

2016
ස්වර්ණ පුස්තක
සම්මානය දිනූ
නවකතාව

අහම්බකාරක

ලියනගේ අමරකීර්ති

"නවකතාව පැන නගින්නේ ඉතිහාසයේ ඇති අඩුපාඩු වෙතිනි."

ෆ්‍රීඩ්‍රිච් වොන් හාර්ඩෙන්බර්ග් හෙවත් නොවාලිස්
Fragmante und Studien, 1799-1800

ආලින්දයක සිදු වූ පූර්විකා සංවාදය

පළමු ආලින්දය අයිති පේරාදෙණිය තානායමට. අපගේ හමුව සිදු උනේ එතන.

ඔහුගේ දුරකථන ඇමතුම ආවෙ ඊට සතියකට පෙර.

“මම -------- මහත්තයා දන්නවා ඇති සුපර්මාකට් චේන් එකක් තියෙනවා -------- කියලා. අපි ළඟදි නුවරත් බ්‍රාන්ච් එකක් දැම්මා."

නගර රතුපාට කරමින් ගොඩනගාගෙන යන ඒ සුපර්මාකට් ගැන අපි කවුරුත් දන්නවා. නගරාවකාශයේ අපේ ඇස් මට්ටම අනවශ්‍ය රතුපාටකින් ආක්‍රමණය කරන ඒ සුපර්මාකට් පැතිරීම හොඳද නරකද කියල මම මගෙන්ම අහලත් තිබුණා. සාමාන්‍යයෙන් කුඩා වෙළෙඳුන්ගෙන් බඩු ගැනීමට සෑම උත්සාහයක්ම ගන්නා මම ඒ රතුපාට සුපර්මාකට් පැත්තේ යන්නේ ඉඳහිට.

“මම තමයි ඒවා පටන් ගත්තෙ. ඕනැ නම් නිර්මාතෘ කියන්න පුළුවන්." ඔහු සිංහල කතාව එච්චර හුරු නැති කෙනෙකු බව ඒ වන විටත් තේරුම් ගෙන සිටි මම ප්‍රකට ව්‍යාපාරයක් හිමි එම අප්‍රකට ධනකුවේරයා ඒ යැයි මොහොතකටවත් හිතුවෙ නෑ.

මම ඔහුට පහසුවෙන්නත් එක්ක ඉංග්‍රීසියෙන් කතා කරන්න ගත්තත් ඔහු සිංහලෙන්ම කතා කළා.

“මම බිස්නස්කාරයෙක් උනාට පොත් පිස්සෙක්. නමුත් සිංහල නවකතා ඒ තරම් කියවන්නෙ නෑ. ඒ උනාට මගෙ

මැනේජර් මට මහත්තයාගෙ නවකතා දෙකක් දුන්නා. මම හෙමින් හෙමින් කියෙව්වා. මම කැමතියි මහත්තයා එක්ක ටිකක් කතා කරන්න. මහත්තයාගෙ අනික් නවකතා හතරත් කියවලම කතා කරන්න තමයි මම මුලින් හිතුවෙ නමුත් මගෙ සිංහල කියවීම හරිම හෙමින්."

"අපි හම්බවෙමු. මේ දවස්වල අපේ නිවාඩු කාලෙ." මම කිව්වා.

අපේ හමුව යෙදුණෙ එහෙම. මගේ පොතකින් සිනමාපටයක් කරන්නට කීපදෙනෙක් කතා කරමින් සිටින නිසා මෙයත් එවැනි සංවාදයක් විය හැකියැයි මම හිතුවා. ඔහු මගේ පොත් දෙක ගැන දීර්ඝ වශයෙන් කරුණු කිව්වා. ඔහු සල්මාන් රුෂ්ඩි, බෙන් ඔක්රි, ග්‍රැහැම් ග්‍රීන් ආදීන් ලන්ඩනයේදී හමු වූ සැටිත්, ඔහුගේ පොත් එකතුවත් මට විස්තර කළා. මම මගේ පෞද්ගලික පුස්තකාලෙ ගැනත් කිව්වෙ පොත් නමැති ධනය අතින් මමත් කුවේරයෙක් කියල පෙන්නන්න. ග්‍රේට් ගැට්ස්බි අපි දෙන්නගෙම කැමති පොතක් විතරක් නෙමේ එහි ආරම්භක වාක්‍ය අපි දෙන්නටම කටපාඩම් තිබුණා.

සීතල අඩුවෙමින් යන බියර් බෝතල් දෙකට දාඩිය දාන්නාක් මෙන් ගලන වතුර ටීපෝව මත ගලන්න උනා.

"මම ලියන්න හැදුවා. ස්වයං චරිතාදපානයක්. හරිනෙ මං කිව්ව?" ඔහු උස් හඬින් හිනා උනා.

"ස්වයං චරිතාපදානයක්. ඔටෝබයොග්‍රෆි?" මම කිව්වා.

"අන්න හරි. ඔයා මේක කියවලා මට කතා කරන්න. මට සිංහලෙන් ලියන්න බැ. ලිව්වෙ ඉංග්‍රීසියෙන්. මම ටිකක් කැමති ශෛලියකින් තමයි ඒක ලිව්වෙ. ශෛලිය අතින් මම ටිකක් ගතානුගතිකයි කියල හිතෙන්න පුළුවන්." ඔහු ඉංග්‍රීසියෙන් කිව්වා.

ඉන් පසු ඔහු මෑතකදී පළ වූ මගේ හයවෙනි නවකතාවේ සිංහල විචාරකයන් කිසිවකුට හසු නොවූ කරුණු කිහිපයක් ගැන විස්තර කළා. හෙන්රි ජේම්ස්ගේ නවකතා පිළිබඳ ඔහුගේ කැමැත්ත ගැන අහන්න ලැබුණම මට ඇති උනේ විශාල ප්‍රීතියක්. ජේම්ස්ගේ ඇතැම් නවකතා මම නැවත නැවත කියවන බව කිව්වම ඔහු ඒවායෙහි සමහර ඡේද මතකයෙන් කිව්වා.

ඒ අත්පිටපත කියවූ මම පුදුම උනා. එය පුදුමකාර කතාවක්. එය කියවන අතරතුර ඇති වූ දුරකථන සංවාද නිසා අපි ඒ වෙන විටත් මිත්‍රවෙලා. ඒ නගරයේ ඔහු පවත්වාගෙන යන පරණ පොත් කඬේට මාත් ගොස් තිබීම ඔහුගෙ සතුටට හේතු උනා. එය ඔහුට අයිති පොත් කඩයක් බව මම දැනගත්තෙ එදා.

අපේ ඊ ළඟ හමුව යෙදුණෙ එක්තරා සුන්දර වැසි දවසක හැන්දෑවෙ ඔහුගේ ප්‍රසිද්ධ නිවසෙ ආලින්දයේ. නුවර යුගයේ ලී කැටයම් සහිත වඩිම්බු ලෑල්ලක කැටයම් තුඩකින් පහළට වතුර බේරුණෙ හරි අලංකාර විදියට. ඉදිරි පස බීබී සුපර් වෙළෙඳ සංකීර්ණ ගොඩනැගිල්ලෙ විදුලි එළිය වැස්ස අස්සෙන් විහිද ගියා මුළු වැස්සම වර්ණ ගන්වමින්.

"මේ විදියට පළ කරන්න බෑ?" ඔහු ඇහුවා.

"ඔයා වගේ බලවත් කෙනෙකුටනං පුළුවන් වෙයි. දේශපාලකයොත් අල්ලගෙන ඉන්නවනම්." මම ඉංග්‍රීසියෙන් කිව්වා.

ඔහු උස් හඬින් හිනා උනා.

"මේකයි. මම ඕක ලිව්වෙ ගෑනු තුන්දෙනෙකුට කියවන්න දෙනවා කියන අරමුණෙන් විතරයි. එක්කෙනෙකුට ඉංග්‍රීසි එච්චර තේරෙන්නෙ නෑ. අනික් දෙන්නට මේ තියෙන විදියටම දෙන්න පුළුවන්. කොහොම උනත් මම කැමති ටිකක් විතර සම්භාව්‍ය ශෛලියකින් ලියන්න."

"හරි." මට කියවුණා.

"මගෙ යෝජනාව නම් ඔයා ලියන්න මේක නවකතාවක් විදියට සිංහලෙන්. මම කියවපු ඔයාගෙ නවකතා දෙකත් එක්කම ගැළපෙන්න පුළුවන් මේක. එකම ගම් පළාතනෙ කොහොමත්."

"එහෙම ලියල පළ කළාට කමක් නැද්ද?"

"මමයි මගෙ චරිත ටිකයි හරියට වෙස් ගන්නල නවකතාවක් බවටත් හොඳට පත් කරලා ලිව්වොත් පළ කරමු. මගෙ පිටපතෙත් පොඩි පොඩි පරිකල්පන වැඩ තියෙනවා. දන්නවනෙ මම සාහිත්‍ය රසිකයනෙ." ඔහු කිව්වා. දැවැන්ත තුන්මහල් වෙළෙඳ සංකීර්ණය පිටුපස ඔහුගේ පාරම්පරික නිවසත්, පොල් වත්ත පුරා විහිදුණු ඔහුගේම ගොල්ෆ් පිටියත් මගේ සිත් පැහැර ගත්තා.

අවුරුද්දක් විතර ගත කර මා යළි ගොඩ නැගූ ඔහුගේ ආඛ්‍යානය කියවූ ඔහු නවකතාවක් ලෙසින් පළ කරන්න මට අවසර දුන්නා.

නිකමකුගේ අපදානය හෙවත් පෙරවදන

මම නිකම් හිටපු මිනිහෙක් වෙමි.

මා සාර්ථක මිනිසෙකියි සිතා මගේ ජීවිත කතාව ලියන්නැයි කියූ අය මේ පොතේ පළමු වැකියෙන්ම තැති ගන්නට ඉඩ තිබේ.

මගේ ජීවිතය පිළිබඳ වෙන කතුවරයකු ලියන ආකාරයට ලිව්වේ නම් මා එය ආරම්භ කරන්නට කැමැති වන්නේ "බන්දුල බලගල්ල සම්භාව්‍ය මිනිසෙක් වූයේය" යන වැකියෙනි. මම සම්භාව්‍ය මිනිසෙක් වීමි යැයි කියන විට මගේ ආත්මාභිමානය අනවශ්‍ය තරම් එළියට පනින නිසා මට එසේ ලිවිය නොහැකිය. මේ ආඛ්‍යානය සෑහෙන තරම් දීර්ඝ වී ඇත්තේ මගේ ඒ ආත්මාභිමානය පරිස්සමට වෙස් ගන්වා ඇති නිසාය.

ඉතා සාර්ථක ධනවතකු සේ මගේ ජීවිත කතාව ලියා තැබීම අවශ්‍ය බව කියන අය නිදර්ශනයට ගන්නේ බිල් ගේට්ස්, ස්ටීව් ජොබ්ස් වැනි අය ලියූ ස්වයං-චරිතාපදානයන්ය. මම ඒවාට අකමැති වෙමි. ඔවුන්ගේ සාර්ථකත්වයේ කතා ඇමරිකානු සාර්ථකත්වය නම් මහා කතාවේ අතුරු කතා පමණි. ඔවුන් ඉතා උන්නතිකාමී නිර්මාණශීලීන් බව ඇත්තය. එහෙත්, මම නිකම් හිටපු මිනිහෙක් වෙමි. මම අහම්බයකින් හම්බ කරන්නට පටන්ගත් අහම්බයක පුත්‍රයා වෙමි. නැතිනම් මම අහම්බයක පිතා වෙමි.

මා නිකම් හිඳිමින් නියෝජනය කරන්නට කැමති වූයේ දහනවවෙනි සියවසේ යුරෝපයේ විසූ ඥානගවේෂී සමාජබුද්ධිමතුන් හා චින්තකයන්ගේ උරුමයයි. කුඩා කල සිට මගේ රුචිය සකස් වූයේ ඒ උරුමය ඔස්සේය. එමෙන්ම මගේ රුචි අරුචිකම් නියෝජනය කළේ එවැනි අයට වඩා සම්භාව්‍ය අවධියක විසූ සම්භාව්‍ය මනුෂ්‍යයන් කණ්ඩායමක් බව මම සිතමි.

අඩු තරමින් මා මා ගැන සිතන්නට තෝරාගන්නේ එසේය.

සාර්ථක මිනිසෙකුගේ ස්වයං-චරිතාපදානය සේ මෙය ලියන්නැයි ආරාධනා ලැබුණද සාර්ථකත්වයේ චරිතාපදාන යනු මා කැමති කතා වර්ගයක් නොවේ. ඒ බව මා නැවත නැවත කිව යුතුය. මා ලියන්නට අවශ්‍ය අහම්බයේ චරිතාපදානයකි. බිබී සුපර්මාට් ව්‍යාපාර සමූහයේ නිර්මාතෘ එක්දාස් නවසිය හතළිස් අටේ අහවල් දා අරුණ නැගෙන විට මෙලොව එළිය දුටුවේය; ඔහු උපන්දා සියලු නුවරවල සියලු ගෙවල මිදුලේ මල් පිපී සුවඳ දුන්නේය. මට එවැනි වැකි ලියන්නට හැකියාවක් නැත. අපේ ගෙදරට මා උපන්නේ අහම්බෙකිනි. මා ලංකාවේ අතිසාර්ථක ව්‍යාපාරිකයකු වූයේ අහම්බ කීපයක් නිසාය. එහෙයින් මගේ ජීවිත කතාව කියවා කිසියම් ආදර්ශයක් ගන්නැයි කියන්නට නම් මට සිදුවූ අහම්බම නැවත සිදුවන තැන්වල ඉන්නැයි පාඨකයාට කියන්නට මට සිදුවේ. අහම්බ සිදුවන තැන්වල කලින්ම සූදානම්ව සිටින්නට අපට හැකි නම් ප්‍රීතිමත් අහම්බ මාලාවක් තෝරාගෙන ඒවා සිදුවන විට ඒ අහම්බවලට බඳුන්වීමට අපට පුළුවන. එනමුදු අහම්බ එසේ සිදු නොවේ. මේ කතාවෙන් කිසිම ආදර්ශයක් ගැනීමට කල්පනා නොකර කියවාගෙන යන මෙන් මා ඔබෙන් ඉල්ලා සිටින්නේ ඒ නිසාය.

මා මාගේ ජීවිතය ලියන්නට කැමති හෙන්රි ජේම්ස්ගේ වැනි සවිස්තර වූද සෙමින් ගලා යන්නා වූද ශෛලියකිනි. එහෙත්, ස්වයං-චරිතාපදාන පාඨකයාට අවශ්‍ය ඉක්මනින් වීරයා සාර්ථකත්වය කරා යන ආඛ්‍යානයක් කියවන්නටය; පිම්මෙන් පිම්මට සාර්ථකත්වයට පනින වීරයකු දකින්නටය. 'බන්දුල බලගල්ල සිය පාරම්පරික නිවස හා ගෙවත්ත තුළ වාසය කළේ ස්වයං-සන්තෘප්ත වූද දර්ශනීය වූද ලෝකයක ගැඹුරු සිතිවිල්ලෙහි ගිලෙමින් දිවි ගෙවන්නකු සේය' යනාදී වශයෙන් ලියන්නට මම ප්‍රිය කරමි. ඒ නිසා මම මෙය ලියමි. මෙය පළ වූ විට මෙය ලියන්නට මට ආරාධනා කළ අය පවා තිගැස්සී යන බව මම දනිමි. මගේ කතාව මගේ කටහඬින්ම ලියනු දැකීම මා මෙහි ලා දිරිමත් කරන අයගේ අපේක්ෂාව වුවද ලේඛකයාට බලය දැනෙන්නේ තමාම තමාගේ භාෂාවෙන් අල්ලා ගත් විට නොව, අනෙකා තමාගේ භාෂාවට හසු කර ගත් විටය. ඒ නිසා මම විටින් විට මාවම අනෙකකු කර ඉවතට මුදා හැර භාෂාවෙන් යළි ඔහු අල්ලා ගන්නට තැත් කරමි. මේ එසේ කළ එක් තැනකි:

බන්දුල බලගල්ල සම්භාව්‍ය මිනිසෙක් වූයේය. ඔහු දැරූ සමහර අදහස්, ඔහු කියවූ පොතපත, ඔහුගේ රුචි අරුචිකම් නියෝජනය කළේ එක්තරා සම්භාව්‍ය යුගයකි. නිදර්ශනයක් ලෙස යම් යම් කාර් ගැන ඔහුගේ කැමැත්ත පවා ඒ සම්භාව්‍යභාවයේම දිගුවක් විය. විනෝදයට පැදයාමට භාවිත කළ මිනිකූපරය පවා ඒ සම්භාව්‍යභාවයට යටත් වූ විනෝදකාමයක් නියෝජනය කළද ඔහු කිසි කලෙකත් මිනිකූපරයේ යන විට පවා කොට කලිසමක් ටී ෂර්ටයක් හැඳ පිටතක නොගිය නිසා ඒ ක්‍රීඩාශීලී කුඩා රථයේ ගමන් කළද බන්දුල බලගල්ල ඉතාම පිළිවෙළට අඳින පළඳින ප්‍රභූ ස්වභාවයක් පෙන්නුම් කළේය. මිනිකූපරයේ යන විට ඔහු ඇන්දේ තනි කපු කලිසමට උඩින් දමා අඳින ලිනන් කමිසයකි. ඔහු මේ ඇඳුම් ගෙනෙන්නට වරින් වර කොළඹ ගියේය. සැහැල්ලු කපු කමිස අඳින විට පදම් නොකරන ලද සමින් කළ සෙරෙප්පු පැළඳීමට ප්‍රිය කළ ඔහු ඒවා සිංගප්පූරුවෙන් ගෙන්නා ගත්තේය. නැතිනම් ඉතාලියේ සිට ඒවා ගෙනැවිත් අලෙවි කරන ලිවේරා බ්‍රදර්ස් වෙතින් ඇනවුම් කෙරිණ.

මා මාගෙන්ම ඈත් කර මෙසේ විස්තර කළත් මා මැවී පෙනෙන්නේ ප්‍රභූවරයකු ලෙසට බව මට පෙනේ. නැත. මම එවැනි මිනිසෙක් නොවෙමි. මම නිකම් ඉඳපු මිනිහෙක් වෙමි.

මා කුඩා කාලයේ අපේ මහගෙදර පිහිටියේ කුරුණෑගල නගරයේ කෙළවරකය. කොළඹ-කුරුණෑගල පාර කුරුණෑගල නගරය පසු කළ විගස අපේ වත්ත ඉදිරියෙන් ඇදී යයි. දැන් කුරුණෑගල නගරය බලගල්ල වත්ත පසුකර සෑහෙන දුරක් ඇදී ගොස් ඇත. කුරුණෑගල නගරය නම් මකරා සිය ලොඹු කට හැර මට අයත් ලෝකය ගිලගත්තාක් මෙනි. දිරවා ගැනීම කාර්යයත් ගිලින සතාටම බාරදී මම මගේ පාඩුවේ හිඳිමි. බලගල්ල වලව්ව මට උරුම වූ පසු එහි කඩ කාමර ගසා කුලියට දෙන්නැයි සල්ලි හොයන අන්දම් කටපාඩමින් දත් අය මට උපදෙස් දුන්හ. සමහරු තකහනියක් පැමිණ බද්දට පර්චසයක් දෙකක් ඉල්ලූහ. ඔවුන් පොරොන්දු වූයේ අදහා ගන්නටත් බැරි තරම් ඉහළ මිලකි.

මම සද්ද නැතිව ගොල්ෆ් ගගහා නිකම් සිටියෙමි.

නරගයට විවෘතව කොළඹ-කුරුණෑගල පාර දිගට කිලෝමීටර් භාගයක් විතර දිගට ඇදෙන අපේ වත්ත අක්කර තිහකි. වත්ත පිටුපස වෙල්යායෙන්ද අක්කර පහක් අපේය. මේ අක්කර තිස්පහ නගරයට ඇති ලොකුම හිසරදයක් බව මම දනිමි. එය මට පුදුම සතුටකි.

මේ ඉඩම මගේ නිසා මම නගරයේ හිසරදයද නගරය විසින් ගිලින ලද අජීර්ණකාරකයද වෙමි.

බලගල්ල වත්ත මැද පිහිටි අපේ මහගෙදර අඹ, කොස්, උගුරැස්ස, පේර, අලිපේර, කාමරංගා, අනෝදා, ජමනාරං ආදී පලතුරු ගස් ගොන්නකිනුත් තැඹිලි අරඹකිනුත් වැසී ඇත. "පාර අයිනේ පොඩි කඩයක් දමාගෙන කොත්තු නොගැහැව්වට අපිට මොනවද අඩු" යැයි ලියන මහත්තයා එකල කියූ කියුම ඇත්තය. අපේ මේ වත්තේ පොල් ආදායම පමණක් වුවද මට කුමාරයකු සේ ජීවත්වීමට ප්‍රමාණවත්ය.

මම මගේ විජිතයේ නිකම් සිටින කුමාරයෙක්ම වෙමි.

මා වසන මේ නිවස එක්තරා ප්‍රෞඪ පෙනුමක් සහිත ආකර්ෂණීය ගෘහ නිර්මාණයකි. දේශීය ලක්ෂණ පමණක් නොව

පෘතුගීසි, ලන්දේසි සහ ඉංග්‍රීසි සේම ඇතැම් ඇමරිකානු ලක්ෂණද මෙහි මිශ්‍ර වී ඇති බව පෙනේ. මා යුරෝපයේ සංචාරය කළ එක් වාරයක ස්පාඤ්ඤයේ සිට ප්‍රංශය කරා බසයෙන් ගියෙමි. පෘතුගාලයේ ඈත මිටි කඳු බෑවුම්වල මිදි වතු මැද මෙවැනිම ගෙවල් තිබෙනු දැක මම මවිත වීමි. වෙනසකට ඇත්තේ අපේ ගේ ඒවාට වඩා ගරුගම්භීර වීමය. දුප්පතුන් සහ අඩු කුළ මිනිසුන් ගෙටත් නොගෙන, පිටත් නොතියා පිළිගැනීමට සුදුසු ඇතුළත් නොවන, පිටතත් නොවන තැනක් අපේ ගෙදර ඇත. නිවස තුළ සීතල ඇති කිරීමට අපේ ගෙදර විශාල උසකට සාදා අතර මැද ලෑලි සොල්දරයක් දමා ඊටත් යටින් ලෑලි සීලිමක්ද ගසා ඇත. අපේ ප්‍රභූවරුන් අතර මේ ගෙවල් පැතිරුණේ පෘතුගීසි හෝ ලන්දේසි ආකෘතියටම නොවුණත් පෘතුගීසිකාරයා සහ ලන්දේසිකාරයා රට හොල්ලා අවසන් කර පිටත්ව ගොස් අවුරුදු තුන්සීයකට පසුවත් පෘතුගීසි සහ ලන්දේසි ලක්ෂණ ගණනාවක් අපේ ගෙවල්වල ශේෂව තිබේ.

අපේ ගෙදර හෙවත් බලගල්ල වලව්ව නිකම් ඉන්න මිනිහෙකුට වුවත් බලයක් ආරෝපණය කරන විශාල ගෘහ නිර්මාණයක් නිසා මා මගේ වත්තේ ගත කළ අන්තරාවර්ථී ජීවිතය බලවත් ජීවිතයක් සේ මටද අන් අයටද දැනිණ. නිකම් සිටීම යනු සැම දෙනෙකුටම ලැබෙන වරප්‍රසාදයක් නොවේ. අත්හැරයාමට නොසිතෙන හෝ අන්සතු කිරීමට හිත නොදෙන කුමක්දෝ ආකර්ෂණීයභාවයක් මේ ගෘහයෙහි මට දැනේ. මා ලංකාවට එන්නට පෙර මිය ගිය පප්පාද සහ මා එංගලන්තයට යන්නට පෙර මිය ගිය අම්මාද සම්බන්ධයෙන් මගේ ණය මේ නිවස වෙත ගෙවා නිම කළ හැකිය වැනි හැඟීමක් මා තුළ විය. කවදා හෝ මා පැමිණ මේ වතුපිටි බලා කියා ගනීවිය යන හැඟීමකින් පප්පා සහ අම්මා බලා සිටි බවක් මට කවදාකවත් දැනී නැත. පප්පාද මේ ලෝකය අත්හැර යාමට අපේක්ෂාවෙන් සිටි කෙනෙකි. ඔහු එංගලන්තයේ ඉගෙනගන්නට යන්නට ඔන්න මෙන්න කියා සිටිද්දී එය වැළකී ගියේ සීයා හදිසියේ ලෙඩ වූ නිසාය. ලන්ඩන් ස්කූල් ඔෆ් ඉකොනොමික්ස් වෙත පප්පා ඇතුළත් කරගත් බව

පැය කීපය ඇරඹේ. ඔවුන් ඒ ලවුඩ්ස්පීකර් ගුරුවරයාගේ පන්තියෙන් නික්ම යන්නේ මට මගේ මහගෙදර, වත්ත හා ගොල්ෆ් වළල්ල තුළ ඒවාටම ආවේණික පෞරාණික ශාන්තභාවයක් වෙත යන්නට අත හරිමිනි. මේ පන්තිවල ඉංග්‍රීසි උගන්වන බොහෝ දෙනෙකුට ඉංග්‍රීසි බැරි බව සේන වරක් කීවේය. එය මගේ කුතුහලය ඇති කළේය. මා සිතා සිටියේ අර්සනායගම් මහතා වැනි අය දැන් එවැනි විශාල ටියුෂන් පන්ති පවත්වන බවය.

මෙවැනි දරුවන්ට යම් වැදගත් දෙයක් ලබා දෙන්නට, එනම් අර්සනායගම් මහතා නිවසටම පැමිණ මට ඉගැන්වූ ඉංග්‍රීසි වැනි දෙයක් ලබා දෙන්නට, ඇත්නම් හොඳ යැයි මට සිතිණ. එහෙත්, බලගල්ල වලව්වේ උරුමක්කාරයා 'ටියුෂන් සර්' කෙනෙකු වී ඇතැයි යන අදහස පැතිරයාම ගැන මටත් වඩා කරදර වූයේ සේනය. ටියුෂන් සර් යනු එකල පිටු ඉරෙන්නට තරම් තදට වැකි යටින් ඉරි ඇඳි සම්භාව්‍ය සාහිත්‍ය කෘති ලෙදර් බෑග් එකක දමාගෙන මොරිස් මයිනරයෙන් පැමිණ අපට ඉගැන්වූ අර්සනායගම් මහතාගේ වූ ගෞරවනීයත්වයෙන් හා ගම්භීරත්වයෙන් තොර පුංචි වෙළෙන්දෙකිය යන අදහස මගේ සිතේද තිබිණ. ඒ නිසා දක්ෂ ඉංග්‍රීසි ගුරුවරියක වන මා මිතුරිය රාධා ඉංග්‍රීසි කථනය, එලකියුෂන් සහ නාට්‍ය පන්තියක් පටන්ගන්නට යෝජනා කළ විට එය හොඳ වැඩකියි මම සිතුවෙමි. ඇය පන්ති පැවැත්වුවද ලාබ සුලබ ටියුෂන්කාරියක ලෙස පෙනෙන කෙනෙක් නොවේ.

මම බෙහෙවින් අහඹු මිනිසෙක් වෙමි.

බලගල්ල වලව්වේ පුංචිම පුතා වී ඉපදීම මා කළ තෝරා ගැනීමක් නොවන බැවිනි. ඒ නිසා හරියටම සැලසුම් ගත කරන ලද ජීවිතයක් සේ මගේ ජීවිත කතාව කියන්නට මට හැකියාවක් හෝ උවමනාවක් හෝ නැත. මගේ ප්‍රියතම නවකතාවක් වන කැචර් ඉන් ද රයි පොතේ කතා නායකයා කියන්නාක් මෙන් ඩේවිඩ් කොපර්ෆීල්ඩ් වැනි නවකතාවල සේ මගේ දෙමාපියන්ගේ උපත, මගේ උපත, මා උපන් විට ඔවුන් ලද සතුට ආදිය ගැන

කියමින් කතාවේ වීරයා වීරයකු වීමේ ලක්ෂණ විදහා පෙන්වමින් වීරත්වය කරා වැඩුණ හැටි ගැන විකාර කතා කියන්නට මට අවශ්‍ය නැත. එහෙත්, කැචර් පොතේ කතා නායකයා නවතින තැන වන උමතුභාවය වෙත මම නොනවතිමි.

බොහෝ දෙනාගේ ඇසින් බලන කල මම සාර්ථක මිනිසෙක් වෙමි. ඒ නිසා ප්‍රබන්ධ වීරයකු සේ ඔවුහු මා දකිති. මා ප්‍රබන්ධගත වීරයකුද කරන්නට කැමති ඔවුහු මට මේ පොත ලියන්නට ආරාධනා කළහ.

එහෙත්, මම අහම්බයකින් මෙන් ඉතිහාසයේ අතරමගට ඇදවැටුණු අහම්බකාරයෙක් වෙමි. ඒ නිසා මම මේ කතාවේදී ජීවිතයේ හරිමැදට හනික එළඹෙමි.

මා එතෙක් සිටියේ තනියම මගේ වත්තේ ගොල්ෆ් ක්‍රීඩාව කරමිනි. මගේ විනෝදයද කාන්සියද භාවනාවද වියවුලද එය විය.

අක්කර තිහක බලගල්ල වත්ත ඉදිරියෙන් නගරය දලුලමින් තිබුණ අතර, පිටුපසින් වෙල්යායක් මිය යමින් තිබුණේය. අක්කර තිහේ මගේ වත්තේ පිටුපසින් ඇරඹුණේ අක්කර පහක මගේම කුඹුරයි. ඒ කුඹුරු යායේ තවත් අයට අයත් කුඹුරු තිබිණ. කලෙක ඒ වෙල් යාය නාරම්මල, පොල්ගහවෙල, අලව්ව දක්වා පැතිරිණි. දැන් ඒ කුඹුරු යාය වෙත පවා පර්චස් දහයේ ගෙවතු වේගයෙන් උප නගරය පැතිර විත් තිබේ.

එහෙත්, මම මගේ අක්කර තිහේ ගොල්ෆ් ගසමින් සිටියෙමි. ගොයම් කැපූ කාලයට කුඹුරු අක්කර පහ දෙසටත් ගොල්ෆ් පිටිය දික් වේ.

බලගල්ල වත්ත ස්වයං-රක්ෂිත ස්වයං-පෝෂිත ස්වයං-චලිත ලෝකයක් බවට පත් කරන්නට මේ ගොල්ෆ් පිටිය හේතුවෙයි. මේ ගොල්ෆ් පිටිය මගේම නිර්මාණයකි. එහිදී එල්ල කරන පහරවල් හා නීතිරීති සියල්ල මගේය. ගොයම් කපා වෙල ඉපනැල්ල වූ

කාලයට කුඹුරු අක්කර පහේද වළවල් දෙකක් සාදා සම්පූර්ණ ගොල්ෆ් පිටිය කප් දහතුනක් බවට පත් කෙරේ.

ගෙදර සිටින්නේ නම් මම හැමදාම හවසට ගොල්ෆ් ගසමි. නගරයට විවෘත වූ ඉදිරි ගේට්ටුව ළඟ සිට වූ කොඩියක් ළඟින් පටන්ගන්නා මගේ ගොල්ෆ් පිට්ටනිය සරුසාර පොල්වත්තේ අඹ, කොස්, දෙල්, තේක්ක, හල්මිල්ල ගස් අස්සෙන් පැතිර යයි. ගැස්වැල් යනු මගේ ඥාතීහු වෙති. ඒ නිසා අලුතින් ගසක් නැගී ගොල්ෆ් බෝලයේ ගමන් මගට අභියෝග කරන විට මම ක්‍රීඩාවේ නීති වෙනස් කරමි. ගස් මග හැර බෝලය ඇදී යන්නට සලස්වන පාරවල් මම පුහුණු වී ඇත්තෙමි. ඒ ඇතැම් පහරවල් ටයිගර් වුඩ්ස්ට හිතා ගන්නටවත් බැරිය. පොල් ගස් කඳන්වල වැදී වළවල් අසලටම හෝ ඒවා තුළටම වැටෙන්නට බෝලය එල්ල කරන්නට මට හැකියාව ඇත. එය ඉබේ ආ හැකියාවක් නොවේ. අපේ අක්කර තිහේ වත්තේ සෑම ගසකම පාහේ ගොල්ෆ් බෝල රැඳී තිබේ. අදටත් ඇතැම් ගස්වල පොල් අතු වේලී වැටෙන විට ගොල්ෆ් බෝලද වැටේ. වත්තේ දකුණු පැත්තේ ඇති මධ්‍යම පාන්තික ගෙවල මිදුල්වලටද වහල උඩටද ගොල්ෆ් බෝල වැටීම වැළැක්වීමට අඩි විස්සක් විතර උසට දැල් වැටක් ගසා තිබේ.

ගොල්ෆ් බෝලයක් එල්ලයට ගමන් කිරීම බොහෝ දුරට අහම්බයකි. ගොල්ෆ් බෝලය ගමන් කරන්නේ අතරමග සිදු විය හැකි අහම්බයන් අතරමැදිනි. එහෙත්, ඉලක්කය වෙත ගමන් කිරීම යන අහම්බය උදා කිරීම ගොල්ෆ් ක්‍රීඩාවෙන් ලැබෙන ආනන්දයයි.

මගේම වත්තේ මාම සාදා ගත් ගොල්ෆ් වළල්ල මගේ ජීවන වළල්ලයි; මගේ සක්මන්මලුවයි; භාවනා වීථියයි. පුංචි ගොල්ෆ් බෝලයක් වෙත මම දැන් අවුරුදු විස්සක් පමණ මගේ ජීවිතය කේන්ද්‍රගත කරගෙන සිට ඇත්තෙමි. මේ කතාව සාර්ථකත්වය නම් ඉලක්කය වෙත යායුතු බව මෙය ලියන මෙන් ඉල්ලා සිටි අය කියති. එහෙත්, මා ලියන්නේද ගොල්ෆ් බෝලය එල්ල කරන්නාක් සේය.

එය කවර නම් ගමනාන්තය කරා ළඟාවේදැයි නිශ්චිතව කිව නොහැකිය. අනේක අහම්බ අතරමැද ඇති බැවිනි. සෑම ගොල්ෆ් පහරක්ම අහම්බයක් නිර්මාණය කිරීමකි. ජීවන අන්දරයක් එසේ ගමන් කළ හැකිද? ඇයි බැරි?

අහම්බයෙන් මේ ස්වයං-සන්තෘප්තභාවයේ වළල්ලෙන් එළියට විත් මා ගොඩනැංවූ විජිතය ගැන ඔබට මේ ආඛ්‍යානයේදී කියවන්නට ලැබේ. එහෙත්, මෙහි එන කතාව එය පමණක් නොවේ. මෙය එම විජිතයද ජීවිතයද ගැන කතාවකි.

කතාව ආරම්භ වන්නේ රාධා සහ මා ඉංග්‍රීසි කථන පාසැල ආරම්භ කර නොබෝ දවසක් ගිය කලය.

පළමු පියවර

ගොළුවා සහ නළුවා

නොසිතූ දේ සිදුවීම අසිරිමත් දෙයකි.

බලගල්ල වලව්ව ඉදිරිපිට වත්තේ කොනකට වෙන්නට ඉදි කර ඇති කුඩා ශාලාවකින් යුතු ගොඩනැගිල්ල ඉදිරිපිට සවිකර ඇති ශේක්ෂ්පියර්ගේ රූව රැගත් අලුත් බෝඩ් එක විජය වික්‍රමසිංහ වැන්නකුගේ ඇස ගැසෙතියි මම හීනෙකින්වත් නොසිතුවෙමි. ඇකඩමි ඔෆ් ස්පීච් ඇන්ඩ් ඩ්‍රාමා යනුවෙන් ඉටැලික් අකුරින් ලියා ඇති බෝඩ් එකේ සිංහලෙන් මෙසේද ලියවිණ:

"අපි ගොළුවන් වුවත් නළුවන් කරමු."

"අපේ පාසැලේදී ගොළු අයද කියති; ගයති; රඟති."

ඒවා ඒ පුවරුව ඇන්ද වයඹ දැන්වීම් සමාගම බලෙන්ම වගේ දැමූ වැකි දෙකක් මිස මා එතරම් කැමති වූවක් නොවේ. ඊට පහළින් මා දුන් ඉංග්‍රීසි වැකියද විය. වී මේක් ඇනිතිං සේ ඇනිතිං - දැන්වීම ඇන්ද හාදයා එහි අර්ථය කුමක්දැයි මගෙන් ඇසීය. මම මෙසේ කිව්වෙමි: "අපි ඕනෑම දෙයක් ලවා ඕනෑම දෙයක් කියවනවා."

"ඒ කිව්වෙ සර්?"

"දැන් අර ලයිට් කණුව ගන්නකො. අපිට පුළුවන් ලයිට් කණුව ලවා කතා කරවන්න."

"නෑ?" ලයිට් කනු කතා කරවන මා දෙස ඔහු බලා සිටියේ තමා ඉදිරියේ දෙවියන් පහළ වූවාක් මෙනි. ඉක්බිතිව ඔහු ඒ ලයිට් කණුව කතා කරන්නට සැරසෙන්නාක් මෙන් ඒ දෙස බලාගෙන උන්නේය.

"ඔව්. ඉක්මනට කරල දෙන්නකෝ." මම ඔහුගේ උරහිසට තට්ටු කර කීවෙමි.

බෝඩ් එක රැගෙන එන්නට සේන යැවූයෙමි. ඔහු ගෙනැවිත් තිබුණ බෝඩ් එකේ අර ටික තිබිණ. නටන, ගයන, රඟන දරුවන්ගේ චිත්‍ර ටික නම් අපූරුය. බෝඩ් එක හරි මැද ශේක්ෂ්පියර්ගේ මුහුණ රේඛාවලින් ඇඳ තිබූ ආකාරයේද වරදක් නැත.

අපේ ගේ ඉදිරිපිට කොත්තු කඩ, ලාබ ප්ලාස්ටික් බඩු කඩ හා ටියුෂන් පන්ති එකිනෙක තරගෙට මෙන් ඉහළ යන විට ශේක්ෂ්පියර්ගේ රුව සහිත මේ පුවරුව ඈතට පෙනෙන්නට සැලැස්වීමෙන් මා ලැබුවේ අමුතු ආස්වාදයකි. සිංහල වචනයක් වත් නැතිව ඉංග්‍රීසියෙන්ම බෝඩ් එක අන්දවන්නට රාධා කල්පනා කළද සිංහල අවශ්‍ය බව කීවේ මාය. දැනටමත් ශිෂ්‍යශිෂ්‍යාවන් එකසිය විසිගණනක් විවිධ පන්තිවල ඉගෙන ගන්නා නමුත් සාමාන්‍ය පවුල්වල දරුවන් වෙනුවෙන් තවත් ටිකක් විවෘත විය යුතුය යන්න මගේ අදහස විය.

රාධා ඉංග්‍රීසි ව්‍යාකරණ සහ එලකියුෂන් උගන්වන අතර වැඩිහිටි ළමයින්ට ඉංග්‍රීසි කථනය ඉගැන්වූ මම වසරකට වරක් ශේක්ෂ්පියර් නාට්‍යයක්ද ළමයින් සමග නිෂ්පාදනය කළෙමි. එලකියුෂන් යන සංකල්පයම මට ගැටලුකාරී අදහසක් වූයේ එයින් ඉස්මතු කරන ලද්දේ ඉංග්‍රීසි කතා කරන එක් විලාසයක් පමණක් වූ හෙයිනි. අනික එමගින් සිදු කෙරුණේ ඉංග්‍රීසි නම් භාෂාව ඉහළ පාන්තික උරුමයක් බවට පත් කිරීමය. උච්චාරණය යනු භාෂාවක එක් අංගයක් පමණක් යැයි මම තර්ක කළෙමි. වාසනාවකට රාධා ඒ සියල්ල පිළිගත්තාය. ඇය කොළඹ අවට එලකියුෂන් විශේෂඥයන් සමග මේ සම්බන්ධයෙන් වාදවිවාදද

වර්ග අංකය 891.483 AMA
ප්‍ර. අංකය 20720

කර ඇති බව මම දැන ගතිමි. ඒ නිසා අපේ භාෂා පාසැලට හොඳම ගුරුවරිය ඇයය.

එහෙත්, මා ටිකෙන් ටික ඉංග්‍රීසි පාසැලේ වැඩවලින් ඈත් වූයේ අප ටියුෂන්කාරයන් සමග තරග කරන පිරිසක් සේ මට පෙනී ගිය බැවිනි. එය එක්තරා පිලිස්තීනුභාවයක් වෙත ඇද වැටීමකියි මට සිතිණි. මගේ අදහස වූයේ ටිකෙන් ටික එහි වැඩවලින් ඈත්වී මගේ ගොල්ෆ් සංසාර වළල්ලේ සැරිසරන්නටය.

බන්දුල බලගල්ල නම් වලව්කාරයා එංගලන්තයේ සිට පැමිණ දීර්ඝ කාලයක් තනියම ගොල්ෆ් ගසා දැන් ඉංග්‍රීසි නාට්‍ය පාසැලක් ආරම්භ කර ඇති බව විජය වික්‍රමසිංහට ආරංචි වූයේය. ඒ වෙන කිසිවක් නිසා නොව, ඔහු නගරයේ වෙන්නේ මොනවාදැයි පරීක්ෂාවෙන් සිටින නිසාය. අනික දැන් නගර සීමාවට හසු වී තිබෙන බලගල්ල වත්ත රඟපාන විකාර නාටකය වික්‍රමසිංහගේද කුතුහලය දැල්වීය. මේ බලගල්ල නම් ප්‍රභූවරයා තමාගේ ජීවිත ගමනේ හන්දි කිහිපයකදී තමා අසලින් ගමන් කර ඇතත්, මුහුණට මුහුණ මුණ නොගැසීම පුදුමයක් යැයි විජය වික්‍රමසිංහ සිතමින් උන්නේය.

නාට්‍ය පාසැල යනු පරණ වලව්වක නිකමකුට වෙන කරන්නට දෙයක් නැතුව කරන විකාර වැඩක් සේ ඔහුට පෙනිණ. ලංකාවේ තුන්වෙනි විශාලම නගරය (වික්‍රමසිංහ එය හඳුන්වන්නේ එසේය) මැදට හසු වී තිබෙන විශාල ඉඩමක ගොල්ෆ් ගැසීම රත්තරන් කන්දක් උඩ නිදා සිටීමක් සේ ඔහු දැක්කේය. බන්දුල බලගල්ල ගුප්ත මිනිසකු බවද ඔහු විශ්වාස කළේය. මලියදේවයේ අලුත් ගොඩනැගිල්ලක් විවෘත කිරීමේ උත්සවයට ඔහු වරක් පැමිණ සිටි අයුරු විජය වික්‍රමසිංහට මතකය.

බන්දුල බලගල්ල ඉදිරිපෙළ වාඩි වූයේය. ඔහු ප්‍රතාපවත් පිරිමියෙකි. එය අමුතු උඩඟුකමක තාපයක් විහිදුවන ප්‍රතාපයකි. විජය වික්‍රමසිංහ වාඩි වී උන්නේ පුටු දෙකක් එහායිනි. බන්දුල බලගල්ල කා සමගවත් වැඩි මනත් කතාබහක් නොකළේය. "මේ යකාට නළුවො ගොළුවො කරන්නනං පුළුහං ඇති." එය විජය වික්‍රමසිංහට වළක්වා ගත නොහැකි අනායාස සිතුවිල්ලකි.

එහෙත්, මෙයාට "බැරිවෙලාවත් ගොළු අය කතා කරවන්න පුළුවන්නං" විජය වික්‍රමසිංහ කල්පනා කළේය.

මේ පසු කලෙක මා දැනගත්තා දේවල්ය. රාධා මගේ වැදගත් තොරතුරු මූලාශ්‍රයක් වුවද මේ පොත කවදා හෝ පළවන තෙක් ඇය දැන නොගත්තා දේවල්ද මෙහි ඇත. මෙය පළවන්නේ ප්‍රබන්ධයක් ලෙස යැයි දැනටමත් තීරණය කර ඇති නිසා රාධා පවා සත්‍ය සහ ප්‍රබන්ධය අතරට මැදිවනු ඇති බව මට විශ්වාසය.

ඒ මලියදේවයේ උත්සවය ගැන මට හොඳට මතකය. විජය වික්‍රමසිංහ මට පුටු දෙකක් එහායින් උන්නේය. ඔහු අසලම පුටුවේ උන්නේ මූලස්ථාන පොලිස් පරීක්ෂකවරයාය. පොලිස් පරීක්ෂකවරයා අතින් යමක් කී විට ගොළු මිනිසා හිස නමා සිනාසුණේය. ඔහුට පිටුපස අසුනේ ඔහුගේ බිරිඳ හිඳ උන්නාය. පොලිස් පරීක්ෂකවරයා අතින් යමක් කී විට විජය වික්‍රමසිංහ හිස නමා සිනාසුණේය. බිරිඳ සටහන් පොතක යමක් ලියා සිය සැමියාට පෙන්නුවාය.

තරමක් දුරට විජය කුමාරතුංගගේ රූපකාය සිහි කරන මේ ව්‍යාපාරිකයාට කතා කරන්නට බැරි බව මා අසා තිබිණ.

ඒ උත්සවයේදී ඇමැති කෙනෙක්ද පොලිස් පරීක්ෂකද විදුහල්පතිද ආකර්ෂණීය කතා පැවැත්වූහ. එවැනි චතුරකම් පා සිංහල කතා පවත්වන්නට කිසි දිනෙක නොහැකි වන බව දන්නා මා ඒවා අසා සිටියේ ආසාවෙනි. රංග පාසැලක් අයිති කෙනෙකු හැටියට ඒ කතා විලාස නිරීක්ෂණය කිරීම මට ආස්වාදයක් විය. දෙදහස් පන්සිය වසරක ඉතිහාසයක් උරුමව ඇති මේ පින්බිමේ එක් පින්බර විදුහල් මාතාවක ලෙස මලියදේව විද්‍යාලය වැජඹෙන්නේ මලියදේව රහතන්වහන්සේගේ පාද ස්පර්ශය ලද පුණ්‍යවන්ත බිමක බව විදුහල්පතිවරයා කීයේය. පාසැල පිහිටි පින්බිමෙන් එක් කොටසක් පරිත්‍යාග කර ඇත්තේ අපේ සීයාය. ඒ පුණ්‍යවන්ත පරිත්‍යාගය ගැන ඒ උත්තමයාගේ මුණුබුරාටද ස්තුති කෙරිණ.

ඒ අනවශ්‍ය ගෞරවය පිළිබඳ චකිතයෙන් මා බිම බලන විට මා දෙස බලා සිටි විජය වික්‍රමසිංහ බයාදු සිනාවක් පෑවේය. සිය සැමියාගේ බැල්ම එල්ල වූ දෙසටම බිරිඳගේ බැල්මද එල්ල විය. ඇය පෑවේ ශෝභන සිනාවකි.

මේ යුවළ ගැන කුතුහලාත්මක මතකයන් මගේ සිතේ එදින තැන්පත් විය. ගොඩනැගිල්ල සාදන වියදමින් බාගයක්ම පරිත්‍යාග කර ඇත්තේ විජය වික්‍රමසිංහ බව නැවත නැවත නිවේදනය කෙරිණ. අලුත් ගොඩනැගිල්ල සාදා ඇත්තේ අපේ සීයා කලකට ඉහත පරිත්‍යාග කළ බිම් කොටසක යැයිද කියවිණ. ඒ නිසා අප දෙදෙනා අතර යම් ගුප්ත සමානකමක් ඇති බව මටද පෙනී ගියේය.

කථිකයන් තිදෙනාගේම වාගාලංකාර බර කතා දෙස විජය වික්‍රමසිංහ බලා සිටියේ කියවෙන සියල්ල තේරුම් ගත්තාක් මෙනි. නගරයේ සිටින මේ ප්‍රකට ගොළු ධනවතා මගේ සාහිත්‍ය රසික කුතුහලය දැල්වුවද ඔහු ඇතැම් අවස්ථාවල මා ඇතින් මැතින් දැක තිබුණද මගේ විඥානයේ ඉතා ඈත පරිධියේ මිස ඔහුට ඉඩක් නොතිබිණ. එහෙත්, එදින ඔහු මගේ විඥානයේ පරිධියේ සිට ටිකින් ටික මැදට එන්නට පටන් ගත්තේය.

මම උත්සවය අවසන් වීමට පෙර නැගිට ආවෙමි. අත්‍යවශ්‍ය රාජකාරියක් පිණිස ඉඩම්හිමි වැවිලිකරු බන්දුල බලගල්ල මහතාට පිටත්ව යාමට සිදුවීම සම්බන්ධයෙන් සභාවෙන් සමාව ඉල්ලා සිටි බව නිවේදක ගුරුවරයා කී විට මට යකා නැග්ගේය. මම ඉඩම්හිමි වැවිලිකරුවෙක් නොවෙමි. මම නිකම් ඉන්න මිනිසෙක් වෙමි. අනික මා සභාවෙන් සමාව ඉල්ලුවේ නැත. නිවේදකයාගේ වාචාලකම නිසා සිදු වූ තවත් දෙයක් නම් විජය වික්‍රමසිංහ මා ගිලින්නට මෙන් මා දෙස බලා සිටින්නට පටන් ගැනීමයි.

මා හිඳ සිටි පුටුවෙන් නැගිට පිටවීමේ දොරටුවට යන විට විජය වික්‍රමසිංහගේ ඇස් මා වෙත යොමු වූ බව මට මතකය. ඔහුගේ බිරිඳගේ ඇස්ද මා පිටුපස එන බව මට දැනිණ.

මේ දෙදෙනාගේ ආකර්ෂණය මා වෙත එල්ල වී ඇත්තේ මන්ද යන ප්‍රශ්නයට පිළිතුරු වහාම සපයනු ලැබිණ.

ඒ සිද්ධියෙන් දෙදිනකට පසු දොස්තර සමරසේකර මට දුරකථනයෙන් කතා කළේය.

"බන්දු මිස්ටර් වික්‍රමසිංහට ඔයාව හම්බවෙන්න ඕනෙ. වෙලාවක් දෙන්න පුළුවන්ද?"

"ඒ ඇයි?"

"ටිකක් කතා කරන්න ඕනෙලු."

"කතා කරන්න!" මම අකාරුණික උපහාස සිනාවක් පෑවෙමි. මට වහාම ඒ ගැන පසුතැවිල්ලක් ඇති විය.

"මිනිහ ගොළුව උනාට කතා කරන්න පුළුවන්." දොස්තර සමරසේකර කීවේ මගේ අකාරුණික බවට කරන චෝදනාවක්ද රැගත් ස්වරයෙනි.

"සොරි. මොනව ගැනද? කවදද?"

"මොනව ගැනද කියල දන්නෙ එයා. කවදද කියල දන්නෙ ඔයා."

කලා විහීන දොස්තර ඒ වගේ වැකියක් වත් කීම ගැන මට ඇති වූයේ ප්‍රසාදයකි. ඇතැම් දවසක ඔහු දියණිය සමග පැමිණ රාධා සහ මම නාට්‍ය පුහුණු කරන සැටි බලා සිටින නිසා ලෙඩ්ඩුන්ගෙන් ප්‍රශ්න ඇසීමට සහ නියෝග දීමට කතා කරන භාෂාවට වඩා වැඩි සුන්දර භාෂා භාවිත කිරීම් ඇති බව වටහා ගනිමින් ඇති බවක් පෙනේ. දොස්තර සමරසේකර ලොකු නැන්දාගේ ඉල්ලීම පිට නිතර නිතර මා හමු වී මගේ දුක සැප සෙවීමට එන නිසාම ඔහු සහ මා අතර සමීප සම්බන්ධයක් ඇත. අප දෙදෙනා අතර කිවයුතු තරම් බුද්ධිමය සංවාදයක් නැත. මගේ නැනාගේ හද දිනා ඇත්තේ මේ දොස්තරවරයායි සිතන විටත් මට නිලීකා නංගී ගැන පුංචි තරහක් ඇති වේ.

මා "හෙට" කීවේ ඒ සන්තෝෂයට විය යුතුය.

"ඉට් ඉස් යූ හූ නෝස් වෙන් - කවදද කියල දන්නෙ ඔබ." එය ඔහුගේ දියණිය පුහුණුවන නාට්‍ය දෙබසක කොටසකි.

විජය වික්‍රමසිංහ මුලින්ම පැමිණි දවස ගැන මට ඇත්තේ හෘදයංගම වූද අනුකම්පෝපය වූද මතකයකි. ඉන් පසු සිදු වූ සියල්ල විසින් වත් ඒ සහානුකම්පික මතකය විනාශ නොකෙරිණ.

භාෂණය නමැති ලෝකයෙන් ඉතා දීර්ඝ කාලයක් පිටමංව සිටීමේ වේදනාව ඔහුගේ ප්‍රීතිමත් කඩවසම් මුහුණින් පෙනෙන්නට තිබිණ. භාෂාව නම් ශබ්ද පද්ධතිය නොඇසී ජීවත් වන මිනිසෙක් මා ඉදිරිපිට හිඳ සිටියේය. පොත් කියවීමෙන්, භාෂා පාසැලක් ඇමීමෙන්, නාට්‍ය පුහුණු කිරීමෙන්, කුරුණෑගල නාට්‍ය දර්ශන සංවිධානය කිරීමෙන් පමණක් නොව, හැකි සෑම විටෙකම කතා ඇසීමට යාමෙන් රහස අනිකක් නොව, භාෂාවේ අලංකාරය පිළිබඳ මගේ ඇති ආශාවයි. භාෂා අසා සිටීමට මගේ ඇති ආශාව තවමත් සන්සිඳී නැත. මා මේ සටහන ලියන මොහොතේත් මගේ කොම්පියුටරයෙන් මගේ මිතුරිය කැත්රින් එවූ ප්‍රංශ ගීයක් වාදනය වේ.

භාෂාව වින්ද නොහැකි මිනිසකු සමග මම එදා පළමු වරට මුණ ගැසුණෙමි. ඒ නිසා අලංකාර නොකරන ලද බසින්ද නාට්‍යමය නොවන බසින්ද කතා කරන්නට මම තැත් කළෙමි. එහෙත්, භාෂාව නොඇසෙන මිනිසකු වෙනුවෙන් මගේ භාෂාවේ ස්වරූපය වෙනස් කිරීම පලක් නැති බව මට අවබෝධ වූයේ මේ ආඛ්‍යානය ලියන්නට ඒ සිදුවීම් නැවත සිහි කරන කල්හිය.

ඔහු සමග ඔහුගේ බිරිඳද පැමිණ සිටියෙන් එය ඔවුන්ගේ පවුලට ඉතා වැදගත් බැහැදැකීමක් යැයි මම සිතුවෙමි. එය බලගල්ල වත්තෙන් කොටසක් ඉල්ලීම වැනි ලෞකික කාරණයක් නොවන බව පමණක් නොව, එසේ මගේ ඉඩම ඉල්ලීමට කෙළින්ම ඉදිරිපත් වීමට ඔහුට ආත්ම ශක්තියක් නැති බවද මම දනිමි. ඉඩමෙන් කොටසක් බද්දට හෝ ඉල්ලා නගරයේ ව්‍යාපාරිකයන් එවූ ඒජන්තයන්ගේ ආත්මශක්තියේ කොඳු කඩා මා ඔවුන් ආපසු යවා ඇත. ඒ අතර මොහුගේ ඒජන්තයන්ද වූ බව මම දනිමි.

එම විශය පිළිබඳ ලංකාවේ හොඳම රෝහලක් බවට එය පත් විය. ඇය මේ විස්තරය කියන විට විජය වික්‍රමසිංහ මඳ සිනාවකින් යුතුව අසාගෙන උන්නේය. දොස්තර සමරසේකර අපේ ලොකු නැන්දාගේ දියණිය නිලීකා විවාහ කරගෙන ඇයට දැවැද්දට ලැබුණ නිවසේ පදිංචි වූයේය. ඇයද වෛද්‍යවරියකි. දොස්තර සමරසේකර නිතර නිතර මගේ ඇසුර පතා ආවේ මා බලා කියා ගන්නා ලෙස ලොකු නැන්දා ඔහුට කී නිසා විය යුතුය. මගෙන් පසු බලගල්ල වලව්වට උරුමකාරයකු නැති නිසා ලොකු නැන්දා මා සමීපයට දොස්තර සමරසේකර එවා ඇතැයි කෑගල්ලේ පුංචි අම්මා කියූවද මම එය ගණනකට නොගත්තෙමි.

"කන් දෙකේම හිල් තිබුණා?" මම ඇසීමි. වික්‍රමසිංහ මහත්මිය දොස්තර සමරසේකර දෙසත් සිය සැමියා දෙසත් නැවතත් ඇස් යොමු කළාය. ඔහු යමක් අනුමත කරන සේ හිස වැනීය.

"මහත්තය තරුණ කාලෙ නොකළ වරදකට ගහල. කාබන් පැන් ගහල තියෙනව කනේ." ඇය එය කීවේ ඇගේ සැමියාට නොතේරෙන්නට මෙනි.

"සර්ට මතක නැතුවට සර් හින්ද තමයි අපේ මහත්තය බේරිලා තියෙන්නෙ."

විජය වික්‍රමසිංහ හිස සැලුවේය. ඔහුගේ මුහුණේ කෘතඥතා පූර්වක සිනාවක් විය. ඒ සිනාව 'මොනව කරන්නද කරුමෙනෙ' කියන්නාක් වැනි බැල්මක් බවට වෙනස් විය. ඈ කීවේ කුමක්දැයි ඇගේ තොල් කියවා වටහා ගන්නට ඔහුට හැකියාව ඇති බව පෙනිණි. මා නිසා ඔහු බේරුණ විස්තරයක් මට මතක නොතිබිණ.

"අසූතුනේ? සර්ට මතක නැතුව ඇති." වික්‍රමසිංහ බිරිඳ කීවාය.

විජය වික්‍රමසිංහ ඇයට අතින් කීවේ "ඒක පස්සෙ පුළුවන්" වැනි දෙයකියි මට සිතිණි.

කුරුණෑගල කඩේක මුදලාලි කෙනෙකු සහ ඔහුගේ ගෝලයා මා පොලීසියෙන් බේරාගත් අන්දම මට සිහිවිය. ගෝලයා ගොළුවකු වීය යන්නද මට යන්තමට මතකය.

දොස්තර සමරසේකර කතාව වෙන අතකට යොමු කළෙන් මගේ මතක ප්‍රවාහය බණ්ඩනය විය.

"මං කියන කල් මෙයාලා දන්නෑ ඔපරේෂන් එකකින් කනේ හිල් වහන්න පුළුවන් කියලා" දොස්තර සමරසේකර කීවේය.

"නෑනෙ. පුදුම දුකක් වින්දෙ. කාලෙකට පැසෝල සැරෝ එනවා. කාලෙකට කකියනවා. මහත්තය ඕක කාටවත් පෙන්නන්ඩ කැමති උනේම නෑ. කන කකියන කාලෙට ගොඩ බේත් කර කර කොහොම හරි උන්නා. පෙන්නනවනං මගෙම හොස්පිටල් එකක් හදල හොඳ දොස්තර මහත්තයකුට පෙන්නනව කියලමයි කිව්වෙ" ඇය කීවාය.

"දැන් යාන්තමට විතර ඇහෙනව වගෙත් පේනවා" ඇය මා දෙස බලා කීවාය. මේ කතා කියන්නට මා තෝරාගත්තේ මන්දැයි යන්න තවමත් ප්‍රහේලිකාවකි. එහෙත්, කතාව වෙත ආකර්ෂණය වී සිටි මට ඒ කතාවේ අරමුණ කුමක්ද යන්න අමතක වී ගොස් තිබිණි.

ඔහු කිසිවක් ගොළු බසින් කීවේය.

"දෝංකාරෙ මිසක් ඇහෙන්නෙ නැලු." ඇය පරිවර්තනය කොට කීවාය.

ඔහු යමක් මටද කීවේය.

"එයා වෙනුවෙන් කතා කරන එක මට බාරදීලයි තියෙන්නෙ කියල සර්ට කියන්නලු."

ඔහු වෙත ආදර භක්තිය පානා සිනහවක් පෑ ඇය මා වෙත එල්ල කළේ බැතිබර බැල්මකි.

"දැං අපි බැලුවෙ සර්ගෙ අර ඩ්‍රාමා පන්තිවලින්වත් බැරිවෙයිද කියල මොනව හරි සහනයක් ගන්න."

මට එය දැනුණේ අනපේක්ෂිත මුෂ්ටි ප්‍රහාරයක් සේය. "ඒ කිව්වෙ?" මට කියවිණ. මම දොස්තර සමරසේකර දෙස බැලුවෙමි. ඔහු මා වෙත හෙළුවේ 'මේ මිනිහට ටිකක් අනුකම්පා කරපං' කියන වැනි බැල්මකි.

"අපේ ඩොක්ටර් කියන්නෙ සමහර විට නාට්‍ය අභ්‍යාස වගේ දේවල් කරන කොට ටික ටික කතා කෙරෙයි කියල."

"මෙහෙමයි. මං කියන්නෙ එහෙම වෙන්ඩ පුළුවන් කියන එක. දැන් ඔය බන්දුලලා රාධා වීචර්ලා එහෙම කරන වොයිස් ට්‍රේනිං තියෙනවනෙ. මේව කාලයක් කරන කොට ටික ටික කතා කරන්න පුළුවන් වෙන්ඩ පුළුවන්" දොස්තර සමරසේකර කීවේ නැවත වරක් මා තුළම උච්චාරණය කර මිස වටහා ගත නොහැකි දෙයක් සේ මට දැනිණ. ඒ නිසා මම ඒවාට මා ඇතුළේම යළි සවන් දුන්නෙමි.

මා මැදි වී සිටින්නේ මා පුහුණු කරන නාට්‍යයකටත් වඩා අපූරු නාට්‍යයකට බව මට වහා අවබෝධ විය.

"කාලයක් එහෙම අභ්‍යාස කරන කොට, එකක් තමයි, කථා කිරීමේ හැකියාව එන්න ඉඩ තියෙනවා. අනික තමයි දැන් තියෙනවට වඩා හොඳට අංග චලනයෙන් උනත් තමන්ගෙ අදහස් ප්‍රකාශ කරන්න මිස්ට වික්‍රමසිංහට ඉගෙන ගන්න පුළුවන්." දොස්තර සමරසේකර ඉංග්‍රීසියෙන් මා හා කීවේය.

වික්‍රමසිංහ යුවළ හිස සැලූහ.

"අපේ පාසැලේදී ගොළු අයද ගයති" යනාදී අපේ බෝඩ් එකේ වැකි තිදෙනා විසින්ම වැරදියට කියවා තිබෙන බව මම සිතුවෙමි.

"එහෙම කතා කරන්න පුළුවන් වෙනවා නම් හරි පුදුම දෙයක්. ඒ වගේම අපූරු දෙයක්." කී මම විරාමයක් දුන්නෙමි. ඒ විරාමය පිරීගියේ අපේක්ෂා සහගත නිහඬතාවකිනි. වික්‍රමසිංහ යුවළ මඳ සිනා නැගූහ. එය අපේක්ෂාවේ මන්දස්මිතයකි. ඔවුන් දෙදෙනාට මා කී දේ හරියටම නොතේරුණේ යැයි සිතුණු මම

දොස්තර සමරසේකරට කතා කළෙමි. "ඉන්ක්‍රෙඩිබල් කියන්නෙ මොකක්ද?"

"අදහන්න බැරි" ඔහු කීවේය.

"අන්න හරි. ඒක අදහන්න බැරි දෙයක්. අදහන්න බැරි දේවල් වෙනව කියල අදහගෙන මිසක් මේ වැඩේට බහින්න බෑ. හැබැයි ඒ හින්ද ඒක උනේ නැත්තං කමක් නෑ කියලත් හිතන්න වෙනවා. අනික මගෙ පන්තිය මං කම්මැලිකමට කරන වැඩක්. මූලික වශයෙන් අපි කරන්නෙ හරියට ඉංග්‍රීසි කතා කරන්න උගන්නන එකයි. අනික පන්තිය බාරව ඉන්නෙ රාධා කියලා මගෙ යාළුවෙකුයි එයාගෙ මල්ලියි. මං කරන්නෙ ශේක්ෂ්පියර් නාට්‍ය අධ්‍යක්ෂණේ කරන එක. මේ වගේ වැඩක් අපිට බාරගන්න පුළුවන්ද කියන එක මං එයාලගෙන් අහන්නත් ඕනෙ."

"ඒක තමයි. ඩොක්ටත් කිව්වා. අපි බැලුවෙ මෙයා වගේ කෙනෙකුටත් යමක් කරන්ඩ සර්ලට බැරිවෙයිද කියල. මෙයාගෙ හඳහනෙත් තියෙනවා චතුර කෙනෙක් වෙනවා කියල. මටත් හිතෙනවා මෙයා කවදහරි කතා කරනවමයි කියලා. ඒකයි සර් අපි ආවෙ. "

ඇය කඳුළු පිස්සාය. විජය වික්‍රමසිංහ ඇයට ගොළු බසින් කීවේ නොහඬන ලෙසය. 'එය බන්දුල බලගල්ල මහතාට කරන අගෞරවයක්' යන්න ඉන් ඔහු අදහස් කළ බව එය කී සැටියෙන් මම තේරුම් ගතිමි.

"මහත්තය ඔය ප්‍රශ්නෙ හින්දම පිළිවෙළක් වෙන එකත් කල්දදා ඉද්දි තමයි මං හම්බුණේ මංනං එච්ච බැලුවෙ නෑ. රටක් වටින මිනිහෙක් නේද කියලයි හිතුවෙ."

ඇය කී සියල්ල නිසා විජය වික්‍රමසිංහගේ දෙනෙතට කඳුළු ඉනූ බව මම දුටුවෙමි. ඒ නිසා මම ඉවත බලා ගත්තෙමි.

"මේකයි. මං ටිකක් කල්පනා කරන්න ඕනෙ මේ ගැන. මංම නැති උනත් හොඳ කෙනෙක් හොයන්න ඕනෙ. සිංහල භාෂාවෙන් හොඳට වැඩ කරන්න හැකියාව තියෙන."

“සර් කියන ගාණක් ගෙවන්න පුළුවන්. ගැළපෙන කෙනෙකුට.” ඇය “ගැළපෙන කෙනෙකුට” යන්න එක් කළේ ගෙවීම මට නොවන බව ඇඟවීමටය. බන්දුල බලගල්ලට සල්ලි දෙන්නට කතා කිරීම නිගරුවක් යැයි ඇය සලකන බව ඇගේ බැල්මෙන්ද පෙනිණ.

“බන්දුට බැරිද මේ වැඩේ අතට අරන් ට්‍රයි කරන්න. පොඩි පර්යේෂණයක් විදියට?” දොස්තර සමරසේකර ඇසීය. මේ තිදෙනා ඇවිත් තිබෙන්නේ අවසාන වශයෙන් මේ ඉල්ලීම කරන්නට බව මම දැනගතිමි.

“බෑ. මං හරියට කියන්නම් ටික දවසකින්. මේ ගැන ටිකක් කල්පනා කරල බලන්න ඕනෙ. ”

විජය වික්‍රමසිංහ ගොළුබසින් යමක් කීවේය.

මම කුතුහලයෙන් ඇය දෙස බැලීමි.

“මහත්තය කියනවා ඕනැ උත්සාහයක් දරන්නං කියල.” බිරිඳගේ දෑසද උද්යෝගයෙන් පිරී ඇත.

“අපිට උත්සාහ කරල ගොළුවෙන්ඩ පුළුවන් උනාට. උත්සාහ කරල ගොළුබව නැති කරගන්ඩ බෑනෙ. ඒ නිසා යම් පලයක් තියෙනවානං විතරයි අපිට මේක පටන් ගන්න පුළුවන්. අපි පටන්ගන්ඩ යන්නෙ මොකක්ද කියල ටිකක් හරි අවබෝධයක් තියෙනවනං තමයි හොඳ. එහෙම නේද?” මා කීවේ සෑම වචනයක්ම බර කර කියමින් බරපතළ බවක් දෙමිනි.

විජය වික්‍රමසිංහගේ මුහුණේ හීන් දාඩියක් මතු වී ආවේය. එය මට ශෝකය ගෙනෙන දර්ශනයක් විය.

වික්‍රමසිංහ යුවළ නික්ම යාම පිණිස මට ආචාර කළේ දණ ගසන තරමට නැමෙමිනි. ඔවුන් නික්ම ගොස් බොහෝ වේලාවක් යනතුරු මා තුළ වූයේ වරදකාරී හැඟීමක් වැනි දෙයකි. මට තනියම කල්පනා කරමින් ඉන්නට අවශ්‍ය වුවත් දොස්තර සමරසේකර සාලයේම රැඳී උන්නේය.

තනියම කල්පනා කිරීමට ඉඩක් නැත්නම් මත් වී දොඩමලු වීම ඊළඟ විකල්පය බව දන්නා මම බීම කැබිනට්ටුව වෙත ගොස් කලින් දවසක විවර කළ බ්ලැක් ලේබල් බෝතලයක් අතට ගෙන සේනට කතා කළෙමි.

“අර දෙන්නා එක්ක කතා කරල ඉවරවෙලා වහ බොන්ඩ හිතුන්නැති එක ලොකු දෙයක්” කියූ සේන කුස්සිය පැත්තට ගියේය.

“මනුස්සයෙක් ගැන කතන්දරයි ඒ මනුස්සයයි කියන්නෙ එකක් නෙමේ දෙකක්” දොස්තර සමරසේකර කීවේය.

“දුවගෙ ඉංග්‍රීසි පාඩමක තිබුණ කැල්ලක් නේද?” මම ඇසීමි.

“ඔව් ලස්සන කැල්ල නේද?”

“රාධගෙ එළිය හුඟක් ඈතට පැතිරෙනවා එහෙනම්” මම සරදම් ස්වරයෙන් කීවෙමි.

“ඔව් ළඟම ඉන්න අන්ධයන්ට නොපෙනුණාට” ඔහු කීය. රාධා බිරිඳ කර ගත නොහැකිදැයි ඔහු මගෙන් අසන්නේ ළඟක සිට නොවේ.

“ගෑනියෙක්ගෙ එළියෙන් එළිය ලබන්න ඒ ගෑනි එක්ක බුදියන්නම ඕන්නෑ. හොඳ යෙහෙළියො නැද්ද සමරෙට?”

“නෑ. අපි මැෂින් වගේ මිනිස්සු.” ඔහු කීවේ ඔහුගේ ඉරණම විස්තර කිරීමටද මට ඇනුම්පදයක් ලෙසටද යන්න පැහැදිලි නොවිණ.

“පුදුම අවාසනාවන්ත ජීවිතයක්.”

“ඇත්ත” ඔහු කීය.

පළමු මධුවිතෙන් බිඳක් තොලගෑ මම ඒ ආලෝකවත් මිතුරියට ඇමතුමක් ගන්නට දුරකථනය වෙත ගියෙමි.

ආලෝකවත් මිතුරිය

ඇකඩමි ඔෆ් ඩ්‍රාමා ඇන්ඩ් ස්පීච් නම් භාෂා පාසැල බලගල්ල වත්තේ එක මුල්ලක පිහිඹිය සහ පලතුරු ගස්වලින් සඟවා ඇත්තේ අනවශ්‍ය අවධානයක් ඒ වෙත යොමු වීම වළක්වන්නටය. මගේ ආදරවන්තියක වීමේ වෙරළටම ඇදී ගිය රාධා ඒ වෙරළේ ඉවුරෙන් නික්ම ගැඹුරු මිත්‍රත්වයේ පැහැබර වෙරළකදී යළි හමු වූවාය. ඇය සහ සොහොවුරු ඩිලන් නුගේගොඩ ආරම්භ කළ ඉංග්‍රීසි භාෂණ සහ නාට්‍ය පන්තියේ ශාඛාවක් කුරුණෑගලද විවෘත කිරීමේ අදහස ආ විට මා කැමති වූයේ ඈ සමග සංවාදයට ඇති කැමැත්ත නිසා මිස ඉංග්‍රීසි ඉගැන්වීමේ ආසාව නිසා නොවේ. ඉංග්‍රීසි භාෂාව මා කැමැති අන්දමින් ඉගෙනගන්නට කෙනෙකු කුරුණෑගලින් හමුවේ යැයි මම නොසිතුවෙමි. සැබවින්ම එය එසේ විය. අපේ පාසැලට ආවේ පුංචි පුංචි වැඩවලට "ඉංග්‍රීසි" යන නමින් හඳුන්වන උපකරණය භාවිතය ඉගෙනගන්නට මිස එය රසවත් භාෂාවක් සේ උගන්නට අවශ්‍ය අය නොවේ. සමහරු ආවේ ඉංග්‍රීසි නමැති ඉස්කුරුප්පු නියන ටික වෙලාවකට ණයට ඉල්ලාගෙන යන්නට එන්නාක් මෙනි. මේ නිසා අපේ ඉංග්‍රීසි පාසැල මා දුටුවේ රාධාට සහ මට අප ලස්සන යැයි සලකන භාෂාවක් සමග එකට එක්වී යමක් කරන්නට ලැබෙන අවස්ථාවක් ලෙසය. ඉන් ලැබෙන ආදායමද රාධාට අවශ්‍ය බව මම දැන සිටියෙමි. ඒ නිසා මම පාසැල පවත්වාගෙන යන්න එකඟවීමි.

ඇගේ වචනවල මා දුටුවේ සරාගී ගැඹුරකි. ඇගේ කතා විලාසය සහ දෑසේ මීන චලනය වචනවලට එක් කළේ ඈට පමණක් යෙදිය හැකි අර්ථයකි. වචන යනු ශබ්දකෝෂයකින් බලා ලබාගත හැකි පොදු අර්ථ ඇති වස්තු නොවේ. ඒ ඒ වචනයද අමුතුම නව අර්ථයක් එය උච්චාරණය කරන කෙනා නිසා ලැබේ. රාධා කතා කරන සාමාන්‍ය වචනයක් පවා රංගනයක යෙදෙන්නාක් වැනිය. ඇය මා සමග කතා කරන විට මධ්‍යම පාන්තික බ්‍රිතාන්‍ය උච්චාරණය පවත්වා ගන්නේ මා වෙත දක්වන ගෞරවයක් නිසා යැයි මම සිතුවෙමි. රාධා සහ ඩිලන් ඔවුන්ගේ ඉංග්‍රීසි පාසැල වසරක් දෙකක් තුළ හොඳින් ගොඩනගා ගත්හ. මුලදී ඔවුන්ද මාද සිතුවේ එවැනි පාසැලකට කුරුණෑගල එතරම් ඉල්ලුමක් ඇති නොවන බවයි. එහෙත්, නොසිතුවක් සිදු විය. සියලු ශිෂ්‍ය ශිෂ්‍යාවෝ අමුතු කතා වස්තුවක් ඇති තොරණක් නරඹන්නාක් මෙන් ඇය ඉංග්‍රීසි කතා කරන දෙස බලා සිටින්නට කැමැත්ත පෙන්වූහ.

ඔවුන්ගේ උදව්වට විටෙක මමද එහි ගොස් ඇතැම් කොටස් උගන්වන්නටත් දෙදෙනාම නැති විට සම්පූර්ණයෙන්ම පන්තිය භාර ගන්නටත්, නාට්‍ය නිෂ්පාදනයේ වගකීම භාර ගන්නටත් වීමි. කුරුණෑගල අලුත් මධ්‍යම පාන්තික දරුවන්ට එලකියුෂන් ඉගැන්වීමට සීමා නොවී, සාමාන්‍ය පන්තිවල දරුවන්ටද පැමිණිය හැකි ඉංග්‍රීසි පාසැලක් සේ මෙය සකස් විය යුතු යැයි මා මුල සිටම කී දේ රාධා පිළිගත්තාය. මාගේ 'අලුත් මධ්‍යම පන්තිය' යන යෙදුම ගැන ඇය මා හා වාද කළාය. එය පැරණි ප්‍රභූන් යැයි හිතාගෙන ඉන්න අය අනික් මිනිසුන් උපහාසයට ලක් කරන්නට යොදන යෙදුමකියි ඇය කීවාය. එහි ඇත්තක් ඇති බව පිළිගත් මම එය යළි කිසි දිනෙක භාවිත නොකළෙමි. එහෙත්, ඒ අදහස මගේ සිතේ නිතරම තිබිණ.

පන්තියට එන කිසිම ළමයකුට මගේ ජීවිතයේ ස්වයං-සන්තෘප්තභාවයට බාධා කරන්නට නොහැකි වන සේ උස දැල් වැටක් ගසා වත්තේ ඒ මුල්ල වෙන් කළෙමි. අපට පමණක් යතුරු

ඇති ගේට්ටුවකින් අපේ ගෙවත්තේ සිට එහි යන්නට හැකිය. එය ද මගේ රදලකම නිසා කළ දෙයක් වන්නට පුළුවන.

මම නිදිගත් රදලයෙක් වෙමි.

රාධා දුරකථනයට ආවාය. විජය වික්‍රමසිංහගේ ඉල්ලීම මම රාධාට විස්තර කළෙමි.

"මොනව?" ඇය අලංකාර ලෙස සිනාසුණාය.

"මිනිහ ඕනෑ තරම් ගෙවන්න ලෑස්තියි" මම කීවෙමි.

"බන්දු ඇත්තටම කතා කරන්න පුළුවන් අයටත් අපි හරියට කතා කරන්න උගන්නන්නෙ කොච්චර අමාරුවෙන්ද?"

"එහෙනං ඇයි බෝඩ් එකේ ලිව්වෙ අපි ළඟ ගොළු අය ද ගයති කියති කියලා?"

"ඒක ලිව්වෙ ඔයා. මං එදා කිව්වෙ ඔක කවුරු හරි වාචාචාර්ථයෙන් ගත්තොත් අපි ඉවරයි කියලා... නැද්ද?" රාධා ඇගේ රංගනීය ඉංග්‍රිසියෙන් කීවාය. ඇය අපේ රංග පාසැලේ නාම පුවරුව මුලින්ම දුටු දා එසේ කී බව ඇත්තය. එය ඇගේ සිනාවද සමග මට තවත් මතකය.

"වෙළෙඳ සටන්පාඨ වාචාර්ථයෙන් ගන්න මිනිස්සුත් ඉන්නව කියල දැන් පේනවානෙ" මම කීවෙමි.

"කමෝන් බන්දු" ඇය කෑගැසුවාය.

"දැන් ඔන්න ඒක වෙලා තියෙනවා අපි ට්‍රයි එකක් දෙමු."

"බන්දු..." ඇය නුගේගොඩ සිට කෑගැසුවාය.

"මේ මනුස්සයට කටහඬ විතරයි අඩුවකට තියෙන්නෙ. මිනිහ හදන්නෙ කටහඬ ගන්නම නෙමේ කතා කරන්න විදියක් හොයාගන්න කියලයි මට හිතෙන්නෙ. අපිට හොඳ චැලෙන්ජ් එකක්." මම පැහැදිලි කළෙමි.

"ඕනෑ එකක්. ඉරිද හම්බවෙමු." ඇය සුසුමක් හෙළා කීවාය.

ඔහු අනික් පන්තිය සමග මිශ්‍ර කළ නොහැකි නිසා වෙනම පන්තියක් කළ යුතු බව මම විස්තර කළෙමි. ඒ නිසා සෙනසුරාදාවත් එන මෙන් ඉල්ලා සිටි විට ඇය එකඟ වූවාය.

වික්‍රමසිංහ යුවළ හා ඇති වූ සංවාදයේ ඇතැම් කොටස් මගේ හිතේ කා වැදී නැවත නැවත පණ ලබයි.

විජය වික්‍රමසිංහට අත්පත් කරගැනීමට ඇති අන්තිම දේ නම් ඔහුගේම කටහඬය. අන් සියල්ල ඔහු සතුව ඇත. කටහඬ ලැබුණහොත් ඔහු යන ගමනේ සීමාව අනන්තයයි. සිතිජය කියා දෙයක් නැති දිසාවකට ඔහුගේ දෑස එල්ල වී තිබේ.

"හාස්කම් තියෙනව කියන දේවාල තියෙනවා කියලා අරෙයා මෙයා කියනවා. ඒත් මහත්තය බයයි මෙච්චට දෙය්යො ගාව ගන්ඩ." ඇය පැහැදිලි කළේ දෙවියන් පිළිබඳ භීතිය රැඳුණ දෑසින් යුතුවය.

"ඒත් ඒව කරල බලන එකත් හොඳයිනෙ." මම කිව්වෙමි. ඇය මා දෙස බැලුවේ මගේ නළලට උඩින් දෙවියන් ඇය දෙස බලා සිටින්නාක් මෙනි.

"මමත් නං කැමති නෑ සර්. දෙය්යන්නාන්සෙලා මෙච්චවගෙදි කොයි අතට හැරෙය්ද කියන්ඩ බෑනෙ. දීල තියෙන දේවල් මදිද කියල උන්නාන්සෙල කෝපවෙන්ඩත් බැරි නැනෙ. අපේ මහත්තයට නැත්තෙ ඔච්චරනෙ දෙය්යන්නෙ පිහිටෙං. මහත්තයටත් වඩා මමයි බය. බෝධි පූජා එහෙමනං තිබ්බ හරියට ලංකාවෙ හැම තැනම."

ඇය එසේ කියන විට භීතිය නම් සත්ත්වයා ඇගේ මුහුණ මත භයානක සිත්තම් අඳින්නට විය. සිතන්නටත් හොඳ නැති යමක් සිතීම වෙනුවෙන් ඇගේම සිත ඇයටම දඬුවම් දෙන්නාක් මෙනි.

මම රාධා නැවත ඇමතුවෙමි.

"රාධා ඔයා සෙනසුරාදම එන්න."

"බන්දු - මොකද මේ පුදුම හදිස්සියක්. මං තනිකඩ පිරිමි ඉන්න ගෙවල්වල නවතින්න එන්නෙ නෑ තනියම." ඇය විහිළු කළාය.

ඒ විහිළුව තුළ විහිළුවකට වැඩි දෙයක බීජය ඇති බව මම දනිමි. බොහෝ සති අන්තවල රාධා පැමිණ මා සමග නතර වන බැවිනි.

"එහෙනං තනියට ඉන්න කෙනෙක් අරන් එන්න." මම මගේ සෙල්ලම්කාර මිතුරිය ඇවිස්සීමට සෙල්ලම් සහගත වූයෙමි.

"තනිකම විතරයි තනියට ගේන්න ඉන්නෙ." ඇය ඉංග්‍රීසියෙන් කීවාය. එය රාධාගෙන් අපේක්ෂා නොකළ හැකි තරම් බොළඳ කියුමක් සේ පෙනුණත් ඇය හද බිඳුණු ගැහැනියක බව මම දැන සිටියෙමි. බිඳුණු හදකින් බොළඳ වදනක් පිටවීම ගැන සමාව දිය හැකිය. ඇගේ හදවතේ රිදුම් සුව කරගැනීම වෙනුවෙන් අවධානය යොමු කළ හැකි කාර්යයක් සේ 'ගොළු අය ලවා ඇත්තටම කතා කරවීමේ කාර්යය' මට පෙනිණ. එහෙත්, ඇයට හදිසියේ ආරාධනා කරන්නේ විජය වික්‍රමසිංහ නිසාම බව අවාධාරණය කරන්නට මට අවශ්‍ය විය. එනම් මා කරන්නේ ඇගේ හද සුවපත් කරන්නට විශේෂ සැලැස්මක් ගැසීම නොවන බව ඇට ඒත්තු ගැන්වීමට මම තැත් කළෙමි. ඇය අනුකම්පාවට කැමති නැති බව මම දනිමි. මෑතකදී බිඳුන ඇගේ ප්‍රේමය සම්බන්ධයෙන් කිසිම උපදේශයක් නොදීමට මම සිතාගෙන සිටියෙමි.

"මේ කේස් එක මාරයි. අපි මිනිහ එක්ක වැඩ කරල බලමු." මම බරපතල ස්වරයෙන් කීවෙමි.

"හරි සෙනසුරාදා." ඇය දුරකථනය විසන්ධි කළාය.

"ගුඩ් නයිට් රාධා."

"චාඕ." ඇය සිනාසෙමින් කීවාය. ඇය මෑතක සිට "බායි" වෙනුවට භාවිත කරන්නේ "චාඕ" යන ඉතාලි වචනයයි.

මා ඊ ළඟට ඇමතුවේ දොස්තර සමරසේකරටය. "ඩොක්ටර් මට මිස්ටර් වික්‍රමසිංහ ගැන ඔක්කොම දේවල් දැනගන්න ඕනෙ."

"මිනිහ ලොකු සල්ලිකාරයෙක් උන දුප්පත් කොල්ලෙක්." ඔහු කීවේය.

"ඕක වාක්කියක්නෙ. මට ඕනෙ කතාව. නියම කතාව." මම අවධාරණය කළෙමි.

ඔහු තමා දන්නා දේ කියන්නට පොරොන්දු විය.

මගේ වේගවත් උනන්දුව රාධාට පමණක් නොව, දොස්තර සමරසේකරටත් දැනී ගියාක් සේ විය. ජීවිතයේ පළමු වරට දොස්තර සමරසේකර ගෙදරට එන යන කෙනෙකුට වැඩි කෙනෙකියි මට දැනිණ.

වේසි

ගොළු කොල්ලා කුරුණෑගල නගරයට එන විට අවුරුදු පහළොවක් හෝ දාසයක් වන්නට ඇත. ඔහුගේ බෙල්ල ළඟට වැටෙන දිග කොණ්ඩයත්, ගොළු බවත් ඔහු ගැන මතක ඇති පරණම අයටත් මතකය. එහෙත්, ගැටවර වයසේදී ඔහු මතක තියාගන්නට තරම් වැදගත් කෙනෙකියි සිතූ අය අඩු නිසා මේ කාරණයේදී අපට රඳා පවතින්නට සිදු වන්නේ ඔහුගේම මතකය මත පමණි.

ගොළු කොල්ලා මුලින්ම වැඩ කළේ සේදරමන් හෝටලයේය. රාධා සහ දොස්තර සමරසේකර සොයාගෙන ඇති ආකාරයට ගොළු කොල්ලා ගොළු භාෂාවෙන් ඉල්ලා ඇත්තේ ඉන්නයි කන්නයි පමණි. ඔහුගේ හැඳුනුම්පත බැලූ සේදරමන් මුදලාලි කොල්ලා වැඩට ගත්තේය. කොල්ලා හෝටලයේ සියලු වළන් පිඟන් හේදුවේ බැඳගත් යකෙකු මෙනි. ඔහුට තිබුණේ පුදුමාකාර සේම පරිස්සම්කාර කඩිසරකමකි. ගොළුවන්ට අනික් අයට වඩා හයිහත්තිය ඇතැයි යන කියමන හෝටලේ වැඩ කළ අය අසා තිබුණද එය ඇත්තක් බව ඔවුන් දැනගත්තේ ගොළුවිජේගේ පැමිණීමෙන් පසුවය. 'සුදු කොල්ලා' යි කිව හැකි තරම් පැහැපතක්ද තිබුණු ඔහු කාගෙත් අනුකම්පාව දිනාගත් අතර, ඒ අනුකම්පාව ටික ටික ආදරයකට හැරිණ.

වැඩි දවස් යන්නට පෙර හෝටලයේම නැවතී සිටි කෝකියා සුදු ගොළුවාට ආදරය කරන්නටත්, ඔහු ආරක්ෂා කරන්නටත්,

හදාවඩා ගන්නටත් විය. සේදරමන් මුදලාලි හෝටලේ වසා ගිය පසු හෝටලයේ පස්සා පැත්තේ සිරාබිරා පිරි ජරාවාස කාමර දෙක බෙදාගෙන ජීවත්වන කෝකියා, වේටර් කොල්ලන් සහ සහය කෝකියා අතර සුදු ගොළුවාගේ ආදරය දිනාගන්නට තරගයක් ඇති විය. ඒ නිසා කුස්සියේ පිරිමි සියලු දෙනාම පාහේ ළිපේ රස්නෙන් පමණක් නොව, එක්තරා රතියකින්ද රත් වී කාලයක් ගත කළහ. ඒ නිසා හැම පිරිමියාම සිටියේ පුදුමාකාර උද්යෝගයකිනි. නිලයෙන්ද, සේදරමන් මුදලාලිගේ විශ්වාසය දිනා ගැනීම අතින්ද බලවත් තැනක සිටි ප්‍රධාන කෝකියා ඔහුටත් වඩා තරුණ තරගකරුවන් පරදවා කොලුවා දිනාගත්තේය. කෝකියාට තනියම උරුම වී ඇති කාමරයේ බිම පරණ මෙට්ට කබලක් දමා ගොළුවිජේගේ ඇඳ හදා දුන්නේ කෝකියාය. ඒ වන විට අනික් අය පරාජය පිළිගෙන ඊර්ෂ්‍යාවද මැඩ ඇති වී තිබෙන තත්ත්වය මැදහත් සිතින් උසුලන්නට පුරුදු වූහ. එතෙක් සහාය කෝකියා වූ කොලුවා අස්වී යන්නට ගියේය.

ප්‍රධාන කෝකියා බුලත් විට කෑම අඩු කර හැන්දෑවට දත් මදින වෙලාව වැඩි කළේ රාත්‍රියට ගොළු කොල්ලා ඉඹින්නට ඇති නිසාය යන කතාව පැතිරිණ. කෝකියාද එළිපිට කියන තැනට එය සාමාන්‍යකරණය විය. ප්‍රධාන කෝකියාගේ කාමරය පුංචි විවාහක නිවසක අනුරුවක් සේ විය. කෝකියා නාන විට තුවාය, සරම ආදිය ගෙනැත්දීම පමණක් නොව, බුරුසුවට දත් බේත් දමා දීමද ගොළු කොල්ලා කළේ ඉතාමත් ආසාවෙනි. ගොළුවා කෝකියාට හොරෙන් අනික් සියලු දෙනාටද ආදරේ කළේය.

මාසෙන් දෙකෙන් කෝකියන් වේටර් කොලුවන් සොයන්නට සිදුවීමෙන් හිත කරදර කරගෙන සිටි සේදරමන් මුදලාලි පැහැපත් ගොළු කොලුවා නිසා හෝටලේ කුස්සිය පැත්ත අමුතු ආදර බැම්මකින් බැඳී ශක්තිමත්ව ඇති බව වටහා ගත්තේය. ඒ බැම්ම කාලයක් අල්ලා සිටියේය. ඒ නිසා කවුරුත් වැඩ කළේ පුදුම තෘප්තියකිනි.

ගොළුවිජේට හෝටලයේ අනික් අයගෙන් ලැබෙන ආදරය සේදරමන් මුදලාලිට තේරුණේ බිල් ලියන කරු හෙවත් බිල්ලා එක් දවසක් තවත් ගොළුවකු උදේම වැඩට එන විට කැන්දාගෙන ආ විටය. ඔහු තරමක් වැඩිහිටි ගොළුවෙකි.

"කෝ විජේ? මෙන්න මං මිනිහට ටිකක් කතා කරන්ඩ කෙනෙක් එක්ක ආවා." බිල් කරු කීවේය.

"මොනව හරි කන්ඩ දෙනවා." මුදලාලි කීවේ බිල් කරුගේ වැඩේ සිනාවකින් අනුමත කරමින් කුස්සිය දෙස බලමිනි.

කුස්සියේ වැඩ කරමින් සිටි ගොළුවිජේ සොයා ගියේ වේටර් ජයසුමනය.

"සුදුමල්ලි අන්න උඹේ ජාතියෙ එක්කෙනෙක් ගෙනැල්ල බිල්ලා."

කට්ලට්වලට අල පොඩි කරමින් සිටි ගොළුවිජේ ඒ සද්දෙන්ම හැරී බැලුවේය.

ජයසුමන වචනයෙන් කියූ දේ අත්වලින් යළිත් කියන්නට තැත් කළේය.

කුස්සියේ සිට හෝටලයේ මේස ඇති ප්‍රදේශයට දොරවල් දෙකක් පසු කරගෙන ආ යුතුය. දෙවැනි දොර ළඟට ගිය ගොළුවිජේ, බිල්ලා හෙවත් බිල් කරු අලුත් ගොළුවා සමග අතින් පයින් කතා කරනු දැක නතර වූයේය.

"වරෙං මලේ කතා කරහං. අපිත් එක්කම කතා කරල ඇති වෙලානෙ ඇත්තෙ උඹට." ජයසුමන ගොළුවිජේ තල්ලු කරගෙන මෙන් ඉදිරියට ගියේය. උදේ කෑමට වාඩි වී සිටි කීපදෙනෙක්ද නාට්‍යයක් බැලීමට මෙන් සූදානම් වූහ.

"අඩේ වරෙව් ගොළුවො ගොළුවො කතා කරනව බලන්ඩ." තව එකෙක් කුස්සිය පැත්තේ සිට කියාගෙන ආවේය. කෝකියා ළිපේ ගින්දර අඩුකොට යකඩ හැන්දද අතින්ම ගෙන දෙවැනි දොර ළඟට ඇවිත් එබී බැලුවේය. අලුත් ගොළුවා තමාගේම වයසේ එකෙකු මෙන් පෙනුණෙන් කෝකියාගේ පපුව ගැහෙන්නට විය.

ජයසුමන කොලුවා දක්කාගෙන ගිය ආකාරය ගැන ඔහුගේ කැමැත්තක් තිබුණේ නැත.

ඒ ගොළුවා සහ මේ ගොළුවා අතර සංවාදය ආරම්භ වූයේ ඒ ගොළුවා පෑ ප්‍රීතිමත් සිනාවකිනි. එය අමුතුම ආකාරයක ගොළු සිනාවකි. පරදේශක්කාරයින්ගේ රටකදී තමන්ගේම රටේ කෙනෙකු අහම්බෙන් මුණ ගැසුණු කලෙක මෙන් ඒ ගොළුවා සතුටු වනු පෙනිණ. ඒත් මේ ගොළුවා කිවයුතු තරම් ප්‍රීති ප්‍රමෝදයක් පෙන්වූයේ නැත. ඔහු උන්නේ තැති ගත්තාක් මෙනි. බිල්ලා ඒ ගොළුවාටද මේ ගොළුවාටද මොනවාදෝ කීවේය. මේ ගොළුවා වැඩිමනත් කතාවක් නොකළේය. එවිටම ඒ ගොළුවා අතපය විසිකර බිල්ලාටද සේදරමන් මුදලාලිටද බැණ වදින්නට විය.

ඔහු කකා සිටි වඩයක්ද කුස්සිය දෙසට දමා ගසා බිල්ලාට පහර දෙන්නටම ගියේ ඔහු බිල්ලාගේ ඈත ඥාතියකු බැවිනි. බිල්ලාද මුදලාලිද "මොකද මොකද" ඇසුවේ එකපාරටය.

"මේකා මේ කියන්නෙ අපි විහිළුවට බොරු ගොළුවෙක් දැම්ම කියල වෙන්ඩැ" බිල්ලා කීවේය. මේ ගොළුවාට බිල්ලාද තවත් අයද ඉස්සර සිට කරන විහිළුවකි. "මෙන්න මේකා කියනවා විජේ ගොළුවෙක් නෙමේ කියල."

ඒ ගොළුවා හමුවට ගොළුවන් මෙන් රඟපාන අය දමා විහිළු කරන අයගෙන් ඔහු අපමණ පීඩා විඳ ඇත.

එවිටම කුස්සිය පැත්තට යන පළමු දොර ඇරුණේය. කඩා බිඳගෙන ආවේ කෝකියාය. ඔහු අලුත් ගොළුවාගේ බෙල්ලෙන් අල්ලාගෙන ගොස් හෝටලයේ දොරකඩටම ඇදගෙන ගොස් පාරට තල්ලු කොට ආපසු එන ගමන් ගොළුවිජේගේ අතින් අල්ලාගෙන කුස්සිය දෙසට ඇදගෙන ගියේය.

"ගොළුවො හිටපියව් ගොළුවො විදියට." ඔහු කෑගෑවේ "ගොළුවන්ට ගොළුවො විදියට ඉන්න දීපියව්" කියන මෙනි. මේ අතර, ජයසුමන බිල්ලාට කුණුහරුප දෙකක් කීවේ ගොළුවිජේගේ ගොළුබව පවා අභිමි කරමින් අපහාස කිරීම ගැනය.

"ඕක ගොළුවෙක්මද කියල කවුද දන්නෙ. මං දැකල තියෙනවා ඕකා ජෝතිගෙ සින්දු යනකොට කකුල නටෝනව වූත් එකේ." බිල්ලා ඔහුට සිදුවූ නවතින්දාවෙන් ගැලවෙන්නට මෙන් කීවේය. එහෙත්, ගෝදම්බ මෝලියක් අනන අතර, ජෝතිගේ මම ගන්නෙමී කරකාර... සින්දුවට ගොළුවිජේ ඇඟ පද්දනු බිල්ලා දැක තිබුණේය. එහෙත්, ඔහු ඇත්තටම සිතා සිටියේ තවත් ගොළුවකු මූණ ගැසීමෙන් ගොළුවිජේ සතුට වෙනු ඇතැයි කියාය.

"ගොළුවකුට රඟපාගෙන මෙතෙන්ට රිංගුවද කවුද්දන්නෙ. සින්දුවක් යනකොට පැද්දෙන ගොළුවො කොහෙදින්නෙ" යි බිල්ලා කිව්වේ කෝකියාගෙන් ගොළුවාට ලැබෙන ආදර ආරක්ෂාව ගැන පිළිබඳ උපහාසය රැගත් හඬිනි.

"මේ ලියන මහත්තයා තමුසෙ දන්න මගුලක් කතා කරනව. ඒ කොල්ල සිංදුඔලට තාලෙ අල්ලන්නෙ අපි තාලෙ අල්ලනකොට මිසක් ඌට සිංදු ඇහිල නෙමේ." කෝකියා කඩා පැන්නේය.

"ඇයි මං නොදන්නව කියල හිතුවද ඒකා අල්ලන්නෙ තමුසෙගෙ තාලෙ කියල?" බිල්ලා ඇසීය.

කෝකියාගේ අතින් ගිලිහී ගිය පදමට ඇනූ ගෝදම්බ රොටී මෝලියෙන් ගුලියක් බිල්ලාගේ නාසය මත මඳ වේලාවක් ඇලී තිබී බිම වැටිණ.

සින්දුවක් අසමින් තාලෙට පැද්දෙන කෙනෙකු දෙස බලාගෙන මිසක් ගොළුවන්ට තාලෙ ඇල්ලිය නොහැකි බව ගොළුවිජේ එදින වටහා ගත්තේය.

ඔවුන් දෙන්නා පමණක් නොව, කුස්සියේ සියලු දෙනාම ජෝතිගේ මිල්ටන්ලා දෙන්නාගේ සින්දුවල තාලෙට කෑම හැදූහ; බෙදූහ; පිළිගැන්වූහ. බිල්ලා බිල්ලකු සේ තනියම බිල් ලිව්වේය.

සියලු කෑම වර්ග හදන හැටි ගොළුවිජේට උගන්වමින් ඔහු රැකබලා ගනිමින් කෝකියා තවත් අවුරුදු දෙකක් විතර එහි උන් අතර ගොළුවිජේ සහායක කෝකියා ලෙස නොනිල තනතුරක්ද ලැබුවේය. දෙදෙනා එක්ව හැදූ කෑම නිසා කුරුණෑගල බස් නැවතුම අසල වඩාත් රසකෑම ඇති හෝටලය බවට ඒ හෝටලය පත් විය.

ඒ නිසා සේදරමන් මුදලාලි කෝකියාගේ රාත්‍රී ජීවිතය ගැන අල්ලපු කඩවලටත් පැතිරුණු කුණු රහස් නොසලකා හැරියේය. එය කටකතා තරමට බරපතළ ප්‍රශ්නයක් නොව, සාමාන්‍ය දෙයක් බව රියැදුරකු ලෙසත්, කඩ සේවකයකු ලෙසත්, ගැටවර වයසේ සිට පිරිමින් අතර වැඩ කර ඇති ඔහු දනියි.

එහෙත්, තවත් දවසක නාට්‍යමය සිද්ධියක් සිදු වූයෙන් ඒ ආදර කතාවට තවත් ලුණු ඇඹුල් එක් විය. කෝකියාගේ බිරිඳ යැයි කියූ ගැහැනියක් සපත්නී රෝෂයෙන් රොස් වෙමින් පැමිණ හෝටලේ ඉදිරි දොර ළඟම ආඩපාලි කියන්නට වූවාය.

"අනේ මුදලාලි මහත්තයො ඕකව රස්සාවෙන් අස් කරල ගෙදර එවන්ඩ. ඕක මෙහෙ වෙන ගෑනියෙක් තියාගෙන ඉන්නව. වල් බල්ලා. ගෙදර ආවොත් කඩදාසිය ළිපේ දැම්මැහැ ආපහු දුවගෙන එනවා. පට්ට පඳුරු වේසිගෙ පුතා. කියපිය බලන්ඩ තොගෙ අලුත් වේසි කොහෙද ඉන්නෙ කියලා. මට හොඳවයින් දෙකක් කියල යන්ඩ."

මුදලාලි හිමින් සීරුවේ කවුන්ටරයෙන් බැස ඇවිත් ගැහැනියට කතා කරනතුරුම කෝකියා කුස්සියෙන් හෙල්ලුණේ නැත.

"මේ මනුස්සයො. නොදන්න ලබ්බවල් කතා නොකර මෙතනින් යනවා යන්ඩ. ඒ මිනිහ මේ හෝටලෙන් එහාට අඩියක් තියන්නෑ. මං ළඟ වැඩ කරන මිනිසුන්ට අපහාස නොකර යන්ඩයි කිව්වෙ."

"එහෙනං ඔය කියන පට්ට වේසි මේක අස්සට රිංගනව ඇති රැට රැට! මේක දවල්ට හෝටලේ රැට වේස මඩුව. මුදලාලි නොදන්නව උනාට බඩේ කැක්කුම දාටවත් මට ඉන්ඩ දෙන්නැති වලත්තයා බලන්ඩ එපැයැ අප්පෙ දැං සිල්ගත්ත වගේ නිවිල ඉන්න හැටි ගෙදර ගියහම. ඕක නිකං නිවෙන එකක්වැ! මං දන්නැතුවයැ."

ගැහැනිය ඔවුන්ගේ විවාහ දිවියේ තවත් නාටකීය ලිංගික රහස් හෙළිකර කියමින් යන්නට ගියාය.

කෙළින්ම කුස්සියට ගිය සේදරමන් මුදලාලි, කෝකියාට ඇඟිල්ල දිගුකොට මෙසේ කීවේය: "ආයෙ ඔය ගෑනි මෙහෙ ඇවිල්ලා කෑ ගහන්ඩ ගත්තොත් තමුසෙ ගෙදර."

මුදලාලි, ගොළුවිජේ දෙසද රවා බැලුවේය. ගොළුවිජේ බිම බලා ගත්තේ අලුත එහි ආ මනාලියකගේ ලැජ්ජාවෙනි.

එදින රෑ ටිකක් බී ඇවිස්සී සිටි වේටර් ජයසුමන ගොළු විජේගේ කනට කර "වේසි" යැයි කීවේය.

දවස් දෙකක් යන්නට පෙර පොලිස් සාජන් කෙනෙක් රාලහාමි කෙනෙකුද සමග සේදරමන් හෝටලේට ආවේ කෝකියාගේ බිරිඳ කළ පැමිණිල්ලක් විභාග කිරීමටය. ඒ හෝටලේට රෑට රෑට ගැහැනුන් රිංගන බවත්, එවැනි ගැහැනියක තමන්ගේ කසාද මිනිසා අල්ලාගෙන ඇති බවත් ඇගේ පැමිණිල්ලේ විය. කුස්සිය පිටිපස්සේ නිදන කාමර ලෙස සාදාගෙන ඇති කාමර කැලි දෙක පොලිස් සාජන්ගේ උකුසු ඇසට හසු වුවද කිසිම ස්ත්‍රියාවක හෝටලයේ වැඩ නොකරන බව සාජන් මහත්තයාට හරියටම ඒත්තු ගියේ කෑමෙන්බීමෙන් සංග්‍රහකොට ගාණක් මිට මෙල වූ පසුය. "මේ පට්ට වේසියො බොරු පැමිණිලි දානව." කොස්තාපල් බැණ බැණ ගියේය.

ඒත් සාජන් සහ කොස්තාපල් හෝටලේ ගැහැනුන් සොයන්නට සැරෙන් සැරේ එන්නට වූහ. වරක් මුදලාලිගේ නෝනා කුස්සියේ කටයුතු පරීක්ෂා කරමින් සිටින ආරංචිය 'ගෑනියක් ඉන්න' ආරංචියක් බවට පත් වී පොලීසිය පැත්තේ ගියෙන් සාජන් කඩාගෙන පැන්නේය. සාජන් ආපසු ගියේ අතට දුන් සල්ලි කොළත් මුදලාලි නෝනගෙන් සමාවත් රැගෙනය. "මේ එක එක වේසියො හින්ද නෝනලාටත් කරදරේ" සාජන් කීවේය. ඉන් පසු සාජන් සමාව ගන්නට නිතර නිතර හෝටලේ පැත්තේ ආ අතර, ඔහු සමග මිතුරු වීම හැර වෙනයම් දෙයක් කරන්නට නැති බව මුදලාලි තේරුම් ගත්තේය. සාජන් සහ මුදලාලි අතර මිත්‍රත්වය කෙතෙක්ද යත් මුදලාලිගේ ඉඳහිට කෙරෙන මධුසාදයට සාජන්ද එන්නට විය. සාජන් නිසා සාදය පැවැත්වෙන වාර ගණනද වැඩි වූයේය.

කෝකියාගේ බිරිඳ පොලීසියට පැමිණිලි කිරීමේ සිද්ධියෙන් පසු කුස්සියේ ආදර බැම්මේ පදනම දෙදරා ගියේය. ඒ ආදර කතාවේ විස්තර බිල්ලා සාජන්ගේ කනේ තිබ්බේය. "අපචාර වැඩ කරනව කියල ඕන්නං අරං ගිහිං කුට්ටම ලාච්චුවෙ දැම්මැකි කියල සාජන් සර් කියන්නෙ"යි බිල්ලා පැමිණ හෝටලේ කිව්වේය. කෝකියා හොඳටම බිය විය. තමන් දන්නා සියලු දේ ගොළුවිජේට ඉගැන්වූ ඔහු අස්වී ගියේය. පිටව යන මොහොතේ කාටත් හොරෙන් "මල්ලියෙ හොඳට වැඩකරගෙන හිටපං"යැයි කොළේක ලියා පෙන්වූ ඔහු ගොළුවිජේගේ නළලද වරක් සිඹ පිට වී ගියේය.

හිටපු කෝකියා සහ මුදලාලි අතර ගිවිසුමක් තිබුණාක් මෙන් ගොළුවිජේ මහකෝකි තනතුර ලද්දේය. කෝකි තනතුරෙහි බලය කොතෙක්ද යත් ඔහු වයසින් බාල වුවත් රෑට හෝටලේ නිදා ගන්නා කිසිවකුටත් ඔහු වෙත තවදුරටත් කායික ආක්‍රමණ කිරීම අමාරු විය. ඔහු තනතුරෙන් උසස් කෙනෙකු වූ නිසාය. අනික නික්ම ගිය කෝකියා වූ සිරි අය්යාට වැනි ආදරයක් අන් කිසිවකු වෙත ගොළුවිජේගේ සිතේ ඇති වූයේද නැත. ඒ නිකමුන්ගෙන් ඉගෙන ගන්නටද කිසිවක් නැතිව කිසිම ඇල්මක් ආලයක් ඇති නොවේ. ගොළුවිජේට බෝවී තිබූ ඉකිලි කැසිල්ලට සිල්වා සාප්පුවෙන් බෙහෙත්ද ගෙන සනීප වූ පසු තමාගේම නිදන කාමරයක් පොඩියට හදාගෙන, එය අස්පස් කරගෙන කෝකි තනතුරෙහි වැඩ කරමින් ගොළුවිජේ ගෙව්වේ තෘප්තිමත් ජීවිතයකි. කෝකි තනතුරු ලැබීමෙන් පසු රාත්‍රියට හෝටලේ වැසීමෙන් පසු නාගෙන කරගෙන ටවුමේ ගැවසීම ඔහුගේ පුරුද්දක් විය. අලුත් තනතුර වැදගත් වෙනසක් ගොළුවිජේ තුළ ඇති කළේය. එය නම් ඔහුගේ කුලෑටිකම මැකීගොස් පිරිමි කඩවසම්කමක් මතුව ඒමයි. එය කෙතෙක්ද යත් ගොළු විජය කුමාරතුංග යැයි සමහරු ඔහුට කීහ. විජයගේ චිත්‍රපට එකක් නැර බැලූ ගොළුවිජේ ගමනබිමනද ටිකක් විතර ඒ ජනප්‍රිය නළුවාගේ ඇවිදීමේ රිද්මය ගත් බව ඇත්තකි. එය දැන් පවා ඔහු වෙත දැකිය හැකිය.

හැන්දෑවට එළිමහනට විත් නගරයේ ඇවිදින්නට පෙර ඔහු කළ පළමු කාරිය අම්මා සිහි කර බෝගහ ළඟ පහනක් පත්තු කිරීමයි.

ටීචර්

ඒ සෙනසුරාදා රාධා ආවාය.

බැස යන හිරු රැස් ඇතුගලේ ඇතාගේ බඳෙහි කළුගලෙහි කළු බවද ගල් බවද රන්වන් මුදුමොලොක් ආලෝකයකින් මොලොක් කර තිබිණ. කුරුණෑගලට වැටෙන ගිනි කන අව්ව නිමී සැහැල්ලුවෙන් ඉන්නට හැකි මඳ රස්නයක් එකතු වන වෙලාවය ඒ.

සුපුරුදු පරිදි ඇගේ බෑග්එක ගන්නට එඩ්මන්ඩ් ගේට්ටුව ළඟ උන්නේය. ඇතැම් ඉන්ටර්සිටි බස් කුරුණෑගල කිට්ටු වන විට "බලගල්ල වලව්ව බහිනවද" කියා අසන බව මම දනිමි. මා ගැටවර කල කොළඹ සිට එන විට ඒ වැකිය ඇසෙන විට අමුතු ආඩම්බරයක් මගේ හිතේ ඇදී ගියේය. ඒ ප්‍රයිවේට් බස් අවධියද නොවේ. ලංගම බස් කොන්දොස්තරලා එසේ කියන විට මුළු ලංගමයම බලගල්ල වලව්ව ගැන දැන සිටින්නාක් සේ මට දැනිණ. එහෙත්, පසු කලෙක "බලගල්ල වලව්ව බහිනවද" යන්න මා තුළ ඇති කළේ අකැමැත්තකි. එය වරදකාරී හැඟීමක් මුසු වූ ආඩම්බරයකි. ඒ මගේ සමාජ විඥානය වර්ධනය වෙමින් පැවති කාලයයි.

"බලගල්ල වලව්ව බහිනවද" යන්න රාධාට මුලින්ම ඇසුණ දා ඇගේ රැඩිකල්කම්ද මකාගෙන ඒ ගැන ආඩම්බරයක් මතු වූ මුහුණින් ඒ ගැන මා සමග කීවාය.

දැන් එඩ්මන්ඩ් සමග එන ඇයගේ මුහුණේ ඇත්තේ එදා තිබුණු ආඩම්බරයයි.

"ඔන්න හාමු මහත්තයා අදත් බලගල්ල වලව්ව තමයි බැස්සෙ." රාධා කියයි. ඇගේ සිංහල එලකියුෂන් පන්තියකින් ඉගෙනගත් සිංහලයක් වැනිය.

"ඔහොම්මම තමයි මැඩං කියන්නෙ. අපිත් එහෙම කියල තමයි බස්සගන්නෙ. ආයෙ ඉතිං ගේට්ටුවටම අල්ලල නවත්තල දෙනවා." එඩ්මන්ඩ්ගේ මුහුණේ ආඩම්බරය කොතෙක්ද යත් ඔහු බලගල්ල නම් වලව්වක අයිතිකාරයකු සේය.

"ඔය ඉන්නෙ ඔය වැඩේ පටන්ගත්තු කට්ටිය තමා" මම එඩ්මන්ඩ් දෙස රවා බලමි.

"බලගල්ල වලව්ව බහිනවා කියල තමයි කවුරුත් කියන්නෙ." එඩ්මන්ඩ් බිම බලාගෙන කියයි.

"බලගල්ල වලව්ව බහින එක නම් ඇත්ත තමා." මම කියමි. බස් එකෙන් බහින අය ඇත්තටම කියන්නේ මා සහ උරුමය කඩා වැටෙමින් තිබෙන්නේද යන්නදැයි ක්ෂණික සැකයක් මට ඇති වෙයි.

"හාමු මහත්තුරු දැනගන්න ඕනෙ එව්ව නග්ගල ගන්න. නේද එඩ්මන්ඩ්?" රාධා ඇගේ අතේ වූ අනික් බෑගයත් ඔහුට දෙයි. ඔහු ඒවා ඈ පැමිණි විට සිටින අමුත්තන්ගේ කාමරය වෙත යයි.

රාධාද මා වරක් වැළඳ "කොහොමද" අසා එඩ්මන්ඩ් පසුපස ගියාය.

"ටොයිලට් එහෙම තියෙන බස් ජාතියක් ලංකාවට කවද එයිද දන්නෑ" ඇය ආපසු හැරී මට ඉංග්‍රීසියෙන් කීවේ ආ විගසම කාමරේට යන්නේ ඇයිදැයි මට අඟවන්නට මෙනි.

ඈ සාලයට එනතෙක් මම බලා සිටියෙමි.

ඇය එහි එන විට මම සෙනසුරාදා අයිලන්ඩ් පුවත්පත පෙරළාගෙන උන්නත් මා සිටියේ ඇය ගැන කල්පනා කරමිනි.

"පත්තරේ පෙරළගෙන මොනවද කල්පනා කරන්නේ?" ඇය ආවාය.

සැහැල්ලු කපු කලිසමකට ළා දුඹුරුපාට සැහැල්ලු කමිසයක් හැඳසිටි ඇය ගෙල තෙක් වැටෙන හිස කෙස් මනාව පීරා සිටියාය. සිහින් උපැස් යුගල ඇයට එක් කළේ ඇතැම් නිව්යෝකර් සඟරාවල මා දැක ඇති බුද්ධිමත් කෙල්ලන්ගේ පෙනුමකි. කුමක්දෝ නොකිව හැකි හේතුවක් නිසා ඇය අවිවාහක බව ඇගේ පෙනුමේද ලියැවී තිබිණ. "මා පොලඹවාගත හැක්කේ බුද්ධිමත් වූද ආකර්ෂණීය වූද පිරිමියෙකුට පමණී" වැන්නක් ඇගේ මුහුණේ කවදත් ලියැවී තිබිණ. එහෙත්, ඈ සැම විටෙකම පෙමින් වෙළුණේ ඒ පෙනුමෙන් ඇරයුම් කෙරෙන ආකාරයේ පිරිමින් සමග නොවේ.

ඇය රවුම් වේවැල් පුටුවේ වාඩි වී දෙපා උඩට ගෙන පද්මාසනයෙන් හිඳ ගත්තාය. ඇගේ දෙපාවලින් මුදන ලද රෝස පැහැති රබර් සෙරෙප්පු දෙක පුටුව අසල තිබුණේ එකිනෙක අසල වැටුණු මල් පෙති දෙකක් මෙනි.

ගෙදරක ස්ත්‍රියක ගැවසීම නිසා එක් වන පුංචි පුංචි සුන්දරතා මට හදිසියේ සිහිපත් විය. නැතිනම් ඒ මා පුංචි පුංචි දේවල් වෙත ප්‍රක්ෂේපණය කරන සුන්දරතාද?

"ගැනියක් ළඟින් ඉඳගත්තාම කල්පනා කරන්න පටන් ගන්නවා" රාධා කීවාය.

මට සිනාගියේය.

"මම ගැනු තේරුම් ගන්නෙ සමීපරූපවලින් නෙමේ දුරස්ථ රූපවලින්. විශාල කැන්වස් එකකට දුරස්ථ කරලා."

"ඔව් එතකොට පුළුවන්නෙ ගැනියක්ව දූවිල්ලක් ගානට ක්ෂුද්‍ර කරන්න. ඔයාගෙ කැන්වස් එක ඇතුළෙ මං දැන් ඉන්නවා ඇත්තෙ පොඩි දූවිලි කැල්ලක් ගානට. පණ නැතුව. ජීවිතයක් නැතුව." රාධා නාට්‍යමය වශයෙන් කීවාය.

ඇය ක්ෂණික බුද්ධිමය චතුරකම් කළ හැකි වේගවත් මනසින්ද වේගවත් මුවකින්ද යුතු ගැහැනියකි. අපේ දිගුකාලීන මිතුරුකමේ පදනමද එයයි. එහෙත්, ඇය මෝඩ සිනමා නළුවකු හා පෙමින් වෙළුණේ ඇයි?

"බන්දු. " ඇය මා සිටි පුටුව දෙසට නැමී මා නින්දෙන් ඇහැරවන්නට මෙන් ඇගේ වම් අත මගේ මුහුණ ඉදිරියෙන් එහා මෙහා කළාය.

එවිට ගේට්ටුව දෙසින් මෝටර් රථයක එළියක් විත් ගස්වල හෙවණැලි අප මත පතිත කළේය.

"ංආ ටීචර් ඇවිල්ල ඉන්නෙ." දොස්තර සමරසේකර සාලයට එමින් කීවේය.

"ටීචර්! කමෝන්!" රාධා අත වැනුවේ 'මට රාධා කියන්න බැරි තමුසෙට පිස්සුද' කියන්නාක් මෙනි.

දොස්තර සමරසේකර සිනාසී වාඩි වූයේය.

"දුව කියනව-මටත් කියවෙනවා." ඔහු සිංහලෙන් කීවේය.

"මටත් ඔසරියක් ඇඳලා කොණ්ඩෙ බෝලයක් බැඳලා එන්න තිබුණෙ." රාධාද සිංහලට බැස්සාය.

"ඒ කිව්වෙ?"

"ඇයි ටීචර් කිව්වම ඔළුවට එන්නෙ එහෙම ගැනියෙක්නෙ. මේ දැන් බුදු සාදුට මල් තියල ඇවිල්ලා මහත්තයගෙ පුටුවට ටිකක් ඈතින් වාඩි වෙලා ඉන්න ටීචර් කෙනෙක්."

ඇගේ උපහාස වචන නිසා මට මගේ අම්මා සිහි විය. එහෙත්, මගේ මතකය උපහාසයෙන් තොර ආදරණීය මතකයකි. මා මතකය වෙත පාවී ගොස් සිටියදී දෙදෙනා අතර යම් යම් දේ කතා වෙනවා මට ඇසිණ.

සිය දියණියගේ එලකියුෂන් ටීචර් හැටියට රාධා හඳුනාගත් දොස්තර සමරසේකර අවස්ථා කිහිපයකදීම ඇගේ සෞඛ්‍ය ප්‍රශ්නවලටද උදව් කළේය. දැන් ඇගේ පෞද්ගලික වෛද්‍යවරයා වන්නේද ඔහු මාර්ගයෙන් හඳුනාගත් කෙනෙකි.

"මෙහෙමයි. වික්‍රමසිංහගේ කතාවෙන් ටිකක් මං බන්දුට කියල තියෙනවා." දොස්තර සමරසේකර කීවේය.

මම ඒ කතාව රාධාට සැකෙවින් විස්තර කළෙමි. රාධා අසාගෙන සිටියේ කතන්දරයට ගිජුකමෙන් මිස අපගේ වගකීම ගැන උනන්දුවෙන් නොවේ යැයි මම සිතුවෙමි.

"ලංකාවෙ දැන් ඉන්න හොඳම ඊඑන්ටී ස්පෙෂලිස්ට්ලා වික්‍රමසිංහව බැලුවා. උගුර, කන, නාහේ කිසිම තැනක ප්‍රශ්නයක් නෑ. කන් බෙරවල හිල් තියෙන එක විතරයි. ඒකත් අපි සර්ජරි එකකින් හැදුවා." දොස්තර සමරසේකර ඌණපූරණය කළේය.

"අවුරුදු හත අටකට කලින්?" රාධා පුටුව මත හරිබරි ගැහුණේ කුතුහලයේ සර්පයා ඇගේ සිරුර තුළ දරණු ගැසුණාක් මෙනි.

"අපිට ඉන්න හොඳම සයිකියැට්‍රිස්ට්ලා මෙයාව බැලුවා. හොඳම කියන්න පුළුවන් එක්කෙනා මගෙ යාළුවෙක්. එයා කතන්දරේ දන්නවා නමුත් හේතුව දන්නෑ."

"ඩොක්ටර්ස්ලා කවුරුත් හිතනවා කාලයක් වොයිස් ට්‍රේනිං කෙරුවොත් කටහඬ එයි කියලා." මම එකතු කළෙමි. ඒ සම්බන්ධ සියලු කරුණු මා ඇයට දුරකථනයෙන්ද කියා තිබිණ.

"වොයිස් ට්‍රේනිං කරන්න වොයිස් තියෙන්න ඕනෙනෙ. මේක මාර උගුලක් - කවද ගැලවෙයිද කියන්ඩ බැරි."

රාධා දෙපා බිම තබා ඒවා රෝස පාට සෙරෙප්පු තුළට රිංගෙව්වාය.

"හොඳට ගෙවනවා." දොස්තර සමරසේකර අනවශ්‍ය දෙයක් කීවේය.

"මනි ඉස් නොට් එව්රිතිං. ඉස් ඉට් ඩොක්ටර්?" රාධා නැගිට කාමරය දිහාට ගියාය.

දොස්තර සමරසේකර මා දෙස බැලුවේ ඇය සංවාදය අතහැර යන බවක් සිතූ ලෙසිනි. ඇය යන්නේ සංවාදයට අවශ්‍ය දෙයක් රැගෙන ඒමට බව ඇය යන ඉරියව්වෙන් මම දැනගතිමි. පුංචි පුංචි ඉරියව්වලින් පවා ඇගේ සිත කියවන්නට මට හැකිවීම ගැන මට ආඩම්බරයක් ඇති විය. මා කොපමණ සියුම්ව ඇය

දෙස කොතරම් බලා සිට ඇත්ද යන්න ඉන් පෙනෙන බව මට සිතිණ.

රාධා නැවත එන විට ඇගේ ස්ත්‍රී රූප ශෝභාව වෙනුවට බරපතළ චින්තිකාවක් ඈ මත ආරෝපණය වී සිටියාය.

ඈ අත පොතක් විය.

ඇය බැරෑරුම් ලෙස වාඩි වී උපැස් යුගල පොත වෙත එල්ල වෙන ලෙස සැකසුවාය.

"ඔය ඉන්නෙ ටීචර්!" මම කීවෙමි.

"ෂට් අප් බන්දු." කී ඇය පොත පෙරලා තැනක් දෙකක් තේරුවාය.

"සමහර විට මානසික හේතු නිසා කතා කරන්නට බැරි අයට අභ්‍යාසවලින් කතා කරන්න පුළුවන් වෙන්න පුළුවන්. නමුත් ඒකට ගොඩක් මනෝවිද්‍යාත්මක නාට්‍ය අභ්‍යාස කරන්න වෙයි. එහෙම අභ්‍යාස මොනවද කියල අපිටත් ඉගෙනගන්න වෙනවා ඔක්කොටම ඉස්සරලා." ඇය කිව්වේ අභියෝගය භාරගන්නේද නොගන්නේද යන්න ඇපැහැදිලි ආකාරයකටය.

"ඉතිං ඒකනෙ ඔයාට වැඩේ බාරදෙන්නෙ."

"මං විතරක් නෙමේ බන්දුත් වැඩ කරන්න වෙනවා. ලන්ඩන් ගිහිං ඩ්‍රාමා ඉගෙනගත්ත රදල පුතාලට ඔන්න දැන් තියෙනව වැඩ." ඇය නැවත දෙපා පුටුවට ගෙන පොතේ තවත් තැනක් දෙකක් හෙව්වාය. ඇගේ මුහුණේ සිනාවක් ඇඳී ගියේය.

එය අලංකාර සිනාවක් විය. ඒ අලංකාරයට වශී වී සිටි දොස්තර සමරසේකරගේ වගියේ තරම මා දුටු බව දැක ඔහුගේ මුහුණ රතු විය. රාධා උගන්වන දවස්වලට දොස්තර සමරසේකරම සිය දියණිය පන්තියට රැගෙන එන්නට තැත් කරන බව මම දනිමි.

රාධා මේ කාරණයේදී අප සියලු දෙනාම සියුම් සරාග දැලක පටලවා ඈ වෙත බැඳගැනීම හොඳය. යමක් සාර්ථක වීමට නම් ඒ සරාග දැලෙන් අප එකිනෙකා වෙත බැඳිය යුතුය.

අපේ සිරුරුවල දුවන්නේ වෙන් වෙන්ව දුවන ලේ වුවද, ඒ ලේ එකම උණුසුමකට එන්නේ එවැනි සරාග රස්නයකට අප කවුරුත් එකට හසු වූ විටය. ලන්ඩනයේ අප ගත කළ බොහීමියානු ජීවිතය තුළ කවරක් නැති වුවත් ඒ සියුම් සරාග බන්ධනය පැවතියේය. එය එකිනෙකා වෙත කායික ප්‍රේමයෙන් හොඳටම ළං වන එහෙත්, නොගැටී ඇත් වන විද්‍යුත් බන්ධනයක් වැනිය. රාධා යනු සිය සමස්ත පැවත්මෙන්ම එවැනි මන්ද සරාගයක විද්‍යුත් චුම්බන ආකර්ෂණයක රශ්මිය විහිදුවන සුන්දර ස්ත්‍රියකි. ගැඹුරු මිත්‍රත්වයක් සරාගී ළෙන්ගතුකමක දැවටූ මිතුරියකි.

"හරි හරි අපි මාස කීපයක් ට්‍රයි කරමු. හැබැයි මං වැඩේට කැමැති වෙන්නෙ මිනිහ කවුද බලලා."

රාධා පොත වැසුවාය.

"හරි ඒ තීරණේ රාධා ටීචර්ගෙ." දොස්තර සමරසේකර කීවේය.

"අගේන්! ටීචර්!" ඈ සිය අත් ගුවනට විසි කළාය.

එවිටම නිසාන් බ්ලූබර්ඩ් රථයේ දැවැන්ත හෙඩ් ලයිට් මිදුලේ පිච්ච වැල්වල හෙවණැල්ල රාධාගේ කමිසය මත පතිත කළේය. අපේ මිදුලට ඇතුළු වීමට ඇති එක් තැනක යකඩ ආරුක්කුව වසාගෙන පිච්ච වැල් ගොන්නක් වැවී ඇත.

විජය වික්‍රමසිංහ පසුපසින් වික්‍රමසිංහ මැතිණියද ආවාය. ඈ වෙතින් දිස් වූයේ රාධා කලින් විස්තර කළ ගුරුවරියගේ ස්වභාවයයි.

"ටීචත් ඇවිල්ල ඉන්නෙ." ඇය කීවාය.

රාධා මා දෙස යන්තමින් බලා මඳ සිනාවක් පෑවාය.

"මහත්තයයි මායි කීපසැරයක් ඇවිල්ලා පාරෙ අයිනෙ කාරෙක නවත්තන් බලන් ඉඳල තියෙනවා ටීචර් උගන්නනවා." වික්‍රමසිංහ මහත්මිය කීවාය.

මම ඔවුන්ට වාඩිවෙන්නට පුටුව දෙසට අත දික් කළෙමි.

වික්‍රමසිංහ සිය බිරිඳගේ උරහිසට තට්ටු කොට කිසිවක් ගොළු බසින් කියමින් අත දික් කළේ අතීතය දෙසට බව මටද අවබෝධ විය.

"ඔව් මහත්තය කියනවා ටීචර්ලගෙ නාට්ටිත් බලල තියෙනවා කියලා. අවුරුදු දෙකකට විතර කලින්." වික්‍රමසිංහ මහත්මිය සිය සැමියාගේ භාෂාව සිංහලට නැගුවාය.

"ටෙම්පස්ට්?" රාධා ඇසුවාය.

මා දෙස ගෞරවයෙන් යුතු සිනාවක් බෑ වික්‍රමසිංහ රාධා "ටෙම්පස්ට්" යැයි කියන විට ඈ දෙසට හැරුණේ "අන්න හරි" යි කියන්නාක් මෙනි. එයා මා පුදුම කළ අවස්ථාවක් වූයෙන් පසු කලෙකද මට ඒ අවස්ථාව වරින් වර මතක් විය.

විජය වික්‍රමසිංහ, දොස්තර සමරසේකර දෙසට හැරී කුමක් හෝ කියන්නට තැත් කළේය.

"වීෆ් ගෙස්ට්" රාධා ඇසුවාය. එය ප්‍රශ්නයක් නොව, තමාටම කියා ගැනීමක් වුවත් වික්‍රමසිංහ මැතිනිය හිස වැනුවාය. කඩවසම් පෙනුමක් ඇති ප්‍රධාන අමුත්තා කතා කරන්නට බැරි කෙනෙකියි යන්න වේදිකාව පිටුපස කතාවට ගැනෙද්දී ඉංග්‍රීසිය පැත්තකට දමා "පව් අනේ" යනාදී සිංහල වචන භාවිත වූ බව රාධාට මතකය.

වික්‍රමසිංහ නැවතත් ඈ දෙසට හැරී "අන්න හරි" යැයි අතින් කිව්වේය.

දෙවසරකට පෙර ප්‍රධාන අමුත්තා රුපියල් විසිදහසක චෙක්පතක් දී තිබුණෙන් නාට්‍යයේ වියදමින් විශාල කොටසක් වහා පියවිණ. භාෂා පාසැලේ වැඩට මගේ මුදල් වැය වීම ගැන රාධාගේ කනගාටුව ඒ නිසා පහව ගිය බව මට මතකය. එය ලක්දාස් මහා විද්‍යාලයේ දරුවන් යොදාගෙන කළ නිෂ්පාදනයකි. රාධාගේ මූලිකත්වයෙන් නාට්‍යය නිෂ්පාදනය කරන්නට මැදිහත් වූයේ මාය.

"මිස්ටර් වික්‍රමසිංහට ඇහෙනවනෙ?" රාධා ඇසුවේ දොස්තර සමරසේකරගෙනි.

"යාන්තං ටිකක් ඇහෙනව වගේ පේනවා ඔපරේෂන් එකෙන් පස්සෙ. ඉස්සරනං ඇහුනෙම නෑ. අපේ ඩොක්ටනෙ කෙරුවෙ," වික්‍රමසිංහ බිරිඳ කීවාය.

විජය වික්‍රමසිංහ දෝංකාරය ගැන කීවේය.

"ඊව අපිට මේ උදව්ව කරල දෙනවනං පුදුම පිනක්. කටහඬ විතරනෙ අපේ මහත්තයට අඩු." ඇය නැවත කීවාය.

විජය වික්‍රමසිංහ ඇගේ උරහිසට නැවත තට්ටු කොට ගොළු බසින් යමක් කීවේය.

"මහත්තෙයා කියන්නෙ ඉතිං කතා කරන්ඩ බැරි උනාට හොඳට බිස්නස් කරපු හැටි. කුරුණෑගල තියෙන හොඳම හොස්පිටල් එක හැදුවනෙ. මේ ඩොක්ට ඉන්නව ඩිරෙක්ට බෝඩ් එකේ. එංගලන්තෙන් ජර්මනියෙන් හිටං මැෂින් ගෙන්නුවා." බිරිඳ පරිවර්තනය කළාය.

"එංගලන්තෙන් හිටන් මැෂින් ගෙන්නුවා" කියද්දී විජය වික්‍රමසිංහගේ අත දිගු වූයේ මා දෙසටය. මා එංගලන්තයේ නියෝජිතයා වූවාක් මෙනි.

රාධා ඔහු සමග ගොළු බසින්ද කතා කළාය. ගොළු බස යනු සුන්දර භාෂාවක් බව පළමු වරට දැක්කාක් මෙන් විජය වික්‍රමසිංහ රාධා දෙස බලා සිටියේය.

අවසානයේ රාධා මෙසේ කීවාය: "අපි කතා කරල කියන්නම් මේක පුළුවන්ද බැරිද කියලා."

"අනේ බෑ කියන්ඩනං එපා ඊව." වික්‍රමසිංහ බිරිඳ බැගෑපත් හඬින් කීවාය.

"හරි හෙට පටන්ගමු." රාධා නැගිට්ටාය.

"අනේ ඊවර් අර ළමයි එක්කම මහත්තය නොදා අපේ ගෙදර වගේ බැරිද?"

රාධා මා දෙස බැලුවේ ඇයට තනිව උත්තර දිය නොහැකිවය.

"අපි කතා කරල කියන්නම්" රාධා කීවේ මා කිසිවක් නොකී නිසාය.

වික්‍රමසිංහ යුවළ පිටත්ව ගියේ අප තිදෙනා වෙතම බැගෑපත් වූද ගෞරවයෙන් යුතු වූද බැල්මවල්ද සිනාවල්ද ප්‍රදානය කරමිනි. නගරයේ ප්‍රධානම ධනවත් යුවළකගේ ලක්ෂණ ඔවුන්ගේ හැසිරීමෙන් නොදැකිය හැකිවීම මගේ ප්‍රසාදය පිණිස විය. නගරයේ ධනවත් දොස්තරවරුන්, නීතිඥවරුන් ආදීන් වෙත මා දැක ඇති ව්‍යාජ ආටෝප මේ දෙදෙනා වෙත නොවීම අදත් මගේ සිත් ගනියි.

"ඊවර් ගොළු උනානං හොඳයි කියල හිතුණ ගොළු භාෂාව කතා කරනකොට." දොස්තර සමරසේකර කීවේය. මටත් එවැනි සිතිවිල්ලක් ඇති වුවද ඊට වැඩි වැදගත් සිතිවිලි මගේ හිතේ ඒ වෙලාවේ තිබිණ.

"ගෑනු ගොළු වෙනව නම් පිරිමි හරි කැමතියි." රාධා වහා කිව්වාය.

දොස්තර සමරසේකරගේ උත්තර නැති මුහුණ බිමට යොමු විය.

"මට එහෙ යන්න නම් බෑ." රාධා කීවාය.

"බන්දුට යන්නත් බෑනෙ. අපි මෙහෙ තැනක් ගමුද?" දොස්තර සමරසේකර කීවේය. රාධා එහි යන්නට අකැමැති වීමත් මා එහි නොයායුතු යැයි දොස්තර සමරසේකර තීරණය කිරීමත් එකම හේතුව නිසා උපන්නක් නොවන බව මම දනිමි. දොස්තර සමරසේකර ඉඟි කරන්නේ මගේ චලච්කාරකමට බව මම දනිමි. අපේ නෑදෑයන් අතරට බින්න විවාහයක් ඔස්සේ එක් වී සිටින ඔහු අපේ නම්බුව අපටත් වඩා කරට ගෙන සිටියි.

"අන්න හොඳයි ඩොක්ටර්. මට බඩගිනියි." රාධා නිවේදනය කළාය.

"රෙඩ් වයින්?" මම ඇසුවෙමි.

"හරි රෙඩ් - ඉතිං ඩොක්ටර් කියන්නකො බලන්න කතාවෙ ඉතුරු ටික."

රාධා පුටුවේ හරිබරි ගැසුණාය.

ලියුම් ගනුදෙනු

සේදරමන් හෝටලයේ ප්‍රධාන කෝකි තනතුර ලැබෙන විට ගොළුවිජේට යන්තම් අවුරුදු විසි එකකි. හිටපු කෝකියා වූ සිරි අය්යා ගොළුවිජේට සියල්ල උගන්වා තිබිණ. සූප ශාස්ත්‍ර යනු ගොළුවෙකුට ඉතා පහසුවෙන් උගත හැකි ශාස්ත්‍රයක් බව ගොළුවිජේ ඉක්මනින් වටහා ගත්තේය. ඒ නිසා ඒ ශාස්ත්‍රය වෙත ප්‍රවේශ වූයේ ගොළුවෙකුගේ විඥානයෙනි.

තමන් උගන්වන්නේ ගොළුවෙකුටය යන කාරණය විශ්වාසයෙන් ගත් සිරි අය්යා කිසිවක් භාෂාවෙන් විස්තර නොකර කරන්නට සැලැස්සුවේය. ඉවීම යනු කරලාම මිස කියවලා හෝ අහගෙන හෝ ඉගෙනගත හැකි දෙයක් නොවේ. විජේ මල්ලි අතින් යමක් වැරදුණොත් සිරි අය්යා එය පිළිසකර කොට සකස් කළේ අලුත්ම රසයක්ද එන පරිද්දෙනි. එහෙත්, ගොළුවිජේට එකල සිටම දීර්ඝ කාලීන ප්ලෑන් තිබුණු නිසා අභ්‍යාස පොතක් ගෙන කෝකියා කරන දේ පියවරෙන් පියවර ලියා ගත්තේය. සිරි අය්යාද ඔහු හදන කෑම වට්ටෝරු ඔහුගේම නිර්මාණශීලී එකතු කිරීම්ද සමග ලියා දුන්නේය. වෙද අකුරුවලටත් වඩා ඇද අකුරින් කෝකියා ලියූ කෑම වට්ටෝරුද අවුරුදු දාසයේ පමණ සිට ගොළුවිජේ ලියාගත් කෑම වට්ටෝරුද සහිත සටහන් පොත් කෝටිපති විජය වික්‍රමසිංහ සතුව තවම තිබෙනු රාධා පසු කලෙක දැක්කාය.

අලුත් ගොළු කෝකියාගේ දක්ෂකම් කෙතෙක්ද යත් සේදරමන් හෝටලේ සමග තරගෙට සිටියේ ශ්‍රී රාම් සයිවර් කඩේ පමණි. ඒ නිසා හෝටල් දෙක එක ළඟ සිට එකිනෙකා හා තරග කළේය. කලෙක එකම නෑදෑ කට්ටියට අයිතිව පැවැති ඒ හෝටල් අතර තරගය ඉස්සර සිටම පවතින්නක් වුවද දැන් එය සිංහල කෑම සහ දෙමළ කෑම අතර තරගයක් මෙනි. කටට සැරට මස් මාළු කන්නට ඇති සේදරමන් හෝටලය ශ්‍රී රාම් පරදවා ලෙහෙසියෙන්ම ඉදිරියට ගියේය. එය කොතරම්ද යත් ශ්‍රීරාම් බංකොලොත් වුවහොත් එයත් කුලියට ගෙන සේදරමන් හෝටලය ලොකු කරන හැටි ගැන කුස්සියේ කතා පවා ඇති විය. ඒවා මුදලාලිගේ පරිකල්පනයෙන් හෝ අනුබලයෙන් හෝ තොරව ඇති වූ කතාය.

ගොළුවිජේ කෝකියා වූ පසු සේදරමන් හෝටලය කුරුණෑගල නගරයේ නිතර ගැවසෙන රියැදුරන් වැනි අයගේ පමණක් නොව, උසාවිය, මහරෝහල, වැනි රජයේ ආයතනවල මහත්තුරුන්ගේද කනබොන තැන බවට පත් විය. කටට දැනෙන රස කටින් කට ගිය නිසා කාර්යාලවල නෝනාවරුද ලන්ච් පැකට් ගෙනියන්නට කාකාසලා එවූහ. නැත්නම් 'කාල යන මහත්තුරු' නෝනලාටද පැකට් අරන් ගියහ. එපමණක් නොව, සේරදමන් බත් එක කුරුණෑගලට පිටපළාත්වලින් එන කවුරුත් කන බතක් බවටද පත් විය. බරපතළ රෝගී තත්ත්වයකින් පසු සුවවීගෙන එන රෝගීන්ට හොඳ පණ ගෙන දෙන කෑම වේලක් බවටද සේදරමන් කෑම පාර්සලය ප්‍රසිද්ධ විය. කටේ අප්පිරියාව ඇති අලුත වැදූ අම්මලාටද සේදරමන් බත් එක අල්ලලා ගියේය. ගොළුවිජේගේ පීකුදු බැදුම හෝ කුකුල් අඹගෙඩි තෙම්පරාදුව 'ස්පෙෂල්' ලෙසට ගෙන බත් පාර්සලයට එක් කර ගත් විට අලුත වැදූ අම්මලාටත්, ලොකු 'ඔපරේසං ඔලින්' පසු යළි පණ ගසා එන්නට තැත් කරන රෝගීන්ටත් හොඳය යන කතාවක්ද තිබිණ. ජොනී ප්‍රනාන්දු බාර් එකෙන් බොන්න එන මිනිස්සුද ගොළුවිජේගේ බයිට්වලට හුරු වූහ. සේදරමන් එකෙන් බයිට් එකක් දාගෙන ගොස් ප්‍රනාන්දු බාර් එක ළඟ තියාගෙන "හවුලක් හවුලක් සේදරමන් බයිට් එක්ක හවුලක්" කියා බෙදාගෙන බොන්නට නාඳුනන අයට ආරාධනා

කරනු දකින්නට ලැබිණි. කලින් ගොළුව පැවති හෝටලයක් අලුත් කටහඬක්ද අලුත් භාෂාවක්ද ලද්දා සේ විය.

සේදරමන් මුදලාලි ගොළු කොල්ලා ඇවිත් අවුරුදු දෙකක් යන විට තමාම ඇප වී මහජන බැංකුවෙන් පොතක් අරන් දී ගොළුවිජේගේ පඩිය පොතට දාන්නට පටන් ගත්තේය. ඔහු ගොළුවිජේ අතට දුන්නේ අතේ වියදමට පමණි. ගෙදරට සල්ලි යවන්නට ඕනෙදැයි මුදලාලි ඇසූ විට ගොළුවිජේ ගොළු ඔළුව වැනුවේය. එය "ඔව්" වැනිල්ලක්ද "එපා" වැනිල්ලක්ද යන්න අතරට වැටුණු වැනිල්ලකි. මුදලාලි එය ගත්තේ "එපා" කියන ගානටය.

කෝකියාගේ වැඩ යනු දවස පුරා පවතින වැඩ නොවේ. අනපේක්ෂිත තරම් විශාල සෙනගක් ආවොත් මිස වේලෙන් වේල ඉවීම් අතර සැහෙන විවේකයක් ඇත. ගොළුවිජේ වේලට අවශ්‍ය කෑම උයා අමතර කෑමද අවශ්‍ය වෙතැයි සිතෙන පමණට සාදා විවේක ගනියි. දවසට අවශ්‍ය වෙතැයි සැලකෙන කෑම ප්‍රමාණය ගැන හොඳ අනුමානයක් කිරීමේ ශක්තියක්ද ඔහුට තිබිණ. ඇතැම් දවසක ඔහු බස් නැවතුම්පොළ පැත්තේ රවුමක් ගසා පැමිණ එහි ගැවසෙන සෙනග ප්‍රමාණය අනුව උයන ප්‍රමාණය වැඩි කරයි. ඒ අමතර කෑම ඉතිරි වන්නේ එහෙමත් දවසකය. ගොළු කොල්ලාට ව්‍යාපාර පිළිබඳ ගුප්ත යැයි කිව හැකි ඉවක් තිබුණු බව සේදරමන් මුදලාලි විශ්වාස කලේය.

දවල් කෑම ඉවීමෙන් පසු සාමාන්‍යයෙන් පැය දෙකක පමණ විවේකයක් ගොළුවිජේට ලැබේ. ඔහු ඒ පැය දෙකේදී යන එක්තරා ගමනක් ඇත. ඒ මීගමු පාරේ ජීවනී සිංහල බෙහෙත් බඩු කඩේ ළඟ පදික වේදිකාවේ පොලිතීන් කැල්ලක හෙවණේ එළවළු විකුණන ගොළු මුදලාලි දෙස බලා සිටින්නටය. එතෙක් කුරුණෑගල ගත කළ අවුරුදු ගණනාවම ගොළුවිජේ ගෙවිවේ 'කඩ කුස්සි' ජීවිතයකි. නගරයේ කඩවල පිටුපස යනු දෙවැනි ලොවකි. ඕනෑම නගරයක කඩසාප්පුවල අලංකාර ඉදිරි පසට නොපෙනෙන අඳුරු ජීවිතයක් ඒවායෙහි පිටුපස පැත්තේ ඇත.

ඇතැම් විට ඒ කඩපිටුපස ජීවිතයට කඩ ඉදිරිපස ජීවිතයේ නීති රීති අදාළ නොවේ. එය හැංගුණු ජීවිතයකි. ඇතැම් නගරවල කඩ පිටුපස අඳුරු වූද දැළිකුණු, ජරා වතුර, මල මූත්‍ර ගඳ පැතිරුණු කාමර කැලිවල දරු පවුල් පවා ජීවත් වෙති. කලාතුරකින් කඩ පිටුපස නොපෙනෙන හරිතවත් ගෘහ උද්‍යාන ඇති ධනවත් ගෙවල්ද තිබෙන බව ඇත්තය. එනමුත් බොහෝ විට එහි ඇත්තේ පිටරටක් තරම් වෙනස් ලෝකයකි. ඒ ලෝකය යනු සැඟවී සිටීමට සුදුසු ලෝකයක් වුවද ඒ නිසා අහිමි වී යන බාහිර ලෝකය විස්ම දනවන එකක් බව ගොළුවිජේට අවබෝධ වූයේ ඔහු එළිමහනට එන්නට වූ විටය. ජීවනී බෙහෙත් බඩු කඩේට මඳක් ඈතින් සිටගෙන ගොළුවා එළවළු විකුණන දෙස ගොළුවිජේ බලා සිටියේ කාගේවත් කරදරයකින් තොරවය. ගොළු භාෂාව තමා සිතනවාට වඩා සංකීර්ණ එකක් බව ගොළුවිජේට ටික ටික වැටහී යන්නට විය.

ගොළු බස හොඳින් ඉගෙනීමට ඔහුට අවශ්‍ය වී ඇත. මියෙන තුරු තමන්ට ජීවත්වන්නට සිදුවන්නේ කටහඬ අහිමි ලෝකයක බව ඔහුට ඒ වන විට සහතික වී තිබිණ. ගොළුවිජේ පරිස්සමට බලා සිටියේය. එළවළු ගන්නට එන අය විවිධ එළවළු වර්ග ගැන අසන හැටි ඔවුන් ඉල්ලන්නේ මොනවාදැයි හරියටම දැනගන්නට ගොළුවා ප්‍රශ්න අහන හැටි ගොළුවිජේ නිරීක්ෂණය කලේය. එළවළු යනු ගොළුවෙකුට වුවත් විකිණිය හැකි බඩු වර්ගයකි. සෑම එළවළුවකටම ඊට ආවේණික හැඩයක් ඇති නිසා ඒ හැඩය දෑතින් පෙන්වීම හරිම ලේසි වැඩකි. එළවළු විකිණීම යනු මෝඩ ගොළුවෙකුට වුවත් කළ හැකි වැඩක් නිසා ඔහු දෙස බලා සිටීමෙන් හරයක් ඇති ගොළු බසක් උගත නොහැකි බව ගොළුවිජේට පසක් විය. දවසක් ගොළුවිජේ එහි යන විට ගොළු වෙළෙන්දා ළඟ වූයේ එකම එක කංකුං මිටියකි. ඔහු එය මිලට ගෙන පැත්තකට වී බලා සිටියේය. පැය භාගයකින් විතර පමණ නෝනා කෙනෙක් එහි පැමිණ "කංකුං කංකුං" කිහිප වරක් කියා ගොළුවාට නොතේරුණු විට බිම වැටී තිබූ කංකුං කොළයක් අහුළා ගොළුවාට පෙන්නුයෙන් ගොළු බසින් පමණක් කංකුං විස්තර

කරන්නේ කෙසේදැයි ඉගෙන ගැනීමේ අවස්ථාව ගොළුවිජේට අහිමි විය. ගොළු බස බොහෝ දුරට තොල්වලින් කතා කිරීමක්ය යන්න ගොළුවිජේගේ නිගමනයයි.

මෙවැනි රසවත් මතක කතා අපට පසු කලෙක දැනගන්නට ලැබිණ.

දන්නා හඳුනන තුන් හතර දෙනා සමග නගරයේ පිටිපස පැත්තට සීමා වූ ලෝකයක ජීවත් වීම ඔහුගේ ගොළුබව ආරක්ෂා කරගැනීමට හොඳ වුවත් බාහිර සමාජයේ ජීවත්වීමට එය ප්‍රමාණවත් නැත. ඔහුට වඩාත් චකිතය ඇත්තේ තවත් ගොළුවෙකු මුණ ගැසුණහොත් සිදුවන දේ ගැනය. වරක් බිල්ලා ගෙනා ගොළුවා නිසා වූ හදිය ගොළුවිජේගේ චකිතය තවත් වැඩි කලේය. ඒ වූකලි මතක් වන විටත් බිය ගෙන දෙන ඇත්දැකීමකි. භාෂාවක් සෑම දෙනෙකුටම එක සේ කතා කළ නොහැකි පරිදිම ගොළු භාෂාවද සෑම දෙනාටම එක්වන්ව කතා කළ නොහැකි බව ගොළුවිජේ ඒ කාලේ දැන සිටියේ නැත. ඔහුට අදත් එය නොතේරේ. ඔහු සිතන්නේ සෑම ගොළුවෙකුම කතා කරන්නේ එකම භාෂාව එකම පමණට කියාය.

ගොළුවිජේ සෑම දවසකම ටවුමට ගොස් ගොළු වෙළෙන්දා දෙස බලා සිටින්නේය යන කාරණය සේදරමන් මුදලාලිගේ කණට වැටෙන්නට ගියේ සති කීපයක් පමණි.

දවසක් ගොළුවිජේ තනියම අල්ලාගත් මුදලාලි ඒ ගැන ඇසුවේය.

ගොළුවිජේ ගොළු භාෂාවෙන් සියල්ල විස්තර කළේය. මුදලාලි ඔළුව හොල්ල හොල්ලා සිටියා මිස කිසිවක් වටහා නොගත්ත බව ගොළුවිජේ දැක්කේය. ඒ නිසා ඔහු කොළ කෑල්ලක් ගෙන මෙසේ ලිව්වේය: "ගොළුවො කතා කරන හැටි ඉගෙනගන්ඩ."

මුදලාලිගේ හිත පත්තු විය.

පසුවදා හෝටලයට ආ මුදලාලි කෙළින්ම කුස්සියට ගියේය. „ආ මේක තමුසෙට" කියා කොළ කෑල්ලක් ගොළුවිජේ අතේ තැබුවේය.

"විජේ නුවර පැත්තෙ ගොළු අයට ඉස්කෝලෙයක් තියෙනවාලු. විජේ කැමතිනං ටික කාලයක් එහෙ ගිහින් එන්ඩ. වියදම් මං බලාගන්නම්. අපේ නෝනත් මේ අදහසට කැමතියි. කැමති නම් කියන්න."

ඒ කොළ කෑල්ල දුටු ගොළුවිජේගේ ඇසින් කඳුළු වැටෙනු අනික් අයද දැක්කහ. ගොළුවිජේ එය ඔහුගේ ලට්ට ලොට්ට එකතු වෙන සූට්කේස් එකට දමා ඉබ්බා දැම්මේය.

රෑ දහයට හෝටලේ වහන්නට පැය දෙකකට පමණ පෙර තමාගේ වගකීම් කොටස අහවර කරන ගොළුවිජේ ටවුමේ කොහේ හෝ ඇවිදින්නට යයි. ඉම්පීරියල්, මෙට්රෝ, නිව් සිනමා හෝල්වල නවයයි තිහ දර්ශනයට යාම ඔහු සතියකට වරක්වත් කරන වැඩකි.

එදිනද සියල්ල අවසන් වී නා පිරිසිදු වී ටෙට්රන් කමිසයක් සහ රැන්ගලර් සරමක් හැඳ හෝටලයේ ඉදිරිපිට ගොළුවිජේ එන විට මුදලාලි දවසේ ගණන් බලා සිමෙන්ති කඩදාසියෙන් හැදූ කවරයකට සල්ලි දමා බත් පාර්සලයක ආකාරයෙන් බැඳ කළුපාට හම් බෑග් එකත් අරන් කවුන්ටරයෙන් පිටට ආවේය. ඔහුගේ කාර් එක හයර් පොළේ සිට හරියටම හෝටලේ ඉදිරියට එන්නේ ඒ වෙලාවටය. මුදලාලි ගෙදර යන වෙලාවට හයර් බාර නොගැනීම ඩ්‍රැයිවර් අය්යාගේ සිරිතය. කාර් එක හෝටලේ ළඟ නතර කරන කරන ඩ්‍රැයිවර් අය්යා විජේ සමග ගොළු බසින් ටිකක් වෙලා කතා කිරීමෙන් සතුටක් ලබයි.

මුදලාලිගේ ලියුම් කෑල්ලට පිළිතුරක් ලියාගෙන සිටි නිසා එදින ගොළුවිජේ ඩ්‍රැයිවර් අය්යා අසලට නොගියේය.

සේදරමන් මුදලාලි තමන් මුණ ගැසීමට ගොළුවිජේ තාවර වෙවී ඉන්නා බව දැන ඔහු දෙස බැලුවේය.

ගොළුවිජේ ලියුම් කැල්ල දිගු කළේ එවිටය.

එහි ඇත්තේ "ගොළු මඩංවලට යන්න ඕනෙ නෑ" යන්න බව මුදලාලි ඉවෙන් මෙන් දැනගත්තත් ඒ ලියුම් කැල්ල හාමිනේද සමග කියවන්නට සාක්කුවේ දාගත්තේය.

මුදලාලි හාමිනේ කරුණාවන්ත කාන්තාවකි. සිංහල අවුරුදුවලට මුදලාලිගේ ගෙදර ගිය විට මුලින්ම ඈ දුටු ගොළුවිජේ වහාම ඇයට ගරු කරන්නටත් ආදරය කරන්නටත් වූවේය. ටිකෙන් ටික මුදලාලිගේ විශ්වාසය දිනාගත් පසු සිංහල අවුරුදු වැනි අවස්ථාවල ඒ ගෙදර බත ඉවීමේ සියලු කටයුතු පැවරුණේ ගොළුවිජේටය. "කතා කරන්ඩ බැරි උනාට පුදුම හොඳ කොල්ලෙක්. දර කැල්ලක් ඇල්ලුවත් රහට කන්ඩ පුළුවන් කෑමක් වෙන අත්ගුණයක් ඌට පිහිටල තියෙන්නෙ"යි මුදලාලි නෝනා සෑම අවුරුදු කාලෙකම කාට හෝ අලුතෙන් කියයි.

මුදලාලි නෝනා හා ගොළුවිජේ අතර බැඳීම වැඩි වන්නට එදා මුදලාලිට දුන් ලියුම් කැල්ලද හේතු විය. එතැන් පටන් ගොළුවිජේ ගැන මුදලාලිගේ විශ්වාසයද වැඩි විය. එපමණක් නොව, ගොළුවිජේගේ ගොළුකම ගැන මුදලාලිගේ විශ්වාසයද දැඩි වූ නිසා ඔහු සමගද ඔහු සිටින තැනද ඕනෑම දෙයක් සාකච්ඡා කරන්නට මුදලාලි පැකිලුණේ නැත. ඒ පොඩි ලියුම් කැල්ල ගොළු කොලුවා වෙත මුදලාලි තුළ ඇති කළේ ස්ථිර ස්නේහයකි.

එදා ඔහු ලියා තිබුණේ ඉතා සරල කෙටි ලියුම් කැල්ලක් පමණි:

"ගොළුමඩමකට ගිහින් ගොළු බාසාව ඉගෙනගෙන ගන්න මට ආසාවක් නෑ. මුදලාලි ළඟ මේ විදියට වැඩ ටික කරගෙන හිටියම ඇති. මගෙ අනාගතේ ගැන ඒ විදියට හිතුව එකත් ලොකු පිනක්. මුදලාලි හින්ද මං ඉගෙනගත්තුව හින්දනෙ මං අද මෙහෙම ඉන්නෙ. ඔක්කොමටම මුදලාලිට පිං. ගොළුවිජේ"

කොලුවා 'ගොළුවිජේ' යනුවෙන්ම අත්සන් කර තිබීම මුදලාලි හාමිනේගේ හද කම්පා කළේය.

තිඹිරි ගෙදරක

විජය වික්‍රමසිංහට දැවැන්ත නිවසක් ඇති බව දොස්තර සමරසේකර මට කිහිප විටක් කියා ඇතත් වරක් හෝ දෙවරක් එහි වන ප්‍රියසාදවලට ඇරයුම් ලැබුණත් එහි යාම යනු මගේ සිතේ පෙළඹීමක් ඇති කළ දෙයක් නොවේ. එය මගේ 'හාමු විඥානය' නිසා ඇති වූවක් යැයි රාධා මට විහිළු කර ඇත. හාමුලා යනු අනික් මිනිසුන් සමග හාමු නොවී සිටින පිරිසකියි ඇය විහිළු කරයි. මිනිසුන් ඇත්තට කියන දේවලට වඩා විහිළුවට කියන දේවල විනිවිදින ශක්තියක් ඇත. එහි යා යුතුද නැද්ද යන්න ගැන හිතමින් සිටිද්දී සේන කෙළින්ම විරුද්ධ විය. "සර් මොකටද ඕවයෙ යන්නෙ?" ඒ ප්‍රශ්නය ඒ වචනවලින්ම වාගේ මාද මාගෙන්ම අසා තිබිණ. මගේ විඥානය තුළත් ඉන් පිටත් සේනලා දෙන්නෙකු සිටින්නාක් මෙනි. සැබැවින්ම මා සේන ගෙදර සේවයෙහි තබාගෙන සිටින්නේ මගේ විඥානයේ සිටින සේන වෙනුවෙනි. ඒ සේනලා දෙන්නාටම එකඟවෙමින් මම එහි නොගිහින් සිටියෙමි. විජය වික්‍රමසිංහ කවදාකවත් මට පෞද්ගලිකව කර ආරාධනා කරන්නට තරම් නිර්භීත නොවීය. එවැනි පෞද්ගලිකයකට ඉඩ දෙන සම්බන්ධයක් අප දෙදෙනා අතර තිබුණේ නැත.

දැන් ඇත්තේ සාදයක් පිළිබඳ ප්‍රශ්නයක් නොවේ. විජය වික්‍රමසිංහගේ ගොළුකම නම් ප්‍රශ්නය විසඳීමට එහි යන්නේද නොයන්නේද යන්නය. සේන එදින රෑ කෑම මේසයේදී ප්‍රශ්නයට

විසඳුමක් ඉදිරිපත් කළේය. "සර්ල එහෙ යන්නෙ මොකටද? මං මෙහෙ කාමරයක් ලෑස්ති කරන්නං."

මා ඔහු දෙස බැලුවේ මා ඇතුළත සිටින සේන දෙස බලන්නාක් මෙනි.

"බේබි කාමරේ නිකංනෙ තියෙන්නෙ." සේන කීවේය.

"ඒක කළුවරයි." මම කිව්වෙමි.

"සේන ලයිට් හදල දෙයි. ලයිට් නෙමේ විශේෂයෙන් ඕනෙ බිත්ති දෙකකටවත් ලොකු කණ්ණාඩි." රාධා සේනට කතා කළේ ගෙදර ගෘහණිය තරම් සමීප විධානාත්මක ස්වරයෙනි.

ඉන් පසු විජය වික්‍රමසිංහට දුරකථන ඇමතුම ගත්තේ සේනය. ඔහු කතා කළේ බලයලත් නිලධාරී ස්වරයෙනි.

ඉරිදා උදේ දහයට ඉංග්‍රීසි පාසැලේ පන්ති පටන්ගන්නට පෙර විජය වික්‍රමසිංහ සමග පැය දෙකක්වත් වැඩ කරන්නට රාධා සූදානම්ය. සාමාන්‍යයෙන් උදේ අවදි වන රාධා මගේ ගෙදරදී නම් කරන්නේ ගොල්ෆ් පිටිය වටා රවුමක් ඇවිද පැමිණ දාඩිය නිමෙනතුරු වත්තේ මල් හෝ පලතුරු ගස් යට ඇවිද ඇවිද මල් කුරුල්ලන් හෝ අමුතු අමුතු බිම්මල් සොයමින් ඇතුගල දෙසින් හමන සුළඟට අනාවරණය වී සිටීමයි. මේ පුරුද්ද නිසා උදේ අටට විජය වික්‍රමසිංහ සමග අටේ සිට වැඩ කරන්නට අමාරු නොවන බව මම සිතුවෙමි. ආරම්භක දවසේ බන්දුල බලගල්ලද ඒ කාමරයේ සිටිය යුතුය.

පසුදා උදේ හය වන විට බේබි කාමරයට පිටතින් ඇතුළු වන දොර හැර තැබුවේ සේනය.

රාධා එඩ්මන්ඩ්ගේ උදව්වෙන් නිවස අභ්‍යන්තරයෙන් බේබි කාමරයට යන මග සොයාගෙන එහි යන විට විජය වික්‍රමසිංහ ව්‍යායාම කරන ඇඳුමක්ද හැඳ බේබි කාමරයේ දොර අසල ඇති ලොව් බංකුව නමින් හඳුන්වන ලොකු ඇඳි සහිත බංකුවේ වාඩි වී උන්නේය. වින්නඹු කාමරයෙන් දරුවෙකුගේ පළමු හැඬිල්ල ඇසෙනතුරු පිරිමි නෑයන් වාඩි වී උන්නේ ඒ බංකුවේය. රාධා දකින විට නැගිට සිටගත් විජය වික්‍රමසිංහ වෙත වූයේ පළමු වරට නාට්‍ය පුහුණුවකට හෝ ක්‍රීඩා පුහුණුවකට ආ කොලුවෙකුගේ පෙනුමය. මැදිවිය සලකුණු කරමින් ශරීරයේ මැදින් මතුවන උදරය ඔහුගේ ශරීරයට එක්තරා අලංකාරයක්ද 'පව් කියා හිතෙන බවක්ද' එක් කළ බව එදා දවස පිළිබඳ සමාලෝචනයේදී රාධා කීවාය.

මා බේබි කාමරය පැත්තේ ගියේ අන්තිමටය. මේ කාමරයේ දරුවන්ගේ පළමු කටහඬ ඇහෙන තෙක් පප්පා සහ අනික් පිරිමි බලා සිටි සැටි මට එක්වරම සිහි විය. නිලීකා හෙවත් මගේ ලොකු නැන්දාගේ පොඩි දුව මේ කාමරයේ උපදින විට මාද මේ බංකුවේ හිඳගෙන උන්නේ කිරි අම්මාද සමගය. ඉන් පසු ගෙදරදී දරුවන් බිහි කිරීමේ පුරුද්ද වලව්කාරයන්ගෙන් පවා ගිලිහී ගියේය.

අපි කාමරයට ඇතුළට ගියෙමු. කාමරයේ බිත්ති හතරෙහිම දැවැන්ත දර්පණ සවිකර තිබූ නිසා අපට දැනුණේ කිසියම් මැජික් කාමරයකට ගියාක් වැනි කෘත්‍රිම අවකාශයක් පිළිබඳ හැඟීමකි. සේනගේ එක කෝල් එකෙන් විජය වික්‍රමසිංහ බිත්තිවල විශාල දර්පණ සවි කෙරෙව්වේය.

බලගල්ල වලව්වේ අතීතය පිළිබඳ ගරුගම්හීර මතක රැඳි මේ කාමරය වර්තමානය දිහාට පමණක් අවධානය යොමු කරවන දර්පණ මගින් ස්වයං-දර්ශනකාමී දර්පණ පීඩාවකට ලක් කිරීම ගැන මගේ සිතේ උපන් පසුතැවිල්ල මම වහා මැඬගතිමි.

"හරි" රාධා සිටි තැනම සිට වටේට කැරකී ඇගේම පිළිබිඹුව බලමින් කීවාය. ඇගේ ගෙලට වැටී තිබුණු කොණ්ඩය හකුලා ඔසවා අතේ දමාගෙන සිටි වූල් බෑන්ඩ් එකකින් හිර කළ විට කුරුළු පෙන්දක් සේ නළිය නළියා ලෙලෙන්නට වූ කෙස් ඇ වෙත එක් කළේ ක්‍රීඩිකාවකගේ ස්වරූපයයි. ඇගේ නළියන කෙස් දෙස බලා සිටි මා විජය වික්‍රමසිංහ දෙස බලන විට ඔහු බිම බලා ගත්තේ ඔහුද ඒ කෙස් නැළවිල්ල දෙස බලා සිටීම ගැන ලැජ්ජාවෙන් මෙනි.

රාධා අපේ ඇස් ඈ වෙත එල්ල වී ඇති බව නොදත්තේ ඇය අත ඇති කාර්ය පිළිබඳ බරපතළෙටම අවධානය යොමු කර සිටි බැවිනි. බිත්තිවල වූ කණ්ණාඩි හතරක් ඇගේ බරපතළෙට ගැනීම ප්‍රතිබිම්බ ගණනාවක් බවට පත් කිරීම නිසා ඒ බරපතළකමේ බර අඩු වූ බව මම සිතුවෙමි.

පුහුණුව ආරම්භ කෙරුණේ ව්‍යායාම මාලාවකිනි. ඒවා සැලසුම් කරන්නට රාධා සමග මාද හරිහරියට වෙහෙස වුවද රාධා විජය වික්‍රමසිංහ සමග ව්‍යායාම කිරීමට මම අකැමැති වීමි. රාධා සිය සුබනම්‍ය ශරීරයෙන් කර පෙන්වන අභ්‍යාස විජය වික්‍රමසිංහ කරන්නට තැත් කරන විට මට පෙනුණේ එකෙකු කරන දෙයක් තව කෙනෙකු අනුකරණය කරන බවක් නොව, එකෙකු කරන දෙයෙහි ප්‍රතිවිරෝධය අනෙකා කරන බවකි. එකිනෙක අතර කිසිම සමානකමක් නැති ලෝක දෙකක් සේ මට ඔවුන් ඇතට පෙනිණ. නාට්‍ය අභ්‍යාසයක් සාර්ථක වන්නට නම් එවැනි පරතරයක් නැති සුසංයෝගයක් කරා යුතුය. එහෙත්, ඈත සිට මා ඔවුන් දෙදෙනා දෙස ටික වෙලාවක් බලා සිටින විට ඒ ලෝක දෙකම එකිනෙකින් ස්වාධීනව ආකර්ෂණීය වන බව පෙනී ගියේය. ගොළුවෙකුට සංකීර්ණ යමක් කියාදීමට විශේෂ පුහුණුවක් නැති රාධා බොහෝ විට කරමින්ද විටෙක කතා කරමින්ද විස්තර කළ දේ විජය වික්‍රමසිංහ ඉතා ඉක්මනින් වටහා ගැනීම විස්මයජනක විය. ඔහු ක්ෂණිකව දැල්වෙන බුද්ධිමය පහනක් විඥානයෙන් ගත් ශූර පිරිමියකු සේ මට පෙනිණ. රාධා මගේ අදහස් විමසූ කල මා ඉංග්‍රීසියෙන් කී යම් යම් දේ රාධා ඔහුට සිංහලෙන් විස්තර කරන්නටත් පෙර වටහා ගත්තේදැයි මා පුදුම වූ අවස්ථා තිබිණ.

ඔහුට උදව් කරන්නට එකඟවීම ගැන ඒ වෙලාව වන තෙක්ම පාහේ පැවති පසුතැවිල්ල වහා නැති විය. කෙනෙකු යමක් උගන්වන විට කෙනෙකු එය ක්ෂණිකව වටහා ගැනීම නිසා ඉගැන්වීමට කැමති කෙනෙකු තුළ ඇති වන්නේ පුදුමාකාර ආනන්දයකි.

විජය වික්‍රමසිංහගේ වටහා ගැනීමේ ශක්තිය ගැන පුදුම සිතුණ බව රාධාද මට පසුව කීවාය.

"මේ වැඩේ ට්‍රයි කරල බලන එක ගැන මට තිබුණ දෙගිඩියාව නැති උනා මිනිහ දේවල් තේරුම් ගන්න විදිය දැක්කම. මිනිහ මෙහෙම පෝසත් මිනිහෙක් උන එක පුදුමයක් නෙමේ." රාධා කීවාය.

මා රාධාට යෝජනා කළ හුස්ම ගැනීමේ අභ්‍යාස ඔහු ඉතා සාර්ථකව කළේය. උගුරේ දැනටමත් ඇති වායුව යොදාගෙන කතා කරනු වෙනුවට උදරයේ සිට වායුව ඉහළට ගෙනැවිත් විවිධ ශබ්ද එන සේ මුවින් පිට කරන්නට ඔහු පුරුදුවිය යුතු බව මම තීරණය කළෙමි. ඒ වූකලි ගොළු බසින් පමණක් නොව, නියම බසින් පවා කෙනෙකුට කියාදීම අමාරු සංකීර්ණ උපදෙස් මාලාවකි. ව්‍යායාමය සරල වුවත් කියාදීම සංකීර්ණය. රාධා සිංහලෙන්ද ගොළු බසින්ද එය විස්තර කළ විගස ඔහු වටහා ගත්තේය. නාට්‍ය අභ්‍යාස වැනි සියුම් අභ්‍යාස පමණක් නොව, තදබල ක්‍රීඩා ව්‍යායාමවත් කර පුරුද්දක් නැති ඔහු අපේ ව්‍යායාම කළේ ඒවා අවසන් වූ වහාම කතා කරන්නට හැකිවෙතියි සිතන්නාක් මෙනි. කෙසේ හෝ කටහඬ අත්පත් කරගන්නට ඔහු දරණ වෑයම අනුවේදනීය විය.

අප එදින බේබි කාමරයෙන් එළියට ආවේ ඒ දෙපැයේ ශ්‍රමයට සරිලන ජයග්‍රහණයක් අත්පත් කරගත්තේය යන හැඟීමෙනි. රාධා හැඳ සිටි ටී ෂර්ට් එකේ පිටෙහි සිට සලකුණු වූ දහඩිය පාරක් නිතඹ දෙසට ගලාගොස් ඇති බව පෙනුණේ පමණක් නොව, එය සුන්දර ගමනාන්තයක් දක්වන ඊතලයක් සේ විය. "තෑන්ක් යූ" නොව "නොට් බැඩ්" යැයි කී ඈ වික්‍රමසිංහට අතට අත දුන්නාය. ඇගේ අත අනපේක්ෂිතව ඔහු වෙත දිගු වීමේ පුදුමය නිසාදෝ අතට අතදීම යනු ඔහුට එතරම් හුරුපුරුදු චාරිත්‍රයක් නොවූ නිසාදෝ ඔහුගේ මුහුණේ ඇඳී ගියේ දරුවකුගේ වැනි ලැජ්ජාවකි. එහෙත්, ඔහු ඇගේ අත ගත්තේය. මාද අත දෙතියි යන බියෙන් මෙන් සිය දෑත් එකට පටලාගත් ඔහු හිස නමා මට ආචාර කර බැගෑපත් සිනාවක් පෑවේය. මම ප්‍රසාදය පළ කරන සිනාවක් පෑවෙමි.

එය ඔහුගේ ආත්ම විශ්වාසය වැඩි කළ සිනාවක් බව ඔහු එදින නොදැන සිටි භාෂාවකින් රාධාට කියන දවසක් එතියි මම එදින නොසිතුවෙමි.

අප බලගල්ල වලව්වේ තිඹිරිගෙයින් එළියට එන විට වික්‍රමසිංහ මහත්මිය එතැනට පැමිණ සිටියේ අලුත උපන් දරුවකු බලන්නට ආවාක් වැනි නොඉවසිල්ලෙනි. සිය සැමියා වෙතට එල්ල වූ ඇගේ මුහුණේ ප්‍රසන්න කුතුහලයක් නළියන්නට විය. ඇය රාධා දෙස බැලුවේ ප්‍රසූතිය බාරව සිටි වෛද්‍යවරියද දරුවාගේ මවද යන දෙදෙනාම ඇයම වූවාක් මෙනි.

රාධාගේ ප්‍රසන්න 'මවු සිනාව' ටික ටික වෛද්‍යවරියගේ බරපතළ බැල්ම බවට හැරිණි.

"මිසිස් වික්‍රමසිංහ මට අනිත් පත්තිය පටන්ගන්න තියෙනවා තව ටිකකින්.. ඉඳගන්නකො."

"කමක් නෑ ටීචර්." ඇය මා දෙසට හැරුණාය. "පිටිපස්සෙන් එන්ඩ පුළුවන් හින්දයි ආවෙ. ගෙදර අයට කරදරයක් උනාද දන්නෑ සර්."

"එහෙම දෙයක් නෑ" මා අත වනා කීයේ ගොළු මිනිසාටද තේරෙන ලෙසය. සේන කාමරයෙහි මේ දොර විවෘත කර ඇත්තේ ඔහුගේ පාලනය යටතේ ඇති බලගල්ල නිවසේ අනික් කොටසින් සම්පූර්ණයෙන්ම පාහේ මෙය විසම්බන්ධ කරමිනි. අපේ ගෙදර දොරවල් සහ ජනෙල් යොදා ඇත්තේ නිවසේ බාහිර කොටස් ඉතා පහසුවෙන් අභ්‍යන්තර ජීවිතයෙන් වෙන් කළ හැකි ආකාරයටය. වලව්ව යනු තම අභ්‍යන්තරය ගැන ඉතා පරිස්සම්කාරී අවධානයක් ඇති ගෙදරකි. ඒ නිසා පිටස්තරයන්ට සිතෙන්නේ යම්කිසි අද්භූත අභ්‍යන්තර කතාවක් වලව්වකට ඇති බව යැයි මේ ආඛ්‍යානයේ වපසරිය තුළදී මම වටහා ගතිමි.

"කාලයක් කරල බලන එක වටිනව කියල හිතනවද ටීචර්?" වික්‍රමසිංහ මහත්මිය ඇසුවාය.

"මිසිස් වික්‍රමසිංහගෙ නම?"

"විනීතා."

"මෙකයි විනීතා. මේක මාස ගාණක නැත්නම් අවුරුදු ගාණක වැඩක්. නමුත් අපි කරල බලන්ඩයි යන්නෙ."

රාධා, විනීතාට සතුට විඳීමට විරාමක් දුන්නාය. විනීතාගේ සැහැල්ලු සුසුම මටත් ඇසිණ.

"නමුත් මහත්තයට කොහොම හරි කියල දෙන්න ඉවසීමෙන් ඉන්න කියල. විනීතත් ඉවසීමෙන් ඉන්න. චූට්ටක් හරි වෙනසක් බලන්න මාස හයක්වත් යයි" රාධා කීවාය.

එම පන්තිය අවසන් වන විටම විනීතා එහි පැමිණ සිටීම ගැන රාධා නොසන්සුන් වී ඇති බව ඇගේ ස්වරයෙන් මට දැනිණ.

"මිසිස් වික්‍රමසිංහ ආපු එක හොඳයි. අපිට විස්තර කියන්න පුළුවන්නෙ." මම මැදිහත් වුණෙමි.

ඇය රාධා කී දේ විජය වික්‍රමසිංහට ගොළු බසින් එවේලේම විස්තර කරන විට ඔහුගේ මුහුණේ යම් කිසි නොරුස්නා ස්වභාවයක් වී යැයි මට සිතිණ. ඔහු හිස වැනුවේ ඒ සියල්ල ඔහු ඒ වන විටත් වටහාගෙන ඇති බවක් පෙන්වමිනි. ඒ බිරිඳට උඩින් සිටීමට ස්වාමිපුරුෂයකු කරන බල අරගලය යැයි මම සිතුවෙමි. ඔහු ඇඟිලි දෙක පෙන්නා කීවේ ගුරුවරුන් දෙන්නකු අවශ්‍ය බවද අනවශ්‍ය බවද යන්න මට තේරුම් ගත නොහැකි විය. රාධා දෙන්නාගේ ගොළු බස දෙස බලා සිටියේ එය ඇයද ඉගෙනීමට සිතන්නාක් මෙනි.

"මහත්තයා කියනවා සුමානෙට දෙපාරක් පුළුවන්නං හොඳයි කියලා."

රාධා මා දෙස බැලුවාය.

"අපි ඒක කතා කරල කියන්නම්."

"නෑ සර් කතා කරන්න ඕන්නෑ. අපි කෝල් එකක් දෙන්නං." විනීතා වහා කීවාය.

"නෑ මම කිව්වෙ අපි සාකච්ඡා කරල කියන්නම් කියනෙක." මම ඇයට කිවෙමි.

එවිටම සේන එම කොරිඩෝවෙන් නිවස වෙත යන දැවැන්ත දොර විවර කළේය. රාධා සහ මම ඒ පුරාණ ගෘහාභ්‍යන්තරය තුළට ගිලගනු ලැබීමු. ඊට පෙර ගොළු භාෂාවෙන් මෙසේ කියන්නට හැකිවීම ගැන දොර වැසුණු වහාම මම සතුටු වීමි:

"ඊ ළඟ සතියෙ." ඒ වචන තුනම කියන්නට කළ යුතු වූයේ හිස මදක් ඇලකොට ඊ ළඟ සතිය දෙසට ඇඟිල්ලක් දිගු කිරීම පමණි.

විජය වික්‍රමසිංහගේ සහ විනීතාගේ අපේක්ෂා සහගත සිනාවල ආලෝක දැල්ල නිවෙන්නට පෙර දැවැන්ත දොර වැසුණේය. නිහඬව දොර වැසීමෙන් සේන අප කවුරුත් මත පැ ස්වාමිත්වය ගැන ඔහුගේ මුහුණේ වූයේ උඩඟුකමකි.

මා ඇඟිල්ල දික් කර පෙන්නූ ඊළඟ සතිය ඉක්මනින් ආවේය.

ඊළඟ සති දෙක තුන වන විට අප කරන ව්‍යායාම සහ නාට්‍ය අභ්‍යාසවල අරමුණ කුමක්ද යන කාරණය ඉතා පුදුමාකාර වේගයකින් විජය වික්‍රමසිංහට වැටහිණ. ඇතැම් විට අපේ අභ්‍යාසවල අරමුණ රාධා සහ මම ඔහු ඉදිරියේ සිංහලෙන් සහ ඉංග්‍රීසියෙන් සාකච්ඡා කළෙමු. ඔහු ඉදිරියේ ඉංග්‍රීසියෙන් කතා කිරීම ඔහු භාෂාත්මක සන්නිවේදනය වෙතින් දෙවරක් ඈත් කිරීමකියි මම රාධාට මතක් කර දුනිමි. ඒ නිසා අපි ඔහු ඉදිරියේ සිංහලෙන්ම පමණක් කතා කරන්නට වෙහෙසවීමු. දැන් ඔහුට අපේ තොල් දෙස බලා සිට අඩු තරමින් වචනයක් දෙකක්වත් අල්ලා ගත හැකිය.

ඔහු ලවා යම් යම් රංග අභ්‍යාස කර ඔහුගේ මුව වෙත එන වායු ධාරාව වැඩි කර ගැනීමටත් ඒ වායු ධාරාව වැඩි වේලාවක් රඳවා ගැනීමටත් ඔහු පුහුණු කළ යුතු බව මම සිතුවෙමි. ඔහු "ආ උං ඕ" ආදී සීමිත ශබ්ද පමණක් උච්චාරණය කරන බවත් ඇතැම් විට වායු ධාරාව මුවින් පිටට විහිදුවනු වෙනුවට ශරීරය ඇතුළට උරාගන්නා බවත් මම නිරීක්ෂණය කළෙමි. ඇතැම් අප්‍රිකානු භාෂාවල් උච්චාරණය කරන්නාක් මෙන් වායුධාරාව ඇතුළට ඇදීමෙන් සිංහල ශබ්ද උච්චාරණය කරන්න ඔහුට හැකිද යන්නද මම පරීක්ෂා කළෙමි. පුදුමයකට මෙන් ඔහුගේ මුවට එන වායුධාරාව ඔහුගේ මුවින් පිටවන සැටි වායුවේ ප්‍රමාණය සාමාන්‍ය කෙනෙකුගේ තරම්මය. කිසිම වෙනසක් නැත.

මම මේ කාරණා ගැන සවිස්තර සටහන් ගෙන ඒවා රාධා සමග සාකච්ඡා කළෙමි.

"මේක නම් මානසික දෙයක් වෙන්නම ඕනෙ." රාධා දෙවැනි සතියේ එක් අභ්‍යාසයකින් පසුව කීවාය.

විජය වික්‍රමසිංහ පැවේ ජයග්‍රාහී සිනාවකි. ඒ දුටු රාධා ඇය මට කීදේ ගොළු බසින් කියන්නට නැත් කළාය. ඇගේ ගොළු බසෙහි පවා ඇත්තේ මධ්‍යම පාන්තික උච්චාරණයකි. ඒ ගොළු බස් උච්චාරණය විජය වික්‍රමසිංහගේ සන්තෝෂයට හේතු වූ බව පෙනිණි. එය ඇයගේ වෑයම අගය කරන කෘතවේදී සන්තෝෂයක් සේ විය.

දෙවෙනි සතිය අවසනද විනීතා පැමිණ, පන්තිය අවසා වන විට පැමිණීම ගැන සමාව අයදිමින්ද රාධා සමග වින්ත කාමරය ඇතුළේ ගෑනු-ගෑනු සාකච්ඡාවකට එළඹියාය.

ඉන් ටික වෙලාවකට පසු ඔවුන්ගේ කාර් එක අපේ මිදුලෙ පිටත් වනු මට ඇසිණ. මම ඒ වනවිටත් නැඹිලි වීදුරුවක් අතැති මහන්සි නිමමින් උන්නෙමි.

රාධාද පසුව මට එක් වූවාය.

තවත් ටික වෙලාවකට පසුව අප වෙත ආ සේන කොළ කැල්ලක් රාධාට දුන්නේය.

"විසිදාහක්!"

විනීතා රාධා සමග කළ රහස් සාකච්ඡාව වී ඇත්තේ අපට ගෙවිය යුතු ගාස්තුව පිළිබඳවය. මා මුදල් නොගන්නා බව රාධා ඇයට කියා ඇත. කොළ කැල්ල අතින් ගෙන සිටින රාධාගේ මුහුණේ වූයේ ඇගේ රැඩිකල් බුද්ධිමත්කම මකාලන දීප්තියකි.

එය අනපේක්ෂිත තරම් විශාල මුදලක් ගෙවනු ලැබීම නිසා ඇති වූ ප්‍රීතියකි. එක මට ශෝකය ඇති කළ ප්‍රීතියකි. ඇයට ආර්ථික ප්‍රශ්න ආදිය තිබේද වැනි කරුණු ගැන මම කවදාවත් සොයා නොබැලුවෙමි. ඇගේ නළු පෙම්වතා බොහෝ දේ සම්බන්ධයෙන් ඇ මත යැපුණු බව නම් මම දැන සිටියෙමි.

"විසිදාහක් කමක් නැද්ද කියල අහන්නෙ!"

"මිනිහට ඕක ගාණක් නෙමේ ඔයා ගන්න." එය අපේ පන්තියෙන් ඇයට ලැබෙන මුළු මුදලටත් වැඩි මුදලකි.

මම සේනට කතා කළෙමි.

"විනීතට කතා කරල කියන්න සිකුරාදටත් පුළුවන් කියල." රාධා ඔහුට කීවාය.

"ඇත්තටම බන්දු මට සල්ලිත් ඕනෙ. අරයා මගෙ ළඟ තිබුණු දේවල් නැති කරලනෙ ගියෙ." ඇය ඉඟි කළේ නළුවා ගැන බව මම දැනිමි. ඔහු නුගේගොඩ, නුවර සහ කුරුණෑගල ඇය කරන පන්තිවල කළමනාකරුවා සේ ක්‍රියා කරන අයුරු මා දැක තිබිණි.

නළුවා ගැන කිසිවක් මතක් නොකරන්නට සිතූ මම ඇය දෙස බලා මාපටැඟිල්ල එසවීමි. අපේ නාට්‍ය-භාෂා පාසැල දෙසට ළමයින් එන සැටි ඇතින් පෙනිණ. එක කොල්ලෙකු ගොඩනැගිල්ලෙ මිදුල දෙසට නැමුණු ගසක අඹ කඩනු රාධාද දැක්කාය.

"අන්න ඔතෙලො අඹ හොරකං කරනවා." මම කීමි.

"ඒකට කමක් නෑ ඩෙස්ඩෙමෝනගෙ හදවත තාම පරිස්සමට තියෙනවා." ඔතෙලෝට පුහුණු වන ඒ කොලුවාගේ ආදර ආක්‍රමණයට ඒ ඩෙස්ඩෙමෝනා කෙල්ල අකැමැති බව රාධා මට දවසක් කීවාය.

රාධා එහි යන්නට නැගිට්ටාය. ශේක්ෂ්පියර් ඩෙස්ඩෙමෝනාගේ ජීවිතය ආරක්ෂා නොකළත් ඒ චරිතය රඟන

ළමා නිළියගේ ආරක්ෂාව තමා සතු බව රාධා කීවේ එලකියුෂන් ඉංග්‍රීසියෙනි.

ඩහදිය ඊතලය වැකි රාධාගේ ටී ෂර්ට් එක නිසා මගේ මිතුරිය වෙතින් දිස්වූයේ ක්‍රීඩාශීලී සුන්දරත්වයකි. එය ඒ වැනි සුන්දරත්වයක් පමණක් නොව, ඒ විදින සුන්දරත්වයකි. නළුවා අමතක කර සිත් යොමන්නට ගොළුවකු ඇයට ලැබී තිබීම මගේ සතුටට හේතු විය. මේ ඇයගේ හදවත සුවපත් කරන අභ්‍යාසයක් වෙතියි යන්න මුල සිටම මගේ අපේක්ෂාව විය.

වීවී

මා උපන් තිඹිරිගෙය අලුත් දරුවකු නිර්මාණය කෙරෙන ගර්භාෂයක් බවට පත් වී තිබීම හරිම අමුතු වූද කුමක්දෝ වධයක් හිතට ඇති කරන්නා වූද සිද්ධියක් විය. මේ උපදින්නට සිටින දරුවා කවර ස්වරූපයක් ගනීද මන්ද බුද්ධිකයකු වේද අංගවිකලයකු වේද යන චකිතය වැන්නක් මගේ සිතේ තිබිණ. ඊටත් වඩා අමුතු කාරණය වූයේ මේ ඔස්සේ රාධා සහ මා උපදින්නට නියමිත දරුවාගේ සංකල්පමය අම්මා සහ තාත්තා වීමයි. ඒ නිසා අපි අඹු-සැමි ව්‍යූහයක් වෙත බැඳී ගියෙමු. රාධා කුලුඳුල් දරුවා බිහි කරන්නට සූදානම් වන අම්මා කෙනෙකගේ බැරෑරුම්කම සහ අපේක්ෂා සහගත බව පළ කළාය. කුසේ සිටින දරුවාගෙන් සිඟිති පා පහරක් ලද කලෙක මෙන් ඇය විටෙක මා දෙස බැලුවාය. විජය වික්‍රමසිංහ යමක් හරියට කළ බවක් මා පවා දකින්නේ එවිටය. විටෙක ඇය අමනාපයෙන් මෙන් උන්නේ සැමියා ගැබ්බර තමාගේ මානසික අවශ්‍යතා පිළිබඳ අවධානයෙන් නොසිටියාක් මෙනි. අප දෙදෙනා මැදී වී සිටි මේ රූපකමය අඹු-සැමි චක්‍රය නිදහස්කාමී තනිකඩකම ජීවිතයේ ඉලක්කය කරගනිමින් සිටි මගේ මනස චංචල කළේය. ඒ නිසා මම දැනුවත්වම ඒ සංකේතීය චක්‍රය බිඳ එළියට ඒමට තැත් කළෙමි. විටෙක මම ඒ කාමරයෙන්ම එළියට විත් මගේ වැඩක යෙදී යළි එහි ගියෙමි. ඒ ලෝකයෙන් සම්පූර්ණයෙන්ම දුරස් වී සිටීම අමාරු වූයේ වික්‍රමසිංහගේ ශබ්ද නිෂ්පාදනයේ යම් දියුණුවක් දකින්නට තිබීමය. ඔහු යම් පුංචි දෙයක් කිරීමෙහිලා සාර්ථක වූ විට රාධා “දැක්කද” කීවේ මගේ උරහිසට තට්ටු කරමිනි. ඇය එවැනි විටෙක වික්‍රමසිංහට හයිෆයිව් එකක් දෙන්නට පටන්ගෙන තිබිණි. රාධා සටහන් පොතක් තබාගෙන ඒ ඒ අභ්‍යාසයෙන් පසුව ඇති වූ වර්ධනය හෝ අවර්ධනය ගැන සවිස්තර සටහන් ලිව්වාය. ඇගේ ගුරුවර කැපවීම ගැන මා මේ මතක සටහන ලියන්නේ අපේ ඒ තිඹිරි ගේ දවස් ගෙවී ගොස් බොහෝ කාලයකට පසුවය. ඒ නිසා ඈ ගැන මා සිත උපදින්නේ සෝබර සිතිවිලිය.

විජය වික්‍රමසිංහ පුහුණුවට ආ දෙවැනි දවසේම රාධා ඇයටත් මටත් මහත් කරදරයක්ව තිබූ දෙයක් නිර්මාණශීලීව වෙනස් කළාය.

“මිස්ටර් වික්‍රමසිංහ ඔයාට කතා කරන්න ලේසි නමක් ඕනෙ. අපි වීවී කියමු.” ඇය කීවාය.

විජය වික්‍රමසිංහ ඇය කී දේ නොතේරුණ බව පෙන්නූ නිසා ඇය සිට සටහන් පොත අසලම තබා තිබුණු මාකර් පෑනකින් විශාල දර්පණයේ කොණක මෙසේ ලිව්වාය: “අද ඉඳල අපි ඔයාට වීවී කියන්නං.”

විජය වික්‍රමසිංහ සිනහවක් පා පෑන ඉල්ලාගෙන ලොකු ඩබ්ලිව් අකුරු දෙකක් දර්පණයේ ලිව්වේය.

“ඩබ්ලිව් ඩබ්ලිව් කියන්න දවසක් විතර යනවා.”

ඈ එසේ කී විට වීවී සිනාසුණේ එය තේරුණාක් මෙනි.

“මේ ක්ලාස් එකේදී ඔයා වීවී. හරි ලේසිනෙ කියන්නත්.” ඇය කුඩා දරුවකුගෙන් යමකට අනුමැතිය පතන බාලාංශ ගුරුවරියක සේ හිස ඇලකර ඔහු දෙස බැලුවාය. පසෙක සිට ඇය දෙස බලා සිටි මට වූල් බෑන්ඩ් එකට හසුව කුරුළු පෙන්දක් සේ නටන ඇගේ හිස මුදුනේ කෙස් රොද සුන්දර දසුනක් සේ පෙනිණ.

වීවීද සතුටින් හිස වනද්දී ඒ කෙස් නටන දෙසද බැලුවේය.

එවැනි ඉරණම් සහගත කෙස් නැටීමක් ගැන මම මේ ආඛ්‍යානයේ මතුවට ලියමි.

මෙවැනි පන්තියකදී ඉක්මනින් ශිෂ්‍යයා අමතන්නට සිදු වන නිසා කෙටි නමක් තිබීම හොඳය. "මිස්ටර් වික්‍රමසිංහ" දිග වැඩිය.

"වීවී මෙහෙම කරමු. වීවී - වීවී - මෙහෙ එන්න. වීවී!!"

ඇය එක එක ස්වරයෙන් උපදෙස් දුන් විට ඔහුට ඒ විධානද ඇගේ ගොළුබසද අවබෝධ වන්නාක් සේ විය.

රාධාගේ අභ්‍යාසවලින් පසු මා එදා මගේ අභ්‍යාස පටන්ගත්තේද වීවී යන්න විවිධ ආකාරවලින් උච්ඡාරණය කරවන්නට තැත් කරවමිනි. ඔහු එය අප කියන ආකාරයට ඉතා කිට්ටු ආකාරයකට උච්චාරණය කළේය.

"නියමයි." රාධා කීවාය.

ඇය මගේ ක්ෂණික සැලැස්ම අගය කරමින් මගේ පිටට තට්ටු කළාය. මා මගේ නාට්‍ය අභ්‍යාසවලදීද බොහෝ විට කරන්නේ ක්ෂණිකව මගේ සිතට නැගෙන්නක් රංග අභ්‍යාසයක් බවට පෙරළීමයි.

"වීවී කියන්නෙ අපි අපි. අපි අපි එකතුවෙලා වැඩේ කරමු"යි කී රාධා කීවාය.

වීවී මගේ තොල් සෙලවෙන ආකාරයෙන් මා දුන් උපදෙස් තේරුම් ගත්තේය. මා තැත් කළේ මුවෙහි වායුව පුරවාගෙන ඒ වායුව බෝලයක් සේ සලකා මුවෙහි ඒ මේ අත ඒ බෝලය කැරකැවීමටය. ඔහු එය සාර්ථක ලෙස කළේය. ඒ නිසා ඔහු ස්තුති පූර්වක සිනාවක් පෑවේය. ඔහුගේ සබකෝලයද වේගයෙන් අඩු වී ඇත. ඔහු කොහොමත් කෝලයක් නැති මිනිසෙකි. එදින අභ්‍යාස වාරය අවසන් වූ පසු රාධාගෙන් මාකර් පෑන ඉල්ලා ගත් ඔහු "අපි අපි" යැයි දර්පණයේ ලිව්වේය.

රාධා ඉන් ප්‍රීතිමත්ව එය අගය කරන අතර මම සිනාවක් පා එළියට ආවෙමි.

ඔහු වෙනුවෙන් මා අලුතින් කරුණු සොයමින් නිර්මාණය කළ අභ්‍යාස ගැන සිහිවන විට එකල මා තුළ වූ සහනුකම්පික ගුරුවරයා ගැන අනුකම්පාවක් ඇති වේ.

ගුඩ් ෂොට්

මාසයක පමණ අභ්‍යාසවලින් පසු අප සියලු දෙනා නැවත හමුවූයේ දොස්තර සමරසේකරට විනීතා කළ පෙරැත්තය නිසා බව ඔහු කීවද ඔහුටද ප්‍රගතිය දැනගන්නට අවශ්‍ය විය. මා ඒ මාසයම ගත කළේ ඔහු අහන ප්‍රශ්න මගහරිමිනි. ඔහු තුළ අනවශ්‍ය අපේක්ෂා ඇති වීම වැළැක්වීම අවශ්‍ය විය.

හමුව හැන්දෑවේ හයට යොදාගෙන තිබුණද මා ගොල්ෆ් වටයක් සෙල්ලම් කර අවසාන වන විටත් වාහනයක් මිදුලේ නතර වී තිබිණ. වෙන වැඩකට කොළඹ ගිය වාහනයක් කලින්ම රාධා කැඳවාගෙන විත් සිටි නිසා ඇයද මා හා ගොල්ෆ් පිටියට ආවාය. ඇයට දිග පහරවල් එල්ල කළ නොහැකි නිසා කෙටිදුර පට් කිරීම් පමණක් ලබා දුනිමි. අප දෙදෙනා ඒ කාලය ගත කළේ මාසයක කාලයක යෙදුණු ක්‍රියාව ගැන තක්සේරුවක යෙදෙන්නටය.

දුඹුරු පැහැති සැහැල්ලු කලිසමක්ද ලොකු මල් සහිත රතුවන් කමිසයක්ද හැඳ උන් ඈ ඉදිකොළ තොප්පියක්ද පැලඳ සිටියාය. ඒ නිසා බැස යන හිරුගේ රැස් පවා ඇගේ මුහුණට කරදර කළේ නැත. අනික ඈ පැලඳ උන්නේ ලොලීටා වැනි නව යොවුන් කෙල්ලකට ගැළපෙන ලොකු සන්ග්ලාස් දෙකකි. එසේ තිබියදීත් ඇය මා හා ගමන් කළේ පොල්ගස්වල සෙවණැලි යට සිසිලෙන් සිසිලට පනිමිනි.

ඇය සිටියේ එළඹෙන හමුව ගැන ප්‍රීතියෙනි. ඒ වන විටත් අපේ ඉංග්‍රීසි පාසැලට වඩා වීවීගේ පන්තිය ඇයට වැදගත් වී තිබුණි.

"මට නම් මොනව කියන්නද කියල හිතාගන්න බෑ. මේක පන්තියකින් ඉගෙනගෙන නැතිකරගන්න පුළුවන් ගොළුකමක් නම් වීවීම තමයි එහෙම කරගන්න පළවෙනියා." ඇය කීවාය.

මම කිසිවක් කතා නොකර බෝලය වෙත අවධානය යොමු කළෙමි. මා සිතාගෙන සිටියේ සංවාදයේදී මතුවෙන යමක් ඇසුරෙන් මාත් යමක් කියනතුරු ඒ හමුව ගැන නොසිතා සිටින්නටය.

"මට හිතෙනවා අපිට මේක පුළුවන් කියලා." ඇය කීවේ තිස්තුන් වියැති පරිණත ගැහැනියකට වඩා නව යෞවන උද්යෝගයෙනි. එය ස්වභාවයෙන්ම පසු බසින බියසුල්ලකු වන මගේද උද්යෝගය දල්වන්නට විය.

"මට නම් හිතන්නෙ මේක අතඇරල දාන්න." මා කීවේද ඇගේද මගේද අවිඥානය ඇවිස්සීම පිණිසය. ඇය තිගැස්සී ගියාය. මා වුඩ්ස් පිත්තෙන් එල්ල කළ බෝලය තැඹිලි ගසක් අසලින් අඩකවාකාරව ඉහළ නැග හොඳින් තණකොළ කපා සකස් කළ කොළවන් ගොඩැල්ලේ ඇති කප් එක අසලටම වැටිණ. කලින්ම එහි ගොස් සිටි එඩ්මන්ඩ් ඈත සිට අතවනා ප්‍රීතිය පළ කළේය.

"මාරයි." ඇය කීවේ නොමනාප කටහඬිනි.

"ඇයි? ඒක හොඳ ෂොට් එකක්. ඔයා ගිහිල්ල පට් කරන්න." මම කීවෙමි.

"වළල්ලක් ඇතුළෙ කැරකි කැරකි පිස්සු බෝලයක් හිලකට තල්ලු කරනව වගේද මිනිහෙක් කතා කරවන එක." ඇය අතේ වූ පටර් එක අහසට දික්කර කීවාය. ඒ නිසා මට මතක් වූයේ කිසියම් චිත්‍රපටයක මෙග් රයන්ගේ ඉරියව්ය. වෙනසකට ඇත්තේ රාධාගේ සිරුර ඊට වඩා රවුම් හැඩවලින් යුක්ත වීමය.

---

1 ගොල්ෆ් බෝලය ප්‍රමාණයේ දුරක් එල්ල කිරීමට භාවිත කරන පිත්ත 'වුඩ්ස්' නමින් හැඳින්වේ.

"මම බැලුව කවුද මේ බන්දු එක්ක සෙල්ලම් කරන පුංචි කෙල්ල කියල." දොස්තර සමරසේකර ඈත සිට කියාගෙන ආවේය.

"බලනකොට ටීචර්නෙ නේද?" රාධා ටීචර් යන්නේ හල් 'ර' යන්න අවධාරණය කර කීවේ බෝලය වැටුණ දෙස බලාගෙනය. ඊළඟට ඇය ඔහු වෙත හැරුණාය.

"එක. මම තවම පුංචි තමයි. දෙක. ගෑනියෙක් සෙල්ලම් කරන්න නම් පුංචි වෙන්නම ඕනෙද? තුන. ඔයාට බන්දු පේන්නෙ වයසක වගේද? හතර. ගෑනියෙක් එක්ක කතාවක් පටන්ගන්න 'පුංචි කෙල්ලක්' අරව මේව කියන්නම ඕනෙද?" ඉන්පසු ඇය ඉදිරියට ගියාය.

දොස්තර සමරසේකරගේ දොඩමලුකම ගොල්ෆ් පිත්තක් වැදුණ නිදිකුම්බා පැලයක් සේ ඇකිලී ගියේය. රාධා සමග විහිළු තහළුවෙන් කතා කරන්නට ඔහු කැමැති බව මම කලෙක සිට දැක ඇත්තෙමි. එහෙත්, ඇගේ මුබරි කියුම්වලට ප්‍රතිචාර දෙමින් ඊළඟ පියවර තබන්නට ඔහුට චතුර බවක් නැත. අනික ඔහුට රාධා වැනි කෙනෙකු සමග කතා කරන්නට තරම් මාතෘකාද නැත. මිනිස් කන සහ උගුර ඇහුණු විට ඔහු ඊළඟට උනන්දුවක් දක්වන්නේ මිනිස් නාසය ගැනය.

"මිස්ටර් වික්‍රමසිංහගෙ තත්වෙ මොකද?" ඔහු කිසිවක් නොකියා ටික වෙලාවක් සිට ඇසුවේය.

"කල් යනවා." කියූ මම නිවස දෙසට යන්නට වීමි.

"මොකක්ද? ඔහු ඇසුවේය.

"අහන්න රාධගෙන්." කියාගෙන දිගටම ගියෙමි.

ඔවුන් දෙදෙනා කතා කරමින් සෙමින් පියවර තබන අයුරු වරක් ආපසු හැරී බැලූ මම දිටිමි. ඈ සමග ඇවිද ඒමෙන් දොස්තර සමරසේකර ලබන තෘප්තිය ඔහුගේ අංග චලනයෙන් පෙනිණ. ඔහු කියන යමකට විරුද්ධ වන හෝ අභියෝග කරන රාධා ඇගේ

අත වූ ගොල්ෆ් පටර් එකෙන් ඔහුගේ හිසට සෙමින් තට්ටු කිරීම සුන්දර දර්ශනයක් විය.

මම ආපසු ඔවුන් වෙත ගියෙමි.

අප සිටියේ එකොළොස් වෙනි ගොල්ෆ් කප් එක ආසන්නයේය.

“හරි එක පාරෙන් බෝලෙ කප් එකට දැම්මොත් මං වැඩේ දිගටම කරනවා. නැත්නම් බෑ.” මම කීවෙමි.

රාධා බෝලය බිම තබා දණහිස්ද බිම තබා එල්ලය බැලුවාය. වරක් මා දෙස බැලුවාය. වරක් දොස්තර සමරසේකර දෙස බැලුවාය. වෘත්තීය ගොල්ෆ් ක්‍රීඩිකාවක සේ සිට ගත්තාය. ඈ වෙතින් එවැනි නිවැරදි ගොල්ෆ් ඉරියව්වක් මා කවදාකවත් දැක නොතිබිණි. මොහොතක් ඇස් පියාගෙන සිටි ඇය ඇස් ඇර පටර් එක ඔරලෝසු බට්ටකු සේ පැද්දී විත් බෝලය පිටුපසින් වදින්නට සැලැස්සුවාය. මට්ටමට තණකොළ පවා කපා නොතිබුණු බිම දිගේ ඇදී ගිය බෝලය කප් එකට තරමක් ඈතින් එය පසු කර ගොස් කවාකාර පථයක කැරකී ආපසු එන්නට විය.

එය කෙළින්ම කප් එක ඇතුළටම වැටුණේය.

රාධා “යේ” කියා කෑ ගසා මගේ ගෙල බදා ගත්තාය. ඉන් පසු දොස්තර සමරසේකරවද වරක් වැළඳ ගත්තාය.

“මරුනෙ මැඩම්.” එඩ්මන්ඩ් ඈත සිට කීවේය.

“ගුඩ් ෂොට්.” මම කිව්වෙමි.

“ඒක අහම්බෙන් උනේ.” ඇය කීවේ පුදුම වූ මුව අතින් වසාගෙනය.

“ගොල්ෆ් තමයි අහම්බයට වැඩිම ඉඩක් තියෙන ක්‍රීඩාව.”

මම ඉදිරියට යන්නට වීමි. දොස්තර සමරසේකර නිහඬව සිටියේ ඔහුගේ විඥානයේ අහම්බවලට ඉඩක් නැතිවාක් මෙනි.

“මොකද කියන්නෙ.”

“කල් යනවා.” මම වේගයෙන් යන්නට වීමි.

“අහම්බයක් උනොත්?” රාධා ඇසුවාය.

“පුදුම වෙමු.” මම අතේ තිබූ ගොල්ෆ් පිත්ත පොල් ගසකට හේත්තු කළේ එඩ්මන්ඩ් ගොල්ෆ් බෑග් එකත් ගෙන මා ළඟම ළඟම ආ බැවිනි.

මා ඇඟපත සෝදා ගැනීමට සාමාන්‍යයෙන් ගත කරන කාලයටත් වඩා ගත්තේ අපේක්ෂා සගහනව ඉන්න යුවළ හමුවේ කුමක් කියන්නේදැයි සිතමිනි. මා සැහැල්ලු ඇඳුමකින් සැරසී එහි එන විටත් රාධා ඇගේ සටහන් පොතත්, තවත් පොතකුත් රැගෙන පැමිණ යුවළ ඉදිරියේ හිඳ සිටියාය. කකුලක් පිට කකුලක් දමාගෙන ඈ හිඳ සිටියේ මට හීනෙන්වත් හිතන්නට බැරි ආත්ම ශක්තියක් විහිදවමිනි. ඇය අර තිදෙනාම ඇගේ සිසු දරුවන් බවට පත් කරගෙන උන්නාය.

මා පැමිණ එහි වාඩි වී විනාඩි කිහිපයක් යනතුරුත් එහි වූයේ නිහඬතාවකි. ඒ නිසා මම මුලින්ම කතා කළෙමි.

“කල් යන්න පුළුවන්” යැයි මා කී විටම එය අවස්ථාවට නොගැළපෙන කියමනක් බව මට වහා වැටහිණ.

“අනේ කල් ගියාටනං කමක් නෑ සර්.” වීවීගේ ආංගික භාෂාව සහ විනීතාගේ ශාබ්දික භාෂාව එකවර පැනනැංගේය.

“දියුණුවක් තියෙනවා.” රාධා කීවාය.

“අනේ ඔව් ටීචර් මටත් පේනවා.” බිරිඳ උද්යෝගයෙන් ඉදිරියට පැන්නාය.

රාධා දොස්තර සමරසේකරට යෝජනා කළේ වීවීට ශ්‍රවණාධාරකයක් සවි කළ යුතු බවය. එයට වීවී අකැමැති බව දොස්තර සමරසේකර කීවේය. විනීතා ඒ සංවාදය වීවීට පැහැදිලි කර දුන් විට ඔහු අතින් කීවේ ඒවා පලඳින විට දරාගත නොහැකි දෝංකාරයක් ඇනෙන බවයි.

"අපිට පේන විදියට මිස්ටර් වික්‍රමසිංහට ප්‍රමාණවත් තරම් ඇහෙනවා." දොස්තර කීවේය. "ඒ උනාට එහෙම ඇහෙන බව එයාට දැනෙන්නෑ."

ඒ සංවාදය නිමාවේදී මගේ අලස දිනචරියාවට වගකීමක් එක්වීම මගේ හිත් කරදරයට හේතුවක් විය. ඒ වගකීම යනු ඉටු කළ නොහැකි දෙයක් වීමට ඉඩ ඇති දෙයක් වීම තවත් හිත් කරදරයකි. එහෙත්, අප මේ කරන්නට යන දෙයෙහි අහම්බයක් සිදුවීමේ විභවතාවත් ඒ හා බැඳුණු අනාරක්ෂිත හැඟීමත් මගේ සිත් ගත්තේය. කෙළවරක් නොදන්නා ඝන වනාන්තරයක් ඔස්සේ මග සොයාගෙන යන්නට එකඟ වන්නාක් මෙනි. ඇතැම් ගොළු මනුෂ්‍යයන්ට පසු කලෙක කතා කිරීමට හැකියාව ලැබුණු අවස්ථා විස්තර කරන පොතක් රාධා ගෙනැවිත් තිබුණෙන් එහි වූ ඇතැම් තැන් අපටත් විස්තර කළාය.

ස්වභාව ධර්මයට එරෙහිව කළ නිර්භීත අරගලයකියි එදවස මා සිතූ, මාස හයකටත් වඩා ඉදිරියට ඇදුණු ගමනක සැලැස්ම ස්ථිර වූයේ එසේය.

දෙය්යන්ගෙ පින්තූර

ගොළු කෝකියාගේ දක්ෂතාව නිසා සේදරමන් හෝටලයේ නිත්‍ය පාරිභෝගිකයන් ගණනද කටකතා අසා එහි එන අයගේ ගණනද වේගයෙන් වැඩි වූ නිසා විශාලම ප්‍රශ්නය වූයේ අසුන් පැනවීමයි. පිරිස ආවේම අනන්මනන් කෑම කන්නට නොව, බත්ම කන්නටය. ඒ නිසා එක් පාරිභෝගිකයකු වෙනුවෙන් අවශ්‍ය මේස ඉඩද කාලයද වැඩිය. තුන්වේලම බත් කන, "බත් කෝරලේ" යැයිද හැඳින්වෙන පළාතක මිනිසුන් බත් කන්නට මේ තරම් උනන්දුවෙන් එන්නේ මන්ද යන්න ගොළුවිජේට වටහා ගන්නට බැරි තත්වයක් විය. මිනිසුන් වෙන වෙන තැන්වලින් කන්නට බත්ම සොයා යන්නේ ගෙදරදී නිතරම බත් කන නිසාම බව ඔහු සිතුවේය. ඔවුන් හොයන්නේ සම්පූර්ණ වෙනසක්ම නොව, හුරුපුරුදු දේට එක් වූ වෙනසකි. ඒ හෝටලයේම ජීවත් වන තමන් වැනි අයට තේරුම්ගත නොහැකි ප්‍රහේලිකාවකි. සම්පූර්ණ වෙනසක් අවශ්‍ය වූ විට පෙරේතකමින් කන්නේ පාන්ය. බත් සමග තරහ වූ විට මිතුරු වීමට මිනිසුන් තෝරාගෙන ඇති බත්වල හතුරා පාන් වූවාක් මෙනි. හෝටලයේදී බඩගින්නක් ආ විට එක එක ආකාරයේ කෑම කන්නට පුළුවන. ගෙවල්වල අයට එහෙම නොවේ. ලුණු රහට කරෝල ටිකක් හෝ මිරිස් සහ දෙහි රසට සම්බෝල ටිකක් සමග බත් පිඟානක් ගිල දැමූ දවස්වල ගෙදර ළඟින් පාන්කාරයා යන විට ලෝකයේ රසම කෑම විකුණන්නා යන්නාක් සේ කටට කෙළ උනා ආවාක් සේ

කළේය. ඔහුගේ මුව ගොළු සිහිපත් දැනුණ අන්දම ගොළුවිජේ වුවද හිත ගොළු නොවූ නිසා "කේතලේ පැහෙන්නා වගේ" එක එක අදහස් උපන්නේය. ගොළුවිජේ ඇතැම් කරිවලින් ලුණු රස පරාජය කරගෙන එන ඇඹුල් රස, කිරි රස, තිත්ත රස, කොළ රස, ඒ රස මේ රස මතු වී එන ලෙස මාළුපිනිවල සියුම් සියුම් වෙනස්කම් කළේය. ඒ නිසා හැමදාම කන බත් පිඟානට වඩා වෙනස් රසක් මතු වී ආවේය. ගොළුවිජේ මේ කිසිවක් කාටවත් නොකියා ගොළු හිතින් හිත හිතා තමන්ම කළේය. ගෙදර බත් එක එපා වූ පිරිමින් පමණක් නොව, තමන්ම උයන කෑම එපා වූ ගැහැනුන් පවා සේදරමන් හෝටලය ළඟින් යන විට එහි ඇදී එන රහස එය යැයි ඔහු සිතුවේය. ඇතැම් ගැහැනුන් පිරිමින්ට ගෙදර උයා තබා හොරෙන් පැමිණ සේදරමන් හෝටලයෙන් බත් කා ගියේ එක්තරා රහස්‍ය සරාගයක රසය විඳින්නාක් සේය.

මේ නිසාය හෝටලේ ඉඩ පිළිබඳ අර්බුදය ආවේ. එය මේ කතාවේ දිසාව තීරණය කරන අහම්බ කාරණයක් බවට පෙරළිණ.

පාවිච්චියට නොගත් උඩතට්ටුව පිරිසුදු කර මේස දැමිය යුතු බව තීරණය වූයේ එන සෙනග වැඩි වූ හෙයිනි. ඒ සාකච්ඡාව පැවැත්වුණේ බිල්ලා සහ මුදලාලි අතරය. එදා කොල්ලන්ට බෝතලයක් ගෙනැත් දී මුදලාලි සහ බිල්ලා ජින් බාගයක් සප්පායම් වන දවසය. ඒ දවස අඩු තරමින් සති දෙක තුනකට වරක්වත් එයි. පොලිස් සාජන් පැමිණ හතර වටේ අණ කරමින් දමන සාප්පයට වඩා මේ සාප්පයේ අමුතු හිතෛෂිවන්තකමක් ඇත. කොල්ලන්ට පෙනි පෙනී මුදලාලි සමග ජින් බීමෙන් බිල්ලා විඳි සන්තෝෂය කොල්ලන්ට ලොකු විහිළුවක් විය. එහෙත්, මුදලාලි සමග වෙනම බීමෙන් බිල්ලා ලැබුවේ එක්තරා 'යුව රජ ප්‍රීතියකි.'

"මං ඉන්නෙ උඩ සුද්ද කරල කැල්ලක් දෙන්ඩ විජේට ඉන්ඩ." මුදලාලි කියනු මුලින්ම සිරිපාලට ඇසිණ. ඔහු එය ගොළු බසින් කාටත් ඇසෙන්නට කී විට ගොළුවිජේද එය තේරුම් ගත් බව පෙන්නුවේය. ඔහු නොතේරුණ ගානට උන්නා මිස උනන්දුවක් පෙන්නුවේ නැත.

ඒ ජින් බාගය අවසන් වන විට මුදලාලි සහ බිල්ලා තීරණය කර තිබුණේ පෝය දවසට හෝටලේ වසා ශ්‍රමදානයක් දාන්නටය.

උඩ සොල්දර තට්ටුවට යන පඩිපෙළ පිරී තිබුණේ හිස් කාඩ්බෝඩ් පෙට්ටි, බීමබෝතල් කේස් ආදී ලට්ටලොට්ටවලිනි. තේ පැන්ට්‍රිය ඇති බිත්තියට හේත්තු කොට ගසා තිබුණු ඒ ලී පඩිපෙළ කලෙක අලංකාර දැව රේඛා රටා පෙන්වමින් තිබෙන්නට ඇති වුවද දැන් නම් දූවිලි බඳාගෙන කළු පැහැ ගැහී ඇත. ඒ පඩිපෙළ උඩින් ප්ලයිවුඩ් ගසා වසා දමා තිබුණේ ඒ තට්ටුව පාවිච්චියට තරම් අවශ්‍යතාවක් නොවූ නිසාත් රාමය්යා මුදලාලිගේ බඩුමුට්ටු වගයක් එහි තවත් තිබුණ නිසාත් පමණක් නොව, ඒ තට්ටුවේ දූවිලි මේ තට්ටුවට එන නිසාය.

"උෟට ඉන්ඩ පොඩි කැල්ලක් වෙන් කරන්නට ඕනැ ලෑලි ගහල. අනික් හරියෙ මේස දාමු එහෙනං" මුදලාලි කියනු ඇසිණ. එයද පරිවර්තනය විය.

ගොළුවිජේ සේදරමන් හෝටලයේ උඩතට්ටුවේ එක පැත්තකින් ලෑලිවලින් වෙන් කළ කාමරයක ස්ථිර පදිංචියට ගියේ ඒ අනුවය. හරියටම කුස්සියට උඩින් පිහිටි ඒ කාමරයට අලුතින් ජනේලයක් දමා එළිය සහ වාතාශ්‍රය ලබා ගැනීමට හැකි විය. එක් පැත්තක ශ්‍රීරාම් හෝටලයේ සන බිත්තියය. අනික් පැත්තේ සිටි පැලස් රෙදි සාප්පුවේ සන බිත්තියය. ඒවා දැවැන්ත කබොක් ගල් බිත්තිය. සිටි පැලස් රෙදි සාප්පුව පැත්තේ බිත්තියේ ගලකින් කැල්ලක් හැරී සෑදුණ ලොකු සැමන් ටින් එකක් දැමිය හැකි තරම් බෙණයක්ද පොඩි පොඩි කඩතොලු කීපයක්ද හැරුණු විට වෙන කිව යුතු වරදක් නැත.

පෝය දා ශ්‍රමාදනය සිද්ධ විය.

"මේ පඩියට වැඩ කරනෙකම ශ්‍රමදානයක් නේන්නං" යැයි සිරිපාල කී කියුමට "අනේද කියන්නෙ"යි තව කෙනෙකු එකඟ වුවද ශ්‍රමදානය ප්‍රීතිමත් අවස්ථාවක් විය. මුදලාලි නෝනා පැමිණි සිටි නිසා සේවක පිරිස අතර පැතිර ගියේ අමුතු උනන්දුවකි.

කිසිවෙක් ඇයටද ඇසෙන ලෙස විහිළු කතාද කිව්වේය. ඒවා ඇ
නෝනා සිනාසෙනු ගොළුවිජේද දැක්කේය.

උඩතට්ටුව යනු දූවිලි තට්ටු තට්ටු වැකි තට්ටුවකි. ඒ
කෙතෙක්ද යත් නාස් බැඳ ගන්නා ලෙස උපදෙස් දුන් නෝනා
ජේමන්ට් වෙළෙන්දෙකුගෙන් ලොකු ලේන්සු ගේන්නට සිරිපාල
යැව්වාය. ඇගේ කරුණාවන්තකමේ තවත් ලක්ෂණයක් පෙ
ලේන්සු කතාව ගොළුවිජේට මතක තිබිණ.

ඒ උඩතට්ටුව හෝටලයට එක්වන අලුත් කොටසක් පමණක්
නොව, අතීතයේ මතක ගබඩාවක්ද විය. මකුළුදැල්ද දූවිලි තට්ටුද
මීයන් කැපූ කඩදාසිද අස්සෙන් අතීතය මතුව ආවේය.

ගොළුවිජේගේ කෝකි උනන්දුව වහා ඇදී ගියේ එක
මුල්ලක ගොඩගසා තිබූ හට්ටිමුට්ටි භාජන වෙතය. දූවිල්ලෙන්
වැසී තිබුණු ඒවා එකින් එක ගෙන ඇඟිල්ලෙන් දූවිලි තට්ටුව
හාරන විට මතුව ආවේ තාමත් මල නොකෑ මල නොබඳින සුදු
යකඩවලින් කළ එක එක ස්වරූපයේ භාජනය. ඒවා සයිවර් කඩේක
බඩුය. බිත්තියේ එල්ලා තිබූ දූවිලිවලින් වැසී ගිය ඡායාරූපවලින්
මතුව ආවේ ලක්ෂ්මී, සරස්වතී, ගණදෙවි, ආදී දේවරූපය. සායි
බාබාගේ රූපයක්ද විය. ඇතැම් දේවරූප ඔහුට හඳුනාගන්නට
නොහැකිය.

යන්තම් ඇස් විතරක් පෙනෙන්නට ලේන්සුව බැඳගෙන
මේ අතීත ලෝකය ගවේෂණය කරන ගොළුවිජේ දුටු මුදලාලි
හාමිනේ අත්ද අතරින් පතර වචනද භාවිත කරමින් කීවේ ඒ
කතාවය.

"ඉස්සර මේක සයිවර් කඩෙයක්."

ඇය ගොළුවිජේ අත වූ දේවරූපයක් ගෙන එහි දූවිලි
තට්ටුව මත හැත්තෑ හත ලියා පෙන්නුවාය.

ගොළුවිජේ හිස වැනුවාය. ඔහුට සිහි වූයේ කුස්සිය පිටුපස
තාප්පයේ ගැසූ කම්බි දැලක එති එතී වැඩෙන සමන් පිච්ච
වැලයි.

"අපේ මහත්තය කුලියට ගත්තෙ." ඇය කීවාය.

"එහා පැත්තෙ දෙමළා තමයි මෙයාව එළෙව්වෙ බය කරලා. මිනිහ මේක ඉල්ලුව. රාමය්ය දුන්නෙම නෑ. මෙයා යාපනේ දෙමළ. එහා පැත්තෙ එකා වෙන මොකක්හරි දෙමළ. උනුත් එකාට එකා නෑනෙ ඔය හිටියට." මුදලාලි කිසිම ගොළු භාෂාවක් භාවිත නොකර කීවේය.

"අපි වගේම තමයි උනුත් එහෙනං ආයෙ මොකද. අර කුලෙයි මේ කුලෙයි උඩරටයි පාතරටයි. දෙමළට කෙළින්ඩ ඕන වෙලාවටනං ඕං එකතු වෙයි." බිල්ලා කී විට සියලු දෙනාම සිනාසුණහ. ගොළුවිජේද සිනාසුණේ හඬ නොනැගෙන්නට නිසා ලේන්සුවෙන් වැසී ඇති ඔහුගේ කට කාටවත් පෙනුණේ නැත.

සිය මයිනර් කාර් එක හයර් කරගෙන කඩේ ඉස්සරහම සිටි සේදරමන් ස්ථිර ව්‍යාපාරයක් ආරම්භ කරන්නට කල් බලමින් උන්නේය. ඒ තීරණාත්මක අවුරුද්දේ රාමය්යා මුදලාලි සරස්වතී භවන් හෝටලය තමන් නිතර දෙවේලේ සාධාරණ ගාණකට ගමන් බිමින් එක්ක ගිය සේදරමන්ට කුලියට දුන්නේය. අවුරුද්දකට පසු බද්දට දුන්නේය. ඊටත් පසු ටික ටික ගෙවන්නට සේදරමන්ටම වික්කේය. තාමත් සම්පූර්ණයෙන් ගෙවා ඉවර නැත.

ගොළුවිජේ පසුව සොයාගත් ආකාරයට රාමය්යා මුදලාලි ඉතිරි මුදල් ගන්නට අවුරුදු ගාණකින් ආවේ නැත.

ඔහු ඒ දේවරූප සියල්ල හොඳින් පිරිසිදු කර කහදියර ඉස ඔහුට වෙන් කළ කාමරයේ එල්ලා මල් පුදන්නට පටන් ගත්තේය. එක් බිත්තියක ගලකින් කැල්ලක් ගැලවී සැමන් ටින් එකක් තරම් බෙණයක් හැදුණ තැන වසා ලක්ෂ්මී රූපය එල්ලූ විට බිත්තියෙහි පළුදු වැසී අප්‍රුව පෙනුමද නැතිව ගියේය.

වේගවත් විස්මය

වීවීට කටහඬ දිනා දීමේ පන්තියේ ගෙවී ගිය ඊ ළඟ මාස කිහිපය තුළ හාස්කමකට වේගයට වඩා සෙමින් වුවත් හාස්කමක් සිදු විය. එය දොස්තර සමරසේකර පවා තරයේ පුදුම කරවන හාස්කමකි. ඊට හේතුව ඔහු මාස කිහිපයකට පෙර කළ අනාවැකියක් නිවැරැදි වීමයි.

තුන්වැනි මාසයේ අප කවුරුත් එක්ව කළ සාකච්ඡාවකදී වීවීගේ උච්චාරණ ශක්තිය පරීක්ෂා කළ වෛද්‍යවරයා කීයේ වැඩිකල් නොයා වචන බවට පත් විය හැකි ශබ්ද ඔහුගෙන් පිටවන බවයි. රාධාගේ අදහස වූයේද එයයි. දෙවැනි මාසය පුරාම පාහේ වීවී සමග වැඩ කළේ රාධා තනිවමය. මා ඉදිරියේ වීවී කුලෑටි ගතියක් පෙන්වීමත් කටහඬ අභ්‍යාසවලින් එපිටට යමක් මා නොදැන සිටීමත් එයට එක් හේතුවකි. රාධා මේ වගකීම ඈ වෙත පවරාගෙන සිටියාය. බ්‍රිතාන්‍ය කවුන්සිල සහ ඇමරිකානු මධ්‍යස්ථානයේ පුස්තකාලවලින් ඇය ප්‍රයෝජනවත් පොතපත සපයාගෙන ඒවා ඇසුරින් ඇගේම අභ්‍යාසද නිර්මාණය කර තිබිණි.

තවත් මාස හයක් විතර වන විට වචන උච්චාරණය කළ හැකි යැයි දොස්තර කියද්දීම විනීතා පෑවේ පුදුමාකාර විස්මයක් පළ කරන සිනාවකි. එවැනි විස්මයක් මුහුණක් මත ප්‍රදර්ශනය කරන්නේ කෙසේදැයි මම අදත් පුදුම වෙමි.

"ටීචර් තමයි හරියට මහන්සි උනේ." වීවී ගොළු බසින් කීවේය.

"ඇයි බලගල්ල සර්. පිට මිනිස්සු වලව්ව ඇතුළෙ දාගෙන මොන කරදරයක්ද සර් විඳින්නෙ." විනීතා මා වෙත කෘතඥතා පූර්වක බැල්මක් හෙළුවාය. ඇය පිට මිනිස්සු යැයි කීවේ ඒ වචනයේ උපරිම අර්ථ එහි ඇතුළත් කරමින් බව මට වහා දැනිණ.

"ඇත්ත ඇත්ත. මං කිව්වෙ ටීචර් තමයි වැඩ කෙරුවෙ බන්දු සර්ගෙ උපදෙස් අනුව - කියනෙක තමයි ඔය කිව්වෙ" විනීතා සිය සැමියාගේ ගොළු බස දෙස බලා මට කිව්වාය.

ඇය සිය සැමියා කී දේවල් කීවේ යැයි කී වචන කීවේ ඔහු ඒවා කියන්නට ඉඩ තිබුණු ස්වරය අනුකරණය කරමින් නිසා සැමියා වෙනුවෙන් එක් ස්වරයක්ද තමා වෙනුවෙන් තව ස්වරයක්ද භාවිත කරමින් කතා කිරීම නාට්‍ය දර්ශනයක් සේ විය.

එය සන්තෘප්තකර සන්ධ්‍යාවක් වූයේය. සේන විසින් පිළිගන්වන ලද තේ කෝප්පයේ උණුසුමට මිහිරක් එක් කරන සීතලක් පතුරුවා වැසි පොදක් වැටුණේය. මඳ වැස්සක් වුව අස්වැසිල්ලක් වන කුරුණෑගල අව්වේ රස්නය නිමී රාත්‍රිය අන්ධකාරය වෙත තුරුළු වී ගියේය. රාධා සාවධානව අසා සිට අමන්ද සන්තෘප්තියක මඳහාස නැගුවාය. විස්මයක් සිදුවනු අත ළඟ දකින අදහස සිත ඉපිද මාද එදා සිටියේ අපමණ ප්‍රීතියෙනි.

"දැනට වීවීට තියෙන්නෙ ඇහෙන් දැකපු භාෂාවක්. ඒක කනෙන් අහපු භාෂාවක් බවට පත් කරගන්න ඕනෙ." රාධා කීවාය. ඇය පෙනුණේ කථනාබාධිත අය පිළිබඳ විශේෂඥවරියක සේය.

"අන්න හරි. මම මේ උන්නෙ ඒක කියන්නෙ කොහොමද කියල. ටීචර් එක ලස්සනට කිව්ව. මොනව හරි කැසට් පටි ටිකක් අහන්න දුන්නොත්?" දොස්තර සමරසේකර තමන්ගේ දායකත්වය දක්වන්නට අවස්ථාවක් එනතෙක් මෙන් බලා සිට කීවේය.

"ඒක හොඳයි නිකම්ම කැසට් දීල බෑ. වීවී වගේ කෙනෙකුට ඕනැ කරන ටේප් තියෙනවා. සිංහලෙන් තියෙනවද දන්නෑ. මම හොයන්නම්. සමහර විට රත්මලානෙ ඇති." රාධා කීවේ දොස්තර සමරසේකරටද නිසි ගෞරවය පුදමින් වීම මගේ සතුටට හේතු විය.

විනීතා එය අංගචලනයේ බසට පරිවර්තනය කළාය.

"මහත්තය කියනව කැසට් හදමු කියලා." ඇය ඔහුගේ ගොළු බස සිංහලට නැගුවාය.

අපි එදින අපේ ඉලක්කය කරා යන්නට කාලසටහනක් හැදුවෙමු. එය අපේ මාර්ග සිතියම විය.

* * *

හය වැනි මාසය වන විට ආශ්චර්ය සිදු විය. මා සිටියේ කාමරයෙන් පිටය. රාධා මගේ නම කියා කෑගසාගෙන කාමරයෙන් එළියට ආවාය. මමද ඇතුළට ගියෙමි.

"අපි අරක ගමු" වීවී කීවේය. එය රාධා ඔහුට සාදා දුන් වැකියකි.

"ඔන්න බන්දු මම වෙන ශබ්ද තියෙන වාක්‍යයක් දෙනවා." ඇය මට ඉංග්‍රීසියෙන් කියා වීවී ඉදිරියේ කාඩ්බෝඩ් එකක් ඇල්ලුවාය.

"අපි කොහොම හරි එහෙ යමු."

වීවී කීවේය.

එය ඇදහිය නොහැකි විස්මයක් විය. රාධා ප්‍රීතියෙන් මගේ ගෙල බදා ගත්තාය. ඉක්බිතිව ඔහුගේ දෑතම ගෙන ප්‍රීතියෙන් සෙලෙව්වාය.

"වී-ච-ර්" ඔහු ආයාසයෙන් කීවේය.

"වච්!"

"පුදුමයක් උනත් ඕනැවට වඩා ඉක්මනින් වෙනකොට බයත් හිතෙනවා." මම ඉංග්‍රීසියෙන් කීවෙමි.

"ඇත්ත. අපි හිතුවටත් වඩා වේගෙන් ප්‍රතිඵල එන්නෙ. හරි ෂෝක්." ඇය සිංහලෙන් කීවේ එය ඔහුටද අසා සිටින්නට ඉඩදෙන්නාක් මෙනි. "හැම පුදුමයක්ම හොඳ දෙයක් නොවුණත් හැම හොඳ දෙයකම මොකක් හරි පුදුමයක් තියෙනවා" ඇය ශෝභන ලෙස උච්චාරණය කළ ඉංග්‍රීසියෙන් කීවාය.

ඉන් පසු ඔහු යමක් කියන්නට තැත් කළද පිටවූයේ වචන භාග පමණි. ඔහු ගොළු බසට මාරු විය.

"එයා කියන්නෙ හෙමින් යමු කියලා." රාධා මා වෙනුවෙන් පරිවර්තනය කළද එය මා තේරුම් ගත්තේද එලෙසය.

අපේ ඉංග්‍රීසි නම් ලෝක භාෂාව විශිෂ්ට ලෙස ඉගැන්වීමත් ශේක්ෂ්පියර් නාට්‍ය නිෂ්පාදනය කිරීමත් ප්‍රධාන අරමුණ වූ රංග පාඨශාලාව පවා අපේ අවධානයෙන් ගිලිහෙන කාලයක් ආවේය.

දෙවෙනි පියවර

අපි ශබ්දය දෙමු

මගේ අභ්‍යාස නිසා වීවීට කතා කරන්නට හැකියාව ලැබෙතියි මා විශ්වාස නොකළ මුත් රාධා දැක්වූ උද්යෝගී උනන්දුව මටත් බෝ විය. මට ස්වභාවයෙන්ම උරුම සංශයවාදයේ අඳුරු හෙවණැල්ල යටට වී වුවද හැකි සෑම සහයක්ම ඇයට ලබා දුන්නේ අහම්බයකට ඉඩක් ඇති බව මා විශ්වාස කළ නිසාය. සිදුවෙමින් පැවති පුදුමය ගැන මටත් වඩා සැකයෙන් බැලුවේ සේනය. "ඕකා බොරුවක් කරනවද දන්නෑ නෑ සර්" ඔහු වරක් කීවේ වීවීගේ වර්ධනය ගැන ඔහුට කනින් කොනින් ආරංචි වූ විටය. "ගොළුවන්ට බොරුවට කතා කරන්න බෑ සේන" මා වරක් ඔහුට කීවේ අනවශ්‍ය දේවලට කට නොදා ඉන්නැයි කියන ස්වරයෙනි. ඔහු ඒත් අපේ වැඩේට කට දාගෙනම ඉන්නට තැත් කරන්නාක් මෙන් උපහාසයෙන් කට ඇද කළේය. "මිනිස්සුන්ට බොරුවට නිදාගන්න පුළුවන් උනාට බොරුවට ඇහැරිලා ඉන්න බෑනෙ" මා එසේ කී විට ඔහුගේ ඇදවුණු කට ටික ටික හරි ගියේය. ඉන් පසු ඔහු ඒ ගැන මගෙන් ඇසුවේ නැත. ඔහු මත මා පැන වූ ඒ ආධිපත්‍යය මගේම සැකසංකා පරාජය කරගැනීමක් සේ විය.

රාධාට මිතුරියක සේ උපකාර කළ හැකි ස්ත්‍රියක සිටියේ නම් මැනවියි එකල මට නොයෙක් වර සිතුණේය. වතුපිටිද කුඹුරුද බලාගෙන නිකම් ඉන්නට කැමැති මට උපදෙස්ද දීගෙන ගෙදර කළමනාකරණය කරන්නට සේන අතිදක්ෂයෙකි. එනමුදු

රාධා සහ මා යෙදී සිටින භාෂා-නාට්‍ය කලා කටයුතු ඔහුගේ විඥානයට ඇතුළත් වන්නේ අනවශ්‍ය කටයුතු ලෙසිනි.

එහෙත්, දැන් වීවීගේ විස්මයජනක වෙනස සේන තුළ අලුත් උනන්දුවක් ඇති කර තිබේ. ජීවිතයේ ප්‍රථම වරට ඔහුගේ හාම්පුතා යම් දෙයකට දක්ෂතා දක්වන බවක් ඔහුට පෙනී ගියාක් සේය.

හය වන මාසය වන විට වීවී දොස්තර සමරසේකර අපේක්ෂා කළ මට්ටමටම පැමිණ තිබුණෙන් රාධා සහ මම ඔහුගේ විද්‍යාත්මක අනාවැකි ගැනද පුදුම වීමු.

තමාගේම වාක්‍ය සාදා කියන්නට වීවී හැකියාව ලබා සිටියේය.

ඒ වන විට කටහඬ අභ්‍යාස සම්බන්ධයෙන් මට කරන්නට දෙයක් නොතිබුණෙන් ඒ දෙදවසේ වැඩ බොහොමයක් කරන්නට රාධාට ඉඩ දී මම එක්කෝ ගොල්ෆ් ගැසුවෙමි නැත්නම් ඉංග්‍රීසි පාසැලේ වැඩ බලා ගතිමි; නැතිනම් මගේ පුස්තකාලයට වී කියවීමි. ඒ දවස්වල මා කලක් සොයමින් සිටි නජීබ් මෆූස්ගේ හරාෆිෂ් නවකතාව මා අතට පත් වී තිබිණ. මා කුමක් කළත් ඒ පොත වෙත යන්නට බලා උන්නේ අලුත ගෙනා මනාලියගේ රුව අඩුතරමින් ඇසින්වත් අල්ලා ගන්නට ඈ ඉන්නා ඉසව්වට ඇදෙන මනාලයකු මෙනි. රවුම් රවුම් කැරකි කැරකී පරම්පරාවෙන් පරම්පරාවට යන ඒ නවකතාවද විස්මයට නව ඉඩක් පෑදුණු මගේ මනස හා මනාව ගැළපුණත් විටින් විට මගේ සිත ඇදී ගියේ රාධා සහ මා එක්ව නිර්මාණය කරන්නට තැත් කරන විස්මය කෙරෙහිය.

සිය සැමියා විස්මයජනක ලෙස ශාබ්දික භාෂාවේ ලෝකයද ජයග්‍රහණය කරමින් සිටින බව විනීතා මුලින්ම ඇගේ සමීප යෙහෙළියන්ට කීවාය. ඔහුගේ කඩසාප්පුවල අයටත් ආරංචිය ගියේය. සිංහ රෝහලේ කාර්ය මණ්ඩලය ඒ සුභාරංචිය මුලින්ම ඇසූ වාසනාවන්තයන් තමන් යැයි සලකාගෙන තමන්ගේ වාසනාවන්තභාවය අනික් අය හමුවේ ප්‍රදර්ශනය කළහ. ඔවුන්ට ආරංචිය ගියේ විනීතාගෙන් නොව, තමාගේ අධීක්ෂණය යටතේ

කෙරෙන පර්යේෂණයක් විස්මයජනක ප්‍රතිඵල ගෙන දෙමින් සිටින බව දොස්තර සමරසේකර රෝහලේ කාර්ය මණ්ඩලය අමතා පොඩි දේශනයක් දුන් නිසාය. තම හාම්පුතාගේ හාස්කම් බලය ගැන වචනයක් දෙකක් සේන වෙතින් වීවීගේ රියදුරුට දැනගන්නට ලැබුණෙන් ඔහුද කීපදෙනකුට කීවේය.

එතැනින්, එසැණින් ගින්න ඇවිළිනි. සිංහ රෝහලේ ඊඑන්ටී අංශයේ පෝලිම පටන් ගත්තේ පාන්දර හතරටය. එල්ටීටීඊ ප්‍රදේශවල සිටද රෝගීහු ආහ. කන් බිහිරි වන සේ බෝම්බ පුපුරා ගිය තැන්වලදී ශාබ්දික සුනාමිවලට හසු වූ අය නැවත ශබ්දය නම් රසය විඳීමට ආසාවෙන් සිංහ රෝහල සොයා ගමන් ආරම්භ කළහ. වැඩිකල් නොයාම ගින්නෙහි දළු මගේ මිදුලටම දිගු වූයේ මගේ ස්වයංපෝෂිත එකලාභාවයේ සියලු බිත්ති දෙදරවමිනි. දවසක් උදෑසන මා ගොල්ෆ් රවුමක් සෙල්ලම් කරමින් නිවස දෙසට එන විට ගැහැනු සහ පිරිමි දහ පාලොස් දෙනෙක් මිදුලේ පොදි ගැසී සිටියහ. කාර් තුන හතරකුත් නවත්වා තිබිණ. මෙවැන්නක් සිදු විය හැකි බව කල්තියාම දැන සිටි මා පිටිපස්සෙන් ගෙට වැදුණේ සේනට කතා කරගෙනය.

"අර මිනිස්සු ඇවිල්ල තියෙන්නෙ ගොළුබිරි ළමයි හොඳ කරනව කියල ආරංචි වෙලා." සේන කීවේය. "සමහරු බූලත් අතුත් ගෙනැල්ලා" ඔහු උපහාසයෙන් සිනාසුණේය. එහෙත්, ඔහු සිටියේ සිය හාම්පුතා විස්මකර්මයෙකිය යන්න හදිසියේ වටහාගත් ප්‍රමෝදයෙනි.

"එහෙම තමයි මිනිස්සු ගොළු උනාම. ඕනැ දෙයක් කරයි සද්ද කරන හැටි ඉගෙනගන්න. සේන ඕකට හිනාවෙන්න පුළුවන් වෙලා තියෙන්නෙත් සේන ගොළු නැති හින්දනෙ."

"වලව්ව අස්සට ගන්නැතුව අර පන්තිය දිහාටවත් තල්ලු කෙරුවොත් හොඳයි නැත්තං අර අන්න ගෑනු මල් පාත්තිත් අතගානව. දැන් මල් පැළ ඉල්ලන්නත් පටන් ගනියි."

මම ඉදිරි සාලයට ගොස් ලැටිස් පටි අතරින් බැලුවෙමි. වත්තේ වැඩ කරන ධර්මරත්න මගේ ගොල්ෆ් ක්‍රීඩාව ගැන නාට්‍යමය ලෙස විස්තර කරමින් උන්නේය. ඔහුගේ පරීක්ෂාව

යටතේ පවතින මල් පාත්ති ගැනු උදවියගේ අවධානයට ලක් වී තිබිණ. යකඩ ආරුක්කුව වසාගෙන වැවී ඇති දැවැන්ත පිච්ච වැල සමහර ස්ත්‍රීන්ගේ පුදුමයට හේතු වී ඇත. මේ හාස්කම් සහිත තැනක්ය යන්න පිච්ච වැල විසින් නිවේදනය කළාක් සේය.

"බලගල්ලෙ හාමු පරම්පරාවෙ බාලම පුතා." ධර්මරත්ත කවුදෝ අහපු ප්‍රශ්නෙකට පිළිතුරු දුන්නේය.

"ඒක තමයි හාස්කම් පිහිටන්නෙ." බුලත් අතක් ගත් ගැහැනියක් කීවාය.

"මේවා පරම්පරා වලව්. මේ වලව්වෙ නිදන්, නිදන් වදුලු, පුස්කොළ පොත්, ඔටුනු, කඩු වගේ රජ කාලෙ එව්ව තියෙනව කියලනෙ කතාව යන්නෙ." එක් මිනිසෙක් කීවේය.

ධර්මරත්තගේ මුහුණ ආඩම්බරයෙන් ආලෝකවත් වූයේ ඒ කඩු සහ ඔටුනු ඔහුට උරුම දේවල් යැයි සලකන්නාක් මෙනි. "ඇයි දෝලාව?" ඔහු එකතු කළේය.

කාර්වලින් ආ උදවිය සිටියේ ඒ බව ඈතටම පෙනෙන ලෙස වෙන වෙනමය. එහෙත්, ඔවුනුත් මේ දෝලාවල්ද ඇති පැරණි නිවස දෙස බලා සිටියේ විස්මයෙනි. ඔවුන් අපේ පරණ ගරාජයේ නවතා ඇති දැන් ධාවනය කළ නොහැකි ඔස්ටින් එයිට් කාර් එක දෙස බැලුවේ එයද නිධන් වස්තුවක් සේ සලකන්නාක් මෙනි. ඒ පප්පාගේ කාර් එකක් බව ධර්මරත්ත ඔවුන්ට කියන්නට ඇත. ඈතින් පෙනෙන සෙක්කු ගල කුමක්දැයි කෙනෙක් ළමයෙකුට කියා දෙමින් උන්නේය. කුමක් කරන්නදැයි සිතාගත නොහැකි මම ආපසු හැරුණෙමි.

"සේන තමයි ඉස්සරහට යන්න ඕනෙ." මම පරාජිත ස්වරයෙන් කිව්වෙමි.

"මං කිව්වෙ! මිනිස්සු බුලත් අත් දෙනකොට සුවපත් වේවා හරි මොනව හරි කියන්ඩ වෙයි" ඔහු මට අණ කරන සේ කීවේය.

එය විහිළුවක් බව ඔහුගේ මුහුණෙන් පෙනිණ. ඔහු ඉස්තෝප්පුවට යන්නට ඉස්සර විය. ඔහු සුදු ඇඳුමක් හැඳ ඒ මුණ

ගැසීමට සූදානම් වූයේ සිටියේ දේවාලයක කපුවාගේ ගෝලයා මෙනි.

"හිත රිදෙන ඒවා කියන්ඩ එපා." මම කිව්වෙමි.

"සර් තමයි හිත රිදෙනෙව්ව නොකියන්ඩ ඕනෙ" යි කියාගෙන ඉස්තෝප්පුවට ගිය ඔහු සියලු දෙනා එහි කැඳවූයේය.

ආපසු ඇතුළත සාලය වෙත ආ ඔහු "අන්න යන්ඩ" යැයි මට කීවේය.

"සර් ගොල්ෆ් ගහල ආපු ගමන් කියල ඒ කට්ටිය දන්නවා. දැම්ම ගියෙ නැත්තං ධර්මෙ කියනෙව්ව අහල ඒ යක්කු ඊළඟ දවසෙ එන්නෙ වලව්වෙ නිධන් හාරන්ඩ බලාගෙන."

"නිධානෙයක් හාරනව වගේ හරියයිද කියන්න බැරි වැඩකට තමයි ඔය ඇවිත් ඉන්නෙ" යැයි මටම කියාගත් මම සිනාසුණෙමි.

ආපසු ගිය සේන දොරකඩ සිට ගත්තේ 'ඔන්න දැන් හාස්කම්කාරයා එනවා' යැයි නිවේදනය කරන්නාක් මෙනි.

මා ඉස්තෝප්පුවට යන විට සියලු දෙනා නැගිට සිටියහ. විනාඩි කිහිපයක් අපි දෙගොල්ලම දෙපැත්තේ නිහඬව සිටියෙමු. ඉදිරියට ආ සේන ඔවුන්ට ඉඳගන්නැයි සන්කර මටද පුටුවක් පෙන්වීය. මගේ 'හාස්කම් ලෝකයේත්' කළමණාකරුවා වීමට ඔහු සූදානම් වූවාක් සේය.

"සර් මේ අය ඇවිත් තියෙන්නෙ අර ගොළු අය කතා කරවන එකට." ඔහු ආරම්භය දුන්නේය. මම හිස සෙලවීමි. ඔවුන් සියලු දෙනා අපේක්ෂාභංගයේ පාතාලයට හෙළන්නට මට හැකියාවක් නැත. සංශයවාදයේ අඳුරු හෙවණැලි යටින් පවා මගේ මුවින් පිටවූයේ අපේක්ෂාව දල්වන දීප්තියක වචනය.

"අපි අර බෝඩ් එක එහෙමත් දැක්කා සර්. කතා කරන්ඩ බැරි උනත් කමක් නෑ සින්දු කියන්ඩ පුළුවන්නං." මා අසලින්ම වගේ ඉඳගන්නට ලැබුණ එක මනුස්සයෙක් කීවේය.

මම ඕනැවට වඩා නිහඬව නොසිට කතා කරන්නට වීමි.

"අපිත් එක්ක වැඩ කරන එක රෝගියෙකුට - රෝගියා කියන එක වැරදියි - එක - එක - මහත්මයෙකුට කතා කරන්න පුළුවන් වෙලා තියෙනවා." මම කතා කරන්නට පටන් ගතිමි.

"පිං සිද්ද වෙච්චාවෙ." බුලත් අතක් ගත් ගැහැනියක් කීවාය.

"නමුත් අපිට සහතික වෙන්න බෑ හැමෝටම හරි යනවා කියලා. අපි කරන්නෙ අභ්‍යාස පන්තියක්. වෛද්‍ය උපදෙස් අනුව. අපි කරන්නෙ දේවාලයක් නෙමේ. අනික කොළඹින් එන ටීචර් කෙනෙක් තමයි බාරව ඉන්නෙ. මං උදව් කරන කෙනෙක් විතරයි. අර මහත්තය එක්ක අපි මාස ගාණක් වැඩ කරල තමයි යම් දියුණුවක් ගත්තෙ."

"ඒකට කමක් නෑ ලොකු සර්" කවුද කෙනෙක් පටන්ගත්තේය. 'ලොකු සර් නෙමේ හාමුදුරුවෝ' යම් කෙනෙක් මිමිනීය. "මෙහෙමයි ඒ ටීචර් නැතුව මට මුකුත් තීරණයක් ගන්න බෑ. මේ සේන මහත්තයට..."

මට කියාගත හැකි වූයේ එපමණි. සමූහයම එකවර කතා කරන්නට විය. ඒ ගාලගෝට්ටිය අවසන් වූයේ මා නොකියන්නට සිතා සිටි දෙයක් මගේ කටින් පිටවීමෙනි. ඒ රාධා ඊළඟට එන දවසය.

ඇය ඊළඟ සතියේ බදාදා එන විට බලගල්ල වලව්වට එන ගේට්ටුව ඉබ්බා දමා වසා සිංහ රෝහලෙන් එවූ සෙකියුරිටි ගාඩ් කෙනෙක්ද එහි රඳවා තබන්නට සිදු විය. වත්ත මුල්ලේ ඩ්‍රාමා ස්කූල් වෙත පිරිස යොමු කිරීම ඔහුගේ කාර්ය විය. වීවීගේ වැඩ පටන් ගන්නට පෙර පිරිස හමුවේ පෙනී සිට ප්‍රශ්නවලට පිළිතුරු දීමට රාධාට සිදු විය. දොස්තර සමරසේකරටද ආරාධනා කර තිබුණේ ඇය දේවතාවියක නොවන බව ඒ පිරිසට විද්‍යාත්මකව කියා දීමේ කාර්ය ඉටු කරන්නටය.

බොහෝ අම්මලා තාත්තලාට අවශ්‍ය වී තිබුණේ තම දරුවන්ගේ කටහඬ අසන්නටය. "අම්මෙ" "තාත්තෙ" යැයි ඔවුන්

කියනු ඇසීම වෙනුවෙන් ඕනෑම කැපකිරීමක් කරන්නට සූදානමින් මෙනි. මේ අවශ්‍යතාව මට කියන විටද ඔවුන්ගේ ඇස්වල කඳුළු පිරී තිබිණ. පැමිණ සිට අය අතර, වීවී සේ තමාගේම කටහඬ අසන්නට කැමති වැඩිහිටියන් නොසිටීම වාසියට කරුණක් විය. ඒ සියලු දෙනා එකට මුසුකොට පන්ති ආරම්භ කළ හැකි වූයෙනි. අප වෙත කඩා වැටුණ මේ වගකීමෙන් කොටසක් දොස්තර සමරසේකරද බාරගන්නට පොරොන්දු වී සිටියේය. අපේ පන්තියේදී දිව්‍යමය හාස්කම් සිදුවන්නට ඉඩ නැති බවත් අප කරන්නේ අත්හදා බැලීමක් පමණක් බවත් දොස්තර කටින්ම කියන්නට ඔහු ඉදිරිපත් විය. එහෙත්, එදා පැමිණ සිටි අයගේ අපේක්ෂාව සැඳී තිබුණේ අලුත් ඉස්පිරිතාලයක විද්‍යාත්මක ජයග්‍රහණ දැකීමේ උනන්දුවෙන් නොව, පැරණි වලව්වක අමුතු හාමු කෙනෙකුගේ ගුප්ත හාස්කම් බලය ගැන විශ්වාසයෙන් බව පෙනිණ. එක ගැහැනියක් දෝතෙහි සුදු රෙද්දකින් වැසූ පලතුරු වට්ටියක්ද විය. ඒ ඒ අයගේ විශ්වාසය ඔවුනොවුන් අතරම වචනයට නැගීම නිසා ඇති වූයේ දරාගන්නට බැරිතරම් කන්කරච්චලයකි.

රාධාගේ උගත් කතා විලාසයත්, කොළඹ පෙනුමත්, ෆයිල් කවරයකුත් පොතකුත් අතින් ගත් වෘත්තීය හැසිරීමත්, සැම දෙනාටම සවන් දෙමින් සටහන් ලියා ගන්නා බරපතළ අවධානයත් පමණක් පිරිසගේ ආකර්ෂණයට හේතු වූ බව පෙනිණ.

ඒ පිරිසගේ ගොළු දරුවන් අභ්‍යාස සඳහා රැගෙන ආ යුතු වෙලාවල් තීරණය කිරීමේ පඹගාලේ මා පටලවා විශාල දර්පණයෙන් වට කළ මා උපන් තිඹිරිගෙයි ගර්භාෂයීය නිදහස තුළට වීවී සමග යනු පිණිස පිටත්ව යාමට පෙර රාධා මට ඉංග්‍රීසියෙන් මෙසේ කීවාය:

"ලොකු සර් - සාමාන්‍ය මනුෂ්‍යයාගේ ලෝකය වෙත ඔබතුමා සාදරයෙන් පිළිගනිමු. අපි ඔවුන්ට ශබ්දය ලබා දෙමු. ශබ්දය වේවා!"

"ෂටප් රාධා." මම සිනාසුණෙමි.

හැනා

පුදුමය නම් මගේ ආත්මකේන්ද්‍රීය ගොල්ෆ් වළල්ලේ ස්වයංපෝෂිතත්වයේ නිස්කලංකය වෙතින් ඉතා කලබලකාරී වූද අන් අයගේ අපේක්ෂාවල ඉලක්කය වූද අලුත් ජීවිතයක් වෙත මා ඇද දමනු ලැබීම තුළ කුමක්දෝ අලුත් ප්‍රීතියක්ද වීරත්වය පිළිබඳ හැඟීමක්ද මට හමුවීමය. මේ අලුත් ජීවිතයේදී මම ගොල්ෆ් බෝලය වීමි. නොයෙක් ගොල්ෆ් දඬු සේම දැතිගොය්යන්, වීසිකැති හෝ පොල් පිති ගත් අය මා ඔවුන්ගේ ඉලක්කය වෙත එල්ල කරන්නට තැත් කරන්නාක් මෙනි. එහෙත්, පිට්ටනිය මගේම වූ අතර බෝලයද මමම වීමි. එය මගේ අලුත් අධිකාරියයි.

මා අපේක්ෂා කළ පරිදි ඩිලන්ටද නිතිපතා පැමිණිය නොහැකි විය. ඔහු අලුත් සංගීත කණ්ඩායමක් ගොඩනගන්නට එහෙ මෙහෙ දුවයි.

ඒ නිසා ළමයින් සමග යමක් කරන්නට මගේ අවධානය යොමු විය. දොස්තර සමරසේකරගේද අවංක තක්සේරුව වූයේ වීවී කළ හාස්කම වැන්නක් මේ දරුවන් අතර සිදුවීමට ඉඩ ඉතා අඩු බවය. එය මගේ පහසුවට කරුණක් විය. එහෙත්, හාස්කමක් සිදුවීම පිළිබඳ අපේක්ෂාව මා සිත නොපැවතියේද නොවේ. සම්පූර්ණ වියළි තාර්කිකභාවයේ කාන්තාරයක් නොවන මගේ මනසේ හාස්කම් පිළිබඳ හරිත පැහැයක් දලුලමින් තිබුණේය. අපි දරුවන් සමග විවිධාකාර අත්හදා බැලීම් කළෙමු. අංගචලනයෙන්

පවා ඔවුන් කියන දේවල ප්‍රකාශන ශක්තිය වැඩිවන බව වැඩිකල් නොයාම පෙනී ගියේය. මොරටුවේ පැවැත්වෙන අදගොළු බිහිරි පාසැලකට ශ්‍රවණාබාධිත දරුවන් පිළිබඳ විශේෂඥවරියක නෙදර්ලන්තයෙන් පැමිණ සිටින බව ආරංචි වූ මම රාධාද සමග එහි ගොස් ඇය හමුවූයෙමි. අනුන් මත ස්වාමිත්වය පාන තරම් උස, දයාබර සිනාවකින් සංග්‍රහ කරන, රන් කෙසැති හැනා වැන්හයික් කරුණාවන්ත ගුරුවරියක වූවාය. ආකර්ෂණීය විලාසයකින් කතා කරන ඈ රාධාගේ සුදු හමැති නිවුන් සහෝදරිය මෙනියි මඳ වේලාවක සංවාදයෙන්ම මට සිතිණ. අපේ පාසැලට පැමිණ නොමිලේම උදව් කරන්නට කැමැති වූයේ අප දෙදෙනා සමග ඇය ගැඹුරු මිත්‍රත්වයක වහා පැටලුණ බැවිනි. අපේ ගෙදර පැමිණ ඇය එක් වරම බලගල්ල වලව්ව දෙස බලා සිටියාය. "ගෙදර ආව වගේ. පරණ ඕලන්ද ගෙවල් තියෙනවා මේ වගේමයි." ඇය කීවාය. විශේෂ අමුත්තන්ට පමණක් නවතින්නට දෙන කාමරයක් මම ඇයට පිරිනැමුවෙමි. එය අලුත් නාන කාමර පහසුකම්ද සහිතව නවීකරණය කර තිබුණද පැරණි ලක්ෂණ සියල්ල එලෙසම රැකගෙන තිබිණි.

හැනා සමග වැඩකිරීමෙන් අපි බොහෝ දේ උගත්තෙමු. රාධා විසින් මතු කර ගන්නා ලද වීවීගේ හාස්කම් සහගත කටහඬ ගැන කතාව හැනාට කියන්නට අපි වීවීගෙන් සහ විනීතාගෙන් අවසර ඉල්ලුවෙමු. එහෙත්, ඔවුන් ඒ ගැන කැමැත්තක් දැක්වූයේ නැත. "අනේ ටීචර් මේක පිටරටවල ප්‍රසිද්ධ උනොත් ටීචර්ලටමයි කරදරේ." විනීතා කීවාය.

එහෙත්, "සුද්දිත් පුදුම උනා මහත්තයගෙ කතාව ඇහුවම. ඒ රටෙත් එහෙම එව්ව වෙලා තියෙන්නෙ අඩුවෙන්ලු. ඉදල හිටලලු එහෙම දේවල් වෙන්නෙ" යනුවෙන් විනීතා, සිංහ රෝහලේ කියූ කතාවක් පැතිරී ගොස් අපේ පාසැලටද ආවේය. රාධාද මාද කටකතා නිවැරැදි කරන්නට වෙහෙස වන අය නොවන නිසා විනීතා හැනා ගැන කියූ කතාව බොරුවක්ය යන කතාව පෙරළා පැතිර ගියේ නැත.

එහෙත්, විනීතා නොදන්නා දෙයක් නම් සිදු විය.

"පොඩිකාලෙ ඉඳල ගොළු කෙනෙකුට කාලයක් අභ්‍යාස කරන කොට කතා කරන්න පුළුවන් වෙන අවස්ථා තියෙනවද?"

මම හැනාගෙන් ඇසුවෙමි. පෙණ දමන බියර් වීදුරුවෙන් උගුරක් තොලගෑ ඇය කල්පනා කළාය. නිවුණ ඇතුගල දෙසින් හැමූ සුළඟක් අපේ මිදුලේ බටපඳුරු සිළිසිළි ශබ්ද ගැන්වීය.

"වෙන්න පුළුවන් කලාතුරකින්. එහෙම දෙන්නෙක් මං දන්නවා. එක්කෙනෙක් බෙල්ජියමෙ අනික් කෙනා ඔස්ට්‍රියාවෙ. හැබැයි ඔස්ට්‍රියාවෙ එක්කෙනාට කතා කරන්න බැරි වෙලා තිබුණෙ මානසික ප්‍රශ්න හින්ද. යුද්ද කාලෙ වෙච්ච් සිද්ධි වගෙයක්. අනික් එක්කෙනාට කතා කරන්න බැරි උනේ ඇයි කියල අදටත් කවුරුවත් දන්නෑ. පස්සෙ කතා කරන්නෙ පුළුවන් උනේ ඇයි කියල කොහොමටත් දන්නෙ නෑ. ජපානෙත් එහෙම සිද්ධි වෙලා තියෙනවා කියල මම කියවල තියෙනව."

හැනා මා දෙස බලමින් බියර් උගුරක් තොලගෑවාය.

"විශ්වයේ ඔක්කොම රහස් දැනගන්න බෑනෙ" මම කීවෙමි.

"යුරෝපෙ සමහරු හිතුව පුළුවන් කියල. දැන් එහෙම හිතන අය අඩුයි." හැනා ලයන් ලාගර් බියර් තොලගෑවේ ආසාවෙනි. කාල්ස්බර්ග් බියර්ද තිබුණත් ඇය තෝරාගත්තේ ලයන් ලාගර්ය.

"ඇයි හැනා ගොළු අයට උදව් කරකර ලෝකෙ පුරා යන්නෙ?"

"ඇයි බන්දු ඔයාගෙ වත්තෙ තනියම ගොල්ෆ් ගහන්නෙ?" හැනා වහාම ඇසුවාය.

ඇය සිනාසුණාය. "පේන්" ඇය පිළිතුරු දුන්නේ ඉන් අනතුරුවය.

"වේදනාව" මම එය සිංහලෙන් මිමිනීමි.

"ෆ්‍රොයිඩ් සමහර දේවල් වරද්ද ගත්ත. ආසාවට වඩා උත්කෘෂ්ට දේවල් උපද්දන්න පුළුවන් වේදනාවට." හැනා එක් කළාය.

ඈ පෑ සිනාව වේදනාව පරාජය කළ ආත්මාභිමානය ප්‍රදර්ශනය කළේය. නන්නාඳුනන රටක තබා ඇති මේ පුටුවේ ඇය හිඳ සිටින්නේ ලෝකයේ ඕනෑම තැනක් නෑදෑ ගෙදරක් සේ සලකන්නාක් මෙනි.

"බියර් එක හොඳයිද?" මම ඇසුවෙමි.

"නියමයි" ඇය සිංහලෙන් කීවාය. "වේදනාව" ඇය මිමිනුවේ යුරෝපීය ශබ්ද ඇති සිංහලයකි.

"සිංහල දන්නවා?"

"ටිකක්. කෙනෙක් භාෂාවක් නොදැනීමත් එක්තරා ගොළුකමක්."

කිසියම් කටයුත්තකට එළියට ගොස් සිටි රාධා රැගෙන වීවීගේ කාර් එක ආවේය.

"කෝල් එකක් දෙන්න." අඳුරේ නැවැත්වූ කාර් එක දෙසින් ඇසිණ.

"හරි ටීචර්." ඒ උපන්දා සිට කතා නොකළ මිනිසෙකුගේ කටහඬය. හැනාටද ඇසුණ ඒ කටහඬේ කතාව හැනාට කියන්නට නොලැබීම ගැන එදින මා තුළ ඇති වූයේ ශෝකජනක සිතිවිලිය. වඩාත්ම වේදනාකර වන්නේ අපට ගොළුකම තෝරාගන්නට සිදුවීමය.

එහෙත්, පසු කලෙක මම ඇයට සත්‍ය කතාව කිව්වෙමි. ඇය වේදනාවේ කතාව මට කීවාය.

සමන් පිච්ච

ගොළුවිපේ නම් කෝකියාට උඩතට්ටුවේ කාමරයක්ම ලබාදීම ගැන කසුකුසුවක් කුස්සියේ පැතිර ගියත් හෝටලයක කෝකියා යනු යුවරජු වැනි තනතුරකි. ඒ නිසා ඒ කසුකුසුව විරෝධයක් බවට පත් වූයේ නැත. අනික සියලු වැඩකටයුතු අවසන් කර බූරු ඇඳවල් දිග ඇරගත් විට කුස්සිය වුවත් නිදි දෙව්දුවගේ දිව්‍ය ලෝකයකි. එසේම කුස්සියේ සිටි පරණ අයගෙන් ඉතිරිව සිටියේ සිරිපාල පමණක් නිසා පළපුරුද්ද සහ සේවා කාලය පිළිබඳ අයිතිවාසිකම් කීමට ඔහු තනියම ඉදිරිපත් නොවීය. මහ රැයක් වන තුරු බුලත් කෙළ ගසන්නට ඇති ඔහු බූරු ඇඳ දිගා කර ගත්තේ කුස්සියේ ජනේලය අසලය. පහුවදා උදේට ජනේලයෙන් පිට කාණුව වතුර ගසා ඉදලෙන් සූරා සෝදා හැරියේය. කුස්සිය පිටුපස උස තාප්පය මත ඇණ ගසා අදින ලද කම්බි දිගේ ඇදුණ සමන් පිච්ච වැල දෙසට යන්තම්වත් බුලත් කෙළ පාර ඇදී ගියහොත් ගොළුවිපේගේ අංග චලනය වේගවත් වී "ආ" "ඌ" ගායි. ජනේලයෙන් එපිටට බුලත් කෙළ ගැසීම ගැන ගොළුවිපේගේ අකමැත්ත ගැන සිරිපාල දැන සිටියද ඔහු දිගටම කෙළ ගැසුවේය. එය ඔහුගේ ජ්‍යෙෂ්ඨත්වයේ බලය පෙන්වීමට ඔහු කළ ක්‍රියාවක් බව ගොළුවිපේ තේරුම් ගත්තේය. "හිටපු කෝකියා ගල්කාරයා හින්දා තමයි ගොළුව ඔය නැගිල්ල නැග්ගෙ"යි බීපු දවසක සිරිපාල කියූ බවද ගොළුවිපේ දනියි. එහෙත්, අලුත ඇවිත් සිටි පැහැපත් කොල්ලන් දෙදෙනා

ඒ කතාව ශත පහකට විශ්වාස නොකළේ ගොළුවිපේ නිදාගන්නා උඩකාමරේට ඔවුන්ගෙන් එකෙකුවත් කැඳවූමක් නොලද හෙයිනි. එහෙත්, ඔහු ඒ දෙදෙනාටම කෝකි කලාවේ ඇතැම් අංග ටික ටික ඉගැන්නුවේය. හිටපු කෝකියා දුන් දුර්ලභ ගුරුමුෂ්ටි කීපයක් පමණක් කාටවත් නොදී සිය ගොළු නැති මනසේ තැන්පත් කර ගත්තේය.

මහ රැයක් වනතුරු ගොළුවිපේගේ කාමරයේ ලයිට් එක පත්තු වීම සිරිතකි. ඔහු සියලු චිත්‍රකතා පත්තර මිලට ගත්තේය. චිත්‍ර කතා පත්තර කියවීම හරි ලේසිය. කවුරු හරි සමග කතා කරන්නාක් මෙන් එවිට ඔහුට දැනේ. විටෙක ඔහු ඒ ඒ චරිතවල හඬ මෙසේ වියයුතු යැයි සිතා ඒවා සිතින් හඬගා මුමුණයි. ඔහුගේ බූරු ඇඳ තබා ඇති බිත්තිය පැත්තේ යූනිකෝ, ඉතිං ඊට පස්සෙ, ටෝගා, ස්පාටකස් චිත්‍රකතාවල මැද පිටුවේ ලොකු චිත්‍ර සහ ඒ චිත්‍ර කතා පත්තරවල මුල් පිටු අලවා ඇත.

අනෙක් පස බිත්තියේ එල්ලා ඇත්තේ දේවරූපය. ඒවා රාමය්‍යා මුදලාලි ඉස්සර පහන් දල්වන්නට ඇති දේවරූප විය හැකිය. ගොළුවිපේ ඒවා ඉදිරියේ හඳුන්කූරක් ගසා පහන් දැල්වීය. මේ තාවකාලික නවාතැනකිය යන අදහස ඔහු තුළ වූ නිසා පහන දැල්වූයේ අනාගතය වෙනුවෙනි. සැමදාකම පාහේ පිච්චමල් අහුරක් නෙළා දෙවියන්ට පුදන්නට තරම් මල් රාමය්‍යා මුදලාලිගේ වැලේ පිපිණ. ඒ පිච්ච වැල පැළ කළේ ඒ හෝටලයේ සිටි කෝකියා වන්නටද ඉඩ ඇත.

පොඩි රේඩියෝවක් අරගෙන කාමරේ තබාගන්නට ගොළුවිපේට නොයෙක් වර සිතුණද කන් නොඇසෙන ඔහු රේඩියෝ අසන්නේ කෙසේදැයි අනික් අය අහන ප්‍රශ්නවලට පිළිතුරු දීමට සිදු වෙයි. පහළ කුස්සියේ කබඩ් එකක් උඩ තබා ඇති රේඩියෝ එක දූම් වැදී කළු ගැහී තිබුණද කුස්සියේ අයට අවශ්‍ය සින්දු ටික නියමෙටම කුස්සියට ගෙනෙයි. ගොළුවිපේ ගොළු නිසා රේඩියෝ එකේ යන ජෝතිගේ මාර සින්දු දාශ්‍යරූප බවට පෙරළා දෙන්නට ඇතැම් අය තැත් කරන විට ගොළුවිපේ

අනුකම්පාවද උපහාසයද මුසු සිනාවක් පෑවේය. සින්දු ගොළු බසට දැමීම පහසු වැඩක් නොවේ. ජෝතිගේ සින්දුවක් කන පුරා නිදහසේ අසා සිටින්නට ඔහුට අවස්ථාවක් නැත.

මහ වීදියේ රේඩියෝ කඩේකට අලුත්ම චූටි රේඩියෝ ජාතියක් හරි හුරුබුහුටි ඉයර් ෆෝන් එකක්ද සමග ආවේ මේ අතරය. ඔහු එමගින් ශ්‍රවණය පිළිබඳ ඔහුගේම වූ ශ්‍රවණ මායා ලෝකයක් ගොඩනගා ගත්තේය.

පිච්ච සුවඳක...

බන්දුල බලගල්ල සම්භාව්‍ය මිනිසෙක් වූයේ යැයි මා ලියූ බව මට මතකය. මා දැන් විස්තර කරන අවධියෙහි සම්භාව්‍යභාවයක් වී නම් ඒ මා කැපවුණු ගුරුවරයකු වීම නිසා පමණි. ඒ ගුරුවර කැපවීම මා මත පතිත වූවක් මිස මා අභ්‍යන්තරයෙක් පැන නැග ආවක් නොවේ. මා දරුවන් සමග වැඩ කරන විට වගකීම පිළිබඳ හැඟීමක් මා තුළ ඇති වූ බව නම් ඇත්තය. සමහර දෙමාපියන් දරුවන් රැගෙන ආවේ ඉතා දුරබැහැරිනි. ඒ නිසාම ඔවුන් සම්බන්ධයෙන් වගකීමක් ඇති බව මට හැඟිණ.

මා සිතා සිටියේ වෙන කිසිවකු 'ටීචර්කමට' පුරුදු කර මේ කරදරයෙන් ඇත්ව පොතක් කියවන්නට, ගොල්ෆ් වටයක් සෙල්ලම් කරන්නට මගේ ලෝකය වෙත පසුබැස යාමටය. එහෙත්, සතියක් දෙකක් පන්තිය කරන විට මා ඇදී ගියේ ඒ වෙතටම මිස අන් දෙසකට නොවේ. දරුවන්ට යළි කටහඬ දීම කෙසේ වෙතත් ඔවුන්ට ආත්ම ප්‍රකාශනය හුරුකරන්නටවත් මට අවශ්‍ය විය. ඒ දරුවන්ගේ උස ප්‍රමාණයේ තවත් කණ්ණාඩි කිහිපයක් අලුතින් සවි කළෙමු. තමන්ට ශබ්දමය පැවැත්ම අහිමි වුවත් ආකර්ෂණීය දෘශ්‍යමය පැවැත්මක් ඇති බව ඒ දරුවන් ක්ෂණයෙන් වටහා ගත්තා සේ විය. විශාල දර්පණ ඉදිරියේ සිට තමා දෙසම බලාගෙන ලෝකය හමුවේ තමා පෙනී සිටින ආකාරය සකසා ගන්නා අත්දැකීම ඉන් පෙර නොලබා සිටි ඒ දරුවෝ අප අපේක්ෂා කළාටත් වඩා ඉක්මනින් තමන්ගේ දෘශ්‍යමය ප්‍රකාශනය

සකසා ගත්හ. ඔවුන්ගෙන් බොහෝ දෙනෙකු කණ්ණාඩිය යන්න එතෙක් වටහාගෙන තිබුණේ ගමනක් යන විට පමණක් එබී බැලිය යුතු දෙයක් ලෙසටය. කණ්ණාඩිය යන්න අනවශ්‍ය මමත්වයේ උපකරණයක් සේ සමහරු වටහාගෙන තිබුණු නිසා තමාගේම ඉරියව් ඒවායෙන් පරීක්ෂා කරමින් සකස් කරගැනීමට කුලෑටිකමක් දැක්වූහ. නියම ආත්ම ප්‍රකාශනය සකස් කර ගැනීමට කණ්ණාඩිය යන්න අත්‍යවශ්‍ය බව ඒත්තු ගන්වන්නට මට කාලයක් ගත විය. එය ඔවුන් තේරුම් විට ඔවුන්ගේ අංගචලනයද වඩාත් අර්ථවත්ද අලංකාරද විය. දරුවන්ම කරගත් මේ වෙනස අප කළ හාස්කමක් සේ ඇතැම් දෙමවුපියෝ දැක්කහ. ඒ දරුවන් වෙතින් වචනයක් දෙකක් අහන්නට ඒ දෙමවුපියන්ට වූ ආසාව මටත් බෝ වූවාක් සේ විය.

ඒ දරුවන් වෙත ඇති වූ බැඳීම කෙසේද යත් රාධා සහ වීවීගේ කටයුතුවලට උදව් කරන්නටවත් ඒවා ගැන සොයා බලන්නටවත් මට අවස්ථාවක් නොවීය. ඇතැම් සන්ධ්‍යා කාලවල රාධා මා මුණ ගැසීමටවත් නොඉඳ පිටව ගොස් තිබිණ. ඒ වන විට ඇය ඇගේ මහගෙදර පිහිටි නුවර පදිංචිව සිටි නිසා ඇයට එහි සිට එන්නට කාර් එකක් සහ රියැදුරකු වීවී ඇයට සපයා තිබුණේය. ඇගේ අවධානය සම්පූර්ණයෙන්ම පාහේ වීවී වෙත යොමු වී තිබීම ගැන ඊර්ෂ්‍යාවක් වැනි හැඟීමක් මා තුළ වූ බව පිළිගැනීමට සිදුවේ. එහෙත්, ඇයට ඊර්ෂ්‍යා කරන්නට අයිතියක් මට නැත. ඇය මගේ හොඳ මිතුරියකි. එපමණි. එසේම ඇය නිදහස්කාමී ස්ත්‍රියකි. ඒ නිසා මගේම ස්ත්‍රී ආත්මය වැනිය.

එසේ මා මුණ නොගැසී ඇය පිටව නොගිය දිනෙක මා දවසේ වැඩ අවසන්ව ගොල්ෆ් රවුමක්ද සෙල්ලම් කර ඇතුළු සාලයට එන විට ඇය බියර් වීදුරුවක්ද තොලගාමින් මා එනතුරු උන්නාය. සන්ඩේ ටයිම්ස් පුවත්පතේ මුල් පිටුව වෙත ඇගේ ඇස් යොමු වී තිබිණ.

මා ඈ ඉදිරියේ හිඳගත්තේ අයිස් කැට තුනක් පාවෙන විස්කි වීදුරුවක්ද අතැතිවය.

ඇය මා දෙස බැලුවාය. ඇගේ මුහුණේ දීප්තියේ අඩුවක් වැනි දෙයක් මට පෙනිණ. ඇගේ තොල් පොපියා ආවේ කුමක් හෝ කියන්නට මෙනි.

"ඉතිං." මම කීවෙමි.

"නතිං" ඇය කීවාය.

"මහන්සියි?"

"යා..."

"පුදුමයක් නෑ."

"ඔයා?"

"මහන්සියි - ඒ උනාට ජීවිතේ පළවෙනි වතාවට ළමයි ගැන ආසාවක් ඇති වෙනවා."

මා මගේ අවංක හැඟීම ඇයට කීවේ ඇයගේද තොල් පොපියා නටන්නට තරම් ඇගේ මුව තෙරපූ දේ මට හෙළිකරතියි සිතූ නිසාය.

"ළමයි?"

මම හිස සැලීමි.

මට නාලිනී සිහි විය.

"ළමයි? කතාකරන්ඩ බැරි ළමයි ඉන්නවනං කවුරුත් කැමති වෙයි." රාධා කීවාය. එය අනවශ්‍ය කුරිරු කියුමක් සේ මට දැනිණ. එසේ කීවේ මන්දැයි යන මගේ කල්පනාව තුළ ඒ කියමන ගැන කෝපයද ගිලී ගියේය. කුරිරුකමක කුයිල වැකුණු ඒ කියමන කියා සිටියේ දරුවන් පිළිබඳ ඇය තුළ මැඩෙන ආසාවම යැයි මට නිකමට සිතිණි.

"මං ළමයින්ට කැමති වෙන්න පටන්ගත්තෙ උන්ට කතා කරන්න පුළුවන් වෙනකොට. කතා කරන්න බැරි ළමයින්ට මිනිස්සු කැමතිනං අර මිනිස්සු අච්චර ඈත ඉඳල එයිද?" මම ඇසීමි.

"අනේ බන්දු මං කටට ආවට කිව්වෙ. සොරි. මගෙ ඔළුව හරියට වැඩ කරන්නෑ." ඇය සමාව ඉල්ලා සිටියාය.

"කොහොමද වීවී?"

"ළමයි හිටිය නම් හොඳයි?" ඇය මගේ ප්‍රශ්නය මතම ඇගේ ප්‍රශ්නය තැබුවාය.

"ඔව්."

"ආයෙ බඳින්න."

මම සිනාසී විස්කි වීදුරුව මුවට ළං කළෙමි.

ඇය මගෙන් පිළිතුරක් බලාපොරොත්තුවෙන් මා දෙසම බලා සිටියාය.

"මම එක පාරක් කරල බැලුවනෙ. දැන් ඔයා කරල බලන්න." මම කීවෙමි.

ඇය බියර් උගුරක් මුවට ගෙන ගොළු වූවාය. කියන්නට දෙයක් ඇති දෙතොලක් බියර් පෙණද සමග පොපියා ආ මුත් ඇගේ ගොළු බව එසේම පැවැතියේය. ඇගේ දෙතොල් මත වචන බවට හැරෙන්නට ඔන්න මෙන්න වූ කිසියම් ශක්තියක් නාඩි වැටෙන බව මම දුටිමි. ගොළු මිනිසකුට කතා කරන්නට ඉගැන්වූ චතුර ගුරුවරිය ගොළුව ගොස් ඇති සැටි සුන්දර දර්ශනයක් වූයෙන් මම එය නරඹමින් විස්කි තොලගෑවෙමි. එවිටම මිදුලේ අඩි ශබ්දයක් ඇසිණ. සමන් පිච්ච සුවඳක් ඇදී ආවේය. ධර්මරත්න මිදුලේ පිච්ච වැල ළඟ මල් නෙළමින් උන්නේය. පිච්චමල් සුවඳ රාධාගේ දෙතොලෙහි සුන්දර පොපියෑම වේගවත් කළේය. එහෙත් ඒ තෙරපුම වචන බවට නොහැරී නොපෙනී ගියේය.

ඇට යමක් කියන්නට ඇතිදැයි හාරා අසන්නට තිබිණියි මට අද සිතේ. මා අසන්නට අකැමැති දෙයක් ඇය කියතියි එදා මා නොසන්සුන් වූ බව මම දැන් හොඳින් දනිමි.

හඬපටිය

ඊළඟ සතියේ මට කොළඹ යන්නට තිබුණ නිසා රාධා නුවරින් කැඳවාගෙන ආ සහායිකාවක සමග වීවීගේ පන්තිත් ළමයින්ගේ පන්තිත් බාරගත්තාය. දෙදිනකට පසුව මා ආපසු ආවේ රාධා දකින්නට වෙනදා නොමැති කුමක්දෝ ආසාවකිනි. ඇයට දෙන්නැයි හැනා දුන් පොතක්ද මා රැගෙනවිත් තිබිණ.

ඇය ඇගේ පැහැදිලි ඉංග්‍රීසි වැල් අකුරින් ලියූ සටහනක්ද සමග කැසට් පටියක් තබා ගොස් තිබිණ. සටහන පිටුවේ පේළි අතරට මැනවින් සීමා වී සිටින සේ ලියන ලද ඒ අත්අකුරුවල වූයේ මා දන්නා රාධාගෙන් අපේක්ෂා නොකළ හැකි තරම් පිළිවෙළකි. රේඛීය හික්මීමකි.

"බන්දු, වීවීගේ හොඳ වර්ධනයක් තියෙනවා. මට දැන් ඔහු සමග කරන්නට තියෙන සමහර දේවල් සඳහා වෙන තැනක් තිබුණොත් හොඳයි. වීවී එයාගෙම ගෙදර ස්ටුඩියෝ එකක් හදලා. මේ කැසට් එකත් එයාම රෙකෝඩ් කරලා තියෙන්නෙ. මම කිව්වෙ එයා කැමති මාතෘකාවක් ගැන කැමති ශෛලියකින් කතාවක් රෙකෝඩ් කරන්න කියල විතරයි. ඔයයි මමයි එකතුවෙලා ඇඳහිය නොහැකි වැඩ කරන්න පුළුවන් කියා මේක අහන විට ඔයාට හිතෙයි. - රාධා"

එක්තරා අවධියක් නිමා කරන ස්වරයක් ඒ සටහනේ ඇති බව මට සිතිණි.

එය කියවා හාන්සි පුටුවට වැටී මොහොතක් සිටි මට ඇය සහ මා ඒ ඇදහිය නොහැකි හාස්කම කළ මගේ තිඹිරිගෙය බලන්නට ආසාවක් ඇති විය. එය තමා නික්ම ආ මවුකුස හා එහි සුවඳ වෙත පෙරළා එළඹෙන්නට ළදරුවකු දක්වන අවිඥානක ආසාවක් වැනිය.

මා කාමරය අරින විටම ආවේ පිච්චමල් සුවඳකි. මා මුලින්ම කළේ ඒ සුවඳ එන තැන සොයා බැලීමය. එක එක පමණට මැලවුණු පිච්චමල් කාමරයේ තැන තැන විය. ඒ අතරින් ඇතැම් මල් තවත් සුදු පාටය. අද උදේ නෙළූ මල් වැන්න.

රාධා පිච්චමල්වලට ආසා කරන බව මා දැන ගත්තේ එදිනය.

මම කාමරය පුරා නෙත් යැව්වෙමි. රතුපාට මාකර් පෑනෙන් කණ්ණාඩියේ ලියූ වීවී ---අපිඅපි--- ආදිය තාමත් එලෙසම ඇත.

මාද සමග අතහැර දමන ලද කාමරයක් සේ එය මට දැනිණ. ජීවිතයේ සජීවී අතරමගක අත්හැර දමන ලද උමං මාර්ගයක් වූ සෙයිනි.

මම බිම වූ දුඹුරු වර්ණය කරා මැලවී ගිය පිච්චමලක් අහුලා සිම්බෙමි. තාමත් එහි සුවඳ රැඳී තිබේ.

පුස්තකාලයට ආපසු ගිය මට පොත්වලින් සජීවී පුස් සුවඳත් කපුරු බෝල සුවඳත් තුළ දැනුණේ ශිෂ්ටාචාරයක පණ ගැහෙන සුවඳය. මා සමග සිටින අමරණීය ආත්මයන්ගේ විනිවිදින සිතිවිලි සප්‍රාණිකව මා දෙස බලා සිටින්නාක් වැනි නිර්නාමික සන්තෘප්තියකින් මම වෙළාගනු ලැබීමි. මම පුස්තකාලයෙන් තවත් අභ්‍යන්තර කුටියකට විහිදෙන දොර ඇරියෙමි. මේ මා බාහිර ලෝකයෙන් සම්පූර්ණයෙන් වෙන් වන්නට අවශ්‍ය වූ විට යන තැනයි. එහි ඇති සැප පුටුවක හිඳ සංගීතයට සවන්දීමට මම ප්‍රිය කරමි. බිත්තියටකට පිටදී සිටින කළුවර එබ්බ වූ බුරුත අල්මාරියේ පිළිවෙළට තබා ඇති පුස්කොළ පොත්වල සිට අනික් පුස්තකාල කාමරයේ ස්ටූලය මත ඇති ලන්ඩන් ටයිම්ස් පුවත්පත දක්වා ඇති සියලු සංස්කෘතික ලෝකය මගේ උරුමයයි.

මම කැසට් පටිය ප්ලේයරයට දැම්මෙමි.

"ශ්‍රී ලංකාව කියන්නෙ ඉන්දියන් සාගරේ මුතු ඇටේ. පෙරදිග ධාන්‍යාගාරය. මොකද මේ රටේ කවුරුවත් බඩගින්නෙ මැරෙන්නෑ. වී පොල් කොස් දෙල් අඹදඹනාරං කෙසෙල්. මේ රටේ වැවෙන්නැති දෙයක් නෑ. මේ රටේ පොළොව යට රන් රිදී මුතු මැණික් නිධාන තියෙනවා. මේ තමයි අපේ සුන්දර මවුරට. සිංහලයන්ගෙ රට. වචන තමයි එන්නැත්තෙ. අය්යෝ ටීචර්. දැනට ඇති. පත්තර එහෙම බලල ආයෙ ටේප් කරන්නං. ක්ලික්."

පුදුමාකාර ජයග්‍රාහී හැඟීමක් විසින් මා බෙහෙවින් පෘතග්ජන මිනිසකු බවට පත් කරන ලදී. ඔහුගේ කටහඬේ ඇත්තේ කිසිම චකිතයක් නැති ආත්මශක්තියකි. දරුවන්ගේ සබකෝලය ඉවත් කර ආත්මශක්තිය දීම සම්බන්ධයෙන් රාධාට විශේෂ දක්ෂතාවක් තිබෙන නිසා ඇයගේ භාෂා සහ නාට්‍ය පන්තියද ජනප්‍රිය විය. එහෙත්, මා අසලක නොවී නම් වීවීගේ කටහඬ මෙතරම් ඉක්මනින් මතු නොවී එන්නට ඉඩ තිබිණියි මට සිතිණි. කීර්තියේ උරුමය පිළිබඳ ඒ ආත්මාර්ථකාමී සිතුවිල්ල පිළිබඳ මගේ පසුතැවිල්ල එසැණම ඇති වුණ අතර, පසු කලෙක මම ඒ ගැන මා වෙතම එල්ල වූ උපහාසයෙන් සිනාසුණෙමි.

මම රාධාට දුරකථන ඇමතුමක් ගත්තෙමි. ඇය තවම නිවසට පැමිණ නැත. දැන් රෑ දහයට ආසන්නය. මීට පෙර වරක් මා ඇයට කතා කරන විට මැදියම් රැය ආසන්න වී පවා ඇය ගෙදර සිටියේ නැත. නළුවා විසින් බිඳින ලද හද සුවපත් වන්නටත් පෙර තමන්ගේ ගමන්මගේ ඉණිමගක් ලෙස ඇය භාවිත කරන තවත් අවස්ථාවාදියෙකුට ඇය හසු වී සිටින්නේද යන බිය මා සිත එදින ඇති විය. ඒ බිය කාලයක් මා කලබල කරමින් මා සිත පැවැත්තේය.

තොටිල්ල

විජය වික්‍රමසිංහගේ පුහුණුව මගේ තිඹිරිගෙයින් ඉවතට යාම ගැන වඩාත් සතුටු වූයේ සේනය. ඔහු වහාම ඒ කාමරයේ කලින් වූ කැටයම් සහිත බුරුත ලීයෙන් සාදන ලද ඇඳද මැහෝගනි තොටිල්ලද ඇතුළු ලී බඩු ආපසු එහි දැම්මවීය. ඒ ලී බඩු වැලි කඩදාසියෙන් මැද වාර්නිෂ් කර තිබීම ප්‍රහේලිකාවක් වුවත් මම ඒ ගැන කිසිවක් නොඇසුවෙමි. ඔහුගේ අදහස වූයේ ඒ ඇඳ අපේ පරම්පරා තුනක්වත් උපන් ඇඳත් තොටිල්ල ඒ පරම්පරා තුනම නැළවූ තොටිල්ල බවත්ය. ඒ තොටිල්ලේ අවසන් වරට නැළවුණ 'පිරිමි පුතා' මා යැයි සිතන විට දෙපැත්තට පැද්දෙන රිද්මයානුකූල මතක විඥානයක් වෙත මා පාව ගියේය.

ඔහු කාමරය වෙනස් කිරීම ගැන මට දැන්වූයේ ලී බඩුද කාමරයට දැමීමෙන් අනතුරුව වුවත් ඒ වෙනස් කිරීම ගැන මා කීවේ "තව ටිකක් තිබුණනං හොඳයි" යන්න පමණි. එය පවා නිහඬභාවය ළඟට ඇති කුඩාම ශබ්දය සේ නිහඬ ශබ්දයකින් කියූවකි.

එහෙත්, "ඇයි මොකටද?" ඔහු ඇසුවේ අධිපති ස්වරයකිනි. ඉඩම්හිමි වැවිලිකාර හාමු මහත්තයා ඔහුද මාද යන්න අමතක වන ස්වරයෙන් සේන විටෙක කතා කරයි. එහෙත්, ඔහුගේ පරිපාලනය නොවන්නට මා සියලු දේ අවුල් කරගෙනය. නාලිනීගේ නික්මයාමෙන් පසු ඔහුගේ පරිපාලන ආධිපත්‍යය

තහවුරු වූයේ ඒ නික්මන ගැන ඔහු කළ අනතුරු ඇඟවීම් මා ගණන් නොගත් හෙයිනි.

"සර් අර කණ්ණාඩි ටික ගලෝල දාන්ඩද නැත්තං තියන්ඩද?" ඔහු ඇසුවේය.

"එච්ච තිබුණාවෙ ආයෙ ඕනැ උනොත්." මා කීවේ තරමක කෝපයක් රැඳුණ ස්වරයෙනි.

"අරූ මොන එහෙකටද අර පිච්ච මලුත් අරන් යන්නෙ. හැමදාම එනකොට වැලෙන් මල් ටිකක් කඩා ගන්නවා. බුදුන් වඳින්ඩයෑ."

"පිච්චමල් විතරක් නෙමේ තව දේවල් පාවිච්චි කෙරෙනවා උගන්නද්දි. දැක්කෙ නැද්ද පෑන් - පොත් - පුටු - පත්තර. සේනට තියෙන්නෙ එයාලට උදව් කරන එක." ඔහු මගේ සේවක තනතුරට තල්ලු කරන ස්වරයෙන් මම කතා කළෙමි. "සේනගෙ වැඩේ එයාලට උදව් කරන එක විතරයි."

"රාධ මැඩම් නතර වෙන්නෙ කතාවකුත් හදාගෙන. එහෙ ගිහිං උගන්නන්ඩ එපා කියන්ඩයි තියෙන්නෙ."

"මම කොහොමද එහෙම කියන්නෙ එයා මගෙ යාළුවෙක් විතරයි. සේනට හොඳ ගෑනු යාළුවො නැද්ද?"

"නෑ. ගෑනු යාළුවොත් නෑ පිරිමි යාළුවොත් නෑ ඔය වගේ වැඩ කරන."

ඔහුගේ හඬ මගේ හඬ පරයා යයි. එය මා මගේ හාම්පුතුවිඥානයෙන් එළියට විසි කළේය.

ගොළුවිජේ මුදලාලි බලගල්ල වලව්වට වැද්දා ගැනීම ගැන සේන මුල සිටම අප්‍රසාදයෙන් උන්නේය. බලගල්ල වත්තේ ජීවිතය ඔහු නැතිව නොපවතින බව ඔහු සිතන්නේ ඔහුගේ පියා කල්පනා කළ විදියටමය.

මම නැගිට ගොස් විස්කි වීදුරුවක් දාගෙන ආවෙමි. ඒ බෝතලයේ ඉතිරි වූ අරික්කාලක් පමණ කොටය ඔහුට දුන්නෙමි.

ම්ගේ බෝතල්වල ඉතිරි වන අන්තිම කොටස් හෙවත් කොට ඔහුගේ කාමරයට රැගෙන ගොස් තබාගෙන තනියම බීම හෝ ඒවා රැගෙන ගොස් මිතුරන් සමග බීම ඔහුගේ සිරිතය. මා එවේලේ ඒ අරික්කාල් කොටේ ඔහු වෙත පෑවේ මගේ නිවසේ ඔහුට හිමි 'අරික්කාල් ස්ථානය' ඔහුටම මතක් කර දෙන්නටය. එය කුරිරු උපක්‍රමයක් බව මම දනිමි. එහෙත්, එය හරියට වැඩ කළේය. විස්කි කොටේ අතට ගත් ඔහු මගේ පියා ඉදිරිපිට සිටගත් මඳක් කොන්දද නමා ගත් ලියන මහත්තයා හෙවත් ඔහුගේ පියා සේ විය.

"අර ගෑනි ටවුමෙ කියල තියෙන්නෙ සර් බඳින්ඩ ඉන්නෙ රාධ මැඩම්ය අරකමේක. "

"කොයි ගෑනිද?"

"අරූගෙ ගෑනි- ගොළුවගෙ."

"කියල?"

"නැතුව."

සේන විස්කි කොටෙත් කැටුව ඇතුළට ගියේය.

"එහෙම එකක් නෑ." මම මිමිනුවෙමි. එය කාටවත් ඇසුණ මිමිනිල්ලක් නොවේ.

රාධා සහ මා අතර මිත්‍රත්වය යනු මගේ නිවසේ කාටවත් නොතේරෙන එහෙත්, ඔවුන්ට බලයක් නැති නිසා ප්‍රශ්න නොනගන දෙයක් බව මම දනිමි. ඔවුන් ඒ ගැන කතා නොකරන බවද මම දනිමි.

මිදුලෙන් එන පිච්චමල් සුවඳ සුන්දර කරදරකාරකමක් සේ මට දැනිණ.

අලුතින් වාර්නිෂ් ගා තිබිරිගෙයි හරිමැද තබා ඇති තොටිල්ල මගේ විඥානයේ හරිමැද කුටියේ යාන්තමට පැද්දිණ. නාඳුනන සියුමැලි අතක් පැද්දෙන තොටිල්ලේ දාරයට අත තබා තල්ලු කළේ මගේ විඥානයේ අඳුරු මුල්ලක සැඟවී හිඳිමිනි.

සේන ගැන මට ඇති වූයේ සහෝදරකමක් වැනි දයාවකි. ආපසු මගේ බීම අල්මාරිය වෙත ගිය මම කිසිවකු මට තෑගි දී තිබුණු රෙඩ්ලේබල් බෝතලයක් රැගෙන සේනගේ කාමරය වෙත ගොස් තට්ටු කළෙමි.

"රතුපාට. සේන කැමති ඇතිනෙ."

මා රෙඩ් ලේබල්වලට එතරම් කැමති නැති බව ඔහු දනියි. ඔහු ස්තුතිය පළ කළේ අපූරු මඳ සිනාවකිනි.

බැංකු පොත

පිච්චමල් සුවඳින්ද දේවරූපවලින්ද සැදි උඩුමහලේ පුංචි කාමරය සහ එහි ඇති සනීප බූරු ඇඳ තාවකාලික නවාතැනක් පමණක් බව ගොළුවිජේ නිතර කල්පනා කළේය. අවුරුදු ගණනාවක් ඔහුගේ හිතේ පැසව පැසවා මෝරන, තැම්බි තැම්බී පදම් වෙන සැලැස්මක් තිබුණේය. ඒ නිසා කොල්ලෙකුට ටික වෙලාවකට කුස්සියේ වැඩ පවරා, මුදලාලිට කුමක් හෝ කියා ටවුම පැත්තේ ඇවිදින්නට යන්නට විය. "යන්නේ කොහේදැයි" මුදලාලි ඇසූ විට ගොළුවිජේ ගොළු බසින් කී දේ සම්පූර්ණයෙන්ම සිංහලට පරිවර්තනය කරගන්නට හැකි වුවත් එය "පොඩ්ඩක් මේ ළඟට ගිහිං එන්නං" වැනි දෙයකට වැඩි දෙයක් නොවේ. අනික ඒ කලබල අස්සේ දිගින් දිගට ගොළු බසින් කතා කරන්නට වෙලාවක් නැත. ඒ නිසා මුදලාලි ගොළුවිජේ යන වෙලාවට ඒ ගැන ප්‍රශ්න කිරීම නතර කළේය.

ගොළුවිජේ සතියකට දවස් දෙකක්වත් එසේ යන්නට පටන් ගත්තේය. මුදලාලිට ශබ්ද සහිත සිංහලට එය පරිවර්තනය කර ගත හැකි වූයේ "කොහේ හරි යනවා" වැනි දෙයකට පමණි. ඔහු යන්නේ කොහේ හරි යාමකට මිස වෙන අරමුණකින් නොවන බව මුදලාලි තේරුම් ගත්තේය. එසේ කාමරයෙන් පිටව යන විජේ නොවැරදීම කළ එක් දෙයක් තිබිණ. එය මුහුණ බැලීමයි. ඔහු අවුරුදු ගාණකින් සිය මුහුණ නොබැලුවාක් මෙන් කණ්ණාඩියෙන් මුහුණ බැලුවේය. අවුරුදු හයකට පෙර

සේදරමන් හෝටලය ඉදිරිපිට පෙනී සිටි අවස්ථාවේ මෙන් ගෙල දක්වා වැඩුණ කොණ්ඩය දැන් නැත. කොටට කැපූ හිසකෙස්ද මුහුණ පුරා ගාණට වැවී ඇති විටින් විට නුවර පාරේ බාබර් සාප්පුවේ සීලිං අය්යාගෙන් සැරෙන් සැරේ කොට කරගෙන එන කර්ලි ගතියක් ඇති රැවුලද නිසා තමා මුළුමනින්ම වෙස් ගැන්වී ඇති බව විජේ දැක්කේය. එහෙත්, හෝටලයෙන් පිටට යන සෑම විටෙකම හැඳුනුම්පත තිබෙන්නේද යන්න බලන්නාක් මෙන් ඔහු කණ්ණාඩියෙන් මුහුණද බැලුවේය. මේ කාර්යයට කොතරම් වැදගත්කමක් දුන්නේද යත් ඔහු එළිමහනට යන්නට එන්නට පටන් ගත් දවස්වලම කළ දෙයක් නම් ගැහැනුන් සාරි අඳින්නට පාවිච්චි කරන ප්‍රමාණයේ කණ්ණාඩියක් ගෙනැවිත් කාමරයේ සවිකර ගැනීමයි. එය තනිකඩ පිරිමින්ගේ බෝඩිං කාමරවල ඇති කණ්ණාඩිවලට වඩා විශාල වූ නිසා "ගොළුව සාරි අඳින්ඩද දන්නැ යන්නෙ" යි බිල්ලා මුදලාලිට කීවේය. මුදලාලි මඳ සිනාවක් පා ඔළුව වනනු ගොළුවිජේද දැක්කේය.

නගරයේ තැන් තැන්වල නිදහසේ ඇවිදින්නට ලැබීම අතිවිශාල නිදහසක් සේ ගොළුවිජේට දැනිණ. විවිධාකාර ලස්සන ඇඳුමින් සැරසුණ කෙල්ලෝ දහස් ගණනින් නගරයේ ගැවසෙති. බස් නැවතුම්පොළේ තැන තැන ආදරවන්තයින් ගැවසෙන්නේ පුදුමාකාර නිදහසකිනි. ඔහු කිහිප වරක් ආදරවන්තයින් පසුපස වැව රවුම, රජපිහිල්ල උද්‍යානය ආදිය වෙත ගොස් බලා උන්නේය. ඇතැම් ජෝඩු කාමර කුලියට දෙන තැන්වලටද යති. තනි කාමරයේ බූරු ඇඳට වී තනිව කියවන "ඉතිං ඊට පස්සෙ" වැනි කතාවල සිදු වන දේට වැඩි දේ සැබැවින්ම රඟදැක්වෙන අතිවිශාල චිත්‍රකතාවක් සේ නගරය ඔහුට පෙනිණ. වෙනසකට ඇත්තේ චිත්‍රකතාවලට වඩා මේ සජීවී චිත්‍රකතාවේ කාෂ්ටක අව් රස්නය වැඩිවීමයි.

ලස්සන කෙල්ලෝ අපමණ සිටිති. ඔවුහු අනාගතයේද උපදිති. සාර්ථක ව්‍යාපාරයක් කරන ගොළු තරුණයකුට ආදරේ කරන කෙල්ලක මේ 'රැල්ල ගහන කෙල්ලො සාගරෙන්' සොයා ගන්නට බැරි වන්නට හේතුවක් නැත. ඒ නිසා පළමු අවධානය

සිතේ ඇඳි ඇති ව්‍යාපාරය කෙරෙහිය. ඒ ව්‍යාපාරය කුමක්දැයි ඔහු තාමත් නොදනියි. "ඔහොම යනකොට හොඳ එකක් ඔළුවට එයි."

ඔහු ලස්සන කෙල්ලන් නැරඹීමට අමතරව කරන්නට ව්‍යාපාරයක් ඔළුවට ගන්නට වටපිට බැලුවේය. නොයෙක් අදහස් පහළ විය. තවත් අදහස් ඉපදිණ. ඒවාත් පරයා තවත් අදහස් පැන නැගිණ. අත මිට ඇත්නම් ටවුමක පය ගසා ගත් කල කරන්නට බිස්නස් අපමණය.

දෛවය පියවරක් දෙකක් තමාට පසුපසින් එන බව දෛවය වෙතින් පලා විත් අලුත් ජීවිතයක් ගොඩනගමින් සිටින ඔහු විශ්වාස කළේය. ඒ තරම් ළඟින් ළඟින් පස්සෙන් එන දෛවයේ කවරක් ලියැවී ඇත්දැයි බැලීමට ඔහු දෛවයේ පිටපතක් වන් අත බලවා ගත්තේය. ගොළුවිජේගේ අනාගතය නම් ගන කළුවර ලෝකයට එබී එහි තිබෙන දේ බලන කවුළුව ඔහුගේම අත බව වටහා දුන්නේ බෝ ගහ යට ලොකු කුඩයක් අටවාගෙන සාස්තර කියූ කණ්ණාඩිකාර සාස්තරකාරයාය. දවසක බිස්නස් නැතුව ඈනුම් ඇර ඇර උන් සාස්තරකාරයා ගොළුවිජේට අත වනා කතා කළේය. අනාගතය වෙනුවට අතීතය කියාවියි බියෙන් මෙන් පසුබැස සිටි ගොළුවිජේ අහළපහළ කවුරුවත් නැති බව හරියටම දැනගෙන ඔහු වෙත ගොස් අතපෑවේය. තරුණයා ගොළුවකු බව වටහා ගත් සාස්තරකාරයා නොමිලේම ගොළු බසින් කී සාස්තරයෙන් බින්දුවක් විතර ගොළුවිජේට තේරුණේය. නොදන්නා අනාගතයක් ගැන ටිකක් විතරක් දැනගත් විට පුදුම අවුලකි. සාස්තරකාරයා අතීතය ගැන නොව, අනාගතය ගැන පුදුමාකාර හොඳ දේවල් ටිකක් කී බව සාස්තරකාරයාගේ දෑසේ දීප්තියෙන් පෙනිණ. ගොළු හාදයාට කී දේ නොතේරුණ බව තේරුම්ගත් සාස්තරකාරයා ගොළු බසින්ද සිංහල බසින්ද නැවතත් විස්තර කළේය. ඒ වනවිට ගොළු බසින් සාස්තර කියන නාට්‍යය නරඹන්නට කීපදෙනෙක්ම වට වී සිටියහ. සාස්තරකාරයාට අනුව ගොළුවිජේ හිතහොඳ කොල්ලෙකි. "මෙහෙමයි කියා වරදක් කාටවත් නොකෙරුවත් හොඳක් නම් අහන්ඩ" නැත. "අනුන්ටම

කොච්චර කෙරුවත් තමන්ට කියා යමක් කරගන්නට හිතන්නේම නැති එක" ගැන ජීවන රේඛාව හරහා වැටී ඇති රේඛාවකින් පෙනේ. මේ අත රාජයෝග ඇති අතක් බව ඔහුද කීවේය. එය ගොළු හාදයාට නොතේරුණ බව තේරුම්ගත් කෙනෙක් එය තේරුම් කර දෙන්නට රජෙකු මෙන් ටිකක් රඟපා පෙන්නුවේය. අල්ලපු දෙයක් රත්තරන් වන ඒ අත, එසේ මෙසේ අතක් නොවන බව සාස්තරකාරයා කීවේය. ඇත්තය. ඔහු අත ගෑසූ පසු හෝටලේ කෑම රත්තරන් විය. කවදා හරි හතර මහා නිධානය පහළ වී වැඳුම්පිදුම් ලබන පුද්ගලයකු බවට ගොළුවිජේ පත්වන බව සාස්තරකාරයා ස්ථිර ස්වරයෙන් කීවේය. ගොළුවකුගේ අඳුරු අනාගතය පවා පානක් ඇල්ලුවාක් සේ බලා කියන්නට හැකි සාස්තරකාරයාගෙන් සාස්තර අහන්නට එතන සිටි සැම දෙනාටම අවශ්‍ය වූයෙන් ගොළුවිජේට නොමිලේ කී සාස්තරය හදිසියේ අවසන් විය. එහෙත්, තමාගේම බිස්නස් සිතුවිල්ලක් ඇති කරගෙන එයට අත ගැසිය යුතු යන සිතිවිල්ල ස්ථිර කරගැනීමට ඒ සාස්තරය ප්‍රමාණවත් විය. ඉන් පසු නිතර පාහේ නිදහස් වෙලාවට ගොළුවිජේගේ අත අල්ලා ගත් සාස්තරකාරයා රේඛා බලා කීවේ අනාගතයේ හතරමහා නිධානය පහළ වන්නේය යන කතාවම මිස වෙන දෙයක් නොවේ. විශේෂයෙන් හොඳ රසට හදාගෙන යන මොනවා හෝ පොඩි කෑමක් ගොළුවිජේ ඒ සාස්තරයට ගෙවූ මිලය.

හතර මහා නිධාන අනාගතයක් ඇති බව නිසැක නිසා ඔහු දවසක සේදරමන් මුදලාලි ලාච්චුව ගණන් බලා බිල්ලාගේ පොතද පරීක්ෂා කර කටයුතු ඉවර කර හීනියට අඩියක් ගහන දවස අල්ලා ගන්නට බලා සිටියේය. දැන් මුදලාලි මධුවිතෙහි වැඩේ කරන්නේ උඩතට්ටුවේ පාර පැත්තට ඇති ජනේල පේළිය ළඟ මේසයක තබාගෙනය. ඔහුගේ ප්‍රියතම කුකුල් අඹගෙඩි බැදුම හොඳ පදමට බයිට් එකට හදා දෙන්නේ ගොළුවිජේය. හීන් කොච්චි හරිහරියට දමා එය තෙල් දමා ගත් විට අපූරු කටගැස්මකි. තුනියට කැපූ පිඹුලූනු සහ බීලූනු රන්වන් වෙන්නට බැදී තුනියට කපා බැද්ද අඹගෙඩි කෑලි සමග හැපෙන විට සේදරමන් මුදලාලිගේ රස

නහර පිනායයි. ඒ පිනායාම මුහුණේ සටහන් වන්නේ යන්තම් සිනා නගමිනි.

එදින බිල්ලා සහ මුදලාලි සිටි මේසයට කටගැස්ම දීසියද ගෙනැවිත් දී පහළට ගිය ගොළුවිජේ කුස්සියේ කට්ටිය බොන බෝතලයෙන් උගුරක්ද කටේ හලාගෙන කටට පණගෙන බලා සිටියේ බිල්ලා පහළට බහිනතුරුය. මුදලාලි පිටව යන්නේ බිල්ලා බස් එක අල්ලාගන්නට පිටව ගිය පසුය. ඒ මොහොත වනතුරු ගොළුවිජේ බූරු ඇඳේ දිගා වී උන්නේය.

"මුගෙ කෑම නං මරු." බිල්ලා කටගැස්මෙන් කෑල්ලක් කටේ දා ගත්තේය.

"මං දවසක් මුදලාලිටත් නොකිය ගියා ඕකා ගිය පස්සෙන්. අර මං දවසක් ගියෙ ඉස්පිරිතාලෙ පොඩ්ඩක් ගිහිං එන්නං කියලා අන්න එදා. මේකා යන්නෙ වෙන කොහෙවත් නෙමේ කෙල්ලො බලන්ඩ. මේකා එදා ගියානෙ ජෝඩුවක් පස්සෙං වැවරවුමට යනකං."

මුදලාලි කිසිවක් නොකීවේය. කතාව ගැන කිසිම උනන්දුවක්ද නොපෙන්වීය.

බිල්ලා යන්නට නැගිට්ට බව ගොළුවිජේට තේරුණේය. නැගිට කණ්ණාඩියෙන් බැලූ ඔහු කාමරයෙන් එළියට ගියේය. බිල්ලා තවත් මේසයකත් හැප්පී වැනි වැනී එයි. මුදලාලි ජනේලයෙන් පිටත බලා සිටියි.

"විජේ මල්ලි. අපි ගියා. නියම බයිට් එක ංඈ." බිල්ලා කතා කළේ ගොළුවෙකුට කතා කරන ලෙස නොවේ.

ඔහු වැනි වැනි පඩිපෙළ බැස ගියේය.

ගොළුවිජේ මුදලාලි වෙත ගොස් කතා කරන්නට විය. ඔහු අහන්නේ බැංකු පොත ගැන බව මුදලාලිට වහා තේරුණද කිහිප සැරයක් ඔහු එය තමා ලවා කියවූ බව ගොළුවිජේ සිතුවේය. ඔහුගේ සිත පළමු වරට තැළුණේය.

"මුදලාලි හෙට උදේ" යි කියා නැගිට්ටේය. ගොළුවිජේ ඔහු පසුපස කාර් එක ළඟටම ගියේය. මුදලාලි කාරයට නැග්ගේ ගොළුවිජේගේ උරහිසට තට්ටුවක් දැමීමෙන් අනතුරුවය.

පසුදින උදේ මුදලාලි ඇවිත් ලාච්චුව අරින විටම ගොළුවිජේ මේසය අසලට ගොස් හිටගත්තේය.

බැංකු පොත ඔහු වෙතට දිගු විය.

එය රැගෙන කුස්සියට ගොස් පෙරළා බැලූ ගොළුවිජේගේ සිතේ පළමු කහට ඇති විය. ඔහු එහි දකින්නට සිටි ඉලක්කමට වඩා ඉතා කුඩා එකක් එහි විය.

ඔහු එදින වැඩ කළේ ශ්‍රමය වැගිරීමක් මිස නිර්මාණයක් නොකරන කෙනෙකු මෙනි. ඉවීම යනු නිර්මාණයක් සේ සලකන ඔහු එදා කළේ වැඩකිරීමක් පමණි.

ඔහු එදින දවල් එළියට ගියේද ගොළුවෙකුටත් වැඩි ගොළුවෙකු මෙනි.

කටකාර කථිකයා

නවවැනි මාසයේ අවසානය වනතුරු යළි මම වීවී නොදැක්කෙමි. එනම් මාස දෙකකටත් වඩා මගේ අවධානය වෙනතක යොමු වී තිබිණ. මා ගැනවත් ප්‍රමාණවත් අවධානයක් යොමු නොකළ කාලයක් ගතව ගියේය. එහෙත්, රාධා ඔහු ගැන විස්තර මට කීවාය. ඇයට කියන්නට තිබුණේ ප්‍රීතිමත් තොරතුරුය. මගේ සහයෙන් තොරව ඇය ඔහු සමග වැඩ කළ කාලයේ ඔහු අත්පත් කරගත් ප්‍රගතිය ගැන ඇය කීවේ එක්තරා උද්දාම රිද්මයකිනි. කීර්ති ප්‍රශංසා ආදිය සිරුරෙහි පැලඳ නුපුරුදු ඇය දැන් දොඩන ස්වරයෙන් පෙනුණේ මේ කාලය තුළ ඇයද විශාල පරිවර්තනයකට ලක් වූ බවකි.

කෙතරම් කාර්ය බහුලව උන්නද රාධා අපේ භාෂා පාසැලටද ආවාය. ඒ වන විට අපේ පාසැල දෙකට බෙදා තිබිණ. භාෂා ඉගැන්වීමේ පන්තිය ඇය බාරගත්තාය. ශ්‍රවණාබාධිත දරුවන් සමග වැඩ කිරීම මම බාරගතිමි. භාෂාව ඉගෙනගන්නට එන දරුවන් එන්නේ ඉංග්‍රීසියේ මා කැමති දේවල් ඉගෙන ගන්නට නොවන නිසා ඔවුන්ට ඉගැන්වීමෙන් මට තෘප්තියක් නොදැනිණ.

විජය වික්‍රමසිංහට කටහඬ දීම අරඹා නවවෙනි මාසයේ දවසක නැවත වරක් මා උපන් තිඹිරිගෙය සකස් කරන්නට සිදු විය. දොස්තර සමරසේකර සහ රාධා යන දෙදෙනාගේම අදහස වූයේ එය ඒ කාමරයේම සිදු විය යුතු බවයි.

එය යෙදී තිබුණේ හවසකය. පහට හයට වන්නට ඇත. අලංකාර දවසකි. බැස යන හිරුගේ රැස් ඇතුගලේ ඇතු බඳ රන්වන් කරන දවස් ඇත. මේ එවැන්නකි. මගේ වත්තේ පොල් රුප්පාව අතරින් ක්‍රිස්ටීන්ගේ සිනාව වැනි අලෝකයක් වැටෙන එවැනි දවස්වල මා ගොල්ෆ් ක්‍රීඩා කරන්නේ නිරුවත් හිරු එළිය නාන සරාගයක් වැනි ආසාවකිනි. මම හිරු එළියේ දරුවෙක් වෙමි. මේ කියන දවසේ ඒ අමුතු හිරු එළිය හමුවේ මට සිහිවූයේ මා ක්‍රිස්ටීන් හමුවේ වරක් කී ඒ වැකියයි. "අ ඇම් අ චයිල්ඩ් ඔෆ් සන්ලයිට්" "එහෙනම් මම හිම කුමාරියක්" ඇය කීවාය.

"මම ඔයාව වතුර බවට පෙරළන්නම්." මම පිළිතුරු දුනිමි.

"ඒත් වාෂ්ප කරන්න එපා." කී ඇය ඇගේ සියුමැලි හිරු එළිය වන් හිනාව පෑවාය.

ඒත් දෛවයේ සූර්යදේවයා ඇය වාෂ්ප කර හැරියාය. දෛවය යනු අප කරන දේවලට සහය වෙමින් අප සමගම සිටින අපගේ අදෘශ්‍යමාන සහකාරයාය.

රියදුරු රාධා මිදුලේ බස්සවා පිටව ගියාය.

වාෂ්ප වී සිටි ස්ත්‍රියක යළිත් පිවිතුරු වතුර බින්දුවක් වූවාක් සේය. රාධා සුන්දර ලෙස හැඳ සිටියාය. ඇයගේ කොණ්ඩය ගෙල පසුකර පිට මැද වැටිණ. එය ගොතා තිබුණේ තනි කරලටය. එය ඉතා නිර්-රාධානු කේශ කලාපයක් සේ මට පෙනිණ. ඇය සිරුර සරසා සිටියේ දුඹුරුවන් කපු සාරියකිනි. එහි තැන් තැන්වල තනි තනි කොටුය. ඒ තනි තනි කොටු එක එක පමණට රතුපාටය. රන්වන් හිරු එළිය තුළින් ඈ ඇවිද ආවේ ලැජ්ජාවක මඳ රතක් රැඳි වතිනි. ඇය සාරියකින් සිටිනු දැක නොතිබුණු මා ඇයගේ නව පෙනුම ගැන පුංචි විහිළුවක් කරන්නට නැගිට ගොස් පිළිගත්තෙමි.

"ටීචර්! -- හරි ලස්සනයි".

"අනේ නිකං ඉන්න බන්දු. වීවීගෙන් බේරුමක් නෑ." ඇය කීවාය. ඇගේ මුහුණේ මඳ රත තද රතකට පෙරළිණ. "විනීතත් බල කෙරුවා" ඇය එකතු කළාය.

"මිනිහ කතා කරනවා ෂෝක් එකට බන්දු. ඔයාට ස්තුති කරන්ඩ ඕනැ මට මේ අවස්ථාව දුන්නට." ඇය ඉංග්‍රීසියෙන් කීවාය.

"විස්කිද ෂෙරීද?"

"මෙහෙම" ඇය සාරියෙන් සිර වී සිටි තමා දෙසම බැලුවාය. ඇඳුම විසින් හික්මී සිටින රාධා කෙනෙකු මින් පෙර මා දැක නොතිබිණ. සාලයට පැමිණ මා වැළඳගෙන සුපුරුදු හග් එක දෙන්නටද නිර්-රාධානු රාධා උනන්දුවක් නොදැක්වූයෙන් මා සිත බිඳක් තැලිණ. කැමැත්තක් තිබුණද බීම බිඳක් තොලගාන්නට වෙලාවක් ඇයට ලැබුණේ නැත. කලඑළියට එන කථිකයා ප්‍රවේශ විය. ඔහු පිටුපසින් විනීතා උන්නේද වටිනා සාරියක් හැඳගෙනය. විජය වික්‍රමසිංහ නේරු කබායට සමාන සුදු කෝට් එකක්ද කලිසමක්ද හැඳ සිටියේය. අපේ නාට්‍යවල ඇඳුම් නිර්මාණය කරන රාධාම එයද නිර්මාණය කරන්නට ඇති බව මම සිතුවෙමි.

අප හමුවේ ඔහුගේ කතාව ඉදිරිපත් කරන්නට පෙර පුංචි පෙරහුරුවක් ඇති බව රාධා කී විට "යමු ටීචර්" යැයි ඔහු නැගිට මිදුලට බැස්සේය. දෙදෙනාටම ගේ ඇතුළෙන් ගොස් වින්නඹු කාමරයට යන්නැයි කියන්නට සිතුණද මම එය මැඩගතිමි. "විනාඩි දහයකින් එන්න" ඇය එසේ කියන විටම දොස්තර සමරසේකරගේ කාර් එකද ආවේය.

හාත්පස රත්වන මැකී යමින් තිබිණ.

"අර ළමයි දෙන්නගෙත් සැහෙන දියුණුවක් තියෙනවා බන්දු." දොස්තර සමරසේකර හිඳගනිමින් කීවේය.

මම සිනාසුණෙමි. ඒ ගැන කතා කරන්නට මට උනන්දුවක් නොවීය. මගේ ජීවිතය මා අකැමැති චක්‍රයකට හසුවෙමින් පවතින බව පෙනෙමින් තිබිණ. විජය වික්‍රමසිංහගේ කටහඬ කුසලතා ප්‍රදර්ශනය ගැනද මා තුළ වූයේ උදාසීන උනන්දුවකි. දැනටමත් හොඳට කතා කළ හැකි ඔහුගේ දක්ෂතා මටම පෙන්වන කලඑළි මංගල්‍යයක් අවශ්‍යයැයි මට නොසිතිණ. එහෙත්, රාධාගේ උද්දාමී

ප්‍රීතිය යනු නරඹන්නට තරම් දර්ශනයකි. ඒ අවංක ගුරුවරියකගේ ප්‍රීතියයි.

අප ගොළුවන් සේ ටික වෙලාවක් හිඳ සිටින විට සේන පැමිණියේය: "සර් - මැඩම් එන්ඩලු."

අප කාමරයට යන විට රාධා වීවීට අවසන් උපදෙස් දෙමින් උන්නාය.

අපට වාඩිවීමට පුටු තබා තිබිණ. බිත්තියේ ඇති දර්පණ තුනකින් විජය වික්‍රමසිංහලා තුන්දෙනෙක්ද ඒ තුන්දෙනාගේ ප්‍රතිබිම්බ ගණනාවක්ද පෙනිණ. මුදු ලෙස ගලනු පිච්චමල් සුවඳක් කාමරයේ විය.

රාධා ඇගේ පුටුවට පැමිණියේ පස්සෙන් පස්සටය. ඇගේ ගෙතූ කොණ්ඩයේ පුංචි පිච්චමල් දෙකක් පැළඳ සිටියාය.

ඇගේ සංඥාවකින් කතාව ඇරඹිණ.

"මගේ ආදරණීය රාධා ටීචර්ගෙන්ද ඉඩම්හිමි වැවිලිකරු බන්දුල බලගල්ල නිලමෙතුමාගෙන්ද අප රෝහලේ අධ්‍යක්ෂක විශේෂඥ වෛද්‍ය රනිල් සමරසේකර මැතිතුමාගෙන්ද මගේ හෙවණැල්ල වන් ප්‍රිය බිරිඳ විනීතා මැතිණියගෙන්ද අවසරයි. අද අද විශේෂ දවසක්."

ඒ කොටස මගේ සිත්ගත්තේ නැත.

"කතා කිරීමේ හැකියාව කියන්නෙ වාසනාවක් කියන එකත් කටහඬ කියන්නෙ මනුෂ්‍යයාට ඇති ශක්තියත්, බලයක්, ආයුධයක් කියන එකත් අපිට තේරෙන්නෙ නැත්තෙ අපිට ඒවා ස්වභාවයෙන්ම තියෙන නිසා..."

ඒ වචන රාධාගේ බව මම අනුමාන කළෙමි.

මඳක් කතාව නැවැත්තූ ඔහු එතෙක් කී දේ නිවැරැදි දැයි පරීක්ෂා කරන්නට රාධා දෙස බැලුවේය. රාධා මාපටගිල්ල ඔසවා සංඥා කළාය. ඔහුගේ වැකි අනුව රාධාගේ අත් සංගීත කණ්ඩායමක මෙහෙයවන්නියකගේ අත් මෙන් - එතරම් වේගයෙන් නොවුණත් ඊට සමාන ආකාරයකින් - චලනය වන බව මා දැක්කේ එවිටය.

"මා දැන් මගෙ මාතෘකාව ගැන වචන ස්වල්පයක් කියන්න කැමතියි. මගේ මාතෘකාව මගේ මවු රට."

ඉන්පසු ඔහු වෙනත් කථන රිද්මයකට මාරුවන බව පෙන්වීමට මදක් නැවතුණේය. රාධා රිද්මය වේගවත් කරන්නට ඔහුට සන් කළාය.

"මගෙ රට ශ්‍රී ලංකාව. අවුරුදු දෙදහස් පන්සීයක වීරෝදාර ඉතිහාසයක් ඇති මගෙ රට ඉන්දීය සාගරේ මුතු ඇටේ, පෙරදිග ධාන්‍යාගාරය කියා හැඳින්වෙනවා. මගෙ රට තමයි ලෝකයේ ඇති එකම ධර්මද්වීපය. මගෙ රට අනගි මුතු මැණික්වලින් පිරුණු රටක්. ඒ නිසා තමයි දෙමළු - සුද්දො - මගෙ රට මංකොල්ල කන්න ආවෙ. මේ රටේ තියෙන්නෙ පින් බිමක්. මේ රටේ කොතන හෑරුවත් මතුවෙන්නෙ ධනය. අපේ වීරෝදාර මුතුන්මිත්තන් නිධන් කළ ධනය. මේ බිමේ වියළි දණ්ඩක් වුවත් පැලවී මිහිරි පලවැල පූදිනවා. මේ වගේ උතුම් රටක් ලෝකෙ කොහෙවත් නෑ."

ඔහු කතා කරන විට වරින්වර රාධා දෙස බැලුවේය. ඇගේ අත්වල චලනයෙහි ඔහුගේ කතාවේ රිද්මය තිබිණි. ගුරුවරිය සහ ශිෂ්‍යයා අතර බැඳි අදිසි හුයකින් ඔහු මෙහෙයවනු ලබන්නාක් මෙනි.

කාමරයේ කණ්ණාඩිවලින් පෙනෙන අනන්ත කථික රූපවලින්ද ශබ්ද පිටවෙන්නාක් මෙන් විය. ජනේලද වසාදමා ඇති කාමරය දෝංකාර කුටියක් සේ වූයෙන් එය අසා සිටීම දුෂ්කර වන තරම් විය. ඒ බව තේරුම් ගත් රාධා ඇගේ දෑතින් ඔහුගේ හඬ බාල කළාය.

"අපේ මවු රට ආරක්ෂා කිරීම සිංහල අපගෙ යුතුකමයි. මේ සිංහල අපගෙ රටයි අප ඉපදෙන මැරෙන රටයි යනුවෙන් කවියන් ලියා ඇත්තේ අන්න ඒ නිසයි. මගේ කතාව අසා සිටි ඔබට ස්තුතියි."

වේගවත් අත්පොලසන් නාදයක් නැගිණ. මගේ අත්ද උදාසීන උද්දාමයක් වෙත චලනය කරනු ලැබිණ.

කතාව අවසන් කළ වීවී හිටගත්තේ ගුරුවරුන්ගෙන් ප්‍රශංසාව ප්‍රාර්ථනා කරන පාසැල් ශිෂ්‍යයකු මෙනි. ඔහු වෙත ගිය රාධාද ඒ ජයග්‍රහණයේ උරුමක්කාරිය මෙන් ඉදිරියට ගොස් ඔහු අසලින් හිටගෙන අපේ අදහස් අපේක්ෂාවෙන් අප දෙස බැලුවාය. දොස්තර සමරසේකර නැවත අත්පොලසන් දුන්නේය. විනීතාද ඊට එක්වූවාය. සාරිය යනු අලුත් රාධාට වඩාම ගැළපෙන ඇඳුම බව මට සිතිණ.

"පාඩම් පොත්වලින් බලබල අපේ පුතා තමයි මගේ රට ගැන කතාව ලිව්වෙ. මෙයා තව ටිකක් එකතු කරලා ගත්තා." විනීතා ඇය සිටි පුටුවෙන් මා වෙත නැමී කීවාය.

"හොඳයි" කී මම ඔළුව වනමින් ගොළු වුණෙමි.

"රාධ වීවර් විප්ලවයක් කරල තියෙන්නෙ. අපි මේ ගැන ඉංග්‍රීසි පත්තරේකට ලියමු. බන්දුට පුළුවන්නෙ." දොස්තර සමරසේකර මා දෙස බැලීය. මම ගොළු ඔළුව වැනුවෙමි.

"මෙයා ඉස්සර ඉඳල පත්තර එහෙම කියවල තියෙනවා. ඒ හින්දා ඉක්මනට වචන අල්ලගන්න හැකියාව තියෙනවා." රාධා වීවීගේ උරහිසට තට්ටු කර සභාවට කීවාය.

"පුතාලත් එන්න උන්නෙ. මෙයා තමයි කිව්වෙ ළමයි ඉස්සරහ වැරදුණොත් හරි නෑ කියලා." විනීතා නැවත මා වෙත නැමී කීවාය. "පුතාලා දෙන්න එක්ක කතාකරගන්න හම්බුණ එකම කොච්චර දෙයක්ද කියල මෙයා කියන්නෙ සර්."

ඒ පණිවිඩය මගේ උනන්දුව උද්යෝග කළේය. කතා කරන දේවල් මොනවා වුවද මිනිසකුට කතා කරන්නට ලැබීමම දුර්ලභ අවස්ථාවක් බව මට වැටහිණ. අවුරුදු තිහක් විතර පමා වී ලැබුණු සෙල්ලම් බඩුවක් සමග සෙල්ලම් කිරීමට ආපසු ළමා විය වෙත ගිය වැඩිහිටියකු සේ ඔහු මට පෙනිණ.

නැගිට ඔවුන් වෙත ගිය මම මුලින්ම රාධාටත් ඉක්බිතිව වීවීටත් අතට අත දුනිමි. එවිට අත්පොලසන් දුන්නේ දොරකඩ ළඟ බලා සිටි සේනය. නියම අත්පොලසන් පිදීම ලැබිය යුත්තේ මා යැයි ඔහු විශ්වාස කළාක් මෙනි.

පහනක්

බැංකු පොත පිළිබඳ සිද්ධිය සේදරමන් මුදලාලිගේ හිත ගැස්සුවේය. එදායින් පසු විජේ තවත් ගොළු වූයේ පමණක් නොව, අදෘශ්‍යමානද වී ඇත. හෝටලේ තුළ ගොළුවිජේ උන්නේ නොපෙනී වසන අවතාරයක් මෙනි. කතා කිරීමේ ශක්තිය නැති කෙනෙකු අදෘශ්‍යමානවද ගිය විට ඔහුට මිය ගියාක් වැනිය. ගොළුවිජේ හදිසියේ බැංකු පොත ඉල්ලතියි මුදලාලි සිතුවේ නැත. ඔහු උන්නේද කල්පනා බරවය. සතියක් පමණ එලෙසින් ගෙවිණ.

ඒ සතිය අවසන ගොළුවිජේ සිටින්නේද නැද්ද යන්නට වඩා මුදලාලි සැලකිලිමත් වූයේ හෝටලයට එන පාරිභෝගිකයන්ගේ මුහුණු ගැනය. නිතර එන යන බස් රියැදුරන්, කොන්දොස්තරවරුන්, ලොරි ගෝලයන් වැනි අයගේ මුහුණුවල වූයේ අමුතු ගොළු බවකි. සේදරමන් හෝටලයෙන් එවැනි පරාජිත මුහුණු එළියට බසින බවක් මුදලාලි දැක්කේ අවුරුදු ගාණකට පසුවය. ගොළුබසින් යමක් කියන්නට අවශ්‍ය වූවාක් මෙන් ඔවුහු පිඟන්වල අසාමාන්‍ය ප්‍රමාණයෙන් කෑම ඉතුරු කර ගියහ. වේටර් කොලුවෙකු ලවා කෑම වර්ග සියල්ලෙන් ටික ටික ගෙන්වා ගත් මුදලාලි ඒවා රස බැලුවේය. ගොළුවිජේ නම් කෝකියා සිටින්නේ නොසතුටින් බව ඒ කෑමෙන්ම පෙනී ගියේය. ඔහු කෑමකට එකතු කරන අමුතු රසය ඒවා එකකවත් නොතිබිණ. ඒ වෙලාවේ විජේද හෝටලයේ නොසිටියේය. ඔහු කෑම කා පිටවන පාරිභෝගිකයන්ට මුවා වී පිටවී ගොසිනි.

මුදලාලි ගොළුවිජේ එනතුරු බලාගෙන උන්නේය. ඒ අතර කෑම කා ආපසු යන මැලවුණු මුහුණැති උසාවි ලිපිකරුවෝ පවා භග්නාපේක්ෂා සටහන් මුහුණින් අකැමැත්තෙන් මෙන් බිල් ගෙවූහ; වේටර් කොල්ලන්ට පුංචි සන්තෝසමක්වත් නොදී පිටවී ගියහ. සන්තෝසමක්වත් නැති අසන්තෝසයෙන් යුත් වේටර් කොල්ලෝ මුදලාලි විසින් තහනම් කරන ලද කාර්යයන් වන හහය හැරීම, ඉකිලි කැසීම ආදී නරක නීරසකාරක පුරුදු වෙත ආපසු ගියහ. ඔවුහු ඒවා කර කර පරාජිතව බලා සිටියහ; පාරිභෝගිකයන්ගේ කුම්මැහිකම් ගැන කුණුකතා කීහ. අතෘප්තිමත් කෝකියකු සිටින විට හෝටලයක මුහුණ මැලවෙන බව දන්නා මුදලාලි ගොළුවිජේගේ පොතට සල්ලි දැමීම මසින් මස පමා කිරීම ගැන අවංකවම කනගාටු වූයේය.

එදින ගොළුවිජේ ආපසු ආවේද ගොළු බවට අමතරව අන්ධභාවයටද ගොදුරු වූ කෙනෙකු මෙනි. බිල්ලා මුදලාලිට ඉඟි කළේ "කෙල්ලො බලල එනවා" කියන්නට මෙනි. ගොළුවිජේ ඇඳුම් මාරු කරන්නට උඩතට්ටුවට යනු මුදලාලි බලා උන්නේය. උඩතට්ටුවේ කෑම කන්නට තරම් සෙනඟද නැත.

ගොළුවිජේ කණ්ණාඩියෙන් මුදලාලි දැක්කේය. ඔහු උන්නේ වැඩට අඳින කලිසම හදිමිනි. තාමත් හිමිදිරි සුවඳ හමන පිච්චමල්වලට පිටිපස්සෙන් කතරගම දෙවියෝ මුදලාලි දෙස බලා සිටියෝය. ඒ අසල ලක්ෂ්මීද උන්නාය. හඳුන්කූරක් අන්තිම වෙන්නට දැවී තිබුණේය.

ගොළුවිජේ බූරූ ඇඳ දිග ඇරියේය. සේදරමන් මුදලාලි හිඳගැනීමට අවශ්‍ය නැතැයි අතින් කීවේය.

කොයි අංග චලනයෙන් පටන් ගන්නටදැයි මුදලාලිට සිතාගත නොහැකිය. ඔහු කතා කරන්නට තෝරාගෙන ආවේ වචන මිස චලන නොවේ. ඒ නිසා දෙකම භාවිත කරන්නට පටන් ගත්තේය.

"විජේගෙ වයසත් හරි හින්දා - අපි දැන් මනමාලියෙක් බැලුවොත් හොඳා - මං සල්ලි ටිකක් අරන් තියල තියෙන්නෙ.

එව්ව මගුල් ගෙදරට තියපු සල්ලි. එව්ව පොතට දැම්මෙ නෑ ඕන්නං දාන්න පුළුහං." මුදලාලි ඒ සියල්ල යළිත් අංගචලනයෙන් කියන්නට පටන් ගත්තේය.

සාමාන්‍යයෙන් ගල් ඉබ්බකු සේ පුටුවේ වාඩි වී ඉන්නා මුදලාලි රූකඩ රූපයක් බවට පත් කිරීමට හැකිවීම ගැන ගොළුවිජේ තුළ ඇති වූයේ කුරිරු සතුටකි. ඔහු තවදුරටත් නොතේරෙන බව ඇඟවීය. මුදලාලි සේදරමන් රූකඩ ගුරුන්නාන්සේ බවට පත් විය. ඒ නිසා නැවත ශබ්ද භාෂාවට මාරු විය.

"ඕන්නං සල්ලි පොතට දාල දෙන්නං. නුමුත් කටයුත්තක්--" මුදලාලි ඇඟිලි දෙක ගැට ගැසීම පෙන්වීය. "නුමුත් මංගල්ලෙයක් අහරෙමෙහෙ කරනවා නං - එව්වා -" මුදලාලි ඇඟිලි එකට අතුල්ලා සල්ලි පෙන්වීය. "අපේ ගෙදර තියෙන එක හොඳයි" ඔහු සිය ගෙවල් පැත්තට අත දික්කළේය.

ගොළුවිජේ "එපා" කියන්නට අත වැනුවේය. මේසයේ ඉටි රෙද්ද යටින් බැංකු පොත ගෙන ඊට සල්ලි දමා පෙන්වීය.

මුදලාලි හිස වනා බැංකු පොතද රැගෙන පහළට යන විට අවුරුදු පහක් රැකවරණ දුන් සේදරමන් මුදලාලි ගැන ගොළුවිජේ තුළ ඇති වූයේ ශෝකයකි. මුදලාලි තමා කළ යුතුකම් ගැන කිසිවක් මතක් නොකිරීමද ශෝකය බලවත් කරන කරුණක් විය. තැපැල් හැඳුනුම් පතත්, ඉරී කබල් වූ උප්පැන්න සහතිකයත් පමණක් රැගෙන ආ ඔහුට හැඳුනුම්පතක් රැගෙන දුන්නේ මුදලාලිය. කලින් සිටි කෝකියාටවත් නොතිබුණු පහසුකම් සහ ඉඳුම් හිටුම් සලසා දුන්නේ මුදලාලිය. ඇඹිලිපිටියේ ගෙදරින් පැන ආ ඇත්තම කතාව කියූ විට ආපහු ගෙදර යවන්නට තැත් නොකර ආරක්ෂා කළේ මුදලාලිය.

පඩිපෙළ මඳක් බසින මුදලාලි වෙත ගිය ගොළුවිජේ බැංකු පොත උදුරාගෙන "එපා එපා" යැයි ගොළු බසින් කියමින් කාමරයට ආවේය.

ඉන් පසු ගත වූ දවස්වල හෝටලයෙන් පිටවී යන පාරිභෝගිකයන්ගේ මුහුණුවල මුදලාලි දුටුවේ සන්තෘප්තියෙන් උගුර පාදපාදා කද්දී දැනුණ රස යළි සිහි කර කර විඳින ප්‍රීතිදායක දසුනකි. වේටර් කොල්ලන්ද නහය හැරීමත්, ඉකිලි කැසීමත් නවතා සන්තෝසම් සාක්කුවල පුරෝගෙන සන්තෝෂයෙන් වැඩ කිරීම ආරම්භ කර තිබිණ.

මුදලාලිගේ හිතේ ඇඳී තිබුණේ අතිදක්ෂ කෝකියකු වුවද ගොළුවකු වන කඩවසම් තරුණයකුට ගැළපෙන මනාලියකගේ රුවයි. තමා ඒ තරුණයා වී නම් කරකාර ගන්නට කැමැති පින්වත් ස්ත්‍රී රූපයක තිබිය යුතු සුබලකුණු ඔහු එකින් එක සිතින් මවන්නට විය.

එක දවසක් ගොළුවිජේ සිය සුපුරුදු දිවා කල රස්තියාදුව ගසා අනාගත සැලසුම් පිළිබඳ අදහස් උකහාගෙන ඇවිත් කාමරයට යන විට ලක්ෂ්මී දේවරූපය ඉදිරිපිට අලුත් පහනක් දැල්වෙමින් තිබුණේය. යන්තම් දැවීගිය ඉන්දියන් හඳුන්කූරක් මනහර සුවඳක් විහිදීය. එය මුදලාලිගේ මේසය ඉහළ බුද්ධ රූපයට සහ දේවරූපවලට පුදන සුවඳ බව ගොළුවිජේට හඳුනාගත හැකිය.

මේසය මත වූ බැංකු පොතට රුපියල් දහදාහක් අලුතින් එකතු වී තිබුණේය.

පුංචි මල

මම, බන්දුල බලගල්ල, නිකම් හිටපු මිනිහෙක් වෙමි.

ඒ කාරණය නැවත කිව යුතුය. මේ ශුෂ්ක ග්‍රාමීය-නගරයේ පුනරුදයක් ආරම්භ කරන්නට බුද්ධිප්‍රබෝධන පාඨශාලාවක් ආරම්භ කළ ශිෂ්ටාචාරයේ ඒජන්තයකු යැයි මා හඳුන්වා ගැනීමට කැමැති නැත. මා එංගලන්තයේ සිට ආවේ නිකම් ඉන්නටය. පරම්පරාවෙන් උරුම වූ වත්ත සහ නිවස එකට තබාගෙන ඒ තුළ ස්වයංපෝෂිත වූද ස්වයං-සිද්ධ වූද ලෝකයක් ගොඩනැගීම මගේ අරමුණ විය. එයට අරමුණක් යැයිද කිව නොහැකිය. එය අරමුණක් නම් එයද ස්වයං-සිද්ධ ආරම්මණයකි. ළඟාවීමට ඉලක්කයක් ඇති අරමුණක් නොවේ. එය 'වීමක්' මිසක් 'කිරීමක්' නැති අරමුණකි. එය හැටියකියි කිව හැකිය. 'හැටි' යනු අපූරු වචනයකි. ඒ මගේ 'හැටියක්' මිස අරමුණක් නොවේ. මා ලංකාවට පැමිණි පසු කළ දේවල් සියල්ල හැඳින්විය හැක්කේ 'හැටි' නිසා වූ දේවල් මිස කළ දේවල් කියා නොවේ. රජු දකුණු දිසාව බලාගෙන හිඳ සිටින විට රාජ්‍යය යහපත් වන්නේය වැනි කියමනක් තාඕ තේ චිං පොතේ එයි. මම නිකම් සිටියෙමි; දේවල් ඉබේම සිද්ධ විය.

ගොල්ෆ්වලට ආසා කිරීම මගේ හැටිය. එහෙත්, මා ආසා කළේ මගේම ගොල්ෆ්වලටය. ඒ ක්‍රීඩාව මගේම නීතිමත ඉබේම සකස් වූවකි. ඉංග්‍රීසි නාට්‍ය විනිශ්චයකදී රාධා හමු විය. අපේ කෙටි පිළිසඳර මිතුදමක් සේ ඉබේම වැඩිණ.

අපේ භාෂා පාසැල ඉබේම ඇති විය. මා ඉබේම වාගේ ඊට මැදි විය. හෙන්රි ජේම්ස්ගේ නවකතාවක් හෙමින් හෙමින් කියවා ඒවායෙහි වැකියෙන් වැකිය වෑහෙන රසය තනියම විඳගැනීමට සමත් කිසිවකු භාෂා පන්තියේදී මට මුණ නොගැසෙන බව මම දැන සිටියෙමි. රාධා ඉංග්‍රීසි පන්තිය පිළිබඳ යෝජනාව කරන විට මගේ ආසාව වූයේ හොඳ ලෝක සාහිත්‍යය කියවා ඒවා ගැන ගැඹුරින් සංවාද කළ හැකි මට්ටමට භාෂාව ඉගෙන ගන්නට කැමැති අය වෙනුවෙන් ඉංග්‍රීසි පන්තියකි. "එහෙම ඉංග්‍රීසි ඉගෙන ගන්නට අවශ්‍ය අය දැන් කොළඹ වත් නැති" බව රාධා වහාම කිව්වාය. සාහිත්‍ය කෘති කියවා රසවිඳීමේ හැකියාවක් රාධාට තිබුණද මා කැමැති පොත් බොහොමයක් ඇය අගය නොකළාය. ඇය හා මා අතර එකම සාහිත්‍යික පොදු බවකට තිබුණේ ශේක්ෂ්පියර් පමණි. ඇය ශේක්ෂ්පියර් නාට්‍ය කිහිපයක් නැවත නැවත කියෙව්වාය. ඔතෙලෝ නාට්‍ය පමණක් ඇය පනස් සැරයක්වත් කියවන්නට ඇත. මරා නොදමන ලද ඩෙස්ඩෙමෝනා කෙනෙක වී නම් ඇය තමා වැනි යැයි රාධා කීවාය.

ස්වයංපෝෂිත ගොල්ෆ් වළල්ලේ කැරකෙන මාත් ඔතෙලෝ නාට්‍යයේ පෙළ ඇතුළේ කැරකෙන රාධාත් බෙහෙවින් සමාන බව මට පෙනිණ. ඉන්පසු එවකට ඇගේ ප්‍රේමවන්තයාව සිටි ප්‍රකට සිනමා නළුවාද සමග අපි කිහිපවරක් මුණ ගැසුණෙමු. රාගික කඩවසම්කම හැරුණු විට රාධාගේ ආකර්ෂණය දිනාගත හැකි කිසිවක් නළුවා තුළ නොවිණ. ඇගෙන් කතා කරන ඉංග්‍රීසි ඉගෙන ගැනීමට ආ ඔහු ඇය හා පෙමින් බැඳිණ. ස්ත්‍රීන් ඉදිරියේ නිර්භීතකම් පා කතා කරන නළුවා ඉංග්‍රීසි ගුරුවරිය පාඩමක් දෙකක් ඉගැන්වූ පසු "අයි ලව් යූ" කියා ඇයට ඉංග්‍රීසියෙන් කතා කළ විගසම ඇගේ හදවතේ දොර විවර විය. ඔහු ඇගේ නිර්භීතම ශිෂ්‍යයා යැයි රාධා මා හා කීවේ සිනාසෙමිනි. එසේ නමුත් ඔහු අසලක සිටින විට ඇය මා සමග ශේක්ෂ්පියර් වැනි බරපතළ මාතෘකා ගැන කතා නොකළේ ඇගේ හදේ දොර විවර වූ තැන් සිට ඔවුන් දෙදෙනා පන්ති කාමරයට වඩා නිදන කාමරයේ කල් ගෙවූ නිසා බව ඇය මා හා සිනාසෙමින් කීවාය.

මා කොළඹ සිටින දවස්වලට ඇය නළුවාට නොකියා පැමිණ මා මුණ ගැසුණාය. ඇය එවිට කතා කළේ නාට්‍ය කලාව ගැන විතරය. පොත්වලින් කොටස් උපුටා කියූ මගේ පණ්ඩිත කතා ඇය දිදුලන දෑසින් යුතුව අසා සිටියාය. කොළඹ අවට පාසැල්වල ඉංග්‍රීසි නාට්‍ය තරග විනිශ්චයන්ට ඇය මටත් නොකියා මා සම්බන්ධ කළේ මා හා ගැවසීම ප්‍රිය කළ නිසා බවද මම දනිමි. රාධා යනු සජීවී ගැහැනියකි. ඇය සෑම දෙයක්ම කළේ තමා කරන දේ වෙත පුදුමාකාර සරාගී ආදරයකිනි. ඇය ඇවිද්දේද තමා ලොවට පහළ වී ඇත්තේ ඇවිදීම නමැති කලාවෙහි පරිපාකයට යන්නට යැයි සලකන්නාක් මෙනි. එය කැට්වෝක් වැනි අතිශයෝක්ති ඇවිදීමක් නොව, ඇයට පමණක් කළ හැකි රාධානු ඇවිදීමකි. ඒ නිසා ඇවිද යන විට ඇස් ඇය වෙත යොමුවන්නේ ඇය බලන්නට නොව, ඇගේ ඇවිදීම බලන්නටය. ඇවිදීම නම් කාර්ය තුළ රාධා නම් ස්ත්‍රිය නොපෙනී ගියේ අමුතු සුන්දරත්වක් එකතු කරමිනි.

කුරුණෑගල භාෂා සහ නාට්‍යය පාසැලක් ආරම්භ කිරීම යනු රාධාගේ අදහසකටත් වඩා නළුවාගේ අදහසක් වන්නට ඇත. රාධාගේ භාෂා හැකියාව සහ කුසලතා අලෙවි කළ හැකි බව ඔහු දැක තිබුණි. නුගේගොඩ සහ නුවර ඇගේ පන්තිද වඩාත් ප්‍රකටව ඇත්තේ ඔහුගේ නමිනි. ඒ ඔහු ඒ පන්තිවලට යාම්ඊම් කරමින් ඉගෙනගන්නට එන කොල්ලන් සහ කෙල්ලන් ඉදිරියේ රාධා සමග ඉංග්‍රීසියෙන් කතා කරන නිසාය. ශේක්ෂ්පියර්ගේ නාට්‍ය වෙත විශේෂ අවධානය යොමු කරන ඒ පන්ති ඉංග්‍රීසි පොතක් කියවා තේරුම් ගන්නට වත් බැරි නළුවෙකුගේ නමින් ප්‍රසිද්ධ වීම ගැන රාධා නළුවා ඉදිරියේ පවා කතා කළේ උපහාසයෙනි. එහෙත් ඇය ඔහුට එදිනෙදා ඉංග්‍රීසි උගන්වන්නට අවංකව වෙහෙස වූවාය. ඔහු වෙත යම් සංස්කෘතික ශික්ෂණයක් ලබා දෙන ගුරුවරියගේ භූමිකාව තුළ ඇය හැසිරුණේ වගකීම් සහගත ලෙසිනි. එකල ඇය ගත කළේ ප්‍රේමවන්තියකගේ කායික තෘප්තියද ගුරුවරියකගේ බුද්ධිමය අසංතෘප්තියද එක් වූ ජීවිතයකි.

මාස කිහිපයකට පසු මට කතා කළ ඇය නළුවාගේ නික්ම යාම ගැන සැහැල්ලු සිතින් වාර්තා කළාය. නුවර පන්තියේ සිටි ශිෂ්‍යාවක වූ ධනවත් ව්‍යාපාරික පවුලක රුබර බාල දියණියද රැගෙන නළුවා රාධාගේ ජීවිතයෙන් ඉවත්ව ගොසිනි.

"එයා දැන් ටිකක් ඉංග්‍රීසි කතා කරනවා. එයා හුඟක් ඈතට යයි ඒ ටිකෙන්. මම එහෙම ඈතක යන්න බලාගෙන ඉන්න කෙනෙක් නෙමෙයිනෙ. මට ඕනැ එකතැන ඉන්න." ඇය කීවාය.

"එහෙනං ඇවිල්ල මාත් එක්ක ගොල්ෆ් ගහන්න." මම කීවෙමි.

"මට ඕනැ එක තැන කැරකෙන්න නෙමේ එක තැන ඉන්න." ඇය කීවාය.

"ගොල්ෆ් ගහන මිනිස්සු රවුමට ඇවිද්දට ඉන්නෙ එක තැන තමයි."

සෑහෙන වෙලාවක් නිහඬව සිටි ඈ නැවතත් කතා කළේ ඒ සැහැල්ලු ස්වරයෙන් නොවේ.

"බන්දු. එයා ගිය විදිය නිසා මගෙ හිත ගොඩක් රිදිල ඉන්නෙ. මට තනියම ටිකක් ඉන්න ඕනෙ. මාසයක් දෙකක්. ඔයාට බැරිද මං එනකල් ස්කූල් එක ටිකක් කරන්න. මං ඩිලන්ටත් කියන්නං ටිකක් උදව් කරන්න කියල ඔයාට."

මම බොහෝ වේලාවක් දුරකථනය අල්ලාගෙන සිට "හරි" කීවෙමි. එය ඉබේ පිට වූ වචනයක් මෙනි.

"අහන්නෙ නැද්ද මං කොහෙද යන්නෙ කියලා?" ඇය ඇසුවාය.

"නෑ." මම කිව්වෙමි. "කොහෙ ගියත් මම ඔයාගෙ යාළුවා."

ඉන් පසු අතුරුදහන් වූ ඈ ආපසු ආවේ මාස දෙකතුනකට පසුය. නළුවාගෙන් වෙන් වූ වහාම ඇය නොපෙනී යාම ගැන මම සතුටු වූයෙමි. ඈ ගොස් මාසයකට පමණ පසු නළුවා ඈ සොයා අපේ ගෙදර ආවේය.

ඇය නැති බව කී විට ඔහු බලගල්ල වලව්ව දෙස බැලුවේ එහි ගුප්ත අභ්‍යන්තරය තුළ මා රාධා සඟවාගෙන සිටින බවක් විශ්වාස කරමින් මෙනි. ඔහු පිටත සාලයෙන් ඇතුළට නොගැනීමෙන් මම අමුතු සතුටක් ලැබුවෙමි. බලගල්ල වලව්ව යනු අතිපැරණි වටිනා වස්තූද, නිදන් වදුලු, පුස්කොළ පොත්, ඔටුනු, දෝලා ගබඩා කර ඇති පුදුමාකාර මන්දිරයක්ය යන අදහස ඔහුටද අසන්නට ලැබී තිබුණ බව ඔහු මට වරක් කියා තිබිණ. එහි රාධා නම් අගනා මාණික්‍යයද සඟවා ඇති බව විශ්වාස කරන්නාක් මෙන් බලා සිටියේය. අපේ ගෙදර වෙත එවැනි ගුප්තභාවයක් ආරෝපණය වී තිබීම ගැන සාමාන්‍යයෙන් සිනාසෙන මා එදා නම් ඒ ගැන ආඩම්බර වූයේ කුරිරු සතුටක් විඳිමිනි.

ටික කලෙකින් ආපසු ආ රාධා නැවත ඉංග්‍රීසි පාසැල බාරගෙන ඉතා ක්‍රියාශීලීවද ප්‍රීතියෙන්ද එය පවත්වාගෙන ගියාය. ඇගේ කැපවීම කොතෙක්ද යත් ඇය සම්පූර්ණයෙන්ම පාහේ ඉංග්‍රීසි පාසැල කරන අතර, මම මගේ ගොල්ෆ් වළල්ල වටේ කැරකුණෙමි. තළුවා නිතර යන එන නුවර පන්තිය ඈ අතහැර දැම්මේ තළුවාට දෙන දඬුවමක් ලෙසිනි.

ඇත් මාත් විජය වික්‍රමසිංහට කටහඬ දීමේ හාස්කම තුළ යළි එක් නොවී නම් අප දෙදෙනා ගමන්ගන්නා ජීවන අඩිපාරවල් එකිනෙක හරහා යළිත් වැටෙන්නට පවා ඉඩ නොතිබිණ. අපේ හුදෙකලා සිහින් අඩිපාරවල් එකිනෙක කැපෙන එක හන්දියකින් තළුවා හැරී ගිය නමුත් තව හන්දියක 'ගොළුවා' හිටගෙන උන්නේය.

ඔහුට පරිපූර්ණ වශයෙන් කටහඬ ලැබී මාස කීපයක් ගතවෙත්ම රාධා රන්වන් සන්ධ්‍යාවක මා සොයා ආවාය. ඈ වෙතින් ප්‍රීතිමත් හදිස්සියක් දිස්විය. ඈ ආ රථයේ රියදුරු තාමත් එංජිම නවත්වා නොතිබීමෙන් ඒ හදිස්සියට ශබ්දමය රිද්මයක් එක් විය.

"බන්දු මාස කීපෙකට පන්තිය බලාගන්න පුළුවන් නේද ඔයාට තනියම?" ඇය නැවත වරක් පලා යන්නට තැත් කරයි.

කුමක්දෝ වරදකාරී හැඟීමක සේයාවක් ඒ කටහඬේ විය.

"බෑ - මට මහන්සියි." මම කීවෙමි.

"හරි ඔයත් විවේක ගන්න එක හොඳයි. මගෙන් විස්මකර්ම වැඩ බලාපොරොත්තු වෙන මිනිස්සුන්ගෙන් මග ඇරල ඉන්න ඕනෙ ටික කාලයක්." ඇය කීවාය.

"ඇත්ත - කරන්ඩම දෙයක් නැත්නම් මම ඉස්කෝලෙ කරන්නම්." මම කීවෙමි.

"මම ඒක දන්නව මගෙ හොඳ යාළුවා" ඇය හිඳ සිටි තැනින් නැගිට මා අසලට ආවාය. ඇගේ දෑත් විවර වූයේ දයාබරත්වයේ හදවත වෙත යන ද්වාරය මා වෙනුවෙන් විවර කරන්නාක් මෙන්ද මගේ අචල මිත්‍රත්වයේ පලබර උද්‍යානය වෙත පියාඹා එන්නට පියාපත් විහිදාලන කිරිල්ලියක මෙන්ද යන්න ඒ මොහොත සිහි කරන අදත් මම කල්පනා කරමි. මා ඇය වැලඳගත්තේ යන්තමට රස්නෙ ඇති සරාගයක් රැඳි සහෝදරත්වයකින් බව මම පිළිගනිමි.

ඇය ආපසු හැරුණාය. ඇගේ කොණ්ඩය කරල් දෙකකට ගොතා තිබිණ. එය ඈ හැඳසිටි සැහැල්ලු කපු සායටද අත් දිග සුදු කමිසයටද ගැළපෙන ගෙත්තමකි. මා පිටුපා යන ඇයගේ හිසකෙස් පරීක්ෂා කරමින් සෙව්වේ පුංචි පිච්ච මලකි.

බරක් නැති කාලයක්

රාධා එදා නික්ම ගිය පසු අපේ භාෂා-නාට්‍ය පාසැලේ හාස්කම් සිදුවීම සම්පූර්ණයෙන් නතර විය. දේවතාවිය පලා ගිය දේවමන්දිරයකි. ආදරයේ කිරි සුදු රළ බිඳෙන වෙරළට අප දෙදෙන එකට ඇදී ගියද අප දෙදෙනාම හසුව ගසාගෙන යන ආදර ප්‍රවාහයකට අපි හසු නොවීමු. ඒ සිඟිති රළවල ලස්සන අපි දෙදෙනාම තනි තනිව දැක්කෙමු. ඒ රළ අපේ පා ඇඟිලි පමණක් දොවා අපේ හදවත්වල ගැඹුරු මුහුද වෙත පෙරළා ඇදී ගියේය. තිස් විය ඉක්මවා සිටි ඇයද මැදිවිය ආසන්නව සිටි මාද වෙරළේ පුංචි පෙණ පිඩු නගන රළ දෙස බලා සිටියේ ඈතින් සිටගෙනය. මම දෙවරක් රිදුණ මිනිසෙක් වෙමි. ඇය රිදුම්ලත් වාර ගණන නිමක් නැත. ඇය මා තරම් ගැඹුරට රිදෙන කෙනෙක නොවේ. එහෙත්, එදින ඇය නික්ම ගිය ආකාරය ගැන මා සිත වූයේ මැදිවියේ පරිණතකමේ බරපතළකමින් සඟවා ගත් හදවත පවා යන්තමට රිදෙන වේදනාවකි.

එය ඉතා අකාරුණික සමුගැනීමක් විය.

එක නින්දක් නිදා සිට නැගිට ලෝකය අලුතෙන්ම පටන් ගැනීම යනු මා කාලයක් තිස්සේ අත්පත් කරගෙන ඇති හැකියාවකි. ටික ටික රිදෙන මාස කිහිපයක නින්දෙන් පසු මම මගේ සුපුරුදු ජීවිතය වෙත අවදි වූයෙමි.

අපේ භාෂා පාසැලින් පමණක් නොවන කථනාබාධිත දරුවන්ගේ පැසැලෙන්ද මම ටික ටික පසුබැස ගියෙමි. මට වඩා හොඳ ආබාධිත දරුවන්ට උගන්වන නිම්නා නම් හැනාගේ ශිෂ්‍යාවක අපේ පාසැල බාරගත්තාය. සිහින්, කළුවන් නිම්නා ලාලිත්‍යවත් ශරීරයක්ද මිහිරි කටහඬක්ද සහිත වූයෙන් ඒ කාර්යයට වඩාත් ගැළපිණ. ඇය දොස්තර සමරසේකරගේද දෙමාපියන්ගේද සිත්ගත් නිසා මට දුරස්ථ අධීක්ෂකයකු ලෙසද හාස්කම් බලය පමණක් ඇති තැනැත්තා ලෙසද ඈතින් ඉන්නට ඉඩ ලැබිණ. හැනාද මසකට වරක් ආ නිසා පාසැලේ අගය තවත් වැඩි වී මට මාගේ ස්වයං-සන්තෘප්තභාවය වෙත පසුබැසීම ඉතා පහසු විය. වීසා අලුත් කරගැනීමේ හිසරදය තිබුණේ වුවත් හැනා ලංකාව හා පෙමින් වෙළී උන්නාය.

නැවතත් මම මගේ සම්භාව්‍ය නවකතාවල මුල් පිටපත් ඒවායෙහි වැකි වෙන් වෙන්ව ගෙන තනි තනි මියුරු රසක් සේ රසවිඳිමින් කියවන්නට පටන්ගතිමි. පොත් නොවිකුණන අදහසින් නගරය මැද්දේ පවත්වාගෙන යන පොත් සාප්පුව පැත්තේ ඇවිදින්නට යමි. මා යන එන තැන් කිහිපයේදී මා හමු වූ මිනිස්සු මා කළ හාස්කම ගැන පුදුම වූහ.

"ඒක අහම්බයක්" යැයි මා කීවද ඔවුහු විශ්වාස නොකරති.

"අහම්බෙන් තමයි හාස්කම් වෙන්නෙ" යි මට කීවේ උගත් නීතිඥයෙකි.

"මිනිහ දැන් කතා කරනවා ගොළු වෙලා උන්නු ඒවටත් එක්ක. පුදුම වචන ගඟක්." නගරයේ ව්‍යාපාරික ප්‍රභූහු කීහ. එක් උදයක අවදි වූ මම සේනට මෙසේ කීවෙමි.

"සේන තනියම මාස දෙකක් මේවා තනියම බලාගන්න."
සේන මා දෙස මොහොතක් බලා සිටියේය.

"මමනෙ ඉතිං දැනුත් බලන්නෙ" ඔහු කීයේ "ඒ ගැන කරදර වෙන්න එපා" කියන ස්වරයෙනි.

මම සැහැල්ලුවෙන් සිනාසුණෙමි. මා නැවත වරක් එංගලන්තය බලා ගියේ ඒ සැහැල්ලුවෙනි. ඔබට පසුව කියන්නට මට සිදුවන අර්බුදයකට රාධා මැදි වී සිටින බව ඒ වන විටත් ඉවෙන් මෙන් දැන සිටියෙමි. එහිලා කෙලෙස මැදිහත් වන්නටදැයි සිතාගත නොහැකි මා කලේ පලායාමයි.

තුන්වෙනි පියවර

නිධානය

මධ්‍යම රාත්‍රිය වන විට ගොළුවිජේට නින්ද යාගෙන ආවේය. කොළඹ පැත්තේ දෙමළ කඩ ගිනි තියන බවට කටකතා දවාලේම පැමිණ තිබිණ. කලබල නගරයෙන් නගරයට පැතිරෙන බවද කියවිණ. ගොළු නොවන කෙනෙකුට වුවත් ඒවා තේරෙන කතා නොවේ. මුදලාලි දිවයින සහ දවස පත්තර දෙකම ගත්තේය. ගොළුවිජේද ඒවා උඩින් පල්ලෙන් කියවා බැලුවේය.

හෝටලයේ ඉදිරිපස දොර ඉක්මනට විවෘත වී ඉක්මනට වැසිණ.

එදා හවසම හෝටලේ වසා සියලු ගෝලයන් ගෙවල්වලට යවන ලදී. ගෙයක් කියා දෙයක් නැති ගොළුවිජේ හෝටලේ නොඉඳ මුදලාලිගේ ගෙදරවත් යා යුතු බව ඩ්‍රයිවර් අය්යා ගොළුවිජේට කීවේය. ඒ මුදලාලිගේ පණිවිඩයකි. මුදලාලිම එය නොකීවේ ලැජ්ජාව නිසා මුදලාලිගේ මූණට බැ කියාවියි ඔහු සිතූ නිසාය. ගොළුවිජේ ගොළු බසින්ම මුදලාලිට කීවේ කොහෙවත් යාම අවශ්‍ය නැති බවත් කඩෙත් බලාගෙන තනියම හිඳීම අමාරු නැති බවත්ය. එහෙත්, තත්වයේ බැරෑරුම්කම ගොළු කොල්ලා නොදන්නා බව මුදලාලි කල්පනා කළේය. ගොළුවිජේ හෝටලයෙන් පිටට ගැනීමට නොහැකි වීම ගැන කල්පනා කරමින් මුදලාලි කාර් එකට නැග්ගේය.

එදින මැදියමේ නින්ද යාගෙන එන වෙලාවේ හෝටලේ දොර අරින විට නම් ගොළුවිජේට දෙලොව රත් විය. ඔහු ඇඳෙන් නැගිට දේවරූපවලට වරක් වැඳ සූදානම් වූයේය.

දොර ඇරියද ලයිට් නොදැම්ම මුදලාලි ඉස්සර විය.

"සර් පඩිය මෙතන බලාගෙන." මුදලාලි කීවේය.

පඩිපෙළ කීක් කීක් ගෑවේය. එහි අත්වැට ටිකක් හෙල්ලෙන බව ගොළුවිජේ බිල්ලා ලවා මුදලාලිට කියෙව්වේ වැඩි දවසකට ඉස්සර නොවේ. ගොළුවිජේ බලාගෙන උන්නේ දැල්වෙන හඳුන්කූරු දෙසය. එය ලක්ෂ්මී දේවතාවිය ඉදිරියේ දැල්වී දැල්වී ටිකෙන් ටික දැවී යයි. කෑමකට රසක් එකතු කරන කෝකියකු සේ පරිසරයට සුවඳක් එකතු කර හඳුන්කූරක් නොපෙනී යයි. සුවඳ සහ රූප යන දෙකෙන් සැදුණු ලෝකයකට හුරු වී වසන ගොළුවිජේ කුමක්දෝ හේතුවකට හඳුන්කූරුවලට පුදුම ආදරයක් දක්වයි. හඳුන්කූරු ශබ්ද නොනගා සුවඳ සදමින් දැවීයාම නිසා විය යුතුය.

තුන්දෙනා වාඩි වූයේ වාඩි වූයේ ජනේලය ළඟට වන්නටය.

"මෙව්ව කබොක් ගල් බිත්ති." මුදලාලි සේදරමන් හෝටලය ශ්‍රී රාම් හෝටලයෙන් වෙන් කරන බිත්තියට යාන්තමට තට්ටු කළේය.

"මිනිස්සු ඕකට ගිනි තිබ්බොත් මේකත් පිච්චෙනවා." එක් කටහඬක් කීවේය. මුදලාලි ඊළඟට කතා කළේ කටහඬ ටිකක් විතර ගොළු කරමිනි.

"තමුසෙට මේක නිකං ලොතරැය්යක් ඇදුන වගේ හම්බුණා නේද?" ඒ කටහඬ අයිති තැනැත්තා වටපිට බැලුවේය. ඇතැම් අය මේ හෝටලේට තාමත් කියන්නේ සරස්වතී හෝටලේය. 'භවන්' කෑල්ල නම් සම්පූර්ණයෙන්ම හැලී ගොසිනි. අර කටහඬකාරයා වටපිට බැලුවේය. එහෙත්, ඔහුට හෝටලේ උඩ තට්ටුව පෙනුණේ පාරේ ලයිට්වලින් පෙරී ආ එළියෙන් පමණි. ලයිට් නොදැමීම නිසා මේ සම්පූර්ණ සිද්ධියම රහස් ස්වභාවයක් ගත්තේය.

"බාගෙකට වැඩියෙ ගෙවල තියෙන්නෙ. ඉතුරු ටිකත් ටික ටික දෙනවා." මුදලාලි කීවේ 'ලොතරැයි' උපමාව වැරදි බව අඟවන ස්වරයෙනි. අර කටහඬකාරයාගේ කටහඬේ වූයේ පෙරේත කුයිලකි. එය ප්‍රේතයන් රහස් කියන කටහඬකි.

"රාමය්යා ආයෙ එන්නෑ ඕයි." ඒ කටහඬ යන්තමට ඉහළ යාම ගැන මුදලාලි තැතිගත්තේය.

"විජේ ඉන්නව කාමරේ." මුදලාලි කොඳුළේය.

"ඒකා ගොළුවෙක්නෙ ඕයි." අර කටහඬකාරයාම කිව්වේය.

"අනික එහා කඩේටත් ඇහෙයි." මුදලාලි නැවත කීවේය.

"මේ කබොක් බිත්තිඔලින් ඇහෙන බම්බුවක් නෑ." කටහඬකාරයා කීවේ පෙරටත් වඩා ශබ්දය අඩුකරමිනි. ඔවුන් වාඩි වී සිටි මේසය ඇත්තේ ශ්‍රීරාම් බිත්තිය පැත්තේ නොවේ.

අනික් කටහඬ අයිති තැනැත්තා තාමත් උන්නේ ගොළුවකු ලෙසය. එහෙත්, ඔහු උඩතට්ටුව හාත්පස පරීක්ෂාකාරීව බැලුවේය. ඉක්බිතිව පුටුවෙන් නැගිට එහා බිත්තිය අසලට ගොස් ඊට කන තියා සවන් දීගෙන උන්නේය. ඔහු ආපසු ආවේ කිසිවක් නොඇසෙන බව අත්දෙකෙන් කියමිනි.

"අනික ඒකයි මේකයි දෙකම ගිනි තියල දාන්ඩ පුළුවන් අපේ කොල්ලො. උන් හිතං ඉන්නෙ මේක තවම රාමය්යගෙ කියල."

"පිස්සුද අපි හරක් මසුත් විකුණනවා." සේදරමන් මුදලාලි මිමිණුවේය.

"ඒකෙ දන්නෙ අපිනෙ. කඩ ගිනි තියන උන් දන්නෑනෙ මස් මොනවද කියලා. අර කොළඹ සිංහල ගෙවලුත් ගිනි තියල තියෙන්නෙ වැරදිලා."

අනික් කටහඬවල් දෙකම ඉන් නිහඬ විය.

"උන් ගෙදර අතැරල ඇවිල්ලා උන්ගෙ කඩේ උඩතට්ටුවෙ තමයි ඉන්නෙ. දැන් දවස් දෙකක්. තමුසෙ කිව්වනෙ නේද ගෑනුත් ආව කියලා."

මුදලාලි ඔළුව වැනුවේය.

"ඩ්‍රැයිවර් තමයි ඇහැගහගෙන උන්නෙ."

මුදලාලි ඉන් පසු නිහඬ විය.

ගොළුවිජේ යාන්තමට ගොරවන හඬ ඔහුගේ කාමරේ දෙසින් ඇසුණේය. ඔහු නින්දේදී ගොරවන බවක් මුදලාලිට මීට කලින් ඇසී නොතිබුණ නිසා එය ගෙරවිල්ල ඔහු තුළ ඇති කළේ තැති ගැන්මකි.

"ගොළුවන්ට ගොරවන්ඩ පුළුවන්ද ඕයි!" මෙතෙක් වෙලා ගොළුවෙකුව උන් තැනැත්තා ඇසීය.

යන්තම් හඬ නැගෙන සිනාවක් ඒ නිසා පැතිර ගියේය.

ගොළුවිජේ ගොරවන හඬ ටික ටික අඩුවී ගොස් නතර විය. ඉන් පසු එය ඇසුණේ ඉතා යාන්තමටය. නිදියැයි දැනෙන තරමට විතරය.

"ලක්ෂ තුනක් ගෙනැත් තියෙනවා ඊයෙ රත්තරන් බඩු තියලා." තුන්වෙනි කටහඬකාරයා වූ සාජන් අමරසේකර කීවේය.

"තුනක්? වෙන්ඩ බෑ." මුදලාලි පුදුම විය.

"නැත්තං."

"තුනක් ගන්ඩ රත්තරං ගෝනියක්වත් තියෙන්ඩ එපැයි." මුදලාලිටම සද්දෙ ගැන පරිස්සම අමතක වූවාක් මෙනි. ලක්ෂ තුනක් කියන්නේ කොපමණ මුදලක්ද යන්න වටහා ගැනීමට ඉන් කළ හැකි දේ ඔහු සිතින් මතක් කර බැලුවේය. තිදෙනා තුළම එවැනි මතක් කිරීම් සිදුවන බව පෙනුණේ කිසිවකු සෑහෙන වෙලාවක් කතා නොකළ බැවිනි.

"වෙන්ඩ බැරිනෑ. දෙමළු එහෙමනෙ. රත්තරන්මයි හොයන්නෙ. උන් හදන්නෙ සල්ලි දීල බේරෙන්ඩ." තුන්වැන්නා කීවේ 'සල්ලි' දෙමළ උච්චාරණයට දමමිනි.

"ඇයි ඉතිං රත්තරන් දීල බේරෙන්න පුළුවන්නෙ."

"ඕකුං මෙහෙමනෙ. රත්තරන් තියල ගත්ත සල්ලි දීල කොහොම හරි බේරිල ඊට පස්සෙ සල්ලි හොයල රත්තරන් බේරගන්නව. දෙමළුන්ට කෙළවන්ඩම ඕන්නං රත්තරන්මයි ගන්ඩෝනෙ." තුන්වෙනි කටහඬකාරයා දැන් තමන්ගේ වාරය ආවාක් මෙන් අදහස් පළ කළේ ගැඹුරු තර්කයක් ඉදිරිපත් කරන්නෙකු මෙනි.

"සර්ල දන්නෙ කොහොමද ඔච්ච ඇත්ත කියලා."

"බැංකුවෙ ඉන්නෙත් අපේ මිනිස්සුනෙ ඕයි."

"පිස්සු යක්කු." මුදලාලි කොඳුළේය. ඒ 'පිස්සු යක්කු' යනු එහි දෙදෙනා බව කාටත් පැහැදිලිය.

"ඔච්චර සල්ලි ළඟ තියාගන්නෙ."

"සල්ලි දීල හරි අපේම රටේම ඉන්ඩනෙ ඕකලාට ඕනෙ." එකෙක් කීවේය.

"රට නෙමේ ඕයි පණ. පණ බයට තමයි ඔය ඔක්කොම." පෙරේත කුයිල ඇති කටහඬකාරයා අන් කිසිවෙකු නොව, සැරෙන් සැරේ එන සාජන්ය.

එදිනම පාන්දර හතරදෙනෙකු පැමිණ සේදරමන් හෝටලයේ පිටුපස තාප්පය උඩින් පැන ඇතුළුව එතැනින් ශ්‍රී රාම් හෝටලයත් සරස්වතී හෝටලයත් දෙකට බෙදන තාප්පය උඩින් ඒ පැත්තට පැන එහි පිටුපස දොර කඩා දොරකඩා ඒ හෝටලයට ඇතුළු වනු ඇත. තුවක්කු දෙක දකින පමාවෙන් ලක්ෂ තුනම දෙනු ඇත. පොදි බැඳගත් රත්තරන් තව තිබෙනු ඇත. සල්ලි සහ රත්තරන්වලට වඩා තරුණ දූවරු දෙදෙනා ශ්‍රීරාම් මුදලාලිට වටිති. අප ඒ දෙදෙනාට අතක්වත් නොතියන තරමට හොඳ වුවත් එන උන් මොනවා කරාවිදැයි කිව නොහැකිය. කෙල්ලන් දෙන්නා හින්දි නිළියන් වැනිය.

"ඔවුන්ට මේ ටවුම එපා උනොත් තමුසෙටනෙ හොඳ. අල්ලපු කඩේ ලොතරැය්යත් තමුසෙට ඇදෙයි."

කටකාරයා

සෙස්න සියලු දේ හොඳින් බලාගන්නා නිසා මම එංගලන්ත මාස තුන නිදහසේ ගත කළෙමි. ඒ නිසාම ඒ කාලය ඉක්මනටම ගෙවී යන්නට විය. අක්කලාගේ ගෙදර නතර වී සිටි කාලය එතරම් ආස්වාදජනක වූයේ නැත. අක්කා සහ ඇගේ සැමියා අදහස් අතින් මගෙන් බොහෝ ඈත් වී සිටියහ. ඒ නිසා මම විවිධ මිතුරන් සමග කාලය ගත කළෙමි. සම්පූර්ණයෙන්ම ලන්ඩන් ජීවිතයටත් ඔවුන්ගේ පරම්පරාවටත් හුරු වී සිටි අක්කාගේ දරුවන්ට කුඩා කල මෙන් මා සමග බෙදා ගන්නට දෙයක් නොමැතිය. ඔවුන්ගේ ලෝකය වෙනම විශාලනය වී තිබිණ. කලා පිස්සුවෙන් සැදි මගේ සම්භාව්‍ය ජීවිතය අක්කාට ළඟා විය හැක්කක් නොවේ. මා තවමත් අපේක්ෂා කළේ හෙන්රි ජේම්ස්ගේ 'පෝට්‍රේට් ඔෆ් අ ලේඩි' නවකතාවේ එවැනි එංගලන්තයක් හැත්තෑ ගණන්වලත්, එහි නොවූ බව ක්‍රිස්ටීන් විහිළු කළ සැටි සිහි වී මම තනිව සිනාසුණෙමි. එහෙත්, මේ මාස තුනක කාලය තුළ අලුත් පොත්පත් රාශියක් සොයා ගන්නට මට හැකි විය. ඉෂිගුරෝ මා කැමති ලේඛකයකු බව ඔහුගේ එක් කෘතියක් කියවා මම වටහා ගත්තෙමි. සල්මාන් රුෂ්ඩි සැඟවී සිටි තැනකින් පැමිණ ඔහුගේ අලුත් පොතකින් කොටසක් කියවන සාහිත්‍ය සැඳෑවක් පොත් සාප්පුවක තිබිණ. ඒ පොත 'මුවර්ස් ලාස්ට් සයි' කෘතියයි. මම ඉන් පිටපතක් ගතිමි. 19 වැනි සියවසේ නවකතා ශෛලියට කැමැති

මට රුෂ්ඩි යනු එතරම් ආකර්ෂණීය නවකතාකරුවෙක් නොවේ. එහෙත්, ඔහු නවකතා කලාවද ඉංග්‍රීසි භාෂාවද සෙල්ලමකට ගන්නා සැටි නම් අපූරුය. ජීවිතය සෙල්ලමකට ගන්නට කැමැති මම නවකතාව සෙල්ලමකට ගන්නා අයටද කැමැත්තෙමි.

මා ආපසු ආවේ ලංකාව යනු මගේ දෛවය වාසය කරන තැනය යන සිතිවිල්ලෙනි. ලන්ඩනයේ අඳුරු සීත කාලය දුඹුරු පැහැයට හැරෙන් හැරෙත්ම දවල් දෙකටවත් එළියට බහින්නට බැරි කුරුණෑගල ගිනි රස්නය මිහිරි මතකයක් සේ මතක් විය. එය මා මත් කරන මතකයකි. මම හිරු එළියේ දරුවෙක් වෙමි. වාෂ්ප කරන්නට එපා යැයි මට කී හිම කැටියද ලන්ඩනයේ නොසිටියාය.

මගේ පැමිණීම ගැන කලින්ම දැනගත් දොස්තර සමරසේකර මා වෙනුවෙන් පිළිගැනීමේ සාදයක් ලෑස්ති කළේය. ඒ මා පැමිණි දාට දෙදිනකට පසුවය. ඊට පෙර දින දුරකථනයෙන් කතා කළ ඔහු සාදය පැවැත්වෙන සැටි විස්තර කළේය.

වීවීගේ අලුත් කටහඬ පුදුමාකාර චාතුර්යක් කරා දැන් ළඟා වී ඇත. ඊටත් වඩා පුදුමය ඔහුගේ ගායන හැකියාවයි. අවුරුදු තිහක් පමණ තට්ට තනියම නොඇසෙන කනින් සින්දු ඇසූවෙකු වුවත් ඔහුට සින්දු සිය ගාණක් කටපාඩම්ය. චිත්‍රපටි හෝල් ළඟ විකුණන්නට ඇති ශත විසි පහේ පනහේ සින්දු පොත් ඔහු කාලෙක සිට එකතු කර ඇත. දොස්තර සමරසේකරගේ නිවසේ පැවැත්වෙන සාදයේදීද ඔහු ගී ගයනු ඇත. බන්දු සර් ඉදිරියේදී සිය වාග්චාතුර්ය ප්‍රදර්ශනයටත් ගායනා කුසලතා පෑමටත් ඔහු අදිමදි කරයි. ඔහුට සබකෝලය ඇත්තේ බන්දු ඉදිරිපිට මිස 'සභා' ඉදිරිපිට නොවේ. එය සබකෝලයක් නොව, 'බන්දු කෝලයක්' විය. ඒ නිසා රාධා ටීචර්ගේ යෝජනාව වන්නේ සාදය පැවැත්වෙන සාලය දෙස වීවීට නොපෙනෙන කාමරයක සිට බන්දුල බලගල්ලට ටික වෙලාවක් සාදය නරඹන්නට සැලැස්වීමයි. ඉන් පසු ඒ කාමරයෙන් මිදුලට ගොස් "ටිකක් පරක්කු උනා" කියාගෙන බන්දු සාදයට එක් වන්නේය.

අනුන් දෙස හොරෙන් බලා සිටීම අශිෂ්ට ක්‍රියාවක් වුවත් මම මේ සැලැස්මට එකඟ වීමි. දොස්තර සමරසේකර මිස රාධා මට දුරකථනයෙන් කතා නොකළාය. එහෙත්, සැලැස්ම මූලික වශයෙන් ඇයගේ බව මම දැනගතිමි. "මිනිහ බිතෝවන් වගේ මිනිහෙක්. කන් ඇහෙන් නැතුව ඒ විදියට සින්දු කියන්න කොහොම ඉගෙන ගත්තද මංදා - ජෝති කැලේ. අමරදේව උනත් එහෙම තමයි."

රාධා මට දුරකථනයෙන් වත් කතා නොකිරීම මගේ නොඇලෙන සිතේ පවා ඇලුණ මොකක්දෝ කෙනිත්තුමක් ඇති කළේය.

මා ඒ කාමරයට වී බ්ලැක් ලේබල් වීදුරුවක් තොලගාමින් සිටින විට මා හා එහි කතා කරමින් සිටි දොස්තර සමරසේකර හදිසියේ නැගිට ගියේය. එක් පැත්තකින් කුරුණෑගල වැව දෙසට විවර වන විශාල ජනෙල්වලින් යුතු ඒ කාමරය වෙත වැව් වතුරක මඩ සුවඳ රැඳි සුළඟක් හමා ආවේය. කළුවර කුට්ටියක් මත වැඩසිටි සුදුපාට බුදුරජු මට පෙනිණ. ලන්ඩනයට වඩා මේ ලොවට මා අයිති යැයි සිතෙන දසුනකි ඒ. මම රන්වන් විස්කි තොලගාමින් පින්වත් බුදුරුව දෙස බලාගෙන භක්ති කාව්‍යය මානසිකත්වයක උන්නෙමි.

සාලයේ එක්කොනක සිටින තුන්දෙනෙකුගෙන් යුත් සංගීත කණ්ඩායමක් ගී ගයයි. "මුවහස රැළි සාගරේ මුතු වැලක් වෙලා - ඔබ මගෙ මුළු ජීවිතේ රඟහලක් කළා." දැනටමත් සාලයේ හිඳ සිටින දොස්තර බිරින්දෑවරු තාලෙට පැද්දෙති. ඒ ගීතය තුළ සිටින ශේක්ෂ්පියර් මට පෙනේ: "ජීවිතේ රඟහලක්."

මම ජනේලෙන් ඇතුගලේ බුදුරුව දෙසත් සාලය දෙසට ඇති වීදුරු ජනේලයකින් සාලය දෙසත් සැරෙන් සැරේ බලමින් ඒ අඳුරු කාමරයේ හිඳ සිටියෙමි.

වික්‍රමසිංහ යුවළ ආවේය.

වීවී අසලින් සිටි විනීතා වැලම්වේ එල්ලාගෙන ආ බෑගය ඇගේ ඇඳුමටද සැඳෑ සාදයකටද මනාව ගැළපුණේය. මට එය වහා පෙනුණේ සාමාන්‍යයෙන් ඇය රැගෙන එන බෑගය නොගැළපෙන එකක් බව මට විවිධ අවස්ථාවල සිතුණු බැවිනි. ඈ කෙදිනකවත් හැඳ සිටිනු මා දැක නොතිබුණු පාටක තද රතු කොළ දික් තීරු ඇති කපු සාරියක් හැඳ සිටියාය. වීවී හැඳ සිටි සුදු අත්කොට කමිසයේ රන්වන් දිගු පටි විටින් විට දිලිණි. ඔහු හැඳ සිටියේ දුඹුරුවන් ලිනන් කලිසමකි. ඒ මා ලිනන් ඇඳුම් ගන්නා කොල්ලුපිටියේ සාප්පුවක පමණක් ඇති ඇඳුමක් බව මට ඒත්තු ගියේය.

සංගීත කණ්ඩායම ගයමින් සිටි ගීතය නතර කළේය.

එවිටම තනිවම, කැපී පෙනෙන ලෙස, අලුතින් රූමත් වූවාක් බඳු රාධා එළඹියාය. දොස්තර සමරසේකරගේ බිරිඳ නිලීකා නංගි ඇය පිළිගත්තේ හාද්දකිනි. ඉන් පසු රාධා අඳුරු වීදුරු කවුළුවකින් ඈ වෙත එල්ල වී ඇති මගේ ඇස් සෙව්වාය. වික්‍රමසිංහ යුවළට පිටුපසින් සිටි ඇය ඒ අඳුරු කවුළුව වෙත හොරෙන් අත වැනුවාය. ඇය වෙතින් ප්‍රීතිමත් කෙළිලොල් බවක් පළ වීම මගේ සතුටට හේතු විය.

මගේ හදවතේ වූ කෙනිත්තුම නැති වී ගියේය.

විශාල සාලය පුරා තැනින් තැන වාඩි වී සිටි දොස්තර සමරසේකරගේ මිතුරන්ගේ ඇස් රාධා වෙත යොමු වනු මම දිටිමි. මට මගේ මිතුරිය ගැන ආඩම්බරයක් ඇති විය. දැන් තනිව ඒ සාලය වෙත එළඹ අන් කවුරුත් බලා සිටින අතර, ඇය විසින් වැලඳ ගනු ලැබීමට පුදුමාකාර බොළඳ තණ්හාවක් මට ඇති විය. එවැනි තණ්හාවක් ඒ මැදිවියේදී පවා මා තුළ හදිසියේ ඇතිවීම ගැන මට එවේලේම ලැජ්ජා සිතිණි. එහෙත්, එය මා තාමත් සජීවී මිනිසෙකිය යන කාරණය මටම දනවන බොළඳකමක් විය.

අඳුරු කවුළුවක් බවට ඌණනය කරනු ලැබූ මා දෙස කෙළින් බැලිය හැකි පුටුවක රාධා හිඳගත් විට අඳුරේ වුවද මට දැනුණේ අපහසුවකි.

ඒ වන විටත් වීවී වටකර ගන්නට කීපදෙනෙක්ම ආහ. ඔවුන් සමග ඔහු කතා කරන ආකාරයේ ගොළු බවක් තබා ගොළු

නොවීම මා තුළ ඇති කළේ අවංක අතීතයක සේයාවක්වත් නොවීම මා තුළ ඇති කළේ අවංක ප්‍රීතියකි. වීවී සිටගෙනම සිටියේ වේදිකාව සහ අවධානය ඔහුගෙන් ගිලිහෙතියි සිතන්නාක් මෙනි. කාටවත් නැති අලුත් ඇඳුමක් කාටත් හොඳින් ප්‍රදර්ශනය වන ලෙස හැසිරෙන දරුවෙකු සේ ඔහු සිය කටහඬ වෙත කාගේත් අවධානය ලබා ගන්නට සැරසෙන්නාක් සේ විය. ඔහුගේ කටහඬ විස්මය දකින්නට උනන්දු ඇති අය එදිනද පැමිණ සිටියහ.

වෛද්‍යවරයෙක් නැගිට ගොස් අමරදේවගේ "කුමරියක පා සලඹ සැලුණා" ගයන්නට පටන් ගත්තේය. ගායකයාත් වාදකයාත් ශ්‍රැතියෙන් පිට පැන්න නිසා එය සාදය දියාරු කරන්නක් වූ බව ගීතය වෙනමත් අවධානය වෙනමත් පැවතීමෙන් පෙනිණ.

ඉන් පසු මයික්‍රෆෝනය අතට ගත් වීවී එම්.එස්.ගේ "බෝලබෝල මැටි" සහ ජෝතිපාලගේ "මම ගන්නෙමී කරකාර බන්දාලා" ගැයුවේ සාලය පණගන්වමිනි. මුලින් මා හමු වී අසරණ ගොළුවෙකු සේ අංගචලනයෙන් කතා කළ මේ මිනිසා තමන්ට වඩා උගත් මිනිසුන්ගෙන් පිරි සාලයක් සිය අධිරාජ්‍යය කරගෙන සිටියි. මාද මැදිහත් වී කළ වික්‍රමය ගැන මට පුදුමාකාර ආඩම්බරයක් ඇති විය. මා ඉදිරිපිටදී නම් මෙතරම් ප්‍රාණයක් විහිදුවා නොහැසිරෙන්නට ඉඩ ඇති බව මමද සිතුවෙමි.

"ඔන්න එක සැරයක් එම්.එස්.ට මරු වැඩක් වෙලා තියෙනවා. එම්.එස්. හොඳටම ලෙඩ වෙලා ඉස්පිරිතාලෙ නවත්තල තියෙනවා. අපි කියමුකො සිංහ හොස්පිට්ල් කියලා. අපේ ඩොක්ටර් කියනවා. එම්.එස්.ට ඇඳේම ඉන්න කතා කරන්න එපා කියලා. මොකක්ද? කතා කරන්න එපා. හරිනෙ. මොකක්ද?"

"කතා කරන්න එපා." සාලයෙන් කිසිවෙක් කියති.

"ඔන්න දැන් එම්.එස්. ළඟ තනියට ඉන්නව කොල්ලෙක්. අපේ බන්දු සර්ගෙ සේන කොල්ලා වගේ."

මාවද ඔහුගේ විහිළු කතාවකට නිදර්ශනයකට ගැනීමට තරම ඔහුගේ ආත්මවිශ්වාසය වර්ධනය වී තිබීම ගැම මගේ සතුටට හේතුවක් වුවද සේන නිදර්ශනයට ගත් ආකාරය මගේ සිත්ගත්තේ නැත. එය රාධාගේද අමනාපයට හේතු වූ බව ඇගේ මුහුණෙන් පෙනිණ. 'සේන කොල්ලා' යනු උඩඟු කියුමකි.

"දැන් ඔන්න දොස්තර මහත්තය සේන කොල්ලටත් කියනවා මහත්තයට කතා කරන්ඩ දෙන්න එපා කියලා. කොල්ල හොඳට අහගෙන ඉන්නවා. ඔන්න දැන් පැයක් විතර ඉන්නවා. කොල්ලා එම්.එස්.ට තට්ටු කරලා මෙහෙම අහනවා."

වීවී කෙසෙල් ගෙඩියක් ලෙලි ඇර එය ඕනැදැයි අංග චලනයෙන් අසා පෙන්වයි. "කෙසෙල් ගෙඩියක් ඕනැද?"

"එම්.එස්. කියනව එපා කියලා. මට මේවි හොඳට කරල පෙන්නන්න පුළුවන්. මං ඉස්සර ගොළුවෙක්නෙ."

සාලයෙන් සිනා හඬක් නැගෙයි.

"රාධ ටීචටයි බන්දු සර්ටයි පිං සිද්ධවෙන්න මං මේ ජෝක් කියන්නෙ. දැංනං මං හිතන් ඉන්නෙ මැරෙනකං කතා කරනවා කියලා."

අඳුරේ හරිබරි ගැහෙන මගේ පුටුවද ටිකක් සද්ද විය. රාධාගේ ඇස් කවුළුව දෙසට එල්ල වී යළි වීවී දෙසට හැරිණ.

"තව ටික වෙලාවත් යනවා. ආයෙත් සේන කොල්ලා එම්.එස්.ට තට්ටු කරනවා. තට්ටු කරලා මෙහෙම අහනවා."

වීවී තැඹිලි ගෙඩියක් කපා කෙනෙකු වෙත දිගු කරන හැටි රඟපා පෙන්වයි.

"එම්.එස්. අත වනලා එපා කියනවා."

"සේන කොල්ලා ආයෙත් තට්ටු කරනවා එම්.එස්.ට."

වීවී බීම බෝතලයක් ඇර ස්ට්‍රෝ එකක් ඊට දමන හැටි රඟපා පෙන්වයි. ඔහුගේ රංගනය නරක නැත.

"බීම එකක් ඕනැද?" කීපදෙනෙක් එක වර කියති.

"හරි බීම එකක් ඕනැද - එම්.එස්.ට තද වෙනවා. තදවෙලා හොඳ කුණුහරපෙකුත් එක්ක මෙහෙම කියනවා. 'යකෝ තොටද කතා කරන්න හොඳනැත්තෙ මටද?' "

“ඇත්තනෙ! කතා කරන්න හොඳ නැත්තෙ එම්.එස්.ට විතරනෙ.” සාලයෙන් කවුරු හරි කියයි. මුළු සාලයම සිනාසෙයි.

වීවී නිවේදකයෙකු සේ මයික්‍රෆෝනය අතට ගනියි. “හරි ඒ හිනාවත් එක්ක අපි කියමු - තවත් එම්.එස්.ගෙ සින්දුවක්. අසෝක මල් මාල ගොතාලා. අසෝක මල් උයනට වැදිලා...”

රාධාගේ ඇස් අඳුරු කවුළුවෙන් මා දෙසට යොමු වෙයි. වීවීගේ ඇස් සාලය පුරා කැරකෙයි. රාධා වෙත මඳක් නතර වෙයි.

එය පුදුමාකාර දර්ශනයකි. එය දර්ශනයක් ලෙස මගේ පළපුරුදු රුචියට දැනුණේ තරමක් දිග වැඩි දර්ශනයක් ලෙස වුවත්, අනුන් දෙස හොරෙන් බලා සිටීමේ වරදකාරී හැඟීම මා පෙළුවත් වීවී අනුන්ගේ ගෙදරක සාලය තමන්ගේ අණසකට ගෙන ඇති කටකාරකම පුදුමය. අනුන්ගේ බිරින්දෑවරුන්ගේ ඇස්වල දීප්තියද එල්ල වන්නේ ඔහු වෙතය.

මම පැතිදොර ඇර මිදුලට බැස වටෙන් ගොස් දොරට ගැසුවෙමි. දොර හැරෙන විට දොස්තර සමරසේකර යුවළ දොර ළඟ සිටියේය. රාධාද නැගිට සිටගත්තාය. ඇගේ මිත්‍රත්වයේ උණුසුම් දෑත මා වෙනුවෙන් විවර වූයේ නැත. ඇයට හුරුපුරුදු චාරිත්‍රවාරිත්‍ර අමතකව ගියාක් මෙනි. එහෙත් ඇගේ සිනහව “දැක්කද” කියා අසන පියකරු සිනාවකි. වීවී මයික්‍රෆෝනය පසෙක තබා මා වෙත පැමිණ ආචාර කළේය.

වීවීගේ ප්‍රභාරශ්මි වළල්ල ඔහු වෙතටම හැකිළී ගියේ සාලයම ගොළු කරමිනි.

සිංහලෙන් කෙරෙන සුහද සංවාද පණ ගැන්වීමෙහි ස්වභාවයෙන්ම අසමත් මම මගේද උදව්වෙන් කටහඬ ලද ආකර්ෂණීය පුරුෂයා ඉදිරියේ එක්තරා ක්ෂුද්‍රභාවයක් වෙත හැකිළී ගියෙමි. වාසනාවකට ගායක කණ්ඩායම ගීයක් ගයන්නට පටන් ගත්තේය.

“මීවදයකි ජීවිතේ...”

සාදකතා

ඒ දින ප්‍රියසාදයද රාධා සමග ප්‍රමාණවත් පිළිසඳරකට මට ඉඩ සැලසූයේ නැත. දොස්තර බිරින්දෑවරුද ව්‍යාපාරික බිරින්දෑවරුද ඈ වටකොට සිටියහ. රාධා ඔවුන්ට රාත්‍රී ඉංග්‍රීසි පන්තියක් පවත්වන බව මට ආරංචි වුවද ඒ ගැන වැඩිමනත් යමක් මම නොදත්තෙමි. වෛද්‍යවරියන්ද වූ ඒ ඇතැම් නෝනලා ඉංග්‍රීසි වටහා ගැනීමේ ශක්තිය ඇති අය වුවද චතුර ලෙස කතා කිරීමේ අපහසුව නිසා දුකෙන් තැවෙන බව දොස්තර සමරසේකර මට වරක් කීවේය. රාධා යනු නෝනලාගේ ඉංග්‍රීසි සබකෝලය ඉවත් කිරීමේ ශක්තිය ඇත්තියක බව මමද ඔහුට කීවෙමි. “නිලීකා උනත් දැන් ඉස්සරටත් වඩා ලස්සනට කතා කරනවා. පුංචි පුංචි දේවල් ටිකක් විතරයි රාධා ටීචර් කෙරුවෙ. ඒකෙන් හරි එළියක් එනවා ඒ උනාට.” දොස්තර සමරසේකර මට කීවේ එදින සාදයේදීමය. "බොරුවට බයවෙන්නැතුව කතා කරාම හරි” මම කීවෙමි. “ඒ උනාට ඒකෙත් ක්‍රමයක් තියෙනවා. රාධා ටීචර් ඒක නියමෙට දන්නවා.” ඔහු කීවේ ඒක නියමෙට නොදන්න මට ඇනුම් කියන ස්වරයක් යන්තමට එහි රඳවමිනි. රාධා ගැන කතා කරන්නට හැකි වුවද රාධා සමග හරි හැටි කතා කරන්නට මට නොහැකි විය. රාධා ගැන කතාවල ඉන්නේ බොහෝ විට මා අඳුනන රාධාට වඩා ප්‍රබන්ධගත රාධා කෙනෙකි.

"කොහොමද බන්දු ලන්ඩන්” යැයි ඇය වරක් ඇසුවාය. ඒ පිරිස කෑමට බීමට එහාමෙහා වන වෙලාවකය.

"දැක්කද ගෝලයගෙ ගායනා?" මට පිළිතුරක් දීමට ඉඩ නොදී ඇය යළි ඇසුවාය.

මම හිස සෙලවීමි.

"මම වීවීට ඉංග්‍රීසි ටිකකුත් උගන්නනවා. මිනිහ ඉක්මනට අල්ලගන්නවා."

ඉංග්‍රීසි පාසැලට පැමිණෙන්නට නොහැකිවීම ගැන කනගාටුව පළ කළ ඇය කියන්නට ගොඩක් දේවල් ඇති බවද කීවාය."මේ දවස්වල මම කට්ටියගෙ නෝනලා ටිකක් පොලිෂ් කරනව." ඇය සෙමින් කීවාය.

මම හිස සැලීමි.

"අපේ ළමයින්ට වගේ නෙමේ. මෙයාලට ඕනකම තියෙනව." ඇය කීවේ වරදකට සමාව ඉල්ලන ස්වරයෙනි.

මම හිස සැලීමි.

ඇය කී හැටියට ඇය කුරුණෑගල ධනවත් පවුල් කීපයකම නෝනලාගේ සහ දූවලාගේ රාත්‍රී ඉංග්‍රීසි ගුරුවරියයි. නෝනා කෙනෙකු වීමට අවශ්‍ය බොහෝ දේ ඇය උගන්වයි. "වීවීට කටහඬ දීලා නෝනලාට සංස්කෘතිය දෙනවා. එයාලා සංස්කෘතික ගොළුවො." ඇගේ ස්වරයේ වූයේ මාස කිහිපයකට පෙර වූ අවංකත්වයේ පිවිතුරු කටහඬ නොව, කුමක්දෝ නිර්දයකමකි. ඇය අපට හසු වූ නිමේෂයේදී ඒ ටික වේගයෙන් කියා දැමුවේද ඇයට ආවේණික සන්සුන් රිද්මයෙන් නොවේ. මා වසන අවවර්ධිත කුඩා නගරයට විශිෂ්ටත්වය ගෙනෙන ඒජන්තවරිය සේ කතා කරන උඩඟුකම ඇය උගත්තේ කෙසේද? එය අපේ නගරයේ නෝනලා ඇ තුළ පැළ කළ ආත්මාභිමානයක්ද? ඇඳුම් මෝස්තරයක්, ළමයින්ගේ විභාගයක්, ටෙලිනාට්‍ය කැල්ලක්, ලස්සනට බණ කියන ලස්සන හාමුදුරු නමක් හෝ ඕපදූපයක් ඇර වෙන කතා කරන්නට අදහසක් හෝ සංකල්පයක් නැති අපේ නෝනලා ගැවසෙන තැන් මගහැරයාම මගේ සිරිතය. මගේ නිහතමානී මිතුරිය විපර්යාසට පත් කළ මෝඩ ගෑනු ගොන්න

දෙස මා බැලුවේ සුපුරුදු අප්‍රසාදයෙනි. ඇගේ ජීවන රිද්මයේ හදිසි වෙනසක් සහතික වශයෙන්ම සිදු වූ බව මට තේරුණේ ඇය අපට ලැබුණු ඒ විනාඩි කිහිපයේදී මට කියන්නට ඇය තෝරාගත් ඊළඟ දේ නිසාය. විජය වික්‍රමසිංහගේ සියලු ව්‍යාපාර "වීවී ගෘප්ස්" යනුවෙන් එක්කොට සෑදූ සමාගමේ ඇය අධ්‍යක්ෂවරියකද වේ.

නිලීකා අප අසලට ආවේ "රාධා ටීචර්" කියාගෙනය.

"ඔය ටීචර් කැල්ල නවත්තන්න නිලී." රාධා කීවාය. ඇය එසේ කීවේ අලුතින් උගත් ව්‍යාජ හුරතලයකින් යැයි මම සිතුවෙමි.

"බන්දු අය්යට ලොකු ලොකු දේවල් කතා කරන්න කෙනෙක් නම් මෙහෙ නැතුවැති." නිලීකා නංගී වටපිට බලා කීවාය. අපේ නිවසේ ඉස්සර පැවැති සාදවල කෙරුණු සාරවත් සංවාද ඇය අසා තිබෙනු විය හැකිය.

ඉන් පසු රාධා ගැහැනුන්ගේ කිච්බිච්ය තුළට ඇදී ගියාය. ඒ මාතෘකාවල හරයක් නැතැයි මට සිතෙන්නේ මගේ උඩඟුකම නිසා යැයි සිතූ මම කෙසේ හෝ ඔවුන් හා මුසුවන්නට තැත් කළෙමි. බත් කෑම ප්‍රියතම විනෝදාංශය බව පෙන්වමින් රවුම් වූ නෝනලාද ෂොපින් යාම ප්‍රධානම කලාව බව පෙන්වන ඇඳුම්ද ඒ නෝනලාට වඩා උඩට මතු වී පෙනිණි. මා නොදන්නා ටෙලිනාට්‍ය කැලිවලින් ගත් නිදර්ශන සහිත ඒ සංවාද මා බැහැර කර මා වටා ගොතන දැලක් සේ විය. ඔවුන් අසල ගැවසෙන සෑම විටම ලන්ඩනයේ ගත කළ බොහීමියානු ජීවිතය මිහිරි සිහිනයක් සේ මට සිහි වේ. නොටිංහිල් සිනමාශාලාවක පිළෙහි රාත්‍රිය ගත කරමින් වීදි මිනිසුන් සමග ලෝක සිනමාව ගැන කළ කතා, වීදි ගායකයකු ගිටාරය වයමින් ගැයූ කැලිප්සෝ ගීත අසමින් කළ සංවාද ඇතුළු ඒ රස්තියාදු ජීවිතය මේ දොස්තරවරුන්ගේ පොහොසත් ජීවිතයට වඩා පොහොසත් බව මට සිතිණි. එය මා එහි එන්නට පෙරම දරා සිටි අදහසක් නිසා සන්සුන් වීමට තැත් කළෙමි. මට එහි ආරාධනා කිරීමෙන් ඔවුන් කර ඇත්තේ විශාල වරදකි. නැවත වරක් අඳුරු සිතිවිලි සිත ආක්‍රමණය කරන විට

තවත් විස්කි වීදුරුවක් මිස සැනසුම සදන අන් දෙයක් නැති බව දැන ගතිමි.

බොන තැනද පිරිමි කලබලයකි. මස් නොකන අයට බයිට් මදි වීම ගැන කසුකුසුවකි. මැතකදී හදිසියේම සිල්වත් වී හරක්මස් කෑම නැවැත්වූ ව්‍යාපාරිකයෙක් හරක් මස් විරෝධී විවාදයක් ආරම්භ කළේය. අපේ අක්කාගේ මගුල් ගෙදරට වත්ත පිටිපස්සේ හරකෙකු මැරූ බව මා කී විට විවාදය සම්පූර්ණයෙන්ම පාහේ අර්බුදයට ගියේය. මම කුරිරු සතුටක් වින්දෙමි.

"මං කාල තියෙන රසම මස මොකක්ද දන්නවද?" හරක් මස් නොකන ව්‍යාපාරික මහතාම ප්‍රශ්නෝත්තර තරගයක් ආරම්භ කළේය. ඔහු විස්කි බොන වේගය අනුව ඉක්මනින් වෙරි වන බව මම කලින්ම දැන සිටියෙමි. අනෙක් දොස්තරලා සහ ව්‍යාපාරිකයෝ සෑම සතෙකුගේම නම් කීහ. ඒ මළකඳන් පිළිබඳ සංවාදය සාදයකට තබා මෝචරියකටවත් නොගැළපෙන දෙයක් යැයි මා සිතුවද ස්කොට්ලන්තයේ විස්කි විසින් එළියට ඇද දමනු ලබන මගේ රටේ එක්තරා ප්‍රභූ පිරිසකගේ විඥානය මාරක චිත්‍රපටියක් සේ මට දැකගත හැකි විය. කිසිවෙකුට ඒ මස් ප්‍රහේලිකාව ජයගත නොහැකි විය. උත්තරේ දුන්නේ ප්‍රශ්නය ඇසූ කෙනාමය.

"කලවැදි මස්."

අපේ ගෙදර සීලිම අස්සේ රිංගා කරදර කරන අප්‍රසන්න සත්වයා මට සිහි විය. කලවැදි මූත්‍ර ගෙබිම වැටී පැතිරෙන දරාගත නොහැකි දුර්ගන්ධය මගේ නාසයට දැනිණ. කලවැද්දා අපේ වහලය අස්සට රිංගන තැන වහලයට නැමුණු අඹගසේ අඹ කෑම පවා අක්කා සහ මා පිළිකුල් කළ සැටි මට සිහි විය.

"කොහොමද බීෆ් වගේද?" මම ඔහු අවුස්සන්නට ඇසීමි.

"නෑ නෑ බීෆ් වගේ හය්ය නෑ. සොෆ්ට්. හරක් පැටවුන්ගෙ මස් කාල තියෙනවද? අන්න ඒ වගේ." ඔහු විස්තර කළේය.

කිසිම මස් වර්ගයක් පිළිබඳ විශේෂ ආසාවක් නැති, ලන්ඩනයේදී කාලයක් නිර්මාංශ ආහාර සංස්කෘතියට හුරු වී

සිටි මට ඕනෑම මස් වර්ගයක් කන්නටද පුළුවන. එහෙත්, හරක් පැටවුන්ගේ මස්ද කළවැද්දන්ගේ මස්ද කා නැති නිසා ඒ ගැන පසුතැවිල්ලක්ද නැත.

සුදුපාට කුර්තා කමිසයක් හැඳගෙන ඒ මත ගැසූ පදක්කමක් සේ හරක් මස් නොකෑමද පැළඳ සිටි ඒ මිනිසා කවුරුත් ඉදිරියේ හෙළිදරව් කර මම කුරිරු සතුටක් ලැබුවෙමි.

"ගන්න තව එකක්." මම ඔහුට විස්කි බෝතලය පෑවෙමි.

ඔවුන් සියලු දෙනාම පාහේ ඉංග්‍රීසියට මාරු වී හතරවටින් ඉංග්‍රීසි කතා කරන්නට වූහ.

චතිකයකින් තොරව මා වට කරගත් ඔවුහු මා අවුරුදු විස්සකට විතර කලින් ගත කළ එංගලන්ත ජීවිතය ගැන අසන්නට වූහ. මම කතාන්දර හද හදා කිව්වෙමි. සුරතාන්තයේදී 'සුද්දියන්' හය්යෙන් කෑ ගසන්නේදැයි දැන ගැනීමට කිහිප දෙනෙකුට අවශ්‍ය විය. ඔවුහු මගේ වචන අල්ලා ගැනීමට මගේ ඇගේ හුස්ම වදින තරම් ළං වූහ.

ඒ මාතෘකාව මගහැර යන්නට මගක් සොයමින් සිටිද්දී රාධා මා වෙත ආවාය.

"බන්දු මෙන්න මෙයාව අඳුන ගන්න ඩොක්ටර් සුසන්ත." රාධා මට එතෙක් වේලා නිහඬව අසා සිටි වෛද්‍යවරයකු පෙන්වූවාය. ඔහු පිරිසෙන් මිදී අප වෙත ඇවිත් මට අතට අත දුන්නේය.

"මම මිස්ට බලගල්ලව දන්නවා කාලෙක ඉඳලා. මම ඉස්සර ඉඳල ටවර් ඔෆ් බාබෙල් එකට එනවා." ඔහු කීවේය.

"ංආ ඔව්. ඒකෙ මෙඩිකල් පොත් එහෙමත් ටිකක් තියෙනවා." මම කීමි.

"නෑ. මම යන්නෙ සාහිත්‍ය පොත් ගන්න. බර්නාඩ් ෂෝගෙ නාට්‍ය පොත් ඔක්කොම මං ගත්තෙ එතනින්." සුසන්ත කීවේය. ඔහුගේ ඉංග්‍රීසි කථනය තරමක් දුරට ලිඛිත ඉංග්‍රීසියක

ස්වරූපයක් දැරුවද ඔහු ඉතා නිවැරැදිව බස හැසිරවීය. අනෙක් වෛද්‍යවරුන්ට වඩා තරුණ කෙනෙකු වූ ඔහු සහ මම බොහෝ වේලාවක් සංවාදයේ යෙදුණෙමු. මා මෙවර ලන්ඩනයෙන් ගෙනැවිත් තැබූ පොත් දෙකක් දැනටමත් අලෙවි වූ බව පෙරේරා අන්කල් කීවේය. ඉන් එකක් මිලට ගෙන ඇත්තේ සුසන්තය. එය ඩොක්ටර්ස් ෆෝ ඩිමොක්‍රසි නම් මානවවිද්‍යාත්මක පොතකි. එය කුරුණෑගලදී විකිණෙතියි මා නොසිතූ පොත්වලින් එකකි. එවැනි පොත් කියවන අය අපේ නගරයේ ඇතැයි මම නොසිතූ බව ඔහු කීවෙමි.

"එහෙම අය ටික ටික හරි ඉන්නවා මිස්ට බලගල්ල." සුසන්ත කීවේය. "අපේ නෝනත් එතනින් නවකතා එහෙම ගන්නවා." ඔහු ගැහැනුන් අතර සිටි සිය බිරිඳ නිකිණි මට පෙන්වීය.

මා සාදයෙන් නික්ම ආවේ එහි යාම ගැන පසුතැවිල්ලකින් තොරවය.

දිස්ටි සහ දර්ශන්

"එතකොට වීවී ඔයා කොහොමද එකපාරට තනියම බිස්නස් කරන්න පටන්ගත්තෙ." රාධා, වීවීගෙන් ඇසුවාය.

"වීවර්ට පුදුම හිතෙයි ඒ කතාව අහුවොත්. ඔන්න කලබල එහෙම ඉවර වෙලා ටවුම නිවිල ගිහිල්ලා. පිච්චිච්ච කඩවල අළු අඟුරු එහෙම අස්කරලා සතියක් දෙකක් යන්ඩ ඇති. මුදලාලි හිටියෙ තුෂ්ණීම්භූත වෙලා. අපේ කඩේ උනත් බිස්නස් බැස්සා. ශ්‍රීරාම් වැහුව මිසක් ආයෙ ඇරියෙ නෑ. මුදලාලිල කොහෙ හරි යන්ඩ ඇති. වීරබාහු කඩේනං අළුම අළු ආයෙ ගන්ඩ දෙයක් නෑ. ඒ කාලෙ දෙමළ කඩ විසි හතරක් තිබුණ. දැං තියෙන්නෙ හතරයි."

දවසක් මහ රෑ මං නිදාගෙන ඉන්නකොට ලොකු සද්දයක් ආවා. මට පුදුම ආසාවක් ඇති උනේ සද්දයක් ඇහෙනකොට. සද්ද ඇහිලම නෑනෙ. සද්දෙ ඇහෙන හින්දා මං හිතුව හීනයක්ම වෙන්න ඕනෙ කියලා. හැබැයි ඇහැ ඇරල බලනකොට මට හීන්දාඩිය දැම්මා. මේක හීනයක්ද ඇත්තක්ද කියලවත් මං ඇහැරිලද බුදිද කියලවත් මට හිතාගන්ඩ බැරි උනා. අර නිදිත් නැති ඇහැරිලත් නැති දවස් තියෙන්නෙ අර කෝපි එහෙම වැඩිපුර බිව්වහම. අන්න ඒ වගේ.

අර මං හැමදාම පිච්චමල් තියලා වඳින දේවරූපෙ තියෙන්නෙ? ලක්ෂ්මී රූපෙ. බිත්තියෙ ගහල? ඒ ඉස්කන්ධ

දේවරාජයා රූපෙන් එළියට ඇවිල්ලා නිල්පාට වළාවක් මැද්දෙ ඉඳගෙන මට කතා කරනවා මට දැන් මේ ඔක්කොම ඇහෙනවා. දෙය්යො කතා කෙරුවෙ හරියට අර ටෙලිනාට්ටිවල වගෙ."

වීවී දේවරූපය රඟපා පෙන්වයි.

"දරුව නුඹ මා කෙරේ නොසැලෙන භක්තියෙන් මෙතාක්කල් මා අසල පහන් පූජා කළෙහිය. පස් යට නිදන් කළ මැණිකක් මෙන් නුඹගේ භක්තිය නොසැලී දිලෙන බව මට පේනවා. ---අර රේඩියෝ එකේ නාට්ටිවල දෙවියො කතා කරද්දි කටහඬ නිකං වෙව්ලනවා වගේ වෙන්නෙ දෝංකාර දීදී. අන්න ඒ වගේ--- ඒ නිසා පුත්‍රය දෙවියන් විසින් තොපට පිදෙන ත්‍යාගය තොපගේ අනාගතය බබළවන ත්‍යාගය දෙවියන් විසින් රඳවා ඇති ස්ථානය මම තොපට නිමිති ලකුණින් දක්වනවා ඇත. මට හිතෙනව මේ දෙය්යොම තමයි කියල මොකද රේඩියෝ එකේ නාට්ටිවල එහෙමනෙ. ටීචලගෙ නාට්ටිවල උනත් දෙය්යො කතා කරනකොට කටහඬ නිකං මේ වෙව්ලනව වෙව්ලනව වගේ නේද? අන්න ඒ වගේ."

රාධාගේ ලොකු ඇස් තවත් ලොකු වී පුදුම වූවාය.

"ඔව් ටීච. මට ඒ හැම වචනෙයක්ම තාම කටපාඩං. දැන් අවුරුදු කීයක්ද?"

රාධාගේ විස්මයෙන් දිදුලන දෑස වීවීට පෙනුණේ විසින් ඔහු ඉදිරියේ තබන ලද තෙතබර සුන්දරත්වයකින් යුතු එළියක් විහිදුවන අතරම තමා වෙතද ආලෝකය උරාගන්නා පහන් දෙකක් සේය.

"දරුව. තොප සිටින්නේ වාසනාවේ දෙවඟන වැඩසිටින තැනින් ඈතක නොවෙයි."

"මං හොඳට අහගෙන උන්නා. තාමත් මට ෂුවර් නෑ මං ඇහැරිලාද නැද්ද කියලා. කාමරේ පිරිලා තිබුණෙ ළා නිල්පාටයි රන්වන් පාටයි දෙකම එකතු උන එළියකින්. මම ගොළුවෙක් කියලා මට ගාණක්වත් නෑ."

"දෙවියන්ගේද තොපගේද වාසභවනය වූ මේ බිමෙ චතුරශ්‍රාකාර තැනක් පයට පෑගි පෑගි තියෙනවා. එය වැඩියක්ම පෑගෙන්නේ තොපගේ දෙපයට නොවේ පුත්‍රය. ඒ චතුරස්‍රය යට තොපගේ වාසනාව සැඟවී බලා සිටී දරුව. තොපට අසන්නට දෙයක් තිබේද දරුව."

"මං දණ ගහල වැන්දා. මං මොකක් හරි අහන්න හැදුවා. එතකොටම නිල් රත්තරන් එළිය නොපෙනී ගියා. මටත් ඇහැරුණා වගේ උනා."

"දර්ශන්" රාධා කීවාය.

"ඒ කිව්වෙ ටීචර්."

"දර්ශන් කියන්නෙ දෙවියො දැකීම. සමහර වෙලාවට එහෙම හිතල බලන්න බෑ. ඉබේ පෙනී යනවා. මං කියවලා තියෙනවා ඉන්ඩියන් පොතක."

"ංආ දිස්ටි - අන්න ඒ වගේ. මං ඇහැරුණා හැබැයි ඉස්කන්ධ දේවරාජයා මොකක්වත් උන්නෑ වගේ වැඩ ඉන්නවා. ලක්ෂ්මි දේවතාවි එහෙමම උන්නා. මං හිටගෙන බැලුවා. හැන්දෑවෙ පූජා කරපු පිච්චමල් තුන තවම පරවෙලා නෑ. අදත් මං ඒ දේවරූපෙ ඉස්සරහම තමයි පිච්චමල් පූජා කරන්නෙ."

රාධා එදින රැයේ වීවී ලැබූ දර්ශනය ගැන පුදුමයෙන් පුදුම වී උන්නාය. ඇයද නීල වර්ණය ආලේප වුණු රන් ආලෝක කිරණයක් දිගේ දේව දර්ශනයක නාභිය වෙත ඇදී ගොස් සෙමින් කැරකෙන්නාක් සේ විය.

"ඉතිං වීවීට ඒ නිමිත්ත හොයාගන්න පුළුවන් උනාද?"

වීවී සන්තෘප්තිකාරක සිනාවක් පෑවේය. ඉන් පසු ෂෙහරසාද්මය නිහඬතාවක් ආරම්භ කළේය.

"ටීච මං ඒ කතාව ආයෙ පාඩමක් කියල දුන්නම කියන්නං."

"ඔයත් ෂෙහරසාද් වගේ."

"ඒ කිව්වෙ ටීච?"

"ඇරේබියන් නයිට්ස් කියල ලස්සන පොතක් තියෙනවා. ඒකෙ ෂෙහරසාද් කියල කෙල්ලෙක් දවස් දාහක් රජ්ජුරුවන්ට කතා කියනවා. හැබැයි හැම රෑකම නවත්තන්නෙ කතාවෙ හොඳම හරිය නොකියා."

"ඇයි ඒ?"

"ඔක්කොම කතාව කිව්වොත් රජ්ජුරුවො ඒ කෙල්ලව මරනව."

"ඊචත් එහෙම කරනවද?" වීවී ඇසීය.

රාධා නිහඬව බිම බලා ගත්තාය.

* * *

"බන්දු හිතන්නැද්ද ඒක ඇත්ත කියලා" රාධා ඒ විස්තරේ මට කියූ දා ඇසුවාය.

"නෑ."

"එහෙනං බොරු?"

"මං දන්නෑ."

"මිනිස්සුන්ට දර්ශන් පහළ වෙලා අතාර්කික දේවල් වෙන්ඩ බැරිද?"

"එහෙම වෙනව කියල මම අහල තියෙනවා. ලස්සන කතාවක් තියෙනවා. ඉස්සර ක්‍රිස්ටීන් මට කියපු. එයා හින්දු කතා බෞද්ධ කතා ගැන පිස්සු වැටිලනෙ හිටියෙ. ඔන්න උඩිප්පි කියල කෝවිලක් තියෙනවා. මේ කෝවිලේ ක්‍රිෂ්ණාගෙ හිටි පිළිමයක් තියෙනවා. ඒ පිළිමෙ බලාගෙන ඉන්නෙ නැගෙනහිර පැත්ත. ඉහළ කුලවල අයට විතරයි මේ කෝවිල ඇතුළට යන්ඩ දෙන්නෙ. ඔන්න කනකදාස කියල බැතිමතෙක් හිටියා. ක්‍රිෂ්ණා ගැන පුදුම භක්තියක්. මිනිහ අඩු කුලේ. ඇතුළට යන්ඩ දෙන්නැනෙ. මිනිහ හිටියෙ බස්නාහිර පැත්තෙ තාප්පෙනුත් පිට. බස්නාහිර පැත්තෙ තාප්පෙ තියෙනවා පොඩි පැල්මක්. කනකදාස මේකෙන් පොඩ්ඩක් ඇහැදාල බැලුවා. හැබැයි ක්‍රිෂ්ණ පිළිමෙ මූණ පෙන්නෑ. කනකදාසගෙ ආසාව ක්‍රිෂ්ණගෙ මූණම බලාගන්න. පුදුම භක්තියක්. මේ භක්තිය ක්‍රිෂ්ණටත් දැනුණා. අදහගන්න බැරි විදියට ක්‍රිෂ්ණ පිළිමෙ බස්නාහිර පැත්තට ඔළුව හරවලා අර තාප්පෙ පැලුණ තැන දිහා බැලුවා කනකදාසට මූණ පේන විදියට."

"පුදුමයි. ඔයා හිතනවද ඒ ඇත්ත කියල." රාධා ඇසුවාය.

"ක්‍රිස්ටීන් හිතුවා ඇත්ත කියලා. ඇත්ත නෙමේ උනත් ලස්සන කතාව."

"වීවී කියන එකත් ලස්සන කතාව. ක්‍රිස්ටීන් හිටිය නම් කියයි ඇත්ත කියලා." රාධා මා දෙස බැලුවාය.

වීවී කියන කතාව ගැන මා බරපතළෙට හිතන්නට පටන් ගත්තේ ඉන් පසුවය.

ඔහු ශූර කතා ගොතන්නෙකු බව ඒ විස්තරය සිහිකොට ලියන දැනුත් සිතමි.

විවාදකාරී

මම මගේම වූ කාල රාමුවක් වෙත ආපසු ගියෙමි. සේන මා වෙනුවෙන් කාර්යබහුලව වතුපිටි බලාගන්නා අතරේ මම මගේම ගොල්ෆ් වළල්ලේ මගේම නිර්මාණයක් වූ ගොල්ෆ් ගැහුවෙමි. තවත් අලුත් පහරවල් නිර්මාණය කළෙමි. තමන්ගේම ගෙවත්තක මිනි ගොල්ෆ් පිටියක් සාදා ගන්නා සැටි ගැන පොතක් ලියන්නට පටන් ගතිමි. එහි ඉලක්ක පාඨකයා කවුදැයි යන්න ගැන කිසිම අදහසක් නොතිබුණු මා මගේ සිතේ ඇඳගත් පාඨකයා වූයේ මාමය. මගේ ගොල්ෆ් ක්‍රීඩාවේ ක්‍රීඩකයාද තරගකරුවාද වූයේ මාය. ටික ටික ලියන්නට ගත් මේ පොතේ කර්තෘද පාඨකයාද වූයේ මාය. එය එක්තරා ස්වයං-වින්දනීය ප්‍රීතියකි. මිනිසා යළි යළි සොයා යන්නේ හුරුපුරුදු ප්‍රීතිය නොවේද?

එසේ ගෙවී ගිය මාස ගණනකට පසු මම මගේ ස්වයං-සන්තෘප්තතාවේ පැවැත්මෙන් එළියට ආවේ බාහිර සමාජය මා වෙත කඩා වැදුණ නිසාය.

නැවත වරක් මලියදේව විද්‍යාලයේ ත්‍යාග ප්‍රධාන උත්සවයට මටද ආරාධනා කෙරිණ. අපේ සීයාගේ නමින්ද කෙරුණු ඒ ආරාධනය මට බාර නොගෙන සිටිය නොහැකි විය. මා වැනි නිකම් සිටින මිනිසෙකුට පවා උත්සවවලට ආරාධනා කරනු ලැබීම මට නම් පුදුමයක් විය. වාසගමක සහ පැරණි නිවසක බලය එවැනිය.

ඊට සහභාගි වන ලෙස රාධාද මට දුරකථනයෙන් මතක් කළාය. ඇය වීවී සමූහ ව්‍යාපාරය කෙතරම් ඉහළට ගෙනැවිත් තිබේද යත් කොළඹ පෞද්ගලික රෝහලක මට්ටමේ අංගසම්පූර්ණ හෘදරෝග ඒකකයක්ද එහි පිහිටුවන බව දොස්තර සමරසේකර කීවේය. දොස්තර සමරසේකර සහ නිමනා එක්ව ගොළු දරුවන්ගේ පාසැල සිංහ රෝහලේම කොටසක් බවට පත් කර ඇත. හැනා වරින් වර පැමිණ නොමිලේම ඔවුන්ට උදව් කරයි. විටෙක මා හමුවන්නටද එයි.

පාසැලේ උත්සවය පිණිස නගරයම සරසා තිබිණ. වීවී සමූහ ව්‍යාපාරයේ බැනරයන්ද සමග පාසැලේ බැනරයන්ද ප්‍රදර්ශනය කෙරිණ. ඒ සියල්ල රාධාගේ අධීක්ෂණය යටතේ සිදු වන බව සේන කිව්වේය. මා වේදිකාව වෙත ගියේ අලුත්ම රතු පලසක් මතිනි. මගේ ගෙල වටා දමන ලද නැවුම් මලින් සැදි මාලය පිච්චමල් සුවඳ විහිදූ නිසා එය ආවේ කොහෙන්දැයි මම දැනගතිමි. මම ප්‍රධාන ආරාධිතයා වීමි. වීවී විශේෂ ආරාධිතයා විය. අපි ළඟ ළඟ පුටුවල වාඩි වීමු.

රාධා අප දෙදෙනාම පෙනෙන සේ සභාවේ ඉදිරි පේළියේ උන්නාය. මල් කලඹක් ගත් විනීතා බලා සිටි අතර, රාධා ඇය දෙසට නැමී වරින්වර යම් යම් දේ කීවාය.

වීවී කළ කතාව ඉතා ආකර්ෂණීය විය. ඒ කතාව අතරතුරද අවසානයේද අත්පොලසන් නැගිණ. ව්‍යාපාරික ලෝකයේ නායකයකු ලෙස නිවේදකයා ඔහු හඳුන්වා දුන් නිසා කටහඬ යනු ව්‍යාපාරික නායකයකුගේ වටිනාම සම්පත බවද තමා වටහා ගත්තේ අවුරුදු හතළිහේදී බවත් ඒ වටිනා නිධානය තමන්ට පාදා දුන්, පැරණි රාජපරම්පරා කරා දිවයන බලගල්ල පරම්පරාවේ දැනට සිටින අවසාන පුරුෂෝත්තමයා වන බන්දුල බලගල්ල ශ්‍රීමතාට ස්තුති කරමින් ඔහු කතාව ආරම්භ කළේය. අවුරුදු දෙකකට විතර පෙර වචනයක්වත් කියන්නට බැරි මිනිසෙකු ඔහුගේ කටහඬ තුළ මම නොදැක්කෙමි. එසේම ඒ කාලය තුළ එතරම් වචන ගොඩක් ඒ කටහඬට එකතු වූයේ කෙසේද යන්න මට අදහා ගත නොහැකි විය. එය කටහඬ ලැබීමට වඩා විස්මයකි.

ඔහුගේ කතාවෙන් කොටසක් පසු දින පුවත්පත්වල පළ වී තිබිණ.

"මේ ශ්‍රී ලංකා ධරණීතලය තුන්වරක් බුද්ධ පාද ස්පර්ශයෙන් පාරිශුද්ධ වූවක්. මේ ශ්‍රී ලංකාව තමයි ලෝකයේ ධර්මද්වීපය. මේ රටේ තරම් මනුෂ්‍ය ගුණධර්ම වෙන කිසිම රටක නෑ. අපි ධාර්මික ජාතියක්. ශ්‍රී සද්ධර්මය මේ ද්වීපයේ රැකෙන බව බුදුන්වහන්සේත් දේශනාකර තිබෙන නිසා අපි උපතින්ම ධාර්මික ජාතියක්. අපේ බන්දුල බලගල්ල නිලමෙතුමා දීර්ඝ කාලයක් එංගලන්තයේ ජීවත් උනත් මේ මවු රටට ඇවිත් තියෙන්නේ මේක ධාර්මික රටක් නිසා."

ඒ කතාව මේ ලියන මොහොතේ නැවත කියවන විටත් මගේ දෙසවනේ එදා ඔහුගේ වචනවල ශබ්දය දෝංකාර දෙයි. ඔහු කතා කළේ අපේ වෙරළටම පැමිණ සිටින ආක්‍රමණික හමුදාවක් අමතා කරන වීර කතාවක් සේය. එදා ඒ කතාවේ ඒ කොටසින් පසු මගේ අවධානය විනාඩි කිහිපයකට ගිලිහී ගියේය. මා මට ඇසුණේ අලංකාර ශබ්ද මිස අර්ථ සහිත වචන නොවේ. මා අතර වේගවත් භාෂාත්මක මල්වෙඩි සංදර්ශනයක් අතරමැදය. ඒ ඔහුගේ වචනද භාෂාමය අත්පොලසත්ම අත්පොලසන්ද නැගිණ. ඔහුගේ වචනද භාෂාමය අත්පොලසත්ම මිස වචන නොවේ.

ඉන්පසු මා අවධානය යොමු කළේ ඔහුගේ අංගචලනය දෙසටය. ඔහු ගොළුවකු වී නම් කෙසේවේදැයි පරීක්ෂා කරන්නට මට අවශ්‍ය විය. මම මගේ හාස්කම් බලයෙන් ඔහුගේ කටහඬ නවත්වා දැමීමි. රූපවාහිනියේ නිතර වේගවත් කතා පවත්වන දේශපාලකයකු සේ අතපය සොලවන ඔහු ශබ්දයෙන් තොර රූකඩයක් සේ මට පෙනිණ. එසේ ඔහු කණ්ණාඩියක් ඉදිරිපිට සිට කතා කරන්නෙකි. ඔහුට අප වෙනුවට පෙනෙන්නේ ඔහුමය. ඔහු දැවැන්ත කණ්ණාඩියක් ඉදිරිපිට ඊට මුහුණ ලා සිටගෙන අපට කතා කරන්නකු සේ මට පෙනෙන්නේ ඇයි? ඔහු කටහඬ ලැබුයේ අපේ තිඹිරිගෙයෙහි සවි කළ කණ්ණාඩියක් ඉදිරිපිටය.

ඔහු ඔහුට වමෙන් සහ දකුණෙන් ඇති තවත් මනෝමය දර්පණ දෙකක් දෙස බලයි. සභා ශාලාවද ඔහුගේම පිළිබිඹුව පෙනෙන විශාල දර්පණයක් සේ ඔහුට පෙනෙන බවක් මට පෙනිණි.

රාධා සිය අත් වීවීට පමණක් පෙනෙන ලෙස යාන්තමට මෙහෙයවයි. ඔහුගේ කතාවේ රිද්මය උස්පහත් වන්නේ ඒ අනුවය. තමා එහි අත්‍යවශ්‍ය චරිතයක් බව පෙනෙන්නට සලස්වමින් රාධා එහි හිඳ සිටියද එය අනවශ්‍ය දෙයක් බව මට සිතිණි. ඇය අදිසි රූකඩ නූලක් අත ඇති බලවත් ස්ත්‍රියක වී සිටීම නිසා එකල මා දැන සිටි ස්වාධීන රාධා තාමත් ඈ තුළ සිටින බව මට පෙනිණ. එහෙත්, ඇය තමාට ලැබී ඇති නව බලය රස විඳින්නේ මගේ පැරණි මිතුරිය ලෙස නොවේ. මම නැවතත් මගේ ශ්‍රවණේන්ද්‍රියට පණ දී ඔහු කියන දේ ඇසුවෙමි.

"ජාතියේ දූ පුතුන්ගෙන් මම ආදරණීය ඉල්ලීමක් කරන්නට තියෙනවා. මේ තමයි ලෝකෙ තියෙන පින්බරම භූමිය. මේ පින්බර ලංකාව. සිංහලයා මේ පින්බර භූමිය ආරක්ෂා කරගෙන තියෙනවා දෙමළ, මුස්ලිම්, පරංගි, ලන්දේසි, ඉංග්‍රීසි ආදී පරදේශක්කාරයන්ගෙන්. ඒ අපි මේ රට රැකගත්තේ මහා කළු සිංහලයන්ගේ පුදුම ශක්තිය නිසා. ඒ ශක්තිය අපට ආවේ තල, මෙනේරි, කුරහන්, හීනැටි..."

වීවීට යම් වී වර්ගයක් හෝ ධාන්‍ය වර්ගයක් අමතක වූ බව මට පෙනිණ. නිහඬතාවක් පැවතිණ. රාධා අදිසි රූකඩ නූලක් ඇද්දාය. "සුවඳැල්, කළුහීන්දිරං" විදුහල්පතිවරයා මතක් කළේය.

"අන්න හරි. සුවඳැල්, කළුහීන්දිර... මේ පින්බර පොළොවේ යට තමයි අපේ වීරෝදාර මුතුන් මිත්තන් වස්තුව තැන්පත් කරලා තියෙන්නේ. ඒ අතීත ශ්‍රී විභූතිය තවමත් මේ දෙරණ යට තියෙනවා. මේ දරුවන්ගේ කාර්යය වන්නේ එය සොයා යාමයි. අපේ මහා රාවණා රජුගේ දඬුමොනරය පවා මේ පොළොව යට වැළලී තියෙන්න පුළුවන්."

ඔහුගේ කතාව වචන සංදර්ශනයක් සේ අලංකාර වුවත් අදහස් නිසා මට ඇති වූයේ නොසන්සුන්තාවකි. ඒ වගේම ඔහු ඒ කතාවෙන් දරුවන්ට කියන්නේ මොනවාදැයිද මට අවබෝධ නොවීය.

මගේ කතාවේ වාරය ආ විට වීවී තරම් චතුර ලෙස නොවුණත් මා කීවේ මෙවැනි අදහසකි.

"ශ්‍රී ලංකාව කියන්නෙ ලස්සන රටක්. ඒ වගේම ලස්සන රටවල් ලෝකෙ තියෙනවා. අපිට නොයෙක් දේවල් ඉගෙන ගන්නට රටවල් තියෙනවා. අපේ භාෂාව ලස්සනයි. නමුත් තව ලස්සන භාෂාවල් තියෙනවා. ඇත්තම කියනවා නම් කැතයි කියන්න පුළුවන් භාෂාවල් ගැන මම නම් දන්නෙ නෑ. අපේ රටේ අද තියෙන සංස්කෘතිය හදන්න සිංහල, දෙමළ, මුස්ලිම්, වගේම තවත් අය දායක වෙලා තියෙනවා. අපේ සංස්කෘතිය විනාශ වෙලා තියෙන අවස්ථාවල ඒකට දායක වෙලා තියෙන්නෙ පරදේශක්කාරයො විතරක් නෙමේ. අපේ දේවල් විනාශ කරන්න සහභාගි වුණ සිංහල මිනිස්සුත් ඉන්නවා. අපේ රටේ දරුවන්ගේ වගකීම වෙන්නේ ජාතිය, ආගම අරක මේක වෙනස් උනත් අපේ රටේ අනාගතය යහපත් කරන්න වැඩකරන එක. අද අපේ රට බොහෝ අංශවලින් අතීතයට වඩා හොඳයි. අනාගතය ඊටත් වඩා හොඳ කරන්න අපිට පුළුවන්. මම දකින විදියට අහසින් යන යානා ඇති වුණේ විසිවෙනි සියවසේ. මීට අවුරුදු දාස් ගාණකට කලින් අහස්යානා තිබිල නෑ ලෝකෙ කොහෙවත්. උඩින් ගිය දඬුමොනරයක් තියෙන්න විදියක් නෑ."

මම සරල භාෂාවෙන් කතා කරමින් තවත් මොනවාදෝ කීවෙමි. මා එදා කියූ දේ පත්තරේ පළ නොවූ නිසා ඒ ගැන කිසිම වාර්තාවක් නැත. මා මේ ලියන්නේ මතකයෙන් වුවත් මා එදා කියූ දේ මූලික වශයෙන් එවැන්නක් බව මට මතක ඇත්තේ ඒ අදහස් විවාදකාරියකගේ ප්‍රහාරයටද හසු වූ නිසාය.

මා කතා කරන විට රාධා තුෂ්නිම්භූත වී බලා සිටියාය. වීවී මගේ කතාව අසා සිටියේ ප්‍රීතිමත් මුහුණින් ඔළුව වනමිනි.

ඔහු මගේ කතාවේ ඇතැම් කොටස් අනුමත කළේ මිනුගිලි සිනාවක්ද සමගිනි. මට හුරුපුරුදු මෘදු ස්වරයෙන් වුවත් මා ඔහුට අභියෝග කරන බව නොදැනුණේද? මගේ කතාව අවසන් කරන විටද ශිෂ්‍යයෝ වේගවත් අත්පොලසන් නාදයක් දුන්හ. වාග්මය මල්වෙඩි සංදර්ශනයෙන් තොර මගේ කතාවේ විවාදකාරීත්වය කොලු ගැටයන්ගේ සිතට අල්ලන්නට ඇත. නැතිනම් කතා කරන ඕනෑම කෙනෙකුට අත්පොලසන් දෙන්නට ඔවුන්ගේ ගුරුවරුන් කියා තිබෙනු විය හැකිය.

රාධා වැඩි වේලාවක් ගත කළේ බිම බලාගෙනය.

එදින ඇගේ දෑතේ වූ මෙහෙයුම් නූල් සිඳ දැමීම ගැන මා තුළ කුරිරු ප්‍රීතියක් වීදැයි අදත් මම කල්පනා කරමි.

මා අපේක්ෂා කළ පරිදිම රාධාගේ ඇමතුම ආවේය.

"ඇයි බන්දු අර මනුස්සයව ප්‍රසිද්ධියෙ අපහසුවට පත් කෙරුවෙ." ඇය කෙළින්ම ඇසුවාය.

"මොකක්ද අපහසුව. වීවී හිනා වෙවීනෙ අහගෙන උන්නෙ." මම සන්සුන් හඬින් කීවෙමි.

"හිනා වෙවී අහගෙන උන්නෙ ප්‍රසිද්ධ තැනක් හින්දා. ඔයාට ඒ අදහස්වලට චැලේන්ජ් කරන්න ඕනෙනං පෞද්ගලිකව කරන්න තිබුණනෙ."

"පෞද්ගලිකව අභියෝග කරන්නෙ කොහොමද ළමයි දාස් ගාණකට වැරදි අදහස් කිව්වම. මම කතා කෙරුවෙ ඒයාට නෙමෙයි ළමයින්ට."

"වීවිගෙ අදහස් ඒ වගේ කියල ඔයා දන්නවනෙ ඉස්සර ඉඳල." රාධා කීවාය. ඇය තව මොනවාද කියන අතරේ මම කල්පනා කළෙමි. මට සිතුණේ සිංහලෙන් කතා පැවැත්වීම යනුම එවැනි අදහස් කීම බවයි. ප්‍රසිද්ධ කතාවලදී මට වැඩි වශයෙන් ඇසී තිබුණේ එවැනි කියමන් නිසා ඒවා සිංහලෙන් පවත්වන කතාවල ස්වරූපය යැයි මම සිතුවෙමි.

"රාධා ඔයාට පුළුවන්නෙ මිනිහගෙ ඔළුවට හරි අදහස් දාන්න."

"බන්දු මට වගකීම තියෙන්නෙ එයාගෙ කටහඬයි ඉදිරිපත් කිරීමයි ගැන විතරයි. බලන්න කොච්චර ලස්සනට එයා ඒ කතාව ඉදිරිපත් කෙරුවද කියලා. අදහස් එයාගෙ. මට කාගෙවත් ඔළු ආක්‍රමණය කරන්න ඕනෙ නෑ. පිරිමි තමයි ඒවට දක්ෂ. අනික එයා කියන්නෙ එයාගෙ නායකයො කියන දේවල්ම තමයි."

"මිනිහෙක් කතා කරල විතරක් මදි. කතා කරන්නෙ මොනවද කියලත් ඔයා හිතන්න ඕනෙ." මම කීවෙමි. "ඔයා නෝනලා ටික විතරක් මයි ෆෙයා ලේඩීස්ලා කරල හරියන්නෑ. පිරිමින්ගෙත් ඔළු හදන්න ඕනෙ."

ඇය නිහඬවම උන්නාය.

"රාධා?"

"මිනිහ ගොඩක් සල්ලි තියෙන බලවත් පිරිමියෙක්. මිනිහට කටහඬ හම්බ උනාම මිනිහ ගිරවෙක් වගේ කතා කරනව කියල ඔයා දන්නැද්ද. මිනිහගෙ කටහඬෙන් කියවෙන්න ඕනෙ අදහස් ගොඩනගන්න තිබුණ අවස්ථාව ඔයා තමයි අත ඇරියෙ. අනික ඔයා අහල තියෙනවද ගෑනු කෙනෙක් පිරිමියෙක්ගෙ අදහස් වෙනස් කරපු කතා. ගෑනු කොච්චරවත් එහෙම කරලා ඇති. ඒත් කතා ලියවිලා නැනෙ."

මම නිහඬ වීමි.

"බන්දු?"

මම නිහඬතාව නොබින්දෙමි.

"බන්දු. අවුරුදු ගාණක් පොඩි හෝටල් කුස්සියක හිටපු නූගත් මිනිහෙක් කොහොමද ලන්ඩන්වල රැඩිකල් ජීවිතයක් ගෙවපු ඔයාට ගැළපෙන දේවල් කියන්නෙ? මිනිහ මොනව හරි කියනෙකම මදිද? අනික වීවී කියන්නෙ ඔයාගෙයි මගෙයි දෙන්නගෙම දරුවා. ඔයා ඉපදුණ කාමරේමයි ඉපදුණේ."

ඒ ප්‍රකාශය මා තුළ ඇති කළේ විස්තර කළ නොහැකි හැඟීමකි. ඔහු මගේ දරුවා පමණක් නොව, මා උපන් වින්නඹු කාමරයේම උපන් නිසා මගේ සහෝදරයාද වැනිය.

"මම ඒකට එච්චර වැදගත්කමක් දුන්නෑ." මම කීමි. මා ඒක යැයි අදහස් කළේ කුමක්දැයි මටවත් හරියට පැහැදිලි නැත.

"ඔයා වැදගත්කමක් දෙන්නෙ ඔයාටම විතරයි."

ඈ දුරකථනය තැබුවේ ඒ ආකාරුණික කියමන සමගය. මගේ ජීවිතය ගැන අවබෝධයක් නැතිව කියූ ඒ වැකිය පසුපස ආ නිහඬකම රිදෙන නිහඬකමක් විය. මා උපන් නගරයේ මිනිසුන් සමග මුසුවීමට මට නැති සුබනම්‍යතාවක් ඇය ලැබුවේ කෙසේද? ඒ සුබනම්‍යතාව වෙනුවෙන් ඇය ගෙවන්නේ අනම්‍ය මිලක් නොවේද?

මම නිකම් සිටින මිනිසෙක් වෙමි. ඒ නිසා මා ගෙවන සෑම මිලක් තුළම වටිනාකමක් සෙවීම ඉතා පහසුය.

දෙපා යට රහසක්

එය ගොළුවිජේ පවා ගොළුවෙකුටත් වඩා නිහඬව ගිය කාලයක් විය.

සති දෙකක් පමණ යන විට නගරය නිවී ගිය බව ඇත්තය. පුත්තලම් හන්දියේ වීටීඑස් සුරුට්ටු කඩේ ගින්නේ දැවුණේ නගරය නම් යක්ෂයා විශාල සුරුට්ටුවක් බොන දුම ඈතට පතුරුවා හරිමිනි. සුරුට්ටු නොබොන මිනිස්සුද සුරුට්ටු පෙට්ටි උස්සාගෙන ගියහ. ජෝනි ප්‍රනාන්දු අරක්කු බාර් එකෙන් බිත්තියකින් වෙන්වුණු වීරබාහු කඩේ බඩු එළියට ඇද ඇද සම්බෝධිරාජයාට පෙනෙන මානයේ පාරේ ගොඩගසා ගිනි තැබිණ. කඩේ දෙවැනි තට්ටුවට නැග්ග මැරයන් ජනෙල්වලින් එළියට විසි කළ මදනමෝදක ඒවා මොනවාදැයි නොදන්නා අය පවා අහුලාගෙන කෑහ. ජාත්‍යාලයේ මදන මත ඇවිස්සුණු ඔවුහු තවත් මොනවා හෝ අහුලාගෙන ගියහ. වීරබාහු මුදලාලි නැවත නොනැගිටින බව සිංහල මෙන්ම මුස්ලිම් ව්‍යාපාරිකයන්ද කල්පනා කළේ මෝදක කෑවාක් වැනි සැහැල්ලුවකිනි. වැල්ලව වැනි නගරයෙන් ඈත පිටිසර ප්‍රදේශවල විසූ දුප්පත් දෙමළ පවුල් කීපයකටද හිංසා කෙරිණ. කුලියාපිටිය පැත්තෙන් දරුණු තොරතුරු වාර්තා විය. කොළඹ සිදු වූ දේට සාපේක්ෂව ප්‍රමාණයෙන් සුළු වුවත් සිදු වූ සිදුවීම් නගරයේ හෘදය සාක්ෂිය මත බරක්ද, වේදනාවක්ද, ජයෝන්මාදයක්ද එකවර ඇති කළේය. එකම සිත තුළ මේ හැඟීම් සියල්ල එකවර පැවතිණ.

සේදරමන් මුදලාලි සිටියේ මළගිය ප්‍රාණකාරයකු සේය. ඔහුට අයිති නැති ජීවිතයක් ජීවත්වන්නාක් මෙනි. ඔහු ගොළු භාෂාවෙන් පවා කතා නොකලේය. ගොළුවිජේට ගොළුකමට අමතරව අංශභාගයද වැළඳුණාක් සේය. කුස්සියේ කියන තරමට වැඩක් නොවීය. ශ්‍රීරාම් හෝටලේ ඇතුලෙන් දවස් දෙක තුනක්ම පොඩි දුමක් ආවත් කඩේ ගිනි ගත්තේ නැත. එහි වීදුරු නාමපුවරුවට ගල් පහරවල්ද ගොම පහරවල්ද වැදී තිබිණ.

නගරයේ කලබල පැතිරෙද්දී වීරෝදාර බවක සෝභාවක් පැතිර තිබුණද අළු සහ දුම් ඉතිරි වූ පසු දැකිය හැක්කේ තුෂ්ණීම්භූත බවකි. තමන්ගේම අභ්‍යන්තරික යක්ෂයන්ට බිය වී සිටින්නාක් මෙනි. තේ බොන්නට ආ මිනිසුන්ද ගොළුවන් මෙන් තේ බිව්වේ දෙමළ කඩේකින් රේඩියෝ එකක්, ෆෑන් එකක්, කළුසුදු රූපවාහිනියක් උස්සාගෙන යාම ගැන වරදකාරී හැඟීමෙන් හෝ එසේ කරගන්නට නොහැකි වීම ගැන පසුතැවිල්ලෙන් හෝ අන්දමන්ද වූවාක් මෙනි. විටෙක කඩේට එන මුදලාලි අඳුනන කෙනෙක් "තව ඉන්නව වැඩේ දෙන්ඩෝනෙ උන්" වැනි යමක් කියයි. මුදලාලි ගොළුවතින් හිඳියි.

තත්ත්වය එලෙස පැවැතියේ සතියක් හමාරක් පමණි. ගොළුවිජේද අපේක්ෂාවෙන් සිටි දවස ආවේය.

උඩුමහලේ සාදයක් සූදානම් විය.

බයිට් එකට නියෝගය ලැබුණේ මුදලාලිගේ හිස වැනීමෙනි. එදා ඉතිරිව තිබුණු පීකුදු දීසි දෙක තුනක් එකට එක්කර බොම්බයි ලූනු සහ මාළු මිරිස් යහමින් දමා ඩෙවල් කලේය. කටට කෙළ එන සුවඳක් දීසියට පෙර උඩුමහලට යැවීම ඔහුගේ අපේක්ෂාව විය.

ගොළුවිජේ බයිට් එකද සෝඩා බෝතලයක්ද රැගෙන උඩුමහළට ගියේ පඩියෙන් පඩිය යන බව තමන්ටම දැනෙන සේ අඩිය තබමිනි.

"කෙල්ලො දෙන්නව බලගල්ල වලව්වට යවල තියෙනවා කලින්ම. කඩේ උන්න කිව්වට ඉදල නෑ." උස මහත තැනැත්තා කියමින් උන්නේය.

"ජාතියක් ජම්මයක් නැති එවුන්."

"බලගල්ල ගෙදර සොල්දරේ හිටං උන්නලු දෙමළු. බත් හැළි ගණන් උය උය දීල තියෙන්නෙ. අර රට ඉඳල ඇවිල්ල ඉන්නවනෙ 'නිකං නිලමෙ' කෙනෙක්. කෙළින්ඩ තියෙන්නෙ ඔය වලව්වෙ තියෙනවා කියන රත්තරන් කඩු. නිදන් වඳුලු අරව මේවටත් එක්ක."

සේදරමන් මුදලාලි තවම ගොළුවත බින්දේ නැත.

"මූ නෙමේනෙ ගොළුව මුදලාලිනෙ." එකෙක් කීවේය.

ඔහු ගොළුවිජේට තට්ටුවක් දමා ගොළු බසින් කුමක්දෝ කියන්නට තැත් කළේය. ගොළුවිජේට එය තේරුණේ නැත. එය හාස්‍යජනක දර්ශනයක් වුවද ඔහු සිනානොසුණේය.

"බැදපු බීෆ්" ඒ හාදයා සිංහලෙන් මුදලාලිට කීවේය.

"පුරුදු වෙන්ඩත්තෙක්ක මහත්තයම කියන්ඩ." මුදලාලි වීදුරුවෙන් උගුරක් බී කීවේය. ඒ මහත්තයා නැවත රූකඩ නැටුම පටන් ගත්තේය. ඔහු බදින හැටි රඟපා පෙන්වා "බීෆ් බීෆ්" ගෑවේය. ඔහුට එය එපා වූ පසු මුදලාලි ඇඟිලි දෙකකින් දෙක පෙන්නුවේය. පහළට ගිය ගොළුවිජේ උඩතට්ටුව සුවඳ ගැන්වෙන සේ තාච්චියෙන් රසදුම් නංවා බැදපු හරක් මස් දීසියක් රැගෙන උඩට ආවේය.

"කොහොමද මුදලාලි මේක මෙච්චර ඉක්මනට කිව්වෙ." මහත්තයා ඇසුවේය.

සේදරමන් මුදලාලි සිනාසී නිහඬ විය. හෝටලයේ එක එක දිසි වර්ගවලට අංක යොදා තිබෙන්නේ විශේෂයෙන් ගොළුවිජේ නිසාය. දෙක බැදපු බීෆ්ය.

ගොළුවිජේ මඳ සිනාවක් පාමින් පහළට බැස්සේය.

"පොත්වලට සල්ලි දාන්ඩ බෑ දැම්ම. බලගල්ලයලට ශ්‍රීරාම්ල කියල තිබුණොත් සල්ලි ගැන. උන් බැංකුවලට කියයි. ඔවුන්ගෙ ඉන්නවනෙ ඩීඅයිජී කෙනෙක් එහෙමත්. පීසීලට හුජ්ජ යනවා

ඩීඅයිජී බලගල්ල ඇත එනවා දකිනකොට." උසමහත තැනැත්තා කීවේය.

ගොළුවිජේ ඉක්මනට ඇඟපත සෝදාගෙන උඩුමහලේ කාමරයට ගියේය.

"තමුසෙ ළඟ බඩු තියෙනවනෙ. පරිස්සමට." උස මහත මහත්තයා ඇසුවේය. මේ හිටපු කෝකියා වූ ආදරණීය සිරි අය්යා නිසා මුදලාලි සමඟ යාළු වූ සාජන් වීම දෛවයේ සරදමක් සේ ගොළුවිජේට දැනිණ.

"නැතුව සාජන් මහත්තයා. මගෙ කකුල යට තියෙනෙකේ ආයෙ මොනවද ඇර ඇර බලන්නෙ." මුදලාලි සෙමින් කිව්වේය.

"ඒ දවල්ටනෙ ඕයි. තමුසෙ කකුල් මෙහෙ තියලද ගෙදර යන්නෙ?" සාජන් කීවේ තරහින් මෙනි. එය බොරු තරහක් බව ස්වරයෙන් කියවිණ.

"හරි හරි" මුදලාලි ඔහු නිහඬ කළේය.

"බලන්ඩ වෙයිද?" එසේ කිව්වේ බැදපු හරක්මස් කටින් ගත් මිනිසා නිසා එය ඇසුණේ "හලන්ද බෙයිද" කියන්නාක් මෙනි.

"ඇද ඇද බලන්ඩ ඕනයෑ ආයෙ" මුදලාලි මිමිනීය. "පොලිස් බල්ලො ආවොත්නං ඇදල බලයි." ඔහු කීවේය.

"පොලීසිය නැතුව බල්ලො විතරක් එන්නෑ ඕයි" සාජන් කීවේය. ඒ වන විටත් හරක් මස් කෑල්ල හපා අවසන් වූ මිනිසා හයියෙන් සිනාසුණේය.

ඔවුන්ගේ සංවාදය කෙටි වුවත් ඔවුහු මධ්‍යම රාත්‍රිය වන තෙක් බිව්වහ. පිටත්ව යන මොහොතේ පඩිපෙළට අඩියක් තැබූ මුදලාලි ගොළුවිජේගේ කාමරය වෙත ගොස් එහි දොරට කන තබා සවන් දුන්නේය. යාන්තමට ගෙරවිල්ල ඇසිණ. ඔහු දොර ඇරියේය.

මඳ වේලාවකට පසුව ගොළුවිජේ ඇස් ඇර බලන විට දේවතාරූප ඉදිරියේ අලුත් හඳුන්කූරක් පත්තු වී තිබිණ.

ප්‍රේමවන්ති

සති කීපයක් මා ගත කළේ නම් කළ නොහැකි නොඉවසිල්ලකිනි. එය හුරුපුරුදු ජීවිතය පවා නුපුරුදු කළ නොඉවසිල්ලකි. එක් හවසක මා ගොල්ෆ් වටයක් සෙල්ලම් කරමින් සිටියේ ඒ නොඉවසිල්ලද පරාජය කරන අදහසිනි. වැරැදි අදහස් මාලාවකට කටහඬ දීමෙන් මා කර ඇති නොසැලකිල්ල ගැන නොඉවසිල්ලකි ඒ.

එය ඉඩෝර කාලයක් විය. ඉඩම පුරාවට පොම්ප කරන්නට ළිඳේ වතුර තිබුණද ගොල්ෆ් කප් අසල කුඩා කවයක පමණක් තණ තිල්ලට වතුර දමන මෙන් මා උපදෙස් දී තිබිණ. නල ජලය නොලැබෙන ගෙවල් කීපයක් අපේ වත්ත පහළ ළිඳෙන් වතුර වතුර ගත් බැවිනි. ඔවුන්ට බොන්නට ජලය නැති කලෙක ගොල්ෆ් පිටියක් නඩත්තු කරන්නට වතුර ඉසින්නට මට සිතුණේ නැත. බොන්නට වතුර ගන්නට එන අයට පැමිණීමට වත්තේ එක් කෙළවරක වූ පොල් ලොරි එන ගේට්ටුව විවෘත කර තිබිණි.

මා වත්තේ ඈත කෙළවරේ අටවෙනි කප් එක කලාපයේ සෙල්ලම් කරමින් සිටිද්දී ලොරි එන ගේට්ටුවෙන් කාර් එකක් ඇතුළු විය. ගේට්ටුවෙන් මඳක් ඇතුළට ආ ඉන් බැස්සේ රාධාය. ඇය හැඳ සිටියේ කලින් දැන සිටි රාධා හඳින ඇඳුම්ය. ඇය ඉදිකොළ තොප්පියක්ද පැලඳ සිටියේ මා සමග සෙල්ලම් කරන්නට කලින් සිටම සූදානම්ව ආවාක් මෙනි. අර පාසැල් උත්සවයෙන්

පසු අප දෙදෙනා එක් වරක් යන්තම් මුණ ගැසුණද වැඩිමනත් කතාබහකට වෙලාවක් නොවීය. අප දුරකථනයෙන් කතා කළේද භාෂා පාසැල ගැන යම් යම් දේ පමණි. ඇය මා දෙසට ඇවිද එන විට ඇගේ සැහැල්ලු ස්ලැක්ස් කලිසම සුළඟේ සෙලවිණ. එක්තරා චිත්‍රපටයක තරුණ ඩයෑන් කීටන් හැඳ සිටි ආකාරය මට සිහි විය. මගේ සිතට වද දෙන දෙයක් ඇය හා කතා කරන්නට ඇති නිසා ඇගේ මේ පැමිණීම මගේ සතුටට හේතු විය.

“නොදැක්ක වගේ ඉන්න ඕනෙ නෑ බන්දු මං දැක්ක ඔයා දැක්ක කියලා.” රාධා ඈත සිටම ඉංග්‍රීසියෙන් කීවාය. ඇගේ කටහඬේ වූයේ පැරණි රාධාගේ සැහැල්ලුවේ හඬයි. එය සැබවින්ම අද්විතීය කටහඬකි. එය උගුරෙන් පමණක් එන බෙලෙක් හඬක් නොවේ ,උදරය දෙසින් උපත ලබා පියවුරුද හදවතද පසුකර එන කටහඬකි. ඇය අසලටම එනතුරු මම ආපසු නොහැරුණෙමි. මා මගේ හිතුවක්කාර කාලය ගෙන ඈ දෙසට හැරෙන විට ඇගේ මිත්‍රත්වයේ දෑත විවරව තිබිණි.

“මං වාද කෙරුව නම් සොරි.” ඇය මගේ කනට කොඳුරා මෙන් කීවාය.

“මිනිස්සු වාද නොකරනව නම් තමයි සොරි වෙන්න ඕනෙ.” මම කීවෙමි.

අලුත ආදරය විඳින නව යෞවනියකගේ මුහුණක් වැනි ඇගේ මුහුණේ සෑම කුඩා මස් පිඩුවක්ම ප්‍රීතියෙන් ඉපිළ ඇති බව ආදරවන්තයකු දකින තරම් සමීපව දකින්නට ලැබුණේ ඈ මා වැලඳගෙන සෑහෙන වෙලාවක් උන් නිසාය. මා තුළට අමුතු උණුසුමක් පැන නැංගේය.

අපි දසවෙනි කප් එක ළඟට ඇවිදින්නට වීමු. මගේ අතින් ගොල්ෆ් පිට්ටනිය සෑහෙන තරම් කාලයක් නොසලකා හරිනු ලැබ තිබුණ නිසා තැනින් තැන තුත්තිරි වැවී ඇත.

“කලිසම උස්සගන්න. තුත්තිරි.” මම ඇයට කීවෙමි. ඇගේ කපු කලිසම තුත්තිරිවලට ආරාධනා කරනසුලුය.

"ඒක හරි. වීවී අහයි කොහෙන්ද තුත්තිරි කියලා. දන්නෑ මං මෙහෙ කියලා."

"ඔයාගෙ කලිසමේ තුත්තිරි ගැනත් එයාට කියන්න ඕනෙද?"යි අසන්නට මට සිතුණද එය මගේ මිතුරියගේ ජීවිතය වෙත වාග්මය හිංසනයක් එල්ල කිරීමකි.

"ආ - මේක කප් එකට පට් කරන්න." බෝලය වැටී ඇති තැනට ආ මම ඇයට පටර් එක දුන්නෙමි. "දනිස්වලින් ටිකක් නැමිල වම් උරහිසට උඩින් බලන්න." මම ඈත සිට කිව්වෙමි. ඇගේ සිරුර අල්ලා ඇයට උපදෙස් දෙන්නට තරම් ඈ අසලට නොයා මම කප් එක ඇති තැනට ගියෙමි.

ඇය එල්ල කළ පහරෙන් බෝලය පෙරළී ගොස් වැටුණේ නිදිකුම්බා පඳුරකුත් ඇති සිහින් අගලකටය. "සොරි" ඇය කීවාය.

මම විපර් එක ගෙන අගලට බැස්සෙමි.

"බන්දු. මම කියපු එක ඇත්ත වීවී කැමතියි දේශපාලනේට එන්න."

මම කප් එක ඇති තැනට අගලේ සිට එල්ලය ගන්නට බැලුවෙමි. වීවීගේ දේශපාලනාගමනය ගැන රාධා මට දුරකථනයෙන් කී විට මා තුළ ඇති වූ නොසන්සුන් හැඟීම මතුවෙන විට මම බෝලය සහ කප් එක වෙත අවධානය කේන්ද්‍රගත කළෙමි. මේ මගේ භාවනාවයි. මම අගලේ සිට චිප් පහර එල්ල කළෙමි. බෝලය කප් එක පසු කර මඳ දුරක් ගොස් ආපසු හැරී කප් එක තුළට නොපෙනී ගියේය.

"එව්. වූනමන්ට් එකකට ගැහුවනං සල්ලි තමයි." රාධා කීවාය.

රාධා 'සල්ලි'ගැන කතා කළේ ඉතා කලාතුරකින් නිසා ඈ කී දේ මගේ කකුලේ ඇනුණ පුංචි නිදිකුම්බා කටුවක් සේ විය.

"සල්ලි දිනන්න අනික් අය පරද්දන්න ඕනෙ. මං ඒකට කැමති නෑ."

"සල්ලි නැතුව වෙන දෙයක් දිනන්න උනත්?" ඇය ඇසුවේ සිංහලෙනි.

"ඔව්." මම ස්ථිරව කිව්වෙමි.

"මෝඩ පිරිමියෙක්." ඇය ඉංග්‍රීසියෙන් කීවාය.

අපි නිහඬව ආපසු ඇවිදින්නට වීමු.

"බන්දු - මට ගෙවල් පැත්තෙ යන්න බෑ. ඔයාගෙ සේන කොල්ලා එෆ්.බී.අයි.කාරයෙක් වගේ බලන් ඉන්නෙ. මං පිටිපස්සෙන් ආවෙ ඒකයි. වීවීත් මිනිහට කැමති නෑ." වීවී සේනට අකැමැති බව මටද වැටහී ගොස් ඇත. "බන්දු සර්ගෙ සේන කොල්ලා" යයි කීම මිතුරු කියුමක් නොවේ.

මම නැවතුණෙමි. සන්ධ්‍යාව සීතලක් රැගෙන පොල් රුප්පාවට පහත් වෙයි. වී අකුරේ හැඬේට සංවිධානය වී කොක් රැනක් පියාඹා යයි.

අපි පෙරළුණ පොල් ගසක කඳ මත හිඳගතිමු. පෙරළුණු ගස හරි මැදින් පස් ගොඩැල්ලකට හිර වී ඇති නිසා අප හිඳගත් විට පොල් කඳ පැද්දිනි.

"වීවී කියන්නෙ පුදුම පිරිමියෙක්. පුදුම සැලැස්මවල් තියෙන්නෙ. දේශපාලනේට එන එක නවත්තන්න බෑ. ඔයා කියන එක ඇත්ත. ඔයා වගේ ගහෙන් පොල් වැටෙනකල් බලන් ඉන්න පුළුවන් කෙනෙක් නෙමේනෙ එයා. එයා අරගල කරන්න ඕනෙ මිනිහෙක්. " ඇය කතා කරගෙන ගියේ ඇයට ලැබී ඇති කාලය ඉතා සීමිත වූවාක් මෙනි. හදිසි රහස් පණිවිඩයක් මට දී වහා යන්නට ආවාක් මෙනි.

"ඔයා කියන එක හරි. වීවීගෙ ඔළුවෙ තියෙන්නෙ අතීතෙ තමයි මාර කියන එක. කැම්පස් එකක ලෙක්චරර් කෙනෙක් මෙහෙ එනවා ටියුෂන් කරන්ඩ. මිනිහ වීවීට සෙට්වෙලා උපදේශකයා විදියට. වීවීගෙ අතීතකාමෙටමයි මිනිහ පෝර දාන්නෙත්. 14 වැනි ශතවර්ෂෙලු කුරුණෑගල හොඳම. පුදුම අවිශ්වාසයක් තියෙන්නෙ අනාගතේ ගැන. ලෝකෙ තියෙන හොඳම පොතත් ඒ කාලෙලු ලියුවෙ."

ඒ අදහසුත් ඇය ඒවා කියන ආකාරයත් මගේ සිනහවට හේතු විය. එහෙත් මා සිනාහොවී සිටියේ ඇගේ මුහුණේ වූ තැති ගැන්ම නිසාය. ඉතා නිවැරැදි ආකාරයට ඉංග්‍රීසි කතා කරන හැටි උගන්වන්නටත්, කුරුණෑගල ළමයින් සමග ශේක්ෂ්පියර් නාට්‍ය අධ්‍යක්ෂණය කරන්නටත් ආ ඇය තුළ සිදු වී ඇති විපර්යාසය කුමක්ද?

"ලෝකෙ තියෙන හොඳම පොත?"

"ඔව්. ජාතක කතා පොත. අර ලෙක්චරර් හාදයා සිවුරු ඇරපු එක්කෙනෙක්. අරව කියනවා බර කර කර. මිනිහ ඒකෙ කතා කියනකොට මටත් හිතෙනවා ඒක හොඳම එක්ක වෙන්න ඇති කියලා."

"එහෙම කියන්ඩ මිනිහා භාෂා පන්සීයකින් පොත් මිලියන දෙකක්වත් කියවන්ඩ ඕනැනෙ. අනික ලෝකෙ හොඳම පොත කියල එකක් නැනෙ රාධා. ශේක්ෂ්පියර් ඩ්‍රාමා උගන්නන්න මෙහෙ ආපු ඔයා මොනවද මේ කියන්නෙ? ශේක්ස්පියර්ටවත් කියන්න පුළුවන්ද හොඳම පොත ලිව්ව කියලා. මහාභාරත, රාමායණ, භගවත් ගීතා, ටොල්ස්ටෝයි, ගෙංජි, මිලින්ද ප්‍රශ්නෙ, ධම්මපද, දොන් කිහෝතෙ, ඇරේබියන් නයිට්ස්... කෙළවරක් තියෙනවද හොඳ පොත්වල?"

"ඔය ලිස්ට් එක මට කියන්න එපා. ඒවා දන්නෙ අපිනෙ. බලන්න සිංහල පත්තර. ටෙලිවිෂන් අරව මේවා. ඒවගෙ කියන්නෙම ලෝකෙ තියෙන හොඳම දේවල් තියෙන්නෙම මෙහෙ කියලා. අර පොත එකක් විතරයි. හොඳම මිනිස්සු ඉන්නෙ මෙහෙ. හොඳටම දෙමවුපියන්ට සලකන්නෙත් මෙහෙ. තව ශතවර්ෂ පහක් විතර ආපස්සට යන්න පුළුවන්නම් මීටත් වඩා හොඳයි." රාධා කියාගෙන යයි.

"මං ඒව බලන්නෙ නැනෙ."

"මං බැලුවෙත් නෑ. මෙතෙන්ට ඇදගෙන වැටෙන කල්. ඔයා ඔයාගෙම ලෝකයක් හදාගෙන ඉඳල බෑ. ඇස් ඇරල බලන්න. නැත්තං මේ සමාජෙ ඔයා පහුකරල යනවා."

"ඉස්සරහටද පස්සටද?" මම ඇසීමි.

"කොයි පැත්තට ගියත් ඔයා තනිවෙනවා. අනික මේ සමාජෙ දෙපැත්තටම එකපාර යනවා." ඇය සිනාසුණාය.

රාධා සහ මා අතර ඇති වූ පැරණි සංවාදවල තේමාද ස්වරයද උණුසුමද මට සිහි විය.

"වීවීගෙ කටට ශබ්දෙ විතරක් දීල ඔයාට මග අරින්න බෑ හිතට අදහස් දාන් නැතුව." ඇය කතා කරන්නේ එලකියුෂන් ගුරුවරියගේ ඉංග්‍රීසිවලින් නිසා පෙරලුණු පොල් ගසක් උඩ ශේක්ෂ්පියර් නිළියක් වාඩි වී සිටින්නාක් සේ විය.

"ඇයි ඔයාට බැරි එයාගෙ අදහස්වලට අභියෝග කරන්න?"

"මට ඒක කරන්න බෑ."

"ඇයි?"

"එකක් ඔයාට මේකෙන් මග අරින්න බෑ. ඔයයි මාව මෙතෙන්ට තල්ලු කෙරුවෙ. අනික ගෑනුන්ට අදහස් හිතන්න පුළුවන් කියලා වීවී හිතන්නෙ නෑ. ගෑනුන්ට පුළුවන් එයාලට කවුරු හරි පිරිමියෙක් බාරදුන්න පොඩි පොඩි වැඩ හරියට කරන්න කියල විතරයි එයා හිතන්නෙ. අනික එයා ඉන්නෙ ආවේශෙකට අහුවෙලා වගේ. බෝධි පූජා කැසට් ගහන හාමුදුරු කෙනෙකුත් අල්ලගෙන ඉන්නෙ. පුදුම ජාතිවාදියෙක් උන්නාන්සෙ. හැබැයි තවම වීවී ජාතිවාදියෙක් නම් නෙමේ. ඔයා අසූ තුනේදී දෙමළ මිනිස්සු බේරපු හැටිත් මතක් කෙරුවා මේ ළඟදි. ඔයා කියන දේවල් එයා අහනව."

ඇය පොල් කඳේ හිඳ සිටි තැනින් නැගිට මා අසලින් හිඳගත්තාය. කඳෙහි එක් තැනක් පමණක් පොඩි කඳු ගැටයකට හිර වී තිබුණු බැවින් පොල් කඳ පැද්දිණ.

"අනික බන්දු - අයි ලව් හිම්."

මා තුළ ඇති වූ තිගැස්මට පොල් කඳද පැද්දිණ.

"මං ආදරේ මිනිස්සුන්ට වඩා මට ආදරේ කරන මිනිස්සු හැමදාම ඉස්සර වෙනවා. මිනිහ මට අවංකවම ආදරෙයි. ඒක භක්තියක් වගේ ආදරයක්. තාමත් මට කියන්නෙ ටීචර්." ඇය බිම බලාගෙන සිනාසුණාය. එය පූර්ණ ආත්ම තෘප්තියක් දෙතොලෙහි ප්‍රදර්ශනය කරන මඳසිනාවකි.

"පුළුවන්නම් මට එයා හිතන විදිය වෙනස් කරල දෙන්න. ඔයා කියන එකක් එයා අහනවා." ඇය කතා කරන්නේ හිතුවක්කාර දරුවෙකු කීකරු කර දෙන්නැයි ඉල්ලන මවකගේ ස්වරයෙනි.

"මං කියන එක අහනව?"

"ඔව්. ඔයා හිතන විදියට එයත් හිතුවොත් එයාගෙ හිතෙත් මුලින්ම නැති වෙන්නෙ මට තියෙන ආදරේ වෙන්න පුළුවන්." රාධා කීවේ පුහුණු එලකියුෂන් ගුරුවරියකගේ හඬින් වුවත් කන්කෙඳිරි ගාන ගැහැනියක මෙනි. එය බාල චිත්‍රපටියක දර්ශනයක් සේ විය. ඇගේ පැවැත්මේ කේන්ද්‍රය වෙත අතිශය අතාර්කික ආදරයක ප්‍රහාරය කඩා වැදී ඇති බව මට ඒත්තු ගියේය. ආදරය යනු තර්කයේ ඝන බිත්ති දෙදරවා ගලා විත් චණ්ඩ දිය සුළියකට අප හසු කර වියරු ආනන්දයක් ඇති කරන දෙයක් බව මම දනිමි.

"ඔයා මේ වගේ දේවල් එයා එක්ක කතා කරන්න මිනිහට ආදරේ නම්." මම අභියෝගාත්මකව කිව්වෙමි.

"ආදරේ භාෂාවයි තර්කයේ භාෂාවයි කියන්නෙ දෙකක්." ඈ කීවාය.

"මම ඒක විශ්වාස කරන්නෑ. සමහර වෙලාවට ආදරේ තරම් තාර්කික දෙයක් ඇත්තෙම නෑ."

"මම දන්නවා." ඇය කීවාය. "මං කියන්නෙ මෙයා සම්බන්ධයෙන්. හෙට උදේ නැගිටල මොකක් කියයිද කියල කියන්න බෑ. පටන්ගත්තු වාක්කියක් කොහොම ඉවර කරයිද කියන්න බෑ. ඒකයි මං මිනිහට ආදරේ."

මගේ අත යන්තමට මිරිකූ ඇය පොල් කඳෙන් නැගිට යන්නට පියවරක් තබා යළිත් ආපසු හැරුණාය.

"දන්නෙ ඔයා විතරයි. ඔයා දන්නව කියල දන්නෙ මං විතරයි."

මම හිස වැනුවෙමි.

"විනීතා?"

"එයා අහිංසකයි. එයාට තේරුම්ගන්න පුළුවන් කතා කරන්න බැරි විජේ කෙනෙක්ව විතරයි. කතා කරන විජේව තේරෙන්නෙම නෑ. පව්."

"ඔයාට විතරයි මිනිහව තේරෙන්නෙ කියලා විනීතා දන්නවද?" මම ඇසීමි.

"ඔයා යාළුවෙක්ද? ලෝයර් කෙනෙක්ද?" ඇසූ ඇය "මොනවද මේ අහන්නෙ" යි කියන්නාක් මෙන් දෑත ඔසවා මා දෙස බලා යන්නට හැරුණාය. "ෆ්‍රෙන්ඩ්ස් ආ ජස්ට් ලෝයල් නොට් ලෝයර්ස් - ඕකේ."

ඇය පිට වී ගොස් බොහෝ වෙලාවකට පසු පොල් කඳට හේත්තු කර තිබූ ගොල්ෆ් බෑග් එකෙන් ඩ්‍රයිවර් එක ගෙන බෝල සියල්ල බිම දමා හැරෙන හැරෙන අතට ඒවා එල්ල කළෙමි. දවස ආරම්භයේදී මා සිටි නොඉවසිල්ල නොඉවසිල්ලේ දියසුළියක් බවට එවේලේ පත් විය. ආදරය කෙසේ වෙතත් මිත්‍රත්වය නම් අතාර්කික දියසුළියක්ම මිස අන් යමක් නොවේ යැයි මම සිතුවෙමි.

දඩයක්කාරකම්

මා ගත කලේ කඩින්කඩ නිදි බිඳෙන රාත්‍රියකි. සාමාන්‍ය ප්‍රමාණය ඉක්මවා විස්කි බිව්වද නින්දට උදව්වක් නොවීය. ඇඳට යාමට පෙර රාධාගේ සෙලියුලර් දුරකථනයට කෝල් කළද ඇය සම්බන්ධ කරගත නොහැකි විය. 83 ජූලි කලබල කාලයේ සිට වීවී මා ගැන දැන සිටීම මගේ කුතුහලය අවුස්සන්නක්ද ඔහුගේ ජීවිතය සමග මගේ සම්බන්ධය වෙත අනපේක්ෂිත ඉතිහාසයක් ලබා දෙන අහම්බයක්ද විය. දොස්තර සමරසේකර ඔහුගේ රෝහලේ හිමිකරු ගැන මුලින්ම කියන තෙක් මා දැන සිටියේ ගොළුවිපේ නමින් මුදලාලි කෙනෙකු කුරුණෑගල ඉන්නා බව පමණි. නගරයේ ව්‍යාපාරික ලෝකයෙන් ඈත්ව මගේම කාල චක්‍රයක්ද සංසාර වළල්ලක්ද සාදාගෙන සිටි මට කතා කරන්නට බැරි මුදලාලි කෙනෙකු ගැන උනන්දු වන්නට අවස්ථාවක් නොවීය.

පසුගිය වසර කිහිපය තුළ බුද්ධිමය වශයෙන්ද කලාත්මක වශයෙන්ද වියළි නගරයකට තෙතමනයක් ගෙනා මගේ මිතුරිය නුගත්, විවාහක ව්‍යාපාරිකයකුගේ පෙම්වතිය වීමට වඩා මගේ නොසන්සුන්තාවට හේතු වූයේ අවුරුදු විස්සක තරම් කාලයක් වීවී මා ගැන උනන්දුවෙන් සිටියේය යන කාරණයයි. ඔහු මා ගැන උනන්දුවෙන් සිටියේ යැයි ඇය නොකීවත් ඈ කී දේ මට තේරුණේ එසේය. නුවර ප්‍රභූ පවුලක ඉපිද, කොළඹ ඉහළ මධ්‍යම පාන්තික පාසැලක උගෙන, පිටිසරින් කොළඹ ආ පිරිමින් කිහිප

දෙනෙකුගේ සටකපටකම් නැති පෙම්වතිය වූ රාධා රත්දෙණිය මීට කලින් ආදරය කළ පිරිමින් දෙදෙනකු ගැන මම දනිමි. ආත්ම ධෛර්යෙන් සාර්ථකත්වය සොයා යන පිරිමින්ට ඇය කැමැත්තක් දක්වයි. ඇගේ ඉංග්‍රීසි දැනුමටද, සමාජ ආචාරවිධිවලටද, සංස්කෘතික විඥානයටද ආසා කළ පිරිමින්ට ඇය කැමතිය. මීට කලින් ඇය ආදරය කළ සිනමා නළුවා ඇගේ ආදරය ඉල්ලුවේ ඈ දෙපාමුල වැඳ වැටී යැයි ඈ මට කීවාය. ඊට කලින් ඇයට ආදරය කළ අනුරාධපුරයෙන් කොළඹ ආ විශ්වවිද්‍යාල ශිෂ්‍යයා කථිකාචාර්යවරයකු වී ඕස්ට්‍රේලියාව බලා ගියේය. ඔහු සිය නිවසේ නවත්වාගෙන අවුරුදු දෙකක් ඉංග්‍රීසි පමණක්ම කතා කරමින් ඔහුගේ භාෂා දැනුම දියුණු කළේ ඇයයි.

එහෙත්, රාධා ඒ පිරිමින් දෙදෙනා ගැනම වීවී ගැන කතා කළ තරම් හැඟීම්බරව කවදාවත් කතා කර නැත.

* * *

හිත් කරදයෙන්ද සැපක් නොවූ නින්දෙන්ද අවදිව මා යන තැනක මා කැඳවාගෙන යන්නට ඉබාගාතයාට මම ඉඩ දුනිමි. ඉබාගාතය යනු අවතාරයක් වැනි සතෙකි. කාලෙකින් නොහැඳි සැහැල්ලු දුඹුරුපාට බතික් කමිසයක් හැඳගත් මම මගේ මිනිකූපරයට නැගුණෙමි. මිනිකූපරයේදී මට අමුතු පිරිමිකමක් දැනේ. ඒ කුඩා කාරය නමැති ක්ෂුද්‍ර ලෝකය සම්පූර්ණයෙන් පාලනය කරන අගරජු මාය වැනි හැඟීමකි ඒ. මට ඊට වඩා ලොකු ලෝකයක අගරජු වීමට අවශ්‍ය නැත.

කුරුණෑගල නගරය පසු කර කොළඹ දෙසට ඇදීගොස් පොල්ගහලවෙල අර පාසැල ඉදිරි පිට කාර් එක නවත්වා බලාගෙන සිටියෙමි. තරුණ අම්මලා කුඩා දරුවන් පාසැලට බාර දී කතාබහේ යෙදී සිටිති. අලුත් ආකාරවලට කොණ්ඩා සකස් කර ගත්, ඩෙනිම කලිසම් සහ ටී ෂර්ට්වලින් සැරසුණු අම්මලාද දැන් දැන් සිටිති. පැය ගණනක කාලයක් පාසැල ඉදිරි පිට ගත කරන්නට සිදු වී

ඇති ඔවුන්ගේ මුහුණුවලින් පළ වන්නේ තරුණ සුන්දරත්වයෙන් මැකිය නොහැකි අපේක්ෂාභංගයකි. ඉස්කෝලයක ගේට්ටුවක් ළඟ දිවා කාලය පුරා රස්තියාදු වෙවී සිටීම ඔවුන්ගේ නව යෞවන ආදර සිහිනවල නොතිබුණු නපුරු ඉරණමක් සේ ඔවුන්ට දැනෙන බව පැහැදිලිය. ඒ නිසා දවසක් දෙකක් කතා කරන විට ඔවුහු ඒ නපුරු ඉරණමෙන් පලා යාමට නිර්හීත වෙති.

මගේ කුඩා කාරය ඔවුන් කිහිපදෙනෙකුගේ දෑසට හසුවී ඇති බව ඔවුන් හැරී බලන ඉරියව්වලින් මට පෙනේ. මා මෙහි පැමිණ ඇත්තේ අවුරුදු දෙකකට විතර පසුවය. මම එක් අම්මා කෙනෙකු වෙත සිනාවක් පෑවෙමි.

හමුදා කපිතාන්වරයකුගේ බිරිඳ වන ක්‍රිෂාන්තිගේ පුතා දැන් තුන වසරේ විය යුතුය. හමුදා කපිතාන් සමහර විට ජීවතුන් අතර නොසිටින්නටද ඉඩ ඇත. ක්‍රිෂාන්ති සැහැල්ලු ජීවිතයකට කැමැති සරාගී ගැහැනියකි. දරුවෙකු රැගෙන පාසැල් ගේට්ටුවක් ළඟ රස්තියාදු වෙවී සිටීම යනු ඇගේ සිහිනවල තිබූ දෙයක් නොවේ. සැණකෙළියක් සේ සරාගී සිරුරකින් යුතු ඇය හා එක දවසක කෙටි සංවාදයකින් පසු අපි ආදරෙන් වෙළුණෙමු. ඉන් පසු දින කීපයක්ම දරුවා පාසැලට දමා එතනින් නික්මී එක්තරා තැනෙකදී මගේ කාරයට නැග, මා සමග මා ඔය අද්දර රමණීය හෝටලයක පැය කීපයක් ගෙවා ආ ඇය හරි වෙලාවට පුතා පාසලෙන් ගත්තාය. මා නිසා ඇය තවත් තවත් ලස්සන වූවාය. රාධාගේද උදව් ඇතිව මා තේරූ ඇඳුම්, ආභරණ ඇයට නිර්ලෝභිව තෑගි කළෙමි. "ත්‍රීවීල් එකක් ගන්නට" මා ඇයට දුන්නේ ඇයට ආඩම්බරයෙන් හෑන්ඩ් බෑග් එකේ දමාගෙන යා හැකි තරම් මුදලකි. එහෙත් අප යා යුතු දුර දන්නා නිසා ඒ කිහිප වරින් පසු 'නිමල්' සිය මිනිකුපරයෙන් නැවත පොල්ගහවෙල පැත්තේ නොගියේය. මගේ පර්ජෝ කාර් එකෙන් කොළඹ යන ඇතැම් දවසක ක්‍රිෂාන්ති පාසැලට දරුවා දමා පාරේ යන රිය පෙළ අතර මිනිකුපරයක් දකින අපේක්ෂාවෙන් බලා සිටී ශෝකී බැල්ම මම දුටුවෙමි. එය මගේ හද දෙදරා යන දර්ශනයක් වුවත් මම යළි කිසි දාක ඈ සොයා නොගියෙමි.

දැන් මෙවර මා මෙහි ආවේ ක්‍රිෂාන්ති යළි දැකීමේ අරමුණින් වන්නට ඇත. මම එය හරියටම නොදනිමි. මා ආවේ සවිඥානකත්වය සහ අවිඥානකත්වය අතර තැනකින් ගත් තීරණයකින් මෙහෙයවනු ලැබ නිසා මට එය හරියටම කිව නොහැකිය. මේ ඉබාගාතයාට යටත් වී ආ ගමනකි. මා මා වෙතින්ම දුරස් කර බැලුවහොත් මෙමෙස් කියන්නට පුළුවන:

බන්දුල බලගල්ල මෙවර සිය කුඩා ක්‍රීඩාශීලි මිනිකුපරයට නැග්ගේ දඩයමක් කරමියි සිතමින් නොවේ. ඒ පාසැල ඉදිරිපිට විකක් ඈතට වෙන්නට පාරේ අනික් පැත්තේ මිනිකුපරය නැවැත්වූ ඔහු පාසැල් ගේට්ටුව අවටත්, අසල ඇති කඩ සමීපයේ නෙත් යැවූවේ ක්‍රිෂාන්තිගේ රුව පළමුව දැක ගනු පිණිසය. ඇය එහි නොසිටියාය. ඉක්බිති ඔහු ගේට්ටුව අසල සිටි ස්ත්‍රී සමූහය වෙත නෙත් යොමා පරීක්ෂා කළේය. නාලිනීද දරුවෙකු රැගෙන මේ පාසැල අසලට පැමිණ සිටින්නට නොහැකිදැයි ඔහුට සිතිණි.

මා වෙත පෙරළා සිනාවක් පෑ එක් රූමත් අම්මා කෙනෙක් අනික් අම්මලා කණ්ඩායමෙන් වෙන්ව මඳක් ඈතට ගියාය. නැවත හැරී මා දෙස බැලුවාය. ඈ සිනාව නිර්මාණය කර මා වෙත එව්වේ ඉතා සූක්ෂ්ම ලෙස අනෙක් අයගෙන් සඟවමින්ය යන්න පැහැදිලි නිසා ඇය මා සමග කතාවකට සූදානම් බව මම තේරුම් ගතිමි. ඇය මා දන්නා හඳුනන කෙනෙකු විය නොහැකිය. මගේම ස්වයං-සන්තෘප්ත ලෝකයක දිවි ගෙවන මා පොල්ගහවෙලට තබා කුරුණෑගල ටවුමට යන්නේද කලාතුරකිනි. ගියත් යන්නේ මා වෙතට ආකර්ෂණයක් නොඑන නිර්නාමිකත්වයේ ආවරණයකින් වැසීගෙනය. ඇය නැවත හැරී බැලූ විට මා පෑ සිනාවට ඈ දුන් පිළිතුරු සිනාවේ වූයේ "මං පැත්තකට ගිහිල්ල ඉන්නෙ පේන්නැද්ද. හිනාවෙවී වෙවී ඉන්නැතුව එන එකනෙ ඇත්තෙ." වැනි තරවටුවක අර්ථයකි.

එහෙත්, මා තුළ වැතිර සිටින දඩයක්කාරයා පණ ගැන්වී ආවේ නැත.

මට සැබැවින්ම අවශ්‍යව ඇත්තේ බුද්ධිමත් මිත්‍රත්වයක ස්ත්‍රියක බව සිතූ මම කාර් එක පණ ගැන්වීමි.

රාධා සහ ඒ තරුණ මව යන දෙදෙනාම ගැන ඉමහත් අනුකම්පාවකින් පිරුණ මගේ සිතෙන් නොඉවසිල්ල පහව ගියේය. ගැහැනියක වෙනුවෙන් මුළු ජීවිතයම කැප නොකර ගැහැනියක සමග ප්‍රීතියේ හෝරාවක් ගත කරන්නට අවැසි වූ විට මා දඩමං ඔස්සේ ගිය අන්දම දැන ඇතැම් විට කරුණාවෙන් උපකාර කළ රාධා මේ මොහොතේ මගේ රැකවරණයට ලක් විය යුතු බව මම තීරණය කළෙමි. අනික ඇය කෙදිනකවත් දඩයක්කාරියක නොවූවාය. ඇය ආදරය නම් උගුලෙහි වැටුණාය. නැතිනම් වැටුණ උගුල ආදරය යැයි නම් කළාය.

පුදුමයකට මෙන් ඉන් දෙදවසකට පසු මිනිකුපරය පදවාගෙන නුවර බලා ගියෙමි. ඒ රාධා තනිව හමුවන්නටය.

එහිදී මා හමුවන්නට ඇයට අවශ්‍ය වී තිබිණ.

දඩයම් ගමන් යන්නට වැඩි වශයෙන් භාවිත කළ කාරයක ඇ දකින්නට යාම කිසියම් අමිහිරි කිතියක් වැනි දෙයක් මා තුළ ඇති කළද දර්ශනීය තැනෙක ඇය ගොඩනගමින් සිටින ගෙය දකින්නටවත් එන්නැයි ඇය ඉල්ලා සිට තිබිණි. මා හදිසියේ කොළඹ යන බව කියා සේනට ගෙදර කටයුතු බාර දී පිටත් වුණෙමි.

රාධා ඉල්ලා සිටින ආකාරයට මා වීවීගේ අදහස් වෙත බලපෑම් කරන්නේ කෙසේද? මගේ කැමැත්තට ඔහු වෙත ගොස් ඔහුට බලපෑම් කිරීම සාධාරණද? එසේම දෙදෙනා අතර ආදර සම්බන්ධතාවට උපකාර කරන්නට යාම ආචාරධාර්මික වැරැද්දක් බව මගේ දඩයක්කාර සිතට පවා දැනෙයි. එහෙත්, මිත්‍රත්වය යනු ආචාරධාර්මික කොන්දේසි නොසලකන අධිරාජ්‍යවාදී ලක්ෂණ ඇති දරදඬු ගිවිසුමකි.

අප දෙදෙන හමු වූයේ හන්තාන කන්දේ බෑදෙහි තැනුවාක් වැනි දර්ශනීය කුඩා නිවසකය. වීවී එය ඉදිකළේ ඈ වෙනුවෙන්ම යැයි ඇය කීවාය. ඉඩම ඇය කලකට ඉහත මිලට ගත්තකි. දැන් මේ නිවස ආදරවන්තයන් දෙදෙනා ලෝකයෙන් සැඟවී හමුවන අශෝක වනය විය.

රාධා මට නිවසේ කාමරයෙන් කාමරය පෙන්නුවාය. ඔවුන්ගේ නිදන කාමරයේ අපේ තිඹිරි ගෙදර සවි කළාක් වැනි විශාල කණ්ණාඩි තුනක් බිත්ති තුනක සවි කර තිබිණි. ඒවා දුටු මා රාධා දෙස බලන විට බිම බැලූ ඇය වහා නිදන කාමරයේ දොර වැසුවාය. ඒ අසලම ඇති අනික් කාමරය මගේ විස්මයට හේතු විය. එහි පැරණි අල්මාරි කිහිපයක් පුරවා තිබුණේ ඉතා කෞතුක පෙනුමක් ඇති බඩුභාණ්ඩවලිනි. ඒවා එකතු කිරීම වීවීගේ විනෝදය බව ඈ කීවාය. කාසි, ආභරණ, ලෝහ කැබලි, භාජන ආදී ඉතා පැරණි යැයි පෙනෙන දේ එහි විය. එක් අල්මාරියක වූ පුස්කොළ පොත් කීපය මගේ සිත් ඇද ගත්තේය.

"මේ මනුස්සය මේව මොකට එකතු කරනවද මන්ද බන්දු. පිස්සුවක් වගේ. සමහර දවස්වලට ඈත පළාත්වල යනව ඔව්ව ගේන්න. වීවී ගෘහප්ස් එකට එහෙම නාස්ති කරන්න අමාරුයි. මමයි අනික් ඩිරෙක්ටර්ස්ලයි ට්‍රයි කරනව වියදම අඩුකරගන්න. මෙයා ඉඳගෙන මෙච්ච පස්සෙ යනවා."

එම කාමරය වසා යතුර අතට ගත්තාය.

කුස්සිය බලා කියා ගැනීමට සිටින මහලු කාන්තාවද නිවස බලා කියා ගැනීමට සිටින තරුණ රාධා මට හඳුන්වා දුන්නාය.

අපි උඩමහලේ ආලින්දය වෙත ගියෙමු.

"බන්දු මම මේව කියන්නෙ මිනිහෙක්ගෙ හොර ගෑනි විදියටම නෙමේ. මං තමයි මේ මිනිහව ගොඩ නැගුවෙ කියල මට හිතෙනවා - තවම මට කියන්නෙ ටීචර් - මං වැටීගෙන යන්නෙ අගාධෙකට වෙන්න පුළුවන්. මට පිස්සු නේද?"

ඇගේ චතුරභාවය සෑහෙන තරම් අඩු වී ඇති බවත් ඇය වැඩි වශයෙන් සිංහල කතා කරන බවත් මට පෙනිණ.

"මට පිස්සු නෑ කියලද ඔයා හිතන්නෙ - අපි ඔක්කොම එක එක ජාතියො පිස්සො." මා කිව්වේ ඇගේ අලුත් ජීවිතය ගැන මගේ විශේෂ අප්‍රසාදයක් නැතැයි පෙන්වන්නටය. ඉතා දැඩි පුද්ගලවාදිනියක වන ඇය මා ඇගේ ක්‍රියා ගැන කරන සදාචාර විනිශ්චයන් ගණන් නොගන්නා බවද මම දනිමි.

"මගෙ ආර්ථික ප්‍රශ්න ඔක්කොම වගේ දැන් ඉවරයි. නුගේගොඩ ගේ ඩිලන්ට දෙන්න පුළුවන්. අනික මම මේ පැටලිලා ඉන්නෙ කතන්දරයක් අහන්න තියෙන ආසාවක."

"මේ මේ ඔයා කරන එකක් කරන්න. ඔයාගෙ තෝරාගැනීම මොකක් උනත් මං ඔයාගෙ යාළුවා. නිදහසට කරුණු කියන්න එපා." ඒ සහතිකය ඇයට දීම අවශ්‍ය බව මා එන ගමනේදී තීරණය කර තිබිණ.

"නිදහසට කරුණක් නෙමේ - මං මේ කතන්දරේටත් ආසයි." රාධා කීවේ යන්තටම මුහුණ රතු වේගෙන එද්දීය.

"ඔයා කතන්දර කියන ෂෙහරසාද් කෙනෙක්ද අහන ෂෙහරසාද් කෙනෙක්ද?" මම ඇසුවෙමි.

වීවී ගෘජ්ස්හි අධ්‍යක්ෂකවරියක සේ ඇයට උඩින් සිටියේ තවත් වෛද්‍යවරුන් දෙදෙනකු පමණි. ගිණුම් කටයුතු බාර අංශයේ ප්‍රධානියා නිල වශයෙන් ඇයට උඩින් සිටියත් වීවීට ඇති සමීපකම නිසා ඇයට තිබූ බලය වැඩිය.

දොස්තර සමරසේකර සහ අනික් වෛද්‍යවරයා පරිපාලන කටයුතුවලට සහභාගි වූයේ ඉතා අඩුවෙන් නිසා රාධා ඉතා වේගයෙන් ඉහළ නැග්ගාය. අලුත් හෘදරෝග ඒකකය පිහිටුවීම පිළිබඳ සියලු විදේශීය සමාගම් සමග සන්නිවේදන කටයුතු කළේත් රාධාය. ඇය ව්‍යාපාරික රැස්වීම් මෙහෙයවූයේ වීවීට පසෙකින් හිඳගෙනය.

දේශීය හෝ විදේශීය සමාගම්වලින් එන නියෝජිතයන් සමග රැස්වීම්වලදී ඇය එලකියුෂන් ගුරුවරියකගේ විලාසයෙන් ඉංග්‍රීසි කතා කළ නිසා ඇගේ බලය තවත් වැඩිවිය.

කුරුණෑගල සොයා ගන්නටවත් නැති ඇඳුම් ඉතාම පිළිවෙළට ඇන්ද රාධා වෙත විධායක පෙනුමක් කොහොමත් තිබිණි. වීවී ගෘජ්ස්හි වැඩ කරන පිරිමි එක්ව ස්ත්‍රීන් ගැන ඕපදූප කියන අවස්ථාවල ඔවුන්ගේ වාග්මය ලිංගික ආක්‍රමණයේ වස්තුව බවට රාධා කිසිදා පත් නොවූවාය. ඇය තනිකඩ ගැහැනියකියි

යන්න ඔවුන් දැන සිටියද "ට්‍රයි කෙරුවොත් පුළුවන්" වැනි කතා ඔවුහු ඇය ගැන නොකීහ. "මට ගැනියක් විදියට මේ තරම් පිළිගැනීමක් ගැනුන්ගෙ තත්ත්වෙ ඉහළ දාන්න කතා කරන අය කෙළවරක් නැතුව ඉන්න කොළඹදිත් ලැබිලා නෑ. රස්සාවට ස්ත්‍රීවාදෙ කරන මගෙ යාළුවොත් ඉන්නවා තමන් පිරිමින්ගෙ සෙල්ලම් බඩු කියල තේරුම් ගන්න බැරි." රාධා කීවාය.

අපි රෙඩ් වයින් බොමින්, තන්දූරි චිකන් කමින් පහළින් පෙනෙන දර්ශනීය නිම්නය දෙස බලා සිටියෙමු. එදා ඇය විසින්ම අපට කෑම පිසින ලද නමුත් වීවී එහි ආ විට ඔහු සියලුම ඉවුම් පිහුම් කරන හැටි ඈ මට විස්තර කළාය. ඔහු ඉතා කුඩා හෝටලයක පිඟන් හෝදන ගොළු කොල්ලෙකු ලෙස වැඩ ආරම්භ කළ ආකාරය පිළිබඳ කතාව ඇය මට විස්තර කළාය. එය මගේද කුතුහලය අවුස්සන කතාවක් වූයේ ඇය විස්තර කළ ෂෙහරසාද් කුසලතාව නිසාය. ඇය සමග මා ගත කළ ඒ මුළු කාලය තුළම ඇය කතා කළේ ඔහුගේ ගොළු කොලු දවස් ගැන මිස ඔවුන් දෙදෙනාගේ අලුත් ජීවිතය ගැන නොවේ. ඒ නිසා ඇගේ ඒ අතීත කතාව වර්තමානය ගැන කීමෙන් මගහැර සිටීමේ උපායක් බව මට දැනිණ. එහෙත්, දැන් මේ ආඛ්‍යානය ගොඩනැගීමේදී ඔහු හිස තැබූ කොට්ටයේම හෝ ඔහුගේ පපුවේ හිස තබාගෙන ඇය අසාගත් කතන්දර මට ඉතා ප්‍රයෝජනවත් විය.

ඇය වර්තමානය ගැන කතා කළේ නම් ඒ වීවී ගෘජ්ස්හි ඇගේ කටයුතු ගැනය. රාධා සහ වීවී අතර සම්බන්ධය දේවතාවිය සහ දේවදාසයා අතර සම්බන්ධයක් සේ රාධා විස්තර කළාය. දෙදෙනා වැඩ කරන්නේ ඔවුන්ටම වෙන් වූ විශාල කාර්යාල කාමරයකය. වීදුරුවෙන් වෙන් කරන ලද ඒ කාමරය සෙසු සේවක සේවිකාවන්ගෙන් වෙනස් වන්නේ ශබ්දයෙන් පමණි. වීවීගේ සහ ඇගේ කාර්යාලයේ කොළ පාට රෙදි තිර සෑම විටෙකම ඇර තැබිය යුතුය යන්න රාධාගේ යෝජනාවකි. රාධා එහි රැඳෙන විට යම් ලිපිලේඛන කටයුතු කරන අතර දෙදෙනා යම් යම් දේ සාකච්ඡා කරන විට රාධා ගුරුවරියකගේ අංගචලනය දරන නිසා ඇතට ඇය පෙනෙන්නේ එතරම් දක්ෂ නැති ශිෂ්‍යයකුට යමක් විස්තර

කරන ඔහුගේ ගුරුවරිය මෙනි. ඒ අතරතුර ඉතා පෞද්ගලික දේද කියවෙන බව රාධා කීවාය. මේ උපායට විශේෂම හේතුව රාධා මැඩම් දෙස ඈත සිට බලා සිටීමට කාර්යාලයේ ගැහැනු පිරිමි කවුරුත් කැමැති බව වීවී ඇයට කීමය. එහෙත්, ඝන වීදුරුවෙන් වෙන් කරන ලද කාමරයේ සිට දෙදෙනා කතාබහ කරන දේ ඒ අයට නොඇසෙන නිසා තමන් සේවය කරන සමාගමේ ලොක්කා තාමත් ගොළුවෙකු සේ ඔවුන්ට දැනේ.

"රාධා ඔයාට මේ මිනිස්සු සලකන්නෙ ගෑනු කෙනෙකුට විශේෂ කරල සලකන එක එයාලගෙ සංස්කෘතියෙ කොටසක් හින්ද නෙමේ. ඔයාගෙ පන්ති පසුබිම හින්දා." මම කීවෙමි.

"වෙන්න පුළුවන්. ඒ උනාට මේ වගේ පසුබිම්වලින් ආපු පිරිමියෙක්ම නේද මට කිසිම ගෞරවයක් නැතිව සැලකුවෙ?" ඇය සිහි කරන්නේ නළුවා ඇගේ ආත්මගෞරවය කෙලෙසූ කතාවය.

"ඒ එයාට ඕනෙ කරන පන්ති ලක්ෂණ ටික අත්පත් කර ගත්තට පස්සෙ."

"අත්පත් කර ගත්ත කියල හිතුවට පස්සෙ." රාධා 'හිතුවට' යන්න අවධාරණය කර කීවේ කුරිරු බැල්මක් දර්ශනීය නිම්නය දෙස හෙළමිනි.

"උගෙ ගෙවල් අන්න අර පැත්තෙ" ඇය මහවැලි ගඟෙන් එතෙර කොළපාට ගම්මානයක් දෙසට ඇය අත දික් කළාය.

ඇය බලා සිටියේ ඒ ක්ෂුද්‍ර ගම්මානය දෙස ඉහළ සිට බලා සිටීමෙන් අපමණ ආස්වාදයක් ලබන්නියක සේය. ඇය නිවස මෙතැනම හැදුවේ ඒ නිසාදැයි අසන්නට මට සිතුණද එයින් සිදුවන්නේ ඇය රහසිගතව විඳින කුරිරු සතුටක් ඇගෙන් උදුරාගැනීම යයි මම සිතුවෙමි. ඒ උඩඟු නළුවා බිහි වූයේ ඉතා දුප්පත් පවුලකින් බව එකල ඇය මට කීවේ ඔහු ගැන පුදුමාකාර ආඩම්බරයකිනි. ඒ ආඩම්බරය අද ඇය තනිවම විඳින කුරිරු සතුටක් බවට පෙරළී ඇත.

වීවීගේ අලුත් ඔෆිස් එකේද ස්කන්ධ, සරස්වතී සහ ලක්ෂ්මී රූප එල්ලා ඇති තැනට හැමදාම හඳුන්කූරක් ද පිච්චමල් අහුරක්ද පූජා කරන බව රාධා කීවේ මා නුවර පිටිසර ගමක දුප්පත් පවුලකින් මතු වී තාරකාවක් වූ නළුවා ගැන සිතමින් ඉන්නා අතරය.

"ඔයා තමයි ඇවිදින සරස්වතී." මා කීවේ ඇගේ කතාවට සවන් දෙන බව පෙන්වීමට මිස ඒ ගැන සිතූ නිසා නොවේ.

"ඔයා නම් පුදුමයි. දිවැස් තියෙනවා. වීවී ඇත්තටම හිතනවා රාධා කියන්නෙ සරස්වතීගෙයි ලක්ෂ්මිගෙයි එකතුවක් වෙලා එයා හම්බ වෙන්න ආපු කෙනෙක් කියලා. එපා කිව්වට අහන්නැ තනියම ඉන්න දවසට වඳිනවා. මාර වඩයක්" ඇය 'මාර වඩයක්' කීවේ පුදුමාකාර තෘප්තිමත් මුහුණකිනි. ඒ තෘප්තිමත් මුහුණ ඈත නිම්නයේ දුප්පත් ගම දෙසට එල්ල වූයේ විය.

"එයාගෙ ආදරේට මුහුණු ගොඩක් තියෙනවා." ඇය ඉංග්‍රීසියෙන් කීවාය.

"කිසිම ආදරේකට එක මූණක් නෑ රාධා."

"ඇත්ත. ඒත් අරූගෙ බොරු ආදරේට එක මූණක්වත් තිබුණෙ නෑ. තිබුණෙ වෙස් මූණක් විතරයි." රාධා කීවාය. ඇගේ ස්වරයේ තිබුණේ මැඩගත් කෝපයකි.

"මේ පළාත හරි ලස්සනයි. සීතලයි. හැබැයි ගොල්ෆ් පිට්ටනියක් නම් හදන්න බෑ." මම ඇගේ සිත වෙනතකට යොමු කරන්නට කීවෙමි.

"මට පුළුවන් වීවී එවන්න ඔයාගෙන් ගොල්ෆ් ඉගෙනගන්න." රාධා කීවේ පැනනගින ප්‍රීතියකිනි. ඇය එය කියන්නට අවස්ථාවක් එනතෙක් උන්නාක් මෙනි.

"එයත් ඒ ගැන කිය කිය ඉන්නෙ. එතකොට ඔයාට පුළුවන් හෙමින් සැරේ එයාගෙ ඔළුවට අදහස් දාන්න. "

"රාධා ඔයා මොනවද මේ කියන්නෙ?" මා ඈ දෙස බැලුවේ අමනාපය පෙනෙන ලෙසිනි.

"එයා කැමතියි ගොල්ෆ්වලට. කවුද කියල ඒ ගැන."

"මම ගොල්ෆ් ගහන්නෙ ඒක ප්‍රභූ ක්‍රීඩාවක් හින්ද නෙමේ. ඒක තනියම කරන්න පුළුවන් හින්දා."

"කමෝන් බන්දු ඔයා ගොල්ෆ් උගන්නන්න ඕනෙ නෑ. ඒ අතරෙ පුළුවන්නෙ වීවීට දේවල් කියල දෙන්න. අතීතෙට යන්න උමගක් කපන්න කාටවත් බෑ කියලා මිනිහට කියල දෙන්න."

රාධා මා අත වූ රතුවයින් වීදුරුව පිරෙව්වාය.

"හිතන්න වෙනවා." මම සෙමින් කීවෙමි.

රාධාගේ මුහුණේ මතු වූයේ තෘප්තියක සේයාවක් ඇති සිනාවක් බව බැස යන හිරු එළියෙන් රන්වන් වූ ඇගේ මුහුණින් පෙනිණ. ඇය අර ඈත ගම දෙස බලා සිටියේ ඇගේ සුන්දර දෙතොලේ කොණක රැඳුණු උපහාසයෙනි.

"වීවී හරියට කියනව දෛවය ගැන. එව්ව ඇත්ත වෙන්නත් පුළුවන්. මේ ඉඩම මම ගත්තෙ අරුන් එක්ක ඇවිදින්. මාර කතා කිව්වෙ මෙතන ඉඳල ෆිල්ම් එහෙම කරන හැටි ගැන." ඈ කුරිරු කියමන් සියල්ලම පාහේ සිංහලෙන් කීවාය.

රාධා තරමක් වෙරි වී ඇති බව පෙනිණ. යාන්තමට මත් වූ විට නොරක් නැතිව සාහිත්‍යය සහ සිනමාව ගැන අලංකාර ලෙස කතා කළ රාධාගේ මුහුණ අඳුරට හසුවන නිම්නයක් දෙසට නොසෙල්වී යොමු වී ඇති බව මට පෙනිණ. ඉතා විශාල වපසරියක විසුරුණු දේවල් පිළිබඳ ප්‍රාණවත් උනන්දුවකින් කතා කළ, ගැඹුරු රුචිකත්වයක් ඇති මගේ මිතුරියගේ විඥානය ඉතා පටු එල්ලයක් වෙත යොමු කිරීමට මාද දායක වීද යන ප්‍රශ්නය එදින මා සිත ඇති විය. ඇයද අතීතය වෙත යන උමගක් කපාගෙන එහි සිරවී සිටින්නී නොවේද?

සැකකාරයෝ

ජූලි කලබල අවසන්ව ගත වූ සති දෙකක පමණ කාලය තුළ දවස් තුනහතරක්වත් 'සාජන්' හෙවත් උසමහත හාදයාත් 'බැඳපු බීෆ්'කාරයාත් බෝතල් රැගෙන ආ බව ගොළුවිජේට මතක ඇත. ඔවුන් බෝතල්වල කොටේ ඉතුරු කළ පසු සේදරමන් මුදලාලි එය ගොළුවිජේගේ කාමරයෙන් තබා දේවරූප ඉදිරිපිට හඳුන්කූරක්ද දල්වා පිටව ගියේය. ඒ ඇතැම් දවසක ගොළුවිජේ අවදියෙන් සිටියද මුදලාලි ඒ ගැන නොසලකා හඳුන්කූරු දල්වා වැඳ නික්ම ගියේය. ගොළුවිජේ අපේක්ෂාවෙන් මෙන් සිටි කුරිරු දවස ආවේ හරියටම ඒ සති දෙකකට පසු බවද මතක ඇත්තේ එය ඉතා තීරණාත්මක දවසක් බැවිනි.

සාජන් මහත්තයා යක්ෂාවේෂ වී උන්නේය. හෝටලය වහන්න ඔන්න මෙන්න වෙන කොටම එහි ආ ඔහු සහ බැඳපු හරක් මස්කාරයා හෝටලේ ඇතුළේ සිටි සියලු දෙනා එළියට යැව්වහ. සාජන් අතේ පිස්තෝලයක්ද විය.

"තමුසෙ හදන්නෙ අපිටත් කොළේ වහල ගහන්ඩද? හම ගහනව වේසිගෙ පුතා." සාජන්කාරයා කෑ ගැසුවේය.

"මං දන්නෑ මොනව උනාද කියල. මං හිතුව සර්ලවත් ගත්තද කියල." මුදලාලි කීවේය.

"ගත්ත අම්මගෙ රෙද්ද! නැති බව තෝ දන්නෙ කවද්ද?" ඔහු මුදලාලිගේ බෙල්ලට පිස්තෝලය තිබ්බේය.

"එයා කැමතියි ගොල්ෆ්වලට. කවුද කියල ඒ ගැන."

"මම ගොල්ෆ් ගහන්නෙ ඒක ප්‍රභූ ක්‍රීඩාවක් හින්ද නෙමෙ. ඒක තනියම කරන්න පුළුවන් හින්දා."

"කමෝන් බන්දූ ඔයා ගොල්ෆ් උගන්නන්න ඕනෙ නෑ. ඒ අතරෙ පුළුවන්නෙ වීචිට දේවල් කියල දෙන්න. අතීතෙට යන්න උමගක් කපන්න කාටවත් බෑ කියලා මිනිහට කියල දෙන්න."

රාධා මා අත වූ රතුවයින් වීදුරුව පිරෙව්වාය.

"හිතන්න වෙනවා." මම සෙමින් කීවෙමි.

රාධාගේ මුහුණේ මතු වූයේ තෘප්තියක සේයාවක් ඇති සිනාවක් බව බැස යන හිරු එළියෙන් රන්වන් වූ ඇගේ මුහුණින් පෙනිණ. ඇය අර ඈත ගම දෙස බලා සිටියේ ඇගේ සුන්දර දෙතොලේ කොණක රැඳුණු උපහාසයෙනි.

"වීචී හරියට කියනව දෛවය ගැන. එච්ච ඇත්ත වෙන්නත් පුළුවන්. මේ ඉඩම මම ගත්තෙ අරුත් එක්ක ඇවිදින්. මාර කතා කිව්වෙ මෙතන ඉඳල ෆිල්ම් එහෙම කරන හැටි ගැන." ඈ කුරිරු කියමන් සියල්ලම පාහේ සිංහලෙන් කීවාය.

රාධා තරමක් වෙරි වී ඇති බව පෙනිණ. යාන්තමට මත් වූ විට තොරක් නැතිව සාහිත්‍යය සහ සිනමාව ගැන අලංකාර ලෙස කතා කළ රාධාගේ මුහුණ අඳුරට හසුවන නිම්නයක් දෙසට නොසෙල්වී යොමු වී ඇති බව මට පෙනිණ. ඉතා විශාල වපසරියක විසුරුණු දේවල් පිළිබඳ ප්‍රාණවත් උනන්දුවකින් කතා කළ, ගැඹුරු රුචිකත්වයක් ඇති මගේ මිතුරියගේ විඥානය ඉතා පටු එල්ලයක් වෙත යොමු කිරීමට මාද දායක වීද යන ප්‍රශ්නය එදින මා සිත ඇති විය. ඇයද අතීතය වෙත යන උමගක් කපාගෙන එහි සිරවී සිටින්නී නොවේද?

සැකකාරයෝ

ජූලි කලබල අවසන්ව ගත වූ සති දෙකක පමණ කාලය තුළ දවස් තුනහතරක්වත් 'සාජන්' හෙවත් උසමහත හාදයාත් 'බැඳපු බීෆ්'කාරයාත් බෝතල් රැගෙන ආ බව ගොළුවිජේට මතක ඇත. ඔවුන් බෝතල්වල කොටේ ඉතුරු කළ පසු සේදරමන් මුදලාලි එය ගොළුවිජේගේ කාමරයෙන් තබා දේවරූප ඉදිරිපිට හඳුන්කූරක්ද දල්වා පිටව ගියේය. ඒ ඇතැම් දවසක ගොළුවිජේ අවදියෙන් සිටියද මුදලාලි ඒ ගැන නොසලකා හඳුන්කූරු දල්වා වැඳ නික්ම ගියේය. ගොළුවිජේ අපේක්ෂාවෙන් මෙන් සිටි කුරිරු දවස ආවේ හරියටම ඒ සති දෙකකට පසු බවද මතක ඇත්තේ එය ඉතා තීරණාත්මක දවසක් බැවිනි.

සාජන් මහත්තයා යක්ෂාවේෂ වී උන්නේය. හෝටලය වහන්න ඔන්න මෙන්න වෙන කොටම එහි ආ ඔහු සහ බැඳපු හරක් මස්කාරයා හෝටලේ ඇතුළේ සිටි සියලු දෙනා එළියට යැව්වහ. සාජන් අතේ පිස්තෝලයක්ද විය.

"තමුසෙ හදන්නෙ අපිටත් කොළේ වහල ගහන්ඩද? හම ගහනව වේසිගෙ පුතා." සාජන්කාරයා කෑ ගැසුවේය.

"මං දන්නෑ මොනව උනාද කියල. මං හිතුව සර්ලවත් ගත්තද කියල." මුදලාලි කීවේය.

"ගත්ත අම්මගෙ රෙද්ද! නැති බව තෝ දන්නෙ කවද්ද?" ඔහු මුදලාලිගේ බෙල්ලට පිස්තෝලය තිබ්බේය.

"දැං ටිකකට කලින් සර්. අද වෙනකං බැලුවෙ නෑ." මුදලාලි හිරවූ උගුරෙන් කීවේය. එය නැවත නැවත බලන්නට තරම් වටිනා දෙයක් යැයි මුදලාලි සිතුවේ නැත.

පිස්තෝලයෙන් මුදලාලිගේ හිසට ගැසූ පොලිස්කාරයා ආපසු හැරෙන විට පඩිපෙළ දැක්කේය.

"ංආ ගොළුවා." කී ඔහු පඩිපෙළ නැග ගොළුවිජේගේ කාමරේ දොර තල්ලු කළේය. ගොළුවිජේ සිටියේ සිත්තර පත්තරේ බලමිනි. පහළ සිදු වූ කිසිවක් ගොළුවිජේට නෑසුණු බව පොලිස්කාරයා ඒත්තු ගත් බව ගොළුවිජේ දැන ගත්තේය.

"වර යන්ඩ පහළට" පොලිස්කාරයා ශබ්ද භාෂාවෙනුත් හස්ත භාෂාවෙනුත් කීවේය. කොයි භාෂාව හෝ තේරුම්ගත් ගොළුවිජේ බියෙන් ගැහෙමින් පොලිස්කාරයාට ඉස්සර විය. කුස්සියට ඔහු රැගෙන ගිය පොලිස්කාරයා මිටියක්, යකඩ ඉන්නක්, යවුලක් වැනි දෙයක් හොයන මෙන් මුදලාලි ලවා කියෙව්වේය. තැති ගැන්ම සඟවාගත් ගොළුවිජේට පරණ අඩු මිටියකුත්, උදැල්ලකුත්, නාරාසනයකට සමාන යකඩ දොදොල් පත්තකුත් හමු විය.

දොදොල් පත්තෙන් තට්ටු කර බලා ගෙබිම් ටයිල්වල බොල් හඬ එන සෑම තැනක්ම කඩන්නට නියම විය. මේ අතර බැදපු බීෆ්කාරයා මිටියෙන් ගසා බිත්තියේ බොල් හඬක් එන සෑම තැනක්ම කඩා බැලුවේය. ඒ කබොක් බිත්තිවලද ගෙබිමේද පරණකම නිසාම සෑම තැනකින්ම පාහේ බොල් හඬක් ආ නිසා පැයක් දෙකක් ගතවන විට හෝටලයේ ගෙබිමේද බිත්තිවලද ඇසට වේදනා දෙන තරම් පළුදු සෑදී තිබිණ.

ඉන්පසු දාඩිය පෙරාගෙන උඩ තට්ටුවට ගිය බැදපු බීෆ්කාරයා එහිද ලොකු විනාශයක් කරන බව ගොළුවිජේට තේරුණේය. ඔහු නොසන්සුන්ව බලා සිටියේ ඔහුගේ දේවරූපද විනාශ කරතියි කියාය.

බැදපු බීෆ්කාරයා හතිදමමින් ආපසු පඩිපෙළ බසින විට ගොළුවිජේ තුළ ඇති වූයේ පුදුමාකාර සැහැල්ලුවකි.

ඒ අර්ථයක් නැති විනාශයෙන් පසු දොර ඇරෙව්ව සාජන් ඉදිරිපස ටැක්සි පාර්ක් එකේ මුදලාලිගේ කාර් එක ළඟ ගුලිවී සිටි සිරිපාල සහ අනික් සේවකයන් කැඳවා හෝටලේ ඇතුළට යැව්වේය. කාර්එක එහි ගෙනෙන්නැයි අණ කළ පොලිස්කාරයා මුදලාලි සහ ගොළුවිජේ කාර් එකට දමාගත්තේය. බැදපු බීෆ්කාරයා දොදොල් පත්තත් රැගෙනම පිටුපස අසුනට නැග්ගේ එය තුවක්කුවක් සේ එල්ල කරගෙනය.

අතරමගදී කාර් එක නැවත්තූ සාජන්කාරයා රියැදුරා බැස්සවීය. "තෝ පල ආපහු."

ඉන්පසු කාර් එක පැදවූයේ බැදපු බීෆ්කාරයාය.

මුදලාලි සහ ගොළුවිජේ රැගෙන යනු ලැබුවේ පොලීසියකටද නැද්ද යන්න අදටත් පැහැදිලි නැත. තවත් මැරයෙක් එහි උන්නේය. ඔහුද සාජන්ට "සර්" කියා කතා කළේය.

මුදලාලි සහ ගොළුවිජේ බිමට ඇද දැමූ මැරයන් මුදලාලි පුටුවක ඉන්දවා බලන් ඉන්නට බැරි තරම් පහර දුන්නේය. එහෙත්, මුදලාලි කීවේ "වෙච්ච දෙයක් දන්නෑ මහත්තයො." යන්න පමණි. එය ගොළුවිජේගේ ආත්ම විශ්වාසය වර්ධනය කරන දරා ගැනීමක් විය.

ඊළඟට ගොළුවිජේගේ වාරය ආවේය. ඔහු පුටුවේ ඉන්දවා දෑත් පිටුපසට කර බැන්ද ඔවුහු ඔහුගේ මූණට ටෝච් එකක් අල්ලාගෙන උන්නේය. අධික ආලෝකය ඔස්සේ ඝන අන්ධකාරයක් වෙත ඇදී යන්නාක් මෙන් ඔහුට දැනිණ.

"අනේ සර් ඔය ගොළු කොල්ලා දන්න දෙයක් නෑ." මුදලාලි කෙඳිරි ගෑවේය. මුදලාලි බිත්තියට හේත්තු වී බිම වාඩි වී සිටියේය.

"කටවහගෙන හිටූ වේසිගෙ පුතා." එකෙක් මුදලාලිට යළි පයින් ගැසුවේය.

සාජන් ගොළුවිජේගේ කන වෙතට නැමී කෑගැසුවේය.

"කියපිය තොට කන් ඇහෙනව නේද? කියපිය තොට කන්නැහෙනව නේද?" ගොළුවිජේ නොසෙල්වී උන්නේය. සාජන්ගේ දරාගත නොහැකි අරක්කු ගඳ නිසා පමණක් හිස පසෙකට කළේය. "මං තෝව හමගහනව."

සාජන් සංඥාවක් දුන් සැණින් අනික් දෙන්නා ගොළුවිජේගේ තොල් පුපුරා ලේ වැගිරෙනතුරු පහර දුන්හ.

"දැන් කියපිය තොට කන්නැහෙනව නේද?"

"මගෙ කකුල යටනෙ ඒක තියෙන්නෙ" සාජන් හය්යෙන් කීවේය. ඉන් පසු මෙසේ ඇසීය: "මොකක්ද මං කිව්වෙ?"

ගොළුවිජේ හිස නොසොල්වා බලාගෙන උන්නේය.

"මගෙ කකුල යටනෙ තියෙන්නෙ." සාජන් නැවත හය්යෙන් කීවේය.

"කියපිය මං මොකක්ද කිව්වෙ?" ගොළුවිජේ හිස සැලීමක්වත් නොමැතිව සාජන් දෙස බලා සිටියේය. ඔහුගේ මුහුණ හිරි වැටී පහර කෑ වේදනාව පහවී යමින් තිබිණ.

"අනේ සර් ඕක ගොළුවෙක්. අවුරුදු ගාණක් මං ගාව ඉන්නෙ." එවර බිත්තියට හේත්තු කෙඳිරිගාමින් සිට මුදලාලි කෑ ගසා කීවේය. සාජන් මුදලාලි දෙස හැරී බලන විට ගොළුවිජේද බැලුවේය.

"මේක තොපි දෙන්නම එකතු වෙලා දෙන වැඩක්. තෝ දැක්කෙ නැද්ද මං හෝටලේ බිම බොල් තැන් හොයන්ඩ තට්ටු කරද්දි මං කියන්ඩ කලින්ම ගොළුව ඒව දැනගත්ත. දැක්කද මේක බොල් තැන් මොනවද කියල මං පෙන්නන්ඩ කලින්ම කැඩුවා. බොල් නැති එක තැනක්වත් කැඩුවෙ නෑ." බැඳපු බීෆ්කාරයා කෑගැසුවේය. සාජන් ඔළුව වැනුවේය.

හිටිවනම සාක්කුවෙන් බෝල් පොයින්ට් පෑනක් ගත් පොලිස්කාරයා එහි කොපුව ගලවා ගොළුවිජේගේ කන ඇතුළට බැස්සුවේය. ඔහු කිටිකිටියේ දත් හපාගෙන යටිගිරියෙන් කෑගැවද

එය යන්තම්වත් වචනයක ස්වරූපයක් ගත් කෑ ගැමක් නොවේ. පොලිස් කාරයා පෑන කැරකෙව්වේය. ඔහු පෑන අහකට ගත්තේ අනික් කන තුළ එය යවන්නට බව දැනෙන විටම ගොළුවිජේට කලන්තෙ හැදුණේය.

පසුදින උදයේ එළිය වැටෙන විට මුදලාලි සහ ගොළුවිජේ දෙදෙනාම රිමාන්ඩ් කූඩුවක සිටින බව ඔවුන් අවබෝධ විය. ඒ කූඩුව සහ ඔවුන්ට වධදුන් තැන දෙතැනක් බව ඔවුන් දැනගත්තේ ඔවුන් කාර් එකේ දමාගෙන මෙහි රැගෙන ආ බව හොඳට මතක තිබුණු බැවිනි.

උදේ සාජන්වරයා කෙළින්ම ගියේ බලගල්ල වලව්වටය. බන්දුල බලගල්ල ගොල්ෆ් වටයක් සෙල්ලම් කර ආපසු එමින් උන්නේය. ඔහු සිටියේ සුපුරුදු සන්සුන් විලාසයෙනි. සාජන් කෙළින්ම ගෙයත් පසුකර ගොල්ෆ් පිට්ටනිය දෙසට ගියේය.

"සර් ශ්‍රීරාම් මුදලාලි මෙහෙ ඉන්නවද?" සාජන් කතා කළේ පුදුමාකාර හදිස්සියකිනි.

"හිටිය. දැන් නෑ. රාලහාමිලට බැරි උනානෙ ඒ මිනිස්සු ආරක්ෂා කරන්ඩ. අපිවත් කරන්න ඕනැනෙ." බන්දුල බලගල්ල කීවේය. සාජන් බිම බලාගත්තේය.

"ඒක ඇත්ත සර්. ඩීඅයිජී බලගල්ල වගේ සර්ල හිටිය නම් මේව මෙහෙම වෙන්නෑ. ශ්‍රීරාම් එකේ මංකොල්ලෙ ගැන පැමිණිල්ලක් ගන්ඩ ඕනෙ. සැකකාරයො දෙන්නෙක් අහුවෙලා ඉන්නවා." සාජන් කීවේය.

"පැමිණිල්ලක් ඕනෙ නෑ. මේ අපරාධයක් වෙලා තියෙනවනෙ. ඔයාල හොයන්න." බන්දුල බලගල්ල ගේ දෙසට යන්නට හැරුණේය.

"පැමිණිල්ලක් තිබුණනං ලේසියි. ඒකයි සර්."

"කවුද දෙන්නා? මං පණිවිඩයක් යවන්නම්." බන්දුල බලගල්ල සාජන්ට කියා ගේ දෙසට යන්නට ගියේය. පොලීසිය ගැන විශාල අප්‍රසාදයක් ඒ දිනවල ඔහු තුළ ඇතිවී තිබුණෙන් බාප්පා සමගද ඒ ගැන කතා කර කළේය.

"අර අල්ලපු කඩේ එකයි උගෙ ගෝලයෙකුයි තමයි වැඩේ කරල තියෙන්නෙ සර්. අපි අරන් ඉන්නෙ උන්ව." සාජන් කීවේ ඈතට යන බන්දුල බලගල්ලට ඇසෙන්නටය. බන්දුල බලගල්ල කිසිවක් නොකියා ආපසු හැරීද නොබලා යන්නට ගියේය.

එදින හවසම පොලීසියට ගිය බන්දුල බලගල්ල ශ්‍රීරාම් මුදලාලි දුරකථනයෙන් දුන් පණිවිඩය පොලිස් ස්ථානාධිපතිවරයාට දුන්නේය:

"ඒ මනුස්සයො දෙන්නා පොඩ්ඩක්වත් සැක නෑ."

කඩේ ගිනි තියන්නට සැලසුමක් තිබෙන බවත් ඒ නිසා දියණියන් ඇතුළු පවුලේ අය නිවසේ හෝ කඩේ අය තබා නොගන්නා ලෙසත් ශ්‍රීරාම් මුදලාලිට පණිවිඩය දුන්නේ සේදරමන් මුදලාලි බව බන්දුල බලගල්ල දැන සිටියේය. ශ්‍රීරාම් මුදලාලිගේ නිවසේ සිටීමට වඩා සිංහල කඩ දෙකකට මැදිවූ ඔහුගේ හෝටලයේ සිටීම ආරක්ෂාකාරී බව ඔහු සිතුවේ පොලීසියද නිතර ගැවසෙන නිසාය. කඩේ ගිනි නොතියා බේරා ගැනීමට ලක්ෂ තුනක් සමග සිංහල සේවකයකු නවත්වා ආවේ සේදරමන් මුදලාලි එසේ කියූ නිසා නොවේ. කඩේ ලාච්චු කඩා සෙව්වොත් සොයා ගන්නට තවත් පනස්දාහක් ඒ සේවකයාටත් හොරෙන් ලාච්චුවක දමා තිබුණේය. සිද්ධිය වෙන්නට දවස් දෙකකට කලින් මහ රෑ සේදරමන් මුදලාලි තනියම කාර් එක එළවාගෙන ආවේය. ඒ වන විට බන්දුල බලගල්ල මහතාත් කාර් එකක් එවා තිබිණි. යාන්තමට ඇරුණු ශ්‍රීරාම් දොරින් මුදලාලිගේ පවුලේ සියලු දෙනා බලගල්ල කාර් එකට නැගුණු අතර, දෙමළ සේවකයන් තිදෙනෙක් නැගුණේ සේදරමන් කාර් එකටය.

මේ සැලැස්ම අකුරක් නෑර දැන සිටි බන්දුල බලගල්ලටද සේදරමන් ගැන කිසිම සැකයක් තිබුණේ නැත.

ශ්‍රීරාම් මුදලාලිගේ නැගණිය වූ සරෝජාගේ දෙහිවල නිවසද ගිනිතබා තිබූ නිසා ඇය සිටියේද රත්මලානේ අනාථ කඳවුරේය. ඒ නිසා එහි යන්නට විදියක්ද නැත.

ශ්‍රීරාම් හෝටලයේ වැඩ කළ ඇතැම් දෙමළ සේවකයෝ ශාන්ත ආනා විද්‍යාලයේ අනාථ කඳවුරකට ඒ වන විටත් ගොස් සිටියහ. නරගයේ දුප්පත් දෙමළ පවුල්වල බොහෝ දෙනෙක් කලබලවලට කලින්ම ඒ කඳවුරේ රැකවරණ පැතූහ.

බලගල්ල නිවසේ සති දෙකක් පමණ විසූ ශ්‍රීරාම් පවුලට යාපනයට යාමට අවශ්‍ය සියල්ල පිළියෙළ කළේද බන්දුල බලගල්ලය. එය තමාට ඉංග්‍රීසි බසද සාහිත්‍ය රුචියද හුරු කළ අර්සනායගම් මහතා වෙතින් තමන්ට උරුම වූ සංස්කෘතිය වෙනුවෙන් ගෙවිය යුතු ආචාරධාර්මික මිලක් යැයි සිතූ බන්දුල බලගල්ල අපමණ සතුටක් වින්දේය. එදිනද පොලීසියට ගොස් සේදරමන් නිදහස් කරගත් දිනද ඔහුට දැනුණේ මිනිස් විශිෂ්ටත්වය වෙනුවෙන් කළ දෙයක් සාර්ථක වීමෙන් ඇති වූ අභ්‍යන්තරික සන්තෘප්තියයි. ලංකාවට පැමිණීමෙන් පසු යම් කිසි දැවැන්ත ඓතිහාසික සිද්ධියකට යහපතෙහි පැත්තේ සිට දායක වූවාක් වැනි හැඟීමක් ඔහු තුළ ඇති විය.

එදින සේදරමන් මුදලාලි සමග අත්අඩංගුවෙන් මුදවා ගත්තේ ගොළු කොලුවෙකිය යන කාරණය එදින ඔහුට ආරංචි වුවද ඔහුට එය සුවිශේෂ මතකයක් ඇති කරන පුවතක් වූයේ නැත.

ඒ ගොළු කොල්ලා සහ තමාගේ ජීවිතය යළි යළිත් එකට පටලවන දෛවය කුමක්දැයි යන්න ගැන අනේක සිතුවිලි රාධා නිසා බන්දුල බලගල්ල තුළ පසු කලෙක ඇති විය.

සුවඳ සඳුන්

ශ්‍රීරාම් මුදලාලිගේ පණිවුඩය පොලීසියට දුන් බලගල්ල වලව්වේ මහත්තයා සැකකාරයන් සමග වචනයක්වත් කතා කරන්නට කිසිදු උනන්දුවක් නොදක්වා පිටව ගිය බව පසුව සේදරමන් හෝටලේ අයටද ආරංචි විය. ඒ ගැන කිසිවෙකු පුදුම නොවූයේ ඔහු වැඩිය සමාජයට නොඑන ආඩම්බර වලව්කාරයකු සේ ප්‍රසිද්ධ නිසාය. ගොළුවිජේගේ දෙකනම පොලිස්කාරයාගේ කාබන් පෑනෙන් සිදුරු වී තිබිණ. ගෙබිම සහ බිත්ති යළි සකසන තෙක් හෝටලේ විවෘත කළ නොහැකි නිසා සේවකයන්ට කළ හැකිව තිබුණේ අස්පස් කිරිලි පමණි. මුදලාලි සිල්වා සාප්පුවෙන් තුවාලවලට බෙහෙත් දාගෙන යළි හෝටලේ ගොඩගන්නට මහන්සි වුවද ඔහු පසු වූයේ ඇඟපත රිදෙන උණ ගතියකිනි. තුන්දිනක් යන විට ගොළුවිජේගේ කන් පැසවා සැරව ආවේය. ගොළුවිජේ ඉස්පිරිතාලෙ යාම ප්‍රතික්ෂේප කළ නිසා නාරම්මල කඩහපොළ වෙද මහත්තයාගේ පිහිට පතන්නට සිදු විය. සේදරමන් මුදලාලි සහ බිරිඳ පුත්‍ර ස්නේහයෙන් ගොළුවිජේ රැකබලා ගත්හ. කන් සුවවන තෙක් මුදලාලිගේ ගෙදර ගොස් සිටින්නට යෝජනා කෙරුණද හෝටලේ ඔහුගේ කාමරය හැර යන්නට ඔහු කැමැති වූයේ නැත. හෝටලය කෙරේ ඔහු දක්වන කැපවීම ගැන මුදලාලි යුවළ තුළ ඇති වූයේ ගැඹුරු ගෞරවයකි.

මුදලාලි දවස ගෙව්වේ පුදුමාකාර පසුතැවිල්ලක් වැනි හැඟීමකිනි. ඇය ගොළුවිජේට හෙදකම් කිරීමට සැමදාකම හෝටලේට ආවාය. මෙවැනි පීඩා විඳින්නට නොවන තැනක වෙන රස්සාවක් හොයා ගන්නට කැමැති නම් අස්වීයාම ගැන මුදලාලිගේ හිතේ කිසිම අමනාපයක් නැති බව කොළයක ලියා දුන්නේ මුදලාලි හාමිනේය. හෝටලේ නැවත තිබුණ තත්ත්වයට ගැනීම මිස වෙන දෙයක් ගැන අදහසක් නැතැයි ගොළුවිජේ පෙරළා ලියා දුන්නේය.

මුදලාලි හාමිනේ ගොළුවිජේගේ නළල තමා වෙත ඇද අම්මා කෙනෙකුගේ හාද්දක් දුන්නාය. ඇයගේ ඇස්වල කඳුළු මතු වූයේ ගොළුවිජේගේ කඳුළු දකින්නට පෙරම බව ගොළුවිජේට මතකය. අම්මාගෙන් එවැනි හාද්දක් ලද දවසක් ඔහුට සිහි නොවිය.

දවසක් ගොළුවිජේගේ බැංකු පොත ඉල්ලා ගත් මුදලාලි බැංකුවට ගොස් ආපසු ආවේය.

අලුතින් රුපියල් දහදාහක් දැමූ ඒ පොත පෙරළා බැලූ ගොළුවිජේ පෑවේ මුදලාලිටද නව පණක් දෙන සිනාවකි.

සේදරමන් හෝටලය නැවත පණ ගසා ආවේය. එහෙත්, සැමරෙන් සැරේ ආ සාජන්ට කප්පම් දීමට මුදලාලිට සිදු විය. එස්අයි ලෙස උසස් වී යැයි කයිවාරු ගසමින් සිටියද ඔහුට ඒ උසස්වීම ලැබුණේ තවත් මාස ගණනකට පසුවය. ඉන් පසු කෑගල්ල පැත්තට මාරුවක් ලැබ ගිය ඔහු විටින් විට පැමිණ කීයක් හෝ කඩාගෙන යන්නට විය. ඇතැම් විට බීමත්ව එන ඔහු හැසිරුණේ පිස්සකු මෙනි. "තෝ එක්ක හවුල් කරල මට අතේ තිබුණ එකටත් කෙළ උනා. තෝ දෙපාරක් මට කෙළියා" යැයි වරක් මුදලාලිට කුණුහරුපයෙන් බැන්න පොලිස්කාරයා මුදලාලිගේ මුහුණ අත ගගා අඬන්නටද වූයේය. බැණීම සහ ඇඬීම යන දෙකම එකවර කිරීම ගොළුවිජේට වටහා ගන්නට බැරි වුවත් පොලිස්කාරයා ආ විට ඔහු ඒ පැත්ත පළාතේ ගියේවත් ඔහුට බයිට් හැදුවේවත් නැත.

අවුරුද්දක් පමණ බාහිරින් එන පොලිස්කාර කරදරයත්, තමා ඇතුළෙන්ම එන හිත් කරදරයත් වින්ද සේදරමන් මුදලාලි යම් තීරණයක් හිතින් හිතාගෙන එක් සිංහල අවුරුදු දවසක

සිය සේවක පිරිස නිවසට කැඳවා මංගල්‍යයක් වැනි අවුරුදු සාදයක් දැම්මේය. සාදය ආරම්භයට පෙර සේවක පිරිස වෙනම කාමරයකට කැඳවූ මුදලාලි කතාවක් පටන් ගත්තේය.

"මට දැන් හෝටලේ කරල ඇති වෙලා තියෙන්නෙ. මං දැන් කැමැතියි පිනක් දහමක් කරගෙන ඉන්ඩ පැත්තකට වෙලා අවුරුද්දක් දෙකක්. මං කඩේ කුලියට දෙනවා කාට හරි. තමුසෙලා කාට හරි පුළුවන්කමක් තියෙනවානං කරන්න මං හුඟක් අඩුවට උනත් දෙනවා. මේ කොල්ලන්ටනං බැරුව ඇති. ලියන මහත්තයට තමයි පුළුහංකමක් තියෙනවනං ඇත්තෙ. පුළුහංනං මට ඉක්මනට කිව්වොත් හොඳා." මුදලාලි කීවේය. ඔහුගේ මුහුණේ වූයේ පරාජිත පෙනුමකි; වේදනා විඳින හදවතක පිළිබිඹුවකි.

මුදලාලි හාමිනේ ගොළුවිජේ ළඟින් හිඳ සැමියා කී සියල්ල විස්තර කරන්නට උත්සහ කළාය. විටෙක ලියා පෙන්නුවාය. ඇය ලියා පෙන්වන්නට අනවශ්‍ය තරම් වෙලාවක් ගන්නා විට ගොළුවිජේ නොසන්සුන් විය. බිල්ලා කට ඉස්සරහට දමා හෝටලේ බාරගතහොත් ඔහු යටතේ වැඩ කරන්නට සිදු වන්නේය.

"මුදලාලි මාසෙකට කීයක් විතර බලාපොරොත්තු වෙනවද දන්නෑ" ගොළුවිජේ මුදලාලි හාමිනේ අසල වූ කොළයේ ලිව්වේය. හාමිනේ එය කියෙව්වේ සතුටිනි.

මුදලාලි එය ගොළුවිජේගෙන් අපේක්ෂා කළ ප්‍රශ්නයක් නොවුණත් එය ඇසුවේ ගොළුවිජේ වීම ගැන මුදලාලිගේ සිතේ ඇති වූයේ සතුටකි. ඒ සතුට මුහුණේ ප්‍රකාශ විය.

"මං කාට කඩේ දුන්නත් විජේව වැඩට ගන්ඩ කියන එක කියනව. අනික් අය ගැන මට කියන්ඩ බෑ. විජේ මං හින්ද බලු දුක් වින්ද කොල්ලෙක්. අනික මං මේක දෙන්නෙ වැඩිම උනොත් අවුරුදු දෙකකට" මුදලාලි සියලු දෙනාගේම මුහුණු බැලුවේය.

"ගොළුවට මොකටද කුලිය කීයද කියලා." බිල්ලා උපහාස සිනාවක් පෑවේය. ගොළුවිජේ කඩේ කුලිය ඇසීමෙන් මුදලාලිට දරුණු උපහාසයක් කළ බවක් ඔහු සිතන බව පෙනිණි. සිරිපාල

සිනාසුණේද උපහාසයට මෙනි. ඩ්‍රයිවර් 'හූකුස්' ගෑවේ ශබ්දයෙන් පමණක් නොව, රූපයෙන්ද උපහාසය පෙන්නමිනි.

"විජේම කරන්ඩද අහන්නෙ?" හාමිනේ ඇසුවේ භාෂාව සහ ගොළු භාෂාවද මිශ්‍රකරමිනි.

ගොළුවිජේ හිස වැනුවේය. මුදලාලි හාමිනේ පෑවේ අපේක්ෂා සහගත සිනාවකි. මුදලාලිගේ මුහුණේ වූයේ ගුප්ත කුතුහලයකි.

"තමුසෙලාගෙන් කෙනෙකුට දෙනවනං මාසෙකට පාළොස්දාහක්වත් ඕනෙ. ඒ කඩ කුලිය. බඩුවලටත් කුලියක් ඕනෙ. ඔක්කොම විස්සක් විසිපහක් විතර වෙයි."

මුදලාලි හාමිනේ එය ලිඛිත බසට පරිවර්තනය කළේ ඇය හෝටලේ දෙන්නට කැමති තැනැත්තා වෙනුවෙනි.

"තමුසෙලා කරනවනං කීමනි ඕන්නෑ. දෙන්න පුළුවංකමක් තියෙනවානං දුන්නත් කමක් නෑ."

මුදලාලි හාමිනේ කීමනි යන්න විස්තර කර කොළයක ලියා විජේට පෙන්නුවාය.

බිල්ලා ගොළු වී උන්නා මිස කිසිවක් නොකීවේය.

"මං දවස් දෙකකින් කියන්නං" ගොළුවිජේ ලියා පෙන්නුවේ පමණක් නොව, ගොළුබසින්ද කීවේය.

එය මුදලාලි හාමිනේගේ ප්‍රීතියටත් මුදලාලිගේ කුතුහලයටත් හේතු විය. ගොළුවිජේගේ බැංකු පොතේ ඇති ගණන ඔහුටත් වඩා දන්නේ මුදලාලිය. ඔහු කිසිවක් නොකියා උන්නේය. දවල් කෑම ජයට ලෑස්ති කර තිබිණ. එක කාමරයක කඩේ අයටද තව කාමරයක නෑදෑයන්ටද බීම ලෑස්ති කර තිබිණ.

ඒ අතර මුදලාලිගේ කාර් එක පණ ගැන්විණ. පොඩි හදිස්සියකට ගිය බව කියවිණ.

පැයකට දෙකකට පසු නැවත ආ සේදරමන් මුදලාලි හිත හදාගෙන උන්නේය.

“තමුසෙ ගන්නවනං මං දෙන්ඩ කැමැතියි.” ගොළු භාෂාවෙන් නොකීවත් ගොළුවිජේට එය තේරුණේය. මුදලාලි හාමිනේගේ පරිවර්තනය ගොළුවිජේටත් වඩා ඇගේම අවශ්‍යතාව සඳහා කෙරුණක් විය.

එදින හවස ගොළුවිජේ සහ සිරිපාල කඩේට ආහ. මුස්ලිම් කඩ හැර අන් කිසිවක් විවෘතව නොතිබිණ.

සිරිපාල පසුවදා ගමේ යන්නට තෑගිබෝග ගන්නට ගියේය. ගොළුවිජේ කඩේ ඉදිරිපස යකඩ දොරේ ඉබ්බා ඇර ඇතුළට විත් ඔහුගේ කාමරේට ගියේය.

සෑම දෙයක්ම අවුස්සා ඇත. මෙට්ට කවරයද එක මුල්ලකින් ගලවා පරීක්ෂා කළ ලකුණුය. ඇඳ යට වූ ලට්ටලොට්ට පෙට්ටි සියල්ල පරීක්ෂා කර යමක් සොයා ඇති බව සහතිකය. ගොළුවිජේගේ තැතිගැන්ම දබ්දබ් ගා ශබ්ද නැංවීය. පොලිස්කාරයා කඩා වැදී තාමත් මෙහි සිටින්නට පුළුවන. වහාම හෝටලෙන් පැන යන්නට සිතූ ඔහු ලක්ෂ්මී දේවතාවිය දෙස බැලුවේය. අඩක් පමණ දැල්වී ගිය සුවඳ දෙන හඳුන්කූර දුටුවේ එවිටය. උදේම තමන් ගැසූ හඳුන්කූර මෙතෙක් වෙලා දැල්වීත් අඩක් පමණක් දැල්වී තිබෙන්නට විදියක් නැත. හිමින් ඒ වෙත ළං වූ ඔහු හඳුන්කූරු රඳවන වැලි කෝප්පය දෙස බැලුවේය. මෙය වෙන කිසිවකු ගැසූ අලුත් හඳුන්කූරකි. යළිත් හෝටලේ හැම තැනම, හැම දොරමුල්ලකම පරීක්ෂා කර බලා කාමරයට ආ ඔහු ලක්ෂ්මී දේවරූපය ගලවා අතට ගෙන එහි පිටුපස බලා වහා නැවතත් ඒ ඇණයෙහිම එල්ලන සැණින්ම සිත් සැනසිල්ල ආවේය.

ඔහුගේ බිය සැක පහ කරන සුවඳක් ඒ හඳුන්කූරින් මතුව කාමරේ පුරා හැමීය.

“හරි මුදලාලි මං ගන්ඩ කැමතියි.” ගොළුවිජේගේ ගොළු මුවෙහි මිමිණිණ.

බිල්ල

ඒ සඳුන්කූරු සුවඳ ගොළුවිජේ “විජය වික්‍රමසිංහ” යන නමින් ව්‍යාපාර ලෝකයට ප්‍රවේශ කරවීමේ සුබ නිමිත්ත හඟවන මංගල සුගන්ධයක් විය.

ඒ කාමර පරීක්ෂාවෙන් තමාගේ සිතේ වූ සැකයේ අවසන් බින්දුවත් අවසන් වූ පසු දෙවියන් වැඳ අලුත් හඳුන්කූරක්ද පත්තු කළේ සැකයක අවසානය ගොළුවිජේට දන්වන සංඥාවක් ලෙසිනි. ආවේ කවුදැයි ඒ මොකටදැයි එමගින් ගොළුවිජේ දැන ගන්නා බව මුදලාලිට සහතිකය. ගොළුවිජේ යනු පුදුම ඉවක් ඇති කොල්ලෙකි. ඒ සල්ලි අතුරුදහන් වීම 'ආපු උන්ගේම වැඩක් මිස' ඊට ගොළුවිජේගේ කිසිම සම්බන්ධයක් තියෙන්නට ඉඩක් නැති බව මුදලාලි කලින් සිටම විශ්වාස කළද ඒ සැකය නැත්තටම නැති වූයේ දෙවියන් ඉදිරියේ කළ මේ පරීක්ෂාවෙනි.

එහෙත්, අවුරුදු පසු වී වෙසක්ද ළඟ තිබුණත් සේදරමන් මුදලාලි හෝටලය කුලියට දීම ගැන කතා නොකළේය. වෙසක් දාට කලින් දා මුදලාලි සහ හාමිනේ ඇත්කඳ විහාරයේ සිල්ගත්හ. සිල් ගැනීම යනු ඔහු කෙදිනකවත් කළ දෙයක් නොවේ. මෙවර සීලසමාදානයට එක් වූයේ එක්තරා පාපාවිමෝචන ශාන්ති කර්මයකට සහභාගි වන්නාක් මෙනි. වෙසක් දාට කලින් දා හෝටලේ ගොළුවිජේට බාර කෙරිණි. වෙසක් දාට කවදාවත් සේදරමන් මුදලාලි හෝටලේ වෙළෙඳාම නොකරයි. ඒ වෙනුවට

හෝටලේ ඉදිරිපිට ටැක්සි නවාතැනේ දන්සැලක් දෙයි. මෙවර මුදලාලි සිල් මුදවන්නේ වෙසක්දාටත් පහුවදා නිසා දන්සැලේ මූලිකත්වයත් ගොළුවිජේටම පැවරිණ. දන්සැල විවෘත කරන්නට ආරාධනා කළ යුතු අයගේ නම් ලැයිස්තුවද මුදාලාලි ගොළුවිජේට ලියා දුන්නේය.

පෙරදින රාත්‍රියේ ඇතුගල උඩින් පායා ආ විශාල හඳක් විසින් වෙසක් දවස රැගෙන එනු ලැබිණ. උදේ දහය වන විට දන්සැල ඉදිරිපිට පෝලිම බෝගහ ළඟට දිගය. එළුගල යට ලැයිම්වලද ඇතුගල පාමුල ලැයිම්වලද වසන දෙමළ පවුල්වල ගෑනු සහ ළමයිද දන්සැලට පැමිණ සිටියේ නගරය ගැන ඔවුන්ගේ බිය තාමත් හිත්හි දරාගෙන බව ගොළුවිජේට පෙනුණේය. ඔවුන්ට බත් බෙදන විට ටිකක් වැඩියෙන් බෙදන්නට ඔහු සිතාගත්තේය.

ගොළුවිජේ දන්සැලේ ඉවීමේ කටයුතු කළේ හෝටලේ දෙස බලමිනි. ඒ හෝටලේ ළඟදීම තමාගේ නායකත්වය යටතට පත් වන්නේය යන සිතුවිල්ල ඔහුට ඉමහත් ප්‍රීතියක් වූයේ වෙනදාට සේදරමන් මුදලාලිට හිමි දන්සැලේ නායකත්වය දැනටමත් ගොළුවිජේට හිමි වී තිබීමේ ප්‍රීතිය නිසාය. ඒ ප්‍රීතිය සෑම දෙනෙකුම එක සේ විඳි ප්‍රීතියක් නොවේ. වෙනදාට දන්සැලේද මැනේජර්කම කරන බිල්ලා පැත්ත පළාතේ ආවේ නැත.

වෙසක් දාට පහුවදා සේදරමන් මුදලාලි සිල් මුදවා එන විට හිත හදාගෙන තිබිණි. එළඹෙන ජූලි මාසය වන විට කරදරයෙන් නිදහස් විය යුතුය. පොලිස්කාරයා සංවත්සරය සමරන්නට ඇවිත් බණින්ට සහ අඩන්නට පෙර හෝටලේ අතහැර යා යුතුයැයි ඔහු සිතූ සෙයකි. සල්ලි මිටිය අතුරුදහන්වීම යනු පොලිස්කාරයාගේම වැඩක් බව සේදරමන් මුදලාලිට සහතිකය. ඒ කාලකණ්ණි මංකොල්ලයට හවුල්වීම ඔහු දකින්නේ පාපයක් පලදීමෙන් සිදු වූවක් ලෙසය. ඔහුගේ හිසේ පැත්තක් තවම රිදෙයි. පොලිස්කාරයකු වීම හැර එවැනි පහර දීමකට පොලිස්කාරයාට බලයක් නැත. බැංකුවෙන් ඔත්තුව ගෙනා එකා ආගිය අතක් නැත. මේ සියල්ල යෝනිසෝමනසිකාරයෙන් කල්පනා කර බලන්නට සිල්ගත් දෙදවස ප්‍රමාණවත් විය. මුදලාලි උන්නේ කල්පනා කරමින් මිස භාවනා කරමින් නොවන බව බිරිඳද දැක තිබිණි. තම ස්වාමිපුරුෂයා නොකළ වරදකට විඳි හිංසාව ගැන දුක්වෙමින් සිට ඇගේ දැසින්ද කඳුළු වැටිණ. ඔහු වැඩිමනත් කතාබහක් නැතත් හිත හොඳ පිරිමියෙකි. විය හැකි අනතුර ගැන බලගල්ල වලව්වේ අමුතු මහත්තයාට පණිවිඩය යැව්වේ තම සැමියා බවද ඇය දැන සිටියාය.

ඒ දෙදවසක සීල සමාදානය මුදලාලිගේ මනස සුවපත් කර තිබිණි. නගරයේ කොයි ජාතියේ මනුස්සයින් සමගත් මෙත් සිතින් හැසිරෙන ඇත්කඳ විහාරයේ ලොකු හාමුදුරුවෝ නගරය අශෝභන කළ ඒ අවාසනාවන්ත ජූලි මාසය ගැන සිහි කළෝ සියලු දෙනාට මෛත්‍රී කරමිනි. ලංකාවේ අවසන් රහතන්වහන්සේ වන මලියදේව මහරහතන්වහන්සේ වැඩ සිටි මේ පූජනීය නගරයේ අතීතයේ සිටම දෙමළ ජනයාද පන්සල්වලට දානමාන දෙමින් තමන්ගේ පාඩුවේ ජීවත් වූ බවට කතා ඇතැයි උන්වහන්සේ වදාළහ. පන්සලේ ඇත් පවුරට නොමසුරුව ආධාර කළ දෙමළ කඩවල නම් උන්වහන්සේ කාටත් අසා ගන්නට නිවේදනය කළහ. උතුරේ ඉන්නා ත්‍රස්තවාදීන් සමග මේ මිනිසුන්ට පොදු දේකට ඇත්තේ දෙමළකම විතරක්යැයි උන්වහන්සේ කියා සිටියහ. ජාතිවාදී ගින්නට පිදුරු දමන උන්නාන්සේලා යනු දානයටත් පිදුරුම වැළඳිය යුතු පිරිසක් බව උන්වහන්සේ වදාළහ. ඒ ධර්මදේශනාව අවසානයේ ඒ අදහසට විරුද්ධ කසුකුසු උපාසක පිරිස අතර තැන තැන තිබුණත් සේදරමන් මුදලාලිගේ හැඟීම වූයේ එය ඇත්තක් බවයි.

ඒ දේශනාව ඔහුගේ වරදකාරී හැඟීම වැඩි කළද ඉන් පසුව ඇති වූයේ ක්ෂණික සුවයකි. ශ්‍රීරාම් මුදලාලිගේ පවුලේ ජීවිත බේරාදීමට හැකිවීම පිළිබඳ ආත්මාඩම්බරය වරදකාරී හැඟීම මකාගෙන මතු විය. ඒ මංකොල්ලයෙන් රුපියලක්වත් නොලැබීම ගැන ඔහු තුළ ඇති වූයේ මහත් සැනසිල්ලකි.

දවස් තුනකට පසුව උදේ දහයට විතර මුදලාලි හෝටලේට ආවේ හාමිනේද සමගය. ඇයද පැමිණීමෙන් පෙනුණේ එය වැදගත් ගමනක් බවයි. වෙසක් දාට කලින් දා ආදායම ගැන විස්තර ගෙනෙන්නැයි මුදලාලි ගොළුවිජේට කිව්වේය. ගොළුවිජේ සතේට ගණන් බේරුවේය.

"බලන්ඩ එපායැ. කුස්සියෙ වැඩ ඉවර කරල කැෂියර් කූඩුවට එනවා. කුස්සියේ මොකක් හරි එකක්නං දුවල ගිහිං ඒක බැලුවා. මෙන්න ආයෙත් කැෂියර් කූඩුවෙ. මූට කඩේ කුලියට දෙනවට වඩා හොඳයි මුදලාලි මූව දාල ගෙදර ඉඳන් කඩේ කොරෝනෙක." බිල්ලා කීවේ ඇතැම් තැන් ගොළුවෙකුට පවා ඇසෙතියි සැක සිතුණාක් මෙන් සද්දෙ අඩුකරමිනි.

මුදලාලි යන්තමට සිනාසුණේය. "විජේ දුවල පැනල වැඩ කරනකං ලියන මහත්තය මොකද කෙරුවෙ?"

බිල්ලා බිල්ලෙකු සේ බිම බලාගත්තේය.

ගොළුවිජේ ගණන් බේරු දවසේ ආදායම දෙස බැලූ මුදලාලි බිරිඳත්, ගොළුවිජේත් සමග උඩුමහලට නැග්ගේය.

"ලියන මහත්තය පොඩ්ඩක් කැෂියර් එක බලන්ඩ." මුදලාලි කීවේය.

බිල්ලා සැරෙන් සැරේ විත් උඩුමහලට කන් දී බැලුවද කිසිවක් වටහා ගත නොහැකි විය.

ඔවුන් ආපසු බසින විට තරුණ ගොළු කෝකියකු ව්‍යාපාරිකයකු බවට පත්වීමට අවශ්‍ය ගනුදෙනුව අවසාන වී තිබිණ. "පොසොන් වෙනකොට හෝටලේ කරන්නෙ විජේ" මුදලාලි කීවේය.

ඒ යුවළ පොසොන් පෝය අල්ලා දඹදිව යන්නට සියල්ල සූදානම්ය. දෙදෙනා ආපසු එන විට ඇසළත් පහුවෙයි.

එදා පටන්ම මුදලාලි හැසිරුණේ හෝටලේ දැනටමත් ගොළුවිජේට දුන්නාක් වැනි සැහැල්ලුවකිනි. එය තමන් අතින් සිදු වූ වරදකට ලැබුණු දඬුවම හෘදසාක්ෂියට එකඟව, ශාන්ත සුවයෙන් විඳින මිනිසකුගේ සැහැල්ලුවක් වැනිය.

"කැෂියර් තනතුරු ඇබෑර්තු ඇත" යනුවෙන් කොළයක ලියූ ගොළුවිජේ එය බිල්ලාට දුන්නේ පින්තූර රාමු කරන තැන රාමනායක ලවා ලොකුවට ඇඳගෙන එන්නටය. දැන්වීම හෝටලේ ඉදිරි වීදුරුවේ අලවා දවස් දෙක වන විට බොහෝ දෙනෙක් තනතුර ඉල්ලා ආහ. ඇබෑර්තු දැන්වීම දැක එන අය සම්මුඛ පරීක්ෂණවලට ලක් කරන ලද්දේ උඩුමහලේය. ගොළුවිජේගේ ප්‍රශ්න ඇසුණේ ලිඛිත ක්‍රමයට අභ්‍යාස පොත්වලය. ඇතැම් අයැදුම්කරුවන් එය වටහා ගත්තේ ඔවුන්ගේ අත්අකුරු පරීක්ෂා කිරීමේ ප්‍රයෝගයක් ලෙසය. ඒ නිසා ලස්සන අකුරින් හැඩදැමූ උත්තර ලියූහ. වාචික ප්‍රශ්න ඇසුවේ සේදරමත් මුදලාලි පමණි. අවසානයේ ඒ අභ්‍යාස පොත්ද මුදලාලි අතට දුන් ගොළුවිජේ ඉන් හොඳම දෙදෙනා තෝරා දෙන මෙන් ඉල්ලීය. මුදලාලි එය සැලකුයේ තමාට කරන ඉමහත් ගෞරවයක් ලෙසය.

සතියකට පසු තෝරාගත් දෙදෙනාට ටෙලිග්‍රෑම් යැවීම බාර වූයේද බිල්ලාටය.

අලුත් දෙදෙනා මුදලාලි සහ බිල්ලා යටතේ දවස් කීපයක් පුහුණුව ලදහ.

ඉන් පසු දවසක හොඳම වෙලාව බලා ඉතා සන්සුන් ලෙස බිල්ලා වෙත ගිය ගොළුවිජේ ඔහුට තවත් තුණ්ඩුවක් දුන්නේය. එහි මෙසේ විය:

"ලියන මහත්තයා ගොළුවෙක් යටතෙ වැඩ කරන්න අකමැති ඇතිනෙ. මහත්තයා මං ඉන්න තැනත් නැති තැනත් මට ගොළුවනෙ කියන්නෙ. ඒ හින්දා මහත්තයා ආයෙ වැඩට එන්න ඕනෙ නෑ. තව මාසෙක පඩිය ගෙදරට එවන්නං. ගොළුවා."

බිල්ලා ඒ කොළ කෑල්ල පොඩි කර බැණ බැණ ගොස් මුදලාලි හමුවුවත් මේ සිදුවීම කලින්ම අපේක්ෂා කළ මුදලාලි ගොළුවිජේ දෙස බලා පෑවේ පියෙකුගේ වැනි සිනාවකි.

පිරිස් පාලනය පිළිබඳ මනා අවබෝධයක් දැන්මම විජේට ඇතැයි මුදලාලිට එදින සිතිණ.

ඒ සිද්ධියෙන් පසු මුදලාලි ගොළුවිජේගේ හෝටලේ පැත්තේ ගැවසීම නැවැත්වූයේ එය අනවශ්‍ය අත පෙවීමක් යැයි සිතූ නිසාය.

ආතක්පාතක් නැතිව පාත රට පැත්තේ සිට කොළඹ හරහා කුරුණෑගලට ආ ගොළු කොල්ලා නගරයේ ව්‍යාපාර ලෝකයට නිල වශයෙන් ඇතුළු වූයේ 1984 ජූලි මාසයේ 10 වෙනිදාය. ඉන් සතියකට පසු මුදලාලි සහ හාමිනේ දඹදිව බලා ගියහ. ගොළුවිජේද හෝටලේ වසා ගුවන්තොටුපළට ගිය අතර ඒ දෙදෙන ගුවන් ගතවීමට පෙර දණ ගසා වැන්දේය.

පාඩම්

වීවීගේ පළමු වැනි ගොල්ෆ් පාඩම සඳහා රාධාද ආවාය. රාධා කලින් ආ අතර වීවී පසුව ආවේය. මේ ඔවුන්ගේ ආදර රහස මට කියූ පසු දෙදෙනා එකට මා හමුවන පළමු වතාවය. ඒ රහස තුළ ජීවත්වීමට දෙදෙනා කොතරම් හුරුවී සිටියේද යත් විකක් හෝ චකිතයක සේයාවක් තිබුණේ ශේක්ෂ්පියර් නාට්‍යවල රඟපෑමෙහි පවා හුරු රාධා තුළ පමණි. මම වහාම මගේ ගොල්ෆ් බෑග් එක රැගෙන මිදුලට බැස්සෙමි. වීවී කොට කලිසමකින් සහ බතික් කමිසයකින් සැරසී ඉදිකොළ තොප්පියක් පැළඳ උන්නේය. රාධාගේ කොට්න් කලිසම සහ සාක්කු දෙකේ ලොකු කපු කමිසය ඇයටම ආවේණික පෙනුමක් ලබා දුන්නේය. මම එඩ්මන්ඩ් ලවා ගොල්ෆ් බෝල බෑග් එකක් ගෙන්වා ගතිමි. ඔහු එය රැගෙන ආවේ වීල් බැරෝවක තබාගෙනය. මගේ සැලැස්ම වූයේ වීවී එක තැනක තබා යම් ඉලක්කයකට බෝල එල්ල කරන්නට වෙජ් එක ඔහුගේ අතට දීමටයි. අප සිටි තැන ගෝල්ෆ් බෝල ශ්‍රේණිය බිම හැලූ එඩ්මන්ඩ් වත්තේ ඈතට ගියේ වැටෙන බෝල එහි සිට ඇහිලීමටය. මා මේ පුහුණුව කරනු ඔහු ඕනෑ තරම් දැක ඇත.

ගොල්ෆ් පාඩම් කාටවත් කියාදීම යනු මට හුරුපුරුදු දෙයක් නොවේ. අර්සනායගම් මහතාත්, අයර්ලන්ත කවියාත් ගොල්ෆ් ක්‍රීඩාව ගැන කියාදුන් පුංචි පුංචි උපදේස මට ඉබේම වාගේ මතක් විය. එහෙත්, ඒ අවස්ථා දෙකේදීම ගුරුවරයා සහ ගෝලයා අතර නොතිබුණු කුමක්දෝ පිලිස්තීනු ස්වභාවයක් මෙහි

ඇතැයි මට සිතිණි. මා වහාම මගේ සිතටම දෝෂාරෝපණය කර ඒ සිතිවිල්ල මැඩ දැමුවේ එය වලව්කාර සිතිවිල්ලක් යැයි වරදකාරී හැඟීමක් ඇති වූ බැවිනි. මේ ක්‍රීඩාව නුගත් කඩකාරයකුට නොගැළපෙන්නේය යන සිතිවිල්ල මා තුළ වීද නොවීද?

ගොල්ෆ් බෝලය ගුවනේ එල්ල කිරීම කිරිකජු වැඩක් යැයි සිතා සිටි වීවීට එහි අමාරුව තේරුණ විට ඔහු පැමිණි ආත්මාභිමානය මෙල්ල වී ශිෂ්‍යයකු බවට පත් විය. බෝලය ගුවන්ගත කිරීම පවා පහසු වැඩක් නොවන බව ඔහු වටහා ගත්තේය. වෙජ් එක කැරකැවිය යුතු ආකාරය පිළිබඳ පුහුණු වන්නට ව්‍යායාම කිහිපයක් ඔහුට කියා දුනිමි. "ඕනැම ක්‍රීඩාවකට තියෙනවා. විශේෂයෙන් පාවිච්චි වෙන මාංශපේශි. ගොල්ෆ්වලට පාවිච්චි වෙනව අපේ අත්වලයි පිටෙයි තියෙන අපි සාමාන්‍යයෙන් පාවිච්චි කරන්නැති මසල්ස්." මම කීවෙමි.

ඉක්බිතිව මම ඩ්‍රයිවර් එක ගෙන වත්තේ එක් එක් ප්‍රදේශවලට එක් එක ගමන් මාර්ග ඔස්සේ බෝලය එල්ල කරන සැටි ඔහුට පෙන්වීමි. ඔහුට වුඩ්ස් පිත්ත දී තරමක් දුර ගහන්නැයි කී විට බෝලයක් දෙකක් ගුවනේ එල්ල කරන්නට ඔහුට හැකි විය. ඕනෑම දෙයක් ඉක්මනින් අල්ලා ගැනීමේ හැකියාව ඔහුට ඇති බව මට පෙනිණ. ඔහුගේ සිරුරේද වූයේ කිසිම ක්‍රීඩාවක් කර නැති කෙනෙකුගේ දරදඬු බව නොවේ.

මම ඔහු සමග ගොල්ෆ් වටයක් සෙල්ලම් කරන්නට පටන්ගත් විට රාධා පිටව ගියාය.

"එයාව හොඳ ළමයෙක් කරල ගන්න එහෙනං" යැයි පිටත්වීමට පෙර රාධා මට කීවාය.

ඇය මෙවැනි අදහසක් ඇගේ සිනමා නළු පෙම්වතා සම්බන්ධයෙන්ද ඉස්සර දවසක මා සමග කියූ බවක් මට සිහි විය. "එයාට මගෙ උදව් ඕනැ බන්දු හොඳ නළුවෙක් වෙන්න උනත්." ඇය අතීතයේ දවසක තුගේගොඩදී මා සමග කී බවක් මට සිහිවේ. අප වෙතින් ඉවතට යන ඈ දෙස මා බැලුවේ උණුසුම්

අනුකම්පාවකිනි. මා එල්ලය බලා බෝලය එල්ල කරන අතර වීවී පිටුපස හැරී ඈ දෙස බැලූ බව මම ඇස් කොනින් දැක්කෙමි.

"වීවර් හිතනව බිස්නස් ලෝකෙ උඩට යද්දි මේකත් ඕනැ වෙන්න පුළුවං කියලා." ඔහු කීවේය.

"එහෙම කතාවක් තියෙනවා. ගොල්ෆ් පිට්ටනිවල ඇත්තමට ගහන්නෙ ලොකු ලොකු බිස්නස් ඩීල් මිසක් බෝල නෙමේ." මම කිව්වෙමි.

එදින මම ඔහුට ගොල්ෆ් ගැන නොයෙක් දේ කියා දුන්නද දේශපාලන අදහස් ගැන කිසිවක් නොකීවෙමි. ඔහුගේ මනස නමැති බෝලය සෙල්ලමට ගන්නට මට ඉඩක් ලැබුණේ නැත. අචේතනික ගොල්ෆ් බෝලයක් ඉලක්කයට යවන්නාක් මෙන් ඔහුගේ මනස බෝලයක් සේ රෝල් කර යවන්නට මට හැකියාවක් නැත. කොහොමත් අනුන්ගේ මනස් සමග සෙල්ලම් කිරීම නොකරන මට එය බෙහෙවින් අමාරු වැඩකි.

එදින රෑ රාධා මට කතා කළාය. අප සෙල්ලම් කෙරුවේ බෝල සමග පමණ යැයි මම ඇයට කීවෙමි.

"අයිල් ප්ලේ විත් හිස් බෝල්ස් යූ ප්ලේ විත් ද මයින්ඩ්." රාධා සිනාසෙමින් කීවාය. ඇගේ අතේ දැන් ඇත්තේ දෙවෙනි හෝ තුන්වෙනි වයින් වීදුරුව විය හැකියැයි මම අනුමාන කළෙමි.

විනීත විදග්ධභාවයේ පහන් කන්දකින් පහළට රුරා වැටෙමින් සිටින සුන්දර ගැහැනියක මගේ සිතේ ඇඳිණ.

ගොල්ෆ් පිට්ටනියේදී වීවීගේ මනස ආක්‍රමණය කිරීම රාධා සිතූ තරම් ලෙහෙසි නොවීය. ගොළුබවින් මිදෙන්නට තරම් හදිස්සියක් හෝ කැපවීමක් ගොල්ෆ් ඉගෙනීමට ඔහු වෙතින් පළ වූයේ නැත. ඔහු පුහුණුවට ආවේද කඩින්කඩය. තාමත් ඇයට 'වීවර්' කියා කතා කළත් තමන්ට කායිකවද මානසිකවද යටත් වූ ගැහැනියක බල කර කියන දේවල් කරන්නට ඔහුගේ අකැමැත්තක් ඇති බවක්ද පෙනිණ. "රාධ වීව කියනවනෙ මේක කරනෙක

හොඳයිම කියල නැත්තං මං සර්ට කරදර කරන්න එන්නෑ." ඔහු වරක් කීය.

මම ඒ වගක් රාධාට නොකීවෙමි. සුවඳ වියැකී යන පිච්චමලක් මගේ සිතේ ඇඳිණ.

"මට කරදරයක් නෑ." මම කීවෙමි.

* * *

වීවීට කටහඬ ලැබුණු පසු ආරම්භ කළ ව්‍යාපාර කිහිපයකම 'වීවී' යන නම භාවිත කර තිබුණේය. සිංහ රෝහල ඉදිරිපිට විවෘත කෙරුණු විශාල පිරිසකට අසුන්ගෙන කෑමබීම ගන්නට හැකි 'හෝටලය' නම් කර තිබුණේ 'අපිඅපි' යනුවෙනි. එය විවෘත කරන දා ප්‍රධාන ආරාධිතයා ලෙස යන්නට සිදු වූයේද මටය. නගරයේ යම් පන්සලක හාමුදුරු කෙනෙක් පන්සිල් දුන් අතර වීවීගේ උපදේශක හාමුදුරුවෝ 'අපිඅපි' යන්න ගැඹුරු ලෙස අර්ථකථනය කරමින් 'අපි' යනු සිංහල අපි බවත්, දෙවන 'අපි' යනු බෞද්ධයන් බවත්, ඒ නිසා ඒ දෙක එක්වූ කල මේ නමින් ඇඟවෙන්නේ ශ්‍රී ලංකාධරණී තලය බවත්, උන්වහන්සේ වදාළ අතර, ඒ ටික කවියටද නගා ගැයූ සේක. නගරවල ව්‍යාපාර සිංහලයන් විසින් වැඩිවැඩියෙන් අත්පත් කරගත යුතු බව උන්වහන්සේ වදාළහ.

මට කතාවක්ද කරන්නට ආරාධනා කෙරිණ. හෝටලේ ඉදිරිපිට විශාල බෆල් දෙකක් තබා තිබුණු බැවින් මා කරන කතාව නගරයේන් සෑහෙන දෙනෙකුට ඇසෙන බව මම දැන සිටියෙමි. මෙවැනි අවස්ථාවල කතා පවත්වා මට පුරුද්දක් නැති බැවින් මම කටට එන දෙයක් කියන්නට වීමි.

රාධාගේ පෙම්වතාට හෝ ඔහුගේ උපදේශකයන්ගේ අදහස්වලට අභියෝග නොකළ මම නගරයේ සිටින සියලු දෙනා

අපිඅපි සේ දකින්නට පුරුදු විය යුතු බව පමණක් කීවෙමි. 'අපිඅපි' යන අදහස පහළ වූ සැටි මා දන්නා බවද කීවෙමි.

වීවී, විනීතා, රාධා සහ තවත් අය ආරාධිතයන්ගේ පුටුවල වාඩි වී සිටි පේළිය දෙස බලන විට රාධාගේ මුහුණ රතු වී තිබුණේ රස්නය නිසාද වෙනයම් දෙයක් නිසාදැයි මම නොදත්තෙමි.

ස්තුති කතාව කළ වීවී මගේ අදහසුත් බෝධි පූජා හිමියන්ගේ අදහසුත් දෙකම අගය කර අප දෙදෙනාටම ස්තුති කළේය. අපිඅපි හෝටලේ අරමුණ ජාතියට සේවය කිරීම මිස ලාභය නොවන බව ඔහු කීවේය.

සිංහ රෝහලට අලුත්ම හෘද රෝග ඒකකයක් එක් කරන බවද ඔහු නිවේදනය කළේය. එවිට හෘද සැත්කම් සඳහා කොළඹ ගොස් විජාතික රෝහල් පොහොසත් කරන්නට අවශ්‍ය නැති බව ඔහු කීවේය.

එදින දවස පුරාම 'අපිඅපි' වෙත එන අයට කිරි පැකට්ටුවක් නොමිලේ දෙන බව නිවේදනය කළේ අලංකාර වචනයෙන් මයික්‍රෆෝනය මෙහෙයවූ නිවේදකයාය. වෙසක් දන්සැලක් තරම් පෝලිමක් අපිඅපි ඉදිරිපිට සැදිණ. කිරි පැකට් එකක් වෙනුවෙන් ඒ ගිනි අව්වේ පෝලිමක ඉඳීම තාර්කික දෙයක්දැයි ඇපසු එන අතර මම සේනගෙන් ඇසුවෙමි.

"එහෙම තමයි සර් අපේ මිනිස්සු. මිනිහ ඡන්දෙ ඉල්ලුවොත් අපිට නොමිලෙ කිරි පැකටුත් දුන්නනෙ කියලා ඡන්දෙ දෙනවා." සේන කිව්වේය.

මා කල්පනා කරමින් සිටියේ රාධා කී දෙයකි. ඇය කියන හැටියට වීවී හෘදරෝග ඒකකය සාදන්නේ 'බලගල්ල සර්ට එහෙම කරදරයක් උනොත්' යැයි ඔහු සිතන බැවිනි. පප්පා සහ ඩීඇඩ්ජ් බාප්පා හෘදයාබාධවලින් මියගිය බව ඔහු ඇයට කියා ඇත. 'බලගල්ල සර්ලට හාට් ප්‍රශ්නෙ තියෙනව' යි ඔහු ඇයට කිව්වේය. එය මා වරක් පරීක්ෂා ඩර්ඩන්ස් රෝහලේ වෛද්‍යවරයා මාර්ගයෙන් දොස්තර සමරසේකර ඔස්සේ වීවී වෙත ආ දෙයක්දැයි

මම නොදනිමි. දොස්තර සමරසේකර අපේ පවුලේ හෘදයාබාධ ඉතිහාසය ගැන දනියි.

"පුදුම ආදරයක් ඔයාට තියෙන්නෙ." රාධා මට කීවාය.

විනීතා අප වෙත ආවේ මුලින්ම වීවීට පාඩම් කියා දෙන්නැයි කියාගෙන ආ ආකාරයෙන්ම වුවත් ඇය කිව්වේ ඊට වඩා ආත්මශක්තියත් ඇති කියමනකි.

"දැං ඉතිං දෙන්න තැං තැංවල රහස් කතා කර කර ඉදල හරියන්නෑ." ඇය කීවාය.

අප දෙදෙනාටම එය වැටහී නොගිය නිසා අපි ක්ෂණිකව නිහඬ වීමු. තමාගෙන් වැරැදි යමක් කියවුණාක් මෙන් විනීතා මාතෘකාව මාරු කළාය.

මම විනීතා කී ප්‍රහේලිකාත්මක කියමන සේනට කිව්වෙමි.

"ඒ ගෑනි විතරක් නෙමේ සර්. අපේ කට්ටියත් හිතන් ඉන්නෙ සර් රාධා මැඩම්ව බඳියි කියල."

"එයා මගෙ යාළුවෙක් විතරනෙ."

"අපේ රටේ ගෑනියෙක් මිනිහෙක් යාළුවෙනව කියන්නෙ වෙනම එකක්."

"ඒක වැරැදියිනෙ." මම කෝපයෙන් මෙන් කිව්වෙමි.

"කාට අනුවද වැරදි? දැන් ඔය සර් විවෘත කරපු එක හෝටලයක් කිව්වට හෝටලයක්ද? හෝටලයක්නං කෝ කාමර? අපි ටීචර් කිව්වොත් ගෑනුකෙනෙක්. කෑම කිව්වොත් බත්. බත් කමු කිව්වොත් කෑම කමු. ගෑනි කිව්වොත් වේසි. පවුල කිව්වොත් ගෑනි. ප්‍රජාතන්ත්‍රවාදෙ කියන්නෙ ඡන්දෙ. ඔව්ව වැරැදියි කියන්ඩ බැනෙ. මේක වෙනම ලෝකයක්."

මම සේන කී සියලු වචනයක් ගැනම එකිනෙක ගෙන සිතා බැලුවෙමි.

"සර්ලා ඉන්නෙ එක ලෝකෙක. අපි ඉන්නෙ තව ලෝකෙක." ඔහු නිගමනය කළේය.

"භාෂාවෙන් උනත්?"

"නැත්තං! ඉස්සර ඇන්ඇමල මේ ගංවලට ඇවිල්ල සහෝදරය සහෝදරිය කියල මිනිස්සුන්ට කතා කරපුවම මිනිස්සු හොල්මං. මේ ලොකු ලොකු මහත්තුරු ඇවිත් අපි වගේ දුප්පත් මිනිස්සුන්ට හේනමාමලාට, පද්දන්ට, හුන්නන්ට, බඩහැලයන්ට සහෝදරය සහෝදරිය කියන්නෙ ඇයි කියල මිනිස්සු බැලුවා. බොරුවක් කරනවා කියලමයි හිතුවෙ. උඹලා, තොපි, තමුසෙලා අරව මේවා කියල කතා කරපු වලව්කාරයන්ටම ඡන්දෙ කෙළල ඇරියෙ ඒකයි. කුරුණෑගලින් සමසමාජකාරයො කීදෙනෙක් දිනුවද බලන්ඩකො. මේක මාර වහල්ලුන්ගෙ රටක් සර්."

සේනගේ කතාව මට අමුතු ලොවක් විවර කරන්නාක් සේ විය. ඔහු කියන දේ ඇත්තදැයි මට කිව නොහැකිය. එහෙත්, ඔහු නිසා මා වෙත විවර වන්නේ අලුත්ම ලෝකයකි. මා සමගම වසර ගණනාවක් ජීවත් වූ සේනට මා සලකා ඇත්තේ ගොළුවෙකුට මෙනියි මට සිතිණ. වාමාංශික නැඹුරුවක් ඇතිව ලන්ඩනයේ සිටි මාත් වාමාංශික නැඹුරුවක් ඇතිව, ලංකාවේ සිටි ඔහුත් අතර මෙවැනි විඥානමය පරතරයක් ඇත්තේ කෙසේද? එහෙත්, අප එකිනෙකා වෙත සමීප කළේද ඒ පරතරයමය.

"දැන් බලන්න අර මිනිස්සු පෝලිමේ ඉඳල කිරිපැකට් ගන්නෙ. මොකවත් නෙමේ වහල්කම. වහල් හිමියා දෙනවා වහල්ලු ගන්නවා." සේනගේ මුහුණේ වූයේ මට තේරුම්ගත නොහැකි කෝපයකි.

නිධානය

රාධා මට පුදුමාකාර කරුණු දෙකක් හෙළිදරව් කළාය. එකක් ලොමු දැහැ ගැන්වෙන එකකි. අනික මගේම බාප්පා ගැන ගෞරවය ඇති කළ එහෙත්, ඒ මට කවදාවත් ඔහුට ස්තුති කළ නොහැකි වූ දෙයකි.

ශ්‍රීරාම් හෝටලයට මංකොල්ලකරුවන් ඇතුළු වූ දාට පහුවදා පාන්දර ගොළුවිජේට අර දේවදර්ශනය ප්‍රාදුර්භූත වී සේදරමන් මුදලාලි සහ සාජන් නිධානය සඟවා ඇති තැන දක්වාලීය.

මුදලාලිගේ කවුන්ටරය පිටපස ඇති උස් මේසය යට ගෙබිමේ ටයිල් එකක් හරියටම බිමට අලවා නැති බව දෙවියන් නිකුත් කළ සංඥා ඔස්සේ ගිය ගොළුවිජේ දැක්කේය. මේ මුදලාලිගේ දෙපාවලට යට වූ තැනය. ආපසු කුස්සියට ගිය ඔහු ලොකු මන්නා පිහිය රැගෙන ගොස් ඒ ටයිල් එක ඔසවා බැලීය. එය කලෙක සිට පවත්නා රහස් 'සේප්පුවක්' වැනි තැනක් බව ඔහු දැක්කේය. ඒ හතරැස් වළ මැද තහඩු විස්කෝතු පෙට්ටිය තිබිණි. ඔහු එය රැගෙන මන්නා පිහිතුඩින්ම තල්ලු කර පියන ඇරියේය. නිධානය එහි විය. රෝල්කර රබර් බෑන්ඩ් දමා තිබූ මුදල් නෝට්ටු මිටි එළියට ගත් ගොළුවිජේ පෙට්ටිය නැවත වසා වළෙන් තබා ටයිල් එක නිසි ලෙස තැන්පත් කළේය. ඔහුගේ හෘද ස්පන්දනය වැඩි විය.

මුදල් නෝට්ටු මිටි රැගෙන ඔහුගේ කාමරයට ගිය ඔහු ඒවා ඔහුගේ බෑග් එකේ අසුරා හෝටලයෙන් පැන යාමට සූදානම් වූයේය. එහෙත්, දේවරූප පේළිය දෙස වරක් බැලූ ඔහුට පැන

යාම පිළිබඳ අදහස සම්පූර්ණයෙන්ම අත්හරින්නට සිතුණේය. සියලු දෙවියෝ ඇසි පිය නොහෙළා එක් ඇසිල්ලේ ඔහු දෙසම බලා උන්හ. එය නොයන්නැයි කියන බැල්මකි. ලක්ෂ්මී රූපය එක් ඇහි බැමක් නැටවූයේ කුමක්දෝ අඟවන්නට මෙනි.

ඔහු දෝතම දික්කර වරක් වැඳ ලක්ෂ්මී රූපය ගලවා දැතට ගත්තේය. එය පිටුපස කබොක් බිත්තියේ සිදුර තිබිණ. ඔහු මුදල් නෝට්ටු රෝල්කර පොලිතින් බෑග් එකක ඔතා ඒ සිදුරේ රඳවා ලක්ෂ්මී රූපය නැවත එල්ලුවේය. ඉන් පසු රූපයට වැඳගෙන මොහොතක් සිටි ඔහු හඳුන්කූරක් ගසා ඇඳේ දිගා වූයේය. ඒ සුවඳ දුම එතැනින් නික්ම ඔහුගේ චිත්තාභ්‍යන්තරයෙහි වැද පාවෙන්නට වූයේය. ඔහුට මොහොතකවත් නින්දක් නොවිණ. මුදල් ආපසු රැගෙන ගොස් තිබුණ තැන තබන්නට ඔහුට කිහිප වරක් සිතුණේය. ඒ සඳහා සූදානම් වී නැගිට ඇඳෙහි හිඳගත්තේය. ලක්ෂ්මීගේ දෙබැම ආශීර්වාදාත්මක තාලෙකට යළිත් වරක් නටනු ඔහු දැක්කේය. ලක්ෂ්මී දෙවඟනට කිසිම හෘදසාක්ෂියේ වේදනාවක් නොවිණ. මුදල් සඟවා තිබුණේ ඇගේ හදවතට පිටුපසිනි.

ඒ කෙසේ වෙතත් දවස් කීපයක් බලාගෙන ඉන්නට වී නම් ඔහු ඒ නිධානය ඔහුගේ අර තිබුණු තැනම ආපසු තබන්නටද ඉඩ තිබුණේය.

හෘදසාක්ෂියට වඩා දෛවය ඉස්සර වී සාජන් සහ සහචරයා පහුවදා රාත්‍රියේම ආහ. එදින රාත්‍රියේ ඒ තිදෙනා තමන්ගේ නිධානයට අත්ව ඇති ඉරණම වටහා ගත්හ.

* * *

රාධා මේ ලොමු දැහැගැන්වෙන පුවත මට කියන්නට තකහනියක් මා සොයා ආවාය. මෙය විශ්වාස කරන්නට හැකිදැයි ඈ ඇසුවාය. මට ඊට පිළිතුරක් දිය නොහැකි විය. "වීවී හොරෙක්

කියල ඔයා හිතනවද?" ඇය නැවත ඇසුවාය. මම ඇය අසන්නට කැමති පිළිතුර දුන්නෙමි: "නෑ."

"මම මේ ඔක්කොම අත ඇරල දාල කොළඹ යන්න ලෑස්ති වෙනකොට තමයි ඔය ටික කිව්වෙ." ඇය කීවාය.

"තාමත් ෂෙහරසාද්." මම කිව්වෙමි.

"යා. බිලඩි ෂෙහරසාද්."

"ඒක නෙමේ. ඉස්සරලා දවසක් කිව්වෙ කලබල ඉවරවෙලා මාසයක් විතර ගිහිං දෙව්යො පෙනුණ කියල නේද?" මම ඇසීමි.

රාධා මොහොතක් විස්තර මතක් කරන්නට තැත් කළාය.

"මට එව්ව එකක්වත් මතක නෑ. අමුතුම කතන්දර වනාන්තරේක දැන් අතරමං වෙලා ඉන්නෙ."

ඉන් පසු ඇය මගේ බාප්පා වූ හිටපු පොලිස් අධිකාරවරයා ගැන කතාව මට කීයේ ඊට මාද සම්බන්ධ බැවිනි. ශ්‍රීරාම් හෝටලයේ මංකොල්ලය සම්බන්ධයෙන් බොරුවට අත්අඩංගුවට ගත් සේදරමන් මුදලාලි සහ ගොළු කොල්ලාට අමානුෂික ලෙස පහර දුන් බව මා බාප්පාට කතා කොට සිද්ධිය විස්තර කළේ පොලීසිය ගැන මගේ අප්‍රසාදයද පළ කරමිනි. මගේ ජීවන විලාසිතාව ගැන විශේෂ පැහැදීමක් නැතිව සිටි ඔහු මේ චෝදනාව එතරම් බරපතළෙට ගනිතියි මම නොසිතුවෙමි. "පුතා. පොලීසියෙ ඉන්න සමහරු මිනිස්සු ඔච්ච කරන්නෙ ජේ.ආර්. උන්ව උසිගන්නන හින්දා. දැක්කෙ නැද්ද මිනිහ රේඩියෝ එකේ කරපු කතාව. සාමන්‍ය මිනිස්සු නෙමේ ඩීඅයිජී වාමදේවන්ගෙ ගේත් ගිනි තියලා අළුවෙලාම ගිහින්. පුතා දන්නැද්ද?" බාප්පා කීවේය. මා අහසින් පාත් වූ මිනිසකු සේ කතා කරන්නේ මන්ද යන්න ඔහුගේ ඒ ප්‍රශ්න කිරීමේ තිබිණ.

"ඔයාට කිව්වෙ නැද්දෙ එයා කරපු දේ?" රාධා ඇසුවාය.

"නෑ."

"ඔයාගෙ බාප්පා කාලෙකට පස්සෙ ඇවිල්ලා. වීවීලට වධ දුන්න සාජන්ව හොයාගෙන තියෙනවා. එයා කියල තියෙනවා තමුසෙට විරුද්ධව මම නීතියෙන් ක්‍රියා කරන්නෑ. මොකද තමුසෙල වගේ උන් මේ කාලෙ හැමතැනම ඉන්නවා. හැබැයි තමුසෙ මේ මිනිස්සු දෙන්නට දෙන්න ඕනෙ වන්දියක්. කියන්න ඇත්තෙ ඔය වගේ දෙයක් කියලා පස්සෙ වීවී හොයාගෙන තියෙනවා."

"මට බාප්පා කිව්වෙ නෑ." මම පුදුමයෙන් කීවෙමි.

"සමහර මිනිස්සු යුතුකම් ඉටුකරන්නෙ තමන්ටවත් නොදැනෙන්න."

"පස්සෙ සාජන් ඇවිල්ලා මුදලාලිට විසිපන්දාහ ගානෙ දෙපාරකට දීල අත්සන් අරන් තියෙනවා."

"එතකොට වීවී?"

ඉන්පසු රාධා කී විස්තරය නිසා සේදරමන් මුදලාලි බලන්න යන්නට ආසාවක් මා තුළ ඇති විය.

සාජන් පැමිණ පළමු විසිපන්දාහ දී ඇත්තේ කලබල දවස්වලින් මාසෙකට විතර පසුවය. දෙවැනි විසිපන්දාහ දුන්නේ තවත් මාස දෙකකින් විතර පසුවය.

ගොළුවිජේ සේදරමන් හෝටලේ බාරගැනීමට සියල්ල සූදානම් කර තිබියදී නැවත වරක් ගොළුවිජේගේ බැංකු පොත ඉල්ලාගත් මුදලාලි එය ආපසු ගෙනැවිත් දෙන විට අලුතින් රුපියල් ලක්ෂයක් එයට එක් වී තිබිණ. ඒ නිසා කුරුණෑගල නගරයේ ව්‍යාපාර ලෝකයට ඇතුළුවන්නට ගොළුවිජේට අඩුතරමින් රුපියල් ලක්ෂ හතරක් පහක්වත් ඒ වන විට අතේ තිබිණි.

"අර හොරකම් කරපු සල්ලි වීවී ආපහු දුන්න නම් නේද හරි?" රාධා මගෙන් ඇසුවාය.

"ඇයි එහෙම අහන්නෙ?" මම ඇසුවෙමි.

"වීවී හොරෙක්ද නැද්ද කියල තීරණය කරන්න."

"ඇයි?"

"මම කරන්නෙ හරි දෙයක්ද කියල තීරණ කරන්න." ඇය කීවේ අසරණ ස්වරයෙනි.

"ඔයා කරන්නෙ වැරැද්දක්ද කියල තීරණය කරන්න වීවීගෙ වැරැද්දක් හොයන්නෙ ඇයි?"

"එහෙම තමයි බන්දු සැබෑ ලෝකෙ ජීවත් වෙන මිනිස්සු. ඔයා වගේ තනියම ගොල්ෆ් ගහන මිනිස්සුන්ට ප්‍රතිපත්තිමය සම්මුතිවලට යන්න සිද්ද වෙන්නෑ. එහෙම වෙන්නෙ වෙනස් වෙනස් මිනිස්සු එක්ක වෙනස් වෙනස් දේවල් කරනකොට." එය ඇත්තකියි මමද සිතුවෙමි. ඇය එය ඉංග්‍රීසියෙන්ම කිව්වේ මට හොඳටම වදින්නට යැයි මම සිතුවෙමි.

"මම අම්මෙක් තාත්තෙක් නැති ගොළු කොල්ලෙක් නම් ඒ සල්ලි ගන්නවා." මම කිව්වෙමි. තමාගේම වරදකාරී හැඟීම සාධාරණීකරණය කරගන්නට තැත් කරන මගේ මිතුරිය ආචාරධාර්මික කල්දේරමක දමා තැම්බීම නොකළ යුතු නිසා මම නිහඬ වීමි.

සේදරමන් මුදලාලි ඉන්නා තැනක් සොයා ගන්නා ලෙස එදිනම සේනට කිව්වෙමි.

බාප්පා එසේ කර ඇත. සාජන් දෙවරකට රුපියල් පනස්දාහක් දුන් බව ඇත්තය. එහෙත්, ඔහු සැරෙන් සැරේ බීමත්ව පැමිණ කරදර කිරීම නැවැත්වූයේ නැත. පොහොසත් වන්නට ගැසූ සැලැස්ම වැරැදී නන්නත්තාර වූ සාජන් බීමෙන්ම විනාශ වී රැකියාවද අහිමි තැන තැන ඇවිදින්නට පටන් ගත් බව අපට සොයා ගන්නට හැකි විය.

ඇන්ටිගනී

ඇගෙන් යම් පණිවුඩයක් කවදා හෝ මා වෙත එන බව මම දැන සිටියෙමි. මා සාදාගත් ගොල්ෆ් වළල්ල වටේ මා කැරකි කැරකී සිටියේ ඒ පණිවුඩය එන දවස තෙක් අපේක්ෂාවෙන් බව මගේ චිත්තාභ්‍යන්තරය විමසන විට මට පෙනේ.

එහෙත්, ආවේ ඇගේ පණිවුඩය නොව, ඇ ගැන ආරංචියකි.

පාදෙණිය හන්දියේදී සිදු වූ වෙඩිතබා ගැනීමේදී විජිත රත්නායකට වෙඩි වැදී ඇත. මනාප පොරය කෙළවර වී ඇත්තේ ළය පසාරු කරගෙන ගිය උණ්ඩයකිනි. උණ්ඩය නික්මුණේ හරියටම කා අත වූ තුවක්කුවෙන්ද යන්න පැහැදිලි නැති වුවත් වෙඩි තැබීම සිදු වූ අවස්ථාවේ වික්‍රමසිංහද එතැන සිට ඇත.

ආරංචිය පැති කීපෙකින් මා වෙත ආ අතර, පළමුවෙන්ම ආවේ නාලිනීගෙනි. ඇය මගේ සෙල්ෆෝන් අංකය දැන සිටි බව මා දැන ගත්තේද එවේලේය. පසුව සේන කියූ ආකාරයට ඇය එය ඔහුගෙන් ඉල්ලාගෙන ඇත්තේ මාස ගණනකට පෙරය. ඇය මා අමතන්නට තැත් කරන්නේ කුමක් සඳහාද යන කුතුහලය සේන තුළ තිබුණත් ඔහු ඒ ගැන මගෙන් ඇසුවේ නැත.

ඇගේ ඇමතුම එන විට මා සිටියේ ටවර් ඔෆ් බාබෙල්හි ඇති ලිවින් තෝර්ට්ස් පොත් පෙළ යළි පෙරළා බලමිනි. ලෝකයේ සිටි ප්‍රකට දාර්ශනිකයන් ගැන විසිවැනි සියවසේ සිටි ප්‍රකට ලේඛකයන් විසින් ලියන ලද මේ කුඩා පොත් පෙළ ලන්ඩනයේදී

පරණ පොත් කඩයක තිබී ලාබෙට හමු වූ නිසා ගෙනා මම ටවර් ඔෆ් බාබෙල්හි තැබුවෙමි. මා ඒ පොත් මෙහි තැබුවේ විකුණන්නට වඩා නගරය පරීක්ෂා කරන්නට යැයි මට සිතේ. ෂෝපන්හවර්, ඩාර්වින්, මොන්ටේන්, ටොල්ස්ටෝයි, නීට්ෂ, තෝරෝ, ස්පිනෝසා, රූසෝ, මසිනි, වෝල්ටෙයර්, ජෙෆර්සන්, පැස්කල් තාමත් නොවිකිණී සිටිති. මකියාවෙල්ලි විකිනුණ බව පෙරේරා අන්කල් වරක් මට කීවේ ඉතා ප්‍රීතියෙනි. එය ඔහුගේද ජයග්‍රහණයක් වැනි විය. නගරවාසීන් තමන් වෙත නොදක්වන නොසැලකිල්ල නොසලකා ඒ ශ්‍රේෂ්ඨ චින්තකයෝ පොත් රාක්කයේ සිටිති.

ඇගේ ඇමතුම එන විට මා සිටියේ ඒ කර්කශ නගරයේ හුදෙකලා වූ චින්තකයන් ගැන චින්තනයේ යෙදෙමිනි. මට අවශ්‍ය වී තිබුණේද මේ පොත් නොවිකිනුණ බව කවදා හෝ කියන්නට මට ඉඩ දෙමින් ඒවා නොවිකිණී තිබෙන්නටය. එවිට මගේම ගොල්ෆ් වළල්ලේ ඇතුළේ චක්‍රීයකරණය වන්නට මට පුළුවන. එහෙත්, එසේ මැසිවිලි කියන්නට සිතා සිටි මා ඈත් වී සිටින්නට තැත් කළ ජීවිතය වෙත තල්ලු කරමින් වෙඩිල්ල පත්තු විය. ඒ නිසා මා මෙහි නොලියන්නට සිතා සිටි නාලිනී ගැන ලියන්නට මට සිදු වේ. මා ලියන ආඛ්‍යානයේ සිටින ස්ත්‍රීන් අතරින් කරුණාවේ උපරිම වචනයෙන් මා ලියන්නට අවශ්‍ය වන්නේ ඈ ගැනය.

"බන්දු මහත්තයා-" කොඳුරන්නාක් මෙන් කී ඇය සම්පූර්ණයෙන්ම නිහඬ වූවාය. ඒ හඬ හඳුනාගන්නට ඒ ටික ප්‍රමාණවත්ය.

ඇය මට මුලින්ම කතා කළේද මහත්තයා කියා පමණි. මේ ආඛ්‍යානය ලියන විට මට ඇගේ මේ දුරකථන ඇමතුම ආවේ අපේ විවාහය අවසන්ව අවුරුදු කීයකට පසුවදැයි ගණන් හැදීම අවශ්‍ය නැත.

ලන්ඩනයේ සිට පැමිණ අවුරුදු කීපයක් රස්තියාදු වන විට ලොකු නැන්දාගේ බල කිරීමට මම නාලිනී බලන්නට ගියෙමි. එවකට විසිතුන් හැවිරිදි විශ්වවිද්‍යාල ශිෂ්‍යාවක වූ ඇය විවාහ කර දෙන්නට ගැළපෙන කෙනෙකු සොයමින් උන්නේය.

අපට ඈතින් නෑකම්ද ඇති, කලෙක ඉඩකඩම් තිබුණද ටිකෙන් ටික ඉඩ බෙදිබෙදී ගොස් ආර්ථික අමාරුකම් ඇති පවුලක බාල දියණිය වූ ඇය දුටු වහාම මම ඇයට ආකර්ෂණය වීමි. එය හේතුවත් නැති අහම්බ ආකර්ෂණයකි. ඒ පළමු මුණ ගැසීමෙන් වසරකට විතර පසු ඉතා දැඩි ආයාසයක් දරා මා ඇයට බන්දු කියන්නැයි කී විට ඇය මට බන්දු මහත්තයා යැයි කියන්නට වූවාය.

මම ඇයට නාලි කිව්වෙමි. ඇයට විශ්වවිද්‍යාලයේදී කියන්නේත් "නාලි" යැයි ඇය කීවාය. ලොකු නැන්දා ඇය මට යෝජනා කලේ ඇය අපට කුලයෙන් සමාන පවුලක වීමත් ඇගේ ක්‍රියාශීලී සුන්දරත්වයත් නිසාය.

"මනාලි කිව්වත් කමක් නෑ." මම ඇයට විහිළු කළෙමි.

මාස කිහිපයක් අප අතර මිත්‍ර සම්බන්ධයක් පැවති අතර ලොකු නැන්දා දිනපතාම මගෙන් ඇසුවේ "මොකද පුතේ කියන්නෙ" කියාය. මට එක්වරටම කිසිවක් කියන්නට බැරි වූයේ විවාහයක් ගැන මාතෘකාවට අප දෙදෙනාටම එන්නට බැරි වූ නිසාය. ඒ නිසා මම මා මගෙන්ම ඈත් කර පරීක්ෂාවේ සැත්කම් පිහිය මා මතම තබන්නට වීමි.

* * *

බීබී ලන්ඩන් සිට ආවේ සිය පියාගේ මරණින් පසු වතුපිටි දේපොළ බලාගැනීම පවුලේ බාලම සේම එකම පිරිමි දරුවා වන තමා වෙත පැවරෙන්නේය යන වගකීම ලන්ඩන්වල සිටින ලොකු අක්කා බීබීගේ ඔළුවට දැමූ නිසාම නොවේ. ලන්ඩන් නගරයේ බොහීමියානු තරුණ කණ්ඩායම් සමග ඔහු යුරෝපය පුරා සැරිසැරුවත් පප්පා අපේක්ෂා කළ ආර්ථික විද්‍යා උපාධියෙන් අවසන් කරන්නට හැකි වූයේ අවුරුදු දෙකක් පමණි. ඉවක් බවක් නැති පොත් කියවන්නකු වූ ඔහු සිය නොටිංග්හිල් නවාතැනේදී කවියන්, ලේඛකයන්, නාට්‍යකරුවන්, සිනමා පිස්සන් ආදීන්ගෙන්

සැදී ලෝකය වෙත ඇදී ගියේ නිරායාසයෙනි. එය සැම අර්ථයෙන්ම නිදහස් ජීවිතයක් විය. නොටිංහිල්හි පෝර්ටබෙලෝ වීදියේ පිහිටි කාමර පහක පරණ ගෙයක් කුලියට ගෙන ඔවුන් ජීවත් වූයේ ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳ අලුත්ම අත්හදා බැලීම කරන කණ්ඩායමක් ලෙසය. බීබී දුටු හැටියට එය එංගලන්තයේ තවත් ඉතිරිව තිබුණු ගතානුගතිකවාදයන්ට සහ වික්ටෝරියානු සුචරිතවාදයන්ට අවසන් පරාජය අත්පත් කරදුන් දශකයයි. මීෂා, මෙලීසා, කේට්, බ්‍රොන්වෙන්, රිච්, ජොනතන්, ජේසන්, සූසන්, රඝු මේ පරණ ගෙදර අලුත් ජීවිතයක් ගත කළහ. මීෂා ජර්මනිය අප්‍රිය වූ ජර්මන් ජාතිකයෙකි. මෙලීසා ඇයට වඩා තිස් වසරක්වත් වැඩිමල් ධනවත් අයර්ලන්ත කවියකු හා පෙමින් වෙළී උන්නාය. ඔහුද ඉඳහිට එහි පැමිණ ගියද එහි රැයගත කරන්නට ආවේ නැත. එය කලින් පරම්පරාවේ කවියෙකුට ගැළපෙන තැනක් නොවේ. මා සමග සාහිත්‍යය ගැන කතා කරන්නට කැමැති ඔහු මා ඔහු සමග ගොල්ෆ් සෙල්ලම් කරන්නට රැගෙන ගියේ මතු නොව, මට ගොල්ෆ් සංගමයේ ක්ලබ් එක වැනි ඉතා ප්‍රභූ තැන්වලින් කැම බීම අරන් දුන්නේය. ගොල්ෆ් ගැන මට මුලින්ම කියාදුන් අර්සනායගම් මහතා ගැන මම ඔහුට කිව්වෙමි. ඒ නම කියන විටම එය දෙමළ නමක් බව හඳුනාගත් ඔහු ආනන්ද කුමාරස්වාමිගේ ඩාන්ස් ඔෆ් ශිව කෘතිය කියවා විඳි ආස්වාදය මා හා විස්තර කළේය. බ්‍රොන්වෙන් වේල්සයේ සුන්දර ගමක ගොවි පවුලක බාල දියණියයි. ඇය බීබීටද රිච්ටද එක සේ ආදරය කළාය. රිච් ඇමරිකාවේ සිට පැමිණ ලන්ඩනයේ කුඩා වේදිකා නාට්‍යවලට සම්බන්ධ වී සිටියෙකි. මේ සියලු දෙනා අතර, වැඩිමහල් කෙනා වූ සූසන් ඇමරිකාවේ සිට ලන්ඩනයට ආවේ බෞද්ධ දර්ශනය ගැන ආචාර්ය උපාධිය කරන්නට ශිෂ්‍යත්වයක් ලැබුණ නිසා වුවත් ඇය ලන්ඩන් විශ්වවිද්‍යාලයෙන් ඉසිඹුවක් ලද මොහොතේ නොටිංහිල් නවාතැනට ආවාය. ටිබෙට් ජාතික භික්ෂුවක් ඇයට ආදරය කළ නිසා ඔහු එහි පැමිණ රැය ගත කර ගියේය. ඇය ප්‍රසිද්ධ මහාචාර්ය ජේම්ස් ගෙයාගෙන් සිංහලද ඉගෙන තිබුණ නිසා බීබී සමග සිංහල කතා කළාය. ආර්ථික විද්‍යාව වෙනුවට ඉලක්කයක් නැති පොත් පිස්සුව බීබී තුළ වර්ධනය කරන්නට එක් හේතුවක් වූයේද සූසන්ය. ලස්සනට ගොඩ නැඟුණු වැකියක් දකින විට රෝමෝද්ගමනය වීම අතින් සූසන් සහ බීබී එකම ජානවලින් ආ දෙදෙනෙකු වැනිය. සුදු හමක් හා කළු හමක් ඇතුළේ එවැනි එක සමාන සංවේදනා තිබෙන හදවත් තිබීම ඒ වන විට බීබීට අරුමයක් නොවුණත් සූසන් සහ ඔහු අතර පැවැතියේ පුදුමාකාර සමානකමකි. බීබී ඇසුරු කළ අය අතරින් ලොකු අක්කාගේ සිත්ගත්තේ සූසන්ය. සැරෙන් සැරේ ඒ දෙදෙනා එක්ව සිංහල කැම ඉවීමේ මිතුරුකමක් වර්ධනය වූයේ බීබීගේ මැදිහත්වීමකින් තොරවය. ඊට හේතුව බීබී සහ සූසන් අතර සම්බන්ධය ප්‍රේම සම්බන්ධයක් නොවන බව අක්කාට හොඳටම ඒත්තු ගොස් තිබීම වන්නට ඉඩ ඇත. සූසන් බීබීට වඩා වසර අටකින් වැඩිමල් වීම එවැනි සම්බන්ධයක් ඇතිවීම වළක්වන සම්බාධකයක් යැයි අක්කා සිතන්නට ඇත. ජවහර්ලාල් නේරුගේ ඥාති පුත්‍රයකු වූ රඝු, නේරුගේ සාහිත්‍ය කුසලතා සහ ආදර කුසලතා ගැන පොතකට කරුණු රැස් කරමින් උන්නේය. පැනක් සහ රෝස මලක් නේරුගේ කබා සාක්කුවේ නිතරම තිබුණ නිසා රසවත් කවිය සහ රූමත් ස්ත්‍රිය යන විශිෂ්ට ඉන්දියානු උරුම දෙකම නියෝජනය කළ නායකයා නේරු යැයි රඝු කීවේය. කවිය සහ ස්ත්‍රිය පිළිබඳ උනන්දුව අතින් රඝු සහ බීබී නේරුගේ ඥාතියෝ වූහ.

තුන් වසරක් ගත වූ ඒ නිදහස්කාමී ජීවිතයේ පුදුමාකාර ප්‍රීතිය බිඳුණේ ක්‍රිස්ටීන් බන්දු බලගල්ලගේ පැවැත්මේ කේන්ද්‍රය වූ පසුවය. එය ශේක්ශ්පියර් නාට්‍යයක එන ආදරයක් වැනි එකකි. නොටිංහිල්හි ඉතා කුඩා නාට්‍ය සංගමයකට බැඳී නාට්‍යය උගන්නා විට හමු වූ ක්‍රිස්ටීන් සිය රන්වන් කෙස් වැටිය මසවා රබර් බැන්ඩ් එකක් දාගෙන බිම බලා සිටින සැටි ඈතට සිට බලා සිටිද්දී බීබී ඇය හා ආදරයෙන් බැඳුණේය. විවිධ රටවලින් ආ කළු සහ දුඹුරු මිනිසුන්ද රැඩිකල් සුදු ජාතිකයන්ද එකතුව නාට්‍ය නිෂ්පාදනය කළ ඒ කණ්ඩායම තුළ ඇය ඉතා ජනප්‍රිය වූවාය. බ්‍රිතාන්‍ය යටත්විජිතවාදය පමණක් නොව, ප්‍රංශ යටත්විජිතවාදයට ගොදුරු වූ රටවලින් ආ මේ තරුණ තරුණියෝ ජාතිවාදයද කළ

දුඹුරු කහ වර්ණද ඉක්මවා උණුසුම් මිත්‍රත්වයක වෙළී සිටියහ. මේ කියන දිනවල ඔවුහු ඒ වන විට අවසානයක් කරා ගොස් තිබුණු වියට්නාම් යුද්ධයට දක්වන ප්‍රතිචාරයක් වශයෙන් ඇන්ටිගනී නාට්‍යය නිෂ්පාදනය කරමින් සිටියහ. ඇමරිකානුවන්ගේ පරාජය අලුත් මිනිස් සබඳතාවන්ට අවකාශය සපයතියි ඔවුහු විශ්වාස කළහ. ක්‍රිස්ටීන් ඒ රන්වන් කෙස් වැටියට රබර් බෑන්ඩ් එක දැමූ තත්පරය ආවේද එය ඔහුගේ ඇස ගැසුණේද ඒ මාස ගණනක නාට්‍ය පුහුණුවේ එක් නිමේෂයකදීය. එය දෛවෝපගත නිමේෂයක් විය. ඔහු ඒ ආකර්ෂණීය තත්පරය ගැන පසු දවසක ඇට කී විට ඇය ඔහු බදා වැළඳගත්තාය. ඇගේ පැරණි පෙම්වතුන් කිසිවකු එවැනි දෙයක් කියා නැතැයි ඈ කීවාය. තමාගේ ජීවිතයෙන් පුංචි තප්පරයක් වෙනුවෙන් ඒ තරම් වටිනාකමක් ආරෝපණය කරන ඔහුගේ හදවත වෙනුවෙන් ඈ හද සපුරා විවර වූයේ ක්ෂණයෙනි. කාලයක් මිතුරකු සේ ඇය හා ගත කළ ඔහු ඇයගේ ස්ථිර ආදරය ඉල්ලා සිටියේ මිතුරු කණ්ඩායමක් සති දෙකක යුරෝපයේ සංචාරයක් සැලසුම් කර තිබියදීය. "මං ඔයාට ආදරේ කරන්නෙ ගොඩක් කල් ඉඳල. ඔයා දන්නෙ නැද්ද?" ඇය ඇසුවාය. "ලංකාවෙ පිරිමියෙක් කෙල්ලෙකුට ආදරෙයි කියන්නෙ බැඳල ගෙදර එක්ක යන්න." ඔහු කීවේය. ඇය ඔහුගේ දෙතොල මත පුංචි හාද්දක් තැබුවේ ඒ ලංකාවේ සම්ප්‍රදාය අගය කරන්නියක මෙනි. එහෙත්, දෙදෙනා එවැනි දීර්ඝ ජීවිත ගමනක නික්මෙන්නේ නම් ඒ ගැන නිදහසේ වාඩි වී කතා කරමුයි ඈ කීවාය.

යුරෝපා සංචාරයට ඇයද එක්වන නිසා දෙදෙනා අතර සම්බන්ධයේ ස්වභාවය කෙසේ විය යුතුදැයි සාකච්ඡා කරන්නට ඒ සති දෙකේදී ඉඩ ලැබෙනු ඇති බවට එකඟවනු ලැබිණ. ඔහු සමග ලංකාවට ගොස් ජීවත්වීම වුවද සලකා බලන්නට ඇය එකඟ වූවාය. අවශ්‍ය වෙතොත් ඇය සමග කැලිෆෝර්නියා ගොස් ජීවත්වන්නට කැමතිදැයි ඇය ඇසූ ප්‍රශ්නයට ඔහු පිළිතුරු දෙන්නට නියමිතව තිබුණේ යුරෝපයේදීය.

අනෙක් මිතුරු පිරිස සමග පැරීසියට ගිය බීබී එතැනදී ඔවුන්ගෙන් වෙන්ව බස්රියෙන් පාතුගාලයට පැමිණ පෝර්තෝ

නගරයේදී ක්‍රිස්ටීන් මුණ ගැසීමට නියමිතව තිබිණ. ඇය ඇගේ පළමු සිනමා රංගනය රූගත කරමින් ඒ වන විටත් පෘතුගාලයේ සිටි බැවිනි. එය ඉතා කුඩා චරිතයක් වුවත් එය ඇගේ නිළි සිහිනය සැබෑ කරලන්නක් විය. චිත්‍රපටය පුංචි නාට්‍යයකදී ඇය දුටු ඇන්තනී හොප්කින්ස් ඒ චරිතය සඳහා ඇය යෝජනා කර ඇය තමාගේ ඒජන්තවරියට හඳුන්වා දී තිබිණ. මේ ප්‍රථම රංගන අවස්ථාවෙන් ඇය ඉතා වැදගත් සම්බන්ධතා ජාලයකටද එළඹෙන නිසා ඒ අවස්ථාවේ වටිනාකම තවත් වැඩිය. එහෙත්, ඒ අවස්ථාව වෙනුවෙන් ඈ ලන්ඩනයෙන් පිට වූ දා බීබී බදා වැලඳ ඉකිබින්දාය.

පෝර්තෝ නගරයේ ඇය නැවතී සිටි නවාතැන්පොළ ඉදිරිපිට කුඩා උද්‍යානයක් විය. එය ප්‍රෞඪ පෙනුමින් යුතු මධ්‍යකාලීන ගෘහ නිර්මාණ තුනක් තුන් කොනින් ඇති අලංකාර කුඩා උද්‍යානයකි. සීත කාලය අවසන් බව නිවේදනය කරමින් උයනේ තැන තැන ටියුලිප් මල් පිපී නැගෙමින් තිබිණ. ඇය සමග ආදරය සහ අනාගතය ගැන සාකච්ඡා කර මුදුවක් පලඳවන්නට හොඳම තැන පෝර්තෝ නගරය යැයි ඔහුට සිතුණේ නගරයේ බොහෝ දැන්වීම් ලංකාව සිහි කළ නිසාය. කොස්තා අවන්හල ළඟ සිට බලන විට ඩවුරෝ නදිය එතෙරින් ෆොන්සේකා හෝටලයේ දැවැන්ත නාමපුවරුව පෙනේ. ඔහු හිඳ සිටින උද්‍යානය අසලම ඇති පටු වීදිය පෙරෙයිරාද සිල්වා යන නම දරයි. ලංකාවේ ඕනෑම නගරයක දැකිය හැකි මුහුණු හැඩද සෑම අවහන්හලක් ළඟම දැකිය හැකිය.

කොස්තා අවන්හල ළඟ මල් වෙළෙන්දෙකුගෙන් රෝසමල් තුනක්ද අතින් ගත් බීබී එය පිටුපසට කර සඟවාගෙන බලා උන්නේ නගරයේ දැවැන්ත ඔරලෝසු කණුව පෙනෙන මානයේ ඇති බංකුවක හිඳගෙනය. ලංකාවෙන්ම හදවාගෙන්වා ගත් පුංචි මැණිකක් එබ්බූ මුද්ද ඊදි සාක්කුවට ඔහු වරින් වර තට්ටු කර බැලුවේය. සාමාන්‍යයෙන් යමක් හෝ යමෙකු වෙනුවෙන් බලා සිටින්නට සිදුවන තැන්වලදී කියවන්නට පොතක් දෙකක් ඔහුගේ අතේ තිබුණත් මෙදින කියවන සිතක් අසලකවත් නොවීය.

කිව යුතු විශේෂ අලංකාරයක් නැති ඔරලෝසු කණුව දෙස සැරෙන් සැරේ බලමින් පැය දෙකක් විතර ගත කළ ඔහු ඇය නැවතී සිටින්නේ යැයි කියූ සංචාරක නවාතැන වෙත ගියේය.

ඇය රෝස මලක්ද සමග පණිවුඩයක් තබා ගොස් තිබිණි.

"බීබී. මගේ ආදරවන්තය. අලුත් ප්‍රංශ චිත්‍රපටියක පොඩි චරිතයක් ලැබුණා. ඒක අනපේක්ෂිත අවස්ථාවක්. ඒක ඔයයි මමයි දෙන්නම කැමැති ඇන්ටිගනී නාට්‍යය ආජන්ටිනාව පසුබිම විදියට අරන් කරන ෆිල්ම් එකක්. ෂූටින් තියෙන්නෙ බ්‍රසීලයේ. මට පෘතුගීසි කතා කරන්න පුළුවන් නිසා මාව නැතුවම බෑ. ආර්ජන්ටිනාවේ ඒකාධිපති පාලකයන්ට එරෙහිව අපි වගේ තරුණ අය කරන අරගලයට මේ චිත්‍රපටිය එළියක් වෙයි කියා අධ්‍යක්ෂක කියනවා. ඒ නිසා මෙය යහපත් බව සහ නපුර අතර තෝරා ගැනීමක්ද විය හැකි බව මගේ හදවත කියනවා. යහපත ඔබද නපුර මේ යන ගමනද වියහැකි බව මගේ හෘදසාක්ෂිය කිව්වත් මම මේ අවදානම ගත යුතුයි. ඊළඟ ගිම්හානයේ මම ලන්ඩන් එනවා. මිහිරි කුමරුනි මට සමාවන්න - ක්‍රිස්ටීන්."

එය ඔහුගේ හද බින්දේ මොහොතකට පමණි. වයින් සහ බියර් ඉතා අඩු මිලට ගත හැකි නගරයක් වන පෝර්තෝහිදී සිත් වේදනා වහා සුව වේ. ඒ නිසා හදවත් පැල්ම මැකී ගියේය. ක්‍රිස්ටින් ගියේ ඇ දිවි කැප කළ කලාව වෙනුවෙනි. ඔහු දුක් වූයේ ගමනට සුබපතා ඇ යැවීමට අවස්ථාවක් නොවීම ගැනය. නැවතත් බස් රථයෙන් ලිස්බන් බලා ගිය ඔහු එහි දවසක් ගතකොට පැරීසියට ගියේය. ලන්ඩනයෙන් ගිය මිතුරු පිරිස මගහැර ඒ වන විට පැරීසියේ සිටි ලංකාවේ ශිෂ්‍යයන් සමග දවස් කීපයක් ගත කළ බීබී ලන්ඩනයට ටෙලිග්‍රෑම් එකක් යවා අක්කා ලවා පවුම් පනහක පෝස්ටේ රෙස්ටන්තේ මනිඕඩරයක් ගෙන්වා ගෙන යළිත් වරක් කැලේ නගරය වෙත දුම්රියෙන් ගොස් ඩෝවර් බලා ඉංග්‍රීසි ඕඩය තරණය කරන්නට ෆෙරි එකකට නැගුණේය. ඉංග්‍රීසි ඕඩය මැදක් ආ කල ඩෝවර් වෙරළේ ධවල ගිරි ශිඛරය දර්ශනය වෙද්දී ගෙදර එන්නාක් වැනි හැඟීමක් ඇති විය. මේ දැන් තමා යන ලන්ඩනයේ ක්‍රිස්ටින් නොසිටින්නේය යන සිතිවිල්ල ඔහු සිතට

ගෙනාවේ සුදුපාට ශෝකයකි. ඩෝවර් සිට ලන්ඩන් බලා පයින් යාමේ දුෂ්කර ක්‍රියාවක යෙදෙන්නට සිතූ ඔහු පැය කීපයක් පයින් ගොස් ශෝකය නිවුණු පසු ඈෂ්ෆොර්ඩ් නගරයේදී බස් එකට නැංගේය. ඒ වන විටත් සිත් සන්සුන්ව තිබුණේය.

ලන්ඩනයට එන විට ඔහුගේ සිතේ වේදනාව දුරුකරන ආකර්ෂණයක් එහි විය. ඇමරිකානු පරාජය සමරන ජයපැන් පෙළපාලි සෑම පාරකම පැන නැග තිබිණ. අයර්ලන්තයට සහය දක්වන උද්ඝෝෂණද අධිරාජ්‍යවාද විරෝධී පෙළපාලිද විය. ඒවාගේ පෙරමුණ ගත්තේ බීබීගේ මිතුරු පිරිස වැනිම තරුණ කණ්ඩායම්ය. එතැන් සිට බීබීද ඒ කැගසන ජනගඟට එක් විය. මේ සියල්ලටමත් වඩා ඔහුගේ සිත් සුවපත් කළේ විවිධ ජාතීන් එක පොදියට එක්ව නිදහසේ ප්‍රීතිය විඳින නොටිංහිල් කානිවල් සමය පැමිණ තිබීමයි. ඔහු පාට පාට රැලි නංව නංවා ගලන මිනිස් ගඟේ දිය බිඳක්ව සැඟවුණේය.

* * *

පාදෙණියේ වෙඩි තැබීම ගැන නාලිනීගේ දුරකථන ඇමතුම මගේ සිතිවිලි ධාරාව මෙතරම් වටයක් මා රැගෙන ගියේ මගේ විඥානයේ ගොල්ෆ් වළල්ලක රවුමේ යන අභ්‍යන්තරික ගොල්ෆ් ක්‍රීඩාවකට මා යොමු කරමිනි. එය මා තනිව කරන මට ප්‍රීතිය ගෙනෙන සෙල්ලමක් වුවද සිය පුරුෂයා වෙඩි තබා මරා දමන ලදැයි මේ දැන් මට දැන්වූ ස්ත්‍රියට ඉන් ලැබෙන පිළිසරණය කුමක්ද?

එදා ක්‍රිස්ටීන් නාවේ ඇන්ටිගනී නිසාය.

ඇත්තටම එය අපූරු සිනමා කෘතියක් වෙතියි මමද සිතුවෙමි. එහෙත්, එය කවදාකවත් මහජන ප්‍රදර්ශනයට ආවේ නැත. ආර්ජන්ටිනාව තවදුරටත් නපුරේම ගිලී ගියේය. අපි ලන්ඩනයේ සිට ආර්ජන්ටිනාවේ සහ චිලියේ මහජන මර්දනයන්ට විරුද්ධව අරගල කළෙමු. පත්‍රිකා ලියා බෙදා හැරියෙමු. ඒ අරගල නිසාම

අපි ජාති, ආගම සහ සමේ පැහැය ඉක්මවා සහෝදරත්වයක එක්වී බැඳුණෙමු. ලන්ඩනයේ නිල ජීවිතය ජාතිවාදී ස්වරූපයක් ගත්තත් රැඩිකල් කණ්ඩායම්, කලාකාරයෝ සහ වීදි මිනිස්සු ඒ නිල ලන්ඩනයට වඩා සමානාත්මතාවාදී වෙනත් ලන්ඩනයක් ගොඩනගමින් සිටියහ. අධිරාජ්‍යවාදී ලන්ඩනය වෙනස් වෙමින් තිබිණ. ආසියානු, අප්‍රිකානු සැර කෑම පවා බ්‍රිතාන්‍යයන්ගේ දිය රස කෑම වේල් රස ගන්වමින් තිබුණේය. අද වන විට බහුජාතික නගරයක් බවට පත් වී ඇති ලන්ඩනයට විවිධ සංස්කෘතිවල අංග එකතු වන වේගය වැඩි වූයේ අප ආදරයෙන් බැඳුණු ඒ ඉරණම්කාර දවස්වලය. එහෙත්, නිල ලන්ඩනයේත්, නිල ලංකාවේත් ඒජන්තවරිය වන අක්කා කෙසේ හෝ මා කුදලා ලංකාවට එවන්නට බලා සිටියාය.

මා පැරීසියේ සිට ආපසු ලන්ඩනයට එන විට පවුල නමැති දඬුකඳේ මා බැඳලන්නට කෙනෙකු විසින් සැලසුම් කෙරිණ. ඒ අක්කා රමණීය. හැටගණන්වලම ලන්ඩනයට සංක්‍රමණය වූ පවුලක පුතෙකු වූ ගාමිණී ආටිගල නම් සාර්ථක නීතිඥයකු හා විවාහ වී සිටි අක්කා ලියන මහත්තයා එවන මුදල් සලාක ක්‍රමයට මට ලබාදීම බාරව උන්නාය. මගේ බොහීමියානු ජීවිතය ඇයට ඉව වැටුණු පසු මා ලංකාවට ආපසු එවන්නට සියලු කටයුතු සූදානම් කෙරිණ.

මට ඊළඟ ගිම්හානය තෙක් ඉන්නට හේතුවක් තිබේ.

අගෝස්තුවේ අවසන් දවසක ක්‍රිස්ටීන් ආවාය. ඇය මා බදාගෙන හැඬුවාය. ඇය ඉතා යහපත් ස්ත්‍රියකි; රූමත්ය; බුද්ධිමත්ය; වානේ වන් අධිෂ්ඨානය ඇත්තීය. එහෙත්, පියාගේ බීමත්කමින් විනාශ වූ පවුලක වැඩිමහලු දියණිය වන ඇය තාමත් පාසැල් යන නංගී සහ මල්ලීගේ අනාගතයද බලාගත යුතුය.

"මං ඔයා වගේ රදලයෙක් නෙමේනෙ. වැඩ කරන පවුලක කෙල්ලක්." ඇය කීවාය.

නිතර සමාජවාදී වචන මාලාවකින් කතා කළ ඇය නොටිංහිල්හි සිටි අප්‍රිකානු සංක්‍රමණිකයන්ගේ අයිතිවාසිකම් වෙනුවෙන් අරගල කළ කණ්ඩායමකද සාමාජිකාවක් වූවාය. අපේ යටත්විජිත ස්වාමි රටේ ඇය කම්කරු පාන්තික වන අතර, යටත්විජිතයක්ව පැවැති මගේ රටේ මා රදල කුමාරයකු වීම අපූරු උත්ප්‍රාසයක් විය. මා කුමාරයකු බවට පත් කළ පොල් වතු වගාව ඇගේ මුතුන් මිත්තන් ලංකාවේ දියුණු කළ කර්මාන්තයක් වීම අර උත්ප්‍රාසය තවත් වැඩි කළේය. මගේ ලන්ඩන් ජීවිතය මට ඉගැන්වූ වැදගත් පාඩමක් නම් මනුෂ්‍ය ලෝකය සරල රේඛාවලින් වෙන් කර විස්තර කළ නොහැකිය යන්නයි.

"මාව රදලයෙක් කෙරුවෙ ඔයාලගෙ මුතුන් මිත්තො එහෙ ඇති කරපු වතුවගා හින්දා." මම ඇයට කිව්වෙමි.

"මගෙ මුතුන් මිත්තො? ඒවා බ්‍රිතාන්‍යෙය ඉහළ පන්තිය කරපුව. අපේ පවුල් ඉස්සර ඉඳලම අධිරාජ්‍යවාදෙට විරුද්ධයි. ඒත් මම නම් ටිකක්වත් පැකිලෙන්නෑ ඒ ඉතිහාසෙට සමාවෙන්න කියන්න." ක්‍රිස්ටීන් මා වැළඳගත්තාය.

"ඒ ඉතිහාසෙ නොවුණ නම් 'රදල' කියන මමයි, රදල විරෝධී ඔයයි කවදාවත් හමු නොවන්න තිබුණ." මම මිමිනුවෙමි.

"ඉතිහාසෙ කියන්නෙ නැතුවම බැරි විකාරයක් නේද?" ඇය ඇසුවාය.

අපි නොටිංහිල් සර්වරාත්‍රී සිනමා ශාලාවකට වැදී ෆැන්ටම් ඔෆ් ඉන්ඩියා බලා උදෑසන වෙන්ව දෙපැත්තට වෙන්ව ගියෙමු. ඉන් පසු ඇය කැලිෆෝර්නියා බලා ගියාය. මා රමණී අක්කා සමග රණ්ඩු කර ඉල්ලාගත් පවුම් පනහක් ක්‍රිස්ටීන්ට දුන්නේ ඇය එපා කියද්දීය.

මා තවත් මාස නවයක් පමණ ලන්ඩනයේ ගතකොට සාමාන්‍ය බීඒ උපාධියක් අවසන් කළෙමි. අධ්‍යාපනික වශයෙන් යම් හෝ විශේෂඥතාවක් ඇත් නම් ඒ ඉංග්‍රීසි සාහිත්‍යය ගැනය.

ක්‍රිස්ටීන් දර්ශනීය කැලිෆෝර්නියාවේ සිට එවූ පළමු සහ එකම පෝස්ට්කාඩ් එකේද 'මිහිරි කුමරුනි' යන යෙදුම තිබිණි. එය මගේ හදවත ආනන්දනීය ආඩම්බරයකින් පුරවා ලූ වචන දෙකකි.

හොලිවුඩයේ දීර්ඝ කාලීන නිළි ජීවිතයක් ඇරඹූ ඇය චිත්‍රපට කීපයක දක්ෂ ලෙස රඟපෑවාය. ලංකාවේ උපන් ලේඛකයකු වූ මයිකල් ඔන්ඩච්චිගේ ඉංග්ලිෂ් පේෂන්ට් නවකතාව ඇසුරින් කළ චිත්‍රපටයේද ඇය එක් චරිතයක් ආකර්ෂණීය ලෙස රඟපෑවාය. එහි රූගත කිරීම් කරන අතර ඔන්ඩච්චි හමු වී නම් ලංකාවෙන් පැමිණි ශිෂ්‍යයකු ඇය ලන්ඩනයේදී දැන සිටි බව ඇය ඔහු හා කියන්නට ඇත. මා ඇයට ඉගැන්වූ එක් සිංහල වචනයක් ඔහුගේද ප්‍රියතම සිංහල වචනයක් බව හැන්ඩි රයිටිං කෘතියේ එන ඔහුගේ කවියක එයි: "වතුර"

"වතුර - වෝටර් - කොච්චර සමානද ඒත් කොච්චර වෙනස්ද?" ඇය එදා පුදුම වූවාය.

ලස්සන වතුර බින්දුවක් දකින ඇතැම් විට මට ක්‍රිස්ටීන් මතක් වේ. ඒ නිසා අවලස්සන වතුර බින්දු ඉතා දුර්ලභ වීම විටින් විට මා සිත වේදනා ඇති කරයි.

* * *

නාලිනීගේ ඇමතුම කවදා හෝ එතියි මම දැන සිටියෙමියි කියමින් මේ අතීතාවර්ජනය ආරම්භ කළ බව මම දනිමි. ඒ කුරිරු පණිවුඩය මා අපේක්ෂා කළ බවක් ඉන් ඇඟවේද? එය ෆ්‍රොයිඩියානු ලිස්සා යාමක්ද? උපවිඥානයේ ඇති ආසා අපේක්ෂා අනපේක්ෂිත මොහොතවල ලිස්සා පනින බව ෆ්‍රොයිඩ් කීවේය. "කට බොරු කිව්වත් දිව බොරු නොකියන බවට" ලස්සන සිංහල කියමනක් ඇත. එය ෆ්‍රොයිඩ්ට වඩා බොහෝ පරණ කියමනක් විය යුතුය. ඒ නිසා මා අපේක්ෂා කලේ එවැනි පණිවුඩයක් නොවන බව කීම අවශ්‍ය වේ.

මෙදින මේ ආරංචියෙන් කියවුණේ මා කලබල කරන කතාවකි. නාලිනීගේ පළමු ප්‍රේමවන්තයාද ඇගේ දෙවැනි සැමියාද වන විජිත රත්නායක වෙඩි පහරකින් මිය ගියේය. එය නාදුනන

වෙඩික්කාරයකුගේ උණ්ඩයකින් නොවන බව මම හරියටම දනිමි. ඒ දැනගැනීම සිදු වූයේ එදින රැයේය.

මගේ සිත ඒ කල හා මේ කල, මේ දේ සහ ඒ දේ අතර දෝලනය වෙයි.

ලියන මහත්තයා නාරම්මල ලොකු මාමා දඹදෙණිය නැන්දා, මැම්බර් බාප්පා, ඩීඅයිජී බාප්පා මා ලන්ඩනයේ සිට එනතෙක් බලා සිටියේ සියල්ල සූදානම් කරගෙනය. අපේ අත්තාගේ සහ කිරි අම්මාගේත්, පප්පා සහ අම්මාගේත් සොහොන් කොත් බලගල්ල වත්තේම තිබෙන නිසා ඒ සිව් දෙනාත් බලා උන්නේයැයි කියන්නට පුළුවන. මා කෙළින්ම පැමිණියේ පැරණි වලව්වක අලුත් බාරකාරයා හැටියටය. අශ්වයකු බැඳ ගොන් කරත්තයක් ඇදගෙන යාම වැනි වූ එය මට වහා එපා වී යතැයි සිතුණද මම මටත් පුදුම හිතෙන විදියට ඒ ජීවිතය වෙත ගියෙමි. එය අලසකමට දිරිදෙන ජීවිතයකි.

"බන්දූ හාමුටනං මේ ජීවිතේ එපාවෙයි. එංගලන්තෙ වගේ වේගෙයක් නැනෙ මෙච්චයෙ." ලියන මහත්තයා මගේ අලසකම ගැන කිව්වේය. ඔහු සිත්ගන්නා මනුෂ්‍යයෙක් විය. පප්පාගේ මරණයෙන් පසු අපේ ඉඩම් පාලනය කළ ඔහු ඉඩකඩම්වල ආදායම් යටිමඩි ගහන බව ලොකු නැන්දා එංගලන්තයටම ලියා එවා තිබිණි. එය අක්කා හෝ මා ගණනකට ගත් චෝදනාවක් නොවේ. බලගල්ල වලව්වේ ගුප්ත අභ්‍යන්තරය ලෝකය වෙත අනාවරණය නොවන අයුරින් ඔහු ආරක්ෂා කළේය.

"නෑ. මං එංගලන්තෙ හිටියෙත් අලස මිනිස්සු එක්ක තමයි." මම කීවෙමි.

"සුද්දොනං ඉතිං කම්මැලියොනෙ." ඔහු කීවේය. ලෝකය පුරා සියලු සුදු මිනිසුන්ගේ ස්වභාවය එක කෙටි වැකියකට කැටි කළ ඔහුගේ ප්‍රකාශය නිවැරැදි කරන්නට නොගියෙමි. මම සිනාසුණෙමි.

"අලස සුවය කියලත් එකක් තියෙනවා." ඔහු කීයේ මගේ අප්‍රසාදය මුහුණින් දැක්කාක් මෙනි.

"තියෙනවා?" මම පුදුම වීමි. මම ඒ යෙදුම ඉංග්‍රීසියට නගා අර්ථය පරීක්ෂා කළෙමි.

"තියෙනවා. මිනිස්සු එහෙම කියනව."

"නියම අදහසක්. ඒක තමයි නියම සුවය." මම ඔහු දිරිගැන්වීමි.

"බුද්ධාගමේනං ඒක එච්චර හොඳයි කියවෙන්නෑ." ඔහු බණ දහම් දන්නා කෙනෙකු බව මම ඒ වනවිටත් දැන සිටියෙමි.

"මම හිතන්නෙ බුදුහාමුදුරුවො මුකුත් නොකර කල්පනා කර කර ඉන්න ඇති." මම කීවෙමි.

"අපෝ නෑ. හරි වීරියක් කරපු කෙනෙක් උන්නාන්සෙ."

"මං කියන්නෙ බුදු උනාට පස්සෙ."

"මගෙ අප්පේ ඊට පස්සෙනෙ පුදුම වීරියක් කෙරුවෙ. අලිද නයිද කොටිද අංගුලිමාලද පිස්සොද ලෙඩ්ඩුද කියල නෑ, දූකෙන් මුදවන්ඩමයි බැලුවෙ. ලංකාවට කී සැරයක් නම් ආවද. එන එකනං සුරුස්ගාල එන්නැති. ඇවිල්ල අපිව දමනය කරනව කියන එකම ලේසි වැඩක්වැ. ආලවකල මොන යක්කුද අපිත් එක්ක බලනකොට."

ලියන මහත්තයාගේ උපහාස ශෛලිය කවදත් මගේ සිත් ගත් දෙයකි.

මා ඊට පසු ඔහු හා ගත කළ බොහෝ දවස්වල වතුපිටිවල විස්තරවලට වඩා කතා කළේ එවැනි කතන්දර ගැනය.

හැත්තෑව දශකයේ අග හරියේදී ලන්ඩනයේ රැඩිකල් පරම්පරාව තුළ සාහිත්‍යය, සංගීතය, ලිංගික නිදහස, දේශපාලන විප්ලවය සේම බුදුදහම ගැනත් ලාලසාවක් තිබිණි. සූසන්ට බුදුදහම ගැන පුදුම ගුප්ත ඇල්මකි. එහෙත්, කෙනෙකු බෞද්ධ වන්නේ කෙසේද යන්න ඒ ගැන හදාරන කෙනෙකුට කියා දෙන්නට මට හැකියාවක් නොතිබිණ. එමෙන්ම බෞද්ධකම ඇත්තේ ලංකාවේ පමණක්ය වැනි අදහසක් ලන්ඩනයේ නොතිබිණ. බුදුදහම යන වචනය නිසා මගේ සිතට එන්නේ අම්මාය. මා උපදින විට හතළිස් විය ඉක්මවා සිටි අම්මා මා බහතෝරන කාලය වන විටත් උපාසිකාවක වී උන්නාය. ඈ කී කතා සිහිකොට කීම හැරුණු විට බුදුදහම ගැන වෙනයම් හරයාත්මක දෙයක් සූසන්ට කියන්නට මට හැකියාවක් නොවිණ. අම්මාගේ බෞද්ධකම අලස සුවයට කිට්ටු එකක් බව මතක ඇත.

"මට නම් හිතෙන්නෙම බුදු හාමුදුරුවො කියන්නෙ කල්පනාවෙන් බරවෙලා නිකම්ම වගේ උන්න කෙනෙක් කියලා. හිතට එන එන අදහස් අල්ල අල්ල ඒ මොනවද කියල හරව හරව බල බල." මම ලියන මහත්තයාට කිව්වෙමි.

"ඔය සුද්දො බුදුහාමුදුරුවො ගැන හිතන විදිය." ලියන මහත්තයා තර්ක කළේය.

එය ඇත්තකියි මටද සිතේ. කතාවට අල්ලාගත් විට ලියන මහත්තයා මගේ අලසකම රැක දී කම්මැලිකම දුරලයි. ඒ නිසා අලසකම සුවයක් කරයි. පොල් ගස යනු මිනිසාගේ අලස සුවයට දිරිදෙන කරුණාවන්ත ගසකි. එවැනි කරුණාවන්ත පොල් ගස් දහස් ගාණක් ඇති පොල්වතු කීපයක්ම හිමි මගේ ජීවිතය පොල් ගස විසින්ම දිරිදෙනු ලබන අලස සුවයේ මාවතක වැටී ඇති බව මම සිතුවෙමි. අලසකම සුවයක් වුවද කම්මැලිකම සුවයක් නොවේ.

මා බලගල්ල වත්තම භාවිත කොට මගේම ගොල්ෆ් පිටියක් නිර්මාණය කළේ ඒ නිසාය. එය විකාර වැඩක් යැයි ලියන මහත්තයා සිතුවද අර්සනායගම් මහත්තයාත්, දබරේරා නීතිඥ මහත්තයාත් සමග සැරෙන් සැරේ ගොල්ෆ් ගසන්නට ගිය පප්පා ගැන මතකය නිසාදෝ ඔහු කිසිවක් කීවේ නැත. අනික මගේ ඇතැම් හිතවතුනුත් ඩීඅයිජී බාප්පාත් පැමිණ මා සමග සෙල්ලම් කළ නිසා මා කර ඇත්තේ පිස්සු වැඩක් නොවේය යන්න ලියන මහත්තයාගේ හිතට වැදිණ.

ලියන මහත්තයා, අපේ නීතිඥවරයා, දඹදෙණියේ පුංචි අම්මා, මැම්බර් බාප්පා මගේ කම්මැලිකම දුරලන්නට මැණිකෙ

කෙනෙකු හොයන්නට පටන්ගත්තේ මගේම ගෙවත්ත ගොල්ෆ් පිට්ටනියක් කරගෙන තිබීම ගැන ආරංචි වූ පසුව විය යුතුය. කොප්පරා කර්මාන්තයක්, තෙල් මෝලක්, පොල් රසැති බිස්කට් හදන කර්මාන්තයක්, පොල් නිෂ්පාදන එංගලන්තයට යවන ව්‍යාපාරයක් ආදිය මගෙන් අපේක්ෂා කළ ඔවුහු පොල් වත්තක තනියම ගොල්ෆ් ගැසීම තනිකම් දෝසයක් මිස වෙන දෙයක් නොවන බව තීරණය කළහ. මා එංගලන්තයෙන් ගෙනාවේ ශේක්ෂ්පියර් මිස ඇඩම් ස්මිත් නොවන බව වටහා ගන්නට කෙනෙක් නොවීය.

වැඩි දවසක් යන්නට පෙර අපි මනාලියන් බලන්නට යන්නට වීමු. සමහර ගෙවල් මා කලින් දැන සිටි පරණ ගෙවල්ය. සමහර ගෙවල් අලුතින් හඳුනා ගැනීමට ලැබුණු පරණ වලව්ය. සමහර ගෙවල් අලුත් වලව්ය. එක එක පමණින් සුන්දර ස්ත්‍රීන් ගණනාවක් අපි නැරඹීමු. එය කුරිරු නැරඹීමක් සේ මට දැනිණ.

අවසානයේ එය නතර කරන්නට මට අවශ්‍ය විය. ඒ සඳහා අප බලන්නට ගිය කෙල්ලන්ගෙන් කවුරුහරි තෝරාගන්නට මා බැඳී සිටින්නාක් මෙන් විය. මම අප බැලූ නවවෙනි මනාලිය තෝරාගතිමි. කොළඹ විශ්වවිද්‍යාලයේ අවසන් වසරේ ශිෂ්‍යාවක වූවාය. එහෙත්, තරුණ කැරැල්ල නිසා ඒ වන විටත් විශ්වවිද්‍යාල අවුරුදු දෙකක් වසා දමා තිබිණ. අපි කැරැල්ල ගැන කතා කළෙමු. මම ඇයට ලන්ඩනයේ පැවැති තරුණ උද්ඝෝෂණ ගැන කිව්වෙමි. ඇගේ විප්ලවකාරිත්වය යනු පිරිමින්ගේ විප්ලවය දෙස ඈතක සිට ආසාවෙන් බලා සිටින්නියක සේ ජීවත් වීමය.

“මේක විකාරයක් අය්යෙ. මමනං කැමැති තව ඉගෙනගන්න.” ඇය කීවාය. “ගෑනුන්ට විස්ස පැන්නම මේ ප්‍රදර්ශනේට පෙනී ඉන්නව වෙනව. මොළයක් තියෙන එකෙක් බලන්ඩ එනවානං කමකුත් නෑ.” ඇය කීවාය.

මම තිගැස්සී ගියෙමි.

“මම කැමතියි නවවෙනියට” මම ලියන මහත්තයාට කීවෙමි. මා ඇගේ නම දැන සිටියත් ලියන මහත්තයා පොතක ලියාගෙන තිබුණේ ඒ ඒ මනාලියට අංකයක් දෙමිනි.

“වටම ගිහිං ගෙටම ආපි කිව්වලු. දඹදෙණියෙ මැණිකෙගෙ ළඟම ඥාතියෝ. පුංචි හාමුට ඒ වගක් කියන්ඩෙපා කියලයි කියල තිබුණෙ. අපරාදෙ කියන්ඩෝන්නෑ හොඳ හැඩ ඇති මැණිකෙ පොඩ්ඩ.”

ඒ හැඩ ඇති නවවෙනි කෙල්ල නාලිනී නම් වූවාය.

මාස කිහිපයක යාම් ඊම්වලින් පසුව අපි විවාහ දිවියට එළඹුණෙමු.

* * *

දැන් ඇය මට මෙසේ දුරකථන ඇමතුමක් දෙන්නේ අප එදින අපේක්ෂා නොකළ ජීවිතයක සිටය:

“විජිත අය්යට වෙඩි වැදිලා.” ඇය හඬා වැටුණාය.

එවැනි පණිවිඩයකදී කුමක් කිව යුතුද වැනි දේ ගැන මට අවබෝධයක් නැත. මම නිහඬ වීමි. ඈ දුරකථනය විසන්ධි කළාය.

මෑතකදී භාවිතයට ගත් මගේ සෙලියුලර් දුරකථන අංකය දන්නේ කිහිපදෙනෙකි. ස්ත්‍රීන්ගෙන් එය දන්නේ ලොකු අක්කා සහ රාධා පමණි. වැඩි වෙලාවක් යන්නට පෙර තවත් කීපදෙනෙක් කතා කළහ. සේනගේ ඇමතුමෙන් කියවුණේ විජිත රත්නායක මියගොස් ඇති බවය.

මා මෙය අවිඥානකව අපේක්ෂා කළ, මට සතුටක් ගෙන දෙන මරණයක්ය යන විශ්වාසය මට සිදුවීම වාර්තා කළ අයගේ කටහඬේ වූයේ යැයි මට සිතිණ. දොස්තර සමරසේකරද පණිවුඩය කීවේ දොස්තර කෙනෙකුට නොගැළපෙන වචනවලිනි: “අරූ ඉවරයි. ආරංචිද?” එවේලේ ඔහු ගැන ඇති වූ අප්‍රසාදය තාමත් පවතී.

මා හැර ගිය මගේ බිරිඳගේ ප්‍රේමවන්තයාගේ මරණය පතමින් අවුරුදු ගණනක් ගත කරන්නට තරම් මම කුරිරු මිනිසෙක් නොවෙමි. මා වෛරයේ ගොල්ෆ් වළල්ලක කැරකි කැරකී ඉන්නට ඇතැයි සිතීම මොන තරම් නම් කුරිරුකමක්ද? ඔවුන්ගේ ඒ අධම සිතිවිලි උපදින 'කුඩා මනස්' නිර්මාණය කරන්නට මා කිසි දිනෙක දායක වී නැත. දික්කසාද නඩුවේදීද මා සිටියේ ද්වේෂයෙන්ද පසුතැවිල්ලෙන්ද තොරවය. මා හැර ගිය බිරිඳ සහ ඇගේ ප්‍රේමවන්තයා යන දෙදෙනාම මට වඩා ළාබාල නිසා මට ඔවුන් පෙනුණේ අසරණ දරුවන් දෙදෙනකු මෙනි. මේ පසු තැවිලි ඇති කරන මොහොතේ මට "මිහිරි කුමරාණෙනි"යි ඇමතූ ක්‍රිස්ටීන් නැති අඩුව දැනිණ.

මම ටවර් ඔෆ් බාබෙල් සිට ගෙදර ගියෙමි.

මේ මොහොතේ ඇ මගෙන් අපේක්ෂා කරන්නේ කුමක්දැයි නොදැන අකර්මණ්‍යයත්වයට පත්ව පැයක් දෙකක්ම ගත කරන විට රාධාගේ සුවදායක ඇමතුම ආවේය. ඇ තුළ තවමත් ඉතිරි වී ඇති මුදුමොලොක් හදවත මට සැනසිල්ල ගෙනාවේය.

"බන්දු මේ වෙලාවෙ නාලිනීව තනි කරන්න හොඳ නෑ. ඔයා කතා කරල කෙරෙන්න ඕනෙ දේවල් අහන්න. ඔයාට අමාරු නම් මම කතා කරන්නම්."

රාධා නාලිනීට කතා කොට මට පණිවුඩය දුන්නාය.

මම පෙරේරා අන්කල් අත අවමංගල්‍යයේ සියලු වියදම් සඳහා ප්‍රමාණවත්යැයි සිතූ සැහෙන තරම් විශාල මුදලක් වහාම නාලිනීට යැව්වෙමි. ඇය මට ස්තුති කළේවත් නැතත් ඒ මුදල කොපමණදැයි මම කාටවත් නොකියමි. යුතුකම් කළ යුත්තේ තමන්ටවත් නොදැනෙන ලෙස යැයි රාධා මට කියා දී ඇත.

රෝහල් දෙකක

ඒදෙවෝපගත දවස ගැන මා සිතන්නට පවා කැමැති ඒ මා නොව, වෙනත් මිනිසකු ලෙස සලකමිනි.

රෝහල වෙත කාරය එළවාගෙන ආවේ සේනය. බන්දුල බලගල්ල තනිව එහි පැමිණීම ගැන සේන කැමැති වූයේ නැත. තනිව පමණක් නොව, බන්දු සර් කෙහොමටවත් එහි නොපැමිණිය යුතුය යන්න ඔහුගේ නිගමනය විය.

කුරුණෑගල රෝහලේ හදිසි අනතුරු වාට්ටුවට යන විට රතු කමිසකාරයෝ රෝහල් මිදුලේ පිරී සිටියහ.

දොස්තර සමරසේකරට පෙරමගට පැමිණීමට සිදු විය. බන්දුල බලගල්ල යනු බෙහෙවින් නිර්නාමික මිනිසකු නිසා කාටත් නොපෙනී යා හැකි වුවත් තනියම නොඑන ලෙස උපදෙස් ලැබිණ. විජිත රත්නායකගේ ජීවිතය අවසන් කළ වෙඩි පහර නිකුත් වූයේ සැලසුම් කළ වෙඩි තැබීමකින්ය යන කතාව ඒ වන විටත් පැතිර යන්නට වූයේය.

මළ සිරුර රැගෙන යාමට නාලිනී පැමිණ සිටියේ නැත. ඇගේ සැමියාගේ පවුලෙන් පැමිණි අය බන්දුල බලගල්ල හඳුනා ගත්තද කතාවට නොආහ. ඔවුන්ගේ චෝදනාත්මක ඇස් තමන් දෙස එල්ල වන බව ඔහු නොදැක්කේ ඔහු සිටියේ ඊට වෙනස් සිතිවිලි ප්‍රවාහයක නිසාය. ඔහු දුටුවනම ඉදිරියට ආවේ නාලිනීගේ වැඩිමහලු සොයුරු උපනන්දය. බන්දු-නාලිනී විවාහය විවාහය බිඳ

වැටීම වළක්වා ගැනීමට ඉමහත් තැතක් දැරූ උපනන්ද රෝහලේ සිට බන්දුල බලගල්ල වෙත දිවැවිත් දැතින්ම අල්ලා ගත්තේය.

"ගේනකොටත් නැතිවෙලා." උපනන්ද කීවේය.

බන්දු සිය හැඟීමෙන් තොර මුහුණ ඉවතට එල්ල කළේය. නාලිනී පැමිණ නැති බව හොඳටම පැහැදිලිය. රෝහල් භූමිය වැසී තිබුණේ රතු කමිසකාරයන්ගෙනි.

"මහත්තයා වැඩි වෙලා නොඉඳ යන්ඩ. පවුලෙ අයටත් උඩින් පක්ෂෙ අය මේක අතට අරන් ඉන්නෙ." උපනන්ද තැතිගත් ස්වභාවයෙන් කීවේය.

දුරස්ථ නොඇලීමකින් යුක්තව මා මා වෙතින්ම ඉවත් කර මේ සිද්ධිය සිහි කරන්නට තැත් කළද බන්දුල බලගල්ල වෙතින් 'මා' පැන නැග එයි.

දොස්තර සමරසේකර එහි සිටි නිසා එහි වට වූ ආරක්ෂකයෝද රෝහලේ සේවකයෝද අප වළල්ලක් සේ වටකරගෙන රෝහල ඇතුළට රැගෙන ගියහ. රතු කමිසකාරයෝ ඝෝෂා කරමින් රෝහල ඇතුළටම ආහ. ඉන් පසු ආරක්ෂකයන් ඔවුන් නවතා ගැනීමට තැත් කරද්දී අපි ඇතුළට ගියෙමු. ඔවුන් කෝපයෙන් මෙන් අප හඹා එන්නේ ඇයිදැයි මට වටහාගත නොහැකි විය. ලන්ඩන් උද්ඝෝෂණවල අත්දැකීම් සිහියට පැමිණ මා ආසාවෙන් සිටියේ රතු කමිසකාරයන්ගේ පැත්තේ ඉන්නටය.

ආරක්ෂකයෝ දෙදෙනෙක් සහ රෝහල් සේවකයෝ කිහිපදෙනෙක් දොස්තර සමරසේකරද සමග රෝහලේ පිටුපස ගේට්ටුවකින් මා එළියට රැගෙන ගිය නමුත් මට තනියම කාර් එක වෙත යන්නට ඉඩ නොලැබිණ. ඒ වෙනුවට කාර් එකේ සිටි සේනට පණිවුඩයක් යවා ඒ ගේට්ටුව වෙත කාර් එක ගෙන්වා ගන්නා ලදී. ලන්ඩනයේ රැඩිකල් කණ්ඩායම් සමග ගත කළ තරුණ දවස් සිහියට ආ මා ඒ රතු කමිසකාර තරුණ පිරිස සමග රෝහල ඉදිරිපිට නවතිනු වෙනුවට රෝහලේ පස්සා දොරින් පිටවන්නේ ඇයිදැයි වටහා ගන්නට නොහැකි විය.

"සේන මොකද මම එයාලට බයවෙන්න ඕනෙ.?" බන්දුල බලගල්ල කාර් එකට නැගුණු වහාම ඇසුවේය.

"සර් තනියම බෝලෙ හිලට දදා හිටියට ඔච්ච දන්නැ සර්" සේන කීවේ පාරේ පිරී සිටින රතු කමිසකාරයන් මගහැර කාරය මෙහෙයවීම ගැන අවධානය යොමු කරමිනි.

"බෝලෙ දදා..." යි නැවත කී බන්දුල බලගල්ලට හිනා ගියේය.

සේන කැගසන පොරකන රතු කමිසකාරයන් සහ තවත් මිනිසුන් අතරින් කාරය මහ පාරට ගැනීමේ අවධානය යොමු කරමින් උන්නේය.

"එහෙම තමයි සර් සිංහල භාෂාව පොඩ්ඩ බැරි උනොත් සෙක්ස්. යනවා, දෙනවා, ගහනවා, තෙමෙනවා, ඒක, අරක, පෙට්ටිය, ගෙඩිය ඔය එකත්වත් දන්නැතුව පාවිච්චි කෙරුවොත් මළා තමයි." සේන කීවේය. "ඉතිං ගොල්ෆ් ගැහිල්ලෙ තියෙන්නෙම පොලු - බෝල - හිල් - ගැහිලි - අරවමේවනෙ - මහලොකුවට ජාතිය, භාෂාව ගැන කතා කරන උනුත් මේ වචනවල කුණුහරප තේරුංඔලින් හොඳට වැඩගන්නවා."

සේන පැහැදිලි කළේය. ෆ්‍රොයිඩ්ගේ මවු භාෂාව සිංහල වී නම් ඔහු ඉන් හොඳට වැඩ ගන්නට ඉඩ තිබිණියි බන්දුල බලගල්ල සිතුවේය.

ඔහුගේ මුහුණේ සිනාවකි. ඔහුද සිංහලයේ ඇති ඒ ලිස්සනසුලු ස්වභාවය ගැන දැන සිටියද තමාගේ ක්‍රියාවක් එවැනි වචනයෙන් විස්තර කරනු ලබතියි ඔහු නොසිතුවේය. සේන යළිත් කතා කළේ ටික වෙලාවකිනි.

"මං ඔය ජෝක් කිව්වෙ සර් අරුං ගැන කල්පනා කරන හින්දා"

"අරුං කිව්වෙ?"

"රතු කමිස ඇඳන් උන්නෙ."

"ඉතිං සේනත් රතු කමිස ඇඳපු එක්කෙනෙක්නෙ." බන්දුල බලගල්ල කීවේය.

"අපේ කාලෙ ඔහොම මැරිච්ච මිනිස්සු විකුණන්න ට්‍රයි කෙරුවෙ නෑ. අනික අපි පන්තිය මිසක් ජාතිය උස්ස ගත්තෙත් නෑනෙ."

එම පක්ෂය තුළ සිට ජනප්‍රිය ජාතිවාදී සටන් පාඨ රතු පාටින් කියන්නට පටන් ගෙන ඇති කණ්ඩායමක එක් නායකයකු ලෙස විජිත රත්නායක මතු වී ඇති බවත්, ඒ පිරිස වෙනම පක්ෂයක් ලෙස කැඩී යන්නට පවා ඉඩ ඇති බවත් සේන විස්තර කලේ ඒ ගමනේදීය. මාතෘභූමියේ සියලු ද්‍රෝහීන් විනාශ කළ යුතු බව කියන ඒ පක්ෂයේ සටන් පාඨ සහ විජය වික්‍රමසිංහගේ සටන් පාඨ අතර ඇත්තේ නිවුන් සහෝදරයන් වැනි සමානකමකි. විජය වික්‍රමසිංහ කියන සියලුම දේ විජිත රත්නායකලා රතු ඇඳගෙනම කියති. සිදු වී ඇත්තේ ඒ සටන් පාඨවල සුජාත අයිතිය කාටද යන විවාදය නිසා ඇති වූ ගැටුමකි. දැන් විජිත රත්නායකගේ මරණය ඒ පක්ෂයට උදාවී ඇති ඉතා ප්‍රයෝජනවත් දේශපාලන අවස්ථාවකි.

"රතු කමිසෙ තේරුම තමයි සර් අපි කාගෙත් ලේ රතුපාටයි කියනෙක. එහෙමයි අපි රතු කමිස ඇන්දෙ. ඔවුන් රතු කමිසෙ ඇඳගෙන ඉන්නෙ එක ජාතියක ලේ අනිකට වඩා රතුපාටයි කියලා හිතාගෙන." සේන විග්‍රහ කළේය. සියලු වර්ණවල පුරුෂයන් සහ ස්ත්‍රීන් රතු ඇඳි ලන්ඩන් දවස් බන්දු බලගල්ල සිහි කළේ රතු ඇඳි රන් කෙසැති කෙල්ලක නාට්‍යමය ආකාරයෙන් සටන් පාඨ කියන මුහුණද ආකර්ෂණීය විලාසයද මතකයට නගා ගනිමිනි.

"සේන දැන් රතු කමිසෙ ගලෝල රදලයෙක් ගාව රස්සාව කරනකොට ඕව විවේචනය කරන එක හරිද?" බන්දුල බලගල්ල ඇසුවේය.

"සර් රදල වෙන්නෙ පරම්පරාවෙන් විතරනෙ. අනික මං කරන්නෙ ප්‍රවේනිදාසකමක් නෙමේනෙ. සර් මට පඩිනඩි ගෙවන, සලකන විදියෙ තියෙන්නෙ ඔය පක්ෂ නායකයන්ට වඩා සමාජවාදීකමක්. පක්ෂ නායකයො එහෙමද? සාමාජිකයො ද රූකඩයො විදියට තමයි සලකන්නෙ."

බන්දුල බලගල්ල කල්පනාවට වැටුණේය. ඔහු ගැනම යම් සතුටක් ඒ වචන නිසා ඇති විය. ඉන් පසු යළි කතා කළේය.

"ලන්ඩන්වල උන්නා මගෙ හොඳ යාළුවෙක්. ක්‍රිස්ටින් කියලා. එයා මට කිව්වෙ මං රදල පවුලක කුමාරයෙක් කියලා. මට හිතුණෙ ඒක මට කරපු සියුම් අපහාසයක් විදියට. එයා කිව්වෙ අපහාසෙකට නෙමේ."

මෝටර් රථය රෝහල අවට ජනකායෙන් සම්පූර්ණයෙන් ඉවත් වූ විට දෙදෙනාගේම සිතට දැනුණේ සන්සුන් බවකි.

"මං සර්ව කතාවට අල්ල ගත්තෙ මොකද දන්නවද? අරුං අල්ලගෙන හිටපු පෝස්ටර් වගයක් සර් දකියි කියලා."

"මොනවද ඒ? මං දැක්කම මොකද? මාත් ඔය වගේම ප්‍රොටෙස්ට්වල හිටපු මිනිහෙක්. දකුණු අප්‍රිකාවෙ ප්‍රශ්නෙට, අයර්ලන්තෙ ප්‍රශ්නෙට අපි ලන්ඩන්වල පෙළපාලි ගිහිල්ලා ගුටිත් කෑවා."

"උන් කියනව මේ ඝාතනේ ලුම්පන්-ධනපති සහ රදල සන්ධානයක කුමන්ත්‍රණයක් කියලා."

"ඒ කියන්නෙ?"

සේන එය සරල සිංහලෙන්ද ඉංග්‍රිසි වචනවලින්ද විස්තර කළේය.

"ඒ කියන්නෙ. සර්රුයි වික්‍රමසිංහයි එකතු වෙලා කරපු කුමන්ත්‍රණයක් කියලා."

බන්දුල බලගල්ල මහහඬින් සිනාසුණේය.

"එහෙම තමයි සර් අපේ ලාංකික මනස. සර් අර හාදයගෙන් පළිගන්න මේ වෙලාව අල්ලගත්තය කියනෙකනෙ ඔය කියන්නෙ. ඔහොම කතන්දර ගොතල පත්තරවලට ලියන එවුන් ඉන්නවා."

"ඉතිං ඒවා පත්තරවල පළවෙනවද?" බන්දුල බලගල්ල ඇසුවේ තාමත් සිනාසෙමිනි.

"ඔව්. එව්වගෙ ඉන්නෙත් අර වගේ උන්ම තමයි. බොරුනං බලන්ඩකො හෙට පත්තරවල."

මා මේ සිදුවීම් වැල දැන් සිහි කරන්නේ මගෙන්ම බාහිර කෙනෙකුට සිද්ධ වූවාක් මෙනි. ඒ වෙඩි පහර පමණක් ඒ නිසා පණ ගැන්වුණු සිදුවීම් මාලාවම මගේ ජීවිතය කණපිට හරවන තරම් අහම්බ මාලාවක් විය. ඒවා සිදුවූයේ වෙඩි පහරක වේගයෙනි. ජීවිතයෙන් වැඩි කාලයක් මගේ සංසාරික ගොල්ෆ් වළල්ලක සිටි මා අනික් මිනිසුන්ගේ ජීවිත සහ විඥාන සමග මේ තරම් නාට්‍යමය ලෙස ඇමිනී ගියේ ඇයි යන්න මට අදත් ප්‍රහේලිකාවකි.

* * *

අපගේ මෝටර් රථය සන්සුන් රිද්මයෙන් බලගල්ල වත්ත කරා ධාවනය වෙමින් තිබුණු අතර, දොස්තර සමරසේකරගෙන් දුරකථන ඇමතුම ආවේය. ඇතුගල්පුර සිංහයා සිංහ රෝහලට ඇතුළත් කර ඇත. වෙඩි තැබීම සිදුවන අවස්ථාවේ සිට දැඩි මානසික කම්පනයටද හෘදය කම්පනයකටද පත් වී සිටින ඇතුගල්පුර සිංහයා දැන් සිටින්නේ දැඩිසත්කාර ඒකකයේය. එපමණක් නොව, ඔහුට යන්තමට කතා කරගන්නට හැකි වූ විට "බලගල්ල සර්" ගැන අසා ඇත. මම රාධාට කතා කළෙමි. දුරකථනය ක්‍රියා විරහිතය.

මම විස්තරය සේනට කිව්වෙමි.

"සර් මොකටද යන්නෙ? අරුංගෙ කුමන්ත්‍රණ කතාව ඇත්ත වෙනව ඒකෙන්." ඔහු කීවේය.

"එහෙනං යන්නම ඕනෙ." කිව්වෙමි.

"ඒකත් ඇත්ත. මටත් බලන්න ඕනෙ ඔකගෙ රඟපෑම." කියූ සේන සිංහ රෝහල එල්ලේ කාර් එක ධාවනය කළේය.

"ඉතිං ඔය සේනත් දැන් කරන්නෙ ඒ මිනිහ රඟපානවා කියල කතාවක් ගොතන එකනෙ." මම කිව්වෙමි.

"යමුකො බලන්ඩ." සේන කීවේය.

මා එහි යන විට වීවී දැඩි සත්කාර ඒකකයේ උන්නේය. සේන සාමාන්‍යයෙන් ළඟ තබාගෙන සිටින ලොකු දිනපොතත් රැගෙන මා අසලින්ම ආවේ මගේ ලේකම්වරයා යැයි පෙනෙන ලෙසය. කාමරය ඉදිරිපිට වීවීගෙන් කටඋත්තරයක් ගන්නට බලාගෙන සිටියේ මා ඊට පෙරත් වරක් හමු වූ පොලිස් අධිකාරිවරයාය. මට තවත් දෙයක් දැනගත හැකි විය. විජිත රත්නායක බිලිගත් පිස්තෝලය පත්තු කළ හාදයා වීවීගේ ඥාති පුතෙකි. ඔහුටත් එනම් ඒ පැත්තෙන්ද වෙඩිතබා ඇත. ඒ තුවක්කුව කාට අයිතිදැයි සෙවීමට දැනටමත් තරුණයන් දෙදෙනකුගෙන් ප්‍රශ්න කරනු ලැබේ.

මගේ සිතෙහි වීවී ගැන ගැන කෝපය වහා අඩු විය. නාලිනී මා අතහැර ගොස් ඇත්තේ ආයුධවලින් දේශපාලනය කරන මිනිසකු වෙතය යන සිතුවිල්ල මා සිත කැළැල් කළේය.

වීවී සිටින දැඩිසත්කාර ඒකක කාමරයට යාමට මට අවස්ථාව උදා වූයේ පවුලේ අය එළියට ආ පසුය. විනිතා සිය යටහත් පහත් සිනාව පෑවාය. ඇය සුදට හුරු සාරියක් හැඳ සිටි නිසා ඇ වෙතින් ශෝකය පළ විය. එය දැඩි සත්කාර ඒකකය වුවද එහි 'දැඩි' ගතියක් හෝ 'සත්කාර' ගතියක් නොවිණ. වීවී සැප පහසු ඇඳක හිඳ, විශාල සුදු කොට්ට දෙකකට හේත්තු වී උන්නේය. ලෙඩෙකු සේ හැඳ සිටියත් ඔහු උන්නේ ලෙඩ පෙනුමකින් නොවේ. ඔහු පසෙක නිල්පාට ශෛල්‍ය වෛද්‍ය ඇඳුම හැඳි වෛද්‍යවරුන් දෙදෙනකු සිටි අතර, ඔවුන් කවුදැයි හඳුනාගත නොහැකි විය. වහාම ඔහු ඇදෙහි දිගා වූ අතර, වෛද්‍යවරු ඔහු වෙත නැමුණහ. හෙදියක

ඔහු වෙත ආවාය. කැමරා ප්ලෑෂ් ලයිට් එකක් පත්තු වූයේ මා අසලිනි. කැමරා ශිල්පියකු කාමරයේ සිටි බව පවා මා දුටුවේ එවිටය. ඡායාරූප ගැනීමෙන් පසු සියලු දෙනාම කාමරයෙන් පිට වූහ. හෙදියක් සේනද කාමරයෙන් පිටතට කැඳවාගෙන ගියාය. ඊට එක් බැල්මකින් ඉඟිය දුන්නේ වීවී බව මට අවබෝධ වූයේ පසුව ඒ ගැන සිහි කරද්දීය.

ඇතුගල්පුර සිංහයා නැවත කොන්ද ඇදේ විට්ටමට හේත්තු කර ගත්තේය. ඔහුගේ මුහුණේ ඇඳුණේ මඳ සිනහවකි. ඒ මඳ සිනාවේ දීප්තිය පිටුපස අන්ධකාර දරුණුකමක් ඇතැයි මට සිතිණි. ප්‍රසන්න පිරිමියකු වන ඔහු වෙත එවැනි අන්ධකාරයක් මා ඊට පෙර දැක නොතිබිණි. එහෙත්, මා දෙස බැලූ ආකාරයේ එක්තරා නෝංජල් බයාදුකමක්ද තිබිණ. දැඩි සිතැති පියෙකුගේ සිත දිනාගන්නට තැත් කරන පුතෙකුගේ වැනි අපේක්ෂා සහගත බවක්, තමන් ඇන්ද "අපේ පවුල" චිත්‍රය තාත්තා අතට දී අගය කිරීමක් අපේක්ෂා කරන පුංචි පුතෙකුගේ නොඉවසිල්ලක් වැනි දෙයක් මට පෙනිණ. මා තුළ අනුකම්පාවක් මතුව ආවේය.

"අපේ කොල්ලො අරුට දුන්නා. අර වේසි හිටියනං ඒකිටත් දෙනවා." වීවී මා දෙස බලා කීයේ මගේ ප්‍රීතිය දකින්නට අපේක්ෂාවෙන් දැල්වුණ මුහුණිනි. ඒ වන විට එහි ඇතුළුව සිටි දොස්තර සමරසේකර මා දෙස බැලුවේ මගේ ප්‍රතිචාරය කුමක් වේදැයි සිතාගත නොහැකි වීමෙන් ඇති වූ තැති ගැන්මකිනි. මම වීවී දෙස බැලුවෙමි. ගොළුකමේ අඳුරු ලෝකයෙන් භාෂාවේ ආලෝකය වෙත එන්නට තැත් කරන දවස්වල ඔහුගේ මුහුණේ වූ පවිත්‍රත්වය වෙනුවට අශිෂ්ට කුරිරුකමක් ඔහුගේ මුහුණේ විය.

මා කෝපය පාලනය කරගත්තේ මහත් ආයාසයෙනි. පාපතරයින් පිරිසක් සමග සබඳකම් පැවැත්වීම අනිවාර්ය කළ දෛවය වෙත එල්ල වූ වෛරය මා තුළ පැසවන්නට විය. රදල සම්භාව්‍යත්වය සහ ලුම්පන් මුග්ධත්වය සැබැවින්ම එකට මුසු වී ඇත.

එහෙත්, ඒ වෛරය වහා වෙස් ගැන්විය යුතු විය.

මම සිනාවක් මවා ගත්තෙමි. එය මවා ගත් සිනාවක්ද? අහම්බෙන් ආ සැබෑම සිනාවක්ද? අදටත් මට එය නිශ්චිතව කිව නොහැකිය.

මැලවෙමින් පැවැති විජය වික්‍රමසිංහගේ මුහුණ පිපී ආවේය. දොස්තර සමරසේකරද ප්‍රීතිමත් විය.

"ඒ කාලෙ නිලමෙ කෙනෙක්ගෙ මැණිකෙ කෙනෙක් අරන් පැනල ගියානං උල තියල මරවන්නෙ. සර්ගෙ හොඳකමට ඉවසුවට." ඇතුගල්පුර සිංහයාගේ කෙසරු දිදුලන්නට විය.

"ඒක නම් ඇත්ත බන්දු. නැද්ද?" දොස්තර සමරසේකර අලගු තැබුවේය. ඔහුද විවාහ වී සිටින්නේ මැණිකෙ කෙනෙකු සමග නිසා විය යුතුය.

විජිත රත්නායක ඝාතනය මට සැබැවින්ම සතුටක් වේදැයි මම මාගේ අභ්‍යන්තරය පරීක්ෂා කරන්නට වීමි. නාලිනී විජිත සොයා ආපසු යාමේ සමස්ත සිදුවීම දෙස උපේක්ෂාවෙන් බැලූ මා නුගත් වෛරයක කුණු දියෙහි වැටී ඇතිදැයි සැක කළෙමි. එහෙත්, ඒ කුණුදිය අතරින් හිස ඔසවා සිනාසුණෙමි. ඒ සිනාව වීවී තුළ ඇති කළේ මිනීමැරුමේ වරදින් නිදහස් වූවාක් වැනි හැඟීමක් බව මට පෙනෙන්නට තිබිණි.

"ලොක්ක ඩීඅයිජීටත් කියල තියෙනවා." ඇතුගල්පුර සිංහයා දොරෙන් එළියට ඉඟි කළේය. මම ආපසු හැරී බැලුවෙමි. පොලීසියේ ඉහළ නිලධාරීන් යැයි කිව හැකි දෙදෙනෙක් නිල ඇඳුමෙන් සිටිති. ඔවුන් සිටින්නේ ඇතුළට එන්නට බව පැහැදිලිව පෙනිණ. "ලොක්කා" විසින් අණ නොකරන ලද නම් ඒ නිලධාරීන්ගේ සිරුරු එතරම් බරපතළ ලෙස සෘජු වී තිබෙන්නට හැකියාවක් නැත.

අකාලේ මිය ගිය ප්‍රතිපත්තිගරුක ඩීඅයිජී බාප්පා මට සිහි විය.

මම විජය වික්‍රමසිංහගේ උරහිසට අත තබා "ගිහින් එන්නම්" යැයි කීවෙමි. මගේ අත යට ඔහුගේ සිරුර කුඩා වී හැකිලී ගොස්

ලියකින් කැපූ පුංචි රූකඩ මිනිසකු බවට පත්වී ගියාක් මෙන් මට දැනිණ. ඔහුගේ මුහුණේ වූයේ මා කවදාවත් නොදුටු තෘප්තියකි. මගේ අත එලෙස ඔහුගේ උරහිස ස්පර්ශ කරන දවසක් එනතෙක් බලා සිටියාක් මෙනි. මම ඔහු දෙස කෙළින්ම බැලුවෙමි.

එවිට කැමරාව යළිත් වරක් ක්‍රියාත්මක විය. නැවත වරක් කැමරාකරුවාද වෛද්‍යවරුද කාමරයට ඇතුළුවෙමින් සිටියහ. මා නිරුවතින් සිටිනු ඔවුන් දුටුවාක් මෙන් මට දැනිණ.

මා කාමරයෙන් පිටවූයේ බිම බලාගෙනය. දොස්තර සමරසේකර මා පසුපසින් ආවේය.

"ඩොක්ටර්ටත් ඉන්නවද ඩොක්ටගෙම කැමරාකාරයෙක්" මම උපහාසයෙන් ඇසුවෙමි. ඔහුට ඒ උපහාසය තේරුණේයැයි මම නොසිතමි.

අනික් ඇන්ටිගනි

මා නිවස කරා ගියේ කල්පනා කරමිනි. සේනද කතා නොකළේය. "අම්බ තක්කඩියෙක්" යැයි ඔහු කීවද මා නිහඬව සිටි නිසා ඔහු වෙනත් යමක් නොකීවේය. ඒ රෝහල් දෙකින් එකකටවත් නොයා යුතුව තිබිණියි මට සිතෙමින් තිබුණද මම එය සේනට නොකීවෙමි.

නගරය නිසොල්මන් වෙමින් තිබුණේය. විජිත රත්නායක ඝාතනයට විරුද්ධ පෝස්ටර් සිහි කළේ 1988 කාලයේ කුරුණෑගලකි. කාර් එක මගේ විඥානය ශරීරය වෙතින් ඉවතට ගෙන යන බවක් පෙන්නුම් කළේය.

* * *

නාලිනී ගුණයහපත් තරුණියකි. මුදුමොලොක් හදවතක් ඇති අවංක ගැහැනියකි. මා ඇගෙන් කිසිවක් නොසැඟවූ සේම ඇද කිසිවක් සැඟවූයේ නැත. ඇගේ ආදරවන්ත මස්සිනා හිරෙන් නිදහස්ව පැමිණ විවාහයක් ගැන සැලසුම් කළහොත් තමා ඒ සැලසුමේ කොටසක් වන්නට බොහෝ ඉඩ ඇති බව ඈ කීවාය. ඒ වනතෙක් ලියුම් ගනුදෙනුවක් නොතිබුණත් තමාගේ ජීවිතයෙහි එවැනි ඉරණමක් තිබිය හැකි යැයි ඈ විශ්වාස කළාය. එහෙත්, ඇය මා හා විවාහ වූවාය. ඇතැම් විට දියෙන් ගොඩ දමන ලද

රත්තරන් මාළුවකු සේ ඇය මට පෙනුණද ඇය සතුටින් සිටියා යැයි මම සිතුවෙමි. අප දෙදෙනාට පොදු දේවල් තිබුණේ ඉතාම ටිකකි. මගේ පොත් පිස්සුව අසාමාන්‍ය එකක් නිසා ඇයගෙන් එවැන්නක් කෙලෙසකවත් අපේක්ෂා නොකළෙමි. එහෙත්, ඇය සාමාන්‍යයෙන්ම කියවන්නියක නොවූවාය. අප දෙදෙනා බොහෝ දේ ගැන කතා කළද ඒවා සංවාද නොවිණ. ඇය කියන දේ මා අසා සිටි අතර මා කියන දේ ඇය අසා සිටියාය. ඒ නිසා ඒ කතාබහ මාරුවෙන් මාරුවට කරන ආත්මභාෂණ සේ විය. මා භාවිත කළ උපමා හෝ නිදර්ශන ඇයට නොතේරුණ අතර, ඇය භාවිත කළ උපමා හා නිදර්ශන මට නොතේරිණ. දෙදෙනකුගේ සංවාදයන් ආස්වාදනීය වන්නට නම් දෙදෙනාම ඉඟිකොට කියන දේද දෙදෙනාම දක්වන උදාහරණද දෙදෙනාටම වහා වැටහෙන පොදු විඥානමය පසුබිමක් තිබිය යුතුය. එවිට ස්මරණයේ එකම ජලාශයක පිහිනන්නාක් මෙන් දෙදෙනාටම දැනේ. අප දෙදෙනා පිහිනුවේ ස්මරණයේ වෙන් වෙන් ටැංකිවලය. මා ලෝක සාහිත්‍යයේ කෘති වෙත ඉඟි කරමින් කියන්නට හැදූ දේවල් ඇයට නොතේරුණ අතර, ඇය ඉඟි කළ ලෝකය මම නොදැන සිටියෙමි. අපි දෙදෙනා භාෂාමය පිහිනුම් තටාක දෙකක වෙන් වෙන්ව පිහිනන අය සේ වීමු. සූසන්, ක්‍රිස්ටීන්ද පසු කලෙක රාධා සහ හැනාද සමග මා කළ සෑම සංවාදයක්ම එකම භාෂාමය සහ අදහස්මය තටාකයක නිදහසේ එකට පාවෙන්නාක් සේ දැන වූ මිහිර නාලිනී සහ මා අතර සංවාදවල නොතිබිණි. ඇ විශ්වවිද්‍යාලයේදී ලද අධ්‍යාපනයේ තත්ත්වය ගැන පවා මට සැක ඇති විය. එහෙත්, ඇයට වඩා වයසින්ද අත්දැකීමෙන්ද වැඩි මම නිහඬව ඇයට සවන් දෙන්නෙකු බවට පත්ව ටවර් ඔෆ් බාබෙල්, මගේ පුස්තකාලය, ගොල්ෆ් පිට්ටනිය හෝ වතුපිටිවලද හැකි තරම් වේලාවක් ඇ සමග කාලය ගත කළෙමි. අප දෙදෙනාටම පොදු විඥානමය ජල තටාකයක් ගොඩ නැගෙනතුරු අපට එකට ඉන්නට ලැබුණේ නැත.

මම වතුපිටි සරු කරන්නට දැඩි වෙහෙසක් ගත්තෙමි. පොල් ඉඩම්වල දෙවැනි වගාව දැම්මෙමි. අක්කර තුනක උහුමීයේ වත්ත

සම්පූර්ණ ගම්මිරිස් වත්තක් බවට පෙරළීමි. වැල්ලව අක්කර පහ අන්නාසි වත්තක් කළෙමි. අක්කාගේ, මගේ සහ තාමත් අම්මාගේ නමින් වූ පොල් අක්කර එකසිය ගණනටම පොහොර දැම්මේ විවාහ ජීවිතයේ පළමු වසර තුළදීය. බන්දු නමැති මැටි ගොඩ ගෙන වැවිලිකරුවකු ඇඟීම මගේ නෑයන්ගෙන් ඇයට පැවරුණු කාර්ය බව විශ්වාස කළාක් මෙන් නාලිනී මට දිරි දුන්නාය. ඇයද හරි හරියට මහන්සි වූවාය. පොල් වගාව ගැන මා නොදන්නා දේවල් කියා දීමට ඇය වෙහෙස වූවාය. මහ ගෙදර වත්තේ පොල් පලදාවූ පොහොර සත්කාරයෙන් පසුව වැඩි වන්නේද යන්න සොයා බැලීමේ කාර්ය බාරගත්තේද ඇයය.

අපට එකට පාවෙවී සුව විඳිය හැකි විඥානයේ මිහිරි ජලතටාකයක් පුංචියට හෝ පැවතියේ නම් ඒ වතුපිටි සහ වැවිලි කටයුතුය. මා හා විවාහ වන විට ඇගේ පවුලට අයත් ඉඩම් සියල්ලම පාහේ විකිණී ගොස් තිබුණද ඇගේ විඥානය පිරී තිබුණේ පරම්පරාවෙන් එන ඉඩම් බලාකියා ගන්නා දැනුමෙනි. පොල් ගසේ ඇසට නොපෙනෙ කොටස්වලට පවා කියන සිංහල වචනද පොල් ගසට වැලඳෙන රෝග, පොල් ගසට හානි කරන සතුන් ආදිය පමණක් නොව, පොල් පිත්තෙන් පවා මුදල් උපයන සැටි ඇය දැන සිටියාය.

බලගල්ල ඉඩකඩම්වල ගහකොළ නවදලු ලමින් පලබර විය.

නාලිනී පැමිණ වැඩි කලක් යන්නට පෙර මා සාදාගෙන සිටි ගොල්ෆ් වළල්ල වසා කොළ පැහැය වැඩිණ. ඉන් පසු නෙක නෙක මල් පිපී ආවේය. තැනින් තැන ඇති ඇහැල ගස් මලින් බරව හාත්පසම රන්වන් විය. මේ වසන්ත විපර්යාසය දැක මා එය ප්‍රීතියෙන් අගය කරන විට වරක් සේන මෙසේ කිව්වේය:

"හැම අවුරුද්දෙම ඔහොම වෙනවනෙ සර් මේ සැරේ තමයි සර්ට ඔච්ච පේන්නෙ."

ඔහු කීවේ ප්‍රීතියෙනි.

බලගල්ල වලව්වේ අභ්‍යන්තරයෙහි ඇති මැද මිදුලෙහි මැද ඇති දෙහි ගසේද මල් පිපී සෑම කාමරයකට සුවඳ ගැලුවේය. ඒ මැද මිදුල වෙත විවෘත වන දැවැන්ත බුරුත දොරකින් යුතු විශාල කාමරය මගේ පුස්තකාලය ලෙස දැන් භාවිත වුවද එහි ඇතුළු වූ විට තවත් දොරකින් යා යුතු කුඩා අඳුරට බර කාමරයක් ඇත. එය වලව්වේ ඇතුළු හදද යටිහිතද වැනිය. මා නාලිනීට ඒ කාමරයද හඳුන්වා දුන්නේ ඒ මල්බර සමයේදීය. ඒ කාමරය පරම්පරාවෙන් එන බොහෝ වටිනා වස්තු යැයි සැලකෙන දේ දරා සිටියි. පුස්කොළ පොත් එකතුව ඇති කළුවර කැටයම් එබ්බ වූ බුරුත අල්මාරියත්, පරම්පරාවෙන් ආ ඔප්පුතිරප්පු රැඳි පෙට්ටගමත් එහි ඇත. අත්තා ලියන්නට පාවිච්චි කළ ලියන මේසය ඒ කාමරයේ හරි මැද තබා ඇත්තේ දැන් දකින්නට නැති පැරණි හැඩයේ පුටුවක්ද සමගය. පැරණි ලෝකඩ සහ පිත්තල බුද්ධ ප්‍රතිමා තැබූ දොන් කරෝලිස් වීදුරු අල්මාරිය හරියටම ඒ මේසයේ හිඳ සිටින කෙනාට හිස එස වූ කල පෙනෙන ලෙස තබා තිබේ. අත්තා, කිරි අම්මා පමණක් නොව, පප්පා පැලැඳි උපැස් යුගලද ඒ අල්මාරියේ බුදු පිළිමවලට පහළ තට්ටුවේ තබා ඇත. ඒ නිසා ඒ තිදෙනාද තමා දෙස බලා සිටින්නාක් වැනි හැඟීමක් ඒ ලියන මේසයේ හිඳ සිටින කෙනෙකුට දැනේ.

"මේ තියෙන්නෙ ඔය මිනිස්සු කටකතා කියන තිදත් වදුලු පොත." ඒ අභ්‍යන්තර කාමරයට ඒමට අවසර ඇති අලුත්ම තැනැත්තිය වන නාලිනීට මා එය පෙන්වූයේ අල්මාරියේ වීදුරුව තුළින් ඇඟිල්ල දිගු කරමිනි. ඇය මා වෙත එල්ල කළේ ත්‍රස්ත වූවාක් වැනි බැල්මකි. මා ඇයගේ උරහිසට අත තබා මා වෙත ඇදගත්තේ ඇයද දැන් මේ නිවසේ අභ්‍යන්තරයට අයිතියි කියන්නට මෙනි.

ගහ වැල පල දරා ආවද නාලිනී ගැබ් නොගෙන ඉන්නට අවශ්‍ය බව කීවේ නැවත විශ්වවිද්‍යාලය විවෘත කළ පසු එහි ගොස් උපාධිය අවසන් කරන්නටය. විශ්වවිද්‍යාලය විවෘත කළ පසු තිඹිරිගස්යායෙන්ම කුඩා නිවසක් කුලියට ගත් මමද ඇය සමග එහි ගියෙමි. සති අන්තයේ විශේෂ වැඩක් නැති නම් අපි

ආපසු ගමට ආවෙමු. එය මා ප්‍රිය නොකළ ජීවිතයක් වුවත් නාට්‍ය, චිත්‍රපටි බලන්නට එය හොඳ අවස්ථාවක් විය. මගේ මිතුරියක වූ රාධා රත්දෙණිය ඇගේ නාට්‍ය වැඩවලට මා සම්බන්ධ කරගෙන තිබිණ. රාධා සහ මගේ මිත්‍රත්වය යනු නාලිනිට තේරුම් ගත නොහැකි වූ දෙයක් නිසා ඇය මුණ ගැසෙන සෑම ගමනක් ගැනම කට උත්තරයක් දෙන්නාක් සේ නාලිනිට විස්තර කරන්නට මට සිදු විය. නාලිනී රාධාට වැඩියෙන් රූමත් වුවත් රාධාගේ පෞරුෂය සහ ආචාරවිධි නිසාත්, විවෘත හදවත නිසාත් ඈ වෙත වූ ආකර්ෂණීයභාවය නාලිනීගේ ඊර්ෂ්‍යාවට හේතු විය. විවාහය යනු ඊර්ෂ්‍යාවේ ආයතනයක් යැයි මට සිතෙන තරමට ඒ කොළඹ අවුරුද්ද හිසරදයක් වූයේය. බීම සම්බන්ධයෙන්ද නාලිනී තුළ වූයේ මා කිසිසේත් එකඟ නොවූ ආකල්පයකි. මා විස්කි වීදුරුවක් අතින් ගෙන පොතක් පතක් කියවමින් සන්තෝසෙන් ඉන්නා විට "ඕකනං පුරුද්දට යන එක හොඳ නෑ අපේ පප්පගෙ ඉඩකඩම් ටිකත් නැති උනේ ඔය බීම හින්දා." වැනි යමක් ඇය කීවාය. ස්කොච් විස්කි, වයින්, කසිප්පු, රා සියල්ල ඇ මැන්නේ ජුගුප්සාවේ එකම මිම්මෙනි.

ඒ අවුරුද්ද ගත කර අප කොළඹ එන විට මහ ගෙදර වත්තේ මල්පලද ගහවැලෙහි නිල්ලද මට නොපෙනෙන තරම් වී තිබිණ. තෝරාගත් මාතෘකා කීපයකට පමණක් අපේ සංවාදය සීමා වී තිබිණ. ඇය ලැබූ උපාධිය සහතිකයක් ලබා දුන්නා මිස ඇගේ විඥානය වර්ධනය කර නව දෑසක් විවර කරදුන් බවක් නොපෙනිණ.

ඇගේ සුසුම්න් බර දුරකථන ඇමතුම් ගැන සේනගෙන් දැනගෙන මාස තුනක් විතර යන විට එක්තරා රැයක මා වෙත ආ ඇය මෙසේ කීවාය:

"මහත්තය බැන්ද එකෙන් මං පුදුම වැරැද්දක් කෙරුවෙ. මහත්තය බෝධි සත්වයෙක් වගේ කෙනෙක්. ඒත් මහත්තය හම්බවෙන්ඩ කලින් මට පණ වගේ ආදරේ කරපු අය්යා කෙනෙක් උන්නා කියල මහත්තයට මං කිව්වනෙ. එයා දැන් ආපහු ඇවිල්ලා. කාලයක් හැංගිලා තව කාලයක් හිරේ ඉඳලා ඇවිල්ලා ඉන්නෙ.

මහත්තය වගේ නෙමේ එයාට මං නැති උනොත් කවුරුවත් නෑ."

මා ඇයගේ කතාව අසා සිටි නොඇලුණු ස්වභාවය දැක ඈ බොහෝ වේලාවක් තුෂ්ණීම්භූතව උන්නාය. මා වළංමුට්ටි, පිඟන් කෝප්ප පොළොවේ නොගසා, ඇගේ තොල් පුපුරන්නට පහර නොදී නොඇලුණු සිතින් ඉන්නේ මන්දැයි පුදුමයෙන් මෙන් නාලිනී බලා සිටියාය.

ඉන් පසු ඇය විජිත රත්නායක ගැන සම්පූර්ණ කතාව මට විස්තර කළාය. අප කොළඹ සිටි කාලයේ ඔහු ඇය හමුවීමට විශ්වවිද්‍යාලයටද පැමිණියෙන් සම්බන්ධතාව යළි අලුත් විය. රාධා සමග මගේ සම්බන්ධයක් ඇතැයි ඇටම ජීත්තු ගන්වා ගත් ඇය විජිත සමග සම්බන්ධය යළි අලුත් කරගත්තාය. "මහත්තය රාධ මිස් එක්ක සම්බන්ධයක් ඇති වෙයි වෙයි කිය කිය මං බලාගෙන හිටියෙ මං මහත්තයට කරන වැරැද්ද ගැන මගෙම හිත හදාගන්න." ඇය පාපෝච්චාරණය කළාය. "කොළඹ හිටපු අවුරුද්දෙදි මහත්තයට මාව එපා උනා කියල මං දන්නවා."

එහි ඇත්තක් ඇතැයි එකඟවන්නාක් මෙන් මම නිහඬව සිටියෙමි.

"ඒත් මං කොළඹින් ආවෙ. ඒ සම්බන්දෙ නවත්තමු කියලා එයාව දිවුරවගෙන." ඇය කීවාය. එය මෙතෙක් කී දේවලට පරස්පර යැයි මම සිතුවෙමි.

මම විස්කි වීදුරුවක් වක් කරගෙන ඇගේ හිස වරක් අතගා මගේ පුස්තකාලය වෙත ගියෙමි. මගේ කියවන මේසයටම සවි කර ඇති පුංචි රාක්කයේ මා නිතර කියවන්නට කැමැති පොත් දහයක් පහළොවක් පවතී. අනික් පොත් ඇත්තේ කාමරයේ අනික් රාක්කවලය. මම ඒ පුංචි පොත් රාක්කය පුරා වේගයෙන් ඇස් යැව්වෙමි.

ඇන්ටිගනී නාට්‍ය පිටපත අතට ගත් මම මැදියම් රැයත් පසුකොට ඒ පුටුවෙන් නැගිට්ටේ එය සම්පූර්ණයෙන්ම කියවා

අවසන් වූ පසුය. මා නැවත නිදන කාමරයට යන්නට හැරෙන විට නාලිනී දොරකඩ උන්නාය. ඇගේ ඇස් රතු වී තිබිණ. මා පොත කියවා අවසන් වන තෙක් ඇය එතනම නොසෙල්වී හිටගෙන සිට තිබිණ. මා පොත කියවන අතර ඇය එහි සිටින්නට ඉඩ ඇත යන සිතිවිල්ල ඇති වුවත් මම හැරී නොබැලුවෙමි. මා ඇයට කළ එකම කුරිරුකම එයයි.

නැවතත් ඇගේ හිස අතගෑ මම ඇගේ අතින් අල්ලාගෙන නිදන කාමරයට ගියෙමි.

දෙවන මහලේ නිදන කාමරයෙන් ඈත ඇතුගල පෙනෙන්නට තිබිණි. එක් අතුරුපාරක් අපේ වත්තේ එක් මායිමක් අයිනෙන් ඇදී ගොස් කොළඹ-කුරුණෑගල පාරට වැටෙන හන්දිය අපේ ජනේලය අසලම ඇති අඹ අත්තක් අස්සෙන් පෙනේ. නාලිනී ඇගේ ආදර කතාව කී අතර මම ලන්ඩන් ජීවිතය ගැන තවත් විස්තර ඇයට කිව්වෙමි. "ඔය දෙන්න කොච්චරනං එක වගේද ඒත් හරි වෙනස්. මට පොඩි කාලෙම ආදරේ කළේ මහත්තය උනානං මගේ ජීවිතේ පුදුම ලස්සන එකක් වෙන්න ඉඩ තියෙන්න ඇති. ඒත් මේක තමයි මට [illegible]රැම."

"ක්‍රිස්ටීන් වගේ මට වෙන්න බැනෙ." ඇය නිහඬතාවකට පසු කීවාය.

ක්‍රිස්ටීන් යනු කවුදැයි ඇයට අවබෝධ වී නැති බව සිතුණ මා තුළ කෝපයක් ඇති වුවද මම කිසිවක් නොකීවෙමි. ඇය එසේ කියා ඇත්තේ ක්‍රිස්ටීන් මා සම්බන්ධයෙන් ක්‍රියා කළාක් සේ ඇයට විජිත සම්බන්ධයෙන් ක්‍රියා කළ නොහැකි බවය යන්න මට තේරුණේ ඇය කී දේ දින කිහිපයකට පසුව යළි සිහි කළ විටය.

අප නින්දට ගියේ උදේ හයට විතරය.

තවත් සතියක් විතර ගිය තැන නාලිනී අපේ නිදන කාමරයට පෙනෙන ඒ විස්මයජනක සිද්ධිය පෙන්නුවාය.

අර අතුරුපාර ප්‍රධාන පාරට වැටෙන හන්දියේ ලයිට් කණුවක් යට තරුණයෙක් සිටගෙන සිටියි. ඔහු හැඳ සිටින්නේ වැරහැලි ඇඳුමකි. කොණ්ඩය කරවටක් වැවී ඇත. කරේ දාගෙන සිටින්නේ දිගු පටි සහිත රෙදි බෑගයකි. ඔහු එහි ආවේ එකොළහට විතර යැයි නාලිනී කීවාය. ඔහු භාවනාවක යෙදී සිටින්නාක් මෙන් සිටගෙන සිටියි.

මා වරක් නින්දට ගොස් අවදි වී බලන විටත් ඔහු ලයිට් කණුව යට ඉඳගෙන උන්නේය.

ඊළඟ දවසේ ඔහු උන්නේ නැත. දින දෙකකට පසු ඔහු යළිත් පෙනී සිටියේය. ඉන් පසු දිනපතාම පාහේ ඔහු එහි පැමිණ ඒ අධිෂ්ඨාන පූජාව පටන් ගත්තේය. එක දවසක මහ වැස්සක් වැටුණේය. ලයිට් කනුවේ එළියෙන් ඔහු සිටින තැන එළිය විය. කලාත්මකව ආලෝකකරණය කළ නාට්‍යයක දර්ශනයක් සේ විය. පින්න කපාගෙන වැටෙන එළිය ඒ දර්ශනය වෙත එක් කලේ සිහිනමය ස්වභාවයකි.

“ඒ තමයි විජිතයියා.” නාලිනී කිව්වාය.

ඇගේ මස්සිනා කෙනෙකු වන විජිත සමග ඇය පෙමින් වෙළී ඇත්තේ ඇයට වයස දාහතරක් තරම් වෙද්දීය. ඒ අත්වැරැද්දක් වැනි සම්බන්ධයෙහි නොයෙක් ගැටලු තිබුණද එය ස්ථිර ආලයක් විය. ඇය මුළු ආත්මයද ශරීරයද ඔහුට පිදුවේ ලාබාල වයසේදීය. ඇගේ සමස්ත පවුලේම ඉතිහාසය නැනා-මස්සිනා විවාහ ජාලයකින් බැඳී ඇත්තකි.

“ඔය මනුස්සය ළඟදිම ඔතන මැරෙනවා.” ඇය ඉකි බින්දාය.

ඒ වන විට අපේ විවාහයට නොගැඹුරු මිත්‍ර සම්බන්ධයක් මිස අඹුසැමි සම්බන්ධයක් නොවන තත්ත්වයක් ඇති වී තිබිණ.

ඒ වැහි දා රෑ එකට විතර නාලිනී මගේ මිනිකුපරය ඒ ලයිට් කණුව යටට පදවාගෙන ගොස් නැවැත්තුවාය. මම ජනේලයෙන් බලාගෙන සිටියෙමි. මගෙන්ම රිය පැදවීම් උගත් ඇය ගිය ඒ

ඉරණම ගමන මට කරන සරදම් ගමනක් සේ මට නොදැනිණ. සැබැවින්ම මා හෙළුවේ සැනසුම් සුසුමකි. කාර් එකේ ලයිට්වල ආලෝකයෙන් තෙතබරිත විජිත හොඳින් පෙනිණ. කාරයෙන් බැස ඔහු වෙත ගිය නාලිනී මොනවාදෝ කියනු මම දිටිමි.

ඉන් පසු දෙදෙනා මොහොතක් වැළඳගෙන සිටියහ. නාලිනී හිස ඔසවා අඹගහ අස්සෙන් ජනේලය ඇති ඉසව්ව දෙස බැලුවාය. ඉන්පසු දෙදෙනාම කාර් එකට නැගුණහ.

දින දෙකකට පසු උපනන්ද මගේ පුංචි කාරය බලගල්ල වත්තට රැගෙන ආවේය. එය තනිකඩයකුට වඩාත් උචිත රථයක් බව මම සිතුවෙමි.

අවුරුදු තුනකට ආසන්න මගේ විවාහ ජීවිතය අවසන් වූයේ එසේය.

මම නැවතත් ගොල්ෆ් වළල්ල සුද්ද කර තණතිල්ල කපා සකසා ගතිමි.

මරා දමා ඇත්තේ නව යොවුන් වියේදී තම හද දිනූ ප්‍රථම පෙම්වතිය යළි දිනා ගන්නට ලයිට් කණුවක් යට අධිෂ්ඨාන පූජාවක් කළ අභීත මිනිසෙකි.

ඊට මා සම්බන්ධ යැයි කියන පෝස්ටර් මොන පාට අකුරෙන් ලිව්වද ඒවා මුග්ධත්වයේ සහ අකාරුණිකත්වයේ අකුරු මිස මනුෂ්‍යත්වයේ අකුරු නොවන බව සිතූ මට විශාල ආත්ම පරාජයක් වැනි හැඟීමක් ඇති විය.

කතන්දර ජාලය

විජිත රත්නායක ඝාතනයෙන් පසු දින සේන සියලු සිංහල පුවත්පත් මිලදී ගත්තේය. ඔහු සිටියේ බන්දුල බලගල්ලගේ විඥානයෙන් අංශුමාත්‍රයක් තමන්ට හිමි වූවාක් මෙන් සිදුවන සියල්ල නිරීක්ෂණය කරමිනි. සිදුවිය හැකි දේවල් අනුමාන කරන්නට ඔහුට හැකි විය. තාලිනීට ලැබෙන, ඇ සුසුම් නංවන දුරකථන ඇමතුම් පිටුපසත්, සතියේ හෝ දවසේ එක්තරා වෙලාවක දුරකථනයට මුලින්ම පිළිතුරු දිය හැකි දුරක සිටිමින් ඇය හොරගල් ඇහිලීම පිටුපසත්, විශාල කතාවක් ඇතැයි සේන නිරීක්ෂණය කර තිබුණේ කෝපයකින් තොරවය. උඩ තට්ටුවේ නිදන කාමරයේ දුරකථනයෙන් ඇමතුම් ගත හැකි වුවත් පහළ ඇතුළු සාලයේ දුරකථනයෙන්ම ඇය පිළිතුරු දෙන්නේ උඩ දුරකථනය භාවිත කළොත් යට සිටින කාට හෝ අසා සිටින්නට ඉඩ ලැබෙන නිසා යැයි සේන හිතුවේය. විවාහ වී කාලයක් ගත වී ඇති වූ ගැහැනියකගේ අමුතු සුසුම් හෙළීම් හඳුනාගැනීමේ හැකියාව ඔහුට තිබිණ. ඇතැම් දවසක රාත්‍රියට පවා බලගල්ල වලව්වේ සිටින ඔහු රාත්‍රියේ නවතින්නේ වලව්වේ දකුණු කෙළවරේ ඇති කාමරයකය. එහෙත්, සේන කෙදිනකවත් පාරේ ලයිට් කණුව යට අධිෂ්ඨාන පූජාව කරන පෙම්වතා නොදැක්කේය. ඔහුගේ කාමරය තිබෙන්නේ පහළ තට්ටුවේ කොනක වන බැවිනි.

තාලිනී නික්ම ගිය දවස්වල සේන ඒ සිදුවීම පිළිබඳ කටකතා ගංගාව මැනවින් පාලනය කිරීම නිසා බන්දුල බලගල්ල සියලුම

කතාව සේනට කිව්වේය. තාලිනී ගැන වැරැදි අවබෝධයක් සේන තුළ නොතිබිය යුතු බැවිනි. වලව්වේ අනික් සේවකයන් තුළද ඇ ගැන වෛරයක් ඇති නොවන සේ කටයුතු බලා කියා ගැනීම සේනට බාර විය. කුස්සියේ උදවිය කටකතා අඹරා කතන්දරවලින් එක එක කෑම ජාති හදන කට්ටියකියි. විහිළු කර තිබුණේද සේනමය. ඔහු සෑහෙන තරම් හොඳට කයිකතන්දර නිර්මාණය වළක්වා ගත්තේ වාචාල ස්ත්‍රියක වන මැණික්හාමිට හා කටකතා ප්‍රචාරක සේවකයකු වන මාටින්ට "රස්සාව නැති වෙන්ඩ පුළුවන්" බව මතක් කරදෙමිනි. ඒ නිසා 'තාලිනී මැණිකේ' පැන යාම පිළිබඳ මාතෘකාව 'දෛවය', 'කරුමේ' යන නියාමවලින් එහාට විස්තර කරන කතා බලගල්ල වලව්වේ හෝ වත්තේ පැතිරුණේ නැත. වත්තේ උස ගස්වලින් වැටෙන පොල් අහුලා අත්ට්‍රැක්ටරයෙන් ගෙනැවිත් මිදුලේ කොණක ගොඩ ගැසීම බාරව සිටි එක කොලුවෙකු "ගෑනු ගෙදර තියල වත්තෙ හිල්බලට බෝල දදා හිටියම ඕක තමයි වෙන්නෙ" යි කියූ බව ආරංචි වූ සේන පොල්පෝර ගබඩා කර ඇති කාමරේට ඔහු කැඳවා කන හරහා දෙපාරක් ගසා රස්සාවෙන් අස් කළේය. රෙදි වැලෙන් අතුරුදහන් වූ තාලිනීගේ යට ඇඳුම් කීපයක් ඔහුගේ කොට්ටය අස්සේ තිබී හමු වූ නිසා දෝ ඔහු රැකියාව අහිමිව ගොස් වාචාලකම් නොකළ යුතු බවට සේන කළ තර්ජනයට ඒ කොල්ලා හොඳටම බිය විය. වලව්වේ සහ වතුවල සේවක පිරිසත්, නෑදෑ පිරිසත්, නගරයේ ප්‍රභූ පවුල්වල අයත් ප්‍රාර්ථනා කළ විවාහයක් මෙසේ බිඳ වැටීම ගැන කතා ඇතිවීම ස්වභාවික වුවත්, බන්දුල බලගල්ලගේ 'අමුතු බව' ඊට හේතුවක් වූ බවට යම් යම් කතා පැවැතියත් සිද්ධියේ උණුසුම දික්කසාද නඩුව අවසන් වන්නටත් පෙර නිවී ගියේය. ඒ දෛවෝපගත සිද්ධියේදී සේන හැසිරුණ ආකාරය නිසා බන්දුල බලගල්ල සහ සේන අතර සමීප මිත්‍රත්වය වර්ධනය විය.

විජිත රත්නායක ඝාතනය පිළිබඳ ජාතික පුවත්පත් සියල්ලම වාර්තා කර තිබුණේ එය වෙඩි හුවමාරුවක පලයක් ලෙසිනි. එක් විකල්ප පුවත්පතක් පමණක් එය ඇතුගල්පුර සිංහයාගේ පිරිස විසින් කරන ලද දරුණු හිංසන ක්‍රියාවක් ලෙස වාර්තා කර තිබිණි. සාමාන්‍යයෙන් සිංහල පුවත්පත් නොකියවන බන්දුල බලගල්ලගේ

සිත් ඇදගන්නට ඒ පුවත්පත සමත් විය. "මේක හැමදාම ගන්ඩකො සේන" ඔහු සේනට කීවේය. "සර් දන්නැතුවට ඕක මං හැමදාම අරන් එකතු කරනවා." සේන සිනාසෙමින් කීවේය.

බන්දුල බලගල්ලගේ සිත් නොසන්සුන් කරන ඡායාරූපයක් පුවත්පත් දෙකකම පළ වී තිබිණ. ඔහු ඇතුගල්පුර සිංහයාගේ සුවදුක් බැලීමට සිංහ රෝහලට ගොස්, ඔහුගේ උරහිසින් අල්ලාගෙන දයාවෙන් බලා කතා කරන සැටි ඒ ඡායාරූපයෙන් පෙනිණ.

"සර් බලන්ඩකො මේක." සේන කොටසක් හඬනගා කියවීය.

"වයඹ පලාතේ අග්‍රගණ්‍ය ප්‍රභූවරයකු වන බන්දුල බලගල්ල ශ්‍රීමතාණන්ගේ රුමත් තරුණ බිරිඳ රවටා පැහැරගෙන ගිය ඊනියා විප්ලවවාදියකු වන විජිත රත්නායක මෙසේ අනතුරට ලක්වීම දිට්ඨධම්ම වේදනීය කර්මයක් පලදීමකියි තතු දත්තෝ කියති."

ඒ වාර්තාව පිළිබඳ සිහිවන මට තව දුරටත් බන්දුල බලගල්ල මගෙන් ඈත් කර ප්‍රථම පුරුෂයෙන් මේ ස්මරණය ලිවිය නොහැකිය. ඒ සාහසික වාර්තාව මගේ හදවත පසාරු කළේය. එය විජිතට කරන අපහාසය මටද වේදනාවක් විය.

"භාෂාව මේ විදියට දූෂණේ කරන්ඩ පුළුවන්ද? අවුරුදු ගාණකට කලින් සිද්ධ වුණ පෞද්ගලික දෙයක් මේකට සම්බන්ධ වෙන්නෙ කොහොමද? මිනිස්සුන්ගෙ ජීවිත ඔහොම ආක්‍රමණය කරන්ඩ පුළුවන්ද?" මගේ කෝපය නිසා එළියට පැන්න ඉංග්‍රීසි වැකි සේනට සම්පූර්ණයෙන් තේරුණාදැයි මම නොදනිමි. ඔහු මගේ කෝපය අනුමත කරමින් කතා කළ ආකාරයෙන් තේරුණේ ඔහු එය වටහා ගත් බවකි.

"අපේ රටේ ඔහොම තමයි සර්. දේශපාලනේ එක. ජීවිතේ දෙක. දකුණත් එකයි වමත් එකයි ඔතනදි."

"ජීවිත වෙනුවෙන්නෙ දේශපාලනේ තියෙන්නෙ." මම කිව්වෙමි.

"ඒ එංගලන්තෙ මෙහෙ ජීවිත තියෙන්නෙ දේශපාලනේ වෙනුවෙන්. අනික සර් මේව ඔක්කොම ගොළුවිජේගෙ වැඩ. මේක ලියලා තියෙන වාර්තාකාරයා ඉන්නෙම සල්ලිකාරයන්ගෙ දේශපාලකයන්ගෙ ගෙවල්වල. සර්රුත් ඔවුන්ට එන්ඩ කියල හාල් පොල් එහෙම දෙනවානං සර්ට ඕනැ විදියට ලියනව. ඕක ලියලා තියෙනෙකා ඉන්නෙම ගොළුවිජේගෙ ගෙවල් පැත්තෙනෙ. කාලකණ්ණි වේසිගෙ පුතාල පත්තරකාරයො උනාම ඕක තමයි වෙන්නෙ."

සේන කවදාවත් නැතිව කෝපයෙන් කෑ ගැසීම දැක මගේ කෝපය පහ විය. මම දොස්තර සමරසේකරට දුරකථන ඇමතුමක් ගත්තෙමි.

"ංආ බන්දු අන්න ඔයාගෙ පොටෝ එකක් අද පත්තරේ තියෙනවා. මගෙ ස්ටේට්මන්ට් එක දැක්කද? හොඳට දාල තියෙනවා."

"ගොං දොස්තරලා" මට කියන්නටම සිතුණද ඒ වචන පිටවීම වළක්වා ගතිමි.

"ඩොක්ටර් බැලුවද ඒ රිපෝට් එක." මම ඇසුවෙමි.

"කියෙව්වෙනං නෑ."

"කියවල බලන්න. දැක්කෙ නැද්ද රිපෝටර් මගෙ පෞද්ගලික ජීවිතේ මේකට පටලල තියෙන හැටි. මම දැන් කතා කරන්න ඕනෙ වික්‍රමසිංහට." මා -දැන්- අවධාරණය කරමින් කිව්වෙමි.

"සර් තවම හොස්පිට්ල්. පරීක්ෂණේ ඉවර නැනෙ." දොස්තර සමරසේකර කීවේය. "සර්" යන වචනයෙන් ඇඟවුණේ නියාලුකමක් පමණක් නොව, ඔහු අසල විජය වික්‍රමසිංහද සිටින බවකි.

"පරීක්ෂණේ" යනු රැවටිලිකාර වචනයක් බව මට වහා පෙනිණ.

විජය වික්‍රමසිංහ රෝහල්ගත වූයේ වෛද්‍ය පරීක්ෂණයට මුහුණ දීමට නොව, පොලිස් පරීක්ෂණයෙන් මගහැරීමට බව මේ වන විට මට වටහා ගත හැකිවිය. ඇතුගල්පුර සිංහයා තමන්ගේම රෝහලක් සාදාගෙන ඇත්තේ සෞඛ්‍ය සේවය සඳහා පමණක් නොව, දේශපාලනය සඳහා බව සේනද කීවේය. දේශපාලකයන්ට නීතිමය ප්‍රශ්නයක් ඇති විට රෝහල්ගත වන්නට තමන්ගේම හෝ තම මිතුරන්ගේ රෝහල් ගොඩනගාගෙන සිටින බව සන්ඩේ ටයිම්ස් දේශපාලන ලිපියේද මම කිහිපවරක් කියවීමි.

"දොස්තරල කියන්නෙත් එතකොට මේ හොර වැඩේ කොටස්කාරයොනෙ." මට කියවිණ.

"ලංකාවෙ දොස්තරල කියන්නෙ සල්ලි හම්බකරන්ඩ බලාගෙන ඉගෙනගත්ත උන්. එවුන් බිස්නස්කාරයො. බිස්නස්කාරයො කියන්නෙ දේශපාලකයො එක්ක සම්මුති ගහන උන්. ඔවුන් ගොඩක් එවුන්ගෙ කාර්වලට ටයර් දාල දෙන්නෙත් බෙත් කොම්පැනි." සේන ආවේශ වූවාක් සේ කියාගෙන ගියේය.

"සේන මිනිස්සුන්ට එහෙම කියන්ඩ එපා. දොස්තරල අතර හොඳ අය ඉන්න ඉඩ තියෙනවනෙ." මා කීවේ අමනාපයෙන් මෙනි.

"ඉඳල හිටල එකෙක් දෙන්නෙක් ඉඳියි. නිදහස් අධ්‍යාපනෙන් ඉගෙනගත්ත දොස්තරල ඔක්කොම වගේ පරයොම තමයි. උන් පොඩිකාලෙ වලව්කාරයො නොවුණ එකේ ඇරියස් එක ගන්ඩ තමයි දෙස්තරකම පාවිච්චි කරන්නෙ. රතු කමිස ඇඳගත්ත ජාතිවාදියොන්ටයි සර්ලා වගේ අයටයි තේරෙන්නැති කැල්ලක් තමයි ඔය. ලංකාවෙ පහළ වෙන්ඩ පුළුවන් එකම එක සේනක බිබිලෙ කෙනයි. ඒත් ඒ මනුස්සය වලව්කාරයෙක් හින්ද. ඒ මනුස්සයට දොස්තරකමෙන් අල්ලන්ඩ ඇරියස් නැනෙ."

"සේනක බිබිලෙ? එයා අපිට නෑයොත් වෙනවනෙ." මම කීමි.

"සර්ලට නෑයො වෙන්නෙ පවුල් පත්සල්වලින්. එතුමා අපිටත් නෑයෙක් හැබැයි අදහස්වලින්." සේන කීවේය.

එම කියමන අදහසක් ලෙසටත් කියමනක් ලෙසටත් මගේ සිත් ගත්තේය.

සේන සහ මා අතර සමීප මිත්‍රත්වය වර්ධනය වූයේ එවැනි සංවාද ඔස්සේය. තම පුතා වැඩ වර්ජනයකින් රස්සාව අහිමිව කඩයක් දමාගෙන සිටියත් එය හරි නොගිය තැන රස්සාවක් සොයමින් සිටින බව ලියන මහත්තයා මට කීවේ මා තනිකඩව ඉන්නා දවස්වලමය. ලියන මහත්තයාගේ පුතෙකු මලියදේවයට දමා දෙන්නට අපේ පප්පා එකල මැදිහත් වූ බවක් මට මතකය. මේ වැඩ වර්ජකයා ඒ පුතා බව ලියන මහත්තයා මට කීවේය. ඔහුට වඩා වෙනස් ආකාරයකට වතුපිටි පාලනය කළ හැකි කෙනෙකු සොයමින් සිටි මම සේනට පණිවිඩයක් යැවීමි. පුතාගේ පැමිණීමෙන් වැඩි දවසක් නොයා ලියන මහත්තයා සියලු ලියුම්කියුම් බාර දී විශ්‍රාම ගත්තේය. මා ඔහුට උනුමියේ වත්ත බලා ගැනීමේ කාර්ය පැවරුවේ එය පිහිටියේ ඔහුගේ නිවස අසලම බැවිනි.

සේන රැකියාවට ගන්නට කළ ආරම්භක සම්මුඛ සාකච්ඡාව ගැන මට වැඩිමනත් දෙයක් මතක නැත. ඔහු අහන ප්‍රශ්නවලට කෙටි පිළිතුරු දුන්නා මිස මගේ සිත් කාවදින යමක් කී බව මට සිහි නොවේ. යම් සඟවාගත් කෝපයකින් ඔහු පසු වූ බව පෙනිණි. මම ඔහුට කරන්නට ඇති දේවල් විස්තර කළෙමි. මා තනතුර හැඳින්වූයේ මැනේජර් යන නමිනි. මා ඔහුට යෝජනා කළේ ඔහු හීනෙන්වත් අපේක්ෂා නොකළ වැටුපකි. ගුරුවරියක වන ඔහුගේ බිරිඳගේ වැටුප මෙන් දෙගුණයකි. ඔහුගේම පාවිච්චියට මෝටර් සයිකලයකුත් ලැබෙන්නේය. සේන මගේ ටවර් ඔෆ් බාබෙල් පොත් කඩේ ගැන දැන සිටියා පමණක් නොව, එය පවත්වාගෙන යාම අගය කළේය. බර්නාඩ් සොයිසා කුරුණෑගල රැස්වීමකට පැමිණ සිටි දවසක ඒ පොත් කඩේ දැක එහි ගිය බවත් කුරුණෑගල සමසමාජ නායකයකු වූ විල්බට් ජයකොඩි සහෝදරයා පොත්

තඩේ අයිති කෙනා ගැන විස්තරයක් කළ විට බර්නාඩ් ඉතා උනන්දුවෙන් අසා සිටි බවත් සේන කීවේය. බර්නාඩ් සොයිසා නම් ප්‍රසිද්ධ පුද්ගලයා පැමිණ පොත් හතරක් පහක්ම ගත් බව එදිනම පෙරේරා අන්කල් මට වාර්තා කළ හැටි මට යන්තමට මතක තිබිණි.

ඇතුගල්පුර සිංහයා පොලිස් පරීක්ෂණ මගහැරීමට තමාගේම රෝහලේ රෝහල්ගත වී තමා සමගම බිස්නස් කරන වෛද්‍යවරුන් ලවා වෛද්‍ය සහතික ලබා ගැනීම නම් සිද්ධිය නිසා සේන සහ මා අතර සුහද මිත්‍ර සංවාදය තවත් වැඩුණේයැයි කියන්නට පුළුවන. පාදෙණියේ වෙඩි පහරින් සිදු වූ එකම යහපත එයයි.

මා මගේ භාවනාත්මක ගොල්ෆ් වළල්ලෙන් නොපෙනෙන අගාධයක් කරා මා ඇදගෙන යන ලෝකාන්ත දියසුළියකට හසුවීම වළක්වා ගත්තේද මා සාර්ථක ව්‍යාපාරිකයකු කළේද මගේ චතුපිට් කළමනාකාරක සේනය.

බොහෝ සාර්ථක කෝටිපතියන්ගේ ව්‍යායාම පිටුපස සේන වැනි සේවකයෝ නිර්නාමිකව සැඟවී සිටිති.

මළවුන්ගේ නගරයක

විජිත රත්නායකගේ අවමංගල්‍ය උත්සවය කුරුණෑගල මාලිගාපිටියේ පැවැත්වූයේ ශෝකයට වඩා බලය පෙන්වීමට මෙන්ය. එය මුළු නගරයම රතුපාට කළේය. රතු කොඩි, රතු පෝස්ටර්, රතු බැනර්, රතු තොප්පි, රතු අකුරු සාගරයක් විය. මේ තත්ත්වය අපේක්ෂා කළ පොලිසිය සහ හමුදාව විශේෂ ආරක්ෂාවක් සලසා තිබිණි. උදේ සිට විවිධ පළාත්වලින් සෙනග ආහ. සාමාන්‍යයෙන් නගරයට යාමට විශේෂ අවශ්‍යතාවක් නැති මා ගෙදරටම වී සිටි අතර සේනද මා වෙනුවෙන් නිරන්තරයෙන් උන්නේය. ටවර් ඔෆ් බාබෙල් එදිනට වසා දමන ලෙස ඔහු පෙරේරා අන්කල්ට උපදෙස් දී තිබිණ. "මවුබිම වෙනුවෙන් දිවි පිදූ විජිත සහෝදරයාට විප්ලවීය ආචාරය" යන දැවැන්ත රතු බැනරයක් ඇතුගලේ ඇත් බඳ මත සවි කර තිබුණෙන් එය හරියටම අපේ සාලෙට පෙනිණි. සේන සිය මෝටර් සයිකලයේ රවුමක් ගොස් පැමිණ "උං මිනිය සැහෙන ගාණකට විකුණ ගන්නයි යන්නෙ. මං කිව්වෙ නැද්ද සර්ට?" යි බන්දුල බලගල්ලට කීවේය. ඔහු පැමිණ වැඩි වෙලාවක් යන්නට පෙර රාධාගේ කාර් එක වේගයෙන් ආවේය. "වීවීලටත් කොළඹ දිහාට යන්න කියල උපදෙස් හම්බ වෙලා." ඇය කීවාය.

සේන ඇයට හා මට කතා කරන්නට ඉඩ දෙමින් මෙන් ඉවත්ව ගියේය.

"සේන. අද නම් උදෙන්ම උනත් බොන්න පුළුවන් දවසක්." ඇය ඔහුට කීවාය.

"බියර්?" මම ඇසීමි.

"මම විහිළු කළේ. මට තැඹිලි වතුර හොඳයි." ඇය කීවාය.

සැලැස්ම පවතින්නේ මිනිය රැගෙන නගරය වටා යන්නට බවත්, ඒ නිසා විවි ගෘප්ස්හි සියලු ව්‍යාපාරික ස්ථානවලට පොලිස් ආරක්ෂාව සපයා ඇති බවත් ඇය කීවාය.

"ඔයා දැක්කෙ නැද්ද?" ඇය ඇසුවේ රහසක් කියන්නාක් මෙනි.

"මොකද්ද?"

"නැත්තං කමක්නෑ."

"මොකද්ද?"

"ඔයාලගෙ තාප්පෙ. "

එවිටම සේන තමාම තැඹිලි වතුර වීදුරු දෙකක් රැගෙන ආවේය.

"මං සර්ට කිව්වෙ නෑ. අර කාලකණ්ණි තාප්පෙ ගහලා. වැඩවසම්-ලුම්පන් සංධානයක් විසින් විජිත සහෝදරයා ඝාතනය කරයි කියලා." සේන කීවේය.

"ඒ කියන්නෙ?

"ඒ කියන්නෙ බලගල්ලයි - ගොළු මුදලාලියි එකතු වෙලා මිනී මැරුව කියන එකනෙ."

වැඩවසම් යන විශේෂණය මා සම්බන්ධයෙන් යෙදීම මා කම්පනය කළ බව ඇත්තය. එහෙත්, මගේ කෝපයට හේතු වූයේ ලුම්පන් යන වචනය ඉතා දුර ඈතින් හෝ මා සමග සම්බන්ධ කිරීම ගැනය. මා නිකමෙකු වන්නට පුළුවන. හුදෙකලා මිනිසෙකු වන්නටද පුළුවන. එහෙත් ලුම්පන් යනු මගේ විරුද්ධ වචනයයි.

මට මා වෙතින් ඉවතට ගොස් ඈත සිට මා දෙස බලා ඒ චෝදනාව සහ මා අතර සම්බන්ධය නිරීක්ෂණය කරන්නට අවශ්‍ය විය. "යමු අපි බලන්න." මම ඉස්සර වීමි.

"ඔකලා සටන් පාට හදන්නෙ අර ඉස්සරහ කඩේ කොත්තු ගහනව වගේ. මේ ඉල්ලුව මේ ගැහුවා මේ දුන්නා. රොටී මදි උනොත් පරාටා හරි කපල දාල ගහනවා. ඔච්චර කැවොත් බඩ අජීරණ යන්නෙ අපේ." සේන මා වළක්වන්නට තැත් කළේය.

"අයි ලයික් කොත්තු. අපි යමු. රාධා ඉන්න." අප පසුපසින් ආ ඇයට මම කිව්වෙමි.

අප ගේට්ටුව ළඟට යන විට එතැනටත් ආරක්ෂාව සපයා තිබිණ.

"ලිංගික ඊර්ෂ්‍යාව සහ පන්ති වෛරය දෙකම එක්ව කළ ලුම්පන් කුමන්ත්‍රණයක් මවුබිමේ සුජාත පුත්‍රයා බිලිගනී."

ඒ දැවැන්ත රතු පෝස්ටරය අපේ ගේ ඉදිරිපිට තාප්පෙන් බාගයක් පමණ අරා තිබිණ. එහි තේරුම පැහැදිලි කරදීම අවශ්‍ය නොවීය. මගේ සිතේ කෝපයද පසුතැවිල්ලද එක්වර නැග එනු දැනිණ.

"සේන ගන්න මේකෙ ෆොටෝ එකක්." කියූ මම වහා නිවසට දෙසට ඇවිද ගියෙමි.

පිටත සාලයේ සිට සියල්ල බලා සිටි රාධා මා එහි ඇතුළු වන විට මගේ මුහුණ දෙස බැලුවේ සමාව අයදින්නාක් මෙනි. මම නාලිනීට දුරකථන ඇමතුමක් ගත්තෙමි.

"හලෝ නාලිනී?"

"ඒ සහෝදරීට කතා කරන්න බෑ මේ වෙලාවෙ. කවුද කතා කරන්නෙ?"

"ඔය කවුද?" මම සැරෙන් ඇසුවෙමි.

"මේ පක්ෂෙන් කතා කරනවා. විජිත සහෝදරයගෙ උත්තමාචාර වැඩසටහන සම්බන්ධ කාරණයක් නම් පක්ෂෙට පුළුවන් පණිවිඩේ ගන්න."



පිළිතුරු දීමට සවිකර ඇති යන්ත්‍රයක් වැනි ඔහු තවත් මොනවාදෝ කියාගෙන ගියත් මම දුරකථනය තිබ්බෙමි. ඉක්බිතිව මම උපනන්දගේ නිවසේ දුරකථනයට කතා කළෙමි. ඔහු නිවසේ සිටියේය.

"උපනන්ද යන්නැද්ද ගියුනරල් එකට?" මා ඇසුවේ කිසිවක් නොදන්නා ස්වරයෙනි.

"අනේ නෑ මහත්තයා. ඒක පවුලෙ වැඩක් විදියට නෙමෙනෙ වෙන්නෙ. නංගිත් එතන හිරවෙලා."

"එහෙමද? මාත් මේ යන්න කියලා බැලුවෙ." මම නිකමට කිව්වෙමි.

"අනේ මහත්තයා යන්ඩෙපා. එවුං මහත්තෙයටත් අපහාස කරන්ඩ පටන් අරන් තියෙන්නෙ." ඔහු කීවේය.

"කවුද එවුං කියන්නෙ?"

"කෝකා කෝක කරනවද කියලා හිතාගන්ඩ බෑ. රතු අකුරු තියෙන හින්ද හිතෙනවා විජිත මල්ලිලගෙ කට්ටිය කියලා. ඒ කට්ටිය කියනවා තව කට්ටිය බැහැලා ඉන්නවා කියල. තව එවුං කියනවා මේවා ඔක්කොම ගොළුවිජේගෙයි මිනිහගෙ ලොක්කන්ගෙයි වැඩ කියලා. කෝකා ඇත්ත කියනවද හොයන්න බෑ. මහත්තයා ටිකක් පැත්තකට වෙලා ඉන්ඩ."

"නාලිනී?"

"එයා හින්දනෙ මහත්තයා මේ ඔක්කොම."

මම වහා සමුගෙන දුරකථනය තැබුවෙමි. ඒ වන විට සේන ආපසු ඇවිත් සිටියේය. මම උපනන්ද සමග සංවාදය මට මතක හැටියට ඒ දෙදෙනාට කිව්වෙමි. සේනගේ අදහස වූයේ විජිතලාගේ පක්ෂය හැර වෙනත් පිරිසක් අවස්ථාවාදී ලෙස මේ සියල්ල පිටුපස සිටින බවයි. "මේ පරයො දැනගන්ඩෙපායැ මෙහෙම මිනිස්සු ඇවිස්සුවම තව පරයි ඇවිල්ලා බොරදියේ මාළු බාන බව. ඊකලා ඉස්සරල කෙරුවෙත් ඕකමයි." සේන කිව්වේය. රාධා සිනාසුණාය. ඒ සේනගේ කතා විලාසයට බව පැහැදිලිය.

"ඇයි මැඩම් හිනාවෙන්නෙ?" ඔහු ඇසීය. ඔහු සහ මා අතර දැන් ඇති වී තිබෙන සමීප සම්බන්ධය නිසා රාධා සමගත් එවැනි ස්වරයකින් කතා කරන්නට ඔහුට ආත්ම ශක්තිය ලැබී තිබීමත්, අපේ සංවාදයේ කොටස්කාරයකු වීමට අවස්ථාව ලැබී තිබීමත් ඔහු ඇසූ ප්‍රශ්නයෙන් ගම්‍ය විය.

"පරයි මාළු බානව කිව්වට, පරයි කියන්නෙත් මාළු ජාතියක්නෙ"

"ඒ පරව්. මේ පරයි. මැඩම්ල පරව් දන්නෙත් නෑ පරයි දන්නෙත් නෑ. කොහෙවත් ඉන්න ගොළුවො කරේ තග්ගන්නට මැඩම්ලට හොඳ වැඩේ."

එසේ කී සේන පිටව ගියේය. රාධාට කට උත්තර නැති විය. "ගොළුවො කරේ තග්ගෙන" යන්න වාච්‍යාර්ථයෙන් ගත් රාධා මා දෙස බලා සිටියේ රතු වූ මුහුණිනි. ඇගේ තිගැස්ම මුහුණේද නළියන්නට විය.

"මොනවද එයා දන්නෙ? ඔයා මොනවද මිනිහට කිව්වෙ?" ඇය මා දෙස බලා රහසින් ඉංග්‍රීසියෙන් ඇසුවාය.

"මුකුත් නෑ. එහෙම තමයි සිංහල කතා කරන්නෙ. ටීචර්ලගෙ කරේ ශිෂ්‍යයො තගින්නෑ කියලා සේන දන්නවා." මම සිනාසුණෙමි. එය ඇගේ මුහුණ තවත් රතු කළෙන් මා සිත පසුතැවිලි සහගත විය. මම ඇගේ උරහිසට අතක් තබා මිරිකීමි.

"මම ආවෙ ඔයා ගැන බයෙන් බන්දු. නැත්තං ටීචී කිව්ව කොළඹ යමු කියලා. පොලීසියේ සීයක් විතර දාලා ටීචීලගෙ ගෙදරට." රාධා බිම බලාගෙන කිව්වාය.

සේනගේ මෝටර් සයිකලය පාර දෙසට ඇදී ගිය නිසා ඔහු තවත් යම් තොරතුරක් රැගෙන එන බව මට විශ්වාසය.

මා රාධාට විහිළු කළේ චිත්තාභ්‍යන්තරයේ පැල්ම අමතක කරන්නට බව මම දනිමි. උපනන්ද "එයා හින්දනෙ මහත්තය මේ ඔක්කොම" යැයි නාලිනී ගැන කීවේය. ඉන් ඔහු අදහස් කළ දේ

මට සිතාගත නොහැකි විය. ඇය මේ සියල්ලේ කොටස්කාරියක්ද? මා ප්‍රශ්නය රාධා සමගවත් බෙදා නොගත්තේ ඇය නාලිනී ගැන හදිසි අර්ථකථනයකට එළඹීම අනවශ්‍ය බැවිනි.

ඒ සියල්ලටමත් වඩා මගේම තාප්පයේ ගසා ඇති පෝස්ටරය මගේ හිත දැඩි සේ රිදවීය. එවැනි කුරිරු භාෂා භාවිතයක් මා ඉන් පෙර දැක නොතිබිණි. සංකීර්ණ ආදර කතාවක් සහ විවාහයක කතාවක් එක රතු අකුරු පේළියකට ඌණ කළ ඒ පෝස්ටරය එය පිටුපසින් සිටින අයගේ භාවමය දූප්පත්කමද තමන් සතුරා යැයි හඳුනා ගන්නා අයට හොඳටම රිදවීමේ දක්ෂකමද පෙන්වන්නේ යැයි මට සිතිණි. එවැනි දුප්පත්කමකින් පැන නගින දක්ෂකමකට කළ හැක්කේ වියළි කතරකට මග කීම පමණක් නොවේදැයි මම මගෙන්ම ඇසුවෙමි. එය රාධා සමග සාකච්ඡා කළ හැකි දෙයක් නොවේ යැයි මම තීරණය කළෙමි. අපේ රටේ ජීවිත තියෙන්නේ දේශපාලනය වෙනුවෙන් යැයි සේන කියන දේ ඇත්තක් නොවේද? ජීවිත යනු දේශපාලන මැෂිමේ ඇඹරෙන අමු ද්‍රව්‍ය පමණද?

එදා රාධා බලගල්ල වලව්වේ නැවතුණාය. රාත්‍රියකට අවශ්‍ය ඇඳුම් ඇය අපේ ගෙදර තබා ගොස් ඇති බව දැන ගැනීමෙන් අපේ මිත්‍රත්වයේ හුය මේ සියලු දියසුළි, සුළි සුළං යටින් නොබිඳී තිබෙන බව දැන ගන්නට ලැබිණි.

එය මගේ සිත සන්සුන් කර සුවපත් කළේය.

වෙඩි පහරකට පසු

එය වෙඩි තැබීමක් මිස වෙඩි හුවමාරුවක් නොවන බව පැහැදිලි නොවූයේ ඇතුගල්පුර සිංහයාගේ ප්‍රචාරය අදහන අයට පමණි. ඩීඅයිජී බාප්පා මිය ගොස් සිටියද තාමත් පොලිසියේ ඉහළ තනතුරුවල අපේ ඥාතියෝද මිතුරෝද සිටියහ. මට එක දුරකථන ඇමතුමෙන් ඇත්ත දැනගැනීමේ හැකියාව තිබිණි. ඒ සම්බන්ධතා ජාල මා සිතාමතාම භාවිත නොකර තිබුණද අවශ්‍ය ඕනෑම විටෙක ඇති කර ගත හැකි දේවල්ය. ලේ ඥාති සම්බන්ධතා පාවිච්චි නොකර තිබුණද මලකඩ අල්ලන්නේ නැත. පිටපළාත්වල පදිංචි අපේ ඥාතීන් කුරුණෑගල හරහා යන විට අපේ ගෙදර රැයකට හෝ කෑම වේලකට නැවතී යාම නිතර සිදු වේ. අම්මා සහ පප්පා වෙනුවෙන් දෙන වාර්ෂික දානයට බොහෝ නෑදෑයෝ එක්වෙති. අක්කාගේ සැමියා වන ආටිගල පවුල පරම්පරා තුනක් විතරම නඩුකාරයන් සහ නීතිඥයන් බිහි කර ඇති සහ දේශපාලන සම්බන්ධතා ඇති බලවත් පවුලකි. දේශපාලන බලය නිසා යට ගැසුණද විජිත රත්නායකගේ මරණය මිනීමැරුමක්ය යන කාරණය සේන ඉවෙන් මෙන් දැන සිටියද මා නිසැක වශයෙන් දැනගත්තේ අර සම්බන්ධතා ජාලය යන්තම් ටිකක් සෙලවීමෙනි. විවීගේ කෙනෙකුට ඒ පැත්තෙන් වෙඩි වැදුණේය යන්න ප්‍රබන්ධයකි. ඔහුගේ අත සීරී යන සේ වෙඩි තබා ඇත්තේ විවීගේම තවත් ගෝලයෙකිය යන කාරණය මට වාර්තා කළේ ඈතින් ඥාති වන කුරුණෑගලම පොලිස් ලොක්කෙකි. එහෙත්,

විජය වික්‍රමසිංහ යනු ඔහුට වඩා විශාල බලසම්බන්ධතා ජාලයක එක් කොණක් පමණි. විශාල දේශපාලන-ව්‍යාපාරික බූවල්ලකුගේ එක් කුඩා අණ්ඩකි.

මේ අනවශ්‍ය මරණය රාධාගේ සිත වංචල කර තිබුණද සිදුවන ක්‍රියාවලියේ ජංජාලමය ජාලා මාලාව ගැන නිසි අවබෝධයක් ඇයට නොතිබිණ. ඇයට මේ සියල්ල පෙනුණේ අවුරුදු ගණනාවක් ගොළුවෙකුව සිට කටහඬ ලබා ගත් අහිංසක නූගත් මිනිසෙකුගේ ගමන අවුරන කුමන්ත්‍රණ ලෙසිනියි මම සිතුවෙමි. සිදුවන දේවල් ගැන මගේ අවබෝධය වර්ධනය කරන්නට සේන මා අසලම සිටියද රාධාට එවැනි කෙනෙක් නොවීය. එසේම වෙඩි පහරින් පසු සිදුවීම් සිදු වූයේද වෙඩිල්ලක වේගයෙනි. එය කිසිවෙකුට නැවතී සිතන්නට ඉඩ නොදෙන වේගයකි. මැතිවරණයක් එමින් තිබුණේය.

මා රාධාට කතා කරන්නට තැත් කළද ඇය සිටියේ වීවී වෙනුවෙන් ඉටු කළ යුතු ව්‍යාපාරික කටයුතු ජාලයකට මැදිවය. සිංහ රෝහලේ හෘද රෝග ඒකකය සම්බන්ධ සංකීර්ණ ගනුදෙනුවක් ඇය භාරයේ පැවැතිණ. ජර්මනියෙන් ගෙන්වන යන්ත්‍රසූත්‍ර පිළිබඳ විශාල ගනුදෙනුවක සියලු සන්නිවේදන කටයුතු කරමින් සිටියේ ඇයයි.

"මිනිහ දේශපාලනේට එන එක නවත්තගන්න බැරිද?" මම ඇගෙන් ඇසුවෙමි.

"ඒක වීවීගෙ තනි තීරණයක් නෙමේ බන්දු. දේශපාලනේ ඉන්න මිනිස්සු එයාව අවුස්සල තියෙන්නෙ. බෝධිපූජා හාමුදුරුවො ජනාධිපතිටත් කියල තියෙන්නෙ මෙයා තමයි ඇතුගල්පුර සිංහයා කියලා. මහ නායක හාමුදුරුවො බිෂොප් ඔක්කොම කියල තියෙන්නෙ වීවී කියන්නෙ හාස්කම් තියෙන දානපතියෙක් කියලා. ඒවට වැඩියෙ බලවත් වචන කියන්න කියන්න පුළුවන්ද ගෑනියෙකුට?"

"ආදරවන්තියෙකුට උනත්?"

"ගෑනියෙකුගේ ආදරේ කියන්නෙ පිරිමියා යන පැත්තටම තල්ලු කරන එක කියල තමයි එයා හිතන්නෙ. අනික එයාගෙ අලුතෙන් ලැබුණ කටහඬ පාවිච්චි කරන එක තමයි එයාගෙ සතුට. පොඩි ළමයෙකුට අලුත හම්බුණ සෙල්ලම් බඩුවක් වගේ හැම තිස්සෙම එයා උස්ස උස්ස පෙන්නන්නෙ එයාගෙ කටහඬ. අපිට තියෙන්නෙ ෂා ලස්සනයි කියන්න විතරයි."

"අනික බන්දු එයාලගෙ දේශපාලනේ තියෙන්නේ මාතෘභූමි අම්මට දක්වන පුත්තුන්ගෙ ආදරේ විතරයි. දූවලට එතන කිසිම තැනක් නෑ."

මම නිහඬ වීමි. එය අරුතක් සහිත කියුමකියි මමද සිතුවෙමි. පැරණි රාධා තවම සිටින බව දැන ගැනීම අපමණ සතුටකි.

"ඒ නිසයි මම ඔයාට කියන්නෙ මිනිහව ටිකක් ස්ලෝ ඩවුන් කරන්න." ඇය පෙරැත්ත කළාය.

මම තව දුරටත් නිහඬව සිටිමි.

"ඔයාට සද්ද නැතුව ඉන්න බෑ. වීවී කියන්නෙ දෛවය ඔයාගෙ ජීවිතේට ඇදල තියෙන ඔයාම අරන් යා යුතු බරක්. ඔයාට ඒක පේන්නැද්ද?" ඇය කීවාය. සිත් කලබලයකින් යුතු අවස්ථාවක පවා ඒ ඉංග්‍රීසි වැකිය ඇය කීවේ එලකියුෂන් ගුරුවරියගේ ව්‍යක්තාලංකාරයෙනි. මගේ විඥානයේ වදින්නට කතා කරන්නට නම් ඒ වාග් සෞන්දර්ය අවශ්‍ය යැයි සිතුවාක් මෙනි.

"යූ ආර් ද වයිට් මෑන්. වීවී ඉස් යුවර් බර්ඩන්." ඈ කිප්ලිංගේ කියමනට මා සිරකොට කීවාය.

වීවී යනු දෛවය විසින් මගේ ජීවන ගමන යාමට දෙන ලද අමතර බරක්ද මා යන ගමනේ විවිධ හන්දිවලදී මට මුණ ගැසෙන අනාථ දරුවෙකුද වන්නේය යන කාරණය ඒ වන විටත් මට ඒත්තු යමින් තිබුණේ වර්තමාන සිදුවීම්වලදී පමණක් නොව, අතීතය පිළිබඳ ස්මරණවලදීද ඔහු යළි යළි මුණ ගැසුණ බැවිනි. මේ අනවශ්‍ය බරෙන්ද වධකාර දරුවාගෙන්ද මා ගැලවෙන්නේ කෙසේද? මගේ උරමත ඇති රාධා කියන කිප්ලිනියානු වගකීම

යනු ඔහු ශිෂ්ටත්වය වෙත එසවීමද? නැතිනම් ඒ බරින් මැඩී මා අශිෂ්ටත්වයක ගිලී යාමද? මම මා මගෙන්ම ඈත් කර මාද මගේ දෛවයද දෙස දුර සිට බලන්නට වීමි.

මේ දෙදෙනාගේ එකතුව බන්දුල බලගල්ල වෙත එක් කළේ අත්‍යවශ්‍ය කුරිරුකමකි. ඒ කුරිරුකම වෙත හරි පදමට කෝපය එක් කරන්නට සේන සිටියේය. විජිත රත්නායක තමා මාතෘභූමිය් සුජාත පුත්‍රයකු ලෙස මැතිවරණ සටනට එළඹ සිටියේය. ඒ අතර ඇතුගල්පුර සිංහයා මැතිවරණයට නාමයෝජනා ලබා ගැනීමට තමාගේ කෙසර සර පෙන්වමින් උන්නේය. විජිත රත්නායකගේ දේශපාලන පක්ෂයද රැස්වීම් මාලාවක් පවත්වාගෙන යමින් සිටියේය. මවුබිම, ජාතිය, දේශය, ජාතියේ සුජාත පුතුන් ආදී යෙදුම් ඒ රතුපාට රැලිවල නිතර නිතර භාවිත විය. කොටි සංවිධානය තැනින් තැන බෝම්බ තියමින් නිරායුධ මිනිසුන් මරාදමමින් ඒ වචනවල දේශපාලන මිලද අලෙවියද වැඩි කළේය. කුමක් හෝ හේතුවක් නිසා කුරුණෑගල නගරයේ බස් බෝම්බ ආදිය පුපුරා ගියේ නැතත් අපේ නගරයේත් ප්‍රධානම දේශපාලන හැඟීම මාතෘභූමියේ වෙත පුත්තුන්ගේ ආදරය - දියණියන්ට වඩා පුත්තුන්ගේ ආදරය - බව පෙනිණ. ඒ ආදරය ඕනෑම මොහොතක අම්මාට ආදරේ නැති 'පිට මිනිස්සු' ගැන වෛරයක් බවටත්, අම්මාට ආදරේ ඇති සුජාත පුත්‍රයන් වෙත ආලයක් බවටත් හැරී පැන නගින්නට සූදානම්ව නළිය නළියා තිබුණේය. සියලු දේශපාලන පක්ෂවලම පාහේ ප්‍රධානම සටන්පාඨය වූයේද චින්තනය වූයේද හැඟීම වූයේද 'මාතෘභූමි අම්මා' වෙත තම තම පුතුන්ගේ ජීවිත දෙවෙනි කළ ආදරයයි. එය පියයුර ඩැහැගැනීමට හෝ අම්මාගේ තුරුලට පැනීමට දඟලන පුතුන්ගේ නාකි හුරතලයක් වැනි විය. විජිත රත්නායකගේ රතු පක්ෂයද එවැනි පුතුන් ආදර මැෂින් බවට දේශපාලනීකරණය කරමින් සිටියේය. සියලු දේශපාලන පක්ෂවලට බෙදා හදාගෙන කෑගහන්නට තිබුණේ වචන කීපයක් පමණි. ජාතිය, මවුබිම, දේශප්‍රේමය, සුජාත නිදහස, දෙදාස්පන්සීයක පවිත්‍ර ඉතිහාසය, ධර්මද්වීප ආදී ඒ වචන අතේ ඇඟිලිවලින් ගණන් කළ හැකි විය. ඒවා භාවිත කොට බලයට ඒමට තැත් කරන පක්ෂ ගණන ඒ වචනවලට වඩා

වැඩි වූ නිසා එක වචනෙකට පක්ෂ දෙකතුනක්වත් තිබුණේය. ඒ නිසා ධර්මද්වීපය ආරක්ෂා කරන්නට තැත් කරන පක්ෂ අතර වෙඩිතබා ගැනීම අරුමයක් නොවේ. ඒ වචන අතරින් හොඳම එක අල්ලා ගැනීමට එකිනෙකා වෙත තුවක්කු එල්ල වූ බැවිනි. මාතෘභූමි අම්මාගේ පූජනීය පතිව්‍රතයට නොගැළපෙන ලෙස සංදර්ශනයක නැටූ හින්දි නළුවෙකුටත් ඒ අම්මාගේ සුජාත පුත්තු බෝම්බ ගැසූහ.

හදිසියේම සිය ස්වයංපෝෂිත, ස්වයංසන්තෘප්ත ලෝකයෙන් එළියට පැමිණ වටපිට බලන විට බන්දුල බලගල්ල මේ සියල්ල ඉතා ඉක්මනින්ද පහසුවෙන්ද නිරීක්ෂණය කළේය. "මේ මිනිස්සු කතා කරන්නෙ වියට්නාම් යුද්දෙ කාලෙ එහෙ මිනිස්සුවත් කිව්වෙ නැති සැර වචන. ගිනි ගන්න වාක්‍ය. හරියට පිටරටක හමුදාවක් මෙහෙ ඉන්නව වගේ." සේන එකතු කරදුන් සිංහල පත්තර බලන ඔහුට සිතුණේය. ඔහු එය සේනට කියන්නට තැත් කළේය.

"ඕව්ව තමයි සර් අපි දේශපාලනේ කියල අහල තියෙන්නෙ අවුරුදු තිහක් විතර. අපේ රටේ තියෙන ඕනෑම ප්‍රශ්නයක් මාතෘභූමි අම්මට විරුද්ධ විදේශ කුමන්ත්‍රණයක් කියල තමයි කට්ටිය හිතන්නෙ." සේන කිව්වේය.

"අපේම වැරැද්දක් නිසා වෙන දේවල් කියල හිතෙන්නැද්ද?" බන්දුල බලගල්ල ඇසුවේය.

"එහෙම හිතුවොත් අපිට වෙනස් වෙන්න වෙනවනෙ. මාතෘභූමි අම්මා පොඩ්ඩක්වත් වෙනස් උනොත් පුත්තුන්ට පිස්සු හැදෙනවා."

"හැම්ලට්ට වගේ." බන්දුල බලගල්ල කීවේය. අම්මා කෙනෙකුට තිබිය යුතු යැයි පුතුන් සලකන පූජනීය අලිංගිකත්වයේ පවිත්‍රත්වය රකින්නට දිවිදෙන පුත්තු ඔහුගේ මනසේ මැවී පැන නැග ආහ.

"අන්න හරි." සේන කීවේය. ඔහු බන්දුල බලගල්ල සහ රාධා එක්ව කලකට පෙර කළ හැම්ලට් නිෂ්පාදනය පුහුණු කළ කාලයේ ආසාවෙන් බලා සිටියේය.

"දැන් ඇන්ඇමිලා කියල ජාතියක් නැනෙ." යැයි සේන කීවද එය සංවාදය හා සම්බන්ධ වන්නේ කෙසේදැයි බන්දුල බලගල්ලට අවබෝධ වූයේ නැත.

ඇන්ඇම් උගත් ලන්ඩන් ස්කූල් ඔෆ් ඉකොනොමික්ස් වෙත පප්පා යවන්නට අත්තාට අවශ්‍ය වූයේය යන කතාවත්, අර්සනායගම් මහතා එහි ලා පප්පා නිතර දිරිගැන්වූ කතාවත් බන්දුල බලගල්ල දැන සිටියේය. අත්තාගේ මරණයෙන් පසු වතුපිටි බලාගැනීමටත් නංගිලාගේ අධ්‍යාපනය බලා ගැනීමටත් පප්පා හිර විය. ඇන්ඇම් සමග එංගලන්තයේ අධ්‍යාපනය ලබන්නට නියමිතව සිටි පප්පා එය නවතා තම නංගිලා දෙන්නා නුවර මහාමායාවට යවා ඉතා ගතානුගතික ගැහැනුන් දෙදෙනකු කරන්නට ලංකාවේ නතරවීම සරදමක් වැනි දෙයකි. පප්පා හිර කළ පොල් වතුම දැන් තමනුත් හිරකර ඇති බවක් බන්දුල බලගල්ලට දැනුණේය. මේ හිරගෙදර බිද දැන් එළියට යන්නේ කොතැනටද?

ඇතුගල්පුර සිංහයා කුරුණෑගලින් පිට පළාත්වලද පවතින රැස්වීම්වල වේගවත් කතා පවත්වන බව බන්දුල බලගල්ලට පෙන්නා දුන්නේ සේනය. යටහත්පහත්ව කටහඬ ඉල්ලාගෙන තමා හමුවට ආ බැගෑපත් සෙය්යාවක් ගත් මිනිසා වේදිකාවල කේශර සිංහයකු වී සිටියි.

"අපේ මවුරට පුණ්‍යභූමියක්. පුණ්‍යභූමියක් විතරක් නෙමේ ස්වර්ණභූමියක්. රත්නදීප කියල කිව්වෙ නිකං නෙමේ. ඒ නිසා මේක ධර්මද්වීපයක් බව කියන්නෙ. අපේ රටේ තියෙන මනුස්සකම වෙන කොහෙවත් නෑ. අපි එක මවකගෙ දරුවො වගේ ඉන්නෙ. මේ මාතෘභූමියෙ තියෙන ශ්‍රී විභූතිය අපි මතු කරගන්න ඕනෙ. මේ පොළොව රන් පොළොවක්. ඕනැම දෙයක් පැළවෙන පින්බිමක්. මේ මාතෘභූමිය ආරක්ෂා කරගැනීම තමයි ජාතියෙ දරුවො කරන්න ඕනෙ."

සේන එය නාට්‍යමය ලෙස හඬනගා කියවීය.

"මිනිස්සුන්ගෙ මූලික අවශ්‍යතා, සාධාරණය, යුක්තිය, අයිතිවාසිකම් - ඒව ගැන නෙමේද දේශපාලකයො කතා කරන්නෙ?" බන්දුල බලගල්ල ඇසීය.

"එව්ව කතා කරන අය ඉන්නව. එව්ව කාටවත් ඇහෙන්නැ. පත්තරවල නැගල යන්නෙත් නෑ." සේන කීවේය.

"ඉංග්‍රීසි පත්තරවල තියෙනවනෙ." බන්දු කීවේය.

"එව්ව තියෙන සිංහල පත්තරත් තියෙනවා. වැඩිපුර තියෙන්නෙ ඔය වගේ අදහස් ජාතිද්‍රෝහි අදහස් කියල කියන පත්තර."

"මේ බලන්ඩකො ගොළුව කියනෙව්ව." සේන පත්තරේ තවදුරටත් කියවන්නට පටන්ගත්තේය. වීවිට තවමත් ගොළුවායැයි කීමේ සිරිත නවත්තන්නැයි කියන්නට බන්දුල බලගල්ලට අවශ්‍ය වුවද ඊට ඉඩ නොතබා සේන පත්තරේ හඬනගා කියවන්නට පටන්ගත්තේය.

"මේ රන්පොළොවෙ කොහෙ හැරුවත් මතු වෙන්නෙ මුතු මැණික් - රිදී - ගජමුතු - ගෝරෝචන - නාග මාණික්‍ය - ඇත් දළ - දියමන්ති. සමහර ඒවා ස්වභාවිකවම අපේ මාතෘභූමිය නමැති අම්මා අපි වෙනුවෙන් ආරක්ෂා කරන ඒවා. සමහර එව්වා අපේ මුතුන් මිත්තො අපි වෙනුවෙන් නිධන් කරපුවා. මේ නිධානය පාදාගත්ත දවසට අපි ලෝකෙ කාටවත් බයවෙන්න ඕන්නෑ. පරදේශක්කාරයො, සුද්දො මේ මාතෘභූමියෙ ධන නිධානය කොල්ලකන්න බැලුවා. පුළුවන් උනාද? බෑ. ආයෙ කොල්ල කන්න දෙනවද? නෑ. අපි දෙන්නෙ නෑ." සේන වචන පණ පොවා කීවේය.

බන්දුල බලගල්ල සිනාසුණේය.

"ඇයි සර් හිනාවෙන්නෙ මෙහෙම තමයි කට්ටිය කියන්නෙ. මූ මේවා ටිකක් මෝඩ විදියට කිව්වට මෝඩනැති එවුනුත් මෙව්වම තමා කියන්නෙ. අරුං ඔය විජිත රත්නායකලගෙ කට්ටිය. උනුත් මෙව්වම තමයි කියන්නෙ වෙනසකට තියෙන්නෙ සමාජවාදය, නිර්ධන පන්තිය, අරව මේව දෙක තුනක් එහෙන් මෙහෙන් දානව අජිනොමොටෝ වගේ."

බන්දුල බලගල්ල සේන විසින් හඬගා කියන ලද වචන තම සිතෙහි ශබ්දාගාරයේ නැවත වාදනය කරන්නාක් මෙන් යළිත්

සවන් දී බැලුවේය. කේසර සිංහයෙකු කෙසරු ලෙළවා වදන් අසිපත ලෙලවයි. පණ පිහිටුවා, හඬ නංවා කියන කල සිංහල භාෂාව රුධිරයට එකතු වී ශ්‍රාවකයාද පණ ගන්වයි. මේ වචනවල එන අදහස් ගැන විවේචනයක් ඇති සේන ඒ වචනවලට පණ දෙන කල ඒවා බන්දුල බලගල්ලගේ රුධිරය පණගන්වන තරම් උණුසුම්ය. මේ භාෂා වශීකරණයට මිනිසුන් හසුවීම පුදුමයක්දැයි ඔහු තමාගෙන්ම අසාගත්තේය. ඒ වශීකරණයේ අවසානය කුමක්ද?

විනීතාගේ අනාවරණය

ඒ තීරණාත්මක දුරකථන ඇමතුමෙන් කියවුණේ විනීතාට මා හමුවීමට අවශ්‍ය බවයි. ඇය මගේ සෙලියුලර් දුරකථන අංකය රාධාගෙන් ලබා ගත් බව කීවාය. ඇ කතා කලේද සන්සුන් විනීතාචාරයකිනි. ඒ නිසා කිසිම ගිනිකෙළි සංදර්ශනයක ලකුණු පෙනුණේ නැත. මේ සංවාදය සඳහා මා කාලයක් සූදානම්ව සිටියේයැයි කියන්නට පුළුවන. එහෙත්, මේ එළඹෙන්නේ මා සූදානම්ව සිටි සංවාදයද යන්න මට නිශ්චිතව සිතාගත නොහැකි විය.

“සේන මල්ලිල එහෙම නැතුව හම්බවෙන්න පුළුවන් නම් තමයි හොඳ සර්” ඇය බැගෑපත් ලෙස කීවාය.

මම මිනිකුපරය සර්විස් කරන්නට සේන යැව්වෙමි. ඒ හුරුබුහුටි කාරය එළවන්නට ඔහු ආසා කරන බව මම දනිමි.

විනීතා සමග කෙදිනකවත් තනිව කතා කරන්නට අවස්ථාව ලැබී නැත. ස්වභාවයෙන්ම ඇය වැඩිමනත් කතාබහක් නැති කාන්තාවකි. සැමියාගේ ව්‍යාපාර ලෝකයෙන්ද දැන් දැන් බෙහෙවින් දුරස් වී සිටින ඇට මා මුණ ගැසීමට ඇති එකම අවශ්‍යතාව කුමක්දැයි මම හොඳින් දනිමි. එළඹෙන අවස්ථාවට අවංකව මුහුණදීමට මම සිතා ගතිමි. මිත්‍රත්වය යනු හොඳ නරක පිළිබඳ පරමාදර්ශ නොසලකන ඒකාධිපතිවාදයක් විය හැකි වුවත් මම ඒ වෙනුවට යහපතෙහි පැත්ත ගන්නට සිතාගෙන සූදානමින් උන්නෙමි. සපත්නීරෝෂයෙන් වියරු වැටුණ ගැහැනියක මගේ

ස්වයංපෝෂිත සන්සුන්භාවය සුන්බුන් කරමින් එළඹෙන්නට ඉඩ ඇත. එය එසේ වන්නේ නම් ඒ මගේ ඉරණමය; මිත්‍රත්වයක් වෙනුවෙන් ගෙවන මිලය.

මා කාර් එකක් අපේක්ෂාවෙන් ඉන්නා විට මිදුලේ නැවැත්වූයේ ත්‍රීවීලරයකි. විනීතා ඉන් බැස්සාය. පොළොව පුපුරන ගිනි මද්දහනේ වුවත් ඇයගෙන් පෙනුණේ නිවුණු බවකි. මම සන්සුන් වූයෙමි. අපට බොන්නට අනෝදා බීම හදන්නැයි මා කුස්සියට කියා තිබිණ.

ඇය සුදු සාරියක් හැඳ සිටියාය. කොණ්ඩය තනි කරලට ගොතා තිබිණ. ඇය ත්‍රීවීලරයේ සිට මා හිඳ සිටි ඉස්තෝප්පුවට ආවේද සන්සුන් ගමනිනි. ඇය දුටු විට මට නැගිට සිටින්නට සිතිණි. එය ඇය අපේක්ෂා නොකළ දෙයකි. ඒ නිසා ඇය තුළ යම් හෝ කෝපවේගයක් වී නම් එයට නිවී ගිය බවක් පෙනිණ. ඇය මා ඉදිරියේ හිඳගැනීමට පෙර මෙත්සිතක් වෙත කවුළුවක් විවර කරන්නාක් වැනි සිනාවක් පෑවාය. මා අපට වාඩිවීමට ස්ථානයක් සකස් කර තිබුණේ හොරෙන් කන්දෙන සේවකයකුටවත් නොඇසෙන ලෙසිනි. මා ඇතුළු සාලයෙන් එබී කුස්සිය පැත්තට කතා කළේ නියම කරන ලද බීම ගෙනැත් දී කුස්සියටම ආපසු යන්නැයි එඩ්මන්ඩ්ට කීමටය. ආපසු ඇවිත් විනීතා ඉදිරියේ හිඳගන්නා විට මෙත් සිතින් වුවත් ඇය කියන්නට යන්නේ මා දැනටමත් දන්නා දෙයක් බව මට හොඳටම විශ්වාසය.

ඇය අනෝදා උගුරක් තොල ගැවේ කිරි සුදුවට දිලෙන ඒ දෙස හොඳින් බලමිනි.

“සර්. සර් හම්බවෙන්න මං හිත හිත උන්න හරි කාලෙයක්. අවුරුද්දක් විතර වෙන්න ඇති. ඒ උනාට සර්ට මෙච්ච කියල මොකටද කියල තමයි මං උන්නෙ. මේක මූදෙ දැම්ම වගේ රැකෙන්න ඕනෙ කියන එකයි මගෙ අදහස. ඒකයි මං කිව්වෙ සේන මල්ලිත් නැති වෙලාවක්නං හොඳයි කියලා. අපේ මහත්තය මොනව උනත් දේශපාලනෙන් ඉස්සරහට යයිනෙ. අර මනුස්සය මැරුණ එකෙන් සර්ට හරි අපවාදයක් උනා. දැන් මේක තව එකක්.

මොනව උනත් මෙච්චර කාලෙයක් එකට උන්න මනුස්සයනෙ. ඒ ඔක්කොටමත් වඩා සර් මෙච්ච දැනගෙන ඉන්න එක හොඳයි..”

අපේ මහත්තයට කටහඬ ලැබිලා සමාජෙ මේ තරම තත්ත්වෙකට ආවෙ සර් හින්දා. රාධා ටීච හම්බුණෙත් සර් හින්දනෙ.” ඇය විරාමය තබා අනෝදා උගුරක් බීවාය. “ඉස්සර ඉඳලම බලගල්ල වත්තෙ පලතුරු තිබුණා.” ඇය කීවාය.

“වීවීට කටහඬ ලැබුණ එක අහම්බයක් වගේ දෙයක්. අපි නම් බලාපොරොත්තු උනේවත් නෑ. මිසිස් වික්‍රමසිංහලා ඇවිල්ල කියපු හින්ද අපි පොඩි දේවල් ටිකක් කළා විතරයි. රාධා නම් හරියට මහන්සි උනා.” විනීතා මට පුදන ගෞරවය මම රාධා වෙත හරවා යැව්වෙමි.

“අපේ මහත්තය එච්චර ඉගෙනගත්තු කෙනෙක් නෙමෙ උනාට පුදුම දක්ෂ මනුස්සයෙක්. මං ඒක ඉස්සරලම දැක්ක හින්ද තමයි නැන්ද කිව්වම අපේ ගෙදර අය ටිකක් පස්සට ඇද්දත් මං කැමති උනේ. කටහඬ හම්බුණාට පස්සෙ නම් රාධා ටීච පුදුම වීරියක් ගත්තෙ අපේ මහත්තයව ලෝකෙ ඉස්සරහට ගෙනියන්න. ඒ ගවුරවේ රාධ ටීචට නැතිවෙන්නෑ මොනව සිද්ද උනත්. අපරාදෙ කියන්නෝන්නෑ ටීච දරුවෙක් වගේ තමයි මෙයාව බලා ගත්තෙ.”

“මොනව සිද්ද උනත්” යන්න මගේ හෘදය ස්පන්දනය වැඩි කළේය.

“සර්ට මං මේ නොකිය හිටියොත් හොඳ නෑ මේක. මං තමයි කිව්වෙ සර්ලගෙ නාට්‍ය ඉස්කෝලෙන් මේ ප්‍රශ්නෙන් ගොඩයන්න පුළුවන් කියනෙක. අර ගොළු අයද ගයති කියල බෝඩ් ගහල තිබුණනෙ.”

ඇය සිනාසුණාය.

ඇය නිහඬව බිම බලාගෙන උන්නාය. අනෝදා වීදුරුව තාම ඉවර කර නැත. ඇය මා දෙස බලා නැවත බිම බලා ගත්තාය.

“සර් රාධ ටීචව බඳින්න ඉන්නව කියල කට්ටිය කියන හින්දයි මං මේ තකහනියෙම මේක කියන්න ආවෙ. අපේ මහත්තයයි රාධ

වීචයි අතරෙ සම්බන්දෙයක් තියෙනවා. දෙන්නට දෙන්න පුදුම ආදරයක් තියෙන්නෙ. අපේ මහත්තයගෙ දක්ෂකමේ හැටියට පුදුමෙකුත් නෑ රාධ වීච වගේ ලොකු පවුලක නෝන කෙනෙක් ඒ මනුස්සයට ආදරේ වෙන එක. ගොළු විදියට උන්නට මෙයා පුදුම විදියට පත්තර එහෙම බලනවනෙ. ඒ ඇරුණම පෙනුමට එහෙමත් ඉන්නවනෙ. කොච්චරද කියනවනං ඉස්සර සමහරු කිව්ව ගොළුවිජේ කුමාරතුංග කියල. සර්ට මං නොකිය ඉන්න හොද නැති හින්දයි මේ කියන්නෙ සර් බඳින්න ඉන්න නෝන ගැන කේලමක් එහෙම නෙමේ."

ඇය නැවත නිහඬ වූවාය.

"අර නාලිනී මැණිකෙගෙන් සර්ට වෙච්ච කරදරේ මදිවට රාධ වීචගෙ මේ ප්‍රශ්නෙත් තියෙද්දි සර් රාධ වීචව බඳින්න එහෙම යනව නම් හොද නැති හින්දයි මම මේ කියන්න හිතුවෙ."

විනීතා නැවතත් නිහඬ වූයේ මගේ ගොළුකම අතහරින්නැයි කරන ආරාධනයක් මෙනි.

"මිසිස් වික්‍රමසිංහ කොහොමද දන්නෙ ඔය විස්තරේ." මම ඇසීමි.

"මෙච්ච මගෙ මනෝ විකාර වෙන්ඩත් බැරි නෑ. මට නිකමට වගේ තේරුණා. අපේ මනුස්සය පිච්ච වැලක් වවනවමනෙ අපි කොහෙ හිටියත්. දැන් ඔය ගේ හදන්න කලින් හිටපු කුලීගෙ දරකත් පිච්චවැල් හැදුව. අර දේවරූප ටිකට පිච්ච මලක් දෙකක් පූජා කරල මිසක් වැඩ පටන්ගන්නෑ. ඒ උනාට මං දැක්ක රාධ වීචගෙ කොණ්ඩෙත් පිච්චමල් ගහල තියෙනව. මෙහෙ අර පන්ති පටන් අරං ටිකක් කල් යද්දි තමයි රාධා වීච කොණ්ඩෙ පිච්චමල් ගහන්ඩ පටන් ගත්තෙ. මෙතන මේ මිදුලෙත් පිච්චවැල් තියෙන හින්ද මං එච්චර හිතුවෙ නෑ. වීචත් පිච්චමල්වලට කැමතියි කියල තමයි මං හිතුවෙ. හැබැයි එහෙදිත් අපේ ගෙදර පන්ති පටන්ගත්තට පස්සෙත් මං දැක්ක වීචගෙ කොණ්ඩෙ පිච්චමල්. අපේ මහත්තය ඉන්න දවසට විතරක්. මෙයා කොළඹ හරි කොහෙ හරි ගිය දවසට පිච්චමල් නෑ වීචගෙ කොණ්ඩෙ.

අර පරණ දේවරූප තාමත් තියෙනවනෙ ඔෆිස් එකේ එච්චටත් තාම පිච්චමල් තියනව තාමත්. වීච උනත් දේවතාවියක් වගේ මට උනත් පේන්නෙ නැත්තෙ නෑ."

"අනික සර් මගෙ අතිනුත් වැරදි වෙලා නෑ කියන්ඩ බෑ. සර් වගේ කෙනෙක් එක්ක මෙච්ච කියන්ඩ මං බයක් නෑ. දැං මං ඉතිං තැම්පත් උන ගෑනියෙක්නෙ. හතළිහත් පැන්න ළඟදි. අපේ මහත්තයව මං නැන්දගෙ කීමට බැන්දට ඒ මනුස්සයගෙ උත්සාහවන්තකම ගැන දැක්කම පුදුම ආදරයක් ඇති උනේ. ආයෙ ඉතිං එයාගෙත් මම ඉතිං පණ වගේ තමයි. මමත් පුදුම වීරියක් ගත්තෙ බිස්නස් නගගල ගන්න. පුදුම වාසනාවන්ත මනුස්සයෙක් කියන්නෙ නැග්ග නැගිල්ලක් බලාගෙන ඉද්දි. මට රත්තරන්ද ඇඳුම් පැළඳුම්ද කෙළවරක් නෑ. ඒ උනාට සර් මගෙ අතින් වැරැද්දක් උනා. මට ඉතිං අපේ මහත්තයා එක්ක වැඩි කතාවක් කරන්ඩ බෑනෙ. මට හරි ආසයි එක එක එව්ව කතා කර කර ඉන්ඩ ඒ කාලෙ. එතකොට පුතත් පොඩියි. එයාගෙ හුරතල් වැඩ ගැන මහත්තයට කියන්ඩ. ඔය ටීවී එකට ඉස්සර එන මහාචාර්ය කෙනෙකුත් ඒ වැඩසටහනේ කියනව අඹුසැමියො නිතරම සංවාද කරන්න ඕනෙ. හඳ දිහා බලාගෙන ලස්සන අගේ කරන්න ඕනෙ. නෝනගෙ ලස්සන මහත්තයා නිතරම අගේ කරන්න ඕනෙ. හිතේ ඇතුළෙම තියෙනෙච්ච බෙදාහදා ගන්න ඕනෙ කියල අරක මේක. මට ඉතිං ඒ අවස්ථාව නෑනෙ. මහත්තයට කතා කරන්න බෑනෙ. අපේ මහත්තයට හිනාවක් තියෙනවා ඔය කතාබහ ඔක්කොටම වඩා වටින. ඒ උනාට මට කතා කරන මනුස්සයෙක් නැති එක ගැන පුදුම දුකකින් උන්නෙ. මිනිස්සුන්ට හිත යන්නෙම නැති දේවල් ගැනනෙ. අපේ මාමගෙ පුතෙක් තමයි අපිට තිබුණ පළවෙනි වෑන් එක එළෙව්වෙ. කුමාර මල්ලි. හරි කතාකාරයා. මිනිහ ඩ්‍රිලිවරි ගිහින් ඇවිල්ලා. ඉස්සර අපි කුරුණෑගල දිස්ත්‍රික්කෙම ඇන්කර් බෙදපු ඒජන්ට්නෙ. මිනිහ ඩිලිවරි ගිහිං ඇවිල්ලා මුල ඉඳල අගටම විස්තරේ කියනවා. චූටි පුතාව බලා ගන්නවා. මහත්තය කඩේනෙ. එනකොට චොකලට් එකක් ටික ටික මං ගැන වර්ණනා කෙරුවා. දන්නෙම නැතුව අපි දෙන්න අතර එහෙම ගෙනැත් දුන්නා. පැය ගණන් නිදහසත් තියෙනවනෙ. සම්බන්ධයක් ඇති උනා.

කුමාර මල්ලි කියන්නෙ කතා කිය කිය ගෑනු වාටු කරන පිරිමියෙක්. ඒක ඉතිං රැවැට්ටීමක් තමයි. ඒ වෙලාවට එහෙම හිතෙත් නැතෙ." ඇය නිහඬ වූවාය.

ඈ ගමන් කරන්නේ චක්‍රාකාර කතා මාර්ගයක නිසා - ඒ කතා රසවත් වුවත් - ඇය කියන්නට යන්නේ කුමක්දැයි මට වටහා ගන්නට නොහැකි විය.

"මං මේ විස්තරේ රාධ ටීචටත් කිව්වා වෙන මොකවත් නෙමේ රාධ ටීචගෙ අවංකකම හින්දා. මේ ළඟදි දවසක ටීච ගෙදර ඇවිල්ලා මට විස්තරේ කිව්වා. ටීච කියන්නෙ අපේ මහත්තයව අකුරටම තේරුම් ගත්ත කෙනෙක් කියලා මට හොඳට තේරුණා කියපු දේවල්වලින්. ටීචගෙ තියෙන්නෙ අමුතු ලස්සනක්. ලොකු පවුලක කෙනෙකුගෙ ලස්සනක්. රමණී මැණිකෙලා උනත් එහෙමනෙ. යන්තම් ලියන්න කියවන්න විතරක් දන්න මේ මිනිහගෙ තියෙන පිරිමිකමට ටීචගෙ හිත ගියා කියලා තමයි ටීච කියන්නෙ. මං අලගිය තැන් මුලගිය තැන් ඇහුවෙ නෑ. පිච්චමල් ගැහිල්ලෙන් එහාට මොනවද උනේ කියල මං ඇහුවෙ නෑ. ටීච කියල තියෙනව අපේ මහත්තයගෙ හොරගෑනි විදියට ඉන්න බෑ කියලා. රාධා ටීච කියන්නෙ වල් ගෑනියක් නෙමේ."

විනීතා නිහඬ වූවාය.

"රාධා එහෙම අවංක උන එක හොඳයි." මා කීවේ විනීතාගේ ප්‍රතිචාරය දැන ගන්නා පිණිසය.

"කොච්චර හොඳද. එහෙම දහිරියක් ගෑනු කෙනෙකුට තියෙනවා කියන්නෙ." විනීතා කීවාය.

මම මගේ අදහස නොකීවෙමි.

"මට ඕන්නං තිබුණ වට්ටි අම්මෙක් වගේ කුණුහරුප කියාගෙන රාධ ටීචටයි අපේ මිනිහටයි කෑ ගහල ලෝකෙට කියල බෙරිහං දෙන්ඩ. චණ්ඩි දම්මලා රාධ ටීචගෙ කොණ්ඩෙ කප්පන්ඩ අරව මේව. මං ඒවගේ වැඩ කරන එළදෙනක් නෙමේ."

ඇය බොහෝ වේලාවක් නිහඬව උන්නාය.

"සර් රාධ ටීචව බඳිනවනං මේක දැනගත්තොත් හොඳයි කියල හිතිලයි මං කියන්ඩාවෙ. ඒ වැරැද්ද උනාට ටීච කියන්නෙ අපේ පවුලටම එළියක් උන නෝන කෙනෙක්. අර දොස්තර නෝනලගෙවත් නෑනෙ එච්චර කලඑළියක් දොස්තරකං තිබුණට."

තවදුරටත් මට නිහඬව ඉන්නට හැකියාවක් නොවිය. නූගත් ගැහැනියක වුවත් ඇගේ මුදු මොළොක් හදවත තියුණු සිහිකල්පනාව මගේ සිත කරුණාවෙන් පුරවාලන්නට විය.

"මිසිස් වික්‍රමසිංහ බොහොම ස්තුතියි මේ විස්තරේ මට කිව්වට. ඔබතුමී මේ ප්‍රශ්නෙ දිහා බලන විදියත් හොඳයි. නමුත් රාධා මගෙ යාළුවෙක් විතරයි. රාධටත් මාව එහෙම තමයි. අනික මං රාධව බඳින්න ගියා කියමුකො ඒත් රාධ මට කියයි ටීචි එක්ක සම්බන්ධයක් තිබුණ කියලා. එයා අවංක කෙනෙක්."

"ඒක ඇත්ත."

විනීතා පැමිණි කාරණය දැන් අවසන් බව පෙනුණත් ඇය නැගී සිටින බවක් නොපෙනිණ. ඇය සමග තවත් කතා කරන්නට යමක් ඇතිදැයි මම හොයන්නට වීමි. ගොළුවන් සේ හිඳ සිටීම අමාරු බැවිනි.

"අපි ඇවිල්ල අපේ මහත්තයට කතා කරන්න උගන්නන්න කියනකොට සර් ඒක වැඩිය ගණන් ගත්තෙ නෑ වගේ මට හොඳට මතකයි." ඇය කීවාය.

"ඔව් මම විශ්වාස කළේම නෑ ඒක කරන්න පුළුවන් වැඩක් කියලා."

"ඒක තමයි අද මං විශේෂයෙන්ම ආවෙ අර කාරණේටත් වඩා." ඇය නැවත විරාමයක් තැබුවේ මගේ සම්පූර්ණ අවධානය ගන්නට මෙනි.

"සර් අපිට සමාවෙන්ඩ ඕනෙ. අනේ බුදුසර් මේක කාටවත් කියන්ඩනං එපා. සර්ව රවට්ටපු රැවැට්ටිල්ල තවත් ඉවසන් ඉන්ඩ බැරි හින්දයි මං ආවෙ. එයා මොන එහෙකට ගොළු කොල්ලෙක්

වගේ රඟපාගෙන කුරුණෑගල ආවද කියල දෙය්යොම තමා දන්නෙ. එයානං කියන්නෙ ඒ හින්ද තමයි කුරුණෑගල පය ගහගන්ඩ පුළුවන් උනේ කියලා."

මම අදහාගත නොහැකිව බලා උන්නෙමි.

"මේක මහ පුදුම කතාවක් තමයි සර්. මං අර සර්ට කිව්වෙ කුමාර මල්ලි එක්ක මගෙ සම්බන්ධෙ. ඒක අපේ මහත්තයට ඉව වැටුණා. එතකොට ඒක යන්ඩ පුළුවං ලොකුම දුර ගිහිල්ල තිබුණ උනාට මං මහත්තයට කිව්වෙ කතාබහ කරන යාළුකමක් විතරයි කියලා. එහෙම උනේ ඇයි කිය කිය මගෙන් බල කර කර ඇහුවා. මං ඇත්තම කිව්වා. නිකං ඉන්න වෙලාවට මහත්තය එක්ක කතා කර කර ඉන්ඩ තියෙන ආසාව තමයි මං කුමාර මල්ලිගෙන් පිරිමහ ගත්තෙ කියලා. ඒ නැතුව වෙන එකක් නෙමේ. කොච්චර නෑ කිව්වත් මොනව හරි දොඩෝ දොඩෝ ඉන්න ගෑනු හරි කැමතියි සර්. පිරිමි තමයි කල්පනාකාරයො. මොනවා ගැන හරි කල්පනා කරනවා. අපි එහෙම නෙමේනෙ. අපේ මහත්තය ඒ මදිවට ගොළුයි. වෙලාවකට මොනව හරි දෙයක් හරියට කියාගන්ඩ බැරිවෙනකොට මට තරහ යනවා. කුමාර මල්ලි කියන්නෙ ගෑනු හිනස්සන්ඩ පුදුම දක්සය. මොනව හරි තියෙනවා කියන්ඩ. මං දන්නව මහත්තයගෙ හිත රිදෙනව කියල මං එහෙම කිව්වම. ඒත් මං කිව්වා."

මම නිහඬව අසා සිටියෙමි. එය අදහාගත නොහැකි කතාවකි.

"ඒක ඇත්ත කියලා ගොළු භාෂාවෙන් කියලා මහත්තය යන්ඩ ගියා. ගෙදර ආවෙ කුමාර මල්ලිව රස්සාවෙන් අයින් කරලා. කඩෙත් වහල ඇවිත් තියෙන්නෙ. එතකොට ලොකු පුතාට දෙකක් ඇති. ගෙදර ඇවිල්ල කල්පනා කර කර ඉඳල ඉඳලා මාව කාමරේට එක්ක ගිහිං කිව්වා 'විනීතා මං බැරුවට කතා නොකර ඉන්න මිනිහෙක් නෙමේ' කියලා. මගෙ දෙලෝ රත් උනා. ඒ මදිවට සතුට. එයා ඉන්න වෙලාවට උනත් කුමාර මල්ලි කිව්ව දෙපැත්ත කැපෙන විහිළු එහෙමත් මහත්තයට ඇහිලා. කුමාර මල්ලිට මං කියලත් තිබුණෙ මහත්තයට හැම දෙයක්ම

යන්නමට හරි ඇහෙනව වගේ මට දැනෙනව කියලා. එයා ගාණකට ගත්තෙම නෑ."

"මහත්තයා ගොළුවෙක් විදියට හිටපු එකෙන් සෑහෙන වාසි උනා. මං බැන්දෙ අසූ හතේනෙ. එතකම්ම අවුරුදු අටක් දහයක් ගොළුව විදියට ඉඳල දැන් කාටත් කියන්න බැහෙ ඉබේ කතා කරන්න පුළුවං උනා කියලා. ඉතිං අපි පටන්ගත්තා හොරෙන් විතරක් කතා කරන්න. මුල් මුල් දවස්වල එළිවෙනකං කතා කෙරුවා කතා කරන්ඩ පුළුවන් උන සන්තෝසෙට. එක දවසක් පුතාව අම්මල ගාව දාලා නුවර හෝටලේකට ගිහිං නැවතිලා එළිවෙනකං කතාමයි කෙරුවෙ. කුමාර මල්ලි මාව ඇඳට ගන්ඩ ගොත ගොත කිව්ව බොරු වගේ නෙමේ මෙයා හරි ලස්සනට ඇත්ත කතා කිව්වා. අදටත් ජේන්නැද්ද. රාධ වීව උනත් වසීවෙලා තියෙන්නෙ ඒකනෙ. මහත්තයා මට කිව්ව කුමාරත්තෙක්ක හුටපටේ හින්ද මිසක් එයාට කතා කරන්ඩ බැරිබව මටවත් කියන්නෑ කියලා. මට හැබැයි හිතිලමයි තිබුණෙ කන්නං ඇහෙනව වද්ද කියලා. ඇත්තටම කන් ඇහිල්ල අඩුවෙලා තියෙන්නෙ අර පොලිස්කාරයො පෑන් ගහපු එකෙන්. ඒක සර්ට කියල තියෙනවනෙ."

"පුදුමයි." මම කිව්වෙමි.

"මට අදටත් මේක හීනෙයක් වගේ සර්. හැබැයි ඒකෙන් උනේ මං ගොළුවෙකුට අනුකම්පා කරනව කියල හිතල මෙයාට අනුකම්පා කරනව වෙනුවට මං ඇත්තටම ආදරේ කරන්ඩ පටං ගත්තෙක. මට දැන් පුදුම ආසාවක් මේක ගෙදර අයට කියන්ඩ. ඒත් කියන්ඩ බෑ. කාටවත් කියන්ඩ බෑ. අර ශ්‍රීරාම් මංකොල්ලෙ හින්ද කොහොමත් කියන්ඩ බෑ. පොලීසියෙන් හිතයි මහත්තය ඒක දන්නවමයි කියලා. ඉතිං අපි අවුරුදු ගාණක් හිතුවා මොකද කරන්නෙ කියලා. කොහෙ හරි දේවාලෙකට ගිහිං පූජාවක් තියලා හාස්කමකින් කතා කරන්ඩ ලැබුණ කියලා ප්‍රචාරයක් අරිමු කියලත් කතා උනා. ඒකට මහත්තය කැමති උනේ නෑ දෙය්යො කෝපවෙයි කියලා. මහත්තයා හිතුවෙම ඔච්චර කල් ගොළුවෙක් වගේ ඉන්ඩ පුළුවන් උනේ දෙවියන්ගෙ ආශීර්වාදෙ

හින්ද කියලා. මටත් හිතුණ එහෙම කරන්ඩ ගියොත් සාපයක්වත් වදියිද කියල. නැත්තං ඉන්දියාවෙ හරි ගිහිං පූසාරි කෙනෙක් අල්ලල බොරුවක් කරගෙන එන්ඩ තිබුණනෙ. පස්සෙ මහත්තය හිතුවා ඉස්පිරිතාලෙයක් හදලා ඒකෙ ගොළු අයට අංශයක් දාලා ඒකෙන් ගොළුකම නැති කර ගන්න පුළුවං කියලා. වෙන ඉස්පිරිතාලෙකට යන්ඩ බය උනා කරන්නෙ බොරුවක් කියල අහුවෙයි කියලා. ඒක පුදුම උගුලක් සර්. එයා ගොළුවෙක්මයි කියලා හිතාගෙන උන්නනං හිතට ලේසියි. ඔහොම ඉද්දි තමයි ඩොක්ටර් සමරසේකර එක්ක යාළු උනේ. එයා අර මැෂින් එකකට දාල මෙයාගෙ කන් ඇහෙනවාද කියල බලන්ඩ නුවර එක්කං ගියා. ඒකෙ තියෙන්නෙ මෙයාගෙ කනට නිකං ඉයර්ෆෝන් එකක් වගේ දාලා එක එක සද්ද ඒක දිගේ එවනවා. ඇහෙනව නං බොත්තමක් ඔබන්න ඕනෙ. මෙයාට ඒ එවපු සද්ද ඇහුණත් බොත්තම එබුවෙ නෑ. එබුවනං එබුවෙ සද්දෙ එන්නැති වෙලාවට. පස්සෙ හිතුව දොස්තරලව රවට්ටන්ඩ ගිහිං තව එකක් වෙයි කියලා. බැරිවෙලාවත් ඔපරේසන් එකක් කරන්ඩ ගිහිං ඇත්තටම ගොළුවෙලා යයි කියලා අපිට බය හිතුණා. කවද හරි දවසක ඩොක්ටර් සමරසේකරට ඇත්තම කතාව කියනවද නැද්ද කියල හිත හිත ඉන්නකොට තමයි අපි සර්ලගෙ බෝඩ් එක දැක්කෙ. අර ගොළු අයද ගයති අරක මේක. අපි හිතුවෙ සර්ලගෙ පන්තියට ටික කාලෙයක් ඇවිත් කතා කරන්ඩ පුළුවන් උනා කියලා රටට කියන්ඩ. ඒකයි අර රාධා ටීචවත් රැවැට්ටුවෙ."

මා කතාව අසා සිටියේ පුංචි කාලයේ සිට කියවන්නට ඇබ්බැහිව සිටි ෂර්ලොක්හෝම් කතාවක් අසා සිටින්නාක් වැනි ආසාවෙනි. ඇය බලා සිටියේ මා යමක් කියතියි කියා යැයි මම සිතුවෙමි.

"පුදුමයි."

"ඔව් සර්. අනේ සර් අපේ මහත්තයට අනුකම්පා කරලා මේක සර්ගෙන් පිට යන්ඩ දෙන්නෙපා. මං මේ ටික කිව්වෙ සර්ව රැවැට්ටුවට සමාවෙන්ඩ කියන්ඩ."

එවර මට කියන්නට දෙයක් ඇති බව මට දැනිණ.

"නෑ ඒකට කමක් නෑ. ඔය ඇත්තම කතාව අපිට කිව්වත් ඒ දවස්වල අපි වීවීට උදව් කරන්න ඉඩ තිබුණා."

"ඇත්තම කතාව සර්ට කියන එකක් නෑ අපේ මහත්තය කොහොමවත්. අර පොලීසියට අරන් ගිහින් දහවඩ දුන්න වෙලාවෙ ගොළු කොල්ලෙකුට මෙහෙම වධ දුන්නෙ ඇයි කියලා සර් පොලීසියට බැණලපු ආව කියන්නෙ."

"මට මතක නෑ ඒ වගක්. අපේ බාප්ප හිටියනෙ පොලිස් අධිකාරි කෑගල්ලෙ එයාට නම් කිව්ව බව මතකයි." මම කිව්වෙමි.

එවිට මගේ දුරකථනය නාදවීම මේ හමුවට අවශ්‍ය අවසානය ගෙන එතියි මම සිතුවෙමි. සේනට මිනිකුපරය ගැන යමක් අසන්නට තිබිණි. ඒ ඇමතුමෙන් පසු රාධා කතා කළාය. විනීතා ත්‍රස්ත වූවාක් මෙන් අතින් යමක් කීවාය. වැඩක යෙදී සිටින බව කියා මම දුරකථනය තැබුවෙමි.

"අනේ සර්. මේ කතාව රාධ ටීචට කියන්න එපා. එයා හිතන් ඉන්නෙ අපේ මහත්තය කතා කරන්නෙ ටීචගෙ හාස්කම හින්දා කියලා. අපි ළඟ වැඩ කරන අය ටීචට පුදුම ගෞරවයක් තියෙන්නෙත් ඔය හින්දා. ඒ නිසා ටීච මේකෙ ඇත්ත දැන ගත්තොත් ටීචගෙ මුළු ජීවිතේම කඩා වැටෙයි. ලොකු පවුල්වල හැදුණ ළමයිනෙ. අපි වගේ කපටි බොරුකාරයො නෙමේනෙ. අනේ සර් ටීචට නං මේක ගැන මොකවත් කියන්ඩෙපා. රාධා ටීචර් අදටත් හරි ආඩම්බරෙන් එකඑක්කෙනාට කියනව අපේ මහත්තයගෙ කටහඬ මතු කරල ගත්ත හැටි. පව්."

ඇය පැයකටත් වැඩිය මා සමග කතා කර කර ඉන්නට ඇත.

පුටුවෙන් නැගිට්ට ඇය මට දණගසන තරම් නැමී වැන්දේ මට ගරු කරන්නටත් වඩා රාධා වෙතින් රහස රකිනා ලෙස ආයාචනා කරන්නට මෙනි.

මා මේ දක්වා ඒ රහස රැකි බව දිවුරා කියන්නේ ඒ පරිණත ගැහැනිය ගැන ඉමහත් ගෞරවයෙනි

හතරවෙනි පියවර

රත තරණය

ලෝකයේ විවිධාකාර නාට්‍ය නරඹා ඇති මගේ ප්‍රියතම නාට්‍ය අතර එකක් වන සිංහබාහු නාට්‍යයේ අවසන් ජවනිකාවේදී සිංහබාහු සිය පිය සිංහයා වෙත විදින ඊතල නොවදින්නේ සිංහයාගේ මෙත් සිත නිසායැයි කියවේ. අවසානයේ ඊතලය වදින්නේ මෙත් සිත බිඳුන නිසාය. නාට්‍යය නැරඹූ සැම විටෙකම මා එය වටහා ගත් හැටියට ඉන් කියවෙන්නේ ඊතලය කයෙහි නොවැදීමකටත් වඩා ආධ්‍යාත්මයෙහි නොවැදීමක් ගැනය. සිංහයා මිය යන විට ඊතලය කයෙහිත්, ආධ්‍යාත්මයෙහිත් වදී.

වීවී කෙරෙහි මගේ මෙත් සිත බිඳුණහොත් හී වදින්නේ මා හදෙහිය.

විනීතාගේ හෙළිදරව්ව දිරවා ගැනීම මා සිතූ තරම් පහසු වූයේ නැත. ඇ ඉදිරියේ මා පෙන්වූ සන්සුන් බව මට මා ඉදිරියේ පවත්වා ගත නොහැකි විය. ගොළුවෙකු නොවන මිනිසෙකු ගොළුකමින් මුදවන්නට අප කළ සැලසුම්, රාධා දැරූ වෙහෙස, හැනා අපට කියාදුන් දේවල්, ඈ දුන් පොතපත සියල්ල මා ඉදිරියෙහි පෙනී මට සිනාසී නොපෙනී ගොස් යළිත් එන්නාක් මෙන් විය. අපේ හාස්කම් සහගත ඉගැන්වීම් ගැන ආරංචි වී අපේ මිදුලේ පිරුණු සෙනග මට මතක් වූයේ ඔවුන්ගේ මුහුණුවල දැවැන්ත සම්ප රූපද සමගය. මට දරා ගන්නටම බැරි වූයේ රාධා පිළිබඳ මා තුළ නැග ආ අනුකම්පාවයි. රාධා යනු කෙදිනකවත් මගේ

අනුකම්පාවට ලක් වූ කෙනෙකු නොවේ. "විනීතට තේරෙන්නෙ කතා කරන්න බැරි වීවී කෙනෙක්ව විතරයි" යනුවෙන් රාධා වරක් කී කියුමෙහි වූ ස්ථිර විනිශ්චකාරීත්වය අද මා වෙත ගෙන එන්නේ හිත බර කරන අනුකම්පාවකි. රාධා මගේ විඥානයේ වසන්නේ මටද වැරදුණු තැන් පෙන්වා දිය හැකි ස්ත්‍රියක ලෙසිනි. ඇය ගැන වැරදුණු ගැහැනියක ලෙස සිතීමම වේදනාවකි. ඇවිදීම පවා තිසි අලංකාරයටද නිවැරැදි රීතියටද කළ ගැහැනියකට මේ දරුණු වැරදීම දරාගත හැකිද? සෑම ඇඳුමකටටම ගැළපෙන අත්බෑගය රැගෙන යන, ඇඳුමෙන් ඇඳුම ඉල්ලා සිටින රිද්මයට ඇවිදින රාධාට සිදු වී ඇත්තේ කුමක්ද? ඇය සුපුරුදු බාහිර අලංකාරය පවත්වා ගත්තත් ඒවා පවතින්නේ බොරුවකින් බොල් වුණු අභ්‍යන්තරයකින් නම් ඒ අලංකාර ජීවිතයෙහි හරය කුමක්ද? විටෙක තමා නිසා ලැබුණු කටහඬ පටිගත කර මට අසන්නට දුන්නේ ඉතා දුෂ්කර පතලක් ඔස්සේ පොළොව කණිමින් ගොස් ඇය සොයා ගත් මාණික්‍යයක් මට පාන්නාක් මෙනි. ඒ වීරවරිය අද රවටන ලද ගැහැනියකි. මා රැවටීම දරා ගත හැකිය. නළුවෙකු විසින් රවටනු ලැබීමෙන් වැළකීමට ගොළුවෙකුට කටහඬ දීමට ආ මගේ මිතුරිය මෙය රැවටීමක් බව කිසි කලෙක විශ්වාසද නොකරනු ඇත.

සේන ගෙදර නොසිටීම වාසියක් විය. නැතිනම් ඔහුට නොපෙනෙන තරමට ආත්ම පරාජයේ වේදනාව පාලනය කරගන්නට මට සිදු වන්නේය.

ගොල්ෆ් බෑග් එකකුත්, පෝර උරයක බාගෙයක් විතර පිරවූ ගොල්ෆ් බෝලත් විල්බැරෝවකට පටවාගෙන පළවෙනි කප් එක අසල පුංචි ගොඩැල්ලට ගිය මම ගොල්ෆ් බෝල සීයක් විතර වත්ත හැම තැනටම එල්ල කළෙමි. ඇතැම් බෝල තැඹිලි ගස්වල කරටිවල රැඳිණ. ඇතැම් ඒවා ළිඳට වැටිණ.

මිනිකූපරය සර්විස් කරගෙන පැමිණි සේන මිදුලේ සිට මගේ ඉලක්කයක් නැති ප්‍රහාරය දෙස බලා සිටින බවත්, එඩ්මන්ඩ් සහ තවත් සේවකයකු ඔහු අසල සිටින බවත් මා දැක්කේ මගේ සිතෙන් ආත්මපරාජය පිළිබඳ හැඟීම පහව ගිය පසුය. මා ඒ

දෙස බලනු දුටු සේන යළි මිනිකූපරයට නැග එය ගරාජය තුළට පැදවීය.

මම සන්සුන් වීමි. එඩ්මන්ඩ් වීල් බැරෝවත් තල්ලු කරගෙන ආවේ මා වත්ත පුරා විසිර වූ බෝල එකතු කරන්නටය. ඔහු මා අසලට නොපැමිණ ඈතින් ගියේය. මා මෙහි එන්නට පෙර විනීතා පැමිණ ගිය පුවත එඩ්මන්ඩ් සේනට කියන්නට ඇත.

මම හිත සන්සුන් කරගෙන ගොල්ෆ් වටයක් සෙල්ලම් කරන්නට පටන් ගතිමි.

විනීතාගේ අනාවරණය ආවරණය කරගෙන ජීවිත කාලයක් ඉන්නට මට සිදුවන බව මම සිතුවෙමි. මේ ආඛ්‍යානයේදී හෙළි කරනතුරු මම ඒ රහස රැක්කෙමි.

ගොළුවෙකු චතුර කටකාරයකු බවට පත් කළ හාස්කම් සහගත ගුරුවරිය තමා යැයි සිතාගෙන ඉතා තෘප්තියෙන් ජීවත් වන, ඒ කටකාරයාටම ආදරය කරන මගේ මිතුරිය රාධාගේ සම්පූර්ණ පැවැත්ම රැඳී ඇත්තේ මේ රහස මා රකින තරම අනුවය. ඇය මෙවැනි රහසක් දැනගන්නට සූදානම් දවස දැන් පැමිණ ඇද්ද යන්න මම නොදනිමි. එහෙත්, මා මේ ජීවිත කතාව ලියන්නට ඉඳගත්තේ ඇත්තම ලියන්නටය. නොඑසේ නම් මා වැනි නිකම් හිටිය මිනිසෙකුගේ කතාවකින් කිසිවකුට ඇති පලක් නැත.

ගොළුවිජේට කටහඬ ලබා දීමේ ව්‍යාපෘතියට අප කැප වූයේ ඉතා දැඩි අවංකකමකිනි. ඒ සඳහා අපි ජීවත්වන ආකාරය පවා වෙනස් කළෙමු. රාධා එකල ඇතැම් සන්ධ්‍යාවන්හි ගොළුකම නම් විෂය ගැන කතා කළ බරපතළ ආකාරයත්, ඒ බරපතළ බුද්ධිමය පෙනුම නිසා ඈ වෙත එක් වූ සුන්දරත්වයත් සිහිවන මගේ සිත දරාගන්නට බැරි අනුකම්පාවකින් පිරීයයි. ඇතැම් දවසක රාධා සහ මම ඉතා සියුම් කරුණු ගැන පවා සාවධාන වෙමින් වීවී සමග කරන්නට අභ්‍යාස සැලසුම් කළෙමු. ආලෝකය වන් සැහැල්ලු සිතක් ඇති මගේ මිතුරියට මේ රැවටීම දරාගත හැකිද? ප්‍රශ්නය ඊටත් වඩා සංකීර්ණය. ඇය ඉංග්‍රීසි කථන පුහුණු ගුරුවරියක සේ ගොඩනගාගනිමින් සිටි ජීවිතය

ගොළුවිජේ වෙනුවෙන් සම්පූර්ණයෙන් කැප කළාය. ඇගේ හද බිඳ පලා ගිය නළුවා දැන් සිනමාවෙන් ටෙලිනාට්‍ය වෙත පැමිණ කටින් කට නම කියවෙන කෙනෙක් බවට පත් වී සිටියි. රාධා පිටිසර වියළි ටවුමක බොරුකාරයකුගේ ප්‍රතිරූපය යට සැඟවී ගොසිනි. මේ කුඩා නගරයේ බැතිමතුන් කිහිපදෙනෙකුගේ ඇස්වලට ඇයට දේවාතාවියක සේ පෙනෙන බව ඇත්තය. අද ඇය ලබන දේවත්වයට ආසන්න ගෞරවය රඳාපවතින්නේ ඇය ගොළුවෙකුට කටහඬ දීමේ හාස්කම කළ කෙනෙකිය යන බොරුව මතය. ඕනෑම මොහොතක ඇගේ දේවතාභාවය සොරාගත හැකි දෙදෙනෙක් සිටිති. ඒ දෙදෙනා ඒ බොරුව හෙළිකරන්නට තිබෙන ඉඩ අඩු බව ස්ථිරය. ඒ නිසාම වේදනාව මටය. මගේ මිතුරියගේ ජීවිතය බොරුවක් උඩ රඳා පවතින බව දැන දැනත් නොදන්නා කෙනෙකු සේ සිටීමට සිදු වෙයි. අප දෙදෙනාගේ මිත්‍රත්වයේ පදනම වන්නේ එකිනෙකාට අවංක වීමය. අප වෙතින් ඒ පදනම උදුරාගෙන තිබෙන නිසා දැන් අපේ මිතුරුකමද රඳා පැවැතිය යුත්තේ මේ බොරුව මතය.

මේ ආඛ්‍යානය ලියන්නට පටන් ගන්නා දවස වන විට ඒ බොරුව මත තවත් බොහෝ දේ ගොඩනැඟී ඇත.

* * *

මා මගේ ගොල්ෆ් වළල්ලේ ස්වයංපෝෂිත, ස්වයංසංතෘප්ත ලෝකයෙන් එළියට විසි කරනු ලැබූ ආකාරය ගැන සවිස්තර වාර්තාවක් කිරීමට මා අකැමැතිය. එසේම එය උත්තම පුරුෂයෙන් කරන්නටද කැමැත්තක් නැත. උත්තම පුරුෂයෙන් ලිවීම කට උත්තරයක්ද පාපෝච්චාරණයක්ද වැනිය. මා ලියන්නේ එවැනි වරදකාරී හැඟීමකින් නොවේ. අනික ඒ දෛවෝපගත වෙඩි පහර ඇති කළ වේගය අපේ ජීවිත සියල්ල වේගයකට හසු කළේය.

බන්දුල බලගල්ලගේ හිත ගැඹුරු ලෙසම රිද්දුවේ ලෝකයෙන් වෙන්වී සිටීමට වත්ත වටේම ගොඩ නගා තිබූ තාප්පයයි. "ලිංගික ඊර්ෂ්‍යාව සහ පන්ති වෛරය දෙකම එක්ව කළ ලුම්පන්

කුමන්ත්‍රණයක් පිවිතුරු ලක්මැණියගේ සුජාත පුත්‍රයා බිලිගනී" යන වැකිය විජිත රත්නායකගේ 'උත්තමාචාර උත්සවය' අවසන්ව මාස ගණනක් යනතුරු සිත රිද්දුවේය. වඩාත්ම සිත රිද්දුවේ ලුම්පන් යන වචනයයි. නගරයේ කේන්ද්‍රයට වන්නට විශිෂ්ට ලෝක සාහිත්‍ය කෘති, දර්ශනවාද සහ ලෝ ප්‍රකට විශිෂ්ට මිනිසුන්ගේ ජීවිත කතා ආදිය පිළිබඳ පොත් නොවිකිණෙන බව දැන දැනම ඒවා සඳහාම ටවර් ඔෆ් බාබෙල් පවත්වාගෙන ගිය කෙනෙකු ලුම්පන් යන වචනයෙන් විස්තර කළ නොහැකි බව ඔහු දනියි. එහෙත් ඒ අශිෂ්ට රතු අකුරු තුළ තමා ලුම්පන්ය. පැවැත්මේ අභ්‍යන්තරික කේන්ද්‍රය වෙත දරුණු ප්‍රහාරයක් එල්ල වූවාක් සේ විය. එදින සේන මෝටර් සයිකලයෙන් නගරයට ගොස් රතු කමිසකාරයන් බෙදූ පත්‍රිකාද එකතු කරගෙන ආවේය. ඒවායේ ඇතැම් තැන්වලද විජිත රත්නායක ඝාතනයට බන්දුල බලගල්ලගේ ලිංගික ඊර්ෂ්‍යාව හේතු වී යයි යන්න විග්‍රහ වී තිබුණේය. කිසිවෙකු විසින් මේ රතුපාට පක්ෂයට පන්ති විශ්ලේෂණයට වඩා වැඩියෙන් මනෝ විශ්ලේෂණය ලබා දී ඇති බව ඔහුට පෙනිණ. එය ඔවුහු තනි තනි පුද්ගලයන්ට රිදවීමට විද්‍යාත්මක ස්වරූපයෙන් භාවිත කරති. එක් තැනක ඔහු ගැන සඳහන් වූයේ "සෙල්ලක්කාර කුමාරයකු" ලෙසය. එක් පත්‍රිකාවක බලගල්ල වලව්ව විස්තර වී තිබුණේ අන්තඃපුරයකට සමාන කාමසුඛල්ලාකානුයෝගයේ මන්දිරයක් ලෙසය. එහි කාමර ගණනද දෙගුණයකටත් වඩා වැඩි වී තිබිණි. එසේ කියන පත්‍රිකාවලටම අනුව බන්දුල බලගල්ල යනු ලිංගික බෙලහීනතාවෙන් යුතු විකෘති කාමාශාවෙන් රෝගී වූවෙකි. එසේ වී ඇත්තේ වලව්වේ අන්තඃපුරය තුළ දූෂණයට ලක් වූ ස්ත්‍රීන්ගේ සාපය වැදීමෙනි. වලව්කාරයන් සහ ස්ත්‍රී ලෝලිත්වය සම්බන්ධ කරන කතා බන්දුල බලගල්ල අසා ඇතත් තමන්ගේ පවුලේ ධන බලයෙන් ස්ත්‍රීන් යටත් කරගත් කෙනෙකු යැයි යන්තමට හෝ කියවෙන්නේ අත්තාගේ නමය. පප්පා සම්බන්ධයෙන් එවැනි කතාවක් ඔහු අසා නැත. බන්දුල බලගල්ල හා සම්බන්ධතා පැවැත්වූ සියලු ගැහැනු ඔහුට ආදරය කළහ. මේ පත්‍රිකා ලියන තැනැත්තාගේ මනසේ තමා මැවෙන ආකාරය බන්දුල බලගල්ලට

දැනුණේ විචිත්‍ර කතාවක් සේය. "මගේම වත්තට වී හුදෙකලාව ජීවත් වූ නිර්හිංසක මනුෂ්‍යයකු වන මා ඔවුන්ගේ මනසේ මැවී ඇති විකෘති ආකාරය මා සිත රිද වූ බව නොකියා බැරිය."

තමන්ගේ ජීවිතය අනුන්ගේ ෆැන්ටසියක් තුළ මැවෙන ආකාරය ගැන ඒ පත්‍රිකා බන්දුල බලගල්ලට ලබා දුන්නේ අපූරු අත්දැකීමකි. 'ධනපති ක්‍රීඩාවක් වන ගොල්ෆ් තනියම ගසන නිකමකු' ලෙස එක් පත්‍රිකාවක සඳහන්ව තිබිණි. ජාතියේ සුජාත පුත්‍රයින් වන විශ්වවිද්‍යාල ශිෂ්‍ය නායකයන් තිදෙනෙකු අසූ නවයේදී මරා පුළුස්සා දමන ලද්දේ ගොල්ෆ් පිටියකදී යැයි සඳහන් කළ එක් පත්‍රිකාවක් ඒ නිසා ගොල්ෆ් යනු ප්‍රගතිශීලි ජනතාවගේ ස්වභාවික පන්ති වෛරයට ලක්විය යුතු තිරිසන් ක්‍රීඩාවක් බවටද තර්ක කළේය. තමාගේ එකලා ගොල්ෆ් වළල්ලෙන් පිට ලෝකයේ විඥානය වෙත වෙත විවර වූ අගනා කවුළු මාලාවක් ලෙස බන්දුල බලගල්ල ඒවා දුටුවේය. සේන ඒවා දෙස හෙළූ වෛරී ආකල්පය සමග බන්දුල බලගල්ල එකඟ වූයේද නැත. ඇතැම් විට ඔහු සේන සමග තර්කද කළේය.

"මෙවුන් මේ වලව්වෙ ඉඩම්වල වැඩකරපු එවුන්ගෙ පුත්තු වෙන්ඩෝනෙ මේ වගේ අසමජ්ජාති බොරු ගොතන්නෙ." සේන කෝපයෙන් කීවේය.

"එහෙම නම් ඒ අය කියන දේවල් හරිනෙ සේන." බන්දුල බලගල්ල කීවේය.

"මේ කියල තියෙනෙව්ව හරි කියලද සර් කියන්නෙ."

"මේ උදාහරණ වැරැදියි. මං ගැන කියන දේවල් වැරැදියි. ඒක ඇත්ත. නමුත් මේ තරහ වැරැදියි කියන්න බැනෙ. තරුණයෙක් මැරුණනෙ. මට ගොඩක් ඉඩං තියෙනවානෙ. මං ගොල්ෆ් ගහනවනෙ. මෙහෙ ලස්සන තෝනලා එනව යනවනෙ. මේ තියෙන්නෙ තාප්පෙන් පිට ඉඳල බලනකොට පේන දේවල්වලින් එයාල ගොතන කතන්දරේ."

සේන නිහඬ විය.

"අපි මෙව්ව බලලා එයාලා ගැන සම්පූර්ණ විනිශ්චයක් දෙනව නම් අපි කරන්නෙත් එයාලා කරන එකමයි." බන්දුල බලගල්ල කීවේය.

සේන තුෂ්ණිම්භූත වී බලා සිටියේය.

"පුදුම කතා තමයි සර් කියන්නෙ." ඔහු කීවේය.

"හෙන්රි ජේම්ස් කියලා හිටිය හොඳ ලේඛකයෙක් ඉන්නවා අර මම නිතරම කියවන්නෙ. එයාගෙ නවකතා හැම එකේම තියෙන්නෙ මිනිස්සුන්ට අනික් මිනිස්සුන්ව හරියට නොපෙනීම ගැනයි. පේන ටිකෙන් විතරක් අනික් මිනිස්සුන්ව ඉන්ටර්ප්‍රිට් කරන්න ගියාම වන වැරදීම ගැනයි. ඉන්ටර්ප්‍රිට් කියන්නෙ කොහොමද?"

"අර්ථකථනය." සේන කීවේය.

"ඒ කියන්නෙ තේරුම් කරල කියනවා කියන එක නේද? අනික් මිනිස්සු ගැන අපි තේරුම් කියන එක හොඳ නෑ." බන්දුල බලගල්ල කීවේය.

ඒ සංවාදයෙන් පසු සේන සහ බන්දුල බලගල්ල අතර සම්බන්ධය ස්වාමි-සේවක ගනුදෙනුව ඉක්මවා මිත්‍රත්වයේ තලයකට එළඹුණාක් මෙන් පෙනී ගියේය. තමන්ට වඩා වසර කිහිපයකින් පමණක් වැඩිමහල් මේ වලව්කාර පුත්‍රයා තුළ මෙවැනි විඥානයක් වර්ධනය වූයේ කෙසේද යන්න සේනගේ කුතුහලය අවුස්සන්නක් විය. ඒ කුතුහලය කවදාකවත් සන්සිඳුණේ නැතත් සේන වරක් ඒ කුතුහලය ගැන බන්දුල බලගල්ලට කීවේය.

"මං දන්නෑ ඇයි කියලා ඒ මගෙ හැටි. අපේ අම්ම නිසා වෙන්න පුළුවන්. එයා නියම බෞද්ධ කාන්තාවක්. නොඇලුණු කියන්නෙ අන්න එහෙම එක්කෙනෙක්. හාමුදුරුවරුවත් එහෙම නෑ. ඒකනෙ මං වැඩිය පන්සල් යන්නැත්තෙ. අම්මගෙ හුරුව ඇරුණම මං නිකම් ඉන්න මිනිහෙක් වෙන එක. රාධා තමයි ඒක හරියටම දැක්කෙ. නිකං ඉන්නකොට සම්මුතිවලට යන්නැතිව ඉන්න පුළුවන්. මම නිකම්ම ඉන්න මිනිහෙක්නෙ."

බන්දුල බලගල්ලගේ නිකම් ඉඳිමේ සීමාව වහාම සලකුණු විය. ඒ මෙසේය:

විජිත රත්නායකගේ මරණය පිළිබඳ ඔහුගේ පක්ෂය ගෙන ගිය දැවැන්ත ප්‍රචාරණයේ බලපෑම නිසාම කුරුණෑගල දිස්ත්‍රික්කයේ පමණක් මැතිවරණය දින නියමයක් නැතිව කල් ගියේය. ඒ නිසා එම ඝාතන නඩුව ඊළඟ ප්‍රචාරණ උපකරණය විය. සැකකාරයකු සේ ඉදිරිපත් කරන ලද වීවීගේ ගෝලයා නිදහස් වන ලකුණු පළ විය. නිරන්තරයෙන් නගරය පුරා රතු පෝස්ටර් ඇලවිණ. මෙම මරණය භාවිත කෙරෙන ආකාරය ගැන අනික් දේශපාලන පක්ෂ අතරින්ම විවේචන එල්ල විය. කතාන්දරයේ සන්ත්‍රාසවත් බව තව දුරටත් ආකර්ෂණීය නොවීමෙන් එහි දේශපාලන විකුණුම් මිලද පහළ බැස්සේය.

එහෙත්, තම බිරිඳ උදුරාගත් වීරයාට එරෙහි ඉරිසියා සහගත ද්‍රෝහියාගේ කුමන්ත්‍රණයක් ලෙස ඒ මරණය හැඳින්වීම දිගින් දිගටම පැවැත්තේය. එයින් අපේක්ෂා කෙරුණේ කුලපීඩිතයින්, ඉඩම් අහිමි ගොවියන් ආදීන්ගේ ඡන්ද ගැනීම බව සේනගේ මතය වුවද බලගල්ල වලව්ව කෙරෙහි මහජන කෝපයක් අවුස්සන්නට තරම් එය බලගතු වලව්වක් නොවීය. එය දේශපාලන බලයට අත තියන්නට හිතකවත් නොතිබුණු වලව්වකි. විවිධ පක්ෂවලින් ඡන්දෙ ඉල්ලන්නැයි ඉල්ලුවද ඒවා ප්‍රතික්ෂේප කළ වලව්වකි. බලගල්ල වලව්ව ඉදිරිපිට ටියුෂන් ආයතනය අයිතිකාරයාට වලව්වට වැඩි බලයක් තිබිණි. එහෙත්, බන්දුල බලගල්ලට එල්ල කළ රතු පෝස්ටරය බලගල්ල තාප්පෙම වැදුණේය.

බන්දුල බලගල්ලගේ සිතේ රතුපාට කෝපයක් පැන නැග්ගේ ඒ නිසාය.

කලෙක සිට ඔහුගේ සිතේ පැන නැග තිබුණු සැලැස්මක් දියත් කරන්නට ඔහු තීරණය කළේය. එය ක්‍රියාත්මක කිරීමට සේනගේ සහාය අවශ්‍ය වුවත් එය සේන වෙතින් පැන නැගුණක් නොවීම ගැන බන්දුල බලගල්ලට ඇති වූයේ සතුටකි. ඒ අතීරණයේ නිසල විලකින් තීරණයේ ගලන ගඟකට බසින්නට තමාම තීරණය කිරීම ගැන ඇති වූ සතුටකි.

ඔහු ලොකු නැන්දාගේ පුතා වූ ආචාර්ය සමන් මැණික්දිවෙලට කතාකොට සැලැස්ම විස්තර කළ විට ඔහු සෙනසුරාදාවක ආවේ කොළඹ විශාල ගොඩනැගිලි සැලසුම් කොට පළපුරුදු ගෘහ නිර්මාණ ශිල්පියකුද සමගය.

* * *

ඔහුගේ තාප්පය මතම කරන රතුපාට අපහාසය ගොල්ෆ් බෝලයක් සේ සෙල්ලමට ගන්නට ඔහුට සිතිණි. ඒ වන විට ඔහු ගැන ඒ පෝස්ටර්වල අර්ථකථනය ගැන කෝපය සන්සිඳී ගොස් ඔහුට හිනා ගියේය. ඔහු රතුපාට සමග විහිළුවක් කරන්නට සැලසුම් කළේය. එය එක්තරා බොළඳ අමනාපයක් හා මුසු වූ සෙල්ලම්කාරකමක් බව ඔහු දැන සිටියද ඒ බොළඳකම විසින් අතීරණයේ නිෂ්ක්‍රීයත්වයකින් තීරණාත්මක ක්‍රියාකාරිත්වයක් වෙත ඔහු අවදි කරවනු ලැබීය. ඒ පෝස්ටර් ගහන කොල්ලන් භාෂාව සමග සෙල්ලම් කළේ කවදාවත් සෙල්ලම් නොකරන ලද සෙල්ලම් බඩුවක් සමග සෙල්ලම් කරන්නාක් මෙනි. ඔවුහු සෙල්ලමට රතුපාට භාවිත කරන පුංචි කොලු පැටියන් මෙන් රතු තවරති. තමාට ගොල්ෆ් බෝලය යනු කුමක්ද ඒ කොල්ලන්ට රතුපාටද එයම යැයි බන්දුල බලගල්ල සිතුවේය. ඔහුද රතු පාට සමග සෙල්ලම් කරන්නට තීරණය කළේ ඒ නිසාය. රතුපාට සමග සෙල්ලම් කරන අයගේ පාට පෙට්ටිය සොරකම් කරන්නට ඔහුට සිතිණි. තමාම නිර්මාණය කළ ගොල්ෆ් පහරක් එල්ල කිරීමෙන් ලැබුණු සතුට වැනි දෙයක් ඔහුට දැනිණ.

ගොඩනැගිලි සැලසුම් ශිල්පියා එන විට සෙල්ලමේ සියලු සැලසුම් බන්දු බලගල්ලගේ සිතේ ලියවී තිබිණි.

බන්දුල බලගල්ල උපනන්ද අත නාලිනීට පණිවුඩය යැව්වේය: "ඔබේ ස්වාමිපුරුෂයාගේ මරණය ගැන ඔබේ දේශපාලන පක්ෂයේ අර්ථකථනය වැරැදියි. කරුණාකර එය වෙනස් කරන්න."

උපනන්ද ආපසු ආවේ නාලිනී කිසිවක් නොදන්නා බව කියමිනි. එහෙත්, ඇය දුරකථනයෙන් වත් කතා කොට ඒ ගැන කනගාටුව හෝ පළ නොකිරීම ඔහුගේ සිත්තැවුලට හේතු විය.

"උන්දැත් ඔහොම හිතනවද දන්නැනෙ මහත්තයා. ඉස්සර ඉඳලම හිතුවක්කාරිනෙ." උපනන්ද කීවේය.

"එයාට එහෙම හිතන්ඩ බැරි බව. එයා දන්නවා." මා කීවේ උපනන්ද අභිමුව අනවශ්‍ය ලෙස කඩහඬ උස් කරමිනි.

මගේ ජීවිතයේ අහම්බ සිදුවීම් අතර යම් සැලසුම් සහගත යමක් කළේ නම් මා දැන් විස්තර කරන දෙයයි. ව්‍යාපාරික ලෝකයට මගේ එළඹීම විස්තර කරන පොතක් ලියන්නැයි මගේ සාහිත්‍ය රසඥතාව ගැන දන්නා අය කියන නිසා ආරම්භ කළ මේ ආඛ්‍යානය තුළ ව්‍යාපාරිකයන්ට යම් ආදර්ශයක් ගන්නට හැකි නම් ඒ මේ කොටසින් පමණි.

මා දැවැන්ත සුපර්මාකට් ජාලයක හිමිකරු වූයේ රතුපාට මා සතු කර ගැනීමට ඇති වූ ආසාව සෙල්ලමක් බවට පෙරළා ගත් නිසාය. ඒ ආසාව මට ඇති වූයේ කෝපයක් නිසාය. මම රතු පාටට ආසා කළ මිනිසෙක් වෙමි. ලන්ඩනයේ ශිෂ්‍ය සටන්, යුද විරෝධී අරගලවල මම රතු සටන් පාඨ ඔසවා ගෙන ගියෙමි. වරක් ලන්ඩන් නගරය හරි මැද පැවැති වීදි සටනකදී සිංහලෙන් ලියූ රතු පාට සටන් පුවරුවක් අල්ලාගෙන ගිය මට විරුද්ධව මගේ තාප්පයේ රතුපාට පෝස්ටර් ගසන ජාතිවාදය රතින් වැසූ අලුත් රතු පක්ෂය ගැන ඇති වූයේ දරුණු අනුකම්පාවකි. විජිත රත්නායක කුරුණෑගලින් ඡන්දයට දැම්මද ඔහුට නායකත්වය සපයන නායකයා පීඩිත කුලයක උපන් කෙනෙකිය යන කාරණය සොයාගත් පසු බලගල්ල වලව්ව වෙත ඔහුගේ විරෝධය ගැන මා තුළ අනුකම්පාවක් ඇති විය. පප්පා සහ අම්මා වෙනුවෙන් වාර්ෂිකව දෙන දානයට එන අපේ ළඟ ඥාතීන් සියලු දෙනාද හිතවතුන්ද එක්ව ගේ පුරා ගැවසෙන අතර හේවිසි ගහන්නට එන අය, ගේ පිටුපස කුස්සි සාලයේ මුල්ලක සිටින අන්දමත්,

ඔවුන්ට හොරෙන් හොරෙන් බොන්නට ගල් අරක්කු බෝතලයක් යවන අන්දමත් මට සිහි විය. එහෙත්, දැන් මගේ මෙත් සිත සිඳි අවසානය.

සමන් මල්ලීගේ හිතවත් ගෘහ නිර්මාණ ශිල්පියා කුරුණෑගල නගරයේ ඇති දැවැන්තම සුපර්මාකට් ගොඩනැගිල්ලෙහි සැලැස්ම මට නිර්මාණය කර දුන්නේ කුරුණෑගල සුගයට ආවේණික වූ ගෘහ නිර්මාණ ලක්ෂණද ඇතුළත් කරමිනි. එසේම ඒ ගොඩනැගිල්ල බලගල්ල වලව්වේ ගම්භීරත්වය වසා නොදමන සේ සැලසුම් කරන්නටද ඔහු මහන්සි ගත්තේය. බලගල්ල වත්තේ ඉදිරිපස අඩි තුන්සීයක් දිගට විහිදෙන එය මහල් තුනකින් යුක්තය. කෙනෙකුට අවශ්‍ය සියලු දේ එකම තැනකින් ගත හැකි බීබී සුපර්මාට් වෙළෙඳ මධ්‍යස්ථාන සමූහයක් ගොඩනැගීම මගේ ඉලක්කය විය. කාලයක සිට අත්හැර දමනු ලැබ කැලේ වැවෙමින් තිබුණු අපේ භාෂා සහ රංග පාසැල බිමට සමතලා කර ගොඩනැගිල්ල වැඩෙනු ඇත. "අපේ පාසැලේදී ගොළු අයද ගයති" යනාදී වශයෙන් සඳහන් ශේක්ෂ්පියර්ගේ රුව රැගත් බෝඩ එක ගෘහ නිර්මාණ ශිල්පියාගේද අවධානයට ලක් විය. අවශ්‍ය නම් එය විශාල සුපර්මාකට් ගොඩනැගිල්ල තුළට එය එලෙසින්ම ඇතුළත් කරන ක්‍රමයක් සොයා ගත හැකි යැයි ගෘහ නිර්මාණ ශිල්පියා කීවේය. මගේ අදහස වූයේ සම්පූර්ණ පහසුකම් ඇති ක්‍රීඩාගාරයක් ඒ ගොඩනැගිල්ල තුළ සැදිය යුතුය යන්නයි.

මගේ ඉඩකඩම්වලින් ලැබෙන ආදායම ගණන් බැලූ සේන පළමු පියවර වෙත ගන්නා විශාල ණය මුදලේ වාරිකය ගෙවීම එතරම් අපහසු නොවන බව පෙන්නා දුන්නේය. මගේ ගිණුම්වල එකතු වී තිබූ මුදල්ද මට වත් හිතාගත නොහැකි තරම් විය. පාරම්පරික වලව්කාරයන් නිකමුන් මෙන් සිටියත් ඔවුන්ට ණය දෙන්නට බැංකු පවා කැමැත්තෙන් ඉන්නා බව පෙනී ගියේය. මා ගොඩනගන සුපර්මාර්කට් බිල්ඩිමේ තමන්ගේ ශාඛාවකට ඉඩ දෙන්නේ නම් විශාල කුලියක් ගෙවන්නට එක් බැංකුවක් එකඟ විය.

මාස හයක් ඇතුළත පළමු තට්ටුවේ වැඩ අවසන් කර විවෘත කිරීම මගේ අරමුණ වූයේය. මගේ සැලැස්ම මා සාකච්ඡා කළේ සේන සමග පමණි. ගොඩමඩ ඉඩම් කළමනාකරණය කළ සේන තුළ මේ සුපර්මාකට් ව්‍යාපෘතිය ගැන විශේෂ අවබෝධයක් ඇතැයි මම නොසිතුවෙමි. වමේ දේශපාලනය කර වරක් ද කියාවද නැති කරගත් ඔහු මගේ මේ අතිදැවැන්ත ව්‍යාපාරය ප්‍රයත්නය කෙරෙහි එතරම් ආශක්ත වෙතියි මම නොසිතුවෙමි. සිදුවූයේ 'ආශක්ත' යන වචනයෙන් මිස අන් ලෙසකින් විස්තර කළ නොහැකි දෙයකි. මා ඉතා කෙටියෙන් විස්තර කළ විටම ඔහු වටහා ගත්තේය. මා විස්තර කළ බ්ලූම්ස්බෙරිහි පීපල්ස් මාර්කට් ආකෘතිය ඔහුගේ සිත් ගත්තේය. ගෙදරකට අවශ්‍ය සියලු දේ කොස් ඇටයේ සිට චීස් දක්වාද හාල් මැස්සාගේ සිට හරක් මස් දක්වා ඉදිකට්ටේ සිට යකඩ ඉන්න දක්වාද, වතුර බෝතලේ සිට විස්කි බෝතලේ දක්වාද, සෙරෙප්පුවේ සිට ඔටුන්න දක්වාද විකුණන තැනක් සැදිය යුතු යැයි ඔහු කීවේය.

"ඔටුනු කවුද ගන්නෙ?" මම ඇසුවෙමි.

"අප්පා සර්. ඔටුනු විකුණන්ඩ තිබ්බොත් ගන්න එවුං ඉන්නවා ඕනෙ තරං. මිනිස්සු ඔය එක එක එව්ව ගන්නෙ ඔටුනු ගන්ඩ නැති හින්දා තමයි." සේන කිව්වේය. මම මහ හඬින් සිනාසුණෙමි. එය මගේ සිත තදින් ඇදගත් කියමනක් විය. මා අසලම කාලයක් විසූවද මා හඳුනා ගන්නට පමා වූ සේනගේ දක්ෂකම් ගැන පුදුම නොවී සිටිය හැකි කාලයක් ආවේය. ඔහු අවුරුදු ගණනාවක් මා යටතේ වැඩ කරමින් බලා සිට ඇත්තේ මේ දවස නිශ්චිතව එන බව දැනගෙන මෙනි.

සැබැවින්ම මගේ සුපර්මාකට් අදහස දැනගත් පසු මගේ ව්‍යාපෘති ශක්‍යතා සමීක්ෂක වූයේද සේනය. "අපේ මිනිස්සු දැන් දේවල් සල්ලි දීල ගන්ඩ විතරක් නෙමේ ගන්නව කියල ජේන්ඩ ගන්ඩත් හරි ආසයි. දැන් මිනිස්සු ගෙදරට ඕනෙ දේවල් කඩෙන් ගන්න එක කරන්නෙ සන්දර්ශනෙයක් වගේ. කඩේ යනව වගේ නෙමේ ෂොපිං යන එක. ටෙලිනාට්ටියක රඟපානව වගේ තමයි මිනිස්සු ෂොපිං යන්නෙ. ඒ හින්ද මිනිස්සු ඇවිල්ල සුපර්මාකට්වල කැරකි කැරකි ඉන්නෙ ජීවිතේ වැදගත්ම වැඩේ කරන්ඩ ආව වගේ. අනික අර ප්ලාස්ටික් කාඩ් එක දීල ගන්නකොට සල්ලි යනව කියල දුක හිතෙන්නෙත් නෑ. සල්ලි කොළේ අතගාල දෙනව වගේ හිතේ අමාරුවක් නැනෙ."

ඔහු මිනිසුන්ගේ ෂොපිං යාම ගැන කී දේ සේන සහ මා අතර සම්බන්ධය තවත් වැඩි කළේය. පිටරට ගමනකදී මිස ක්‍රෙඩිට් කාඩ් භාවිත නොකරන මට ඔහු කී දේ හා එකඟවන්නට සිදු විය. නගරය අවට ජීවත් වන මධ්‍යම පාන්තික මිනිසුන්ට වෙන කරන්නට දෙයක් නැති නිසා විනෝදය සහ සංස්කෘතිය සඳහාද ෂොපිං යාමම කරනු ඇති බව මමද සිතුවෙමි. අප ජීවත් වන්නේ පිටිසර නගරයකදී පවා මිලදී ගැනීම යනු සංස්කෘතික සංදර්ශනයක් වූ කාලයකය.

මගේ මනසට මේ ව්‍යාපාර සංකල්පය ආවේ ලන්ඩන් නගරයේ මා ප්‍රිය කළ ස්ථාන දෙකක් නිසාය. එකක් නම් බ්ලූම්ස්බෙරිහි පීපල්ස් සුපර්මාකට් සුපිරි වෙළෙඳ සංකීර්ණයයි. එහි ඇති නිදහස් ස්වභාවය සහ ඇසට ප්‍රිය උපදවන ස්වභාවය මගේ සිත වහා ඇද ගත්තේය. ඊට හේතුව බ්ලූම්ස්බෙරි ප්‍රදේශයේ පවතින නිදහස්කාමී සංස්කෘතික පරිසරය ගැන මගේ ආසාවද වන්නට පුළුවන. අනික නම් නොටිංහිල් ප්‍රදේශයේ ඇති පාවිච්චි කළ කුඩා පොත් කඩයි. මගේ නගරයේ මට මුලින්ම අවශ්‍ය වූයේ පාවිච්චි කළ කුඩා පොත් කඩයක් පවත්වාගෙන යන්නටයි. එය ලෝකයේ විශිෂ්ට අදහස් ඇති පොතපත හෙමින් හෙමින් විකුණන, අදහස් ගැන සංවාද කරන නාගරිකයන්ට හමු වී කතාබහ කරන්නට හැකි තැනක් සේ පවත්වාගෙන යන්නට මට අවශ්‍ය විය. අවුරුදු ගණක් වැඩිමනත් අවධානයක් හෝ කලඑළියක් නොමැතිව මා ටවර් ඔෆ් බාබෙල් පවත්වාගෙන ගියේ ඒ නිසාය. ඒ පරණ පොත් කඩයෙන් පොතක් දෙකක් ගත් කෙනෙකු දෙන්නෙකු ඉදහිට හෝ හමුවීම මට දැනෙන්නේ කාන්තාරයේ තණ පඳුරක් හමුවීමක් ලෙසිනි.

නිර්නාමික කටඋත්තරය

මැතිවරණය දින නියමයක් නැතිව කල්යාම ඇතුගල්පුර සිංහයාගේ සිංහ වියරුව බෝ වෙන රෝගයක් සේ පැතිර යන්නට හේතුවක් වෙතියි මම නොසිතුවෙමි. මා අපේක්ෂා කළේ ඔහුගේ ජනප්‍රියත්වය අඩුවී ඔහු නිසා ඇවිළගත් සිංහ ගින්න නිවෙන්නට ඒ කල්යාම හේතුවෙතියි කියාය. සිදුවූයේ අනික් පැත්තයි. වෙනම මැතිවරණයක් සේ කුරුණෑගල ඡන්දය එන නිසා ඒ දිස්ත්‍රික්කය වෙත පමණක් අවධානය යොමු කරමින් සිය අණසක කරකවන්නට වීවීට අවස්ථාව ලැබී ඇති බව රාධා මට වාර්තා කළේ ඉතා ප්‍රීතියෙනි. දැන් ඇය මට කියන සෑම වචනයක්ම ඇය ගැන අනුකම්පාවක් මා තුළ ජනිත කරන බව ඇය නොදන්නා බව දැන සිටීම මට ඉමහත් වේදනාවකි.

මා මගේ පොල් වත්තේ නිද්‍රාවෙන් අවදිව ව්‍යාපාර ලෝකය වෙත එන්නේය යන ආරංචියෙන් මා වෙත ලැබෙන තොරතුරුද ඒවා එන වේගයද වැඩි විය. බලගල්ල වත්තේ ඉදිරි පස කොටස ඉදිකිරීමක් පිණිස මැනෙන බව ආරංචි වී නොයෙක් පණිවුඩ ආවේය. වලව්ව විකුණන්නේද නැද්ද යන්න ගැන ඇමැතිවරයකු උනන්දු වන බවට ඔත්තුවක් ආවේ වෙළෙඳපොළ මිල ඉක්මවන මිලකට ගන්නට කැමැතිය යන රහසද සමගය. අරක්කු වෙළෙඳාමෙන් ධනකුවේරයකු වූ ඔහුට වලව්වක් අවශ්‍ය වී ඇති බව සේන කීවේය. නගරයේ සියලුම ව්‍යාපාරිකයෝ පාහේ වත්ත කොටස්කර විකුණන්නේද බැලීමට ආහ. එහි ගොඩනැගිල්ලක්

හදන්නේ නම් එය හෝ එහි කොටසක් කුලියට ගන්නට ඇතැම්හු තකහනියක් ආහ. දැනටත් ඇතට වැඩී ඇති නරගයේ මැදට ආසන්නයෙන් පිහිටි මේ ඉඩමේ සුපර්මාකට් එක සාර්ථක වෙන බවට එයම සාක්ෂියක් විය. රාධා මා හමුවීමට ආවේ ඉඩම ගැන වීවීගේ කුතුහලය නිසා බව මම දැනගතිමි.

"ඔයාව පුදුම කරවන වැඩක් කරන්නයි යන්නෙ." මම ඇයට කීවෙමි.

ඒ අතර කාලය තුළ වීවී ගොල්ෆ් පුහුණුවට එන වාර ගණන වැඩි වුවද ඉඩමේ ඉදිරිපස වෙන්නේ කුමක්දැයි මගෙන් කිසිවක්ම ඇසුවේ නැත. මා ඒ ගැන කියතියි යන නොඉවසිල්ල ඔහු තුළ දැවෙන බව දැන දැනත් මම කිසිවක් නොකීවෙමි. මම ඔහුට ගොල්ෆ් පහරවල් කිහිපයක් කියා දුන්නෙමි.

"සර් කරන වැඩේ හරි. රත්තරන් කන්දක් උඩ නිදාගන්නව වගේනෙ ඉඩම එහෙමම තිබ්බනං." වීවී කුතුහලය ඉවසා ගත නොහැකි තැන කීවේය.

"මම කරන වැඩේ මොකක් කියලද වීවී හිතන්නෙ?" මම ඇසීමි.

"ටුවරිස්ට් හෝටලයක් කියල තමයි කියවෙන්නෙ."

මම ඔහුට ඇත්ත කීවෙමි.

ව්‍යාපාර ලෝකයට මුලින්ම එන විට ප්‍රයෝජනවත් වේයැයි ඔහු සිතූ කරුණු කීපයක් ඔහු මට කියා දෙන්නට ඉදිරිපත් විය.

මේ අතර මට වීවී ගැනම ලැබෙන තොරතුරු පවා නිරායාසයෙන් වැඩි විය. මා ආරම්භ කරන්නට යන ව්‍යාපාරයට වීවීගේ සම්බන්ධයක් ඇතැයි යන සැකය නිසාදෝ මා හමුවේ කරන ලද එක්තරා අනාවරණයක් අපේ ආඛ්‍යානයේ වර්ධනයටද යම් බලපෑමක් කළ හැකි නිසා මෙහි දක්වමි.

කොතරම් දුරට වෙස් ගැන්වූවත් මේ ආඛ්‍යානයේ එන දේවලට යථාර්ථයේ මුහුණක් ඇත. එසේම මේ සිද්ධිදාමය නාමත්

සිදු වී අවසානද නැත. ඒ නිසාම මේ කටඋත්තරයේ කට කාට අයිතිදැයි මම හෙළි නොකරමි. මෙහි එන කරුණු ඇත්තදැයි මා හරියටම නොදන්නා බව ඇත්තය. එහි යම් ඇත්තක් ඇද්දැයි සලකා බලන්නට ආරාධනා කරමින් එය ඒ තැනැත්තාගේ හඬින්ම දැක්වීම හොඳය. ඔහු මා දන්නා හොඳින් හඳුනන කෙනෙකි.

“මෙව්ව මගෙ හිතට ආවට කියන හිතලු නෙමේ සර්. මෙතෙන්ට එනකල්ම මම ලෝකෙත් එක්ක ගැටුණ මිනිහෙක්. ගැටී වැටුණ මිනිහෙක්. ඒත් හැබැයි නැගිට්ට. කරුණාවන්ත අය අතදුන්න බව ඇත්ත. ඔය වික්‍රමසිංහයා සර්ව උගෙ ව්‍යාපාරවලට හවුල් කරගන්න හදන්නෙ මොකද? උගෙ කළු සල්ලි සුදු කරගන්න. මං මේ දවසක් එයි කිය කියාමයි උන්නෙ ඕක සර්ට කියන්න. කෝ වෙලාවක් ආවයැ.

ඕකා සර් බත් විකුණලා නැග්ග එකෙක් නෙමෙයි. බතුත් වික්ක තමයි. ඒකෙනුත් නැග්ග තමයි. කුරුණෑගල ටවුමෙ බුලත්විට වික්කත් ලක්ෂපතියෙක් උනහැකි කියලනෙ කතාවට උනත් කියන්නෙ. හැබැයි බතෙන් විතරක් ඔහොම නගින්ඩ බෑ. අපේ පළාතට කියන්නෙ බත් කෝරලේනෙ සර්. අපිට බත් විකුණල ඔච්චර එව්ව කරන්නෙ කොහොමද? ඇයි අපිට බත් රත්තරන්ද? ඕක නැග්ගෙ තනියම නෙමේ. දැන් ඕකව දේශපාලනේට දාල තියෙන උන් එක්ක හවුලෙයි ඕක නැග්ගෙ. ඕක ගොළුව හින්දා උන් මූව තියමෙට පාවිච්චි කෙරුවා. ඔය දේශප්‍රේමියො අර අසූහතේ ඉන්දියන් බඩු තහනම් කෙරුවෙ සර්ට මතකද? අන්න එතකොට ඕකයි උගෙ හවුල්කාරයොයි කෙරුවෙ මොකද දන්නවද? නැව් ගණන් ගෙන්නුව ජපන්, මැලේසියන්, තායි, චයිනා බඩු. පුදුමේ කියන්නෙ අරුන් ඉන්දියන් බඩු තහනම් කරනකොටම මුං අර රටවල්වලින් ගෙනාපු බඩු ගොඩබාපු එකනෙ. හරියට ගෙනත් තියාගෙන උන්න වගේ. ඔය කාලෙ තමයි ඔය චීන බඩු කෙළවරක් නැතුව එන්ඩ පටන්ගත්තෙ. අපි රුපියල දෙකට අහරෙ මෙහෙ ගත්තු ඔය මෝටර් සයිකල්වල ඇණ, බයිසිකල් බඩු අරව මේවා, ඒ කාලෙ ගත්තෙ රුපියල් සීයට දෙසීයට. ඉන්දියන් එව්ව තිබුණනං රුපියල් පනහට ගන්ඩ තිබුණ කොට අපි ජපන් එව්වා ගත්ත

රුපියල් පන්සීයට. අම්මද බොල ඒ කාලෙනෙ මූ නැග්ගෙ මාර නැගිල්ලක්. ඔය විජය මෝටර්ස් ඉස්පෙයාපාර්ට්ස් කඩේ දැම්මෙ ඒ කාලෙ. ඒ මදිවට ඉන්දියන් එව්වම හොරෙන් හොරෙන් හොයල දෙන කාක්කො බෝ උනා. හැබැයි ගාන දෙගුණයක්.

ඒක මොකක්ද ඒක ඉතිං අවුරුද්දක් හමාරනෙ තිබුණෙ. දේශප්‍රේමී එව්වන්ට කෙළවිලාම ගියානෙ. සුමිත් අතුකෝරලපුරට ප්‍රා ආවා කියලා පෝස්ටර් වටයක් ගියා. කම්බි කණු දහයක දොළහක ඔළු ගහල පේන්නුවම ඉන්දියන් වර්ජනේ ඉවරයි. පව් අප්පා ඒ කොල්ලො.

ගොළු විජේය නැග්ගෙ ඒකෙන්ම නෙමේ. කොටි හින්දා. ංහා සර්ම කියන්ඩ බලන්ඩ ඇයි කොටි කුරුණෑගල බෝම්බ පිපිරෙව්වෙම නැත්තෙ? ඇයි කුරුණෑගල බස් නැතුවද? එක බස් බෝම්බයක් තිබ්බද? නෑනෙ. මෙහෙන් තමයි කට්ටිය කොටින්ට බඩු යැව්වෙ. මේ ටවුමනෙ ඔය හතර වටේටම යන සෙන්ටර් එක. ඔය ප්‍රනාන්දුවල අරුංමෙවුං ඔක්කොම ඔය ගේමෙ ඉන්නවා. බැටරි කැලිද හාල්පොල්ද ඕනැ එකක්. මෙහෙන් මන්නාරමෙන් එහාට අරන් ගියාම කොටි ගන්නවා. අරහෙන් කන්තලේ වැවෙන් එහාට අරන් ගියාම කොටි ඇවිල්ල ගන්නවා. මෙහෙ මිල වගේ දෙකක් දීල ගන්නෙ. ඒකෙන් කොමිස් එකක් හැම තැනටම ගිය එක ඇත්ත. ඒත් මාර ලාබෙයක්.

ඒක නෙමේ ඔය ගොළුව හිටිය තව ගේමක. ඒකෙත් උන්නා මෙහෙ දේශපාලකයො. මුං මෙහෙන් වාහන උස්සලා අරන් ගිහින් කොටින්ට විකුණනවා. මෙහෙ කාර් වැන් ලොරි කීයක්නං නැති උනාද? මුන් උස්සන වාහන කොටි ඉන්න පැත්තට ගිහින් දෙන්ඩත් කට්ටිය හිටියා. සාක්කු කීපෙකටම ටික ටික වැටෙන විදියට තමයි වාහන යන පාර හැදිලා තිබුණෙ. ගොළු විජේයට කතා කරන්ඩ බැරි හින්දා ඔය වැඩේ කරපු ලොක්කො මූව තියාගත්තා. අරුන් වගේ නෙමේ මූ කපටියා. අරුන් සොම් කරලා, එහෙට මෙහෙට ගෑනු උස්සලා, ලොකු ගෙවල් හදලා ආතල් ගත්තට මූ ගානට ඉතුරු කරගත්තා.

මූ ගොළුව හින්දා ගෑනු වැඩෙත් අමාරුනෙ. තොරතෝංචියක් නැතුව වැල් බයිල ගහන උන්ට තමයි ගෑනු වැඩියක්ම කැමැති. සල්ලි තිබුණටම බෑ. අනික උගෙ ගෑනි දක්සයි. ගෑනි කියන්නෙ සේදරමන් මුදලාලිගෙ නෝනගෙ මල්ලිගෙ දූව. මං හිතන්නෙ ගෑනි තමයි හොස්පිටල් එක හැදුවෙ. ඉස්සර පොඩියට වැනල් කරන දොස්තර කෙනෙක් ආපු තැනනෙ. මුලින් මුලින් වේළි වේළි තිබුණෙ. සර්ගෙ දොස්තර මස්සිනා ආවට පස්සෙ තමයි ඔතන නැගල ගියෙ. හැබැයි ඒ කාලෙ ඉඳලම ආවෙ කනේ රෝග විශේෂඥයො. එක දොස්තර කෙනෙක් බේත් දුන්න පොඩි තැනනෙ ඔය ඉස්පිරිතාලෙයක් උනේ. ඉස්පිරිතාලෙ හැදුවෙ නම් සල්ලි හොයන්ඩම කියන්න බෑ. දැන් ඔන්න හෘද රෝග අංශයක් හදන්ඩ ගිහිං මිනිහ බාගෙට නැති වෙලා ඉන්නෙ.

දැන් ඔය සර්ට එන්න කියන්නෙ මොකද ඕකගෙ බිස්නස්වල හවුලට? සර් වලව්කාරයා. පරම්පරා සල්ලිකාරයා. නම්බුකාර විදියට ජීවත් වෙනවා. සර් ගියොත් ඌට පුළුවන් උගෙ මූළු අතීතෙම සුදු කරගන්ඩ.

අර හාදයගෙ මරණෙ වෙලාවෙ ඌ බැලුවා සර්ට ළං වෙන්ඩ. සර් අහු උනේ නෑ. ඕකා ඒ කොල්ලව මැරුවෙත් ඕකටම වෙන්ඩ ඇති. ඕකා විතරක් නෙමේ සර් තව කට්ටියක් ඉන්නවා ඕකා පිටිපස්සෙ. ඔය මකරකුගෙ එක මූණක් විතරයි.

මට වෙලාවකට හිතෙනවා ඕකගෙ ගොළුකමත් හෙණ බොරුවක්ද කියලා. මටනං හිතෙන්නෙම ඕකට හැම එකක්ම ඇහිල තියෙනවා. ඇත්තටම ගොළු වෙන්ඩත් පුළුවන්. සර් හිතනවා ඇත්තෙ ඔය වගේ එවුන්ට අනුකම්පා කරන්ඩ ඕනෙ කියලා. ගොළුකම ගැන පව් කියල හිතන එක හරි. ඒකනෙ සර්ලා මහන්සි වෙලා ඒකව කතා කරන තත්ත්වෙට ගෙනාවෙ. ඒත් සර්ගෙ අනුකම්පාව පාවිච්චි කරල එක්කො බිස්නස් ගේම් නැත්තං දේශපාලන ගේම් ගහන්න එන එවුන් පාදඩ බල්ලො. ඒ වගේ එවුන්ට අනුකම්පා කරනවා නම් සර්ලා කරන්නෙ මෝඩකමක්. ඕකගෙ හිතේ ඇත්තෙ බලගල්ල වලව්ව විකුණලා සර් එංගලන්තෙ

යයි කියලා වෙන්ඩැති. අපේ රටේ වලව්කාරයො ඔක්කොම වගේ ඔය වගේ පාදඩයන්ට අහු උනා. බලන්ඩකො ඔය හොරගොල්ලෙ දුවල පුතාල අහු උනේම පාදඩයන්ටනෙ. බෝතලේ එව්වොත් එහෙමම තමා. පව් අප්පා. සර්ට මං මේ කියන්නෙ මෙවුන් උඩින් පෙන්නන මූණ යටින් තව තියෙනවා එක එක මූණු රාක්ෂ මූණු, පෙරේත මූණු, කෝලම් මූණු.

මේ ටවුමෙ හැම සල්ලිකාරයම කෙළ හලාගෙන ඉන්නෙ මේ වලව්වට. වලව්ව ඇතුළෙ රත්තරන්, මුතු මැණික්. ඇත් දළ, රජ කඩු, නිදන් වදුලු අරව මේවා තියෙනවා කියලනෙ කට්ටිය කියන්නෙ."

මම සිනාසුණෙමි.

"ඔය කියන එකක්වත් අපේ ගෙදර නෑ."මම කිව්වෙමි.

"සර් එහෙම කිව්වට බෑ. දැං දියවඩන නිලමෙ කිව්වොත් අර කරඬුව ඇතුළෙ දන්ත ධාතුව කියල එකක් නෑ කියලා මිනිස්සු විශ්වාස කරයිද? නෑනෙ. අන්න ඒ වගේ තමා."

මගේම ගෙදර ඇතුළේ ඇත්තේ හෝ නොමැත්තේ මොනවාද යන්නවත් මට තීරණය කළ නොහැකි වීම යනු මට කවදාකවත් සමාජයෙන් වෙන් වූ හුදෙකලා ජීවිතයක් තිබී නැති බව පෙන්වන ලකුණක් සේ විය.

ඔහු සමග ඇති වූ දීර්ඝ සංවාදයකින් මට මතක ඇති කොටසක් ඔහුගේ ශෛලියෙන්ම ඉදිරිපත් කරන්නට මම තැත් කළෙමි. එදින සංවාදය ඉතා රසවත් එකක් විය.

ඔහුගේ කටඋත්තරයේ ඇති සියල්ල නිවැරැදි නොවන්නට පුළුවන. එහෙත්, එහි නිවැරැදි දේද බොහෝ ඇතැයි මම සිතුවෙමි. එය ඇත්තක් නම් අපේ නගරවල අලංකාර දවටනය යටින් ඇති නපුරු කතන්දරය අතිශය භයානකය.

මේ අනාවරණය ඇසීමෙන් පසු ඩීඅයිජී බාප්පා නොමැති අඩුව මට දැනිණ. මම මගේ ඉතුරු ඥාති ජාලය ටිකක් සොලවා

මේ පුද්ගලයාගේ කට උත්තරයේ යම් ඇත්තක් ඇද්ද යන්න සොයා බලන්නට තැත් කළෙමි. යුද්ධයක් යනු බොහෝ අයට ව්‍යාපාරික අවස්ථාවක්ය යන කාරණය රහසක් නොවේ.

"ඔකෙ ඇත්තක් තියෙනවා. නොයෙක් දේවල් කුරුණෑගල හරහා වන්නියට ගිහින් තියෙනවා. එව්වගෙන් හම්බ කරපු අය එක්කො බලයෙ උන්නා නැත්නම් ඉන්නව එහෙමත් නැත්නම් එන්න ඉන්නවා. ඔක එච්චර රහසක්ම නෙමේ. ඒකෙ නෙමෙයි ලොකුම විහිළුව. කුරුණෑගල දිස්ත්‍රික්කෙන් හමුදාවලට ගිහිල්ල කොල්ලො මැරිල තියෙනව අනික් දිස්ත්‍රික්කවලට වඩා." තවත් ඉහළ තැනක කෙනෙක් මා සමග කීවේය.

උගුල

එය කුරිරු සැලැස්මක් විය. එහෙත් එය සෙල්ලමට කළ සැලැස්මකි. ඔහු ඒ බව දැන සිටියේය. ඒ නිසා ඒ සැලැස්ම ක්‍රියාත්මක කළ සැටි උත්තම පුරුෂයෙන් ලියන්නට පවා ඔහුගේ කැමැත්තක් නොවීය. රාධා විසින් විඥානය වෙනස් කරන්නට බාරදුන් කටකාරයා විනාශ කරන සැලැස්මකට අකැමැත්තෙන් හෝ එකඟවීම ගැන ඔහු තුළ පසුතැවිල්ලක් තිබුණේය. රාධා කියූ හැටියට මිනිස් විඥානයක් ආක්‍රමණය කර වෙනස් කළ නොහැකිය. වීවී සිතන්නට භාවිත කළ සියලු සංකල්ප ඔහුගේ විඥානයේ ගල් ගැසී තිබුණේ පමණක් නොව, ඒවාට දේශපාලන වෙළෙඳපොළේ අලෙවියක් ඇති බවද ඔහු නොදන්නෙක් නොවේ. අනික ඔහුගේ අදහස්වලට අභියෝග කිරීම ඉතා කම්මැලි ක්‍රීඩාවක් විය. එක්කෝ ඒ අදහස් වෙනස් කළ යුතුය නැතිනම් ඒ අදහස්ද සමග ඒවා දරන්නා විනාශ කළ යුතුය.

රාධා අපේක්ෂා කළ ලෙස වීවීගේ විඥානය වෙනස් කිරීම කළ නොහැකි වැඩක් බව බන්දු බලගල්ලට තේරුම් යමින් තිබුණේය. ඒ නිසා විඥානය බෝලයක් සේ ගෙන සෙල්ලම් කරන සෙල්ලම් සිතුවිල්ල සිතට ආ විට ඔහුගේ සිත ගියේ සෙල්ලම වෙතමය. එහෙත්, එය තීක්ෂණ සැලැස්මක්ද විය.

ඉතා සියුම් ලෙස එළන ලද උගුල විජය වික්‍රමසිංහගේ විඥානය සමග හරියටම ගැළපුණු නිසා ඔහු ඒ වෙත වේගයෙන් ඊංගුවේය. සැලැස්ම ගැන බන්දල බලගල්ලගේ වරදකාරී හැඟීම

නිසාම වීවී විසින් තමා සහ රාධා රැවැට්ටූ ආකාරය ගැන ඔහුගේ කෝපයද වැඩි විය. ඒ වරදකාරී හැඟීම සහ ඒ කෝපය අතර තරගය නිසා වීවී උගුල වෙත යන ආකාරය දෙස ඔහු උදාසීනව බලා සිටියේය.

උගුලෙහි සැලැස්ම සේනගේය.

බලගල්ල වලව්වේ පරණ පොත් අල්මාරියේ පුස්කොළ පොත් අතර එය තිබිණ. කලක් පරණ පෙට්ටගමක තිබුණු එය බන්දුල බලගල්ලගේ පුස්තකාලයේ දුර්ලභ පොත් අල්මාරියට එක් කළේ ලියන මහත්තයා සිටි කාලයේය. එහෙත්, එය එතරම් ප්‍රයෝජනයක් ඇති එකකියි බන්දුල බලගල්ල කවදාවත් සිතුවේ නැත. ලියන මහත්තයාද ඒ ගැන කියා ඇත. ඒ ගැන කතා වූ සැමට විටෙකම දැක්වූ උදාසීනත්වය ඔහුට ඒ ගැන කියූ අයට අදහා ගන්නට බැරි විය. සාරවත් පොල් වත්තක තනියම ගොල්ෆ් ගහන නිකමකු උසිගන්වා පලක් ඇති වැඩක් වෙත යොමු කරන්නට ඔහු හමුවේ ඒ ගැන කියන බවක් බන්දුල බලගල්ලට පෙනී ගියේය. ඒ නිසා ඔහු තවත් උදාසීන විය.

එය නිදන් වදුලකි.

ඒ ගැන මෙවර බන්දුල බලගල්ලගේ අවධානය යොමු කළේ සේනය. ඔහු මේ නිදන් වදුල ගැන සිය පියා වූ ලියන මහත්තයාගෙන්ද අසා තිබිණි. බලගල්ල වලව්වේ පෙට්ටගම්වල වදුලු පොත් තිබේය යන කාරණය තරමක් පැතිරුණු කටකතාවක් විය.

සේනගේ සැලැස්ම මෙසේ විය: "සර් කතා කර කර ඉන්න අතරෙ ගොළුවට වදුල ගැන නිකමට කියල බලන්ඩ. එකත් එකටම ඕකා වදුලට අහුවෙනව පෙරේත ගොටුවට එන පෙරේතයෙක් වගේ. ඕක ඉල්ලනවානං අපි වදුල දෙමු. සර් කියන්ඩ 'වීවී එහෙනං බලන්ඩකො මේකෙ මොනවද තියෙන්නෙ' කියලා. මට හොඳටම ෂුවර් ඕක ඔක්කොම පැත්තක තියල නිදන් හාරන්ඩ යනවා. ඕකා නිදන් හාරල හාරලා වල් ඌරෙක් වගේ නිදානෙකම වැළලිලම යයි. මාත් කතාව හීනියට යවන්නං ඩ්‍රැයිවර් අතේ."

සේන එය විස්තර කළ ආකාරයේ වූ කුරිරු ස්වභාවය බන්දුල බලගල්ලගේ රුචිය හා නොගැළපුණද, විජය වික්‍රමසිංහ නිදන් වදුල නිසා ඇවිස්සෙන්නට ඉඩ ඇති බව ඔහුද සිතුවේය.

"සේන කොහොමද හිතන්නෙ මිනිහ ඔහොම කරයි කියලා?"

"මං දන්නව සර්. ඔය වගේ ජාතිය, මවුබිම අරක මේක කිය කිය ගෑගහන එවුං මීට කලින් ඉඳල තියෙනවනෙ. ඔවුන් මවුබිමේ තියෙනෙව්වා හොරාකන එකම තමයි කරල තියෙන්නෙ. ඔය රතු කමිසකාරයෝ විතරයි මවුබිම කිය කියා කෑගහන එව්වන්ගෙන් ඒක වෙනුවෙන් මැරෙන්ඩ ඉන්නෙ - මොනව උනත් ඒක නම් කියන්ඩ ඕනෙ. හැබැයි එව්වො දන්නෑ උන් මවුබිම ගගා බෙරිහන් දීල මැරිල ගියහම එව්වම කියල බොරුවට බෙරිහන් දෙන එව්වො රජ වෙල මවුබිමම කනවා කියලා."

විජය වික්‍රමසිංහ යනු ලංකාවේ පොළොව යට විශාල ධන නිධාන තිබේය යන්න වාච්‍යාර්ථයෙන් ගන්නට ඉඩ ඇති කෙනෙකි. නූතන වෛද්‍ය විද්‍යාව ව්‍යාපාරයක් බවට පෙරළා කුඩා වැනලින් සෙන්ටර් එකක් රෝහලක් දක්වා වර්ධනය කළ අනාගතය වෙත යොමු වූ මිනිසෙකුට පොළොව යට සැඟවී ඇති නොදන්නා වස්තුවක් වෙත යොමු වූ විඥානයක් ලැබුණේ කෙසේද? එය බන්දුල බලගල්ලට තේරුම් ගත නොහැකි ප්‍රහේලිකාවකි. විජය වික්‍රමසිංහ යනු විඥාන දෙකක් එකවර ගත් මිනිසෙක්ද? මේ විඥාන දෙකින් එකක් පමණක් විනාශ කළ නොහැකිය. දෙකම ඇත්තේ එකම සිරුරක බැවිනි. මේ රට ඉස්සරහටත් පස්සටත් එකවර යන්නේ යැයි වරක් රාධා කීවේ මේ සියල්ල අපටත් කලින් දැන සිටි නිසාද?

සේන එළියට රැගෙන ආ නිදන් වදුල කළු පැහැ ගැහුණු පුස්කොළ පොතකි. එය බන්දුල බලගල්ලට ඇසෙන්නට කියවන්නට සේන තැත් කළද එය ඉතා දුෂ්කර කාර්යයක් විය. පුස්කොළ පොත් කියවන්නට විශේෂ පළපුරුද්දක් අවශ්‍ය වන බවද පෙනිණ.

ඒ නිසා සේන එය සෙමින් සෙමින් කියවා අභ්‍යාස පොතක පිටපත් කළේය.

"කවුඩා උල්ලේ ගලේ ගෝන අඟ කොටා ඇත. එතන සිට තුන් පියවරක් පූර්වදිගට අඟේ හැටදාහයි.

එතනම දළදා මාලිගාවට බස්නා අතට බලා වෙහෙරක් සේම ඇත. එතන හතළිස්දාහයි.

ගිරිහම්පත්තුවට කිට්ටුව පඬා වැවේ කොටවෙහෙරේ නවකුරුණියයි. මැණික් දොළහයි. සර්වඥ ධාතු 246 නමයි. වෙහෙරට පුද කළ මහත් ධනයයි.

හෙට්ටිගම ගලේ ඉලත්තට්ටුව කොටා ඇත. මැණික් ගල් දොළහයි.

මඟුලාගම ගලේ කපුටා කොටා ඇත. තුඩ අග තුන් ගලක් යට හත්දාහයි.

විල්බාවේ ගලේ පල්ලැක්කිය කොටා ඇත. ඒ යටයි.

නාගොල්ලාගොඩ උතුරු දිග ගල් වැවේ තිලඹු ගලේ කවයක් ඇත. ඒ වට කව තුනක් ඇත. සිව්කොණ දහදාහයි. මැද හාර ලක්ෂයයි. මැණික් තුනයි. වියතක් යටයි.

ඇතුගලේ දෙව්රුවක් ඇත. සත්පියවරක් ගිය තැන මූන ඉදිරියෙන් දොළොස් දාහයි. වියතක් යටයි.

එම ගලේ අස්කුරයක් ඇත. ඉදිරියෙන් සත් පියවරක් ගිය තැන තුන්දහයි. තුනඟුලක් යටයි.

කුරුණෑගල වැව මැද ගලේ පාරුවක් කොටා ඇත. සත් පියවරක් ගිය තැන දොළොස් ලක්ෂයයි. රියනක් යටයි.

ආඳාගලේ නෙළුම්මල යට දාහයි. අඟලක් යටයි.

කුරුණෑගල ගලේ දූන්න කොටා ඇත. දලුව අගයි. රන් කඩු දෙකයි. අඩියක් යටයි."

ලංකාව හැම තැනම ඇති නිධාන ඇති තැන්වල නිමිති දක්වන මේ වදුලු පොත බන්දුල බලගල්ල මවිත කළේය. ඒ ඇතැයි කියන නිධාන බොහොමයක් ඇත්තේ බලගල්ල වලව්ව අහළ පහළය. ඒ නිධාන ගැනීමට දිය යුතු දොළ බිලි ආදියද කියවනු අසා සිටි බන්දුල බලගල්ලට පෙනුණේ ඒවා ජීවිතය පිළිබඳ රූපකයක් සේය. අමිල වස්තුවක් ඇති තැනක් ගැන කෙළින්ම කියා තිබුණද ඒවා ගැනීමට අමිල වස්තුවක්ම පරිත්‍යාග කළ යුතුය. ඒ නිසා නිධාන යනු ඇත්තක් නම් එවා නොගන්නට තැන්පත් කළ දේවල් විය යුතුය. බන්දුල බලගල්ලගේ ප්‍රියතම සිනමා කෘතියක් වන නිධානයේ විලීගේ විඥානය වෙත මොහොතකට තමාද ඇදී ගියාක් මෙන් ඔහුට දැනිණ. වදුලු පොත යනු පුරාණ සිංහලයන් අනාගත සිංහලයන්ගේ ජීවිත සමග කරන විහිළු සෙල්ලමක කොටසක් නොවේදැයි බන්දුල බලගල්ල කල්පනා කළේය. අපගේ මේ ආඛ්‍යානයේ විලී, වීවී මිස තමා නොවන බව සිතෙන විට බන්දුල බලගල්ලගේ මුහුණේ යන්තම් සරදම් කරන සිනාවක් ඇඳිණි. එය කුරිරු සිනාවක් බව ඔහුටම අවබෝධ විය.

"මෙහෙමයි කතාවට එන්න ඕනෙ" බන්දුල බලගල්ල හිතේ ගොනු කරගත්තේය: "දැන් වීවී නිතරම කියනවනෙ මේ මවුබිමේ තියෙන නිධාන ගැන. ඇත්තටම එහෙම නිධාන තියෙනවද?"

විජය වික්‍රමසිංහ කියන්න ඇති දේද බන්දුල බලගල්ල තම සිතේම ගොනු කළේය: "ඇයි නැත්තෙ සර්. කොච්චර නම් තියෙනවද? මේ රටේ ඒ වගේ ධනනිධාන වෙන කිසි කාලෙක තිබිලත් නෑ. ආයෙ තියෙන්නෙත් නෑ."

"මගෙ එක පුස්කොළ පොතක් තියෙනවා. නිදන් වදුලක් කියන්නෙ?" තමන්ට එසේ කියන්නට පුළුවනියි බන්දුල බලගල්ල සිතුවේය. ඔහුගේ දෙතොලේ සිනාවක් ඇඳිණ.

"මොකද සර් තනියම හිනාවෙන්නෙ?" සේන ඇසුවේය.

"මට හිතෙන්නෙ මේ නිදාන ගැන තියෙන පිස්සුවයි අපේ රට ලෝකෙ හොඳම රට කියන පිස්සුවයි දෙකම එකයි."

"ඒකත් වෙන්න පුළුවන්. ඒ උනාට නිදාන තියෙන්න පුළුවන්. තමන්ගෙ තියෙන අතිරික්ත ධනය පන්සල්වල ගෙනැල්ල ගොඩගහන මිනිස්සු ඉන්ඩ ඇති." සේන කීවේය.

"මටනං හිතෙන්නෙ. ඔය නිදාන කියල ගන්න ගොඩක් ඒවා පැරණි කෞතුක වස්තු මිසක් නිදාන කියල නිදන් කරපුව නෙමේ." බන්දුල බලගල්ල කීවේය.

"සර් ඔහොම හිත හිතනං මේ වැඩේ හරියන්නෑ සර්." සේන කෝපයෙන් මෙන් කීවේය.

ඊළඟ වාරයේ ගොල්ෆ් පුහුණුවට වීවී ආ විට වදුල ගැන පුවත ඔහුට කියන හැටි බන්දුල බලගල්ල සැලසුම් කරගත්තේය.

වීවී එදා පිටව ගියේ පුස්කොළයෙහි ලියූ නිදන් වදුල අතගා බලා සේන පිටපත් කළ කොළයද රැගෙනය. බන්දුල බලගල්ලගේ පුස්තකාල කාමරයේ සිදු වූ ඒ රහස් හමුව ගැන අන් කිසිවකු නොදන්නේ යැයි වීවී විශ්වාස කළේය. ඒ අභ්‍යන්තරික කාමරය වෙත පළමු වරට වැද්ද ගැනීම ගැන වීවීගේ මුහුණේ වූයේ පිටතට පෙනෙන තරම් ආඩම්බරයකි.

"වීවී නිදන් ගැනම කියන හින්ද ඔක දුන්නෙ. නිකමට කියවල බලන්නකො." බන්දුල බලගල්ල කීවේය.

රතු සාප්පුව

මාස හයක් ඇතුළත ගොඩනගන ලද බීබී සුපර්මාට් ගොඩනැගිල්ලේ පළමු තට්ටුව උත්සවශ්‍රීයෙන් විවෘත කෙරිණ. ඒ කාලය තුළම පාහේ මම රාධා නොදැක්කෙමි. මගේ හදිසි ව්‍යාපාරික උනන්දුව ඇති වූයේ කුමක් නිසාද යන්න ගැන දුරකථනයෙන් සාකච්ඡා කරන්නට ඇය නැත් කළද මම වැඩිමනත් විස්තර කියන්නට නොගියෙමි. විටින් විට කුරුණෑගල ආ හැනා මගේ පුස්තකාලයෙන් කියවන්නට පොතක් ඉල්ලාගෙන යන්නට හෝ මා කියවිය යුතුයැයි ඇය සිතූ පොතක් මට දෙන්නට හෝ ආවාය. අප දෙදෙනා පෙනිලොපී ෆිට්ස්ජෙරල්ඩ්ගේ සියලු නවකතා කියවන්නට පටන්ගෙන තිබිණි. ඒ නිසා පොත් හුවමාරුව සඳහා විටින් විට හමු විය යුතු විය. නිම්නා, රාධා සහ හැනා සිංහ රෝහලේම ගොළු දරුවන් වෙනුවෙන් පන්තිය පවත්වාගෙන යති. නිම්නා එය බාරව සිටින අතර හැනා වරින්වර එයි. මේ සියලු දෙනාම බීබී සුපර්මාට් විවෘත කරන දින ආහ.

රාධා දුටු විට මගේ ඇස් අදහාගත නොහැකි විය. දර්ශනීය කපු සාරියකින් සැරසී සිටි ඇය බෙහෙවින් මහත් වී සිටියාය. නිතරම ව්‍යායාම කරමින් සිරුරේ හැඩය සහ නිරෝගීභාවය ගැන කරදර වෙමින් සිටි ඇයට බත් කෝරලේ බත් කර ඇති ව්‍යසනය මා සිත කැලඹීය. ඈ සිරුර රවුම් වී ඇති නිසා ඇගේ සාරියේ වර්ග අඩිවලින් වැඩි ප්‍රමාණයක් ඒ සිරුර මත ප්‍රදර්ශනය කරන්නට ඇයට හැකි විය. තමා සහ තම සිරුර ගැන අවධානය යොමු

නොකර අනුන්ගේ සුව සෙත සදන ගැහැනියකගේ ලක්ෂණ ඇ වෙත පෙනිණි. සියලු කටයුතු සේන සහ අනෙක් අයට පවරා සිටි මා එතරම් කාර්ය බහුලව නොසිටියෙන් මට ඇය හා මද වේලාවක් කතා කරන්නට ඉඩ ලැබිණි.

"මම මහත් වෙලා කියන එකනෙ ඔය බැල්මෙ තියෙන්නෙ." ඇය ඉංග්‍රීසියෙන් කීවාය.

ඇය මා වෙත එන විට මගේ අලුත් සේවකයින් පවා ඇය දෙස බැලුවේ 'ගොළුවිජේව කතා කරවූ මැඩම්' ඇය බව දන්නා නිසා විය යුතුය.

සිය ශරීරය ඇයගේ පාලනයෙන් ගිලිහී ගිය අන්දම ඇය මට විස්තර කළේ එක්තරා වරදකාරී හැඟීමකිනියි මට සිතේ. ඇය එකක් පසුපස එකක් සාරි ගත්තාය. ඒවාට ගැළපෙන හැට්ට එකක් පසුපස එකක් මැසුවාය. ඒ නිසා එක හැට්ටයක් අනික් හැට්ටයට වඩා ටිකක් හෝ ලොකු වෙන බව දැනුණේ නැත. වීවී සමග සිටින විට කලිසම් ඇඳීම අඩු නිසා පරණ කලිසම් කුඩා වන බව ඇය දැනගන්නා විට සිරුරට අලුතින් කිලෝ දහයක් විතර එක් වී තිබිණ. ඒ සියල්ල සිදුවන කාලයේ ඇය වීවී ගෘජස් පරිපාලන කටයුතුවල කාර්යබහුලව උන්නාය. ඇය කවර අන්දමකින් විස්තර කළත් මට ඇය පෙනුණේ තමා විසින්ම අත්හැර දමන ලද ශරීරයක බර උසුලාගෙන යන ගැහැනියක ලෙසිනි. මගේ මිතුරියට මේ ව්‍යසනය කරන මිනිසා ගැන කෝපයක්ද මා තුළ ඇති වූ බව නොකියා බැරිය.

ඇයට අත් වී ඇති ඉරණමෙහි තරම වඩාත් කැපී පෙනුණේ හැනා අප වෙත ප්‍රවේශ වූ ආකාරයෙනි. අත් කැපූ සුදු සැටින් ගවුමක් පැලඳ, කුඩා අත්බෑගයක් අතින් ගෙන අප වෙත ආ ඇ කෙරෙහි බොහෝ ඇස් එල්ල විය. ඇගේ සිහින් උස සිරුර, දුටු මතින් රාධා ගැන මා තුළ වූ අනුකම්පාව පැන නැග ආවේය.

අප තිදෙන කතා කරමින් සිටි තැනට ආරක්ෂකයින්ද සමග වීවී ආවේ දඩිබිඩි ගමනිනි.

"වීවර්ල දෙන්නම ඉන්නෙ." ඔහු කීවේය.

බීබී සුපර්මාට් සම්පූර්ණයෙන්ම රතුය; බිල්ඩිම තාප්පය රතුය; ඇතුළත බිත්ති රතුය; රාක්ක රතුය; ෂොපින් කාට් රතුය; සේවකයන්ගේ නිල ඇඳුම රතුය; ප්ලාස්ටික් බෑග් රතුය; බීබී සුපර්මාට් විවෘත ලෝකයට දන්වන පෝස්ටර් උත්සවයට එල්ලා ඇති බැලුන් රතුය; පීත්ත පටි රතුය; බීබී සුපර්මාට් වාහන සියල්ල රතුය; මම නගරයේ රතු පාට අත්පත් කර ගතිමි. නගර සභාව විසින් පවත්වාගෙන යන දැන්වීම් පුවරුද පෞද්ගලික බිල්බෝඩ්ද යන සියල්ල කුලියට ගෙන රතුපාට පසුතලයේ බීබීයැයි ලියවූයෙමි. මා රතුපාට සමග සෙල්ලම් කළේ එය තනියම ගොල්ෆ් ගැසීමේම දිගුවක් බව සලකමිනි.

අද බීබී සුපර්මාට් ශාඛා ලංකාවේ සියලු ප්‍රධාන නගරවල ඇත. ලොකු රතු පාට බී අකුරු දෙකක ඡායාව ඕනෑම කෙනෙකුගේ ඇස් දෙකෙහි ස්ථිරව සටහන් වූවාක් සේය. ඒ නගර සියල්ලේම ඇති රතුපාට අවකාශයෙන් විශාල කොටසක් අයිති මටය. මා කුලියට ගෙන රතු පාට කළ සියලු තාප්ප සහ දැන්වීම් පුවරු අයිති මටය. ඒවා මත අලවන විප්ලවීය පෝස්ටර් වුවත් වහා ඉවත් කෙරේ. අපේ ඥාති ජාලයේද මගේ මිතුරු ජාලයේද පොලිස් ලොක්කෝද දැන් ඕනෑ තරම් සිටිති. අවශ්‍ය වූයේ මා නින්දෙන් නැගිටීම පමණි. මේ සියල්ල සිදුවූයේ මගේ ප්‍රාග්ධනයත්, මොළයත් යන්තම් සෙලවීමෙන් පමණි. අනික් කාලය මා ගත කළේ මගේම ගොල්ෆ් පිටියේය. වෙනසකට ඇත්තේ දැන් මා සමග ගොල්ෆ් ගසන්නට අලුතින් කීපදෙනකුම එක් වී සිටීමයි. බිස්නස් ලෝකයේ ඉන්නට බිස්නස්කාරයන් සමග නිතර ගැවසීමට සිදුවීම මගේ ජීවිතයේ සිදු වී ඇති එක් වෙනසකි.

නිකම් සිටින මිනිසෙකුට අයත් පරණ වලව්වක තාප්පයක රතුපාට වණ්ඩිකම් පළ කළ පෝස්ටර්කාරයෝ සුපර්මාකට් තාප්පෙක ඒවා ඇලවිය යුතු නැති බව හොඳින් වටහා ගත්හ.

මා විසින් රතු කරන ලද නගරයේ කිසිම තාප්පයක ඔවුහු පෝස්ටර් නොඇලවූහ. මගේ රතුපාට සුපර්මාකට් ජාලය එන විට ඒවාට විප්ලවීය විරෝධයක් එල්ල වෙතියි සේන අපේක්ෂා කළද එය සිදු නොවීය. විප්ලවීය පක්ෂවල අයද පැමිණ රතුපාට ෂොපින් කාට් තල්ලු කරගෙන, රතුපාට කවුන්ටරයට ගොස්, රතුපාට නිල ඇඳුම් ඇඳි කෙල්ලන්ට විහිළුද කර, රතුපාට සාමාජික කාඩ්පත්වලින් වට්ටම්ද ගෙන, රතුපාට බෑග්වල බඩු ගෙන යන බව සේන මට වාර්තා කළේය.

මම මට සුපුරුදු සැහැල්ලු ඇඳුම් හැඳ නිදහසේ උන්නෙමි. මගේ පුස්තකාලයේ ගත කළ කාලයේද විශේෂ අඩුවක් නොවිණ. මගේ ධනකුවේරත්වය යනු නිදි නැති රැයක සැලසුම්ද ඉසිඹුවක් නැති දවාලක වෙහෙසද යොදා කළ වික්‍රමයකියි සිතන අය ඒ කතාව ලියන්නැයි කියති. මේ ආඛ්‍යානයේ අවසානයේදීද මට කියන්නට ඇත්තේ මා නිකම් සිටිය මිනිසකු බවය. මගේ ජීවිතයේ කිසිම තීරණාත්මක වෙනසක් නොවිණ. වෙනසකට වී නම් වූයේ ලන්ඩන් ටයිම්ස් වැනි පුවත්පත්වල වෙළෙඳ දැන්වීම් අතිරේක වෙතද දැන් මගේ අවධානය යොමු වීමය.

සේන මේ ව්‍යාපාරයේ විශාල වැඩ කොටසක් කරන අතර, එය විහිළුවකටද ගත්තේය. ඒ මෙසේය: ඔහු රූපවාහිනියේ ජාතිය, දේශය ආදිය ගැන ලේ රත් වෙන ආදරයකින් කතා කියන වැඩසටහන් බල බලා අපේ බීබී සුපර්මාට් වෙත එක් කළ යුතු දේවල් ලැයිස්තු ගත කළේය. "සිංහල ජාතිය ලෝකයේ උතුම්ම ජාතිය වීමට" කෑ ආහාර යැයි ඒ කථිකයන් කී කොහිල, කුරක්කන්, අගුණකොළ, කොස් ඇට, කටු අනෝදා, තුඹ කරවිල, වෙල් ගොටුකොළ, ගිරා පලා, නීරමුල්ලිය යනාදී නොයෙක් දේ ඔහු බීබී සුපර්මාට්හි 'දේශීය අංශයට' එක් කළේය. ඒවා දැන් ඕනෑම කෙනෙකුට පැමිණ රතුපාට සිලිසිලි බෑග් එකක දමාගෙන යා හැකිය. දේශීය අංශයේ ඕනෑම දේශීය දෙයක් විකුණන්නට තිබිණි. පත්තරකාරයෝද ඒ දේශීය අංශය ගැන විශේෂාංග ලිව්වේ කොස් ඇට, තිබ්බටු, සුදු කොච්චි, හීන් කොච්චි, කොහිල දළු ආදියේ අලංකාර සමීප රූපද සමගය. සේන කර තිබුණේ බීබී සුපර්මාට් තෙවැනි තට්ටුවේ බීබී සුපර්පබ් බාර් එකෙන් පත්තර මහත්තුරුන්ට හොඳ සංග්‍රහයක් දීම පමණි. සේන දේශපාලන කතා ඇහුවේ ඔවුන්ගේ කතාවලින් කියවෙන විකිණිය හැකි ජාතියේ ජාතික දේවල් මොනවාදැයි බලන්නටය.

* * *

මගේ රතුපාට සුපර්මාකට් එක වේගයෙන් වර්ධනය වන අතර, අතුරු මැතිවරණය පැවැත්විණ. ඉන් වීවී ජය ගත්තේ නැත. වීවීගේ පක්ෂයෙන්ම ඉදිරිපත් වූ කිහිපදෙනෙක්ම වෙඩිතැබීම සමග ඔහුගේ නම සම්බන්ධ කර ඔහුගේ මනාප අඩු කර තිබිණි. ඔහු කියන දේම ඔහුට වඩා හොඳින් කියන්නටද ඒ අය ඉගෙනගෙන තිබිණි. ඒ වන විට වීවී යනු හාස්කම් බලයෙන් කටහඬ දිනූ හාස්කම්කාරයෙකිය යන කාරණය බොහෝ දෙනෙකුට අමතක වී ගොස්ය. එපමණක් නොව, නොමිලේ අරක්කු බෙදා දෙන්නට හැකි තැබෑරුම්කාරයන් දෙන්නෙක්ම වීවීගේ පක්ෂයෙන් ඉදිරිපත් වී සිටියහ. විජිත රත්නායකගේ පක්ෂයට සැලකිය යුතු ඡන්ද සංඛ්‍යාවක්වත් ලැබුණේ නැත.

මා විසින් නගරයේ රතුපාට අයිති කරගත් පසු මට විරුද්ධ රතු පෝස්ටර්ද අඩු විය. විජිත රත්නායකගේ පක්ෂයෙන් සේන වෙත පණිවුඩයක් එවා කියා තිබුණේ විජිත රත්නායක යනු මියයන විටත් තම පක්ෂයට අරියාදු කළ ද්‍රෝහියකු නිසා ඔහුගේ පක්ෂය රතුපාට අකුරින් කරන ප්‍රචාරවලට තමන්ගේ සම්බන්ධයක් නැති බවයි. එය තරමක ව්‍යාකූල පණිවුඩයක් විය. මේ ඇතැම් රතු පාට පෝස්ටර් අලවන්නේ විජය වික්‍රමසිංහ සහ ඔහුගේ නායකයන්ගේ මැරයන් වන්නට ඉඩ ඇති බවද ඒ පැමිණි පුද්ගලයා සේනට කියා තිබිණි. එය අප එතෙක් නොසිතූ දෙයකි. ඒ කවර ආකාරයකින් සිදු වුවත් ඒ වන විට අපට එය අදාළ නැත. අපේ නගරයේ රතුපාට තිතත් දැක්කත් බීබී සුපර්මාට් සිහි වෙන තැනට රතුපාට

අපට අයිති කරගන්නට සේන සමත් විය. සේන මුලදී අකැමැති වුවත් ව්‍යාපාරයේ සියලු අංශවලට තරුණ කළමනාකරුවන් බඳවා ගන්නට මට හැකි විය. කොළඹ සහ නුවර ප්‍රකට පාසැල්වලින් ඉගෙනගත්, ඉංග්‍රීසිය හැසිරවිය හැකි තරුණ පිරිසක් ව්‍යාපාරයේ නායකත්වයට පැමිණ එය මෙහෙයවූහ. ඒ නිසා වැඩිකල් යන්නට පෙර බීබී සුපර්මාට්හි කොටස් මිලට ගෙන අප සමාගම තුළ ආයෝජනය කරන්නට නොයෙක් අය ආහ. අද බීබී සුපර්මාට් යනු එක් මිනිසෙකුටවත්, එක රටකටවත් අයිතියැයි කිව නොහැකි විශාල සමාගම් ජාලයකි. එය දවසින් දවස වැඩේ. පොල් වතුවලින් ලැබෙන ආදායමින් ප්‍රභූ පවුලක් බවට පත් වූ සීයාට සහ පප්පාට සිහිනෙන්වත් හිතන්නට බැරි ආදායමක් මට ලැබේ.

මම දැන් නිදහසේ නිකම් ඉන්නෙමි. මා යා යුතුයැයි කියන නිරන්තර ප්‍රියසාදවලට පවා යවන්නට මා තරම්ම වැදගත් නිලධාරීහු මගේ සමාගමේ සිටිති.

* * *

වදුල නම් උගුලට වීවී කෙසේ හසුවීද යන්න සොයා බලන්නට මට වෙලාවක් ආවේ නැත. බීබී සුපර්මාට්හි වේගවත් නැග්මෙන් පසු මට පොළොව යට නිධාන ගැන නොව, පොළොව මත නිධාන ගැන සිත යොමන්නට සිදු වී තිබිණි. වීවී ගොල්ෆ් ඉගෙනගන්නට පැමිණීමද ක්‍රමයෙන් අඩු විය. ඔහුගේ ව්‍යාපාරවල පසුබෑමක් ඇති බවද කියවිණ. එහෙත්, සේන සිය සැලැස්ම ගැන අවධානයෙන් සිට ඇත.

මැතිවරණයෙන් මාස තුනකට විතර පසු සේන මට මෙසේ වාර්තා කළේය:

අපේ නිධන් වදුලේ නිධාන ඇතැයි සඳහන් තැන්වල කණ්ඩායම් කීපයක් අතරම ගැටුම් ඇති විය. ඔවුහු එකිනෙකාට වෙඩි තබා ගත්හ. එක් පහර දී ගත්හ; එකිනෙකා

කණ්ඩායමක් තව කණ්ඩායමක් පොලීසියට අල්ලා දෙන්නට ඉදිරිපත් වූහ. පුදුමය වූයේ නගරයේ සිටින ප්‍රධාන දේශපාලන පක්ෂ දෙකකම දේශපාලකයන් සහ ඔවුන්ගේ ගෝලයන් නිධාන කීපයකට පොරකන්නට පටන් ගත්තේ කෙසේද යන කාරණයයි. එහෙත්, සේන එය පුදුමයක් නොවන බවද පැහැදිලි කළේය. ඔහු සිය සම්බන්ධතා සියුම් ලෙස මෙහෙයවා බලගල්ල වලව්වේ තිබූ නිදන් වදුලෙහි පිටපත් වීවීගේ පක්ෂයේත් අනික් පක්ෂයේත් දේශපාලකයන් අතට පත් කළේය. එය ඇත්තේ තමන් ළඟ පමණකියි සිතූ ඔවුහු තමන්ගේ චණ්ඩින් සහ ගෝලයන් සමග නිදන් සලකුණු හොයමින් තැනින් තැන ගියහ. ඒ යන විට ඇතැම් නිදන් සලකුණු හොයමින් තැනින් තැන ගියහ. ඒ යන විට ඇතැම් කණ්ඩායම්වලට දැක හාරන්නට තැත් කර ඇති බව සමහර කණ්ඩායම්වලට දැක ගන්නට ලැබිණි. සමහර විට කණ්ඩායම් දෙකක් එකම වෙලාවට එකම නිධානය හාරන්නට ගොස් එකිනෙකා වෙත පහර දී ගත්හ. එය එකම විකාර නාටකයක් විය. අපේ සියලු දේශපාලකයන් පොළොව හාරා අතීතය හොයන අතීතකාමී රැළක් වන බවත් අපේ බීබී සුපර්මාට් වැඩෙන්නේ අනාගතය දෙසට බවත් සේන හරියටම දැන සිටියේය. එහෙත්, අපේ පුස්කොළ පොත් අතර වූ මේ දුර්ලභ පුස්කොළ පොත සියලු දේශපාලන මැරයන් අතට පත් කිරීම ගැන මට ප්‍රසාදයක් තිබුණේ නැත.

"පුස්කොළ පොත හෙල්ලුවෙවත් නෑ. පිටපතෙනුත් කෑල්ලක් විතරයි ඇරියෙ." සේන සමාවාචීව කීවේය.

මවුබිමේ උදාරත්වය, පූජනීයත්වය, සුජාතභාවය ආදී වචන කියන සියලු දේශපාලකයන් තම ගෝලයන් එම නිධන් වදුල පසුපස යවන්නේය යන්න ඇත්තකි. නිධන් හාරන්නට ගොස් හසු වූ දේශපාලන ගෝලයන් බේරාගැනීමට දේශපාලන ඇමතුම් පොලීසියට එන බව වාර්තා විය. නිධන් හැරුං බොහෝ අයට හමු වී ඇත්තේ පස් පමණි. නිධාන ඇති තැන්වලට ගෙන යන්නට තැත් කළ බුල්ඩෝසරයක් මහ රෑ වෙළක එරී පොලීසියට හසුවූයෙන් තොරතුරු එළියට පැන්නේය. නිධානයක් ඇති තැනක් ගැන එක් දේශපාලකයකු විසින් ඉහළට දන්වනු ලදුව ඉහළම නායකයකුට අයත් කණ්ඩායමක් අලුත් තාක්ෂණය ඇතිව පැමිණ ගලක් විද

සොයා ගත් රන් කඩුවක් වැනි දෙයක් හෙලිකොප්ටරයකින් ගෙන ගිය බවටද කතා පැතිරිණි. ඒ නිධානය ගැන තොරතුර ඉහළට ගියේ විජය වික්‍රමසිංහ ඔස්සේ යැයිද කටකතාවක් ගියේය. සේන සිද්ධි දාමය ගැනම ඇස් සහ කන් යොමාගෙන ඉන්නා බව මට අවබෝධ විය. මා මේ සියල්ල දෙස බලා සිටියේ සෙල්ලම් කරන්නාක් වැනි සැහැල්ලුවෙනි.

"ඕකා මට කියන්නෙ බන්දු සර්ගෙ සේන කොල්ලලු. පරයා." සේන කීවෙන් ඔහු මටත් වඩා හොඳින් සැලැස්ම ගැන අවධානයෙන් සිටින බව මම නිසැකව දැන ගතිමි.

අනතුර

දොස්තර සමරසේකරගේ රථය බලගල්ල වලව්වේ මිදුලේ නතර වූයේ කාලයකට පසුවය. ඔහු මාස තුනකට එංගලන්තයට ගිය බව මා මුලින්ම දැන ගත්තේ හැනාගෙනි. එහි පිටත්ව යාමට දෙදිනකට පෙර ඔහු නිලීකා නංගීද සමග ආවේය. මගේ බීබී සුපර්මාට් සමාගම් ජාලයට දොස්තර සමරසේකර, නිලීකා නංගී හෝ ලොකු නැන්දලාගේ පවුලේ අය සම්බන්ධ කර නොගැනීම ගැන අමනාපයක් ඇති බවට කතාවක් පැතිරී තිබුණේය. මෙතරම් සාර්ථක වෙතියි මා නොදැන සිටි ව්‍යාපාරයකට අන් කිසිවකු සම්බන්ධ කර ගැනීමට පෙලඹවීම් කටයුතු කරන්නට මට වෙලාව තිබුණේ නැත. එහෙත්, පසුව ව්‍යාපාරයේ විවිධ තනතුරුවලට නෑදෑයන්ගේ ඉල්ලීම් පිට නොයෙක් දෙනා බඳවා ගත්තෙමි. ඒ අතර බඳවා ගත් තනතුරුවල වැඩ හරියට නොකළ නෑදෑයන් ඉවත් කළෙමි.

මෙවර දොස්තර සමරසේකරගේ රථය නතර වන විට සමාගම හා සම්බන්ධ කාරණයකටයැයි මම සිතුවෙමි.

එහෙත්, ඔහු කීයේ අනුවේදනීය කතාවකි:

විජය වික්‍රමසිංහ දරුණු ලෙස තුවාල ලබා ඇත. ඔහු සමග සිටි එක් සේවකයකු මිය ගොසිනි. තුවාල ලැබූ සේවකයකු පොලීසියට කතා කරන්නට පටන්ගෙන තිබේ.

ඔවුන්ම ගල පුපුරුවා රන්කඩු දෙක ගන්නට සවිකළ බෝරය පිපිරුණේද නැත්නම් වෙනත් කිසිවකු වීවී ඇතුළු පිරිසත් සමග පුපුරුවා හැරීමට ඇටවූ බෝම්බයක් පිපිරුණේද යන්න තවමත් කිව නොහැකිය. මේ රන්කඩු දෙක ඇත්තකු වෙත රාජ උරුමය ඇතැයි කියන ලද කතාවක් වීවී තදින් විශ්වාස කර ඇතැයි දොස්තර සමරසේකර කීවද ඔහුට එය ආරංචි වී ඇත්තේ කටකතා මාර්ගයෙන් මිස වීවීගේ කටින් නොවේ. විජය වික්‍රමසිංහගේ පාදයක සැත්කමක් දැනටමත් කර ඇත. ඔහු සුව අතට හැරෙමින් සිටියද කන් ඇසෙන්නේ නැත. ඇති වූ කම්පනය නිසාදෝ කතා කරන්නේද නැත. එවැනි අත්දැකීමකට මුහුණ දුන් කෙනෙකුගේ කතා කිරීමේ ශක්තිය පමණක් නොව, මතකයද සම්පූර්ණයෙන් නැතිවීම සිදුවිය හැක්කකි. එහෙත්, බන්දුල බලගල්ල මහතා ඔහු බලන්නට පැමිණීම ගැන ඔහු තුළ කැමැත්තක් නැති බව ඔහු ගොළු බසින් රාධා ටීචර්ට කියා ඇත. විනීතා සහ රාධා ඔහු අසලින් මොහොතකටවත් බැහැර නොයා සිටිති.

ශිෂ්ටත්වයේ සම්භාවනීයභාවයක් පිටිසර වියළි නුවරක පවා පවත්වාගෙන යන්නට තැත් කළ මා ඇට වූ නිර්දය උගුලක් විසින් වීවී අනතුරට හෙළා ඇත්තේ පමණක් නොව, මාද අමානුෂික පිලිස්තීනුභාවයකට ඇද වැටී ඇතැයි මට සිතිණි. ඒ අතින් රාධා යනු දේවතාවියක වැනි ගැහැනියකි.

"බන්දු හිතනවා ඇති මිනිහගෙ සල්ලි හින්දා මම මිනිහ එක්ක ඉන්නවා කියලා. එහෙම නෙමේ. මටත් නිදහස් අධ්‍යාපනේ තිබුණෙ නැතිනම් මිනිහ වගේම වෙන්ඩ ඉඩ තිබුණා. බන්දුල වගේ වැදගත් පවුල්වලට සම්බන්ධ වෙන්න ලැබෙන්නෑ එහෙම උනානං. මිනිහට අපේ උදව් ඕනෑ කියලයි මාත් හිතුවෙ. රාධා ටීචර්ට ඒක තේරෙනවා." දොස්තර සමරසේකර කීවේය. නිලීකා නංගී ඔහු අසල සිට ඔහුගේ හිස අත ගෑවේය.

මා කවදාකවත් ඒ තරම් බරපතළෙට ගණන් නොගත් දොස්තර සමරසේකර ගැන මට ඇති වූ අනුකම්පාව වීවීද හසු කරගෙන පැතිරෙන අනුකම්පාවක් බවට පෙරළිණ. ඉක්බිති එය රාධා ගැන ගෞරවයක් බවට පෙරළී මගේ විඥානය තුළම වර්ධනය විය.

දේවතාවිය

බන්දුල බලගල්ල, සේනටත් නොකියා සිය පැරණි මිනිකුපරය එළවාගෙන සිංහ රෝහලට ගියේ රාත්‍රී අටට පමණය. ඒ වන විට වේදනා නාශක එන්නත ලබා ඔහු නිදා සිටින්නට ඉඩ ඇති බව දොස්තර සමරසේකර කීවේය.

මා එහි යන විට රාධා සහ විනීතා දෙදෙනාම එහි උන්හ. රාධා දැන් විනීතාට වඩා මහතය. එහෙත්, දෙදෙනාම හැසිරීමෙන්ද ගතිගුණයෙන්ද එක සමාන යැයි මට මොහොතකට සිතිණි. මා නිදා සිටින රෝගියා බලා කාමරයෙන් පිටවන විට රාධා සහ විනීතා දෙදෙනාගෙන් කවරකු පළමුව මා හා පසුගමන් ආ යුතුදැයි ඒ දෙදෙනාටම සිතා ගත නොහැකි බවක් පෙනී ගියේය. විනීතා පළමුව නැගිට්ටාය. මා දොරින් පිට නැවතී ඈ වෙත හැරුණේ කළ යුතු යමක් ඇතිදැයි අසන්නටය.

"දැන් ටිකක් හොඳයි සර්. මං කොච්චරනං කිව්වද ඔය එක එක බලවත්තු එක්ක බජනෙට යන්ඩ එපා කියලා. ඉස්සර ඉඳල අපේ මහත්තයට හරි සන්තෝසයි ටවුමෙ ලොක්කො එක්ක ගැවසෙන එක. මොනව කරන්ඩද ඉතිං කරුමෙ කියන්නෙ ඒකනෙ. කන් දෙකෙන් ලේ පෙරාගෙන වැටිල ඉද්දි ගිහිං අරන් ආවෙ. සර්ට මූණ දෙන්ඩ ලැජ්ජයි කියනෙකමයි කිව්වෙ. අර ඉස්පිරිතාලෙ හාට් අංශෙට පුදුම වියදමක් කෙරුවෙ. බන්දු සර්ට කරදයක් උනොත් අපි ලැස්ති වෙලා ඉන්ඩ ඕනෑ කියලමයි කොච්චරවත් කියන්නෙ."

රාධා නැගිට ලෙඩාගේ ඇඳෙහි යමක් කරනු මම වීදුරු දොරෙන් දැක්කෙමි.

"ටීචර් හින්ද තමයි මෙහෙම බේරුණේ කියන්ඩ පුළුවන්. ටීචත් ඇතුගලේ නැග්ගනෙ මහත්තයා ගේන්ඩ. රත්තරං ගෑනියෙක් අපරාදෙ කියන්ඩ ඕන්නෑ. දැම්මම ලෑස්ති වෙනවා මහත්තයව ආයෙත් කතා කරවන්ඩ."

විනීතා නැවත කාමරයට ගියාය. එය රාධාට මා වෙත පැමිණෙන්නට ඉඟියක් බව මම දැන ගතිමි.

රාධා ආවාය.

ඇය මා වෙත සෘජු බැල්මක් බැලුවාය. උගුල ඇටෙව්වේ මා යැයි ඈ දන්නා බවද ඒ බැල්මෙහි වූයේ? එහෙත්, ඇය කිසිවක් නොකීවාය.

"වීවීට ආයෙත් ඇහෙන්නෑ. කතා කරන්නෙත් නෑ. කම්පනේට වෙන්න පුළුවන්. මං දන්නවා ඔයා ආයෙත් එන්නෙ නැතිවෙයි වීවීට කටහඬ දෙන්න. නමුත් මම මෙහෙන් යන්නෙ ආයෙත් එයාව කතා කරවලා. හැනා කියනව ඒක කරන්න පුළුවන් කියලා." රාධා කීවේ ඉස්සර ඇයගෙන් මා අසා පුරුදු එලකියුෂන් ගුරුවරියගේ අලංකාර ඉංග්‍රීසියෙනි. රවුම් වෙන්නට තරම් මහත් වී ඇති සිරුරේ ඒ ළයාන්විත කටහඬ එලෙසම තිබිණි.

මට කිසිවක් කියා ගන්නට නොහැකි විය. ඒ මොහොතේ සිට මා සිතෙහි ඈ වෙනුවෙන් වූ අනුකම්පාව පහව ගොස් පැරණි ගැඹුරු මිත්‍රත්වය යළි පණ ගසා ආවේය. මා දෑත විවර කළ විට ඈ මිත්‍රත්වයෙන් ගැහෙන හදවත වෙත කොපුල තබා වැලඳ ගත්තාය. මම ඇගේ උරහිස උඩින් එබී පිට දිගේ එල්ලෙන කොණ්ඩය දෙස බැලුවේ පුංචි පිච්ච මලක් දකින්නටය. ඒ මල එහි නොවිණ. එහෙත්, පිච්ච සුවඳක් හාත්පස පැතිරෙන්නාක් සේ විය.

"බායි ටීචර්" මා කීවේ ඇය ගුරුවරියකයැයි මට අවංකවම දැනුණ බැවිනි.

"ෂටප් බන්දු." ඇය සැහැල්ලුවෙන් සිනාසුණාය.

අප වෙන්වූයේ තවත් කිසිවක් කතා නොකරය. ඇය නැවතත් වීවීට කටහඬ ලබා දී අවසාන වන තෙක් මා දන්නා කිසිවක් ඇයට නොකියන බව මම මටම දිවුරා පොරොන්දු වීමි.

ඒ රැයේම මම මෙම ආඛ්‍යානය ලියන්නට පටන් ගතිමි.

ඉපැරණි ආලින්දයක අලුත් සංවාදයක්

මෙම ආඛ්‍යානය සම්බන්ධයෙන් අප දෙදෙනාගේ අවසන් හමුව සිදුවූයේ ඔහුගේ ප්‍රසිද්ධ සුපිරි වෙළෙඳ සංකීර්ණ ගොඩනැගිල්ලට පිටුපසින් තාමත් සුරක්ෂිතව ඇති ඓතිහාසික ගෘහයෙහි ආලින්දයේ. ඒ මේ නවකතාව අවසන් කිරීමේ අවසන් හමුව විනා අපේ මිත්‍රත්වයේ අවසන් සංවාදය නෙවෙයි.

"මම අත්පිටපත හරි ආසාවෙන් කියෙව්වා. ඔයාගෙ හොඳම පොත මේක වෙන්නත් ඉඩ තියෙනවා. මට නම් මාව හොඳට අඳුන ගන්න පුළුවන්."

"කියවන අය නම් අඳුනගන්න ඕනෙ ඔයාව නෙමෙයි එයාලව." මම කිව්වා.

"එයාලයි එයාලගෙ රටයි." ඔහු එකතු කළා.

ඒ සංවාදය අප දෙදෙනාගේ ඉතා දීර්ඝම සංවාදවලින් එකක්. ඒත් අපි දෙන්නම වැඩි වෙලාවක් උන්නෙ නිහඬව වගේ. එක් දීර්ඝ විරාමයක ගොළුබව බිඳ ඔහු මෙහෙම කිව්වා.

"ඒ අත්පිටපතේ නොලිව්ව, ඒ වගේම මෙතෙක් දවසක් මම ඔයාට නොකිව්ව දෙයක් තියෙනවා. නොකිව්ව දේවල් ගොඩක් තියෙනව - නමුත් මේක නොකිව්ව ඒවගෙන් වැදගත්ම එකක්."

අපමණ ලෝක සාහිත්‍ය කියවීමෙන් මුවහත් වූ ආකර්ෂණීය කතා කීමේ ශක්තියක් ඇති ඔහු වෙනුවෙන් මම දෙසවන සූදානම් කරගත්තා.

"රාධා ආයෙත් අර මනුස්සයව නැගිට්ටවල ගන්න, කතා කරවන්න ලෑස්ති උනේ අර ඉස්සර මම නුගේගොඩ ඉඳල ගෙන්න ගත්තු රාධා වගේමයි. එයා ඒ ගැන මාත් එක්කත් කතා කළා. ඒව දකින හැම වෙලාවෙම මගෙ පපුව කකියනවා වගේ හිතේ අමාරුවක් තිබුණෙ. මේව කාටවත් කියන්නත් බෑ. මම ගොල්ෆ් ගගහා කල්පනා කෙරුවා මොකද කරන්නෙ කියලා. මගෙ ගොඩක් සැලැස්මවල් මතු වෙන්නෙ ගොල්ෆ් සෙල්ලම අස්සෙමනෙ. දවසක් මං හිතුව එක දිග ෂොට් එකක් අර වත්ත මැද්දෙ දෙල් ගහ උඩින් ගහල හත්වෙනි කප් එකට පාරවල් දෙකකින් පට් කරන්න පුළුවන් උනොත් ඇත්තම කතාව රාධට කියනව කියලා. එයාව බේරගන්න එක මගෙ යුතුකම කියලා හිතුණත් අර අහම්බෙත් උනොත් තමයි කියන්නෙ කියලා මම හිතාගත්තා. ඔයා දන්නවද මම වැඩිය ඒම් කරන්නෙත් නැතුව ගහපු ෂොට් එක දෙල්කොළ ටිකක් ඉරාගෙන ගිහින් වැටුණෙ හත් වෙනි කප් එකට අඩියක් විතර දුරින්. අර දෙල්කොළ ටිකයි මං අර ෂොට් එක ගැහුවට පස්සෙ ඇතුගල පැත්තෙන් ආපු හුළඟකුයි නිසා තමයි බෝලෙ ඒ තරම් කප් එක ළඟට ගියෙ. හුළඟක් එයි කියල හිතුව නම් මම ගහන්නෙ තව ටිකක් ඇතුගල පැත්තට ඇල වෙන්න. එහෙම උනා නම් කතාවෙ මේ ටික මං රාධට නොකියන්න තිබුණා. ඊට පස්සෙ වෙච්ච දේ ඔයාට නොකියන්න තිබුණා. ගොල්ෆ් තමයි අහම්බෙට වැඩිම ඉඩ තියෙන ක්‍රීඩාව."

ඉක්මනින් ඒ කතාව අසාගන්නට මා තුළ වූ නොඉවසිල්ල ඔහු දකින්න ඇති.

"ඉන්නකො මම අවශ්‍යම දේ කියන්න. මම ගියා රාධා හොයාගෙන. ඒ තමයි වීවී ගෘජ්ස් එකේ රාධාගෙ ඔෆිස් එකට මම ගිය පළවෙනි වතාව. වීවී නැතුව එයා තමයි ඔක්කොම වැඩ බැලුවෙ. අර දේවරූපත් තියෙන වීවීගෙ ඔෆිස් එකේ එයා උන්න. මං කිව්වා රාධා මට ඔයාට වැදගත් දෙයක් කියන්න තියෙනවා, ඒක නොකියා මට ජීවත් වෙන්න අමාරුයි කියලා. රාධා අහගෙන උන්නා. මං සම්පූර්ණ විස්තරේ කිව්වා. වීවීගෙ ගොළුකම බොරුවක්ය, අපේ පන්තියට එයා ආවෙ ඇයි අරක

මේක ඔක්කොම. මං සමාව ඉල්ලුව රාධට මගෙන් වෙච්ච වැරැද්දට. මගේ නගරෙට එයාව ගෙන්නැල පටලෝපු අවුල ගැන මම සමාව ඉල්ලුවා. මට පුදුම සැහැල්ලුවක් දැනුණෙ ඒක කිව්වට පස්සෙ. මම ඒක කියල යන්න නැගිට්ටා. මම දැක්කා ඔෆිස් එකේ වැඩ කරන අය වීදුරු බිත්තියෙන් අපි දිහා බලනවා. රාධා මේසෙන් නැගිටල ඇවිල්ලා මාව වැලඳගත්ත මිසක් මුකුත්ම කිව්වෙ නෑ. ස්තුතියි කියල විතරක් කිව්වා. මම පිටවෙලා ආවා. පුදුම සැහැල්ලුවකින් මම ආවෙ."

ඔහු මා දෙස බැලුවා. ලස්සන සැහැල්ලු සිනාවක් ඔහුගෙ මුහුණෙ තිබුණා. එදා ඔහුට අත් වූ සැහැල්ලුව යළිත් මා වෙනුවෙන් රඟදක්වනවා වගේ.

"හැන්දෑවෙ මම ගොල්ෆ් වටයක් ගහල ඇවිල්ලා. අපේ අර සෙක්කුගල ළඟ ගල් බංකුවෙ වාඩි වෙලා තැඹිලි ගෙඩියක් බිබී ඉන්න කොට රාධා ආවා. සැහැල්ලු හිනාවෙන් ඒත් කල්පනා කර කර වගේ. එඩ්මන්ඩ් රාධට තැඹිලි ගෙඩියක් කපල දුන්නා. ඒක දීල මිනිහ ගොල්ෆ් බඩුත් අරන් ගියා. වැල්වටාරම් නැතුව කිව්ව දේ කියන්නම්කො.

ඔයා මට අර කතාව කිව්ව එකට ස්තුතියි කියන්න මම ආවෙ, කියලා එයා කිව්වා. මම අත වැනුවා ඒක එච්චර දෙයක් නෙමේ කියන විදියට. මම බයේ හිටියෙ ඒ සිද්ධියෙන් රාධගෙ හිත හොඳටම රිදිලා කියලා. නමුත්, මම එහෙම එකක් දැක්කෙ නෑ. ඒක මට පුදුම සතුටක්. මට ඕනැ වෙලා තිබුණෙ එයා මේ ටවුමෙන් පිටටවලා යනවා දකින්න. රාධා සෙක්කුගලට හේත්තු උනා. මෙහෙම කිව්වා: 'මම ඒ කතාව දැනගෙන උන්නා බන්දු. මම ඒක ඔයාට නොකිව්වෙ ඔයාගෙ හිත රිදෙයි කියලා. අනික වීවී පොඩ්ඩක්වත් කැමැති උනේ නෑ ඒකට. ඔයාව රවට්ටපු එක පවක් කිය කියා හැම වෙලාවෙම කිව්වෙ. අපි ඔයාගෙ ගෙදර ට්‍රේනිං කරන කාලෙ තමයි මම එයාට ආදරේ කරන්න පටන්ගත්තෙ. මට කොච්චර ආදරේද කියනවා නම් මාව රවට්ටන්න බෑ කියලා එයා මට ඇත්තම කිව්වා. ඇත්තටම ඒකෙන් පස්සෙ එයාට තවත් ආදරේ කරන්න පටන්ගත්තා මම. මුළු ටවුමක්ම විතරක් නෙමේ නගරාධිපතිගෙ ඉඳල ඉහළටම මේ විදියට නටවන එක ලේසි වැඩක්ද! මම පුදුම ආසාවෙන් උදව් කෙරුවෙ වීවීට. මොකක් හරි වීර වික්‍රමයකට සහභාගි වෙනව කියන හැඟීම තමයි මට ඇති උනේ. ඔයාට ස්තුති කරන්න ඕනෙ ඒකට.'

රාධා සෙක්කු ගලට හේත්තු වෙලා සැහැල්ලුවෙන් ඉන්නවා. කොහෙද ඈතක බලාගෙන. මේ කාලය පුරා ඇත්තටම රැවටී තිබෙන්නේ මා නොවේද? එහෙත්, රාධා රැවටීමකට ලක් නොවීම ගැන මා තුළ ඇති වූයේ සැහැල්ලුවක්. මට යන්තම් හිනා ගියේ මාවම උපහාසයට ලක් කරන්න කියලා රාධාට හිතෙන්න ඇති. ඒත් මම හිනාවුණේ ජීවිතයේ පුදුමාකාර මායාකාරීත්වයට වෙන්න ඇති. රාධා මෙහෙමත් කිව්වා: 'ඔයාව රව්ටටපු එක ගැන එයා හැම වෙලාවෙම කියනවා. ඒකට වන්දියක් විදියට එයාගෙ හොස්පිට්ල් එකේ හාට් යුනිට් එකක් හදාගෙන ඉන්නෙ ඔයාට කරදරයක් වෙයි කියලා. එත් මෙහෙ හාට් යුනිට් එකක් කරන එක පාඩුයි. නුවර උනත් ප්‍රයිවෙට් හොස්පිට්ලස්වල හෘදරෝග අංශ නෑ. වියදම කවර් කරගන්න බැරි හින්දා. ඒත් වීවී ඒක තියාගෙන ඉන්නෙ. ඔයාට ඕනැ වෙයි කියලා.' ඒක මට කම්පනයක් වගේ. මට හාට් ප්‍රශ්නයක් ආවොත් වීවීගෙ හොස්පිට්ල් එකට යන්න තියෙන ඉඩ අඩුයි. දැන් මට පැයක් දෙකක් ඇතුළත ප්ලේන් එකක් කුලියට අරන් සිංගප්පූරු යන්න පුළුවන්."

මම මේ කතාව අදහාගත නොහැකිව බන්දුල බලගල්ල දෙස බලා උන්නා. ඔහුගේ දෙකන් අසලින් පැසීගෙන ඉහළ නගින සුදු කෙස් ඔහුට තැන්පත් පෙනුමක් එක් කළා.

"ඇයි ඒ සිද්ධිය මුලින් අත්පිටපතේ නොලිව්වෙ?" මම ඇහුවා.

"පොඩි හිත් වේදනාවක් තියෙන්න ඇති. පරාජිත හැඟීමක් වගේ දෙයක්." ඔහු මා දෙස බලා ඔහුගෙ ආකර්ෂණීය හිනාව පෑවා.

"දැන්?" මම ඇහුවා.

ඔහුගේ පිළිතුර වූයේ අර සිනාවෙන්ම අලංකාර වූ සැහැල්ලු හිස වැනීමක්.

"කොහොම උනත් බීබී සුපර්මාට් කියන්නෙ ලොකු ජයග්‍රහණයක් නේද?" මම ඇහුවා.

ඔහු ටිකක් වෙලා නිහඬව ඉදලා කතා කරන්න පටන් ගත්තා.

"නෑ. මං රතුපාට මට අයිති කරගන්න ගිහිල්ල පටන්ගත්තෙ මටවත් පාලනය කරගන්ඩ බැරි ජුරාසික් පාර්ක් වගේ එකක්. දැන් මට අයින් වෙන්ඩ අමාරුයි. මේකයි නියම නිදන් වඳුල මාවම බිල්ලට දීපු. නමුත්, මට සන්තෝසයි මම ගොඩාක් දෙනෙකුට රස්සා දුන්න එක ගැන." ඔහුගේ මුහුණේ වූයේ බරපතළ පෙනුමක්.

ඔහුගේ සුපර්මාකට්වලට රතු ඇඳ වැඩ කරන තරුණ හමුදාව මගේ මනසේ පෙළපාලියක් ගියා.

එවිටම නිවසේ ඇතුළේ සිට දිව ආ සාමාන්‍ය සුදකට වැඩිය සුදු කුඩා දැරියක් ඔහුගේ උකුලට නැග වාඩි වී දෙපා හොල්ලන්නට පටන්ගත්තා.

"මෙයා උපදින්න කලින් මම කතාව නැවැත්තුවා." ඔහු කිව්වා.

ඇය ලස්සන සිනාවක් පෑවා. පියෙකුගෙන් උරුම කරගත් සිනාවක් දියණියක විසින් තවත් සුන්දර කළාක් මෙන් උනා.

"ඔයාගෙ වයස කීයද?" මම ඉංග්‍රීසියෙන් ඇහුවා. ඇය දකුණු අතේ ඇඟිලි සූර්ය කිරණ දක්වන්නට මෙන් විහිදුවා පහ පෙන්නුවා. ඇගේ නිල් ඇස් දිලිසුණා.

මේ දැන් සාලය දෙසින් ඇසෙන්නේ ඒ දියණියට සුන්දර සුදු පැහැය දුන් කෙනාගේ පියවර හඬ බව මට සහතිකයි. ඒ වේදනාවන් දෙකක් සුව වූ දෙදෙනකුගේ එක්වීමක් අඟවන සැහැල්ලු අඩි ශබ්දයක්.

බන්දුල බලගල්ල අසල ඇති පුටුව ඇය පිළිගන්නට සූදානම්ව සිටින්නාක් මෙන්. තව මොහොතකින් මා නමින් පමණක් දැන සිටි ඇය පළමු වරට දකින්නට මට ඉඩ ලැබෙනු ඇති.

* * *

එදා මා ඔහුගෙන් සමුගන්නා විට මගේ සංසාර ගමන හා අහම්බෙන් එක්ව මා හා ටික දුරක් ගමන්කොට මගේ ජීවිතය අර්ථවත් කළ මිනිසකුගෙන් සමුගන්නාක් වැනි වේදනාවක සහ කෘතවේදීබවක උණුසුම් හැඟීමක් මා තුළ තිබෙනු මට දැනිණ. ලේඛකයකු වීමේත්, පාඨකයකු වීමේත් ලස්සන වාසනාව එය නොවේද?

කර්තෘගේ සටහන

මෙම නවකතාවේ එන සියලුම සිද්ධි හා චරිත ප්‍රබන්ධාත්මක වුවද 1983 ජූලි මාසයේදී දෙමළ ජනයාට කළ හිංසනය පිළිබඳ මෙහි එන සිදුවීම් ගොඩනැගීමේදී සත්‍ය තොරතුරු මත පදනම් වීමි. අසූතුන හිංසනය දවස්වල ළමයකු වූ මා ජීවත්වූයේ කුරුණෑගලට කිලෝමීටර් හයක් පමණ දුරින් නිසා ඒ සිදුවීම් ඇසින් දකින්නට ලැබුණේ නැත. මෙම කෘතිය රචනා කිරීම උදෙසා ඒ සිදුවීම මතක ඇති කිහිප දෙනෙකුටම කතා කළෙමි. ඒ අතර දෙමළ ජාතික හිතවත්තුද වූහ. දෙමළ ජාතිකයන්ට අයත් කඩ විසිහතරක් එකල කුරුණෑගල නගරයේ තිබුණද අද ඇත්තේ හතරක් පමණක් බව ඒ දෙමළ ජාතික මහත්මයෙක් කීවේය. අනික් ව්‍යාපාරිකයෝ ටිකෙන් ටික කුරුණෑගලද ශ්‍රී ලංකාවද හැර ගියහ. 1983 ජූලියේදී කුරුණෑගල කිසිම දෙමළ ජාතිකයකු මරා නොදැමුණ බව කීපදෙනක්ම කීහ. ඊට හේතු කිහිපයකි. එකක් ඇතැම් සිංහලයන් විසින් ඒ පිරිස ආරක්ෂා කිරීමයි. අනික නම් 1977, 1979, 1981 වර්ෂවලදීත් කුරුණෑගලදී යම් යම් සිදුවීම් වූ නිසා කොළඹ 83 ජූලි කලබල ඇති වන විටම කුරුණෑගල දෙමළ ජාතිකයන් ආරක්ෂාව පිළිබඳ පියවර ගැනීමයි. මේ ඉතිහාසය පිළිබඳ දෙමළ ජනයා සමග කළ සංවාදවල ඉතා අනුවේදනීය තොරතුරු තිබිණි. ඒවා මේ කෘතිය සඳහා භාවිත කළේ ඉතා සුපරික්ෂාවෙනි.

මෙම කෘතිය සඳහා අවශ්‍ය ඇතැම් තොරතුරු සොයා ගැනීමට මට සහාය වූවන් අතර දිසානායක මුදියන්සේලාගේ රණවීර (නිමල්) සහ සිරිල් ප්‍රේමරත්න යන මගේ පාසැල් මිතුරෝ ප්‍රධාන වෙති. මා හා කතා කළ දෙමළ ජාතිකයන්ගේ නම් ගම් මෙහි සඳහන් නොකරන්නේ අපේ නගරවල රජ කරන ජාතිවාදී දේශපාලකයන් සහ ඔවුන්ගේ මැර ගෝලයන් ගැන මට විශ්වාසයක් නැති හෙයිනි.

දක්ෂ පර්යේෂකයකු වන මා මිතුරු බුද්ධික කෝනාර මහතා 1934 ඔක්තෝබර් 28 වැනිදා සිළුමිණ පුවත්පතට ඩී.බී. හේවාවසම් මහතා වදුලු පොත් ගැන ලියූ ලිපිය මට සොයා දුන්නේය.

මෙහි එන ලන්ඩන් ජීවිතය ගැන අප ඇදුරු මහාචාර්ය චාල්ස් හැලිසි මහතා සමග කළ සංවාද ඉතා ප්‍රයෝජනවත් වූයේය.

සුහද මිතුරු ස්වර්ණ ගුණවර්ධන නිතර දෙමව්ලේ මගේ සාහිත්‍ය කටයුතු ගැන විමසා බලයි.

මේ කෘතිය අවසන් කරන්නට දිරි දුන් ප්‍රභාත් ජයසිංහ සහ රාජිත දිසානායක මිතුරන්ටද තුති පුදමි.

ඔවුන් දෙදෙනා නිසා මගේ ජීවිතයට එක් වූ වාසනාවන් දෙකක් වන් කරුණාවන්ත මිතුරියන් දෙදෙනෙකුට මේ පොත පිළිගැන්වීමට ලැබීම ගැන ඔවුන්ට නැවත ස්තුති කළ යුතුය.

සරෝජිනී දසනායක, අතුල සමරකෝන්, සුදර්ශන සමරවීර සහ රාජිත දිසානායක සමග අත්පිටපත සාකච්ඡා කරන්නට ලැබීම වාසනාවක් විය.

අප පවුලේ මිතුරියක වන හරිනි දූල්ලෑව ඇයගේ නිවස වන දූල්ලෑව වලව්වේ ගෘහ නිර්මාණ ශිල්පය අධ්‍යයනය කරන්නට මට ඉඩ දුන්නාය.

කල්ප රාජපක්ෂ පසුකවරයේ කර්තෘගේ ඡායාරූපය ගත්තේය.

මගේ පොත් උනන්දුවෙන් පළ කරන ප්‍රේම් දිසානායක මේ පොතත් පළ කළේය.

සරා, සහිත්, සරිතා තිදෙනාම අලුත් පොතක් එනතෙක් උනන්දුවෙන් බලා සිටිති.

ලියනගේ අමරකීර්ති

196/15 උඩ පේරාදෙණිය.

වර්ග අංකය 891.483 AMA
ප්‍ර. අංකය 20720

අහම්බකාරක

ලියනගේ අමරකීර්ති

ලියනගේ අමරකීර්ති සිය සිව්වෙනි නවකතාව වන අහම්බකාරක මඟින් ජීවිතයේ අහම්බමය ස්වභාවය ගවේෂණය කරන්නේ අහම්බය ඉරණම සේ ගත් පරම්පරාවක් සහ රටක් පිළිබඳ සංස්කෘතික ගවේෂණයක් ද සමගය. කුමකින් කුමක්වේදැයි නිශ්චිතව කියන්නට ඉඩ නොදෙන කතාකීමේ ශිල්ප ක්‍රමයකින් යුතු මේ කෘතිය ඉතා නාට්‍යමය නවකතාවකි. එක්තරා යුගයක ආධ්‍යාත්මය ගැන ගවේෂණයකි. චර්ම වර්ණ, දේශසීමා ආදිය ඉක්ම වූ ආදරයක සහ මිත්‍රත්වයක කතාවකි. **අටවක පුත්තු, අර මිහිරි සීනු නාදය** සහ **කුරුලු හදවත** වැනි කෘතිවලට වඩා බෙහෙවින් වෙනස් වන අතරම තේමාත්මකව ඒ කෘති වෙත නෑකම් දක්වන කෘතියකි.

ISBN 978-955-677-501-3
9 789556 775013
මිල රු. 500/=

00155777-27
Rs. 500.00 OL
01/17 DC

සුරස
පොත
වට්) ලිමිටඩ්
වත, කොළඹ 10
ෆැක්ස්: 2682224